## කරුණාසේන ජයලත්ගේ වෙනත් කෘති

ගොළු හදවත (1962 පළ වුණු හොඳ ම නවකතාව)

මුව දඩයම

බඹා කෙටූ හැටි

ලස්සණ ඇස්

ගැහැනු ළමයි

යහළු යෙහෙළි (1969 පළ වුණු හොඳ ම නවකතාව)

මව සහ දුව

ඇවැස්ස නෑයෝ

හතුරු හිතක්

පිදී නිමිතය (1972 පළ වුණු හොඳ ම නවකතාව)

සතීගේ කතාව

කුල කුමරිය

මානවිකාවක්

පෙම් පුවතක්



නිමල් හතුරුසිංහ වියාගරෝ පදවියට පත්වීම නිමිත්තෙන් ගමේ උත්සවය පැවති ද රාත්‍රියේ මම සඳ රැස් දෙස බලමින් අරුණෝදය තෙක් නො නිද ගත කළෙමි.

කරුණු කීපයක් ගැන මා තීරණයකට බැසගෙන සිටියේ ඊටත් කලිනි.

නිමල්ගෙන් වෙන් ව පාසල් ගමන නතර කර විභාගයෙන් ද අසමත් ව රක්ෂාවකුත් නැති ව ගෙදරට වී සිටි මම යම් කිසි කලකිරීමකට පත් වූයෙමි. ඒ දවස්වල මා දවාලට කෑම කෑවේ කලාතුරකිනි. දිනපතා කෑම ගැන පවා මට ඒ තරම් උනන්දුවක් නොවිය. මේ අතර කාන්තා මිළ අලුත දිනක් නොකා නොබී සිටීම ගැන අම්මා මට අවවාද කළා ය. හිත හද ගැනීමට එද රෑ නින්දට ගිය මම තීරණය කර ගතිමි. ජීවිතය ගැන වුවමනාවෙන් කලකිරී හාස්ති වීම නිෂ්ඵල ය. අම්මට සියලු දුක් කරදර ඉසිලිය හැකි නම් මට බැරි ඇයි. යනුවෙන් සිතා රක්ෂාවක් ලැබෙන තුරු බලා නොසිට බීඩි ඔතන්නට මා අදහස් කළේ ඉන් පසුව ය. බයිසිකලයේ පෙට්ටියක් බැඳ ගෙන මිනිහෙක් සතියකට වරක් ගමට ආවේ ය. අප ඔතන බීඩි ඔහු මිල දී ගත්තේ ය. මේ හැර මම එළවළු පාත්ති කීපයක් ද සිටුවා ගතිමි. ගමේ ගොඩේ ගොස් වෙනදට වඩා උනන්දුවෙන් හා වැඩිපුර එළවළු එකතු කර අම්මාගේ වෙළදාමට උදවු කළෙමි. පුංචි නංගීගේ පාඩම් ගැන මුලදීට වඩා උනන්දුවක දක්වීමි.

www.sinhalaelibrary.com

පාසල යන කාලයේ මා සබඳකම් පැවැත්වූයේ ප්‍රධාන වශයෙන් හතුරුසිංහ පවුල සමග ය. සිසිලට යෑම නතර වීමත් ලොකු නංගී ලබාගත් අවමානයත් නිසා ගමේ අයට මුහුණ නොදී සැඟවීමට උත්සාහ ගැනීමත් නිසා මම කලක් අවට සමාජයෙන් වෙන් වී ශාරීරික වශයෙන් ද මගේ ම පුංචි ලෝකයක තනි වීමි. නැතහොත් බන්ධනාගාර ගතවීමකට පත් වීමි.

එහෙත් මෙසේ නැවත එළවළු එකතු කරන්නට යෑමේ දී මට ගමේ අනෙක් මිනිසුන් සමග ගැටෙන්නට සිදු විය. නිතිපතා ගිය සමහර නෑකම පවුල් හා මා අතර සාමාන්‍ය ඇසුරක් ඇති විය. කාලවේලා ලද පරිදි මම ගැහැනුන් හා තරුණියන් සමග කතාවට වැටී සිටින්නට පුරුදු වීමි. පාසලෙන් ළමා වියේත් සුවඳ තුනී වී යෑමෙන් මම ගමේ ජීවිතයට හිමින් හිමින් ඇතුළු වන්නට පටන් ගතිමි.

එදිනෙද ජීවිතයේ මේ වැඩ කටයුතු අතර මගේ දුක් වේදනා යටපත් විය. අම්මාටත් නංගීටත් උදවු වීමෙන් ද නිල්මිණී රැක බලා ගැනීමෙන් ද මා ලැබුවේ ආස්වාදයකි. අපටත් වඩා දුප්පත් පවුලක කාන්තාවක සමහර දක මගෙන් සත විසිපහක් ණයට ගත්තා ය. එළවළු ගෙනෙන්නට ගිය ගෙදරක ළමයෙක් අමාරු ගණිත ප්‍රශ්නයක් විසඳීමේ දී මගේ උපදෙස් ඇසුවේය. සුළුවෙන් හෝ මෙවැනි උදවුවක් කරන්නට අවස්ථාවක් එන තුරු මා ආශාවෙන් බලා සිටියා තරම්.

එහෙත් එදත් මා තුළ බලාපොරොත්තුවක් නොවී ය. අනාගතයක් ගැන මම ඇත නො බැලුවෙමි. හිත හද ගන්නටත්, එන තත්ත්වයකට මුහුණ දෙන්නටත් සූදානම පමණක් මා වෙනුවෙන් මම ඇති කර ගතිමි. මගේ ම යහපතට යයි සිතා මම කිසිවක් කරන්නට කල්පනා නොකළෙමි.

නිමල් හතුරුසිංහ ඩීයාරෝ පදවියට පත් වන කාලය වන විටත් මා සිටියේ එම මානසික තත්ත්වයේ ය.

නිමල් ඇගේ පෙරහැර අපේ ගේ ඉදිරිපසින් යන විට මා දැඩි කම්පනයකටත් චංචලත්වයකටත් පත් වූ බව සැබෑවි. ඔහුගේ කතාව ශබ්ද විකාශනයෙන් අසා ඉක්බිති ගෙට ගොස් ඉකි බිඳ බිඳ හැඬූ බවත් සැබවි. එහෙත කලකිරීම හෝ වේදනාව හෝ මා



වෙත ආපසු ආවේ නැත. හඬා කඳුළු සැලීමෙන් පසු සැහැල්ලු වූ සිත අලුත් අධිෂ්ඨානයත් ද බලාපොරොත්තු හා විශ්වාසයත් ද ගොඩනැංවීමට තරම් ශක්තිමත් පසුබිමක් වූ බව පසුව මට අවබෝධ විය.

අම්මාත් අනුලාත් හා නිල්මිණීත් නිදි නින්දේ පසු වන අතර ජනේලයෙන් සඳ රැස් දෙස බලාගෙන කල්පනාවේ යෙදුණු මම අවසානයේ තීරණයකට බැස ගතිමි. ඒ තීරණය කුමක් ද යි එක අතකට මම ම නො දනිමි. අඩු වශයෙන් ඒ අවස්ථාවේ දී හෝ මම දැන නො සිටියෙමි. ජීවිතය ගැන අලුත් බලාපොරොත්තුවක් හා විශ්වාසයක් ඇති කර ගැනීම සමහර විට ඒ තීරණය විය යුතු ය. එසේ ම මා ඇති කර ගත් බලාපොරොත්තු හා විශ්වාසයන් අසවල් අරමුණ ඉටු කර ගැනීමට ය යි නිශ්චිත හැඟීමක් මට නොවීය.

එක් කාලයක අනාගතය දෙස බලාගෙන මම නොයෙකුත් සිහින මැවුවෙමි. නොයෙකුත් බලාපොරොත්තු හා ප්‍රාර්ථනයත් ඇති කර ගතිමි. ඒ කිසිවක් මට තනිකර අයිති වූ ඒවා නොවේ. හැම සිහිනයක ම හැම බලාපොරොත්තුවක ම හැම ප්‍රාර්ථනයක ම තව කෙනෙකුටත් හවුලක් විය. ඒ අනෙක් හවුල්කාරයා නිමල් හතුරුසිංහ ය. අපේ පුංචි ගෙය, අපේ මිදුල, අපේ මල්, අපේ දරුවෝ! සියල්ල අපේ! මගේ ම ය යි කිසිවක් නැත. මගේ ය යි මා සිතුවේ නිමල් ගැන පමණකි. මගේ නිමල්: මගේ ආදරණීය නිමල්!

එසේ ඔහු ගැන සිතන්නට අයිතියක් නොමැති වූ විට මම පසු කාලයක අනාගතය දෙස බැලීම නතර කළෙමි. බැලුවත් එහි කිසි සංකේතයක් මට දක්නට නොවී ය. අද දෙනා ගැන එකට කල්පනා කරන්නට පුරුදු ව සිටි මට තනි ව වෙන ම අනාගතයක් නොපෙනිණි. ශූන්‍ය බවක් හැර අන් කිසිවක් මා ඉදිරියේ නොවී ය.

නිමල් හතුරුසිංහ නොමැති ව - තනි ව - අනාගතය දෙස බලන්නට මම එද ප්‍රථම වරට උත්සාහයක් ගතිමි. "මම" යනු කුසුම් පමණක් නොවේ. "මම" යනු බොහෝ දෙනෙකි. අම්මාත් නංගීත් නිල්මිණී "මම" යන්නට අයිති ය. මා මෙදින අනාගතය

දෙස බලන්නට තීරණය කර ගත්තේ අන්න ඒ "මම" වෙනුවෙනි. ජීවිතය ගැන බලාපොරොත්තුවක් හා විශ්වාසයක් අලුතින් ගොඩ නංවා ගත්තේ ඒ "මම" වෙනුවෙනි. සමහර විට ඒ බලාපොරොත්තුව හා විශ්වාසය "මම" යන අයටත් වඩා බාහිර තවත් විශාල පිරිසක් වෙනුවෙන් වන්නටත් පුළුවන.

කෙසේ වුව ද අලුත් අධිෂ්ඨානයකින් යුත් මා අරුණෝදය ළං වූ කල අනුලාත් නිල්මිණීත් මැදින් වැතිර දෙ දෙනා ම මා වෙත දෙපසින් තුරුළු කර ගතිමි. ඔවුන්ගේ උණුසුම දෙනෙත් ම මගේ දෙ තොල තුනී සිනාවක් මතු විය. අප්‍රමාණ සහනයකින් මම දෙ නෙත් පියා ගතිමි. කුකුළාගේ හඬ අසා අවදි වී මා ඇස් ඇර බලන කල අම්මා නැගිට වෙළෙඳාමේ යන්නට සූදානම් වෙමින් සිටියා ය. මම කලබල වී නැගිට, නින්දට ඇඳ සිටි යට ගවුමට උඩින් පොරොවන රෙද්ද ඔතා ගතිමි.

"ඇයි අම්ම මට කතා නොකළේ?"

"නින්ද ගිහිල්ල තිබුණයින් මම ඔහේ කතා කළේ නෑ.........."

"අම්මට තේ එකක් වත්............" කී මම "පුංචි නංගියෙ, පුංචි නංගියෙ"යි අනුලාගේ උරහිසින් අල්ලා සොලවමි.

අම්මා විසින් තේකලය ළිප තබන ලදුව තිබිණ. මා තේ පිළියෙළ කරන අතර පුංචි නංගී නිදිමතේ ම කුස්සියට පැමිණ ළිප අසල වාඩි වුණා ය.

"දන්නෙම නෑ නින්ද ගියා. පව්! මම නැගිටල බලන කොට අම්ම තේකලෙත් ළිපේ තියල."

"අක්කගෙ වැරැද්ද කළේ මට යන්තම් දැනුණ අක්ක තුරුළු වෙනව. උණුසුමට මටත් නින්ද ගියා." පොරවා ගත් රෙද්ද අතරින් එළියට ගත් අත ගින්නට ළං කළ අනුලා "සීතලයි" උරහිස් හකුළුවාගෙන ඒ උණුසුම යළි ලබනු රිසියෙන් මෙන් අත්ල රත් කරමින් කීවා ය.

"ඉරිදත් වෙලා අද යන්න වුණේ හිස් අතින් වගෙ." අම්මා තේ කෝප්පය අතට ගනිමින් කීවා ය.

"ඒක නේන්නම් අම්මෙ. එළියක් අරගෙන ගිහිල්ල මගේ පාත්තිවල මොකුත බලන්න ද?"



"දැන් ඕව කර කර ඉන්න බෑ. පරක්කු වුණා."

අම්මා කීවේ ඇත්තකි. හන්දියෙන් පහට පිටත් වන බස් රියේ ශබ්දය ඇසිණි. ඔරලෝසුවක් නැතත් අම්මා ඉවකින් වේලාව දනී. මම නැවත කලබල වීමි. වහා උඩ ගවුම දමා ගත් මම ඉන්නල මල්ල තබා ගත් වට්ටිය පාරට ගෙන යනු පිණිස අතට ගත්තෙමි.

"මගෙ මිරිස් කරල් ටිකවත් කඩා ගන්න බැරි වුණානෙ."යි කියමිනි.

"කමක් නෑ බං" අම්මා කීවා ය.

අම්මා හිස් අතින් මෙන් වෙළෙඳාමේ යන්නේ මගේ වරදිනැයි පසුතැවිල්ලක් මට ඇති විය. පුංචි නංගී කුප්පි ලාම්පුවක් රැගෙන අප සමඟ පාරට ආවා ය. අතර මඟ මගීනට හීප නැනක නතර කරමින් නැවත පිටත් වෙමින් ගිය බස් රියේ හඬ නිසංසල අලුයම් කාලයේ බොහෝ දුර යන තුරු ඇසෙන්නට විය. හඬ නැත්තට ම නැති වීමෙන් පසුවත් මා ගෙට ගියේ නැත.

උදෑසන සීතල ගතිය මා දැඩි ප්‍රබෝධයකට පත් කළේ ය. කුරුල්ලෝ ගී ගයන්නට පටන්ගෙන සිටියහ. පුංචි නංගීගේ රෝස පඳුරේ තවත් රතු මලක් පිපෙමින් තිබෙනු මට මඳ අඳුරේ ම පෙනිණි. රෝස මලක් හා කිරිල්ලියක් පිළිබඳ බටහිර කෙටි කතාවක් හදිසියේ සිහියට නැගිණ. මට ඒ සියල්ල හරියට මතක නැත. මලක් තව තවත් රත් පැහැ ගන්වනු පිණිස කිරිල්ල රෝස කටුවකින් පපුව පළා හදවතේ රුධිරය ගසට දුන්නා ය. කිරිල්ලගේ පරිත්‍යාගය පිළිබඳ මේ කෙටි කතාව ලියන ලද්දේ ප්‍රංශ ලේඛකයකු විසින් ද? නැතහොත් එය ඇන්ටන් චෙකොෆ්ගේ ද?

"අක්කෙ තේ ටිකක් බොන්නෙ නැද්ද?"

ගෙට ගිය මම තේ කෝප්පයක් ඇතැති ව පැදුර ළඟට ගියෙමි. නිල්මිණී තවමත් නිදි ය. පොරවන රෙද්ද ඇයගේ ඇඟට අසු වී ඇඹරී ගොස් තිබිණ. නිදි සුවයේ සැනසීම ඇයගේ මුහුණේ බබළන තරම්.

බාල්දිය රැගත් මම ළිඳ වෙත ගියෙමි. පිණි බිඳුවලින් වැසුණු තණ බිම පෑගෙනු කල යටි පතුලට දැනුණේ ඉතා සුවදායක

www.sinhalaelibrary.com

ගතියකි. මම පාත්ති වලට වතුර දමන්නට පටන් ගතිමි. 'මිරිස් කරල් ටිකක් කලින් ද සවස කඩල තියන්නට වුණා නම්'ය යි මට යළි සිතිණි. ඉරිද පොළේ දී වැඩි මුදලක ගන්නටත් පුළුවන්කම ඇත. පුරුද්දට ගියා මිස අම්මා මෙදින පොළේ නොයා යුතු ව තිබිණි. වෙළඳාමට තරම් දෙයක් ඇයට ගෙන යන්නට නොවී ය. ඉන්නල මල්ලෙලන් වැඩක් ඇද්ද? නිමල්ගේ උත්සවය නිසා අපට කලින් ද සවස ගමේ ඇවිද එළවළු ටිකක් එකතු කරන්නට පුළුවන්කමක් නොවී ය.

නිල්මිණි අවදි වන්නට කලින් මම පාත්තිවලට වතුර දමා අවසන් කෙළෙමි. ගෙය අතු ගා හමාර කළ නංගී මිදුල අමදින්නට වූවා ය.

කලින් ද රැය පැයකට හමාරකට වඩා නින්දක් නොලැබුණත් මෑතක දී නො දැනුණු ප්‍රාණවත්කමක් හා ප්‍රබෝධයක් මගේ සිතටත් ගතටත් දැනෙන්නට විය. තවමත් හිරු පායා නැත. එහෙත් ඉස්සරහ වත්තේ පැත්තක ගස් අතරින් ක්ෂිතිජය අසල අහස තද රත් පැහැයක් ගෙන තිබිණි. යම්කිසි එළියක් මතුවන්නට දඟලමින් සිටි.

"පුංචි නංගියෙ අපි අද ගෙයි ගොම ටිකක් ගාල දමුද?"

අතු ගෑම නතර කළ අනුලා එක අතකින් හිස කසමින් මගේ දෙස බැලුවා ය. ඇය සිටි තැනට ගෙයි බිම හොඳ හැටි පෙනුණා ම නොවේ.

"දැන්ම ඕනෑ යැ අක්කෙ? තාම අලුත් නේද?"

ඇය කී දෙය සැබෑවකි. මීට කලින් ගෙයි ගොම මැටි ගා මාසයක් වත් නැත.

"අක්ක කියනව නම් මම ගොම ටිකක් අරගෙන එන්නම්." මා රෝස පඳුරට වතුර වත් කරද්දී නංගී කීවා ය.

"එහෙනම් ඔන්න ඔහෙ ඕනෑ නෑ............"

"අක්-කේ"

ඒ කෑගැසුවේ නිල්මිණි ය. මම ගෙට යන කල ඇ පැදුරේ වාඩි වී සිටියා ය. මම ඇය වඩාගෙන මිදුලට ආවෙමි.



"පුංචි නංගියෙ අපි දවල් වෙලා වැඩක් කරමු ද?"

අනුලා අතු ගෑම නතර නොකර ම හිස ඔසවා බැලුවා ය.

"............ අපි අර - අලුත් ගේ ළඟ ටිකක් සුද්ද කරල දමු."

"ඔව් අක්කෙ කැලේ වැවිල."

බාගෙට ඉදී වී නතර වුණු පුංචි ගොඩනැගිල්ල අවට පින්න, බෝවිටියා හා ගඳපාන පඳුරු වැවෙමින් තිබිණි. පලංචි කණුවක් දිගේ යන බාබංඩා වැලක් විය.

ඇඳුමට යටින් අත යවා නිල්මිණිගේ පිට අත ගාමින් මිදුලේ සක්මන් කළ මම,

"පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට

බඳ ගිහිණිය............ විමන් වට" යනුවෙන් තොල් මතුළෙමි.

මුවග තුනී සිනාවක් නැගී තිබෙනු මට දැනෙයි. මම ඒ සිනාව පොඩි වෙතැයි බියෙන් මෙන් ඉතා පරිස්සමින් නිල්මිණිගේ මුදු මොළොක් කෙස් කැරැල්ලකට දෙ තොල් තබා ගතිමි. නිල්මිණි මගේ බෙල්ල බදාගෙන ම හිස එසවූවා ය.

"පැටිවිට බඩ ගිනිද?"

"ඔව්"

"යමු දූවේ. අපි මොකුත් කමු."

කලින් දින කමලාවතී විසින් එවන ලදුව වෙනම ම තැබූ කැවුම් හා කෙසෙල් ගෙඩිවලින් මම නිල්මිණිට කන්නට දුනිමි. මොනවා කීවත් කමලාවතීට මා මතක් වී තිබේ. "ඇයි ජේන් අක්කෙ මම මැරිල උපන්නද, ඒ කෙල්ල කරපු උදව්යි ඒකිගෙ අගෙයි මම මතක නැති කරන්නෑ"යි ඇය කියා ඇත. නිමල්ට දොස් තබන අවස්ථාවලත් මගේ ගුණ කියා ඇත. අඩු වයසෙයත් මා ගැන තේරුම් ගැනීමට වත් ඇය වෙත ශක්තියක් තිබීම මගේ සිතට සහනයක් හා සතුටකි. කමලාවතී ගැන හෝ අන් කිසිවකු ගැන හෝ මම කුමට නම් වෛරයක්, ද්වේෂයක් ඇති කර ගනිම් ද? පවිත්‍ර වී තිබෙන මගේ හදවත පවිටු හැඟීම්වලින් කුමට නම් කිලිටි කර ගනිම් ද? අපි දෙගොල්ල ම දුප්පත්කම නමැති එක

www.sinhalaelibrary.com

ම රැකැණකට අනු වී සිටියෙමු. කමලාවතී තමා දන්නා මඟකින් ඉන් මිදෙන්නට උත්සාහ ගන්නා ය. දුප්පත් වීම ඇයගේ වරදක් නොවේ. මගේ වරදක් ද නොවන්නේ ය යි නිමල් කියයි. ගුණපාල කියන්නේ දුප්පත්කම වැරදි සමාජ ක්‍රමයක විපාකයක් බවයි. ඔහුගේ මතය තනි තනි ව දුප්පත්කමින් මිදෙන්නට බැරි බවයි. තනිව කෙනකු දුප්පත්කමින් මිදෙන කල තව තවත් දෙනා වඩ වඩාත් දුප්පත්කම කරා තල්ලු වන බවයි. "පිස්සු ළමයා!" යි ගුණපාල හදිසියේ මතක් වී මට සිනා ගියේ ය.

පුතා උපාධිධාරියෙකු කළ යුතු ය යි සිතාගෙන ඇය වැඩ කළා නොවේ. ඔහු ඩියාරෝ කෙනකු කළ යුතු බවට නියත අරමුණක් ද ඇයට තිබුණා නොවේ. එහෙත් ඇය දරුවනට ඉහළට ඉගැන්වීමට උත්සාහ ගත්තා ය. ඒ උත්සාහයේ දී ඈ නොයෙකුත් පරිත්‍යාගයනට හා දුක් ගිරිහැරවලට මුහුණ දුන්නා ය. ඒ නිසා පුතා මේ තත්ත්වයට පත් කළේ තමා ය යි අයිතියක් කීමට ඇයට පුළුවන. ඔහු පිළිබඳ අයිතිය ඇත්තේ ඇයට මිස මට නොවේ. පුතා වෙනුවෙන් තමා ගොඩ නංවන ලද ලෝකයට මා අයත් නැතැයි ඇය සිතත් නම්, මා ඇතුළු වීමෙන් ඒ ලෝකය බිඳ වැටෙතැයි ඇය බිය වෙත් නම්, මා බලෙන් රිංගන්නට යන්නේ ඇයි? මට වෙන ම ලෝකයක් තිබිය යුතු ය. මම එයා සොයා ගනිමි.

කෙසෙල්ගෙඩි හා කැවුම් කෑමෙන් සන්තර්පනය වූ නිල්මිණි පොල් කටු කීපයක් ද රැගෙන මිදුලට බැස්සා ය. නංගී හා මම ද උදය අහර කිස නිමවා ජනෙල් මට්ටම වැඩ අවසන් ව නතර වී තිබුණු අලුත් ගෙය අවට පඳුරු උදුරා ශුද්ධ කරන්නට පටන් ගතිමු. නිල්මිණි පැමිණ අපට උදව් වන ලෙසින් නොයෙක් වර බාධා කරන්නට වූවා ය.

"අක්කෙ ලඟකදි ආයෙත් ගෙයි වැඩ පටන් ගන්න විදිහක් නෑ නේද?"

"පටන් ගන්න ඕනෑ කොහොම හරි. මගෙ අර පොතේ තියන සල්ලි ටිකවත් අරගෙන."

"ඒක අරගෙන කොහොමද? අක්කගෙ සල්ලි ටික අරගෙන හරියනව යැ"යි ඈ කීවේ දොම්නසකිනි. ප්‍රශ්නය විසඳන අලුත්



අනෙක් මගක් ඇද්දැයි දැනගනු රිසියෙන් ඇය මුල් ප්‍රශ්නය නැගුවේ බලාපොරොත්තු ඇතිව ය. ඒ බලාපොරොත්තුව මගේ පිළිතුරෙන් සුන් වූ බව දුටු මම කණගාටු වුණා ම නොව කෙසේ හෝ ගෙයි වැඩ නිම කර ගැනීමේ අධිෂ්ඨානය දැඩි කර ගතිමි.

පඳුරු හා පැළෑටි ගලවා දැමූ අපි බිත්ති කණ්ඩියේ සිට අඩි තුනක් පමණ පටියක් මෙන් තිබෙන්නට තණ කොළ ද උදලු ගා දැමීමු. ගෙයි වැඩ නිම කරගත් තරමේ සතුටක් ටිකකට මගේ සිතෙහි මතු විය. අනතුරුව මඩ සෝදා ගත් මම ඉස්තෝප්පුවේ පැදුරක් එළා වාඩි වී බීඩි ඔතන්නට වීමි. අනුලාත් මගේ උදවුවට ආවා ය. නිල්මිණී තනිව ම කතා කරමින් අප අසල සෙල්ලම් කළා ය.

"පුංචි නංගි කැමති ද අපේ ඉස්කෝලෙට යන්න?"

ඇයගේ මුහුණට අලුත් එළියක් ආවේ ය.

"ඉඩ තියෙනවද දන්නවයැ?"

"නංගි ආස ද යන්න?"

"මම ගොඩක් ආසයි. සෙන්ට්රල් එක අපේ එකට වැඩිය කොයි තරම් හොඳ ද?"

"ප්‍රින්සිපල්ට මම ගිහිල්ල කියන්න ඕනෑ. සමහර විට ගනී. පර්ලත් ඉන්නව තව මම අඳුරන..............."

"ලොකයියගෙන් ලියුමක් අරගෙන ගියොත් නම් එක පාරටම ගනී."

"නෑ මම යනව ප්‍රින්සිපල්ට කියල බලන්න. කාගෙවත් ලියුම් මොටද?"

"දැන් නොවැම්බර්............... මේ මාසෙ තියෙයි ඇතුළත් කරන විභාගෙ"

"බලමුකෝ"

නංගීගේ මුහුණේ සතුට බෙරෙයි. ඈ ඉගෙනීමේ දක්ෂ ය. ඒ සඳහා උනන්දුවක් හා ආශාවක් ද ඇයට තිබේ. හැම වාරයක දී ම පංතියේ පළමු වෙනියා වී හත් වසක් මධ්‍ය මහා විද්‍යාලයේ

www.sinhalaelibrary.com

ඉගෙනගෙන සම්මාන සහිත ජ්‍යෙෂ්ඨ සහතිකයක් ඇතැති ව පිට වූ මම ඉස්කෝප්පුවේ බිම වැතිර බිඩි ඔතමි. එහෙත් අනුලා එහි යවන්නේත් මගේ ඉරණම ම අත් කර දීමට ද යන ප්‍රශ්නය මේ අවස්ථාවේ මගේ සිතේ මතු නොවී ය.

අද හෙට ම ගෙයි වැඩ නැවත පටන් ගත හැකි ය යි ඉපිද තිබුණු සතුට, ජනවාරියේ පුංචි නංගී ඉහළ පාසලකට දමා ගත හැකි වෙතැ යි සිතීමෙන් තවත් වැඩෙන්නට විය.

"අක්කට ඊයෙ ඊ කියන්න මතක නැති වුණා.............." අනුලා හදිසියේ කීවා ය. ".............. මධුරි අක්කලත් ඇවිත් හිටිය.............."

"මධුරි කොහොමද නංගිට අක්ක වුණේ..............?"

"ඉතින් කවුරු වුණත් වැඩිමල් කෙනෙක් නෙ" පුංචි නංගී සිනාසුණා ය.

හදිසියේ මතු වූ කෝපයක් යටපත් කරගෙන මම ද සිනාසුණෙමි. මා කෝපයට පත් වූයේ නංගී නො නෑයකුට 'අක්කා' යි කී නිසා නොවේ. නුවුවමනා කතාවක් ඇද ගැනීම නිසා මගේ සිතේ සන්සුන්කමට බාධා වෙතැ යි මගේ යටි සිතේ අනුලා ගැන නොමනාපයක් උපදින්නට ඇත.

"කාන්තිගෙ තියන ආඩම්බරේ හරියට අං ආව වගෙ!"

"අනුන්ගෙ වැරදි හොයන්න පුරුදු වෙන්න එපා නංගියෙ."

"මම වැරැද්දක් යැ කිව්වෙ?"

"වැරැද්දක් නෙවෙන්නම්! කෙනාකගෙ මූණට කියන්න බැරි කිසි දෙයක් නැති තැන කියන්න එපා. එහෙම පුරුදු වෙන්න නරකයි. නැති තැන අපි කියන එකක් ඇහුනෙ නැතත් එහෙම එකක් කිව්වට පස්සෙ ආයෙත් මූහුණ දෙන කොට නිකම් බයාදු ගතියක් තමන්ට ම ඇති වෙනව. තමන්ගෙ හිත පිරිසිදුවට.............."

"ලොකයියා කිව්වලු දවසක් කුසුම් නම් හොඳ මහණ වෙන්නයි කියල. ඒක හරිම ඇත්ත!"

නිමල් මට දවසක් එසේ කීවේ ය. නංගී මේ කතාව දන්නේ කෙසේ ද? මා මේ ගැන පද්මිනීට හැර අන් කිසිවකුට කියා නැත. නංගීට දැන ගන්නට ලැබී ඇත්තේ ඔහු මේ කතාව ම තවත්



තැනක දීත් කියා ඇති නිසා විය යුතු ය. ඔහු කවර දක කවරකු සමඟ මේ ගැන කුමක් නම් කතා කරන්නට ඇද්ද?

"ඔය කතාව නංගි දන්නෙ කොහොමද?"යි ඇසීමේ කුතුල මා වැඩ ගත්තේ අමාරුවෙනි.

"උඹ සතුටුද මම දසසිල් වෙනවට?"

අනුලා සිනාසී බිම බලා ගත්තා ය. අපි දෙදෙනා ම නිහඬ තත්ත්වයට වැටුණෙමු. සිනාව කෙමෙන් තුරන් වී ගියෙන් ඇයගේ මුහුණ ශෝකාකුල ගතියකින් වැසී ගියේ ය. සමහර විට මා හිස මුඩු කරගෙන බොර පාට රෙද්දක් හා අත් දිග හැට්ටයක් හැඳ තවත් එවැනි ම රෙද්දක් උරයක් පලා පොරවාගෙන නව ගුණ වැලක් ද අතැති ව සිටින දර්ශනයක් ඇය ඉදිරියේ මැවී යමින් තිබෙන්නට ඇත.

"ලොකු අක්ක ගිහි ගෙය හැර යයි ද?" යන බියක් හා සැකයක් ඇයගේ සිතෙහි මතු වන්නට ඇත. ඇයගේ දෙ නෙත් කඳුළෙන් තෙත් වන්නට ආසන්න ය. එහෙත් මට ඇති වූයේ සංවේගයක් නොවේ. ආඩම්බරයක් හා පුංචි නංගී සිප බද ගන්නට තරම් සෙනෙහසකි. අනුලා කොහොමටත් පියකරු ය. ශෝකයෙන් හෝ කෝපයෙන් හෝ වැසුණු කල ඒ මුහුණ වඩාත් සුන්දර ය. නැතහොත් අමුතුවෙන් සුන්දර ය. උතුරන සතුටක් ඇතිව මම ඒ සුන්දරත්වය මැන ගැනීමට තැත් කළෙමි. හිස එසවූ ඇ මා තමා දෙස බලා සිටින බව දැක කට කොනකින් සිනාසුණා ය.

බිඩි කොළ කපන කතුර ගෙන එහි තුඩ ඇයගේ නිකටට සිරවූ කළ මම,

"මෙකිගෙ ලස්සණ!"ය යි කීමි.

මා තමාට විදවතැයි බිය පත් වූ එකියක මෙන් ඇ "ඒ-යි" කියාගෙන පැත්තකට බර වූවා ය. මගේ හිතට හදිසි දුකක් ආවේ ඉන් පසුව ය. අනුලාගේ මුහුණ අතරින් සෝමා පෙනෙන්නට වූ බැවිනි. ඇට අස්සේ සැඟවුණු වේදනාව මොහොතකට හදවතට ඇතුළු වී හිරි වැටීමක් ඇති කළේ ය. සෝමා මහ පොළොවට ගිල ගත්තා මෙනි.

www.sinhalaelibrary.com

www.sinhalaelibrary.com



"ඔය මොකත් නෑ නෙ ඊයෙ ගියා නම්!"

"කොහෙද?"

"අපි එපැ යි කිව්වෙ නෑ නෙ යන්න"

Eleganttalks.com

"බයවෙලා ද? මම කොහේ යන්නද?"

"ඩැයිවර මාමලගෙ ගෙදර යන්න බැරි වුණාට අක්කට තරහයි. මම දන්නව."

"ඉදා! කෝලං. මම මොටද ඒකට තරහ වෙන්නෙ? මගෙ අතපය බැඳල තිබුණ යැ? මට ඔන්නම් යන්න නොතිබුණ යැ? මම ඒ ගැන හිතුවෙත් නෑ............... මට ගණනක් වත් නෑ ඒකට" මගේ නිදහසට වුවමනාවටත් වඩා කතා කළේ කලින් ද උත්සවය සඳහා "සිසිල"ට යන්නට නොලැබීම ගැන පසුතැවිල්ලක් යටි සිතේ තිබුණු නිසා ද යි මම බිය පත් වීමි. ප්‍රශ්නය මතු කිරීම ගැන නොමනාපයක් වෙනුවට මේ වන විට "මේ කෙල්ල මගෙ හිත හඳුනගනී දෝ" යි චකිතයක් මතු වන්නට පටන්ගෙන තිබිණි. මම නිහඬ වීමි. පුංචි නංගී ඊළඟට මා දෙස බැලුවේ නුවුවමනා කතාවක් ඇද මගේ සිත තැලීම ගැන කණගාටුව පළ කරන ඇසකිනි. මම සිනාසුණෙමි. ඇය දූන් කල්පනා කරන්නේ මා සතුටු කරවන යමක් කියනු පිණිස විය යුතු ය.

"එක අතකට දූන් නම් මට වුණත් හිතෙනව ලොකු අක්ක නොගිය එකමයි හොඳ. නැන්දට වුණත් වටිනව පණිවිඩයක් හරි එවන්න. කළ උදව් මතකයි මතකයි කිව්වට හරියන්නෙ නැනෙ. මොකද අක්ක එතන ගිහිල්ල ලොකයියගෙ ඇඟට පනිනවයැ?"

මෙතෙක් මට කල්පනා නොවී තිබුණු දෙයක් ඇයගේ කතාවෙන් පසු මගේ සිතට ද වැදිණි.

"ජේන් අක්කෙ කුසුමටත් එන්න කියාපත් මේ වැඩකට පළකට උදව් වෙන්න."ය යි අම්මා අත මට පණිවිඩයක් එවීමේ යුතුකමක් කමලාවතීටත් තිබුණා නොවේ ද? එහෙත්,

"කිව්වත් කව්ද යන්නෙ?" යි මම බොරුවක් කියා ගතිමි.

"මීට පස්සෙ මම යන්නෙත් නෑ ඔය ගේ හරියට. අක්කට කළ වෙනස්කමට"



"කෙල්ල එහෙනම් අක්කංඩිට ආදරෙයි?"

අනුලා සිනාසෙන්නට උත්සාහ කළා ය. ඇයගේ නෙතඟ කඳුළු බිඳුවක් නැඟී තිබිණි.

"උදේ මිදුල අතු ගාන ගමන් කල්පනා කරන අතරෙයි මටත් අලුතෙන් හිතුණෙ. අක්කට මොන තරම් අසාධාරණයක් ද ඒ පවුලෙන් වුණේ?"

මා නිමල්ට ආලය කළ බවක් කිසි දවසෙක අනුලාට විවෘත ව කියා නැත. ඒ බව ඇයගෙන් සැඟවීමට උත්සාහයක් ගත්තේ ද නැත. ලොකු නංගී රූ රජින තරගයට සහභාගි වූ ද නිමල් අප හමු වීමට ආවේ ය. එද අනුලා ද සිටියා ය. එක් රැයක ඔහු අපේ ගෙදරට ආවේ ඇයත් මාත් පමණක් සිටි අවස්ථාවක ය. මේ කිසිම අවස්ථාවක දී ඔහු හා මා අතර සබඳකමක් පැවැති බවක් හෝ ඒ සබඳකම අත් හැර දමන ලද බවක් හේ ඇඟවෙන විධියකින් මා අනුලා සමඟ කතා කර නැත. සමහර විට මුල් කාලයේ මා නැති තැන අනුලාට ඇසෙන්නට සෝමා අප ගැන කතා කළා විය හැකි ය. ඇග්නස්ලාගේ ගෙදර උදවිය හෝ ගමේ අන්කිසි යෙහෙළියක හෝ පුංචි නංගී සමඟ මා හා නිමල් ගැන සඳහන් කළා වන්නටත් ඇත. අම්මාගෙන් පවා යමක් කියැවෙන්නට හොඳටම ඉඩ තිබේ. අනුලා දූන් පුංචි ළමයෙක් නොවේ. දූන් කාලයේ වයස දහතුනක දැරියකගෙන් මෙවැනි දෙයක් වසන් කර තබා ගත නො හැකි ය. ඇය කිසිත් නො දනිතැ යි බොරුවට සිතා ගන්නට තැත් කිරීම මුළාවකි. අද නැතත් කලෙක මා නිමල් අහිමි වීම ගැන සිත් තැවුලෙන් පසු වූ බවක් නංගීට රහසක් නොවිය හැකි ය. මා තවමත් වේදනාවෙන් කල් ගෙවතැයි සමහර විට ඇය සිතන්නටත් ඇත.

"මම ඔව ගැන හිතන්නෙවත් නෑ නංගියෙ දූන්. මට ඕනැ කෙහෙල් මලක් නෑ..............."

මා කතා කළේ ඇයගෙන් ඉවත් කර ගත් බැල්ම ඇතිව ය. ඇය මා කී දෙයට කිසිත් කතා කළේ නැත.

"ඔය ගිය දේවල් ගැන කල්පනා කරල ඔළුව අවුල් කර ගන්න ඕනෑ යැ? අපිට කල්පනා කරන්න කොයි තරම් දේවල්

කියනවද? ගෙයි වැඩ ටික ඉවර කර ගන්න ඕන.............. පුංචි නංගි කොහොම හරි ඉගෙන ගන්නකො. තවත් එකක්.............."

"දෙවෙනියිය නේද අර එන්නෙ?"

මම තිගැස්සී පාර දෙස බැලීමි. රෝහණ ඈත එමින් සිටියේ ය. කිරි මිටිත් කොළත් වට්ටියට දමමින් ගවුමේ රැඳුණු රොඩු පිසදගෙන සිට ගත් මම "මේ ටික ගෙට ගන්නැ"යි කලබලයෙන් සොහොයුරියට කීමි. කිරි ඔතන්නට වීම ගැන මට දුන් ලැජ්ජාවක් නැත. එහෙත් නිමල්ලාගේ ගෙදර කෙනකුට පෙනෙන්නට මේ කටයුත්තේ යෙදෙන්නට මම මැලි වීමි. අයසකට පත් වීණැයි ඔවුන් මට අනුකම්පා කරනු ඇත. මම ඒ අනුකම්පාව ලැබීමට නො කැමැත්තෙමි.

"දෙවෙනියියෙ. එන්න එන්න"

"කුසුම් දකින්න කියන අමාරුවක්"ය යි කියාගෙන ඔහු ගෙට ගොඩ විය. සහෝදරයකු දකීමේ සොහොයසින් මගේ සිත පිරී ගියේ ය. සතුටත් සමඟ ම දෙ නෙතට කඳුළක් නැගෙන්නට එයි. මම සිනාසෙමින් ම අඩියක් පස්සට වී උළුවස්සට හේත්තු වීමි. රෝහණ පුටුවේ වාඩි වී "එන්න බබෝ"යි නිල්මිණිට අත පෑවේ ය. දුවිය පස්සට පැන මගේ දෙපා බදු ගත්තා ය. මම ඇයගේ හිස මත අත තබා ගතිමි.

";සෝමගෙ පළාපු පළව"

"සෝමෙගෙ නෙවී මගෙ"

"කුසුම් දකින්න කියන අමාරුවක්" මල් ගිය ඇත්තකු ගැන මතක් කළැයි පසුතැවිල්ලකට පත් වූවකු මෙන් ඔහු අනෙක් අතට වහා කීවේ ය.

"අයියල ඉතින් ගමට එන්නෙ හාව හඳ දකින්න වගෙ. කොහොමද දකින්නෙ?"

තේ වතුර ටිකක් ලැස්ති කරන ලෙස මා ඉඟි කළ කල පුංචි නංගී කුස්සියට ගියා ය. ඇඟිල්ල කටේ රුවාගෙන මගෙන් අඩියක් දෙකක් එහාට වුණු නිල්මිණි ලොකු කර ගත් දෙ නෙතින් මඳ වේලාවක් අමුත්තා දෙස බලා සිට වහා එක පිම්මෙන් නංගී සොයා ගෙට දුව ගත්තා ය.



"ඇයි කුසුම් ටිකෙ උත්සවයට නාවෙ?"යි රෝහණ ඇසුවේ දෙන් තරහකින් මෙනි.

මම සිනාසුණෙමි.

"අයියගෙ දියුණුව දකින්න අපි තරමටම ආස කළ කෙනෙක් ඇත්ද?..............."

"දැනුත් එහෙමයි." මම නියපොතු දෙස බලාගෙන නියපොතු හඬමින් කීමි.

"එහෙනම් උත්සවයට හවුල් වුණේ නැත්තෙ?"

"ඇයි නැත්තෙ? අපි පාර සැරසුව. පෙරහැර බැලුව. කතාවල් අහගෙන හිටිය. සන්තෝස වුණා." මම අන්තිම වචන දෙක කියා හොල් හඬ කර ගතිමි.

ඔහු වඩාත් කෝපයට පත්වන්නට ඇත.

"නංගි දන්නව අයිය ඉන්නෙ බොහොම ලොකු වේදනාවකින්..............."

මා තුළ ද වහා තරහක් උපන්නේ ය.

"දෙවෙනියිය කියන්නෙ මම ඒකට වගකියන්න ඕනැයි කියලද?"

"නෑ මම එහෙම කියන්නෙ නෑ. නමුත් කුසුමට පුළුවන් එයාගෙ වේදනාව නැති කරන්න."

"ඒක තියෙන්නෙ මගෙ අතේ නෙවි. නැන්දගෙ අතේ."

රෝහණ මා විනිවිද යන බැල්මක් හෙළීය.

"මොනාව වුණත් කුසුම් ඇයි ඉඳහිට වත් ඒ පැත්තෙ නො එන්නෙ?" කෙටි නිහඬතාවකින් පසු ඔහු ඇසී ය.............. "නංගිට කවුරුත් එහෙම යන්න එපා කියල නෑ නේද?"

"නෑ නමුත් මම නැන්දට පොරොන්දුවක් වුණා. කවදවත් ඒ ගෙදර පය පාගන්නෙ නෑ කියල."

"එහෙනම් ඒක දිගටම ගෙනියන්නයි අදහස?"

"ඒක අයිති නැන්දට"_

www.sinhalaelibrary.com

උත්සවයට සහභාගි වන ලෙස අම්මා අත මටත් පණිවිඩයක් එව්වේ යුතුකම කමලාවතී වෙත තිබුණා නොවේ ද යි අනුලාගේ කතාව උඩ මට කල්පනා නොවුණා නම් සමහර විට මගෙන් මෙවැන්නක් රෝහණට නොකියැවෙන්නට ඉඩ තිබිණි. නිමල් දකින ආශාව පසෙක තැබුවත් "සිසිල" වැනි මා නිතර ආ ගිය තැනක ලොකු උත්සවයකට හවුල් වීමට නොලැබීම මට වුණු මදිකමකැයි හැඟීමක් යටි හිතේ තිබී වහා මතු විය. තිබෙන තරමින් හොඳට ඇඳපැළැඳ සැරසී එළියට පහළියට යන්නට නො කැමැති වන තරුණිය කවරෙක් ද?

රෝහණ හා මා අතර නිශ්ශබ්දතාව දිග්ගැස්සෙත් ම මගෙන් පිට වුණේ නුසුදුසු වචනයකැයි අනෙක් අතට පසුතැවිල්ලක් ඇති විය. මවක ගැන මෙසේ පුතකු සමඟ කතා නොකළ යුතුව තිබිණි. එහෙත් මම ආත්මාර්ථකාමයට ජයගන්නට ඉඩ දුනිමි.

"මම කාටවත් දෙස් කියනව නෙවි. මගෙ තරම මම දන ගන්න ඕනෑ. මම මොටද දන දන කාටවත් බරක් වෙන්නෙ?"

"මොකටද කුසුම් ඒව. අම්මලගෙ අදහස් අපේ අදහස්වලට වැඩිය වෙනස්."

"ඒ ටික කල් තියා ම දැනගෙන තමයි මම ඔය තීරණයට බැස්සෙ."

අප අතර නැවතත් අඹිහිරි නිශ්ශබ්දතාවක් ඇති විය. මගේ සිතෙහි නොසන්සුන්කමක් ඉපිද වැඩෙන්නට පටන් ගත්තේ ය. රෝහණ දකින කල අන් හැම අවස්ථාවක මෙන් ම හට ගත් පිවිතුරු සතුට පිරිහෙන්නට වන්නේ ය. ඔහු ආවේ අළුයම සිට මා වෙත පැවැති ප්‍රබෝධය උදුරාගෙන යන්න දැයි බියකින් මම තැති ගතිමි. පරණ කලකිරීම කරා ආපසු යන්නට මට කොහොමවත් නුපුළුවන.

හිල්මිණි උස් හඬින් නැඟූ ප්‍රශ්නවලට අනුලා හෙමින් පිළිතුරු දෙනු කුස්සියෙන් ඇසිණි. රෝහණ කතා නැතිව සාක්කුවෙන් සිගරට් පැකැට්ටුවක් ද ගිනි පෙට්ටියක් ද එළියට ගත්තේ ය. ඇඟිලි තුඩු කහවීන් බොර පාට වී තිබිණි. ඔහු මුළු සිගරට්ටුව එක උගුරට දවා නිම කරන්නට මෙන් වැරෙන් දුම් ඇද පිට කළේ ය.



"පවුව නැමිලා ඇති." යි මට සිතිණි.

"අයිය කවදද ආයිත් වත්තට යන්නෙ?"

ඔහු හිස ඔසවා මා දෙස බලා සිනාසුණේ ය.

"කුසුම් අපේ දිහාවෙ එක දවසක් හරි ගියොත් එදාට තමයි වත්තට යන්නෙ ආයිත්."

මම කතා නැති ව සිනාසුණෙමි. නිෂ්ඵල කතා කුමට ද?

"අන්න හරි"

"ගේන්න නංගියෙ"

"අද යමු එහෙ. නංගිත් එක්කලම ගිහිල්ල දවාලට බත් හෙම කාල හවස එන්න." අනුලාගෙන් තේ කෝප්පය අතට ගත් රෝහණ ඇය ගෙට ගිය පසු කී ය.

"අද නම් කොහොමටත් බෑ."

"ඇයි?"

"ඩියාගෝ මහත්තයත් ඇති."

"අනේ අනේ ඩියාගෝ මහත්තයා! එයා කව්ද?"

"ඉස්සර නම් මගෙ ගුරුවරයෙක්." මම සිනාසී [illegible]මනාවටත් වඩා සිනාසී - කීමි.

"ඊටත් ඉස්සර?"

"ඒ ඉස්සර නෙ. කාටද ඕව මතක?"

"නිකම් නිරපරාදෙ දෙන්න දෙපැත්තට වෙලා කඳුළු බොනව."

"කඳුළු බොන්න ඕනෑ යැ? හිත හද ගත්තම ඉවරයි නෙ. පිරිමියෙකුට බැරි ද හිත හද ගන්න?" ය යි මා කීවේ නොමනාපය පළ කරන හඬකින් ඊට උචිත පෙනීමක් ද මුහුණට නගාගෙනය. මා ද කඳුළු බොනැයි හැඟීමක් ඔහු තුළ තිබීම ගැන මම කෝපයට පත් වීමි.

"දෙවෙනියිය එහෙමද හිතන්නෙ? මමත් කඳුළු බොනව කියලද!" යන ප්‍රශ්නය මා පිට නො කළේ ඒ කෝපය ලුහුබැඳ

සිතට නැගුණු ශෝකයක් ගැන ද කල්තියා ම දැනගෙන විය යුතුය. ශෝකය මා වෙනුවෙන් නොවේ. නිමල් හතුරුසිංහ වෙනුවෙනි. දෙවියනි! ඔහු තවමත් මා ගැන සිතා සැදුළ බොන්නේ ද?

අනුලා නිල්මිණි අතින් අල්ලාගෙන මිදුලට බැස්සා ය. පාරට ගිය නංගී යමකු එන බලාපොරොත්තුවෙන් මෙන් දෑ පැත්ත බැලුවා ය.

"සමහර වෙලාවට කුසුම් කතා කරන්නෙත් අපේ අම්ම කතා කරන විදිහටමයි."

"දෙවෙනියිය එහෙනම් මා ගැන කතා කරල තියනව නැන්දත් එක්කල?" උත්සාහයෙන් සිනා සී මම ඇසීමි. ඔහු ද සිනාසුණා මිස කතා කළේ නැත.

"මොනවද නැන්ද මා ගැන කිව්වෙ" යන ප්‍රශ්නය අමාරුවෙන් යට පත් කරගත් මම,

"මොනවටද ඔව කතා කරන්න ගියේ? ඔයින් වෙන්නෙ මට අර අම්ම කෙනෙක් වගෙ හිටිය නැන්ද තව තවත් තරහ වෙන එකයි." දුබල හඬින් කීමි.

"අම්ම කුසුම් එක්කල තරහ නෑ නංගියෙ"

"කොයි තරම් වුණත් තමන්ගෙ දරුව ගැන තෙවී තරහ ඇති වෙන්නෙ. පිට අය ගැන. ඒක හැටියක්මයි."

මා කී දෙය පිළිගත් නියාවෙන් රෝහණ කරබා ගත්තේ ය. අනුකම්පාවක් ද මිශ්‍ර වී ඔහු වෙත මගේ දයාව වැඩෙන්නට විය. කුඩා දවස හිංසා කළත් පසුව, විශේෂයෙන් රක්ෂාවකට ගොස් වගකීමෙන් ද වැඩුණු පසුව, රෝහණ මා කෙරෙහි කරුණාවන්ත විය. අන් බොහෝ තරුණියන් හට කළ කවටකම් ඔහු මා සම්බන්ධ ව අමතක කළේ ය. අයියාගේ අත ගෙන පවුලට බැඳෙන්නට සිටින එකියකය යන හැඟීම ඔහු මා ගැන ඇති කරගන්නට ඇත. එහෙත් රක්ෂාවට යාමෙන් පසුව උදා වූ ප්‍රථම සිංහල අවුරුද්දේ දී රෝහණ මට ගවුම් රෙද්දක් තෑගි කරන කල මා හා නිමල් අතර ප්‍රේමයක් නොවිය.

ඔහු මගේ ම සහෝදරියට පවා නුවුවමනා විහිළු කළේ ය. රෝහණ සෝමාට ලියුම් ලියන්නටත් ඇද්ද? ඔවුන් දෙ දෙනා



අතර පැවති සම්බන්ධය කුමක් ද? මුලින් ම ඇයගේ සිත අවදි කෙරෙන්නට ඇත්තේ ඔහු විසින් ද? අමිහිරි දෙයක මතකයෙන් විසෙකට උඩ දී රෝහණ වෙත උපන් දයාව මොහොතකට යට ගත් විය.

"වැලව්වත්තලගෙ දිහාවෙ හෙම ගියෙ නැද්ද?"

කිසි බලාපොරොත්තුවක් නැති ප්‍රශ්නයක් මගෙන් නැගිණි. ඔහු සිනැස්සී මා දෙස බැලීය. මුහුණ ලැජ්ජාවෙන් රතු විය.

"මම මොට ද එහෙ යන්නෙ?"

"අපි යෑ දන්නෙ?"

මම තව දුරටත් ඒ විහිළුව ඔස්සේ යන්නට අදහස් නො කැලේ.

"මම කුසුමිට බල කරන්නෙ නෑ. මට අයිතියකුත් නෑ............"

"අයියල මගෙ එක කුසේ නූපන්න කියල මගෙ වෙනසක් නෑ. නැන්දත් මට අම්ම කෙනෙක් වගෙ. අයියල කියන ඕනෑ දෙයක් අහන එක මට මදිකමක් නෙවී. ඒත් මටත් ආත්ම ගෞරවයක් කියල මොකක් හරි..........."

"මම දන්නව කුසුම්." ය යි කියාගෙන ඔහු අසුනෙන් නැගිට්ටේ ය. "නංගියෙ මම ගිහිල්ල එන්නම්."

ඔහු අනුව මිදුලට බැස මම එහි මැදක් යන තුරු ගමන් කළෙමි. ඔහු පාරට බැස ගිය පසු, මිදුලේ ඇවිදිමින් සිට පුංචි නංගී මා වෙත ආවා ය.

"දෙවෙනියිය මොනවද කියන්නෙ?"

"නිකම් කතා කර කර හිටිය."

"අපූරු කතාවක් නෙ එයා කියන්නෙ? ඔළෙන් ගිහිල්ල එහෙ ලොකු හෝදල වරෙල්ල............."

"අපිට මොකද ඕනෑ එකක් කිව්වම. මමත් ඔහේ අහගෙන හිටිය."

"ඒක තමයි අන්තට වෙලා තියෙන්නෙ. මම නම් බණිනව."

"උඹ මොකද, උඹ චණ්ඩියා!" යි මම අනුලාගේ උර හිසට අත ගසා කීමි.

මම ගෙට ගොඩ වුණු නමුත් නැවත බිඩි ඔතන්නට පටන් නො ගතිමි. රෝහණ හතුරුසිංහ පිටත් ව යෑමෙන් පසු ව මගේ සිතට පාළු ගතියක් දැනෙන්නට විය. ඔහු ඇසුරේ දී මවන ද ලබන සතුට මම මෙදින නොලද්දෙමි. මම ඒ ගැන පසුතැවිලි වීමි. පලක් ඇති කිසි දෙයක් අප අතර කතා නොවිණැ යි මට කල්පනා විය.

රෝහණ කමලාවතී සමග අපගේ ප්‍රශ්නය ගැන කතා කළ බව නිසැක ය. මවගෙන් බුරුලක් නොලද තැන ඔහු තම සහෝදරයා වෙනුවෙන් මා සමග කතා කරන්නට ආවේ ය. හිතුවක්කාරකමට හෝ විවාහ වීමට කැමැති වන ලෙස මා පෙලැඹවීම ඔහුගේ ගමනේ අරමුණ වුණා විය හැකි ය.

රෝහණ වත්තට යන්නට කලින් නැවත වරක් මා හමු වීමට එතැයි මා කල්පනා කළේ ආශාවෙනි. එහෙත් ඔහු දින කීපයකට පසු ගෙදරින් පිට ව ගියේ ය. ඔහු වත්තට ගියේ අම්මා සමග ඇති කරගත් අමනාපයක් ද රැගෙන බව මට දැන ගන්නට ලැබුණේ කලකට පසුව ය.

මා උත්සවය ද 'සිසිල' ට නො යෑම ගැන ගමේ සමහර ගැහැනුන් අතර ඕපාදූප කතා පැතිර ගිය බව මිතුරියකගෙන් පුංචි නංගීට දැන ගන්නට ලැබී ඇත. මේ පුවතින් නංගී මටත් වඩා තදින් කිපුණා ය. මා නිමල් ට පෙම් බැඳි බව සමහරෙක් දැන සිටියහ. මා එහි නො ගියත් ගමට ආවොත් රෝහණ අපේ ගෙදරට නොවරදවා ම එන බැවින් තවත් සමහරකුගේ මතය වූයේ ඔහු හා මා අතර සබඳකමක් තිබී කමලාවතී ඊට විරුද්ධ වූ බවකි. විජය හා මගේ නම එකතු කළ පිරිසක් ද වූහ. නිමල් අමතක කළාට පසුව ඉඳහිට හෝ ඔවුන්ගේ ගෙදරට යන අවස්ථාවක් තිබිණි නම් ගමේ ගෑනු මා ගැන මෙවැනි කතා නො කියති. ඇත්ත වශයෙන් කුඩා දවස් සිට එතැනට හුරු පුරුදු මා එහි දිගට ම ගියා නම් කිසිවකු සැක කරන්නේ නැත. කතා පැතිරුණේ මගේ ගමන් නතර වූ නිසා ය. මා තුළ ශෝකයක් ද කෝපයක් ද ඇති විය. ඕපාදූප ගැන අම්මාට කිසිත් නො කියන ලෙස මම පුංචි නංගීට අවවාද කළෙමි.

උත්සවයට පැමිණි නිමල් ඉරිද සවස පිටත් ව යන්නට ඇතැයි මම සිතමි.



## 02

**මා** නමින් තැපැල් කන්තෝරුවේ තැන්පත් කර තිබුණු මුදලින් ගෙයි වැඩ කිරීමේ අදහසට අම්මා පමණක් නොව අනුලාත් කැමැති කරවා ගත්තේ බොහෝ දුර කරුණු කීමෙන් පසුව ය.

නැවත ගෙයි වැඩ පටන් ගැනෙත් ම මගේ උද්‍යෝගය හා ප්‍රබෝධය වැඩෙන්නට විය. මම අලුත් ජීවයකින් ප්‍රාණවත් වීමි. බැම්මේ වැඩ ඉක්මනින් ම නිම කර ගත හැකි විය. ඊට පසු වහල ගැසීමටත් දොර ජනෙල්වල වැඩටත් වඩුවෝ පැමිණියහ. වැඩ කිරීම සඳහා ඔවුනු යාලත්තක් මා ගත්හ. ඔවුනට දවල් ආහාරය දිය යුතු ව තිබුණේ අපෙනි.

ඇණ ගසන හඬ, යතු ගාන හඬ, ලී ඉරණ හඬ මට ඇසුණේ මිහිරි නාදයක් මෙනි. මා වඩුවනට කෑම බෙදුවේත් තේ වත් කළේත් හිතවත් පිරිසකට කෑමෙන් බීමෙන් සංග්‍රහ කිරීමෙන් ලබන සතුට ද විඳිමිනි. විවේකයක් ලද හැම විට ම මම ගේ ළඟට ගොස් ඔවුන් වැඩ කරන සැටි ආශාවෙන් බලා සිටියෙමි. 'සුරුස්' 'සුරුස' ගා එහා මෙහා යන යත්තට අසු වී ලී රොඩු කැරලි ගැසී විසි වන සැටි බලා සිටීමෙන් මා ලැබුවේ විනෝදයකි. මට ලෑල්ල අත ගා එහි සිනිඳුකම මැන ගැනීමට ආශා සිතෙයි. නිල්මිණී යතු කුඩු ද කියත් කුඩු ද අවුස්සා ඔළුවේ පටන් ඇඟ පුරා දමා ගත්තා ය.

"ඕව ඇඟේ ගෑවුණාම කසනව දුවේ." යි කීවත් ඇත්ත වශයෙන් අලුත් කඳන් සුවඳින් යුත් ලී කුඩුවලින් ඉහ සිට නාන්නට තරමේ බොළඳ ආශාවක් මටත් ඇති විය. නිල්මිණී

www.sinhalaelibrary.com

ඉවත යන ලී පතුරු කැලි එකතු කළා ය. අනුලා ඒවායින් ඇයට ගෙයක් සාදා දුන්නා ය.

දවල් කාලයේ අම්මා ගෙදර නො සිටියෙන් වැඩ කළ මිනිසුන් අවශ්‍ය උපකරණ හා බඩු මුට්ටු ගැනත් මුදල් ගැනත් කතා කළේ මා සමඟ ය.

"දැන් සිමෙන්ති හෙම කොයි තරම් ඕනෑ වෙයිද බාස් උන්නැහෙ?" වහා අවශ්‍යතාවක් නොවුණත් මම ම ඔවුන් වෙත ගොස් අසමි.

ගෙයක ගෙට යන වියදම් හා අවශ්‍ය බඩු මුට්ටුන් ගැන කතා කිරීම පවා මට සතුටකි. අම්මා සවස ගෙදර පැමිණි කල මම දවසේ කෙරුණු වැඩ කටයුතු ගැන ඇයට විස්තරයක් කළෙමි. සමහර දිනයක මුහුණ සෝදා තේ බීමෙන් පසුව අම්මා කුප්පි ලාම්පුවත් රැගෙන ගෙට ගොස් අලුතින් එකතු වූ ප්‍රමාණය මැන ගන්නට මෙන් පරීක්ෂාකාර බැලුවා ය.

ගෙයි වැඩට ගිය වියදම් සියල්ල මම පරණ ඇක්සයිස් පොතක අග ඉතිරි වූ පිටුවල ලියා තැබීමි. අලුතින් ගණනක් එකතු කරන්නට නොතිබුණු දවසකත් මම කීප වරක් පොත ගෙන ඉලක්කම් එකතු කර බැලීමි. මා එයින් ලැබුවේ ද පංතියේ දී පහසුවෙන් ගණනක් සාදා නිම කරන කල ලද විනෝදයකි.

එළවළු එකතු කරන්නට ගම්මානයේ ඇවිදින්නට ගිය අවස්ථාවල දී අලුත් ගෙවල් සාදා ගත් අය හමු වූ විට මම සිමෙන්ති, ගල්, උළු ආදියට ඔවුන් ගෙවූ මිල ගණන් විපරම් කර අපට ලාභයක් වුණා ද පාඩුවක් වුණා ද දැයි සිතන්නට වීමි. කෙතැනක හෝ කතා බහේ දී ගෙය ගැන ඇසුවොත් මට ඇති වූයේ සතුටකි. මේ සතුට උඩඟුකමක් ලෙස පෙනුණොද යි ගෙදර පැමිණි මම පශ්චාත්තාප වීමි.

ගෙයි වැඩට සම්බන්ධ වීමෙන් සතුටක් හා තෘප්තියක් ලැබුණා පමණක් නොව එක්තරා ප්‍රමාණයකට කලත්තෑනි වීමේ වැඩිහිටි වීමේ හැඟීමක් ද මා තුළ ඇති විය.

මගේ පන්තිවලින් හා බීඩි එතීමෙන් ද අම්මාගේ වෙළෙඳාමෙන් ද එදිනෙදා ලද ආදායමින් කොටසක් ගෙයි වැඩට



ගොඩ ගත හැකි විය. මේ සඳහා ඉතා අර පරිස්සමින් කටයුතු කිරීමට අපට සිදු විය.

ශිෂ්‍ය නිවාසයේ නතර වීමට යන්නට කලින් ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ලද රුපියල් තිහෙන් ඉතුරු කරගත් මුදල් ද ඊට පසුව අම්මා විසින් දෙන ලද හා මගේ ම උත්සාහයෙන් උපයා ගත් මුදලින් ඉතිරි වූ ප්‍රමාණය ද වශයෙන් රුපියල් අටසිය ගණනක් මගේ නමින් තැන්පත් වී තිබිණි. මා මේ මුදල ආපසු ගත්තේ එකවර නොව අවශ්‍යතා අනුව තැපැල් කන්තෝරුවට ගොස් කොටස් වශයෙනි.

අම්මා වෙළෙඳාමේ නොගිය දවසක අඩද්දී ම නිල්මිණි ගෙදර තබා මම තනිව ම නගරයට ගියෙමි. මගේ ගමනේ අරමුණු දෙකක් විය. මුදල් ටිකක් ගැනීම සඳහා තැපැල් කන්තෝරුවට යෑම එකකි. පුංචි නංගී මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු කර ගනු පිණිස විදුහල්පතිවරයා හමුවීම අනෙකයි. නගරයක යන කල ළඟක දී සිට දැන් ඔසරිය අඳින්නට මා පුරුදුව ඇතත් පාසලටත් යන බැවින් ගවුමක් ම හොඳ ය යි මෙදින මට සිතිණි.

කලකට උඩ දී නිල්මිණි සමඟ බෙහෙත් ගැනීමට ගිය ද ශාලා පසු කරද්දී ඇති වූ තරමේ චංචලත්වයක් මෙදින මා තුළ ඇති වූයේ නැත. එහෙත් පරණ පරිසරය වෙත ළං වීමේ දී මම දැනෙන තරමකින් නොසන්සුන් වීමි. පාසල් ගොඩනැගිලි හා මිදුලත් පිට්ටනියත් ඇස ගැටෙත් ම පැහිරි සුවඳකට සමාන කළ හැකි අතීතය පිළිබඳ සුවඳක් මගේ නැහැයට නොව හදවතට දැනී [illegible] මම පිවිසීගෙන ගියෙමි. මේ වන විට අප හා එක පංතියක ඉගෙන ගත් කිසිවෙක් පාසලේ ඉතිරි වී නොසිටියහ. එහෙත් දන්නා හඳුනන විශාල පිරිසක් එහි වූහ. උඩු මහලේ වූන් දැරියන් පිරිසක් අතර එක මුහුණක් මම වහා හැඳින ගතිමි. සුවිනීතා දැන් වැඩුණු යුවතියකි. ඒ කාලයේ නේවාසයේ සිටිය දී ඈ පුංචි කෙල්ලකි. මා ඇයට නොයෙක් විට ගණන් කියා දී ඇත. සුවිනීතා මට අත වැනුවා ය. විදුහල්පතිවරයාගේ කාර්යාලයේ දොරටුව ඉදිරිපිට දී මට පියදාස නම් සේවකයා හමු විය.

"හා මිසී, කොහොමද? බොහොම කාලෙකින්. මොකද දැන් කරන්නෙ?"

"තවම මොකුත් නෑ පියදස. සර් ඉන්නවද?"

"ඉන්නව යන්න ඇතුලට?"

මා විදුහල්පති කාර්යාලයට ඇතුළු වූයේ පාසලේ සිටිය දී වරදක් කර ඒ ගැන විභාග කරනු සඳහා එහි කැඳවනු ලැබූ එකියකගේ චකිතය හා බිය ඇතිව ය. මගේ හදවත නොසන්සුන්කමින් ද ගුරු ගෞරවයෙන් ද සැලෙන්නට විය.

"ගුඩ් මෝනිං සර්!"

"ගුඩ් මෝනිං............. මොකද කුසුමාවතීට මේ පැත්තෙ එන්න මතක් වුණෙ?"

මම නියපොතු විකමින් ඇඹරුණෙමි.

"වාඩි වෙන්න."

මා වැටෙතැයි බියෙන් මෙන් පුටු ඇන්ද අල්ලා ගත්තා මිස වාඩි වුණේ නැත.

"මිස්ටර් හතුරුසිංහට ලොකු උත්සවයක් හෙම තිබුණලු නේද?"

"එහෙමයි සර්"

"ඔව් ගමට ආඩම්බරයක්. අපිටත් ආඩම්බරයක්............. කුසුමාවතී මොකද කරන්නෙ දැන්?"

"තවම මොකුත් නෑ සර්."

"ඒක නේන්නම් විභාගෙ ගත්තෙත් නෑ ආයෙත්............ මොකද සහතිකයක් වත් ගන්නද?"

"නෑ සර් මගෙ............ මගෙ නංගී............. එයා හරි දක්ෂයි............. වැඩටත් ආසයි."

මට ඇඬෙන්නට එන්නේ ඇයි? පුංචි නංගීගේ මතු දියුණුව පතා ගත යුතු පියවරක් ගැනීමට මම පැමිණ සිටිමි. මෙය කණගාටු දයක සිද්ධියක් නොවේ. ඉතින් මට කඳුළු එන්නේ ඇයි? උත්සාහයෙන් හැඟීම් යටපත් කර ගත් මම විදුහල්පතිතුමාට මා පැමිණි කරුණ විස්තර කළෙමි.



"ඉඩකඩ නම් අමාරුයි. නමුත් කුසුමාවතී අපේ හොඳ ආදි ශිෂ්‍යාවක්. අපි බලමු" යි අන්තිමට එතුමා කීය.

ඔහුට ආචාර කළ මම ජය ලද්දියක ලෙසින් කොරිඩෝවට බැස වට පිට බැලීමි. ගුරුවරුන්ගේ කාමරයේ මා දන්නා ගුරුතුමියක් සිටිනු ජනේලයෙන් දුටු මම එහි ගියෙමි. අප විසා වෙලාවක් එහි කතා කරමින් සිටින කල, 'බනිස් ඉන්ටර්වල්' ය යි අප එකල හැඳින්වූණු කෙටි විවේක කාලය සඳහා සීනුව නාද විය. ඝෝෂාවක් නංවාගෙන පංතිවලින් පිට වුණු ළමයින්ගෙන් කොරිඩෝව හා මිදුල පිරෙන්නට විය. අලුත් ගුරුවරු කීප දෙනෙක් ද කාමරයට ඇතුළු වූහ.

"මිස් මම අරගෙට ගිහින් එන්නම්" ය යි කියාගෙන මම පිට වීමි. මා දන හැඳින සිටි ළමයි - විශේෂයෙන් නේවාසයේ එකට සිටි ළමයි - පැමිණ මා වට කර ගත්හ. උතුරන ලෙන්ගතුකමක් ඔවුන් ගැන මට ඇති විය.

"අයියෝ කුසුමක්ක දක්ක කල්!"

"අනේ අපි හැම දම මතක් කරනව."

"අක්ක ගියාට පස්සෙ හොස්ටල් එකේ එක වේලක් රසට කෑවෙ නෑ."

"ගවුම රෙද්ද හරි ලස්සණයි."

"ගවුම රෙද්ද විතරක් නෙවි. කුසුමක්කත් දැන් ඉස්සරට වැඩිය ගොඩක් හැඩයි."

සුවිනීතා සහ චඩා ම ළඟින් ඇසුරු කළ තවත් කීප දෙනෙක් මට තේ බොන්නට කතා කළහ. අපට 'ටක්ෂොප්' එකට යන්නට තිබුණේ පුස්තකාලය පසු කරගෙන ය. එකිනෙකාගේ අත් අල්ලාගෙන පද්දවමින් අප ඉදිරියට එමින් සිටි දැරියෝ දෙ දෙනෙක් මුණ ගැසුණෝ ය.

පද්මිනි යි මම යි! පද්මිනී සේනාරත්න හා ලියනගේ දෝන කුසුමාවතී!

තේ බොන තැනට ශිෂ්‍යාවන්ගේ නේවාසයේ වහල පෙනෙයි.

www.sinhalaelibrary.com

තනි සුදු ගවුම් ඇඳගත් ශිෂ්‍යාවන් මැද මා පමණක් පාට ගවුමක් ඇඳගෙන! පාට ගවුමක් ඇඳගත් මම තනි සුදු ඇඳුමින් සැරසුණු ශිෂ්‍යාවන් අතරින් පිය නගා පාසලින් පිට වීම. හැඟීම්! මා තව දුරටත් හැඟීම්වලට යට වන්නේ කුමකට ද?

පුස්තකාලය, ශිෂ්‍ය නිවාසය, මගේ පංති කාමරය ආදී තැන්වලට තවත් එක ම වරක් පය තැබීමේ කුහුල ද මම මැඩ ගතිමි. පාසලෙන් අස් වුණු එකම දරිය මම නොවෙමි. මම ජීවිතයට මුහුණ දෙමි. මම තීරණයකට බැස සිටිමි. මා තුළ අලුතින් ධෛර්යයක් උපන්නේ ය.

නගරයේ පදික වේදිකාවේ තොරොම්බල්කාරයෙක් සිටියේ ය. නිල්මිණිට යමක් ගැනීමට මම මෙතැන නතරවීමි. පහතට හැඹුරු වී ද දණ මත ද අත් තබා ගත් මම බිම වනා තිබුණු විසිතුරු බඩු පරීක්ෂා කරන්නට වීමි. යමකු පැමිණ මා අසල නැවතුණු බවක් හැඟුණත් මා එතරම් ගණන් ගත්තේ නැත.

"නෝන මාලයක් ගන්න. ලාබයි."

මම විදුරු වළලු හයක් ගෙන ගණන් විමසා අත් බෑගයෙන් රුපියල් දෙකේ නෝට්ටුවක් වෙළෙන්ද අතට දුනිමි.

"නෝන කොංඩ කටු, ආය කටු කැරැල්ලක් සත............"

"එපා එපා!"

"කපුරු බෝල"

"ඉතුරු සල්ලි දෙන්නැ"යි කියාගෙන මම වෙළෙන්ද තවත් යමක් කීමට බාධා කරනු පිණිස ඉවත බලන්නට වීමි.

ඇසිපිය නොහෙළා මෙන් ගුණපාල මා දෙස බලාගෙන සිටිනු මා දුටුවේ එවිට ය.

"ගුණ-පාල? මම දක්කෙ ම නෑ."

"මම ටිකක් වෙලා මෙතැනට ඇවිත්. කුසුම් දකින කල් ම කතා නොකර හිටිය.............. කොහෙද ගියේ?"

මම ඔහුට ආ ගිය තොරතුරු කෙටියෙන් කීමි.

"ඉතින්? දකින්නත් ආසයි."



"කොහෙද කුසුම් ලියුමකට වත් උත්තර එවන්නෙ නැහෙ. මගෙ ලියුම් අටකට මට ආවෙ දෙකයි."

"ගුණපාලට ගණන්නුත් මතකයි." නොදැනුවත්ව ම මට කියැවිණි.

අපි එතැන සිටගෙන ම එකිනෙකා ගැන කෙටියෙන් කතා කර ගතිමු. ඔහුටත් තවම රස්සාවක් නැත.

"යමු මොකුත් බොන්න."

"මම කෙල්ලන්ගෙ වගේ නිසා වත් එකෙන් තේ බිව්ව විතරයි. බොහොම ස්තුතියි."

"කමක් නෑ. කාලෙකින් කතා කරන්නත් බැරිවුණා" යි කී ගුණපාල මගෙන් තවත් විරෝධයකට ඉඩ නොතබාම "යමු සල්ගාදු එකට" ය යි ඉස්සර විය.

එය අලුත් ආපන ශාලාවකි. නගරයේ අනෙක් කිසිම තැනකට වඩා විශාලත්වයෙන් හා පිරිසිදුකමින් යුත් එහි නවීන පන්නයේ මේස පුටු විය. හැම මේසයක් ම මත ඉටි මල් [illegible] සහිත පෝච්චිය බැගින් විය. විදුරු පෙට්ටිවල වූ පැටිස් කට්ලිස් හා කේක් ආදී කැවිලි පෙවිලි බැලූ බැල්මට අලුත් ඡවියක් පළ කළේ ය.

අප යන කල සල්ගාදු ආපන ශාලාවේ මේස වැඩි හරියක් හිස් ව තිබිණි. මා ගුණපාල හෝ අන් කිසිදු පිරිමි ළමයෙක් හෝ සමඟ මින් පෙර මෙසේ කෑමකට බීමකට හෝටලයකට ගොස් නැත. එහෙත් මා තුළ චකිතයක් නොවී ය. සමහර විට කිත්සිරි හෝ ජයසේකර හෝ කතා කළා නම් මේ ගමන නොයන්නට ඉඩ තිබිණි. ගුණපාල ගැන මට පිරිමි ළමයකු වශයෙන් හැඟීමක් නැත. උසින් හා මහතින් වැඩි සිටියත් පෙනීමෙන් පමණක් නොව අභ්‍යන්තරයෙන් ද ගුණපාල වෙනස් වී නැති බව තේරුම් ගැනීමට මට වැඩි වේලාවක් ගත නොවී ය. ඉලන්දාරියකු වුව ද ඔහු දැනුත් ඇඳුම් පැලඳුම් ගැන සැලකිල්ලක් නො දක්වයි. ඉස්තිරික්ක නොකළ කමිසයක් ද පොඩි වී ගිය කලිසමක් ද ඇඳ සිටි ඔහු වෙත මා තුළ උපන්නේ අනුකම්පාවකි. මාස දෙකකින් වත් කොණ්ඩය කපා තිබුණේ නැත. නිකටේ එළ රැවුලත් එහෙම ම ය.

පාසලට යෑම නිසා මට කොහොමටත් අතීතය මතක් වී තිබිණ. ගුණපාල හමුවීමෙන් මට ටික වේලාවක් ඒ අතීතයේ ජීවත්වීමට සිදු විය.

අප වාඩි වෙත් ම පිරිසිදුවට හැඳපැලඳ ගත් වේටර් කෙනෙක් පැමිණ,

"සර් මොනවද ඕනැ?" යි ඇසිය.

වීදුරු පෙට්ටිවලට පිටුපා වාඩි වී සිටි ගුණපාල ගෙල හරවා බැලුවේ ය.

"මම නම් මොකුත් කන්නෙ නෑ."

"ඇයි? පැටිස් හොඳයි මෙතන."

"අනේ එපා. නිකම් තේ එකක් හොඳටම ඇති."

"දෙඩම් තියෙනවද?"

"දෙඩම් ඉවරයි සර්, ෂර්බට් කෝඩියල්, අයිස් කෝපි............."

"මොනවද කුසුම් බොන්නෙ? අයිස් කෝපි?"

"ඕනැ එකක්."

"මේ තරම් පොල් තියන රටේ කුරුම්බ වතුර බෝතල් කරන විදිහක් අපේ මිනිසුන්ට තාම හොයා ගන්න බැරිවුණා නෙ." වේටර් ඉවතට ගිය පසු ගුණපාල කීය. "............... පිටරට යවන්න වුණත් පුළුවනි."

"ඔයා පටන් ගන්න කො එහෙම එකක්. අපිටත් රක්ෂාවක් වත් ඉල්ල ගන්නැකි."

"අපි කොහොම කරන්න ද? ,අරමුදල් ඕනැ. බැංකුවලින් ණය දෙන්නෙත් සල්ලි තියන අයට විතරයි."

"මම නම් පොඩි වැඩක් කරනව ගෙදරට වෙලා."

"ඒ මොකක්ද?"

මම සිනාසී තප්පර ගණනක් ඔහුගේ මුහුණ දෙස බලා සිටියෙමි. ඒ අව්‍යාජ මුහුණ බලාගෙන මගේ ඇත්ත තත්ත්වය



ගැන කීම මට ලැජ්ජාවක් නොවේ. ගුණපාලට කිසි දවසෙක මා හෙළි නො කළේ මගේ හදවත පමණි. මගේ හිසට නැගුණු ප්‍රශ්න ද මගේ බාහිර ජීවිතය ද ගැන නොයෙක් කරුණු මා ඔහු ඉදිරියේ තබා ඇත. මගේ නැති බැරිකම් හා දුප්පත්කම් සම්බන්ධව ම මම පාසලේ දී ඔහු හා විවෘත ව කතා කර ඇත්තෙමි.

"බිව එපානව"

ඔහු එක වර මා කී දෙය පිළිගත්තේ නැතත්,

"කුසුම් පුදුම ගෑනු ළමයෙක් කියල මම ඒ කාලෙත් කිව්ව" යි කියා ගත්තේ මට ඇසෙන්නට නොව තමාට ම විය යුතුය.

"මොකක් ද ඒකෙ පුදුමෙ?"

ඔහු ඊට පිළිතුරු දුන්නේ නැත.

සිප්සිරි ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ රැකියාවක් ලබා ගත්තේ ය. ගමට පැමිණි ජයසේකර සීප වරක් ගුණපාලට මුණ ගැසී ඇත. ලලිතා විවාහ වීමට යයි.

ඉංගිරිසි දැනුම වැඩි කරගනු පිණිස ගුණපාල පංතියකට යන බව කී කල,

"මොටද මාක්ස්වාදය ඉගෙන ගන්නද?" මම අතීත කතාවක් මතක් වී සිනාසී ඇසීමි.

"ඒකත් එක අදහසක් තමයි."

"දේශපාලනය හොඳයි සල්ලි තියන අයට"

"ඒ ඉස්සර කුසුම්. අද තත්වය වෙනස්."

ඒ ගැන කතා කරන්නට ගියොත් කොහෙන් නිම වේද යි කිව නො හැකි ය. මම අන් ප්‍රශ්නයක් නැඟීමි.

පංතියට යෑම නැරුණු විට ඔහුගේ කාලය ගෙවෙන්නේ පොත පත කියවීමෙන් හා යම් යම් දේ ලිවීමෙනි. ගුණපාල මේසය මත වූ අයිස් කෝපි වීදුරුව දෙ අත්ලෙන් ම බදාගෙන ඒ දෙස මඳ වේලාවක් බලා සිටියේ ය. ඔහු ලියන ලද දේවල් ගැන ඇසීම මගේ යුතුකමකි. ඒවා කියවා බැලීමට ද ආශා කරන බව ඇසීම ඔහුට ධෛර්යයක් හා සතුටක් වන බව මම දනිමි.

www.sinhalaelibrary.com

එහෙත් එවැන්නක් අසන්නේ කෙසේ ද? ගුණපාලගේ ඇස් මා බිය පත් කරවයි. ඔහුගේ බැල්ම තපුරු එකක් නිසා නොවේ. බැගෑපත් ඉල්ලීමක් එහි පිළිබිඹු ව තිබෙන බැවිනි. ගුණපාල ලියන දේවල් බලන්නට මටත් ඕනෑකමක් ඇති බව පෙන්වීම ඒ බැල්මට නව නවත් අනුබලයක් වනු ඇත. ඔහුට අනුබල දී දමයන්තියක වීමට මට නුපුළුවන.

"කුසුම් එක්කල කතා කරන්න මට බොහොම දේවල් තියෙනව."

"මට නම් දනුත් පරක්කු වුණා! අර පොඩි එකී අඬනවත් ඇති"

"නෑ නෑ දන් නෙවෙයි."

මා මුදල් ගෙවන්නට ගිය නමුත් ඔහු ඊට ඉඩ දුන්නේ නැත. රක්ෂාවක් නොකරන ගුණපාල ලවා මුදල් ගෙවන්නට"ම මගේ සිතේ කණගාටුවකට ළං වූ හැඟීමක් ඇති කළේ ය.

එතැන ලොතරැයි ටිකට් විකිණීමට තිබිණි. මම ලැජ්ජාවෙන් මෙන් ටිකට් පත් දෙස පරීක්ෂාවෙන් බැලුවෙමි.

"ටිකැට් එකක් ගන්නද?"

"නැතුවත් කමක් නෑ..............."

"මොකක් ද ඕනෑ අකුර?" කැෂියර් ඇසී ය.

"එන්"

බලා සිටිය දී ම ගුණපාලගේ ඇස් වේදනාවකින් පිරෙන්නට විය. "එන්" අකුරෙන් ටිකට් පත ගත්තේ නිමල් ගැන නොව නිල්මිණී ගැන සිතාගෙන බව ඔහුට කිව යුතු වුව ද එසේ නො කීම පාපයකැයි සිතුණත් මම ඇත්ත කියා ඔහුගේ ඇස්වලින් අඳුර ඉවත් කරන්නට ඉදිරිපත් නො වුණෙමි.

ගුණපාල බස් පොළට එන තුරු මා සමග ආවේ ය. අතර මග දී අප අතර වැඩි පුර කතාබහක් නොවී ය. පෝලිමක් නො වූයෙන් කෙළින් ම බස් රිය වෙත හැරුණු මම, "එහෙනම් මම යන්නම්" ය යි කීමි.



"කුසුම් මම වෙලාවක ඒ පැත්තෙ එන්න ද?"

ඔහු මග දිගට ඒ වචන කටපාඩම් කරගෙන ආවා විය යුතු ය.

මා බස් රථයේ වාඩි වූ අතර ගුණපාල පාරෙන් එහා පැත්තේ කඩයක් ඉදිරි පිට පදික වේදිකාවේ සිට ගත්තේ ය. මම වරින් වර ඔහු දෙස බලා සිනාසුණෙමි. ඔහු වෙත වූයේ සිනාවක උත්සාහයක් පමණකි. බස් රථය පිටත් වූ කල මම ඔහුට අත වැනීමි. නගරයේ කඩ පෙළ පසු කරන්නට ඔන්න මෙන්න තියා තිබිය දී කවුළුවෙන් හිස පිටත දමා මම ආපසු බැලීමි. ඒ වන විටත් ගුණපාල මා යන අත බලාගෙන වූන්නේ ය.

ඇත්ත වශයෙන් මටත් දැනුණේ දැඩි පාළුවකි. ඔහු සමග තව බොහෝ වේලාවක් වුව ද කතා කරමින් සිටින ආශාවක් මා තුළ ද විය. පාසල් වියේ එකට ඉගෙන ගත් කෙනකු කලකට පසු මුණ ගැසීම කොහොමටත් සතුට ගෙන දෙන්නකි. විශේෂයෙන් මම ගුණපාල ඉතා ළඟින් ඇසුරු කළෙමි. මා වඩාත් ඉක්මනට ආවේ දිගට කතා කරන්නට ගියොත් ඔහු මා වරදවා තේරුම් ගනීතැයි බියෙනි.

බස් රියට මුදල් ගෙවා ටිකට් පත අත් බෑගයේ දමන අතර මම, ලොතරැයි ටිකට් පත ද ගෙන නැවත වරක් බැලුවෙමි. "එන්" අකුර තෝරා ගත්තේ නිල්මිණී ගැන සිතීමෙන් වුව ද ටිකට් පතක් ගන්නා හැම විට ම මට නිමල් ද මතක් වෙයි. යම් හෙයකින් ලක්ෂයේ මුල් දිනුමක් මට ඇදුණොත් අපගේ විවාහයට කමලාවතී නො කැමැති නොවනු ඇතැයි මට සිතෙයි. මම ටික වේලාවක් ඒ ඔස්සේ කල්පනා කළෙමි. අනෙක් අතට විකාර සිහිවිලි යි මට ම හිනා යයි.

කපන්න කපන්න දළු ලන තේ පඳුරක් මෙන් බලාපොරොත්තුව ද නැවතත් ලියලන්නට දඟලයි.

අනුලා හවස ගෙදර ආවේ නො ඉවසිල්ලෙනි. මම ගමනේ ප්‍රතිඵල පමණක් නොව ගුණපාලගේ හමුවීමත් ඇයට කීවෙමි. ගුණපාල ජයසේකර, කිත්සිරි, පද්මිනී හා අනෙක් මිතුරු මිතුරියන් මා පාසල ගැන කළ කතාවලින් අනුලා ද හඳුනාගෙන ඇත.

තුන් වන දවසේ මට ගුණපාලගෙන් ලියුමක් ආවේ ය. කවරය ඉරා ලියුම කියවන තුරු මම නො ඉවසිලිමත් වීමි. ඔහුගෙන් එවැන්නක් බලාපොරොත්තු ව සිටි නිසා නොව මොනවා ලියා ඇද්දැයි මා නොසන්සුන් වූ බැවිනි. මා ලියුම කියවන්නට පටන් ගත්තේ සැලෙන ඇඟිලි හා සැලෙන සිතක් ඇතිව ය. වාසනාවකට මෙන් මා බිය පත් කළ කිසිවක් එහි නොවී ය. ඔහු පිටු හයක් පමණ පුරවා තිබුණේ තමාගේ දර්ශනයෙනි.

ගුණපාල තැවුණේ තමාට රක්ෂාවක් හෝ අනාගතයක් නැති නිසා නොවේ. ඔහු කම්පාවන්නේ සමාජය වෙනුවෙනි. මේ රටට යන කල දවස කුමක් ද? හොඳ දේශගුණයක්, සරුසාර භූමියක්, ධන නිධාන හා වැව්ලි ආදී සියල්ල අපට තිබේ. එහෙත් ලක්ෂ ගණනක් ආහාර, ඇඳුම්පැළඳුම්, නිවාස හා ජීවිතයේ අත්‍යවශ්‍ය අනෙක් නොයෙක් සැප පහසුකම්වලින් තොර ව පීඩා විඳිති. දුක් විඳිති. මේ සමාජයට ඇති සැනසීම කුමක් ද? මේ තත්ත්වය වෙනස් කිරීමේ දී මඟ පෙන්වීමක් නායකත්වයක් දිය හැකි අයට ඇත්ත වශයෙන් සමාජය වෙනස් කිරීමේ අවංක වුවමනාවක් නැත. බහුතර ජනතාවට සෙතක් සලසනු පිණිස ඉදිරිපත් වී සිටින පිරිස තමන්ගේ වතු පිටි ව්‍යාපාර, දේපළ ආදියටත් පහසුකමින් යුත් ජීවන ක්‍රමයකටත් හානියක් වනු දක්මට සූදානම් නැත. සුළු පිරිසකගේ පරිත්‍යාගයක් නැති ව බහු ජනතාවට සහනයක් ලබා දිය නොහැකි ය.

"පිස්සු ළමයෙක්!" ය යි ලියුම කියවා අවසානයේ මට සිතා ගියේ ය. මා සිනාසුණේ පාසලේ දී ගුණපාලගේ මත ගැන අන් බොහෝ ළමයින් කළාක් මෙන් අවඥා සහගත ව නොවේ. මට තේරුම් ගත නො හැකි වුව ද ගුණපාල කියන දේවල ඇත්තක් තිබෙන්නට පුළුවනැ යි කවදත් මම සැලකුවෙමි. ඒ ඇත්ත අවබෝධ කර ගැනීමට මා උත්සාහයක් ගත්තේ ද නැත. එය මගේ ශක්තියෙන් එහා වුවකි.

මම පුංචි නංගී සමඟ ද ගුණපාලගේ ලියුම ගැන කතා කළෙමි. ඈ එය කියවා බැලුවා ය. එහෙත් එහි අඩංගු කරුණු ගැන අනුලා කිසි මතයක් පළ කළේ නැත. සමහර විට ඇයට මේවා ගැන මට තරම් වත් තේරුමක් නැතුව ඇත.



සාමාන්‍යයෙන් ගුණපාලගේ කොයි ලිපියටත් මගෙන් පිළිතුරු අත පසු වූයේ ලියන්නට වැදගත් දෙයක් නොතිබීමෙනි. ඔහුට මෙන් ම දේශපාලනය ගැන ලියන්නට නුපුළුවන. මගේ හදවතට සම්බන්ධ කිසිවක් ඔහු හා කතා කළ නොහැකි ය. ඉස්සර මා ගුණපාලගේ උපදෙසක් පැතුවේ හිසට වධ දුන් ගැටළුවක දී පමණි. මට දැන් එවැනි කරදරයක් නැත. විශේෂයෙන් ඔහුගේ අලුත් ම ලිපියට පිළිතුරු දීම වඩාත් දුෂ්කර කරුණක් විය. දින තුනකට උඩ දී මුණ ගැසුණු බැවින් කිව යුතු සියලු තොරතුරු කියා හමාර ව තිබිණි. වැදගත් කරුණක් ගැන මා සමඟ කතා කරන්නට ඇතැයි ඔහු කීය. මා හමුවීමට අපේ ගෙදරට එන්න දැ යි ඔහු ඇසී ය. "ඒ වැදගත් කරුණ කුමක්ද? අපේ ගෙදරට එන්නේ කවදා ද?" යන ප්‍රශ්න ඇසිය හැකි ද? මේ ගැන විපරම් කළොත් ඔහු පුහු බලාපොරොත්තු ඇති කර ගැනීමට ඉඩ තිබේ. ගුණපාල කෙරෙහි හට ගත් යම්කිසි කාංසාවක් මැඩ ගත් මම දස අතේ කල්පනා කර පිළිතුරක් නොයවන්නට අන්තිමට තීරණය කර ගතිමි.

සිදු හුණු ගෑමෙන් පසුව අලුත් ගෙයි බිත්ති සඳ එළිය ඇති රැයට මට පෙනුණේ ඇත් දත්වලින් තනන ලද්දක් මෙනි. ඉවුම් පිහුම් වැඩ නිම කර, වෙළෙඳාමේ ගොස් එන තුරු නිල්මිණිට කතාන්දරයක් කියා දෙමින් පඩිය උඩ වාඩි වී සිටින මට වැඩ නිම වෙන අලුත් ගෙය සඳ එළියෙන් පෙනෙයි. මගේ සිතෙහි සතුට බෙරෙයි.

ගෙට ගෙවදින නැකත යෙදී ඇත්තේ වෙසක් මාසයේ දවසකට ය. ඒ එන තුරු මට ඉස්පාසුවක් නැත.

විපතේ දී මෙන් ම සැපතේ දී ද වෙනස් නොවන අම්මාගේ මුහුණෙහි පවා අලුත් ගෙයින් නික්මුණු එළියක සෙවණැල්ල වැටී තිබෙනු දක්නට තිබිණ.

මේ වන විට අනුලා මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වී සිටියා ය. නිල්මිණිට අකුරු කියවන්නට තිබුණේත් ඒ අලුත ය. මට එද නිමල් මතක් විය. පළාතට ම සිටි උගතා නිමල් ය. ඔහු ලවා පොඩි එකීට අකුරු කියවා ගන්නට ලැබුණා නම් ය යි මම කල්පනා කළෙමි. ඇයට අකුරු කියවනු ලැබුවේ පන්සලේ ලොකු හාමුදුරුවන් විසිනි.

www.sinhalaelibrary.com

සිංහල අවුරුද්දට කලින් ගෙයි වැඩ නිම විය. මිටි කාප්පයෙන් වට වුණු ඉස්තෝප්පුවත් සාලයත් කාමරයත් සහිත පුංචි ගෙය අපේ තරමට ඉඩකඩ ඇති එකකි. කෑම පිසීම සඳහා කටු මැටි ගසා කුස්සියක් තනා ගනු ලැබිය.

පාසල් නිවාඩුව ආරම්භ වෙත් ම අනුලාත් හවුල් කරගෙන මම ගෙට ගෙවදීමට සූදානම් වීමි. අපි අපේ පුංචි ඉඩම එහෙම පිටින් ම එළිපෙහෙළි කළෙමු. ගෙයි පස් ගැනීමට කපන ලද වළ කුණු ගොඩුවලින් පුරවා කෙසෙල් පැළයක් සිටවීමු. ගෙයි වැඩ කෙරුණු කාලයේ ම බාස්ලා ලවා බුදුන් වැඩීමට මිදුලේ මල්පැළක් සාදන ලදුව තිබිණි. අපි ඒ වටා දස් පෙති රවුමක් ද අසල වතු සුද්ද පඳුරු කීපයක් ද පාර අයින දිගට ක්‍රොටන් ඊකිලි පෙළක් ද මිදුල මැද වෙරි පැලයක් ද සිට වීමු. බක් මහේ වැසි ලැබ මේ සියල්ල හොඳින් වැඩෙන්නට විය.

"කාටද කුසුමේ දූත් ගේ ඉඳුල් කරන්න කියන්නෙ?" යි අම්මා සිංහල අවුරුද්දට කලින් මගෙන් ඇසුවා ය. කලින් මේ ගැන කල්පනා කර නොතිබුණත් මගේ සිතට එක වර නැගුණේ තිස්ස ය. ඒ අදහස වහා පිට නො කළ මම,

"කවුරු හරි ඉතින් හොඳ කෙනකුට කියන්න ඕනෑ" යි වැඩි උනන්දුවක් නො දක් වූ ලෙසින් කීමි.

"රතු මාමට කියමු." යි පුංචි නංගී යෝජනා කළා ය.

"රතු ගොයිය කුහකයා!"

"කවුරු හරි ඉතින් ඉරිසියාවක් කුහකකමක් නැති කෙනෙක් වෙන්න ඕනෑ."

"හිත උඩින් කතා කළාට හිතා වුණාට කෙනෙක් හොඳින් ඉන්නව දකින්න කැමති කීයෙන් කී දෙනා ද? මුසලකමක් නැති කෙනෙක් වෙන්නත් එපායැ" යි අම්මා මඳක් කතා නැති ව සිට "ඩ්‍රයිවර් උන්නැහෙගෙ පවුලට කිව්වොත් නරකද?" යි ඇසුවේ අනුමත නො වෙතැයි සිතෙන් මෙනි.

"අපොයි එක එකක් නෑ." යි වහා කීවේ අනුලා ය.

"මොකද කිව්වොත් තෝන්නෙ? ඒ ගැනි සකසුරුවමට අරපරෙස්සමට හොඳයි. මොනව කිව්වත් කිසි ඉරිසියාවක් නෑ..............."



"නැන්ද නම් ඉතින් කොහොමත් හොඳයි. කියන්න මොකක් ද වගෙ මිසක්. මට නම් කල්පනා වුණේ මහතුන් මල්ලි ගැන. සිංදිවී ළමය..............."

"මහතුන් අයියත් හොඳයි. මම නම් කැමැතියි අම්මෙ ඩ්‍රයිවර් මාමට..........."

"ඒ මනුස්සය වියදම් කාරය. සිය හම්බ කළත් වියදම් සැරයි."

"මට නම් යන්න බෑ. අම්ම ගිහිල්ල කියන්න නැන්දට."

"අවුරුද්දටත් එක්කල ගිහිල්ල කිව්වොත්..........."

"මට නම් මොකක්ද වගෙ. අම්ම යන්න."

"නෑ මම යනව පුංචි එකිත් එක්කල."

"මටත් බෑ"

"අද නෙවි නෙ යන්නෙ. නංගි ඕකට කලබල වෙන්න ඕනෑ යෑ. දන්නම කියා" යි මං කීවේ අම්මාගේ සිත රිදීම වළකනු පිණිස ය.

කමලාවතීලාගෙ පවුලේ උදවිය කෙරෙහි අනුලාගේ ආකල්පය හදිසියේ ම වෙනස් වී ඇත. 'සිසිල' ට යෑමට බැරියැ යි අවුරුදු ද ද ඈ කීවා ය. "තියෙන ඇට්ටරකම" යි කීවත් අම්මා කතා කළේ සැරෙන් නො වේ. පුංචි නංගී එහි නො යන්නේ මට පක්ෂපාත ගතියක් දක්වනු පිණිස බව අම්මාත් ඉවසින් මෙන් දනී. කැවිලි මල්ල ද රැගෙන අම්මා නිල්මිණිත් සමග මිදුලට බට කල,

"අම්මෙ මහතුන් මල්ලිත් එක්ක එන්න කියන්නෑ" යි මම කීමි.

ලොකු පුතා ඩියාගෝ පදවියට පත්වීමත් සමග කමලාවතී කඩ වෙළෙඳාම් අත් හැරියා ය. මේ කාලය වන විට විජයට ආදායම් පාලක දෙපාර්තමේන්තුවේ රක්ෂාවක් ලැබී තිබිණි.

ඇයගේ කඩය කලින් වෙන තැනක පැවැත්වුණු ගමේ සමුපකාරයට බදු දෙන ලදී.

වෙළෙඳාම නිසා ඇසුරට පත් වී සිටි බොහෝ දෙනකු මෙද අවුරුදු කන්නට නො වූ බව අම්මාගේ කතාවෙන් මට සිතා ගත හැකි විය. නිමල් ගෙදර සිටි බවක් ඇය මට කීවේ වත් මා ඒ ගැන ඇසුවේ වත් නැත. අයියාගේ උත්සවයට පැමිණි ගමනේ දී අම්නාප වී ගිය රෝහණ ගෙදර නොපැමිණි බවත් මේ ගැන කමලාවතී කනස්සල්ලෙන් පසු වන බවත් නම් අම්මා මට කීවා ය. මගේ සිත අනියත බියකින් චංචල විය. කමලාවතී තවත් කියා ඇත්තේ වෙළෙඳාම නතර කරන්නට සිදු වීම නිසා තමා ගත කරන වැඩකට නැති ජීවිතය ගැන ය.

"මගෙ අත පය බැඳල හිරේ දම්ම වගේ ජේන් අක්කෙ. පිස්සු වගෙයි." ඇය කියා ඇත.

කමලාවතී වැඩ කරන්නට මිස නිකරුණේ කාලය ගෙවන්නට උපන් ගැහැනියක් නො වේ.

"දූත් මොනවට තනින්න ද?" අම්මා කීවා ය.

"ඒක නම් ඇත්ත තමයි. අර ලොකු පුතාට අවනම්බු නෙ" යි ඇය ඊළඟට කියන්නට ඇත්තේ සෙනෙහසත් ආඩම්බරයත් මිශ්‍ර හැඟීමෙන් විය යුතුය.

කමලාවතීත් අම්මාත් අතර හුවමාරු වුණු හැම වචනයක් ම සවිස්තරව දැන ගැනීමේ ආශාවක් මට ඇති විය. එහෙත් අම්මා සියල්ල නො කියයි. හාර හාර අසන්නට මට නුපුළුවන.

"මොකද ජේන් අක්කෙ තනියම ආවෙ?" යි ඇය ඇසූ බව අම්මාගෙන් කියැවුණේ බැරි වීමකින් විය යුතු ය. මගේ සිත මේ වචන ඔස්සේ ක්‍රියාකාරී වන්නට පටන් ගත්තේ ය. අම්මා ගියේ තනියම නොවේ. නිල්මිණීත් සමඟ ය. පුංචි එකීගෙන් තනිකම මඟ හැරෙන්නේ නැත්නම් තවත් යන්නට සිටියේ මාත් නංගීත් ය. ඇය ඇසුවේ මා ගැන ද? නංගී ගැන ද? වෙන වචනවලින් ඇය අසන්නට ඇත්තේ "මොකද කුසුමෙ නාවෙ?" යන ප්‍රශ්නය ද? මා ගියොත් ඇය මා වැද්ද ගනී ද? 'සිසිල' ට යන ආශාව මට තවමත් ඇත. නිමල් නිසා ම නොවේ. හිතවත් නෑයකුගේ හිතවතකුගේ ගෙදරක් මෙන් අහිංසයට, ළමා වියට, කොටින් කියතොත් හදවතට, ඉතා සමීප වූ තැනක් මෙන් සලකාගෙන ය.



ගෙයි වැඩ අවසන් කර ගත්තේ අමාරුවෙනි. අර පරිස්සමින් කටයුතු කරන්නට වුවා පමණක් නොව රුපියල් දෙසියයක් පමණ ණය වීමටත් සිදු විය. අම්මා ණය වුණේ කවරකුට දැයි මට නො කීවා ය. ඇඳන් දෙකක්, මේසයක්, පුටු හතරක් හා පෙට්ටියක් හැරුණු විට ලී බඩු වශයෙන් අපට කලින් තිබුණේ සෝමා විසින් මිල දී ගන්නා ලද අල්මාරියක් කණ්ණාඩි මේසයක් පමණකි. ගෙයි වැඩට ගෙන ඉතිරි වූ ලීවලින් අපි කල්පියා ම පුටු හයක් ද ටීපෝවක් ද තුන පහ දමන ලෑලි පෙට්ටියක් හා තවත් එවැනි සුළු සුළු බඩු මුට්ටු කීපයක් ද සාදවාගෙන තිබිණි. පුංචි නංගීත් මමත් පරණ වැල් කපා ඇඳන් වියා ඒ දෙකත් මේසයත් පොල් ලෙලිවලින් අතුල්ලා සෝද තැබීමු.

ගෙට ගෙවදීමට දින කීපයක් තිබිය දී අපි පවුල පිටින් ම වඩුමට ගියෙමු. උත්සවයක් වශයෙන් අමුත්තනට ආරාධනා නො කළත් ගමේ කීප දෙනකුට හෝ සංග්‍රහ කරන්නට සිදුවනු ඇත. ගෙදරට කොතෙක් අඩු පාඩු තම් ඇද්ද, අවශ්‍ය බඩු මුට්ටු හා උපකරණ කොතෙක් ඇද්දැයි මට අවබෝධ වූයේ කඩ පොළට ගිය පසුව ය. පිඟන් කෝප්ප, හැඳි, වීදුරු, අත සෝදන භාජන, මල් පෝච්චි, දොර රෙදි, මේස රෙදි, ටීපෝ කවර, පාපිසි, ලාම්පු, බන්දේසි, බේසම් මේ සියල්ල අවශ්‍යතාවෝ ය. මේ සියල්ල මිනිසාගේ ජීවිතයට අවශ්‍ය දේවල් වශයෙන් මට කලින් හැඟීමක් නො වුණු තරම්.

වුවමනා කරන බඩු මුට්ටු හා උපකරණ කොතෙක් වුණත් අතේ තිබුණු මුදලේ හැටියට කටයුතු කරන්නට අපට සිදු විය. පිඟන් දුසිම් භාගයක් හා පීරිසි කුට්ටම් දුසිම් භාගයක් ද වීදුරු කුනක් හා බන්දේසියක් ද මිල දී ගත්තේ අපේ පුංචි උත්සවයට එන අමුත්තනට සංග්‍රහ කිරීමේ අවශ්‍යතාවයටත් මුල් තැන දී කල්පනා කිරීමෙනි.

විවෘත ව අප අතර සාකච්ඡා නොවුණත් ලැමෙන්නට තිබෙන තෑගි ගැනත් අපගේ යටි සිත් ක්‍රියා කරන්නට ඇත. මුදල් දී ගත් බඩු ම තෑග්ගටත් ලැබුණොත් අපරාදේ! එහෙත් අපට අනුන්ගෙන් බලාගෙන අවශ්‍යම දේ නොගෙන සිටීමටත් නුපුළුවන් විය.

www.sinhalaelibrary.com

ගෙවල මාරු වෙද්දී බඩු අස් කරන අවස්ථාවේ මට සෝමාගේ පරණ පොත පත ද ඇඳුම් ද අවුස්සන්නට සිදු විය. මේසය යට අඹ ලෑලි පෙට්ටියක ලොකු නංගී විසින් එකතු කරන ලද පත්තර කෑන්පත් වී තිබිණි. ඇයගේ රන් රිදී බඩු හා වටිනා සාරි ආදී සියල්ල කොළඹ යන ගමන්වල දී වරින් වර ගෙන ගොස් තිබිණි. රූප සුන්දරී තරගයෙන් ජයගත් අවස්ථාවේ තෑගි වශයෙන් ලැබුණු බොහෝ දේවල් ද ගෙදර තබා තිබුණේ නැත. ගුවන් විදුලි යන්ත්‍රයත්, ඉස්තිරික්කයත්, විදුලියෙන් වැඩ කරන ඒවා බැවින් කල් තියා ම ඉන්දපාලට දී තිබිණි. ඇත්තවශයෙන් නංගී ගැන සිත් තැවුලෙන් පසු වූ මට ඒ දවස්වල මේ කිසිවක් ගැන සිතන්නට වත් අවස්ථාවක් නො විය. තෑගි බෝගත් ප්‍රසිද්ධියත් විනාශයට පාර කැපුණු දේවල් වශයෙන් මවිසින් අමතක කරන ලදී.

මා සෝමාගේ පෙට්ටිය අවුස්සන්නට වූයේ සංවේගයකින් මෙන් ම බියකින් ද යුක්තව ය. පාසල් යන කාලයේ දවසක් ලියුම් අවුස්සද්දී ඇයගේ ගුප්ත ජීවිතයට එබිකම් කර බලන්නට මට සිදු විය. සෝමා කුමන ඉරණමකට පත් වුණා දැයි සොයා දැන ගැනීමට තුඩු දෙන හෝඩුවාවක් ඇයගේ අතීතයෙන් වත් ඉතිරි වී තිබේ දැයි කුහුල මෙන් ම ඇය ගැන තව කුමක් නම් දැන ගන්නට ලැබේ දැයි බියක් හා හැකි ගැනීමක් ද පෙට්ටිය අවුස්සන කල මට ඇති විය. වැදගත් කිසිවක් දක්නට තිබුණේ නැත. පියසේන හා අනෙක් අය විසින් ලියන ලද ලියුම් සියල්ල සෝමා විසින් ම පුළුස්සා දමා තිබිණි. එය මගේ සිතට ලොකු සැහැල්ලුවක් විය. ඇයගේ පින්තූර පළ වූ පත්තර හා සඟරා රට අඹ ලෑලි පෙට්ටියේ සුරක්ෂිත ව තිබිණි. ලොකු නංගී මේ සියල්ල එකතු කර ගත්තේ කෙතරම් ආදරයෙන් හා සැලකිල්ලෙන් ද? එපමණක් නොව නම ගිය නිළියක වීමේ තත්ත්වය ලබා ගැනීමේ දී පත්තර පිටු දවසක සහතිකයක් ලෙස ප්‍රයෝජනවත් විය හැකිය යන විශ්වාසයක් හා බලාපොරොත්තුවක් ඇය වෙත පැවැති බව මට කතා බහෙන් සිතා ගත හැකි විය.

කාටුන් හා කැරපොත්තන් කා සිදුරු සහිත පත්තරවලින් ගඳක් නික්මිණි. මම නැවතත් පෙට්ටියේ කෑන්පත් කරනු පිණිස



එක එක පත්තර පිට්ට ගෙන දූලි ගසා ඇඳ උඩ ගොඩ ගැසීමි. ඒ අතර මම පින්තූරයක් දෙස මඳ වේලාවක් බලා සිටියෙමි.

"ඔය පරණ පත්තර මොට ද? විසි කරල දාපන්." යයි අම්මා කීවේ නැත. ඇය කීප වරක් මා ළඟින් එහාට මෙහාට ගිය මුත් නො දන්නා බවක් පෙන්වා කතා නොකර සිටියා ය. අනුලා මා ළඟට පැමිණියෙන් මගේ උර හිස උඩින් පින්තූර දෙස බලාගෙන සිටියා ය. ඇය ද කිසිත් කීවේ නැත. මට හැඬුණේ නිල්මිණි නිසා ය. මිදුලේ සිට දුවගෙන ආ නිල්මිණි මගේ උකුළට පැන ගත්තා ය. උකුළ මත වූ පත්තර පිට්ටක් ඇයට යට විය.

"හා හා දූවේ පත්තරේ ඉරෙයි." මම කලබල වී කෑගැසීමි.

ඈ සිනාසෙමින් දඟලන්නට වූවා ය. ඊළඟට ඇය සිනාසෙමින් ම ඇඳ උඩ වූ පත්තර ගොඩ ඇවිස්සෙන ලෙස දෙපයින් තල්ලු කළා ය. "මෙහෙ එන්න බඩුවක් පෙන්නන්න" යි ඇය සන්සුන් කළ මම ඇඳ උඩ වාඩි කරවා පත්තරයක් පෙරළා දුනිමි. තම මවගේ පින්තූරයක් ඇගේ ඇස ගැසිණි. ඒ දෙස මඳ වේලාවක් බලා සිටි ඈ මගේ මුහුණ බැලුවා ය. ඇය නැවතත් පින්තූරය දෙසත් මා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා ය. ඡායාරූපයේත් මගේ මුහුණේත් ඇති සමානකම මැන ගැනීමේ උත්සාහයක් පුංචි දුවියගේ ඇස්වල තිබිණැයි මට සිතිණි.

"කවුද දූවේ?" අනුලා ඇසුවා ය.

"අක්-ක"

"කොයි අක්ක ද දූවේ?"

"කොයි අක්කද අහන්නෙ?" යි සිනාසුණු නිල්මිණි මගේ උකුළ මත උඩුකුරුව පෙරළී "මේ අක්කනෙ" යි මගේ නිකටට ඇඟිල්ලක් තබාගෙන කීවා ය.

මම නිල්මිණි බදා ගතිමි. මා හැඬුවේ ඇයි දැයි ඇය ඇසුවේ නැත. ඇගේ දෙ නෙත් විස්මිත භාවයකින් යුක්ත විය. ජීවිතයේ සමහර ගුප්ත කරුණු තේරුම් ගැනීමේ ඉවක් ළමා සිත්වලට ඇද්දැයි මම නොදනිමි. අසන දකින වැදගත් නොවැදගත් ලොකු කුඩා හැම දෙයක් ගැන ම දැන ගැනීමේ කුහුලකින් හාර හාරා අසන ළමයින් මෙවැනි ගුප්ත කරුණක් ඉදිරියේ දී ගොළු වීම ස්වභාවයක් ද යන්නත් මම නො දනිමි.

සෝමා ඉකිරි කර ගොස් තිබුණේ බාල සාරි කීපයක් පමණි. එහෙත් මට ඒවා මිල කළ නො හැකි තරම් වටිනා මහඟු වස්තුවක් ලෙස සිතිණි. මම නවන ලද සාරියක් දෝතින් ගෙන එහි මුහුණ ඔබා ගතිමි. සාරියෙන් සුවඳක් නික්මිණි. ඒ සුවඳ ලොකු නංගීගේ සුවඳයි. අහෝ! ඒ සහෝදරත්වයේ සුවඳයි. ඇය මුලින් ම මේ සාරිය අඳිමින් කණ්ණාඩිය ඉදිරියේ හැඩ වැඩ වෙමින් සිටිනු මට තවමත් මතක ය. ඒ කාලයේ ඇය හා මා අතර ඒ තරම් මහාප ගතියක් නො විය. මා සෝමා දෙස බලා සිටියේ හොරෙනි. ඉරිසියාවෙන් නොවේ. ඇයගේ සුන්දරත්වය දෙස මම ආදරයෙන් බලා සිටියෙමි. එහෙත් 'ලොකු නංගී හරි ලස්සණයි ඒ සාරියට' යයි මම නො කීවෙමි. ඇයගේ රූ සපුව අගය කිරීම මා අනුමත නො කළ ක්‍රියා කලාපයකට අනුබල දීමකැයි එද මම සිතුවෙමි. මේ වචන පිට නොකිරීමෙන් - මගේ හැඟීම පළ නොකිරීමෙන් - "නංගියෙ ඔයා හරි ලස්සණයි" යනුවෙන් නො කීමෙන් - සහෝදරිය වෙනුවෙන් මගෙන් ඉටු විය යුතු යුතුකමක් පැහැර හැරී බවට දැඩි පසුතැවිල්ලක් මට ඇති විය. මා සාරිය මුහුණින් ඉවත් කර අවට බැලුවේ මඟ හැරුණු යුතුකමක් ඉටු කරනු පිණිස, කණ්ණාඩිය ඉදිරියේ හැඩ වැඩ වෙන සෝමා දකින බලාපොරොත්තුවකින් මෙනි. දෙපා පණ නැති ව ගියෙන් මම ඇඳේ වැතිර ගතිමි. සෝමා පමණක් නොව මට තාත්තා ද සිහිපත් විය. තාත්තා අලුත් ගෙයක දවසක් හෝ ජීවත්වනු දක්ම මගේ සිහිනවලින් එකක් විය. ඒ සිහිනය සැබෑ වනු දක්නට තාත්තා නතර වූයේ නැත.



## 03

"ඒන්න එනන" ය යි අම්මා කමලාවතී අතින් අල්ලා ගෙට ගත්තා ය.

සැපතක දී මෙන් ම විපතක දී ද කිසි හැඟීමක් සටහන් නොවන අම්මාගේ මුහුණ අද සොම්නසින් විකසිත විය. එවැනි සතුටක් ඇයගේ මුහුණේ මා ඉන් පෙර කිසි දවසක දැක නැත. අලුත් ගෙය නිම කර ගෙවදින්නට ලැබීමෙන් ජීවිත කාලයක් තිස්සේ වවාගෙන ආ බලාපොරොත්තුවක මල් පල ලබන්නට විම නිසා ටිකින් ටික ලියලමින් තිබුණු සොම්නස නැතතටම පිට කරන්නට අම්මා කමලාවතී එන තුරු බලා සිටියා විය හැකි ය. සතුටත් භක්තිය මිශ්‍ර සෙනෙහසක් නිසා මගේ ඇද නෙත් කඳුළින් තෙත් වුණේ නිමල්ගේ මව හා යළි ගැටෙන්නට අවස්ථාවක් ලැබිණැයි හැඟීමකින් නොවේ. කුඩා දවස කොසෙල් ගෙඩියක් හෝ ලොසින්ජරයක් හෝ දී මගෙන් වැඩ ගත්, මට වැඩ ඉගැන්වූ කමලාවතී දකීමෙනි. අම්මා හැරුණු විට මගේ හදවතට එතරම් ළංව සිටි අන් වැඩිහිටි කාන්තාවක් නොවුණා ය.

කමලාවතී එක වර ම මගේ බැල්ම මඟ හැරියා ය. අනතුරුව ඇය මා දෙස බැලුවේ වරදක් කර සමාව ඉල්ලන ඇස්වලිනි. මට නම් ඒ කිසිවක් මතක් වුණේ වත් නැත.

"මල්ලියෙ ඉතින් වාඩි වෙන්නකො"යි මම උතුරන සෙනෙහසකින් තිස්ස දෙ උරෙන් අල්ලා පුටුවක වාඩි කරවීමි. "මන්න පුටුව ඉස් ඉස්සර වෙලා විවෘත කළේ මහතුන් මල්ලියි" මම කීමි.

www.sinhalaelibrary.com

ඒ ඇඳි පටුවන් තවත් එකකුත් කමලාවතී විසින් එදා උදේ කරත්තයක පටවා එවන ලදි.

අපි නැකතට ගෙට ගෙවැදුණේ උදේ අටකුත් විනාඩි දහ නමයට ය. කමලාවතී හා තිස්ස ඉඳුල් කිරීමට ආවේ ඉන් අනතුරුව ය.

"පුංචි වුණත් ගේ සිදේවියි ජේන් අක්කෙ" මුලින් ම ගෙයි එහා මෙහා ඇවිද සාලයේ සිට ගත් කමලාවතී කීවා ය. "ලොකු පවුලක් යෑ. මේ හොඳටම ඇති."

"අනේ අපේ හැටියට මේ මදෑ යි"

"හොඳට ම ඇති. කුසුමෙගෙ මහන්සිය තමයි ඉතින්"

ඇය ප්‍රථම වරට මගේ නම සඳහන් කළේ එවිට ය. මම ඇය දෙස බැලීමි. ඇගේ ඇස් කෙලින් ම මුණ ගැසුණු ප්‍රථම අවස්ථාවත් එය යි. ඊට කලින් එසේ අපගේ ඇස් නෙත් එකට ගැටුණු අන්තිම අවස්ථාව මා සිසිලට ආයුබෝවන් කී දවසේ ය. එකනෙකා වෙත යොමා ගත් බැල්ම ඇහිව ගත වූ මොහොතක අපි එකිනෙකා, නැවත හඳුනා ගැනීමේ උත්සාහයක යෙදුනෙමු ද යි සිතෙයි.

"මම කළ හපන්කමක් නෑ නැන්දෙ"

"කුසුමෙ නැත්නම් මම ද මේව කළේ?" අම්මා කීවේ ආඩම්බරයක් ද ගැබ් වුණු හඬිනි.

"මගෙන් වුණු හපන්කමක් නෑ නැන්දෙ. මහන්සි වුණේ අම්මයි." සිනාසෙමින් වුව ද මා කීවේ කළුළු මැඩ ගන්නටත් තැත් කරමිනි.

"කොහොම කොහොම හරි කොන්ටරැ එකක් ද ගේ පැලක් ගහ ගන්න එක. ඩැයිවර් උන්නැහෙයි මායි ගෙදර කතා වුණේ ම ඒකයි."

ඒ කතාවට තවත් කීසිවකු හවුල් වුණේ නැද්ද?

"මහතුන්ට අද නම් සතුටු ඇති බොහොම" කෑම මේසයේ දී කමලාවතී කී කල තිස්ස මගේ මුහුණ බලා ලජ්ජාවෙන් ඇඹරුණේ ය.



"ලොකු අක්ක මහතුන් අයිය එන නිසාම තමයි ඔය කිරි හොද්ද වෙනම ඉව්වෙ"

"දැන් නම් රසත් නැතුව ඇති. හීතල වෙලා" මම තිස්සට කිරි හොදි බෙදමින් කීවෙමි.

"කිරි හොදියි කිව්වොත් යන්නම් නමට තිබුණොත් ඇති. හැමදම සණ්ඩු කිරි හොදි උයන්නෙ නෑ කියල."

"ඇයි ඉතින් පුංචි කාලෙ ඉඳල ම කිරි හොදි තිබුණොත් වෙන මොකුත් ඕනැයෑ." මා කීවේ ඔවුන්ගේ අතීතයට මාත් හවුල් ව සිටි බව කමලාවතීට මතක් කර දෙන උත්සාහයකින් මෙනි.

"උයනව කියන එක මට මරන්න වගෙ වැඩක් ජේන් අක්කෙ. වෙන ඕනෑ වැඩක්."

"නැන්ද උයන එකට කවදත් කම්මැලියි" මම නැවතත් කීමි. කමලාවතී කතා කළේ මට නොව අම්මාට ය. මා ඇය හා එල්ලී කතාවට යනවා වැඩි ද? මදි පුංචිකමක් වූ බවට හැඟීමක් උපන් නමුත් මම ඒ හැඟීමට තැන නොවුණෙමි.

"වෙළඳාමට පුරුදු වුණා ම එහෙම තමයි. මමත් උයන වැඩේට කම්මැලියි."

"මල්ලිට තව කිරි හොදි ටිකක්?"

කෑමෙන් පසු කමලාවතීට බුලත් හෙප්පුව පිළිගැන් වූ මම "පුංචි නංගියෙ ඔය පඩික්කම ගේන්න" ය යි කීමි.

අම්මා හා කමලාවතී සාලයේ කතාවට වැටුණා හ. නිල්මිණී අම්මාගේ ඔඩොක්කුවේ වාඩි වී ඔවුන්ගේ කට දිහා බලා සිටියා ය. නිල්මිණී අම්මාගේ ඇසුර ප්‍රිය කළා ය. අම්මා වෙළඳාමේ යන බැවින් ඇයට ඒ අවස්ථාව ලැබුණේ කලාතුරෙකිනි.

මම තිස්ස සමඟ මිදුලට බැස්සෙමි. තිස්ස ගැටවරයකු මෙන් වැඩීගෙන එයි. ඔහු හදිසියේ වැඩෙන්නේ තරුණ වියට පත් ලොකු අයියාගේ මුහුණුවර ද හැඩ තිල ද වෙත තවත් ළං වෙමිනි. ඔහුගේ ඇස්, නහය, මුව හා නළල ඇසුරෙන් නිමල්ගේ මුහුණ මැවෙනු නො දක සිටින්නට මට කෙසේ වත් නුපුළුවන් විය. ඔහුගේ උඩුතොල මත යන්තම් කළු වේගෙන එන්නට

පටන්ගෙන ඇත. පිජාමා සරමක් ද 'ටී ෂර්ට්' කමිසයක් ද ඇඳ සිටි තිස්ස යාන්න ය. ඇඟිලි කරු අතර ඇඟිලි හිර වන ලෙස අතිනත අල්ලාගෙන මා සමග වෙල් එළියේ වන පෙතේ ඇවිදින කාලයේ නිමල් ගත කළේ තිස්ස අද පසු කරන වයසයි. අතීතය සිහිපත් වී මතු වුණු හැඟීම් මැඩ ගැනීම පහසු නො විය. මම ඒ සඳහා සිනා සීමි.

"හෝ හෝ ගාල සද්දයක් එනව. නේද?"

"මොන සද්දයක් ද?" තිස්ස මගේ ඇඟිල්ල අල්ලාගෙන ඇසීය.

"මෙන්න මේ පැත්තෙන් එන්නෙ" මම තිස්සගේ මුහුණට ඇඟිල්ල ළං කර සීමි.

"කෝ? මොකක් ද?" තිස්ස මවිත වී ඇසී ය.

"ඔය ඇහෙන්නෙ."

ඔහු තවත් පුදුමයට පත් විය.

"හෝ - හෝ - ගා - ලා - රැවුලක් එන - වා"

තිස්ස රැවුල පිස දමන්නට මෙන් අතින් කට වසා ගත්තේ ය. මම ඔහුගේ බාහුව බදාගෙන උර හිසට කම්මුල තබා සිනාසීමි. මම තවත් යමක් කියා දෙවටොරට 'පටස්' යන ශබ්දය නැගෙන්නට ගසාගෙන මහ හඬින් සිනාසීමි. මම අවිනීත ය යි මට ම සිතෙන තරමට හඬ නගා සිනාසීමි. කමලාවතීගේ අවධානය ද ඇද ගැනීමේ වුවමනාවක් මගේ යටි සිතේ තිබුණා ද යි මම නො දනිමි. එසේ නැතහොත්, මා දැන් සියලු දුක් දොම්නස් ජයගෙන සොම්නසින් ම කල් ගෙවන බවක් කමලාවතීට ඒත්තු ගැන්වීමට මට ඕනෑ වීණි ද?

"අක්ක එහෙ එන්නෙ නැතෙ?"

"එන්-නම්. දැන් එන්නද?"

"එන්න"

මම එවර ද සිනාසුණෙමි. මම පියා ගැනත් නිමල් හැර අනෙක් අයියලා ගැනත් ඔහුගෙන් ඇසීමි. පාසල හා පාඩම් ගැන



කතා කළෙමි. රෝහණ අවුරුද්දට ගෙදර නොපැමිණීම ගැන අම්මා දොම්නසින් කල් ගෙවන බව තිස්ස ද කීවේ ය. තවදුරටත් හඬ නගා සිනාසෙන්නට මම අපොහොසත් වීමි.

"අනේ මම දන්නෙ නෑ දෙවෙනියියට මොනව වෙලා ද කියල." මම තිස්සට ම නොව මට ම කියා ගතිමි.

"අක්ක එහෙ එන්නකො"

මම එහිදී උත්සාහයෙන් සිනාසුණා මිස තිස්සට පිළිතුරක් නො දුන්නෙමි. සිය සොහොයුරා අමනාප වී ගියේ මා 'සිසිල' ට නො යෑම නිසා බව දනිතත් තිස්ස ඉන් එහා දෙයක් සවිස්තරව නො දනී.

"ඔහතුන් ඉතින් යමු." යි ඉස්තෝප්පුවට පැමිණි කමලාවතී කීවා ය. මම ද එදෙසට ගියෙමි. ගෙදර යන්නට පුතාට කතා කළ නමුත් ඇය වෙත කලබල ගතියක් නොවී ය. නැතහොත් තවත් රැඳීමට වුවමනාවක් ඇය වෙත තිබෙන්නට ඇත. අම්මා මේ වුවමනාව හැඳිනගෙන මෙන් මාත් කමලාවතීත් ඉස්තෝප්පුවේ සිටිය දී යම් කිසි වැදගත් කටයුත්තකට මෙන් ගෙට ගියා ය.

"උඹ එහෙ යන්නෙ නැතුව දෙවෙනිය මා එක්කල තරහ වෙලා නෙ කුසුමෙ." යි ඇය කීවේ පරාජිත ගතිය යටපත් කරගෙන පුතකුගේ දඟකාරකමක් ගැන කතා කරන කල මවක තුළ ඇති වන සතුටට උචිත සිනාවක් නගා ගනිමිනි.

ඇය කළේ සැඟවුණු ඇරයුමකි. 'කුසුමෙ උඹ ඒ පැත්තෙ ඇවිත් යන්න වරෙන්.' ය යි ඇය කීවේ නැත. මට අනුබලයක් දීමට ඇය සූදානම් නැත. 'කැමැති නම් ඒ පැත්තෙ ඇවිත් යන්න වරෙන්.' යන අදහස ඇයගේ වචනවල ගැබ් වී තිබුණා විය හැකි ය. මම කිසිත් නොකීවෙමි. හිස් බැල්මක් ඇය වෙත හෙළා මම බිම බලා ගතිමි. තත්පර ගණනකට පසුව හිස ඔසවන විටත් කමලාවතී මා දෙස බලාගෙන සිටියා ය. එවර ඇයගේ දෑ නෙත් හි පරාජිත ගතිය මෙන් ම බැගෑපත් ඉල්ලීම ද වසා ගැනීමට ඇය සමත් වූයේ නැත. අනුකම්පාව පරදවා ආත්ම ගෞරවය පිළිබඳ දැඩි හැඟීමක් මගේ සිතෙහි මතු විය. ඒ හැඟීම එක්තරා ප්‍රමාණයකින් ද්වේෂයටත් ළං වූවකි. මම ඒ ගැන පසුතැවිලි

නොවුණෙමි. ලොකු ධෛර්යයක් ද සිතට නැගිණි. 'මොනාද කුසුමෙ උඹ කියන්නෙ?' යන ප්‍රශ්නය ඇයගේ දෙ තොල් අ[illegible] නළියන්නට විය.

"නැන්දට කියන්න බැරියැ මම එහෙ යනව කියල. මෙහෙ ආවොත් මාත් දෙවෙනියියට ඒ විදිහට කියන්නම්" මම ගණනකට නැති ව කීවෙමි.

"එහෙනම් එහෙම කියපන් උඹත්. මම ලියුමක් යවනව අද හෙට."

මා කමලාවතීගෙන් පළිගත් බවට සිතට ආරූඪ වූ ජයග්‍රාහී හැඟීමක් මොහොතක් එහි රැඳී සිට අනුකම්පාවට ඉඩ දී පහ ව ගියේ ය.

"අක්කෙ එනව නේ ද?" තිස්ස යන්නට හැරෙමින් ඇසී ය.

"ඔව් ඔව්. අක්ක එනව" යි කීවේ කමලාවතී ය.

මම නොපෙනී යන තුරු ම තිස්ස දෙස බලා සිටියෙමි.

"මොනව කිව්වත් නැන්ද ආව නෙ!" යි මා කීවේ අවසාන භාගයේ දී මා තුළ ඇති වූ කැලැඹිලි සහගත ස්වභාව අම්මාගෙන් වසා ගනු පිණිස ය.

"ඒ මනුස්සය කරුණාවයි."

කමලාවතී අම්මා ඇසුරු කළේ සහෝදරියක ලෙසිනි. මා 'සිසිල'ට යෑම් අත් හැර දැමීමෙන් පසුව වුව ද විශා කලක් යන තුරු දිනපතා ම සවස අම්මා ඇයගේ කඩය ළඟ නතර වී ගෙදරට අවශ්‍ය යම් කිසිවක් මිල දී ගැනීමේ පුරුද්ද අත්හැරියේ නැත. අම්මාට අවශ්‍ය දේ පාතදුම්බරෙන් ම ගත හැකි ව තිබුණත් පරණ පුරුද්දට ඇයගෙන් ද යම් යම් දේ ගත්තා ය. බස් සේවය පටන් ගත් පසුව අම්මා කෙළින් ම පැමිණ ගේ ඉදිරිපිට බැස්සා ය. එහෙත් ඇසුර දිගට ම පවත්වා ගැනීමට දෙ' සතියකට වරක් දෙකක් කමලාවතීගේ කඩය ළඟ දී බැස ඉතිරි දුර පයින් ආවා ය. කමලාවතී කඩය වසා දමා ගෙට වීමෙන් පසු ඇය හා අම්මා අතර මේ ඇසුර ද කෙමෙන් අඩු විය. වෙළෙඳාමේ නො ගිය දවසක එළවළු එකතු කරන්නට ගමේ ඇවිදින්නට ගියේ අම්මා



[illegible] ඒ [illegible] දී ඇය කමලාවතීගේ ගෙදරටත් ගොඩවන බව [illegible] නමුත් අම්මා ඒ ගැන විස්තර මා හා කතා කළේ නැත.

[illegible]ගේ ඉඳුල් කිරීමට පැමිණි කමලාවතී හා අම්මා අතර මට [illegible] ඇසෙන්නට කෙරුණු කතාබහට කුමක් ඇතුළත් වුණේ දැයි [illegible] මට ඇති වුණත් මා කිසිවක් විපරම් කළේ නැත.

අලුත්තෝ කීප දෙනෙක් ම පැමිණිය හ. ගමක ගෙට [illegible]දීමක් වැනි අවස්ථාවක සමහරෙක් යුතුකමක් ය යි සිතා [illegible]වින් බැරිකමට එති. තවත් කෙනෙක් අවංකව ම සතුට පළ [illegible]රීමට එති. මොන සිතින් වුණත් කවුරුත් නැගි බෝග ද [illegible] ගෙනාවෝ ය. කෙනකු පැමිණ ආපසු ගිය විගස ගෙනා [illegible]පලය අවුස්සා බලන තුරු අපට ඉස්පාසුවක් නො වීය. පුංචි [illegible] හා පිරිසි කෝප්ප ද පිඟාන් ද ඒවා අතර විය.

"අපරාදෙ අපි සල්ලි දීල ගත්තෙ."

"තෑගි දෙන්න තියෙන්නෙ කල් තියා අහල මිනෑ කරන්නෙ [illegible]වද කියල දැනගෙනයි." යි පුංචි නංගී සිනාසුණා ය.

"එහෙම සිරිතක් තියෙන්නෙ කොයි රටේද?"

"නැති නිසා තමයි කියන්නෙ එහෙම සිරිතක් ඇති කර ගන්න කියල. අපරාදෙ වැඩි දෙනෙක් ගෙනාවෙ අපිට තියෙන [illegible]මයි."

"ගෙනත් දීලත් ඒ මිනිස්සු බැනුම් අහනව"

"බැන්නෙ නෑ මම කිව්වෙ තේරුමක් නැති වැඩක්."

නැමෙන් පසු අම්මා නින්දට ගියා ය.

"අම්මෙ ගෙදර ඉන්න දවසෙවත් නාගන්න" මම හවස ඇයට කීවෙමි.

"උඹල ගිහිල්ල වරෙල්ල මම පස්සෙ යනව"

"අපි එකට ම යමු අම්මෙ." යි පුංචි නංගී යෝජනා කළා ය.

"තුන් මාසයක් යන කල් අලුත් ගෙවල් දෙර වහල පාළුවට අරින්න නරකයි."

"ගේ තනිවෙනව ද අම්මෙ?"

"උඹලට හිනා"

"විකාර" ය යි පුංචි නංගී සිනාවක් ද ඇතිව නැවත කියේ මට පමණක් ඇසෙන ලෙස ය.

"එහෙනම් අම්මල යන්න." යි මා යෝජනා කළේ තනි වීමේ වුවමනාවක් ද දනෙමින් තිබුණු බැවිනි. ගෙදර හුදකලා වූ මම නිදැල්ලේ කල්පනා කරන්නට වීමි.

මට තිස්ස මතක් විය. තිස්ස තුළින් නිමල්ගේ ඒ වයස මතක් විය. ඔහුගේ ඇඟිලිවලට හිරවුණු මගේ අත්වලට දනුණු පහස මතක් කර ගැනීමට මම උත්සාහ කළෙමි. ආදායම් පාලක නිලධාරී නිමල් හතුරුසිංහ මගේ අත් අල්ලාගෙන වෙල් තීරයේ ඇවිදින්නට යන සැටි මතක් කර ආස්වාදයක් විඳීමේ අයිතියක් මට නැත. එසේ ම ගැටවර වියට පා තබමින් සිටි නිමල් පුංචි කුසුම්ගේ අත් අල්ලාගෙන ගිය අන්දම මතක් කරන්නට තහනමක් ද නැත.

කමලාවතී විසින් එවන ලද පුටුවක ඇද වැටුණු මම මට තහනම් නොවූ දෙයක් කළෙමි. ඔහු මගේ කරට අත දමා ගනී. මා ඔහු තරම් උස නැත. මම ඔහුගේ බඳ වටා අත යවමි. අප සඳු නගින කලෙක මෙන් වැනි වැනී ටික දුරක් ගමන් කරමු. එකිනෙකා බලා අනතුරු ව අප සිනාසෙන්නේ එකිනෙකාගේ ග්‍රහණය ද දැඩි කර ගනිමිනි.

වෙලේ ඇවිද වෙහෙස වන අපි සමහර විටක වතුර පාරකින් දහඩියෙන් පිරි මුහුණු ද අත් ද සෝද ගනිමු. ඔහු අතේ රැඳුණු වතුර - බිංදු වශයෙන් මගේ මුහුණ මත වැටෙන ලෙස අතෙහි ඇඟිලි මහපට ඇඟිල්ලෙන් ගසයි. මම දෙ නෙත් පියාගෙන කම්මුල ඔහුගේ පැත්තට හරවා වතුර බිංදු වැදෙන ආස්වාදය විඳිමි.

ඔවුන්ගේ වත්ත එක පැත්තකින් සීමා වුණේ තණකොළ පොල්ගස් ද පඳුරු ද ගල්තලාවක් ද සහිත පාළු ඉඩමකිනි. මෙහි වෙරළු ගසක් ඇත. අපි පුණුන් රැගෙන වෙරළු කඩන්නට යමු. ඔහු හා සමහර දවසක මල්ලිලාත් පොලු ගසා කඩන වෙරළු



එකතු කර ගන්නේ මා විසිනි. මම ගවුම් සායෙහි දමා ගත් වෙරළු ගිය ගෑනුම්බියක් ලෙස සිටින අන්දමින් රෙදි පට මිරිකා ගනිමි. ගල්තලාවට වී අපි වෙරළු කමු.

කුඹුරු වැඩ පටන් ගන්නට පළමු මුඩු වුණු වෙල් තීරය අතිශයින් සුන්දර ය. ලියැදි හරහා යන ඔහු පහත් වී යමක් අහුලා ගනී.

"මොනව ද ලොකයියෙ?"

"ඔටුවක්"

"මොකක් ද අනේ පෙන්නන්නකො" මම ඔහුගේ අතින් අල්ලා අසමි. ඔහු ඇඟිලි තද කර ගනී. මම ඔහුගේ අත මගේ කරෙන් ඉදිරියට දමාගෙන ඇඟිලි දිග හරින්නට උත්සාහ කරමින්,

"දෙන්න කො අයියෙ" යි මුහුණ ඇඹුල් කරගෙන කියමි. ඔහු තවත් පෙරැත්ත කරයි.

"එහෙනම් ඕනෑ ද?" යි ඔහු අසයි.

"ඔව්"

"අතාරින්න............ කන ජාතියක්"

"දෙන්නකො..........." මම ඔහු අතහැර අත්ල පා කියමි.

"කට අරින්න........... දන් ඇස් වහ ගන්න."

මම නිකට උස් වන ලෙසින් මුහුණ ඔහුට පා කට ඇර ඇස් පියා ගනිමි. මගේ දිවට යමක් වැටෙයි. ඇස් අරිමින් කට පියාගත් මදිවට යම්සිසි අමිහිරි රසක් දනෙන්නට වන්නෙන් මම නිතැතින් ම කටේ දමුණු දෙය අතට ගනිමි.

"හා බෙට්ටී!" නිමල් හඬ නගා සිනාසෙයි.

මම හා බෙට්ට ඔහුගේ මුහුණට දමා ගසා 'තුප් තුප්' යනුවෙන් කිප වරක් කෙළ ගසමි. මා හට දැඩි දුකක් හා ලජ්ජාවක් ඇති වෙයි. මම ඔහු විශ්වාස කළෙමි. ඔහු මගේ කටට අමිහිරි දෙයක් නොදමනු ඇතැයි මම සිතුවෙමි. නැතහොත් එවැන්නක් කරතැයි සිහිනෙන් වත් නො සිතුවෙමි. වග විභාගයක් නැති ව මෝඩියක ලෙසින ඇස් පියා ගත්තේ එබැවිනි. ලජ්ජාවත්

ශෝකයත් මැඩගෙන මගේ සිතේ කෝපයක් මතු වෙයි. මා තුළ වුණු වෙනස දකීමෙන් ඔහුගේ සිනාව තුනී වේගෙන යයි.

"නංගි තරහ වුණා ද?"

"යන්න" මම ඔහුගේ අත ගසා දමමි. මම ඔහුට පිටු පා අඩියක් දෙකක් ගමන් කරමි. මම නියර දිගේ දුවමි.

"කුසුම් ඉන්න." ඔහුගේ කටහඬේ බිය රැඳි ගතියක් ගැබ් වී තිබේ.

මම අපගේ ගෙදරට වැටෙන කැලෑ පාර දෙසට ම දුවමි. අතර මඟ දී මට ඇඬුම් එයි. ඔහුටත් යම් කිසි දවසක එවැනි කවටකමක් කිරීමේ - පළිගැනීමේ - සිතක් මට ඇති වෙයි. මා මින් මතු කිසි දවසක ඔහු සමඟ කතා කරන්නේ නැත.

පසුව ද වන විට මගේ කෝපයත්, පළිගැනීමේ සිතත් පහව යයි. මා තුළ ඉතිරි වන්නේ ලජ්ජාවකි. ඒ ඔහුගේ කවටකමට අසුවීම ගැන නො වේ. කවටකමක් ඉවසන්නට බැරිව ඔහු හා කෝප වී පැන දිවීම ගැන ය. මා නැවත ඔහු ඉදිරියට යන්නේ ඒ ලජ්ජාවෙන් ඇඹරෙමිනි.

එක්තරා නිවාඩු කාලයකි. අලුත් ගෙය ඉදිකරන්නට දමුණු අත්තිවාරමේ එළන ලද මාගලක මම වී වනමින් සිටිමි. ඔහු ඉස්තෝප්පුවේ පුටුවක පොතක් බලයි. වී අත ගාන අතර හිස ඔසවන මා දකින්නේ ඔහුගේ දෙ නෙත් මා වෙත යොමු වී තිබෙන සැටියි. ඔහුගේ මුහුණේ සිනාවක් නැත. මම සිනාසී යළි ඉවත බලා ගනිමි. මම තව විකකින් හිස ඔසවා යළි සිනාසෙමි. එද ඔහු වෙත සිනාවක් නැත. ඔහු මට රවනු නො වේ. එහෙත් මුහුණ මා බිය පත් කරවන තරම් ය. තුන් හතර වරක් මා බලන හැම විට ම ඔහු වෙත ඇත්තේ ඒ බැල්ම ම ය. ඔහු පාඩම් කරන අතර සිතට නැගුණු යම්කිසි ප්‍රශ්නයක් ගැන කල්පනා කරනු විය යුතු ය. කල්පනාවක යෙදී සිටින අතර ඔහුගේ බැල්මට මා නිකම් අසු වුණා පමණකි. ඔහුගේ සිත ඇත්තේ අන් අතක - ඔහුගේ ප්‍රශ්නය වෙත - විය යුතුය.

වී වනා අවසන් කර මම මාගල් වාටියේ විළුඹ ගසා දෙ පය රැඳි වී ඇට හළා ගෙට යමි. මා ඔහුගේ පුටුව පසු කර යා යුතු



ය. ඔහු මගෙ අතින් අල්ලයි. මම නතර වී සිනාසීගෙන ඔහුගේ මුහුණ බලමි. තවමත් එහි සිනාවක් නැත.

"ඇයි?"

"මූණෙ දඩිය පිරිල"

"අව්වෙ හිටියම දඩිය දන්නෙ නැතෑ"

මම ගෙට යන්නට හැරෙමි. ඔහු මගේ අත මිරිකා ගන්නට උත්සාහ කළා ම නො වේ. එහෙත් එය අත හරින්නේ නොකැමැත්තෙනි. මම සීමාව ඉක්මවුණු තහනම් පෙදෙසකට යමි. මට අවසර ඇත්තේ පුංචි කුසුම් හා ගැටවර වියට පත් වීමට එන නිමල් ගැන සිතන්නට පමණි. එක්තරා නිවාඩුවක මා කමලාවතීගේ මිදුලේ වී වනමින් සිටි කාලයේ නිමල් තරුණයෙකි. මම ද තරුණියක්මි.

මගේ දණ මඬලෙහි කැලෙ ඇති කළ තුවාලය වුණු කාලයේ මම යුවතියක නොවුණෙමි. එකල ද ඔහු තරුණයෙකි. මට ඒ සිද්ධිය ගැන සිතන්නට අවසරයක් තිබේ ද?

"කුසුම් දන්නෙ නෑ මම කුසුම් ගැන ආදරයක් ඇති කර ගන්න කාලෙ කුසුම් පුංචි කෙල්ලක්."

කමලාවතී වැඩි වශයෙන් වත්තේත් බදු ඉඩම්වලත් පොල් කැඩවූයේ සෙනසුරාද දවස්වල ය. ගෙදර ළමයින් සමඟ පොල් එකතු කිරීමට මට ද සිදු වෙයි. ඔවුන් පොල් එකතු කිරීමට නතර වන්නේ කුරුම්බා ගෙඩියක් කැඩෙන තුරු පමණකි. නිමල් පොල් එකතු කිරීමට නො යයි. මම ඔහුටත් කුරුම්බාවක් ගෙන එමි. මගේ කුරුම්බා ගෙඩිය වත්තේ දී නො කන මම එය ද ඔහු ලවා කප්පවා ගැනීමට ගෙදර ගෙන එමි. අපි ගේ පිටුපසට යමු. නිමල් කුරුම්බා ගෙඩිය කපයි. වෙහෙස වී සිටින මම පැත්ත වාඩි වී බලා ඉඳිමි. නිමල් කුරුම්බා ගෙඩියේ මුහුණත මා වෙත හරවා පිහිය එල්ල කරයි. මම මුහුණ වසා ගනිමි. 'චිස්' යනුවෙන් කුරුම්බා වතුර දළුවක් මගේ පපුවට වදී.

"ඒයියා! මගේ ගවුමත් තෙමුණ" මම සිනාසී උඩ පනිමින් කියන්නෙමි. නිමල් කුරුම්බාව මා වෙත දිගු කරගෙන බලා සිටී. ඔහුගේ ඇස් දකින මා තුළ ලජ්ජාවක් හට ගනී. ඇයි දැයි මම නො දනිමි.

www.sinhalaelibrary.com

"බොන්න"

"අයියා බොන්න. මම අනික බොන්නම්"

"සිව්වම බොන්න"

මා දැතින් බඳ ගත් කුරුම්බා ගෙඩිය කට තියා බොන අතරත් ඔහු දිගට ම මා දෙස බලා සිටී. 'ගුඩුස්' 'ගුඩුස්' ශබ්දය නංවා කුරුම්බා වතුර උගුරෙන් පහළට යයි. ඔහු බලා සිටිනවා ඇත. මම අහසට යොමු වූ ඇස් කරකවා ඔහුගේ මුහුණ බැලීමට උත්සාහ ගනිමි. මට වතුර ඉස්පොල්ලේ යයි. මම සිනාසෙමි.

"පෙරේති! පෙරේතකමට ගුඩු ගුඩු ගාලා බීගෙන ගියා. ඒකයි හිරවුණේ."

"පෙරේතයා! පෙරේතකමට මම බොන හැටි බලාගෙන හිටිය. තමන්ට එකක් තිබිලත් මදිවට. ඒකයි මට ඉස්පොල්ලෙ ගියේ."

ඔහු සිනාසුණේ නැත.

"ඔය හෙම ඇඟට විද්දෙත් බලාගෙන" පසුව මම කියමි. ඔහු දෙවන කුරුම්බා ගෙඩියේ මුහුණ කපා අවසාන ය. ඕනෑ නම් මට ඉවසාට පැන ගත හැකි ය. මම බියෙන් ඉවත් නො වෙමි. ඒ වෙනුවට දැතින් මුහුණ වසාගෙන ඔහුට පිටුපාමි. වතුර පාරක් මගේ පිටට වැදෙයි.

"ඒ පාර හොඳටම තෙමුණා. ඉන්නකො නැන්දට කියන්න" මම ඔහුට රවමි.

අප ගෙට යන්නේ යාළුවන් වශයෙනි.

එකල ද මම යුවතියක ව නො සිටියෙමි.

පුංචි කාලයේ මට රිදවූයේ රෝහණ ය. ඔහු මට වොකු ඇන්නේ ය. හිසකෙස් අනුරකින් අල්ලා ඇද්දේ ය. ඔහු ඒ සියල්ල කළේ මා හොඳට ම රිදවන අදහසිනි. නිමල් ද පසු කාලයක මට ඊට සමාන හිංසාවන් කරන්නට විය. රිදවන - හිංසා කරවන - අදහසින් ම නො වේ.

නිමල් අත දිගු කර මගේ කෙස් වැටියෙන් අල්ලා ඇදී. මම "අනේයියා නිකා ඉන්න-කෝ" යි කියාගෙන, බේරෙනු පිණිස



ඉවතට පැන්නොත් රිදෙනැයි සිතාගෙන මෙන් ඔහු වෙතට ම ළං වෙමි. ඔහු දැතින් ම මගේ හිස අවුල් කරයි. ඒ වෙනුවට මම ඔහුගේ මනාව පීරුණු කෙස් වැටිය අවුල් කරමි. නිමල් මගේ දෙ අත එකතු කර මැණික් කටුවෙන් අල්ලා ගනී. මා ග්‍රහණයෙන් මිදෙන්නට උත්සාහ ගන්නේ ඔහුගේ උකුළ මත වැටෙමිනි. ඔහු රිදෙන්නට නො රිදෙන්නට මගේ කම්මුල් මිරිකයි. මා කම්මුල් බේරා ගන්නට ගිය තැන ඔහු මගේ ඉගටිය මිරිකයි. අනතුරුව උරහිස මිරිකයි. ගෙල මුලට කිහිල්ලට ඇඟිලි යවා හංකිති කවයි. මම දිගට ම හඬ නගා සිනාසෙමි. ඔහුගේ මුහුණේ සිනාවක් නැත. ඒ ඇස් තුමක් කියත් ද යි මම නොදනිමි. එවකට මා යුවතියක ව නොසිටි බැවිනි.

දිය නාගෙන එන අම්මාගේ, නංගීගේ හා නිල්මිණිගේ කටහඬ මට ඇසිණි. කහනාම ඉඩමකට ගොස් අයිතිකරුවකුට අසු වීමේ දී මෙන් මම තිගැස්සී සිට ගතිමි.

"උඹත් ගිහිල්ල නාගෙන වරෙන්."

"අද තියන සතුට හේදිලා යයි ද කියල බයයි අම්මෙ. ඒක නිසා නාන්නෙ නෑ."

"අක්කගෙ සතුට හිතේ තෙවෙයි එහෙනම් ඇඟේ?"

මා ඊට සිනාසුණා ද නැද්ද යි කීමට මම නොදනිමි.

"අම්මෙ මාළු පිණි නම් ඕනෑ තරම් තියනව දවල් ඒව. හාල් ටිකක් ලිපේ තිබ්බොත් ඇති." මම අම්මා අතට තේ කෝප්පය දෙමින් කීමි.

"තව කවුරුත් එයි ද?"

"දැන් කවුද එන්න ඉන්නෙ?"

නැගී බෝග බලාපොරොත්තුවෙන් ම තොව තව තවත් ආවොත් හොඳ ය යි මට සිතිණි. මෙවැනි සිහි කටයුතු දවසෙක අපගේ ප්‍රීතියට හවුල් වීමට හිතවතුන් පැමිණීම කෙතරම් සම්පතක් ද යි මට හරි හැටි අවබෝධ වූයේ මෙදින ය. මීට පසු අහල පහළ ගෙට ගෙවදීමක් වුණොත් කිව්වත් නැතත් යා යුතු ය යි මම සිතා ගතිමි

www.sinhalaelibrary.com

තීන්ත සුවඳ මා අතීතයට ගෙන යයි. 'සිසිල්'ට ගෙවදින කාලයේත් මේ තීන්ත සුවඳ මට දැනෙමින් තිබිණි. අතීතය වෙත සිත රැඳවීමේ අයිතියක් හෝ අවසරයක් මට නැත. ඒ කාලය මගේ සිතේ සටහන් වී ඇත්තේ උත්සවයක් පිළිබඳ මතකයක් වශයෙන් පමණක් නො වේ. ඊට තව බොහෝ දේවල් සම්බන්ධ ය.

මම නිල්මිණි තවා නින්දට දැම්මි. ඇයට නින්ද ගොස් තිබුණත් මම ඇය ළඟ ඇඳේ වැතිර සිටියෙමි.

"කවුද එනව" ඉස්තෝප්පුවේ සිට පැමිණ කී අනුලා ඇස් හකුළුවා යළි මිදුල දෙස බලා සිටියා ය.

ඉටිපන්දම් එළිය වඩ වඩාත් ළං විය. මම අතින් හිස පස්සට පිරිමදිමින් පිටතට ආවෙමි.

"මාම නේද..............?"

"ජේන් අක්කෙ!" ඔහු එක පයක් පඩියට තබා ගෙට ගොඩ නොවී හතර වී කීවේ ය.

"එන්න, එන්න ඩැයිවර උන්නැහෙ"

"එන්න මාමෙ"

ගෙට ගොඩවුණු ඔහු එළිය නිවා වටපිට බැලී ය.

"දෙන්න මාමෙ ඕක." මම ඔහු අතින් ගත් පොල් කට්ටත් ඉටිපන්දමත් මිටි නාප්පය මත තැබිමි. කටුවේ ඉතිරි වූ පොල් මද ටික පිළිස්සී කර සුවඳක් - නැහැයට අමිහිරි නොවූ සුවඳක් - එන්නට විය. ඔහු තරමක් බීමත් ව සිටින බව මට වහා අවබෝධ විය.

"එන්න මාමෙ මෙහාටම" මම ඔහු ඇතුළට කැඳවීමි.

ඇල්බට් ඩැයිවර උන්නැහේ සාලයට ඇතුළු වූයේ අනවසරයෙන් තැනකට යන කෙනෙකු මෙන් මඳක් පසු බාගෙන ය. මත් පැන් බී සිටින නිසා ඔහු තුළ ලජ්ජාවක් ඇති වුණා විය හැකි ය.

"මාමෙ වාඩිවෙන්න."



"ඩැයිවර් උනනැහෙ උදේ වරුවෙ වෙන්නැති වැඩ?"

ඔහු කෙළින් ම අපගේ මුහුණ බැලුවේ නැත. අම්මා බුලත් හෙප්පුව ඔහුට ගෙනාවා ය.

"ඉන්න මාමෙ සිගරැට් ඇති."

අවශ්‍යම කෙනෙකුට දෙන්නට ය යි මම 'ත්‍රී රෝසස්' පැකැට්ටුවක් ගෙනත් තැබුවෙමි. එසේ සිගරැට්වලින් සංග්‍රහ කිරීමට තරම් කෙනෙකු ආවේ නැත. මම සව් කොළය ගලවමින් සිගරැට් පැකැට්ටුව ගෙනවිත්,

"පුංචි නංගියෙ ගිනි පෙට්ටිය ගේන්නැ" යි කීමි.

ඔහු එය අතට නොගෙන මා විනිවිද යන බැල්මක් හෙළාගෙන මඳ වේලාවක් සිටියේ ය.

"එපා" යි කටින් නොකියා ඔහු අත පෑවේ ය. "........... එපා දුවේ එපා. මම දරුවන්ගෙන් සිගරැට් බොන්නෙ නෑ............. උඹ මට දරුවෙක්."

ඔහු අම්මා අතින් ගත් බුලත් හෙප්පුව උකුළ මත තබා හඬ නගා සිනාසී පුවක් කැල්ලක් සොයන්නට විය. පුවක් කෑල්ල අතට ගත් ඔහු,

"ජේන් අක්කෙ. මා එක්කල තරහද?" යි ඇසී ය.

ඔහු අතට ගත් පුවක් කෑල්ල කටට දමා ගත්තේ සෑහෙන වේලාවකට පසුව ය.

"අනේ මොනවට තරහ වෙනව ද? ඩැයිවර උන්නැහෙල අපේ සහෝදරයො වගෙ"

"ඒක නොවෙයි මම අහන්නෙ. ජේන් අක්කල තරහ ද මාත් එක්කල? තරහද මම අහන්නෙ?"

ඔහු ඒ ප්‍රශ්නය ම නැවත නැවතත් අසන්නට විය. තව තවත් අලුත් වචන එකතු කර තරහ නැතැයි නැවත නැවතත් කියන්නට අම්මාට සිදු විය.

"යමු නංගියෙ අපි මොකුත් හදන්න." ය යි අනුලාත් සමඟ කුස්සියට ගිය මම ඔවුන්ගේ කතාවට කන් දෙමින් ම අල බැදුමක් පිළියෙළ කළෙමි.

www.sinhalaelibrary.com

අප පුංචි කාලයේ වැඩ අවසන් ව වෙරි වී ගෙදර එන අතර ඇල්බට් ඩ්‍රයිවර උන්නැහේ අපගේ ගෙදරට ද ගොඩ විය. ඒ අවස්ථාවල දී මමත් සෝමාත් ගේ ඇතුළට වී ඔහුගේ කෝලම් බලා විනෝද වීමු. එහෙත් මෙදින විනෝදයක් පිළිබඳ හැඟීමක් මා තුළ ඇති නො විය.

"අල ටිකයි බතුයි විතරයි රස්නෙට තියෙන්නෙ. අනිත් සේරම හීතල වෙලා." කෑම සූදානම් කරමින් මම කීමි.

"ලොකු අක්කෙ ලුණු ගෙඩියක් ලියමු ද?"

"නෑ කැලි හිටින්න උම්බලකඩ ටිකක් තලල ගන්න. මිරිස් දල. මාම ඒකට ආසයි. බීලත් නෙ ඉන්නෙත්............"

මා මේසයට කෑම ගෙන එන අතර ඔහු මට කතා කළේ ය.

"දුවේ මෙහෙ වරෙන්."

ඇල්බට් ඩ්‍රයිවර් උන්නැහේ අතින් අල්ලා මා තමා වෙත ඇද ගත්තේ ය. කුඩා දවස වෙරි වී අපගේ ගෙට ආ ඔහු කොතෙක් මා සුරතල් කර ඇද්ද? ඒ කාලයේ මා ඔහුගෙන් මිදී පැන යන්නට උත්සාහ කළත් දැන් මට බියක් නැත.

"උඹ මා එක්කල තරහ ද දුවේ?"

ඔහු කෙළින් ම මගේ මුහුණ බලාගෙන සිටියේ ය. මත් ගතියෙන් පුංචි වූ ඒ ඇස් තුළ දඟලන වේදනාවක් දක්නට විය.

"මොටද මාමෙ මම තරහ වෙන්නෙ?"

"තරහ නම් කියපන් දුවේ.............. මම ඔය වෙන............. වෙන............. මිනිස්සු වගෙ නෙවෙයි."

"මාම මට තාත්තා කෙනෙක් වගෙයි." කී මම යටි තොල විකා ගතිමි.

"උඹ එහෙම හිතනවද දුවේ."

ඔහු ඒ ප්‍රශ්නය ඇසුවේ මා කී දෙය අදහන්නට බැරිව මෙන් හිස පහත් කරගෙන මගේ මුහුණට තවත් ළං වී සිය නොන් පහරින් මගේ ඇස් පත්ල හාරන්නට තැත් කරන්නකු ලෙසිනි.



"උඹ එහෙම හිතනව ද? එහෙනම් මට ඇති! උඹ දන්නව ද දුවේ උඹත් මට දරුවෙක් වගෙ.......... උඹට මතක ද...........? මතක ද දුවේ පුංචි කාලෙ උඹට කතා කළා. මතක ද? මට කෙල්ලො නැති නිසා උඹව අපේ ගෙදරට ගන්න කතා කළා..........? උඹ ආවෙ නෑ....." තරවටුවකට මෙන් ඇඟිල්ල උරුක් කර ඔහු කීය. "........... උඹ ආවෙ නෑ. ආව නම් ඉවරයි නෙ.......... මේ කිසි කරදරයක් නෑ.......... ආව නම් ඉවරයි නෙ. උඹ ආවෙ නෑ.......... මතක ද?" ඔහු පරණ විහිළුවක් මතක් කර හඬ නගා සිනාසුණේ ය. ඒ සිනාව අනුචිත එකකැයි මම සිතමි.

'මෙයින් එකෙක් මට දියන් ජේන් අක්කෙ. මට මේ ලොකු එකී දියන්.' එදා ඔහු කී කල 'අනේ එක්ක යන්න' ය යි අද කිව යුතුව ඇත. අම්මාට එසේ කිය හැකි ද? ඒ වෙනුවට,

"ඩ්‍රයිවර් උන්නැහේ යමු කෑම කන්න." යි අම්මා වතුරු වීදුරුව ඔහු වෙත පා කීවා ය.

"යමු මාමෙ"

"යං යං වතුර එපා"

ඔහු මේසයට ගියේ මගේ අතින් අල්ලාගෙන ය.

"අනේ මම දන්නෙ නෑ. කෑම ටික නම් හීතල වෙලා ඇති." අම්මා ඔහුට බත් බෙදමින් කීවා ය. මම ව්‍යාංජන බෙදුවෙමි.

"මාමෙ මේ අල ටික දුන් හැදුවෙ. රස්නෙයි. ඒකෙන් වැඩිය ගන්න."

"මොට ද දුවේ මාන්සි වුණේ? උඹේ අතින් ලුණු මිරිසක් හැදුවම මදි ද? මම ආවෙ උඹේ අතින් බත් වේලක් කාල යන්න."

"මේ මාමෙ මිරිස් කරලකුත් තැලුව. ඒක මාමට හොඳ ඇති."

"මහතුන් ගෙදර දනුත් කතා වෙනව උඹේ කිරි හොද්ද ගැන."

"දවල් ආව අම්මත් එක්කල. කුසුමෙ ඔන්න මහතුන් මල්ලිටමය කියල වෙන ම කිරි හොද්දකුත් හැදුව" යි කී අම්මා "ඒක තරක් වෙලා ඇති" යි මගෙන් රහසෙන් මෙන් ඇසුවා ය.

"ඒක ඇති්තයි අම්මෙ හැදුවෙත්." මම පසුතැවිල්ලකින් යුක්ත ව කීමි.

ඇල්බට් ඩැයිවර් උන්නැහේ නිහඬ ව කෑම කෑවේ ය. අනා ගත් බත් පිඩක් මුවට ළං කර යළි ආපසු ගත් ඔහු හිස ඔසවා බැලී ය. ඔහු කීප වරක් තදින් ඇසි පිය නැගී ය.

"දුවේ! දුවේ මම මේ කියන්නෙ උඹටයි අම්මටයි දෙන්නටම.......... කියපන්.......... කියපන් උඹ මා එක්කල තරහ ද?"

"අනේ ඩැයිවර උන්නැහෙ මොනව කියනව ද මේ? තරහ වෙන්න මොන වැරැද්දක් කළාට ද? අපි අදත් එදා වගෙමයි."

ඔහු හා තර්ක කිරීමෙන් පලක් නැත. තරහක් නැතැයි කියන්නට කියන්නට ඔහු තව තවත් කතාව ඒ අතටම දිග් ගස්සනු ඇත.

"දුවේ.............. දුවේ මේක කියන්නෙනත්............. ජේන් අක්කෙ............. මම ඔය අනිත් ඇයො වගෙ නෙවෙයි. මට කරන්න දෙයක් නෑ ජේන් අක්කෙ. මම කියන්නෙ ඒකයි.............. මා ගැන නම් අහිතක් හිතන්න එ-පා.................! මට කරන්න දෙයක් නෑ"

"ඩැයිවර උන්නැහෙට අපෙන් වැරැද්දක් වුණා නම් ඒකට සමාවෙන්න. අපි කියන්නෙ ඒකයි."

ඔහු තවත් විනාඩියක් පමණ නිශ්ශබ්ද ව කෑම කෑවේ ය. කතාව එතැනින් අවසන් වෙතැයි සැනසීමක් මට ඇති විය.

"අපේ ලොකු පුතා? මෝඩයා! ඉගෙන ගන්නට මෝඩයි"

ඔහු පහත් වන්නට යන හිස ඔසවා කෙළින් කර තබා ගත්තේ ආයාසයෙනි. පහතට එල්ලෙන වම් අත අමාරුවෙන් ගෙන මේසය මත තබා ගනී. මොහොතකින් ආපසු පහත හෙළා ගනී.

"තවම පොඩි ළමයි නෙ.............. ඉගෙන ගන්නයි කියල තේරුමක් තියෙනවයැ?"

"ලොකු පුතාගෙ උත්සවයට ආවට පසුසෙ දෙවෙනිය තව ම ආවෙ නෑ............ අම්මත් එක්කල සණ්ඩු වෙලා ගියේ.............." යි ඔහු අනතුරු ව කීවේ සිනාවක් ඇතිව ය. රෝහණ මව සමග අමනාප වී යෑම ගැන ඔහු සතුටු වන බවකි.



"දෙවෙනි ළමය ටිකක් මුරණ්ඩු නෙ කවදත්"

"ඌට යමක් තේරෙනව ජේන් අක්කෙ"

වචන වලින් ඔහු පිටින් පළ වුණු දෙයක් හැර අපි එහි නිධානය සොයා ගැඹුරට යැවෙන කිසිවක් නො කීවෙමු. කතාව මැද නිශ්ශබ්දතාවක් ඔහු වූ කීප අවස්ථාවක දී ම දත් දත් ඔහු පත්ලට යන කිසිවක් කියනු ඇතැයි මම සිතීමි. ඔහු කතා නැති ව සිටියේ එය අප අතින් කෙරෙතැයි සිතාගෙන ද විය යුතු ය. අන්තිමට දෙ පැත්තෙන් ම නො විය. මා තුළ බලාපොරොත්තු සුන් වූ ගතියක් ඇති විය. කෑමෙන් පසු බුලත් විටක් කා ඔහු තවත් ටික වේලාවක් කතා කරමින් සිටියේ ය. වැඩිපුර කියැවුණේ එක ම දේවල් ය.

ඔඩතුරෙන් මුදල් පෝට්ටුවක් ගත් ඩැයිවර් උන්නැහේ එය අකීකරු ඇඟිලිවලින් බුලත් කොළයක එතුවේ ය. ඔහු දෙ අත එකතු කර බුලත් කොළය අල්ලා අම්මා වෙත ගියේ ය.

"ඩැයිවර් උන්නැහෙ ආසු එක මට ඇති. තෑගි මොට ද?"

"තැන්ද තෑගිත් අරගෙන ආව මාතම............. ගේ අඳුල් කළෙත් තැන්දනෙ?"

"හ් ඒව මම දන්නෙ නෑ............ ඒව තැන්දගෙ තෑගි. මම ඒවට හවුල් නෑ. ජේන් අක්කෙ මේක මගේ් පුළු තෑග්ගක්."

අම්මා වරදකට සමාව ඉල්ලන ඇස්වලින් ඔහු දෙස බලා තෑග්ග අතට ගත්තා ය. අනතුරුව ඔහු මට ළං විය.

"දුවේ" ඔහු මගේ හිස අත ගෑවේය. ".............. දුවේ මම ගිහිල්ල එන්නම්"

මම බිම බලා ගතිමි. ඔහු මගේ හිස මත තැබූ අත උර තලය දක්වා ගෙනැවිත් මිරිකා මා තවත් තමා වෙත ළංකර ගත්තේ ය. මතක ඇති දවසෙක තාත්තා මා වැළඳගෙන නැත. ජීවිතයේ මුළු කාලය තිස්සේ මා තාත්තාගේ හෝ එවැනි අන් කිසි වැඩිහිටියකුගේ හෝ පහසක උණුසුම නො ලැබීමේ පිපාසයකින් පසු වූ බවට හැඟීමක් මට ඇති විය. මම ඇල්බට් ඩැයිවර උන්නැහේ වෙත තුරුළු වී දෙ අතින් ම ඔහුගේ බාහුව බදා ගතිමි.

www.sinhalaelibrary.com

"මට කොළන්න දෙයක් නෑ දූවේ" යි ඔහු මා තවත් මිරිකාගෙන කීය. මම වහා ඔහුගේ මුහුණ බැලීමි. ඔහු ඒ වචන කීවේ උගුරෙනි. ඔහුගේ මුහුණ විරූපී වී තිබිණි. මගේ කම්මුලට කඳුළු කැටියක් වැටිණි. මම තරයේ තොල විකාගෙන ඔහුට තවත් තුරුළු වීමි.

"මොනවද මේ ඩැයිවර උන්නැහෙ කියන්නෙ? අපි අතර ඇයි හොඳයිකම් නැති වුණා ද? අපේ අහිතක් තියනව ද?"

ඔහු කතා නැති ව ම මා අත හැර අත් දංඩෙන් දෑස් පිසදා ගනිමින් ඉස්තෝප්පුවට ගියේ ය.

"නංගියෙ අර ඉටිපන්දම පත්තු කරල ගන්න."

තවත් වචනයකුදු කතා නො කර මිදුලට බට ඇල්බට් ඩැයිවර උන්නැහේ වැනි වැනීම ගියේ ය. ඉටි පන්දම් එළිය ද වැනි වැනී නො පෙනී යන තුරු බලා සිටි මම සුසුමක් හෙළා ගෙට ගියෙමි. සිත් පිත් නැත්තියක ලෙස අනුලා සියල්ල නිහඬ ව බලා සිටි බව මා දුටුවේ එවිට ය. ඇය වෙත වූයේ හිස් බැල්මකි.

"අම්මෙ අපිත් කාල ඉවරයක් කරමු."

"මට නම් බඩගින්නක් නෑ"

අපි තිදෙනා ම මේසයට වාඩි වීමු. මෙසේ කවුරුත් මේසයක වාඩි වී ගෙදර දී එකට කෑම ගත් ප්‍රථම අවස්ථාව මෙය යි.

"ඩැයිවර උන්නැහෙ දැන් ඉස්සර වගෙ බොන්නෙ නෑ. මය අද ඔහොම වුණාට." ය යි අම්මා කීවා ය.

අපි ඊට කිසිත් නොකීමු.



# 4

අනුලාත් සමග මා එක් සවසක අපේ කඩා දමන ලද පරණ ගෙයි ගෙපළෙහි කිරි හබරල සිටුවීම සඳහා පාත්තියක් සකස් කරමින් සිටිද්දී මිදුල දෙසින් බයිසිකල් සීනුවක හඬ ඇසිණි. මම හැරී බැලුවෙමි.

"නංගියෙ ගුණපාල ඇවිදින්"

"ඒ ගුණපාල ද?"

"ගුණපාල වාඩිවෙන්න" යි කියාගෙන මිදුලට පැමිණි මම "වාඩි වෙන්න" යි නැවත ද පවසා පිටුපසට ගොස් වහා දෙ අතේ මඩ සෝදාගෙන ඉස්තෝප්පුවට පැමිණියෙමි. මා කලින් දුටු දාට වඩා ගුණපාල කළු වී මුහුණ තවත් වැහැරී සිටියේ ය. මා වෙත වහා ඇති වූයේ අනුකම්පාවකි.

"කොහොමද ගේ හොයා ගත්තෙ?"

"අහගෙන අහගෙන ආව."

"ගුණපාල කළුවෙලා ටිකක්"

"මේ ටිකේම ඇවිද්ද, අදත් උදේ ගෙදරින් පිටත් වුණු ගමන්"

මම කුස්සියට ගියෙමි. අනුලා තේ වතුරට කේතලය ළිප තබමින් සිටියා ය.

"මම නම් හිතන්නෙ නංගියෙ ගුණපාල දවාලට කාලත් නැතුව ඇති කියල."

www.sinhalaelibrary.com

"මොනවද දෙන්නෙ?"

"පුංචි ගිහිල්ල පාන් බාගයක් අරගෙන එන්න"

"පාන් විතරක් ද?"

"නෑ කෙසෙල්ගෙඩි තුන හතරකුත් එක්කල."

"කෝලි කුට්ටු?"

"ඇඹුල් වුණාට කමක් නෑ. අර ලාච්චුවෙන් සල්ලිත් අරගෙන යන්න."

"කුසුම්ගෙ ව්‍යාපාර කටයුතු හෙම කොහොමද?" මා ආපසු පැමිණි කල ගුණපාල ඇසී ය.

"ඔහේ ටික ටික කරනව. ගුණපාලටත් තවම මොකුත් නෑ නේද?"

"මම ඒ ගැන ඒ තරම් බලාපොරොත්තුවක් නෑ කුසුම්."

"එහෙම බලාපොරොත්තු අත් අරින්න එපා."

ඔහුගේ ඇස්වලට අමුතු එළියක් ආවේ ය. මම එයින් බියපත් වීමි.

"............... රක්ෂාවක් ගන්න කොයි තරම් කිව්වත් කොහේ හරි දන්න අඳුරන කෙනෙක් ඉන්න ඕනෑ. මේ ගමේ කීප දෙනෙක් ම රක්ෂාවල් හොයා ගත්තෙ එහෙමයි."

"ඒක තමයි කුසුම් මම කවදත් කියන්නෙ. ප්‍රජාතන්ත්‍ර වාදය කියල අපිට තියෙන්නෙ විහිළුවක් කියල."

මා සිනාසුණේ ඒ විහිළුවට නො වේ. වැඩි දුර යන්නට මතු ඔහු දේශපාලනයට බසින බව දැන සිටි බැවිනි.

"ගුණපාල දැන් ලියන්නෙ නැද්ද?"

මගේ ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ගුණපාල දිග විස්තරයක් කරගෙන ගියේ ය. ඔහුගේ කාලය ගෙවුණේ ලිවීමට පමණක් නොවේ. ඔහු දවල් දවස වැඩි පුර ගත කළේ ගෙදරින් පිට ය. ඔහු නොයෙක් තැන්වල ඇවිදින්නට ගියේ ය. ගඟ අයිනට ගොස් පැය ගණන් කල්පනාවේ යෙදී සිටියේ ය. පන්සලට ගොස්



හාමුදුරුවනගෙන් පරණ පොත පත ඉල්ලා ගෙන බණ මඩුවේ මුල්ලකට වී කියෙව්වේ ය. රෑ අනෙක් අය නින්දට ගිය කල යම් යම් දේ ලීවේ ය. මෙසේ ලියන ලද ඇක්සයිස් පොත් කාමරයේ ගොඩ ගසා ඇත.

අප මෙසේ කතා කරන අතර පුංචි නංගී බන්දේසියක තබාගෙන පාන් සහ කෙසෙල් ගෙඩි ගෙනාවා ය.

"මේ මගෙ නංගී. ඔයා ගැන හොඳට දන්නව"

ගුණපාල අනුලා දෙස බලා සිනාසීගෙන පාන් කෑල්ලක් අතට ගත්තේ ය.

"මම දකින්න ආසාවෙන් හිටිය. මම හිතාගෙන හිටියෙ ගුණපාල කියන්නෙ ගොඩක් උස මහත කෙනෙක් කියල."

"නංගී එහෙම හිතන්න ඇත්තෙ ඔයාගෙ අදහස් වලටයි."

ගුණපාල පාන් පෙත්තක් කෙසෙල් ගෙඩියක් කෑවේ සෑහෙන වෙලාවක් කුසගින්නේ සිටි බව හඟවමිනි. මගේ අනුකම්පාව දැඩි විය.

"පව් අනේ. අතේ සල්ලිවත් නැතුව ඇති" යි මට සිතිණි.

පවතින කිසිම දේශපාලන පක්ෂයකින් ජාතියේ වුවමනාවන් ඉටු වෙතැ යි විශ්වාසයක් ගුණපාල තුළ නැත. ජනතාව පීඩා විඳිති. පීඩනයෙන් මිදෙන්නට ජනතාවට වුවමනා ය. ඔවුන් ඒක රාශී කර බලවේගයක් ලෙස මෙහෙයවීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ද නව නායකත්වයක් ද අවශ්‍ය ය. ගුණපාල සොයන්නේ මේ වැඩ පිළිවෙළ හා නායකත්වය යි.

"අපි අපේ වැඩක් බලාගන්නෙ නැතුව රට හදන්න අපිට බෑ." යි මම අන්තිමට කීවෙමි.

වැරදි සමාජ ක්‍රමයක් වෙනස් කිරීමේ කටයුත්ත එම සමාජ ක්‍රමයේ විෂමතාවන් නිසා පීඩාවට පත් පිරිසගේ ම යුතුකමක් හා වගකීමක් බව මට ඒත්තු ගැන්වීමට ඊළඟට ගුණපාල සෑහෙන වචන සමූහයක් වැය කළේ ය. රෝහණ අපේ ගෙදරට ආවත් මට නිදහසේ කතා කරන්නට ඉඩ දී ගේ ඇතුළට වී ගත කරන අනුලා, උළුවස්සට හේත්තු වී සිටියා ය.

www.sinhalaelibrary.com

"මූලික වෙනසකම් නොකර ප්‍රශ්න විසඳන්න බැරි බව අවබෝධ වුණු දාට මිනිසුන් ඒ වෙනස්කම් කරන්න සූදානම් වෙයි." ඔහු කීය.

"අපි එදාට බලා ගනිමු."

"ඒ දවස ඉක්මන් කරන එකයි කුසුම් අපිට තියෙන එක වැඩක්"

"අපි?"

"ඔව් අපි! කුසුම් මම අපි වගෙ ඉන්න තවත් ලක්ෂ ගණනක්"

"අනේ මම ඇර"

මගේ සිනාවට අනුලා හවුල් නොවුණා ය.

ගුණපාලගේ මුහුණටත් අඳුරක් ළඟා විය. මා තුළ නැවත අනුකම්පාවක් ද එසේ කීම ගැන පසුතැවිල්ලක් ද උපන්නේ ය.

තමන් දරන මත හා අදහස් උදහස් අනුමත කරන කෙනකු නොමැති වූ කල ගුණපාල තැවෙයි. මම පාසලේ දී පවා මේ බව දැන සිටියෙමි. ඔහු මා ප්‍රිය කළ එක කරුණක් නම් අනුමත කළත් නැතත් තමා කියන දේවල් ඉවසිල්ලෙන් අසා සිටීමය. ඔහු එයින් ද සැනීමකට පත් විය. මගේ අද කතාවෙන් ඔහුගේ සිත රිදෙන්නට ඇත.

ගුණපාලගේ කතාව නතර වුණු කල මගේ සිතට තවත් සියක් ඇතුළු විය.

ඇත්ත වශයෙන් ඔහු පෞද්ගලික දේ නො මැතිව දේශපාලනය ගැන දිගින් දිගට කතා කරගෙන යෑම ගැන මම එක අතකට සතුටු වීමි.

මා හමුව කතා බස් කිරීමට වැදගත් කරුණක් ඇතැයි කලින් දා නගරයේ දී ගුණපාල මට කීය. මේ වැදගත් කාරණය කුමක් ද? කුතුලක් ඇති වූ අතර ම ඔහු කියන දෙයට සවන් දීමට මම පසුබට වීමි.

ඔහුගේ මේ ගමනේ පරමාර්ථයත එය ම විය යුතු ය.



අපේ ගෙදර එන්න දැ යි ගුණපාල ඇසුයේ අමාරුවෙනි. කතා කරන්නට ආ දෙය අද ඔහු කිරීම ඔහුට ඊටත් වඩා අමාරුවක් ව ඇතුවා විය හැකි ය. නිශ්ශබ්දතාව මැද ගුණපාල තමා අදහස් කරන දෙය කියා ගන්නට ධෛර්යය එකතු කරනවා විය හැකි ය. ඊට කලින් ඔහුගේ අවධානය අන් අතක යොමු කළ යුතු ය. වෙන කතාවක් ඇද ගත යුතු ය. අනෙක් අතට මගේ සිතට දුකක් ද වෙයි.

ගුණපාලට මා හා කතා කර ගන්නට ඇත්තේ කුමක් දැයි ඇසීමේ උනුකමක් මා වෙත ද ඇත. මා එය නො ඇසීම ඔහුට කරන වෙනස්කමකි. මේ අඳුරු මුහුණට එළියක් ලබා දීමට මගේ එක වචනයක් වුව ද සෑහෙයි. එහෙත් මම එය කෙසේ නම් කරන්නෙම් ද?

"කුසුම මම ආව එක කරදරයක් ද?" මා පත් දුෂ්කරතාව වටහාගෙන මෙන් ඔහු ඇසී ය.

"අනේ නෑ. මොකක් ද කරදරේ? කොයි තරම් එකක් ද කතා කරන්න ලැබුණු එකත්."

"මම දන්නව මගෙ කතාව කුසුමට කරච්චලයක් වෙන්නත් ඇති. හැබැයි මට වෙන දෙයකුත් නෑ කතා කරන්න දේශපාලනය ඇර"

"ඔයා ඉස්සරත් එහෙම ම නෙ"

ඔහු මගෙන් බලාපොරොත්තු වුණේ අතීතය මතක් කරවා ගැනීම නොවේ. ඒ බව මම මුහුණින් ම දැන ගතිමි.

"කුසුම් දැන් අඳින්නෙ නැද්ද?"

"දැන් ඒව මතකත් නෑ ගුණපාල"

"අපිට වගේ නොමෙයි. ගෑනු ළමයෙකුට ගෙදරට ම වෙලා ඉන්න එක ලේසි නෑ."

"ඒක නම් ඇත්ත. වෙලාවකට මට පිස්සුයි. අර පොඩි එකී ඉන්න නිසා ගණනක් නෑ."

"පාඨව යන්න අඳින්න. කුසුමට ඒ කාලෙ ලස්සණට අඳින්න පුළුවනි."

www.sinhalaelibrary.com

මා ඒ වර අතීතය මතක් කරන්නට ගියේ නැත.

කිසියම් වැදගත් පෞද්ගලික කරුණක් ගැන නොකියා ම ගුණපාල පිටත් ව ගියේ ය.

"ගුණපාල ආයෙ වෙලාවක එන්නැ" යි මම ඔහු මිදුලට බට කල කීමි.

අනුලාත් මමත් ආපසු පාත්තිය සකස් කරන්නට ගියෙමු. අප වැඩ කළේ ගුණපාල ගැන කතා කරමිනි.

"මම හිතුවටත් වැඩිය හොඳ එක්කෙනෙක්." අනුලා කීවා ය.

"හොඳ වුණාට ඒ අදහස් හෙම මළුවට ගන්න එපා."

"ඇයි එයා කිව්වෙ වැරදි දෙයක් යැ?"

"වැරදි නෑ. ඇත්තක්. ඒ වුණාට මට හිතෙනව නිකම් විකාර වගෙයින් කියල"

පුංචි නංගී ඊට යමක් නො කීවා ය.



## 05

ගෙය සාදා ගැනීමෙන් පසුව මගේ සිතට කරදර කිරීමට ඉතිරි වූ අනෙක් කරුණ ණය ගෙවා ගැනීමේ ප්‍රශ්නය යි. ගෙට ගෙවදී අවසාන වන විට අපි රුපියල් තුන් සිය ගණනක් ණය වී සිටියෙමු. එකට වෙළෙඳාම් කරන ගැහැනුන්ගෙන් මුදල් ණයට ගත් බවට ඉඟියක් අම්මා මට දී තිබුණත් මෙහි දී ඇය කමලාවතීගේ පිහිට පතන්නට ඇතැයි මට සිතිණි. එහෙත් මා ඒ ගැන හාරා අවුස්සන්නට ගියේ නැත.

අම්මාගේ සිත ක්‍රියා කරන්නට වූයේ අන් කරුණක් ගැන ය. මගේ විවාහය පිළිබඳ ව දත් ඇය කල්පනා කරන බව මට ඉවසින් මෙන් දැනෙන්නට විය. මම එක වර ම ඇයගේ මේ අදහස ගැන උනන්දුවක් නො දැක්වූයෙමි. එහෙත් මට දිගට ම ඒ ගැන නොසිතා සිටින්නට බැරි තැනට කරුණක් යෙදිණි.

අම්මාත් ගෙදර සිටි එක උදයක ජේතන් බාස් පාරේ ගියේ ය.

"ඊට පාරෙන් ම යන්නෙ එන්නෙ නැද්ද විටක්වත් කාල යන්න?" යි අම්මා ඔහුට කීය.

අතර මඟ දී දුටුවොත් හිනාවක් හෝ වචනයක් දෙකක් හෝ හුවමාරු කරගනු විනා, පාරේ යන විට අම්මා කිසි දවසෙක ජේතන් බාස්ට ගෙට කතා කර නැත. පරණ ගෙයි සිටිය දී මෙන් නොව අලුත් ගෙට පැමිණි පසුව දන්නා හඳුනන කෙනෙකුට ගෙට කතා කිරීමේ දී අපට චකිතයක් නොවීම නිසා මෙදින මා මුලින් ම අම්මාගේ ක්‍රියාව ඒ තරම් කුකුසකට භාජනය නොකළෙමි.

"මේ ළමයට තාම රස්සාවක් හොයා ගන්න බැරිවුණා නේ ද?" යි ඔහු ගෙට ගොඩ වී වාඩිවෙමින් කීය.

"ඒක නෙන්නම් තාම බැරි වුණා නෙ."

"රස්සාවල් හොයන්න බෑ දැන් වෙන අතක් බලා ගන්නව මිසක්." ය යි කී සේනන් බාස් දත් විලිස්සා සිනාසුණේ ය.

ඔහු මගුල් කපුවකු බව දැන් සිටියත්, "බාස් උන්නැහෙට තේ වතුර ටිකක් වක්කර ගෙනෙන්." ය යි අම්මා කියන තුරුත් මට සැකයක් පහළ වී තිබුණේ නැත.

මා රක්ෂාවක් සෙවීමේ උත්සාහය තව ම අතහැර නැත. මගුල් කපුකමට සේනන් බාස් ලොකු ලොක්කන්ගේ ගෙවලට ද යයි. අම්මා මඟ ගිය සේනන් බාස්ට ගෙට කතා කර දුන් තේ කෝප්පයක් පිරිනමන්නටත් යන්නේ ඔහු ලවා රක්ෂාවක ඔත්තුවක් ලබා ගැනීම සඳහා හිතවත් කර ගන්නට ය යි තේ කෝප්පය පිළියෙළ කරන අතර මම කල්පනා කළෙමි.

"වැඩ පහසින් සම්මානත් ඇතුව නෙ පාස් වුණේ" යි අම්මාගෙන් කියැවෙනු අසා මගේ මතය තවත් තහවුරු විය. එහෙත් ඔවුන්ගේ කතාව ගැන ඉන් ඉදිරියට සැලකිල්ලක් නොගත් මම,

"හදිසියක් නෑ. නිවී හැනහිල්ලෙ සුදුසු තැනක් බලමු කො" යි. අම්මා මිදුලට බට සේනන් බාස්ට කියනු අසා වහා ඉස්තෝප්පුවට ආවෙමි. මා දුටු විගස අම්මාගේ මුහුණේ බියාදු ගතියක් මතු විය.

"මොනවද අම්මෙ?"

"නෑ මොකුත්"

"මොනවද ඒ මිනිහ කියන්නෙ?"

"නිකම් කතා කළා."

මම සිනාසුණෙමි. මදක් නතර ව සිට පිස්සියක මෙන් හඬ නගා තත්පර ගණනක් නැවත දිගට ම සිනාසීමි.

අම්මා තම මුහුණේ සිනාවක් නැගෙනු මගෙන් වසන් කරගෙන මා මඟ හැර ගෙට යන්නට ගියා ය. මම පිටුපසින් ගොස් දෙ උරෙන් අල්ලා අම්මාගේ පිටට කම්මුල තබා ගතිමි.



"කියන්න මොකක්ද කුමන්ත්‍රණය කියල"

මාත් ඇඳෙන්නට අඩි කීපයක් ගිය අම්මා තොවැරෙන් මගේ අත ගසා දමා,

"කෝලම් නොකර හිටපන්" ය යි කීවා ය.

"මම කොහේ හරි යන්නද?"

අම්මා පුදුමයෙන් මෙන් මගේ මුහුණ බැලුවා ය. මා සිනාසුණු ගමන් ම ය.

"අම්මට මම එපා නම්?"

"උඹට දැන් දහනමයක්."

"දහ නමේ නපුරුයි" මම නැවතත් කතාව විහිළුවට ම හරවා ගතිමි.

පුංචි නංගීට මේ කපුකම ගැන කියා ගන්නා තුරු ඉස්පාසුවක් නැති ව මම බලා සිටියෙමි.

"අපේ ගෙදර ළඟදි මගුලක් නෙ" අනුලා පැමිණි පසු මම කීමි.

නංගි විස්මය රැඳි ඇසින් මගේත් අනතුරුව අම්මාගේත් මුහුණ බැලුවා ය.

"............... නේද අම්මෙ?"

"ඇත්තද අම්මෙ?"

"අක්කගෙන් ම අහගනින්"

"මොකක්ද අක්කෙ කියන්න කො"

"අද සේනන් බාස් ආව. අර කපුරාළ?" මම ඇස් නටවා කීමි.

"මගුල් ජෝඩුවක් ගෙනාවද?"

මම හඬ නගා සිනාසීමි.

"කෝලං නොකර කියන්නකො."

"ඉතුරු ටික දන්නෙ අම්ම"

"අම්මෙ අක්ක සතුටු වගෙ.............."

"මට සතුටු තමයි.............. මට අඩුවකට තිබුණෙ එච්චරයි." තුනී වෙමින යන සිනාව ඇතිව මම කීමි.

"අක්කෙ මොකක් ද අර කතාව?" යි පුංචි නංගී නැවත මගෙන් ඇසුවේ බොහෝ වේලාවකට පසුව ය. මම සිදු වූ සියල්ල ඇයට කීමි. ඇයගේ මුහුණෙහි මා දුටුවේ හිස් බැල්මකි.

මතු පිටින් විහිළුවක් ලෙස සලකා සිනාසුණු නමුත් මගේ සිත දැඩි ලෙස නොසන්සුන් විය. අම්මාට දිය හැකි ක්ෂණික පිළිතුර 'මට තව කල් තියනව' යන්න ය. ඇත්ත වශයෙන් ම මට දැන් ම විවාහයක් වීමට කිසි ම අදහසක් නැත. පවුලට ආර්ථික වශයෙන් සුරක්ෂිතකමක් නැත. මානසික වශයෙන් මගේ කිසි ම සූදානමක් නැත.

මා නිමල් ගැන අදහස් අත හැර බොහෝ කල් ය. එහෙත් මගේ සිතෙහි තවත් කෙනකු පදිංචි කරවීමට තරම් ඉඩකඩ පැදි ඇද්දැයි සොයා බැලීමේ පුළුවන්කමක් පවා තවමත් මට නැත. පෙම්වතකු වශයෙන් නොවුණත් යම්කිසි ස්වභාවික ප්‍රතිමූර්තියක් වශයෙන් මගේ හදවත නිමල්ගේ හොල්මන තවමත් නිරන්තරයෙන් අරක් ගනු ලැබ ඇත. නිමල් ගැන සිතන කල මට දැන් කිසිදු වේදනාවක් ඇති නොවන බව ඇත්තකි. එසේ වූයේ මගේ සිත ප්‍රේමය පිළිබඳ හැඟීම්වලින් සසල නොවන තරමට ගල් වී තිබෙනු නිසා ද යි මම නොදනිමි.

නිමල් ආපසු ලබා ගන්නා බලාපොරොත්තුවක් ද මට නැත. එසේ ම නිමල්ගෙන් තොර ව අනාගත ජීවිතය ගොඩ නංවන අන්දම ගැන සැලැස්මක් ගැන ද මට නොසිතෙයි.

යම් දවසක අනුලා පමණක් නොව නිල්මිණීත් ඉගෙනගෙන වයසට පත් ව විවාහ වී දරුවන් ලබතැ යි ඇතැම් විට කල්පනා වෙතත් මා විවාහයකට පත්ව මවක වන්නට සිටින කෙනකු ලෙස සිත ගන්නට මම කිසිසේත් සමත් නොවෙමි. කොටින් කියතොත් අනාගතය ගැන බලන කල මා හා සම්බන්ධ කොටස තිරයකින් වැසී තිබෙනු මට පෙනේ. ඒ තිරය ඉරා දමා ඉන් ඔබ බලන්නට තරම් ශක්තියක් හෝ හේතුවක් හෝ තව ම මට නැත.



ධූරමනාවෙන් කල්පනා නොකළත් නොයෙක් විට මට නිමල් ගැන නිතමට සිතෙයි. අම්මා වෙළෙඳාමට ගිය දවස්වලට දවල් ආහාරයෙන් පසුව නිල්මිණී නින්දට ගිය කල පාසලේ සිට නංගි එන තුරු මා ගත කරන්නේ තනිවම ය. මා කෑම කන්නේ අනුලා ද පැමිණි පසුව ය. මෙවැනි අවස්ථාවල වැඩි වශයෙන් මගේ සිතට ඔහු ඇතුළු වෙයි. එහෙත් වැඩි වේලාවක් සිතෙහි රැඳවා නොගෙන පිට මං කරවීමට නොහොත් යටි සිතෙහි හැංගවී සිට මතු වූ ඔහු යළි ඔබා තැබීමට තරම් ශක්තියක් දැන් මට තිබේ.

නිමල් හා විවාහ වන්නට නොලැබුණාට මගේ කිසිම පසුතැවිල්ලක් හෝ කණගාටුවක් හෝ ඇත්තේ නොවේ. එහෙත් ඔහුගේ ඇසුර නැතිවීම ගැන මට සමහර විට පාළුවක් දැනෙයි. නෑදෑයින් හෝ හිතවතුන් හෝ අඩුවෙන් සිටි පවුලකට අයත් මා විසින් බාල කාලයේ පටන් ම ඇල්බට් ඩ්‍රයිවර් උන්නැහේගේ අඹුල සලකනු ලැබුවේ හිතවතුන් හා නෑදෑයින් මෙනි. ගමේ හෝ අන් පිට හෝ ළෙන්ගතුකමකින් යන්නට තිබුණු එක ම තැන 'සිසිල' යි. නැන්දලාගේ හෝ අන් කෙනකුගේ හෝ තැනකට අවුරුද්දකට වරක් දෙකක් නෑගමක ගියා නම්, ඒ යුතුකමක් වශයෙන් ගිය ගමනක් පමණකි.

සබඳකම නැති වීම ගැන මේ අතින් බලන කල එක්තරා දුරකට කණගාටු නොවී සිටීමට මම අසමත් වෙමි. ඔවුන්ගේ නිවස මට තවත් මගේ ම ගෙදරක් ව තිබිණි. මම 'සිසිල' ඉදිවෙනු දුටුවෙමි. එහි දොර රෙදි මැසීමි. ගෙවදින පිරිසට උත්සවයට මගේ ම කමකින් හවුල් වීමි. අතු පතු ගෑවෙමි. ඒ කුස්සියේ කෑම පිසීමි. මිදුලේ වී වැතුවෙමි. එහෙත් මට අද අසල පාරේ යන විට ඒ දෙස බලාගෙන යන්නට වත් නුපුළුවන.

මා සරසවි පිවිසුම් පෙළ විභාගය අවසානයේ පාසලේ දී හමු වීමෙන් පසුව නිමල් සමග වචනයක් වත් කතා කරන්නට අවස්ථාවක් ලැබුණේ නැත. කතා කරන්නට තබා ඔහු දකින්නට වත් ලැබුණේ කීප විටක් පමණකි. නිමල් හතුරුසිංහ වියාකරණ පදවිය ලැබ මේ කාලය වන විට අවුරුද්දක් පමණ ගෙවී තිබිණි. ඒ අතර මා ඔහු දුටුවේ ද තුන් වරක් පමණකි. ඔහු මෝටර්

www.sinhalaelibrary.com

රියක් පදවාගෙන ගියේ ය. අපේ දෙ දෙනාගේ මුණ ගැසෙන් ම මගේ හදවත මොහොතක් හෝස් ගා ඇවිළී ගොස් ඒ ගින්දරෙහි වේදනාව පැය ගණන් ඉතිරි වී තිබී ඔහේ පහ වී ගියේ ය.

බාල කාලයේ සිට දනහැඳින සිටි හිතවතකු ලෙස ඔහුගේ තොරතුරු දන ගැනීමේ ආශාවක් ඇතැම් විට මට ඇති වෙයි. ඇත්ත වශයෙන් සැපදුක් විමසා ලිපියක් ලියන්නට මට නොයෙක් වර සිතිණ. මොකක් දෝ වැඩකට පැන්සලක් අතැති ව සිටි එක දවසක 'ආදරණීය ලොකු අයියේ' යි කඩදාසියේ මා අතින් ඉබේ ලියැවිණි. මොන මුහුණුවරින් සබඳකමක් යළි පටන් ගත්තත් අවසාන වශයෙන් යොමු වන්නේ එක ම තැනකට බැවින් මම අදහස යටපත් කර ගතිමි. මට නම් ඔහු බලාපොරොත්තුවලින් තොර ව සහෝදරයකු වශයෙන් ඔහු සමග ඇසුරක් පවත්වාගෙන යන්නට මේ තත්ත්වය යටතේ වුව ද පුළුවනැ යි සිතෙයි.

මා අමතක කර දමන්නට උත්සාහ ගන්නා නිමල්ගේ රූ සටහන නොයෙක් විට අලුත් වන්නේ රෝහණ හා තිස්ස නිසා ය. මේ දෙ දෙනා තවමත් මට අහිමි නො වූහ. ගමට ආවොත් රෝහණ මා බැලීමට එයි. මේ නිසා බාල කාලයේ අප අතර ඇසුරක් නොවුණත් පසුව මම ඔහු වෙත ඇල්මක් ඇතිකර ගතිමි.

ඉඩක් ලද හැම අවස්ථාවක ම මම ඔහු යන තිස්ස නවතා කතාවට අල්ලා ගතිමි. තිස්ස හා අනුලා දෙ දෙනා ම ඉගෙන ගත්තේ එක ම පාසලක බැවින් ඔහු හා මා සමග කතාවට වැටෙන කල නොයෙක් වර ඈ ද හවුල් වුණා ය. හතුරුසිංහ පවුලෙන් අනුලා ප්‍රිය කළේ ඇල්බට් ඩැයිවර් උන්නැහේ හා තිස්ස පමණකි. ඇය පූර්ව ජ්‍යෙෂ්ඨයෙන් මැදි මහ විද්‍යාලයට ඇතුළු වන කල තිස්ස විද්‍යාංශයෙන් සාමාන්‍ය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයට සූදානම් වෙමින් සිටියේ ය. ගෙදර දී සන්සුන් නිශ්චල ළමයකු වුව ද තිස්ස පාසලේ දී ඉගෙනීමට මෙන් ම ක්‍රීඩා ඇතුළු අනෙකුත් බාහිර වැඩ කටයුතුවල ද උනන්දුවක් දක්වූ ක්‍රියාශීලී කඩිසර ශිෂ්‍යයකු බව මට අනුලාගෙන් දනගන්නට ලැබිණි. ඔහු පාසලේ ජනප්‍රිය චරිතයකි.



තිස්ස අනුලා හා මාත් මෙසේ එක්වුණු සමහර විටෙක පාසල ගැන කෙරෙන කතාබහ මා නො දන්නා අලුත් ළමයින් හා ගුරුවරුන් ද සිද්ධීන් ද ගැන ඔවුන් දෙ දෙනාට පමණක් සීමා වන අවස්ථාවල දී පාසල් වියෙන් ඈත් වී වැඩි වයසකට පත් වූ බවට පාළුවක් මට ඇති වෙයි.

මම තිස්සගෙන් කියැවීමට පොතපත ඉල්ලා ගතිමි. සමහර දවසෙක ඔහු නංගි අත මට පොත් එවවේ ය. උදය කාලයේ ඔහුනට අපගෙ ගෙවල් ඉදිරිපිටින් ඒ පැත්තට යන බස් රියක් නො විය. සවසට නංගීත් තිස්සත් ආවේ එක බස් රියේ ය. මේ නිසා මැදි මහ විද්‍යාලයට ඇතුළු වීමෙන් පසුව තිස්ස හා අනුලා අතර සබඳකම වඩාත් ළංවීම පුදුමයක් නොවේ.

"මෙ සතා කළාට මම අක්කත් එක්කල තරහයි." තිස්ස මා හමු වූ අවස්ථාවක දී කියයි.

හේතුව දන්නා නමුත් "ඒ මොකදැ?" යි මම ඇසීමි.

"අක්ක එහෙ එන්නෙ නෑ."

'සිසිල' මට තහනම් තැනක් වූ අන්දම මතක් වීම නිසා මගෙ මුහුණෙන් පැන යන්නට යන සිනාව තව දුරටත් රඳවා ගනු පිණිස,"කිරි හොදි ඕනෑ වෙලාදැ?" යි මම කතාව විහිළුවකට හරවා ගන්නට උත්සාහ කරමි. මා මෙසේ කියන කල තිස්සගේ මුහුණ වඩාත් තරක වෙයි.

"අක්ක හිතන්නෙ මම අක්කට අපේ ගෙදර එන්න කියන්නෙ මය කොහෙල්මල් කිරි හොද්ද උයව ගන්න විතරමයි කියල. ඒකයි මට වැඩියම තරහ" එක දවසක් ඔහු කීය.

"එහෙම තරහ ගන්න එපා ඉක්මනට නාකි වෙයි. බඩ පිස්ස එහෙම ඉක්මනට නාකි වුණොත් කොහොමද? මම හිස සලමින් කීමි. "............... මල්ලියෙ" මම අනතුරුව බැගෑපත් හඬින් කතා කළෙමි. "............... මම දන්නව මල්ලියෙ. මම ඔක්කොම දන්නව මම දන්නව වගේම මල්ලිත් දැන් දන්නව නේ ද? දන්නෙ නැති වුණත් දැන ගන්න ඕනැනෙ. මහතුන් ලොකු ළමයෙක් නෙ දැන්. හොඳ මල්ලියෙ? මගෙ වෙනසක් නැතෙ මල්ලියෙ. ඒ ඇති නෙ! අපි ඔය ගැන මීට පස්සෙ කතා නොකර ඉඳිමු. හොඳේ! එහෙම හොඳයි නේද?"

www.sinhalaelibrary.com

"මම දන්නෙ නැහැ අර දෙවෙනියිය කියන්න වාගෙ.............."

"දෙවෙනියිය කියන්න වාගෙ මොනවද? ඇයි කියන්න ගිය එක නැවැත්තුවෙ? කියන්න බලන්න. දෙවෙනියිය කියන්න වාගෙ මොකක්ද කියල."

"ලොකු අක්ක හැම දෙයක් ගැනම හැම කෙනෙක් ගැනම බලනව තමන් ගැන ඇර"

"ඉදා! කවද ද පණ්ඩිත විභාගෙ පාස් කළේ?" මම හඬ නගා සිනාසී ඇසීමි.

"අක්කට හිනා"

"මල්ලිත් හිනා වෙන්න! කඳුළු අතරින් හරි හිනා වෙන්න - ඒකයි මහත්තුන් හපන්කම!" ය යි මා කීවේ සිනාවක් ඇතිව නොවේ.

"හැමෝටම බැනෙ අක්කෙ එහෙම කරන්න"

"ඒකමනෙ මල්ලියෙ ඒකෙ තියෙන අගයත්"

"අක්කට හොඳයි මහණ වෙන එක."

අනුලාට මහණ වෙන කතාව කියන්ට ඇත්තේ තිස්ස ද? මම ඒ ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට වෙහෙස නො වීමි.

"මම මහණ වුණාම මට කිරි හොදිත් එක්කල දනෙ ගෙනත් දෙනව ද?" යි මම ඇසීමි. ඔහු කතා කළේ නැත.

"මහත්තුන්" මම අප අතර මතුවුණු නිහඬතාව බිඳ දමමින් තිස්සගේ උර හිසට අත තබා කතා කළෙමි. "............... මල්ලි කිව්ව නේද මම අනික් අය ගැන බලනව කියල මම ගැන නැතුව? මල්ලිට මම එකක් කියන්නම්. අනික් ඔක්කොම ගැන බලන්න ඕනෑ නෑ. අපි අම්මල ගැන බලන්න ඕනෑ මල්ලියෙ. අම්මල ගැන බලන්න ඕනෑ මල්ලියෙ. අම්මල ගැන හිතන්න ඕනෑ."

"ඒකම තමා අක්කෙ අපිට වෙලා තියෙන්නෙ."

මම තිස්සගේ උරහස මිරිකා ගතිමි.



තිස්ස හා රෝහණ තරමට පවුලේ අනෙක් ළමයි මා හා ඇසුරට පත් නො වූහ. විජය වරක් මගේ සිත දිනා ගැනීමේ උත්සාහයක යෙදුණත් පසු කලෙක සාමාන්‍ය කෙනෙක් බවට පත් විය. මේ හැර ඇල්බට් ඩැයිවර උන්නැහේ මා මග ඇරියා තරම්. ඔහු අපේ ගේ අසලින් දවාලක පයින් ගියේ කලාතුරකිනි. එකල ඔහු මට මුහුණ දුන්නේ මග හරින්නට ඉඩක් නොලැබෙදුත් පමණකි. මේ ක්‍රියාව මා හා අමනාපයෙන් දැයි වරක් මම සැක කළෙමි. ඔහු වෙත වූයේ මා හා නො කැමැත්තක් නොව මට වරදක් කළ කෙනකුගේ පසුතැවිල්ල බව පසුව තේරුම් ගත හැකි විය. අපේ ගෙට ගෙවදින දවසේ මම ඒ බව උදක් ම පසක් කර ගතිමි.

මේ කාලය වන විට විජය කොළඹ කච්චේරියේත් සෙනරත් ගාල්ලේ මහජන බැංකුවේත් රක්ෂාව කරමින් සිටියහ. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයේ බාහිර උපාධියකට ඉගෙන ගන්නා විජය නතර වී සිටියේ ද කොළඹ ම ය. ගාමිණී කාර්මික විද්‍යාලයේ ඉගෙනීම කළේ ය. ගෙදර නතර වී විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉගෙනීමේ යෙදී සිටියේ තිස්ස පමණකි.

මෙදින මට රෝහණ පෙනුණේ වෙහෙස වූවකු ලෙසිනි. තාරබාරු පුෂ්ටිමත් මුහුණක වෙහෙස වූ ගතිය වඩාත් හොඳින් කැපී පෙනෙයි.

"දෙවෙනියිය නිදිමරල වගෙ" යි මා කී විට ඔහු මගේ මුහුණ බලාගෙන සිනාවක් නැති හිස් බැල්මකින් මොහොතක් ගත කළේ ය. මා වෙත බියකට සමාන හැඟීමක් ඇති විය.

"කුසුම් අපේ ගෙදරට යන කල් මම වත්තට යන්නෙ නෑ කියලයි එද කිව්වෙ. පස්සෙ කුසුම් අපේ ගෙදර යන කල් කවද හරි ගෙදර එන්නෙ නෑ කියලයි පිටවෙලා ගියෙ. ඊයෙ රෑ අයිය ගිය නිසයි මම අද මේ ආවෙ."

අතීතය හා සම්බන්ධ පුද්ගලයන්ගෙන් මට දනට ඉඳ හිට හෝ හමු වී කතා බස් කරන්නට ඉතිරි වී සිටින්නේ සීප දෙනෙක් පමණි. ගුණපාල හා රෝහණ ඉන් දෙ දෙනෙකි. ගුණපාලගේ අදහස් උදහස් හා සිතුම් පැතුම් මට කිසිසේත් නො ගැළපෙයි. ඔහුගේ දේශපාලන මත මට අඳුර දෙමළයකි. එහෙත් මම

ඔහුගේ සමාගමය ප්‍රිය කරමි. තමාගේ සිතෙහි තිබෙන නොයෙක් අදහස් එළියට දමනත් ගුණපාල මගේ හදවතට ඇඟිලි නොගසයි. ඊට වඩා හාත්පසින් වෙනස් තෘප්තියක් රෝහණ දකීමෙන් මම ලබමි. බාල කාලයේ සිට ඇති දන හැඳුනුම්කමත් ඇසුරත් නිසා රෝහණ වෙත ගුණපාලට නැති ළෙන්ගතුකමක් ද මට ඇත. එහෙත් සහෝදරයකු දකීමෙන් අත් වන මේ ප්‍රීතිය විඳ ගන්නට බාධා කරමින් රෝහණ මගේ හැඟීම්වලට ඇඟිලි ගසයි. ඒ නිසා කතාව ආරම්භයේ දී මා මා තුළ ඇති වූයේ නොමනාපයකි.

"මට ඕව කියන්න එපා" යි කෑ ගැසීමට සිතුණත් මම උත්සාහයෙන් සිනාසුණෙමි. ඔහු ඒ සිනාවෙන් ධෛර්යයවත් විය.

"මම ඊයේ රෑත් මහන්සි ගත්ත කුසුම්..............."

මා බලාපොරොත්තු අත් හැර බොහෝ කලක් ගත වී ඇතත් ඊයේ රෑ වන තුරුත් තව දුරටත් ඉඩකඩ ඇතැයි මා තුළ ද විශ්වාසයක් පැවැති බවට හැඟීමක් වහා මතු වී මගේ මුළු සර්වාංගය බලාපොරොත්තු කඩවීමේ ගින්නකින් මොහොතකට දැවී ගියේ ය.

"මම නම් හිත හදාගෙන බොහොම කල්. මම අයියට කිව්වෙ හැමදම.............."

"මම නම් හිතුවෙම නෑ කුසුම්. අන්තිම වෙනකල් හිතුවෙ නෑ..............."

"අන්තිම? මොන අන්තිමක් ද?" යි අසන ඇසින් මම ඔහු දෙස බැලීමි.

රෝහණ හතුරුසිංහ මගේ බැල්ම මග හැර සිගරට්ටුවක් දල්වා ගත්තේ ය.

අනතුරක් - අනතුර - ඉතා ළඟ බව මට ඉවකින් මෙන් දැනෙයි. තව මොහොතකින් මාත් සමග මුළු ලෝකය ම විනාශ වී යන්නට ආසන්න බවට ඇති වූ අනියත බියකින් මම හිරිවැටී ගියෙමි.

"අම්මාට මොන විදිහකින්වත් කිව්වකරන්න බෑ............... මම දන්න විදියට කතා කළා. එද නම් අයියයි තාත්තායි දෙන්නම කුසුමගෙ පැත්තට හරිය..............."



'අද?' එහෙත් බිම බලාගෙන සිටි මම හිස ඔසවා ඇස්වලින් ම ඔහුගෙන් ඇසීමි.

"කුසුමට විතරක් නෙවෙයි අයිය අපිටත් නැතිවෙයි. ඉන්සෙල්ලම අම්මට අයිය නැතිවෙයි. සමහර විට එයා එයාටම නැතිවෙන්නත් බැරි නෑ..............."

මා වෙත බලපවත්වන්නට වූ හැඟීම් සංවේගයක් වශයෙන් හඳුනා ගැනීමට මා අදත් සූදානම් නැත. එහෙත් මට කඳුළු හැරවා ගැනීම පහසු නොවී ය. නොහඬා සිටින්නට කෙතරම් අදිෂ්ඨාන කරගෙන සිටියත්, දෙවියනි, ගැහැනියකගේ ඇසින් කඳුළක් වැටීම වරදක් ද? පුදුමයක් ද?

"තංගී හොඳට දන්න කෙනෙක්. එකට ඉගෙන ගත්ත කෙනෙක්............ තංගී.............. දන්න.............."

"පද්මිනී සේනාරත්න!"

විත්තිකාරියකගේ නම හඬ නගා නිවේදනය කරන අධිකරණ සේවකයකු මෙන් මම කෑ ගැවෙමි.

"පද්මිනී සේනාරත්න" රෝහණ ඉතා සෙමින් කීවේ ය.

විජයලතා කිරියප්පෙරුමගේ හෝ පංතියේ එකට ඉගෙන ගත් අන් තරුණියකගේ හෝ නැති ව සිහිනෙකින් වත් නො සිතූ පද්මිනී සේනාරත්නගේ නම ම මට කියැවුණේ කෙසේ දැයි කල්පනා කිරීමට මම නොවෙහෙසුණෙමි. කොටින් කියතොත් කිසිවක් කල්පනා කිරීමේ ශක්තිය එහෙම පිටින් ම විනාශ වී ගියේ ය. සිත කිසිවක් නො දැනෙන නොවැටහෙන හිස් බවකට - ශූන්‍ය බවකට - පත් විය. වේදනාවක් දැනුණේ ගතට ය. ගත අප්‍රාණික වූයෙන් මම නිරුත්සාහයෙන් ම බිත්තිය අල්ලා එහාට වී ඉස්තෝප්පුවේ තිබුණු අනෙක් පුටුවේ - කමලාවතී විසින් ගෙනා ලද අනෙක් පුටුවේ - වාඩි වීමි. නිරායාසයෙන් ම වැළමිට දෙක එකට තබා ගත් මම නළල අත්ලට බර කර ගතිමි.

අවට සියල්ල අන්ධකාරයක ගිලී භ්‍රමණයකට අසුවී කර කැවෙයි. රෝහණ ඒ භ්‍රමණය මැද පිළිමයක් ලෙසින් නිශ්චල ව ම සිටී. හදවත නමැති යම්තිසි ගුලියක් හැර අනෙක් ඉන්ද්‍රියෝ ක්‍රියා විරහිත වී ගියහ.

www.sinhalaelibrary.com

රෝහණ තවදුරටත් කතා කළේ ය. ඔහු කී කිසිවක් මට ඇසුණේ නැත.

මා ඒ ආකාරයෙන් කෙතෙක් වේලා ගත කළේ දැ යි මට මතක නැත. පපුවේ හිරවීමක් විනා අන් කිසිදු දෙයක් මට නො විය. කාන්තා මළ ද, සෝමා ගැබ් ගත් බව දැන ගත් ද, 'සිසිලට' ආයුබෝවන් කී ද, නිමල් හා අන්තිමට කතා කළ ද, මගේ හදවත දැඩිම වේදනාවකට අසු වූ අවස්ථාවන් ය. එහෙත් ඒ කිසිවකින් දැන් මේ දැනෙන හිර වීම වූයේ නැත. රෝහණට තේ එකක් නුදුන් බව මතක් වී එහා අමතක වී ගියේ ය. අනුලාට කතා කරන්නට මතක් වී අමතක වී ගියේ ය. සියල්ල මැද - අන්ධකාරය මැද - නිමල් හතුරුසිංහගේත් පද්මිනී සේනාරත්නගේත් මුහුණු - මතකේ සැඟ වී තිබුණු අතීත සිද්ධීන් පිළිබඳ නොයෙක් අවස්ථාවල දැක පුරුදු මුහුණු - දිලිසෙමින් නටන්නට විය. මට ඒ මුහුණු දෙක පෙනෙන්නට වූයේ වෙන වෙන ම මාරුවෙන් මාරුවට මිස - එකට නො වේ.

රෝහණ හා මා අතර කතාවක් නැති ව කෙතෙක් වේලා ගත විණි දැ යි හැඟීමක් ද මට නො විය. සමහර විට ඒ කාලය මිනිය හැක්කේ කල්පවලිනි. අනුලා තේ කෝප්පයක් රැගෙන රෝහණ වෙත ආවා මෙන් යන්තම් මතක ය. නිල්මිණිගේ කටහඬ ඇසුණා නැසුණා මෙන් මතක ය.

මා තනි කර දමා යෑමේ නොකැමැත්තකින් මෙන් ඔහු කියන්නට හෝ කරන්නට හෝ කිසිවක් නැති ව බලා සිටියා විය හැකි ය. ඔහුට කතා කරන්නට දෙයක් තිබුණත් වචන නැති වන්නට ඇත.

'ඕව ඔහොම තමයි කුසුම්. මොනව කරන්න ද? හිත හදාගන්න' ය යි කිව නොහැකි ය. 'හිත හදාගත අවසානය' යි මා ඔහුට කියා ඇත්තේ කලකට උඩදී ය.

අවට භ්‍රමණය වීමේ ස්වභාවය කෙමෙන් නතර විය. කන් අඩි අඟුල් වැටුණු ගතිය තුරන් වී කෙමෙන් අවට ශබ්දයන් ඇසෙන්නට පටන් ගත්තේ ය. දෑ නෙත් හි බැඳි පටලය පහ වී රෝහණ මට පැහැදිලි ව පෙනෙන්නට විය. මෙසේ යථා තත්ත්වයට පත වෙත් ම,



'කොහොම ද දෙවෙනියියෙ ඔය දෙන්න එකතු වුණේ?' යන ප්‍රශ්නය මගේ සිත්හි නැගිණි. 'දැන් ඉතින් මඟුල් හෙම කවද ද?' යන ප්‍රශ්නය අනතුරුව මතු විය. 'මට නම් විශ්වාස කරන්නත් අමාරුයි' යන අදහස නැවත පහළ විය. මා ඒ කිසිත් පිට කළේ නැත.

"අයිය කවද ද වත්තට යන්නෙ?" යන ප්‍රශ්නය මගේ කටින් පිටවුණේ ඇයි දැයි නො දනිමි.

රෝහණ කවද වත්තට ගියත් එහි ඇති වැදගත්කම කුමක් ද? ඔහු කතා කළේ නැත. ඇත්ත වශයෙන් ම මට ඔහුගෙන් පිළිතුරක් අවශ්‍ය ද නො විය.

"මේ තත්ත්වය වළක්වන්න මම හුඟාක් මහන්සි ගත්ත............ මම නංගිටත් මුල ඉඳලම කිව්වෙ ඒකයි. නංගිටත් තිබුණ අනුන් ගැන නොබලා තමන් ගැන.............."

"ඒ ගැන මම ඇබිත්තක් වත් පසුතැවිලි වෙන්නෙ නෑ............. මම ගත්ත තීරණය වැරදිය කියල මම කවදවත් හිතන්නෙ නෑ............."

ඒ වචනය කියා ගන්නට ලැබීමෙන් මා ලැබුවේ අසීමිත සහනයකි. ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තිය පිළිබඳ ආස්වාදයක් මගේ පිදුණු හදවතට පිඹින්නාක් මෙන් දැනිණි.

"............... මම දන්නව දෙවෙනියිය මට කවදත් කරුණාවයි. අයිය කල්පනා කළේ මගෙ හොඳට. නමුත් මේ විදිය මට ඊට වැඩිය හොඳයි. අයිය මා ගැන හිතුවට අයියට බොහොම ස්තූතියි."

මේ ටික වේලාව ඇතුළත රෝහණගේ ඇස් ඉදිමී ගොස් තිබිණැයි මම ප්‍රථම වරට දුටුවෙමි. ඔහු කෙරෙහි උපන් දයාවක් හා අනුකම්පාවක් මඳකට මගේ වේදනාව යටපත් කර ගත්තේ ය.

නිමල් හා මා අතර සබඳකම නතර වීමෙන් පසුවත් මගේ තීරණය වෙනස් කරවීමට රෝහණ උත්සාහ කළේ තම සොහොයුරා ගැන පමණක් සිතීමෙනැයි මම ඇතැම් විට කල්පනා කළෙමි. නැත. ඇත්ත තත්ත්වය එය ම නොවේ. රෝහණ මට කරුණාවෙන් දක්වන්නට පටන් ගත්තේ අනාගත

www.sinhalaelibrary.com

නැතා කෙනකු වශයෙන් සැලකීමෙන්මත් නො වේ. ගෙදර ආවොත් ඔහු මා බලන්නට ආවේ ය.

'දෙවෙනියියෙ මම දල යන්න එපා. මට පාළුයි.' යනුවෙන් කෑ ගසා කතා කරන්නට මට ඕනෑ කළේ ය. මගේ ඒ වුවමනාව ඔහු ද තේරුම් ගත්තා මෙනි.

"මම හෙටත් මේ පැත්තෙ ඇවිත් යන්න එන්නම් කුසුම්" යි කියාගෙන ඔහු මිදුලට බැස්සේ ය. රෝහණ සිට වූ විගස මම නැවතත් පුටුවේ ඇද වැටුණෙමි. කම්මුලෙන් අත ඉවතට ගත යුතු ය යි කීප වරක් ම සිතුණු නමුත් මම ඊට අසමත් වීමි. හිස් බැල්මක් ඇති ව පැමිණි අනුලා මා පිටුපස සිට ගත්තා ය. මම කතා නො කළෙමි. පුංචි නංගී උකුණන් බලන්නට මෙන් මගේ හිසකෙස් අතර ඇඟිලි කුඩු යවන්නට වූවා ය. මගේ මුළු ගත පුරා රස්නයක් දිව ගියේ ය.

"අක්කට තේ ටිකක් ගේන්න ද?"

"නැතුවට කමක් නෑ."

පුංචි නංගී ගෙට ගියා ය.

මම පුටුවෙන් නැගිට රුකඩයක් මෙන් ගෙට ගොස් පිටු පස පඩිය උඩ වාඩි වීමි.

"නංගී දන්නව ද?" මම ඉවත බලාගෙන ඇසීමි.

"නෑ" යි අනුලා කොඳුළේ කිසිවක් දත් ගත්තට තමාට කිසි ම වුවමනාවක් නැති බවක් හගවමිනි.

"අරය බඳිනව කියන්නෙ."

"මේ තේ ටික බොන්න"

"මට වැඩියි"

"ටිකක් බිල ඉතුරු කරන්න."

"පොඩි එකී බිව්ව ද?"

"ඔව්"

මම තේ උගුරක් දෙකක් බී කෝප්පය බිම තබා යළි කල්පනාවට වැටුණෙමි.



"කොහෙන් ද අක්කෙ?"

"අර පද්මිනී සේනාරත්න"

"ඕක කියල යන්න ද දෙවෙනියිය ආවෙ?" යි පුංචි නංගී ඇහුවේ තරහෙනි.

මට සිනායන්නට ගියේ ය.

නිල්මිණි දුවගෙන අවුත් පිටුපසින් මගේ බෙල්ලේ එල්ලුණා ය. මම ඇයගේ අත් දෙක අල්ලා ගතිමි.

"එන්න දුවේ අපි සෙල්ලමක් කරන්න" යි අනුලා නිල්මිණි බලෙන් මෙන් ඇදගෙන ගියා ය. මුලින් විරුද්ධ වූ දූරිය පසුව නංගීට මෙල්ල වුණා ය. මම ඇඳට ගොස් හාන්සි වුණෙමි.

මගේ වේදනාව මා වෙනුවෙන් ද? නිමල් වෙනුවෙන් ද? විපතක් වූයේ මට ද? නිමල්ට ද? මා දවන්නේ එක ගින්දරක් ද? ගින්දර කීපයක් ද? හිතින් අස්කර ගත් විදියට හිටියත් නිමල් හතුරුසිංහ යම් දවසක මට අයිති වන බවට නියත විශ්වාසයක් මා තුළ දිගට ම පැවැතිණි ද? සියලු බාධක ඉවත් වී කමලාවතීගේ කැමැත්ත ලැබ මගේ පැතුම් ඉටු වන බවට බලාපොරොත්තුවක් කවදත් මා තුළ විණිද?

මේ එක ද ප්‍රශ්නයකට වත් පිළිතුරක් සෙවීමට මම අසමත් වෙමි. එකින් එක යවුල් මෙන් මගේ හදවත පාරයි.

නිමල් හතුරුසිංහ මා සිතින් අස් කළේ කිසිවකුගේ කීමට හෝ බල කිරීමකට හෝ නොවේ. කමලාවතීත් අනතුරු ව අම්මාත් දනගෙන ඔවුනට පොරොන්දු වන්නටත් කලින් නිමල් සමග කිසි දවසක විවාහ නොවීමට මම තීරණය කරගෙන හිටියෙමි. කමලාවතීගේ කැමැත්ත නැති ව විවාහ නොවන බව පමණක් නොව එසේ කැමැත්ත ගැනීමට උත්සාහ දරන අතරතුර සබඳකම දිගට ම පවත්වාගෙන යෑමටත් මා කිසි ලෙසකින් සූදානම් නැති බව ද මම තරයේ ම නිමල්ට කීවෙමි. තව දුරටත් මා ගැන මොන අන්දමකින් වත් බලාපොරොත්තුවක් තබා ගැනීමේ ඉඩක් මම ඔහුට ඉතිරි නො කළෙමි.

නිමල් හතුරුසිංහ සමග විවාහ වීමේ බලාපොරොත්තුව බලකට උඩ දී අත්හළ නමුත් ඔහු දවසක අන් කිසිවකු සමග

www.sinhalaelibrary.com

විවාහ වීමේ පුවත අසන්නට මගේ හදවත සූදානම් ව නොසිටියේ ඇයි?

පද්මිනී සේනාරත්න හැර අන් තරුණියක හා විවාහ වන්නට ගියා නම් ආරංචිය ඇසූ කල මා තුළ මේ හැඟීම ඇති නො විය හැකි ව තිබිණි.

පද්මිනී සේනාරත්න!

පියැවුණු දෙ නෙත් අත්ලෙන් ද වසා තද කරගෙන මම පද්මිනී සේනාරත්න ගැන සිතමි. පුංචි නංගී හැරුණු විට පස වයසේ අන් කිසි ද දැරියකටත් වඩා - සමහර විට ලොකු නංගිටත් වඩා - පද්මිනී මගේ හදවතට ළං ව සිටියා ය. මේ තරම් ළෙන්ගතුකමකින් ඇසුරු කළ අන් එක ද මිතුරියක් වත් මගේ ජීවිතයේ නො වුණා ය.

අමතක විණැයි මා සිතාගෙන සිටි - කලකට උඩ දී සිදු වී අතීතයට පමණක් අයිති ය යි මා සිතාගෙන සිටි - නොයෙකුත් ජවනිකා හා සිද්ධීන් අඳුර අතරින් මතු වෙයි. කල්පනා කරගෙන යන කල වරෙක ඇයගේ මුහුණුවර මතකයෙහි මැකී නොපැහැදිලි ව ම යයි. වරෙක මට සියල්ල - විසිරී කළලට වැටුණු කෙස් රොදත් උඩු තොල මත තැගුණු ඩා බිඳුවත් පවා පෙනෙන තරමට - සුළු දේ ලොකු වන කණ්ණාඩියක වැටුණු කලෙක මෙන් - ඉතා පැහැදිලි ව පෙනෙයි. අනුරාගය හා තේජසක් වැනි පෙනීමක් මිශ්‍ර වූ කාන්තියක් විහිදෙන ලොකු ඇස්, හොඳින් වැඩුණු අත පය, තෙල් වෑහෙන ගතිය, වැදගත් ය යි සම්මත පෙනීම, වුවමනාවෙන් පුරුදු කර ගත් එකකැයි මා සිතූ ගමන, කතා ලතාව, සිනාව - සියල්ල මා ඉදිරියේ ඇදී යයි.

උදය පාසලට එන කල ඇයගේ වත්පුණු තැවරුණු මුහුණ කෙතරම් පියකරු ද? කොටට කැපූ කෙස් සමහර දවසක රතු රිබන් පටියකින් බැඳ ඇත. ඇය පාවිච්චි කළේ එක ම වර්ගයක පියරු ය. පාසලේ අන් කිසිදු දැරියක් ඒ වර්ගය පාවිච්චි නො කළා ය. ඒ සුවඳ මට දැනෙයි. ඇයට ම විශේෂ වූ සුවඳ! එවත් මට දැනුණේ ඒ ඇයගේ පමණක් නොව මගේත් සුවඳ වගයෙනි. සුවඳ යොවුන් වියේ තැවුම් සුවඳ!



සවස ක්‍රීඩා අවසානයේ වෙහෙස ගතියකින් හා දහදියෙන් වැගුණු ඇයගේ මුහුණේ ඇත්තේ වෙනත් සුන්දරත්වයකි. එකල ඇය වෙතින් වෙනම ම සුවඳක් වහනය වෙයි. මගේ නැහැයට නොව හදවතට දැනුන් දැනෙන ඒ සුවඳ වරක් මම කෙතරම් ප්‍රිය කළෙම් ද?

මම දෙ අතින් ම මුහුණ වසා ගනිමි. අන්ධකාරයේ - එහෙත් දුවගන පරයේ ඉතා සමීපයෙන් - මගේ ඇස්වලට ගෑවෙන තරම් සමීපයෙන් - පාසල, එහි කොරිඩෝව, පංති කාමර, පුස්තකාලය, ක්‍රීඩා හා පිට්ටනිය පසුතලයේ ඇති ව ලියනගේ දෝන කුසුමාවතී - ආර්. ඩී. කුසුමාවතී - කුසුම් - අතින් අල්ලාගෙන පද්මිනී සේනාරත්න එක්තරා ලතාවක ගමනින් යයි. යොවුන් වියේ නිර්මලත්වය පළ කරන ඔවුන්ගේ අව්‍යාජ සිනාහඬ මට ඇසෙයි. අමතක වී ගියා යි මා සිතාගෙන සිටි ඔවුන්ගේ වචන මට ඇසෙයි.

"ඊයෙ රෑ ලලිතගෙ ඇඟට කැරපොත්තෙක් ඇවිත් එක වැඩයි. ලලිත උඩ පැන - ලා කෑ ගහ ලා............."

"ඔයා ද ඌ අරන් දැම්මෙ?"

"ඌ පොඩි වෙලා මළා අනේ"

"වැටුණෙ නෑ වැටෙන්න ගියා විතරයි"

"මේ ඉස්කෝලෙ ළමයෙක් ද?"

"නෑ වෙන කොහෙද රෝඩියෙක්"

"කුසුම් පද්මිනීගෙ බොඩි ගාඩ්"

"නෑ ආන්ටර්"

"නිත්සිරි සිගරට් බොනවයි කියල මම හිතන්නෙ නෑ"

"බොනව ඇති. මිනුන් කොයිකත් එකයි."

මට ඇයගේ අත්ලෙහි සීතල ගතිය දැනෙයි.

උදේ කලින් ම හමු වන අපි සලිත වී දුවගෙන ගොස් එකිනෙකා බදා ගනිමු. කුලින් ද වෙන් ව යැමෙන් පසු ව ඇයට

www.sinhalaelibrary.com

ගෙදරදීත් මට ශිෂ්‍ය නිවාසයේදීත් අසන්නට දකින්නට ලැබුණු දේ කියා ගන්නා තුරු අපට ඉස්පාසුවක් නොවී ය.

ඇයගේ බැල්මේ ඇති ඒ කාන්තිය කුමක් ද?

මා තමා වෙත බලා සිටින බව දුටු ඈ බැල්ම ආපසු පොත කරා යොමු කළාය. මොහොතක් නොයවා මගේ මුහුණ බලා සිනාසුණා ය. මොහොතක දී ඇයගේ සිනාව පහ වී ගියේ ය. බියකට සමාන හැඟීමක් සිනාවෙන් ඒ මුහුණ දුටු කල මට ඇති විය.

අතිනත ගෙන කොරිඩෝවේ යන අතර පද්මිනී කුසුම්ගේ ඇඟිලි මිරිකයි.

මට ඇයගේ අත්ලෙහි සීතල ගතිය දැනුත් - නැවතත් දැනෙයි.

පාසල් ගොඩනැගිල්ල වසා පැතිර තිබුණේ දැඩි නිශ්චලතාවකි. ඇසි පිය නොහෙළා අර බැල්මෙන් කුසුම් දෙස බලාගෙන ම පද්මිනී කුසුම් සිටි පඩියට බැස අත අතහැර විට හරනා අත යවා කුසුම් සිප ගත්තා ය. කුසුම්ගේ අතත් නිරායාසයෙන් ම පද්මිනීගේ බඳ වටා ගියේ ය. පාසල් ගොඩනැගිල්ලේ දැඩි නිශ්චලතාවත් පියගැට පෙළේ මඳ අඳුරත් මැද ඔවුන් එකිනෙකා වැළඳ තත්පරයක් - විනාඩියක් - පැයක් - සො පමණ වේලාවක් සිටියේ ද යි මට අදත් කිව නොහැකි ය.

අනුමවත් ව අතැතින් මෙතැනින් කොටස් එකතු කළ චිත්‍ර පටියක් මෙන් පද්මිනී සේනාරත්නගේ මුහුණ හා ඊට සම්බන්ධ සිද්ධීන් අතරට වැටී තවත් මුහුණක් ද ඒ මුහුණට සම්බන්ධ සිද්ධීන් ද මා ඉදිරියේ මැවී යයි.

කුසුම් මඳ දුරක් මෙහා විලාස කොටසේ රෙදි පට කවන්නට වුවා ය. පිටු පසින් පැමිණි පිරිමි අත් දෙකක් ඇයගේ ඇස් වසා ගත්තේ ය. ඇස් වලින් පටන් ගත් සීතලක් ඇයගේ මුළු ගත පුරා පැතිර ගියේ ය. ඛේදවාචකයේ ආරම්භය එදවස නොවන්නේ ද? නැතිනම් ඊට කලින් දවසක් ද? ඈ ගෙට පැත්තකින් වත්තේ පුංචි ලොකු කොස් ගස දුටුවා ය. වසර ගණනකට උඩ දී පුංචි කාලයේ සිංහල අවුරුදු දවසක මේ ගසේ ඔංචිල්ලාවක නිමල් තමාත් තබාගෙන පැද්ද හැටි ඇයට මතක් විය. තමා තුළ ඇය



ගැන මුලින් ම හැඟීමක් ඇති වන කල ඇය පුංචි කෙල්ලකැයි ඔහු කියා ඇත. ඔහු ඇය තබාගෙන ඔංචිලි පදිද්දීත් ඒ හැඟීම ඔහු තුළ තිබුණේ ද?

"ඔයගෙ වැඩි සීනි එක කොයිකද කියන්න."

"කොයිකෙත් එක ගණනට."

"එහෙම හරි නැහැ. විශේෂයක් තියෙන්න එපායැ."

"කෝලං නැතුව ගන්න. මම ගෙනියනව ආපහු"

"කොල්-ලෙක් අල්ල-ගෙන වා-ගෙයි"

"අනේ නිකා ඉඳපන්"

"උඹට කියන කොටත් සතුටුයි. කියපන්කො කවුද?"

"විකාරද?"

ආදරය නැමැති මේ පුදුම දෙය කෙතරම් මිහිරි විද? කෙතරම් රසවත් විද? හදවතකට තුනී වේදනාවක් ගෙන දුන් නමුත් මාස කීපයක් තිස්සේ මම ඒ රසයෙන් මත් ව සිටියෙමි.

"එක ලේන්සුවද කඳුළු පිහින්න ගෙනාවෙ?"

"ඔයා ළඟත් එකක් ඇතිනෙ?"

"මම අඬනව යැ?"

"ඔයා කවදාවත් අඬන්න එපා නිමල්. අඬන්න වෙන්නත් එපා. අඬන ටික මට බාර දෙන්න. මම දවසක ඔයාටත් එක්කල අඬන්නම්"

නිමල්ට මා එද වුණු මේ පොරොන්දුව අද ඉටු කළ යුතු ද? මා හැඬිය යුතු ද? ඔහුටත් හරියන්නට හැඬිය යුතු ද?

ඔහුට සෙතක් වෙතොත් මුළු ජීවිත කාලය දිගට ම ඔහු වෙනුවෙන් හැඬීමට තරම් ශක්තියක් අදත් මා වෙත තිබේ. එහෙත් මගේ කඳුළුවලින් ඉරණම වෙනස් කළ හැකි ද?

මම පද්මිනී සේනාරත්නලා දෙ දෙනකු දුන සිටියෙමි. ඕනියත් මා ළඟින් ඇසුරු කළ එක පංතියේ ඉගෙන ගත් මට

www.sinhalaelibrary.com

ආදරය කළ - මගේ ආදරය ලද - දඟකාර පද්මිනී ය. අනෙක් හැනැත්තිය අපගේ පාසලට එන්නට කලින් යොවුන් විය ආරම්භයේ ම වරදට පෙළැඹී කිළුටට පත් පද්මිනී ය. මේ දෙදෙනා එකියක ලෙස සලකා සිතන්නට මම එදත් අසමත් වීමි.

නිමල් සතුරුසිංහ විවාහ වන්නට යන්නේ මේ දෙදෙනාගෙන් කවර පද්මිනී සමඟ ද? කවරකු සමඟ වුවත් මට එය ඇදහිය නො හැක්කකි.

මගේ මිතුරිය මා හා නිමල් අතර පැවති සියලු සබඳකම් දනී. නිමල් හා මා සම්බන්ධ ව වැඩිපුර ම දන්නා හැනැත්තිය පද්මිනී ය. කොටින් කියතොත් නිමල්වත් නොදන්නා දේ පද්මිනී මා ගැන දන සිටියා ය.

අනෙක් අතට ගැහැනු ළමයකු වන්නටත් කලින් ගැහැනියක වුණු 'චින්තාමණී', 'අනුලාදේවි' ආදී නම් පට බැඳුණු වයස දහහතරේ දී ගැබ් ගත් පද්මිනී කෙනකු නිමල් සමඟ ආවාහ වන්නට?

දෙවියනි, නැත. පද්මිනිලා මෙන්ම නිමල්ලා ද දෙ දෙනෙක් සිටිති.

මා බාල කාලයේ සිට හැඳින සිටි ඇල්බට් ඩැයිවය උන්නැහේලාගේ ගෙදර ලොකු පුතා - ඉගෙනීමේ දක්ෂ, අහිංසක, හැන්පත් නිමල්. කුඩා දවස මට සහෝදර නී, දෙ දෙනා විනෝදයට පත් කරවමින් මනෝමය ගණිත ප්‍රශ්න ඇසූ, ඉංග්‍රීසි පාඩම කියා දුන්, මා 'මඩොල්දූව' 'අපේ ගම' සහ 'අඹ යහළුවෝ' ඉල්ලා ගත්, වෙල් නියරයේ අසින් අල්ලා ඇවිද ගෙයක් වන ලැහැබේ දී කොම්පිඤ්ඤ කඩා දුන්, අවුරුදු ද ඔංචිල්ලා පැද්ද පු, ගෙට ගෙවදින උත්සවයට දෙර රෙදි මහද්දි පිටු පසින් ඇවිත් මගේ ඇස් වැසූ, ලොකු නංගී රූප සුන්දරී තරගයට සහභාගී වූ ද මුහුදු වෙරළේ දී ප්‍රථම වරට හා අන්තිම වරට මගේ තොල් සිප ගත් නිමල් - මගේ නිමල් වෙන ම ම කෙනෙකි.

මගෙන් වෙන් වූ පවුලෙත් හා ගමෙන් ඈත් වූ ඩියාගෝ නිමල් හතුරුසිංහ වෙන ම කෙනෙකි. දැන් මේ විවාහ වීමට යන්නේ ගැහැනු ළමයකු වන්නටත් කලින් ගැහැනියක වුණු පද්මිනී සේනාරත්න හා ඩියාගෝ නිමල් හතුරුසිංහ ය.



දඟකාර, අහංසක, පිරිසිදු, සුවඳක් වහනය වන මගේ මිතුරිය මට අහිමි වූයේ නැත. ඇයට ලියුමක් පවා යවා සැප දුක් විමසිය යුතු ය. මා ඇය හා දිගට ම සම්බන්ධකම් පවත්වා ගත යුතු ය.

මට පද්මිනී නැති වූයේ නැත. මට මගේ නිමල් නැති වූයේත් නැත.

සියල්ල දවී ඉතිරි වුණු අළු අතරින් බලාපොරොත්තුවේ ගිනි පිළිවක් මතු වී මගේ මුළු හදවත මොහොතකට ඒකාලෝක විය. ජීවිතයේ මින් පෙර කිසි දවසෙක විඳ පුරුදු නැති අපරිමිත සන්තුෂ්ටියකින් මොහොතකට මගේ සිත පිරී ගියේ ය.

නිමල් මට ලබා ගත හැකි ය යන විශ්වාසයත් බලාපොරොත්තුවත් සතුටත් ඇති ව මම මොහොතකට ජීවත් වුණෙමි. ඒ ජීවිතය සිහින ලොවකට අයිති එකකි. මට එහි සදහට ම වාසය කළ නොහැකි ය. මා එයින් චුත ව සැබෑ ලොවට ම පිවිස සත්‍යයට මුහුණ දිය යුතු ය.

සත්‍යය කුමක් ද?

නිමල් හතුරුසිංහ පද්මිනී සේනාරත්න සමඟ විවාහ වීමට යයි.

නිමල්ලා මෙන් ම පද්මිනීලාත් දෙ දෙනා බැගින් නොවෙති. සිටින්නේ එක නිමල් කෙනෙක් හා එක පද්මිනී කෙනෙකි. ඒ වගේ මගේ පෙම්වතා ව සිටි නිමල් හා වරක් මගේ හොඳ ම මිතුරිය ව සිටි පද්මිනී ය. ඔවුහු විවාහ වීමට යති. මේ දෙ දෙනා එකතු වී ම සිහිනයක් නොව සත්‍යයකි. මේ සත්‍යය සිදු වූයේ කෙසේ ද?

මා ඉගෙනීම නතර කිරීමෙන් පසුවත් පද්මිනී තවත් මාස ගණනක් දිගට ම පාසල් ආවා ය. ඒ කාලයේ නිමල් එහි ගුරුවරයෙකි. නිසැකයෙන් ම ඔවුන් අතර ඇසුර හට ගන්නට ඇත්තේ මේ කාලයේ ය. ඔවුන්ගේ ඇසුර පටන් ගන්නට ඇත්තේ ඒ දෙ දෙනාගෙන් මා ඈත් වී මාස ගණනක් ඇවෑමේ දී විය යුතු ය. මගේ මරණය මත සිය මන්දිරය මෙතරම් ඉක්මනින් ගොඩ නංවා ගැනීමට තරම් ඔවුහු සැහැසි වූවෝ ද?

www.sinhalaelibrary.com

මට ඉඳහිට ලියුම් ලියන කාලයේත් පද්මිනී ඔහුට පෙම් බැඳගෙන සිටින්නට ඇත. මා රැවටීමකට අසු වූ බවට හැඟීමක් මේ ගැන සිතන කල මට ඇති වෙයි.

නිමල් අතහැර දැමූ බවට හිත හද ගත් පසුවත් ඉවසිය නොහැකි වේදනාවෙන් නිදි වර්ජිත ඇතැම් රැයෙක මම සිතට සහනයක් ලබා දෙනු පිණිස මිය ගිය බලාපොරොත්තුවලට මඳකට පණ දී දවසෙක නිමල් හා විවාහ වී පුංචි ගෙයක ඔහුගේ දරුවනුත් සමඟ ජීවත් වන අන්දම මනැසින් සිතුවම් කළෙමි. හරියට ඒ කාලයේ ම ඒ රැයේ ම පද්මිනී සේනාරත්නත් ඔහු ගැන ඒ විදිහට ම සිහින මවමින් සිටින්නට ඇත. මේ කරුණ කල්පනා වන විට පාපයකට හවුල් වීම පිළිබඳ පසුතැවිල්ලක් ද ලැජ්ජාවක් ද මට ඇති වෙයි. නොමනා කටයුත්තක යෙදීමෙන් ආත්ම ගෞරවය නැති කර ගැනීමේ සංවේගයක් මට ඇති වෙයි.

මට සිදු වූ විපත මොහොතකට අමතක වන සිතෙහි පද්මිනී හා නිමල් එකතු වූ අන්දම දැන ගැනීමේ දැඩි කුතුහලක් උපදී. රෝහණගෙන් එය ඇසිය යුතුව තිබිණි. සමහර විට ඔහුත් නො දන්නවා ඇත. එහෙත් ඔහු පද්මිනී ගැන කිසියම් තොරතුරක් දැනගෙන කතා කළැයි මට සිතෙයි.

"අයිය කුසුමට විතරක් නෙවෙයි අපිටත් නැති වෙයි. මුලින් ම අම්මට නැති වෙයි. සමහර විට එයා එයාටම නැතිවෙයි."

රෝහණ මෙසේ කීවේ ඇයි?

මා ගැන සම්පූර්ණයෙන් ම අමතක කළ මම, නිමල් ගැන ඇති කර ගත් අසීමිත අනුකම්පාවකින් වේදනාවට පත් වන්නට වීමි. තමා වරදට පත්වීම පිළිබඳ කතාව කීමෙන් පසුවත් පද්මිනී ගැන මිතුරියක වශයෙන් මගේ සිතේ කිසි ම කහටක් ඇති වූයේ නැත. මිතුරියක වශයෙන් කිසිසේත් ඇය අපවිත්‍රය යන හැඟීමත් මගේ සිත අහලකට වත් ආවේ නැත. එහෙත් නිමල් හා සම්බන්ධ කර කල්පනා කරන විට එසේ නොවේ. මට දැන් පෙනෙන්නේ පද්මිනී නිමල්ගේ සමීපයට පත් නො කළ යුතු පාපයේ හා අපවිත්‍ර භාවයේ ප්‍රතිමූර්තියක් මෙනි.

නිමල් විවාහ කර ගන්නට යන්නේ අන් අය අතින් වරදට පත් වූ එකියකි. ගුප්ත අතීතයක ඇති, 'අනුලා දේවි', 'චින්තාමණි'



ඇඳි නාම පට බැඳ ගත්. මා දනුවත්ව ම පිරිමි ළමයින් හත් අට දෙනකු මුලා කරන්නට ගිය කාම දේනුවකි.

දෙවියනි, නිමල් වෙනුවෙන් ඉතා පවිත්‍ර හැඟීමෙන් මා සියලු පරිත්‍යාගයන් කළේ - සියල්ල විනාශ කර ගත්තේ - මේ ඉරණම ඔහුට අත්පත් කර දීමට ද?

මගේ පෙම්වතා නොව ලොකු අයියා ගැන ඊළඟට මම සිතන්නට වීමි. නිමල් විසින් ම ප්‍රේමය මට හඳුන්වා දෙන්නටත් පෙරින් ඔහු මගේ හදවතට ඉතා ම සමීප ව සිටි හොඳ ම හිතවතා විය. ආත්මාර්ථය පිළිබඳ සියලු හැඟීමෙන් තොර ව මම ඔහුගේ දියුණුව පැතීමි. ඔහු විශ්ව විද්‍යාලයයට ඇතුළු වූ දවසේ මා සතුටු වූයේ ඔහු දවසක මගේ ම ජීවිතයට හවුල් කර ගැනීමේ කිසිදු බලාපොරොත්තුවක් ඇතිව නොවේ.

ඔහු මුලින් ම පේරාදෙණි ගිය ද අලුයම මා පාරට බැස ඔහුට අත වැනුවේ මගේ ම එක කුස උපන් සහෝදරයකු නොවන බව සලකාගෙන නොවේ. ලා රෝස පැහැයකින් යුත් අහස එද [illegible] ඉතා පැහැදිලි ව තිබුණු සැටි මට තවමත් මතක ය.

පද්මිනී වැනි කිලුටට පත් එකියක හා විවාහ වීමට යන්නේ ඒ මගේ ලොකු අයියා ය. මා නිමල් ට පෙම් නොබැඳ සිට මෙවැනි විවාහයක් ගැන අසන්නට ලැබුණත් ඔහු ගැන මේ වේදනාව ම මේ අනුකම්පාව ම ඇති විය හැකිව තිබිණි. සමහර විට එසේ වුණා නම් මෙබඳු විවාහයක් වැළැක්වීමට පවා මා ඉදිරිපත් විය හැකි ව තිබිණි. නිමල්ට කෙලින් ම හෝ කමලාවතීට හෝ පද්මිනී ගැන යථා තත්ත්වය කිව හැකි ව තිබිණි.

දැන් බැරි ද? රෝහණගේ මාර්ගයෙන් ඇත්ත හෙළි කර - ලොකු අයියා බේරා ගැනීමට දැනුත් ප්‍රමාද වුණා වැඩි ද?

නැවතත් මගේ සිතට මොහොතක සැනසීමක් දැනෙන්නට විය.

මට ඒ කිසිවක් කළ නො හැකි ය. මුලින් ම සියල්ල වරද්ද ගත්තේ මා විසින් ද? පද්මිනීට හෝ එවැනි අන් ඕනෑ ම යුවතියකට හෝ ලබා ගන්නට ඉඩ දී මම නිමල් අනාථ නො කළෙම් ද? ඔහුගේ විනාශයට මඟ පෑදුවේ මා ගත් තීරණය

www.sinhalaelibrary.com

නොවන්නේ ද? නැත. මම ඊට වග කිව යුතු නො වෙමි. මා වරදක් කළ බව දැනුත් මම නො සිතමි. මම මගේ යුතුකම ඉටු කළෙමි. මා සිතූ තරම් දැඩි ආදරයක් තිබුණා නම් නිමල් ඔය තරම් ඉක්මනින් පද්මිනීගේ ඇසුරට පත් නො වනු ඇත.

එකිනෙකාට ගැළපීමක් නැත්නම් ඔවුන් අතර සබඳකමක් ඇති නො වනු ඇත. සමහර විට අතීතය පිළිබඳවත් සියල්ල ඔහු දන්නවා ඇත.

කමලාවතී මා ප්‍රතික්ෂේප කළේ මා දුප්පත් එකියක බැවිනි. නිමල්ගේ අත ගැනීමට බාධා කළ මගේ එක ම නුසුදුසුකම දුප්පත්කමයි. කමලාවතී පමණක් නොව නිමල් ද ඒ සුදුසුකම ප්‍රධාන ස්ථානයෙහි ලා සලකනු ඇත.

ප්‍රථම වරට - ජීවිතයේ ප්‍රථම වරට - නිමල් හතුරුසිංහ ගැන පිළිකුලකට සමාන කහටක් මගේ සිතෙහි ඇති විය. එයින් සිත දැඩි විය.

එහෙත් ඒ මානසික තත්ත්වය ද වැඩි වේලාවක් පැවතුණේ නැත. වේදනාව විවිධ මුහුණුවරින් මගේ හද තලන්නට වන්නේ ය. අන්තිමට ඉතිරි වූයේ අසවල් එක ය යි තෝරා බේරා ගත නොහැකි දැඩි බරක් පමණකි.

රෝහණ අපේ ගෙදරට පැමිණ පැය දෙකකට වඩා නැත. එහෙත් මට සිතෙන්නේ ඒ ගමන වෙන ආත්මයක - වෙන කල්පයක - වූවක් ලෙසිනි.

බලාපොරොත්තු හා විශ්වාසයක් ඇති ව ජීවිතයට මුහුණ දීමට තීරණය කර ගෙන සිටි මා මෙසේ ඇඳේ වැතිර කල්පනාවේ නිමග්න ව ගත කිරීම වැරදි ය. පුංචි නංගී වුණත් මා ගැන මොනවා සිතනු ඇද්ද? සවස අම්මා ආවා ම මේ සියල්ල අමතක කර හොඳින් සිටිය යුතු ය. එහෙත් ඇඳෙන් නැගිට එළියට යන්නට සිතූ හැම විටක ම මට වහා එය අමතක වී ගියේ ය. ගතට කිසි පණක් ද නො විය.

මා බිත්තිය පැත්තට හැරී ඇඟිලි තුඩින් බිත්තියේ ඉරි අඳිමින් සිටින කල අනුලා පැමිණ මා අසලින් වාඩි වුණා ය. ඈ මගේ නළලට අත තැබුවා ය. අපමණ සහනයක් ගතටත් සිතටත් දැනිණ.



"අක්කෙ යමු නාන්න."

"යන්න බැරි යැ පස්සෙ"

"එන්න" යි මගේ අතින් අල්ලා අනුලා කීවේ විධානයක් ලෙසිනි. මම ඇය දෙස බලා සිනාසීමි.

ඇය මා අතින් ඇද ඇඳෙන් බිමට ගත්තා ය. අනතුරුව මා ළිඳට අඳින රෙද්ද මගේ කර දෙපැත්තෙන් දමා ඈ කතා නැති ව ඉඟිකිරීමින් මා මෙහෙය වූවා ය.

"මොකද මේ හදිසිය?"

"මොකුත් නෑ යමු නාන්න. ඔය ඇති කල්පනා කළා. දැන් [illegible] හොඳට කාලා ඉන්න එකයි."

"උඹ ඔය ද මට පිස්සු වෙයි කියල?"

"පිස්සු වෙන්න දෙයක් නෑනෙ?"

"අක්කෙ වඩා ගන්න" මිදුලට බට කල නිල්මිණී අත් දෙක මා පැත්තට ඔසවා මා ඉදිරියට පැන කීවා ය.

"එන්න දුවේ............. මම වඩා ගන්න."

"නංගී අපා............."

"එන්න............. දැන් කෙල්ලට බොහොම වෙලාවකින් මගෙ ළඟටවත් එන්න වුණේ නෑ නෙ?" යි කියමින් නිල්මිණී වඩා ගත් මම කම්මුලට කම්මුල තබා ගතිමි.

නංගී හා කතාවට හවුල් වීමට කෙතරම් උත්සාහ කළත් මගේ සිත දමනය කර ගැනීම පහසු නොවී ය. හිටි හැටියේ මා කල්පනාවට වැටී සිත එක ම පිල්ලක් දිගේ ගමන් කිරීම වළක්වා ගත නො හැකි විය.

පුංචි නංගී නිල්මිණී නාවන තුරු මම දිය රෙද්ද අඳින්නේවත් නැති ව පොකුණ අසල අත තියාගෙන වාඩි වී නිකට දණ මත ඔබාගෙන කල්පනාවට වැටුණෙමි. අතීතය පිළිබඳ නොයෙක් සිද්ධීන් - ගත වූ පැය කීපය ඇතුළත නොයෙක් වර මා විසින් මෙනෙහි කරනු ලැබ තිබුණු ඒවා මෙන් ම අලුත් සිද්ධීන් ද - සිතෙහි නැඟෙන්නට විය.

"අක්කෙ නාන්න ඉතින්"

"නංගි නාන්න"

"ඔය ගවුම ඉවර කරල දෙන්න. ඉක්මනට දිය රෙද්ද ඇඳගෙන"

"මොට ද?"

"හෝදන්න"

"මෙක කිලුටු නෑ"

නිල්මිණී පිසදා ඇඳුම් අන්දවා හමාර කළ අනුලා පිටු පසින් පැමිණ කිති කැවෙන පරිදි කිහිල්ල යටින් අත තබා මා උස්සන්නට තැත් කළා ය. මා සිනාසෙමින් ඇයගෙන් ගැලවීමට ගත් වෑයමේ දී පිටුපසට බරවී වැටෙන්නට ගොස් බේරුණේ බිමට අතක් තබා ගනිමිනි.

නිල්මිණී අප්පුඩි ගසමින් හූ කියමින් සිනාසෙන්නට වූවා ය.

"මොන එකක් ද? තුවාලත් වෙන්න ගියා" යි මම ද සිනාසෙමින් නැගිට්ටෙමි.

බොරු තරහක් ආරූඪ කරගෙන සිටි අනුලා සිනාව පෙන්වූයේ නැත.

"ඉක්මනට!"

නැවතත් විධානයකි.

"ගවුම හේදුවම මම මොකක්ද අඳින්නෙ?"

"මම දෙන්නම් කො අඳින්න එකක්."

මා දිය රෙද්ද ඇඳ ගත් නමුත් එක වර ම නාන්නට පටන් ගත්තේ නැත. මා පොකුණ මිදුලට වී ගෙතුණු කොණ්ඩය අලස ලෙස මුදා ගන්නා අතර පුංචි නංගී හෝස් ගා මගේ ඇඟට වතුර බාල්දියක් විසි කළා ය. නිල්මිණී එවර ද සිනාසුණා ය.

"මෙකිට විසේ!" යි කියමින් මම ඉවතට පැන්නෙමි.

මා නාන්නට වූ අතර අනුලා මගේ ගවුම සේදුවා ය. ඇය මට අලුත් ගවුමක් ද ගෙනැවිත් තිබිණි.



කවදත් ස්නානයට ගිය බොහෝ අවස්ථාවල මට අතීතය ද නිමල් ද මතක් වන කරුණක් ඇත. කුඩා දවස සිංහල අවුරුදු දවස නිමල් මා මන්චිලි පද්දවන කල දණ මඬලේ වූ තුවාලයේ කැළල අසු වෙයි. තවමත් දණහත වේදනාවකට සහනය ගෙන දෙන්නට මෙන් ඇඟිලි තුඩුවලින් මේ කැළල පිරිමදින කල සිත නොදැනුවත්ව ම අතීතයට ගමන් කරයි.

දිය නෑමෙන් පසුව ගතට දැනුණු සුවපහසු ගතිය සිතට බලපෑමක් ඇති නොකළා ම නොවේ.

"ළමයිනේ එළවළු ටිකක් නම් ඇති." යි අප නාගෙන එන අතර මඟ දී හමු වූ ගොවියෙක් කීය.

"අපි තව ටිකකින් එන්නම්." මම කීවෙමි.

"අක්කෙ හෙට ඉරිද"

"කිව්වත් වගෙ මතක ම නැති වුණා"

"මැඟි අක්කලාගෙ කොටුවෙ නම් ඇති පලා ජාතියක්............. නිවිතිත් තිබුණා."

"දෙතුන් තැනකට ගියාම මොකුත් හොයා ගත්තැකි"

"අක්කෙ මාත් අනව"

"හැබැයි පයින් අනවන්න ඕන. වඩාගෙන බෑ."

"ඔය අක්කනෙ ඕකි නරක් කරල තියෙන්නෙ. මාත් එක්ක නම් කොහෙත් යනත් පයින් යනව............ මේ බත් හැලිය උස්සගෙන යන්න බෑ දූත් හරි බරයි."

"අ-නේ ඒකිට බත් හැලිය කියන්න එපා."

මා එසේ කීවාට පසු නිල්මිණී ශෝකයෙන් කට උල් කර ගත්තා ය. මම ඇය වඩා ගතිමි.

ගෙදර ගිය අපි තේ වතුර ටිකක් බී දොර වසා එළවළු එකතු කරන්නට කීප තැනකට ගියෙමු. එහි දී මට නොයෙක් දෙනා සමඟ කතා කරන්නටත් සිනාසෙන්නටත් සිදු විය. බාහිර වශයෙන් කිසි වෙනසක් නොපෙන්වා හැසිරිය යුතු ව තිබිණි. ඇතැම් තැනක දී මම ඕනෑවටත් වඩා සිනාසිමි.

www.sinhalaelibrary.com

පොත් පාඩම් කරන්නට තිබෙන නිසා වැඩි වශයෙන් අනුලා කෑම පිසීමට හවුල් වන්නේ නැතත් මෙදින මට උදව්වට ආවා ය.

ඇඳිරි වැටෙන විගස නින්දට යන බැවින් මම සිරිත් පරිදි නිල්මිණිට බත් බෙදා දුනිමි. නිවිති, කං කුං හා දඹල වශයක් මිටි බැඳීමට තිබිණි.

"අක්කෙ මේක ඉවරයක් කරල දාමු."

"නංගි පාඩම් කරන්න. අද දවසෙම මම නිකම්ම නෙ හිටියෙ. මම ඕක කරන්නම්."

"ඊ වෙලා පාඩම් කරනව"

තව ටිකකින් අම්මා එනු ඇත. මම කුප්පි ලාම්පුව ද රැගෙන කාමරයට ගොස් කණ්ණාඩියෙන් බැලීමි. මගේ මුහුණ බැලූ බැල්මට පෙනෙන තරමේ වැහැරීමකට අසු වී තිබිණි. අම්මා එන විට මුහුණ දෙන විදිහ ගැන අත්හදා බැලීමට මෙන් මම සිනාසෙන්නට උත්සාහ ගතිමි. මුහුණට මතු වූයේ මා ගැන මට ම දුක සිතෙන ආත්මානුකම්පාවකින් ළය මුසපත් කරන අතිශයින් අසරණ පෙනීමකි. මම වහා කණ්ණාඩිය අසලින් ඈත් වීමි. කඳුළු නො හෙළා සිටින්නට මෙතෙක් ගත් වෑයම අපතේ හරින්නට වුණොත් ලොකු මදිකමක් ලෙස මම සලකමි.

මේ වන විට කෙස් වැටිය වියැළී තිබිණි. හිස පීරා ගත් මම තනි කරලට ගොතා මුහුණේ පියරු ටිකක් ද තවරාගෙන ආපසු සාලයට ආවෙමි. පුංචි නංගී බිම වැතිර වාඩි වී පළා මිටි බඳින්නට පටන්ගෙන සිටියා ය. ඈ හිස ඔසවා විනාඩියකට කිට්ටු කාලයක් මා දෙස තියුණු බැල්මක් හෙළා ගත්තා ය.

"ආයෙත් ඇඬුව ද?"

"ඇඬුව ද?" මම වහා නංගී වෙත පිටුපසින් ගොස් දෙපාවලට ඇය හිර වන සේ සිටගෙන කෙස් රොදකින් අල්ලා මා වෙත මුහුණ ඉළහට හැරෙන සේ හිස පස්සට නමා "ආයෙත් ඇඬුව ද කියන්නෙ උඹ දක්කද බොංඩි අද දවසෙ මම අඬනවා?" යි ඇසීමි.



"ඌයි" කියාගෙන ඈ අඬන ලෙසින් හඬ නගා සිනාසුණා ය.

"කියපන් කියපන් මම ඇඬුව ද?" ඇයගේ හිස ගැස්සෙන ලෙස අදින අදින පාරට මම ඇසීමි.

"නෑ. නෑ. නෑ. අතාරින්න."

හිස අතහැර ඇයගේ කට මිරිකා ගත් මම,

"ඇඬුවයි කියල බොරු හෙම ගොතාගෙන ඉඳල අම්මට කිව්වොත් කට කඩනව කරට්ටිගෙ" යි. සිනාසෙමින් ම කී මම අනුලා අසල බිම වාඩිවෙමින් "උඹ එන්නෙ මාව ආණ්ඩු කරන්න ද?" යි ඇසීමි.

අනුලා කට පිසදා ගත්තා ය.

"කොලත් විකුණ ද කොහි ද?" ඇත්තට ම ලේ ඇද්දූ යි සිතෙන ලෙසින් ඈ අත්ල පිරික්සා බැලුවා ය. "............... ආණ්ඩු කරන්න තමයි වෙලා තියෙන්නෙ තමන්ට තමන් ආණ්ඩු කරන්න බැරි නම්"

මම කතා නොකර බිම දිගා වී ඇය අසල තිබුණු නිවිති මිල්ල මට ළං කර ගතිමි. අප අතර මඳ නිශ්ශබ්දතාවක් මතු විය.

"පුංචි නංගි පාඩම් කරන්න. මම මේක බඳින්නම්"

"හෙටත් තියෙන්නෙ අක්කෙ"

මම නිවිති දඬු ගණනට කපන්නට පටන් ගතිමි.

"ලොකු අක්ක හොඳට ම දන්නව මම ඕව අම්මට කියන්නෙ නැති විත්තිය"

"මම බොරුවට නෙ කිව්වෙ"

"ඇත්ත. හිතට අමාරුයි. මම කියන්නෙ නෑ. හබුත්..............."

"නෑ මට නිකම් හීනයක් වගෙ වුණා පද්මිනී බඳිනව කිව්ව ම..............."

ඒ කාලයේ මෙන් ම ඉන් පසුවත් පාසල ගැන ගෙදරදී කෙරුණු නොයෙක් කතා අනුව පද්මිනී සේනාරත්න ගැන

www.sinhalaelibrary.com

බොහෝ දේවලුත් ඇය මගේ හොඳම මිතුරිය බවත් අනුලා දැන සිටි නමුත් මා ඇයගේ අර ගුප්ත කොටස නංගීට කියා නැත. "මට හිතෙන්නෙ අපරාදෙ ලොකයියට ලැබෙන්න යන්නෙ මෙන්න මේ ජාතියෙ එකියකැ" යි ඇයට හෙළි කරන්නට මම මෙදින ද නොසිතුවෙමි. යම්කිසි කරුණක් ගැන ඇත්ත නො දැන මං මුළා වූවකුට ඇත්ත හෙළි නොකර සිටින්නට වීමේ දී ඇති වන බර මා ඉවසා ගත්තේ ආයාසයෙනි.

"ඕව ඔහොම තමයි ඉතින්............. ඔයිට වැඩිය දේවල් වෙන්නෙ. ඕව................"

"මම හිතන්නෙත් එහෙම තමයි"

"අක්ක කියන්නෙ අපි මේ ගැන කතා කරමු ද? නැද්ද?"

මම අනුලා දෙස හිස ඔසවා බැලීමි. කං කුං මිටක් සහිත අත බිම තබාගෙන ඇ මා දෙස විවෘත බැල්මෙන් බලා සිටියා ය.

"කතා කරන්න ගියාම අක්කගෙ හිතේ අමාරු වැඩි වෙනවද?"

"උඹ පැහිච්ච ආච්චිනෙ. දූත් කියපන් බලන්න උඹේ හිතේ තියන දේවලුත්"

"පැහිච්චකමක් නෙවි මම කියන්නෙ. මට හිතෙන දෙයක්............ අක්ක හිතන්නෙ නැද්ද අක්ක ඉස්කෝලෙන් අස්වුණු ලගදිම ඔය දෙන්න යාළු වුණා කියන එක?"

"එහෙම තමයි වෙන්න ඇත්තෙ. වෙන කොහොමද?"

"ඉතින්..............? දෙන්න දෙවිදියක යාළුවො............ පොඩ්ඩක් හරි අක්ක ගැන හැඟීමක් තියනව නම්............"

"නමුත් නංගියෙ මමනෙ හිතින් අස්කර ගත්තෙ. පද්මින් ඒක දන්නව මම නැති බව"

"හරි අක්කෙ.............. නමුත් ඔය තරම් ඉක්මනට නිමල්ට පුළුවන් වුණා නෙ වෙන කෙනෙක් යාළු කර ගන්න? ඒකයි මම කියන්නෙ............"



"මම හිතුවෙත් ඒකමයි."

"ඉතින් ඕවගෙ අය ගැන හිතල දුක් වෙන එකත් මෝඩ කමක්..............."

"මම හිත හද ගත්ත"

"එකක් කියන්නම්, ඔය මඟුල හරියන එකක් නම් නෙවි."

"වගේ වනහතුරෙකුට වත් එහෙම එකක් හිතන්න එපා දූ-වී!"

"මම එහෙම වෙන්න කියල හිතනව නෙවි. ඒ දෙන්න සමහර විට සතුටින් හිටී. හැබැයි නැන්ද හිතේ තියාගෙන හිටිය විදියට ඉන්න ලැබෙන එකක් නෑ. මෙයාගෙ ඩියාරෝකම තිබුණට මේ පැත්තෙ කාංචිට කවද හරි කිට්ටු වෙන්න බැරි වෙයි. ඩියාරෝව වෙයි ගෑනිගෙ සල්ලිවලට යටවෙලා ඉන්න."

"අර ළමය නම් දුප්පත් පෝසත් කියල වෙනස්කමක් නෑ.............."

"ඒ ඉස්සර අක්කෙ............. ඉස්කෝලෙ යන කාලෙ නැතුවට දැන් යසට ඕව සලකනව ඇති."

"මෙකි මේ පණ්ඩිතකම් දැනගෙන තියෙන්නෙ මම හිතන්නෙ ගුණපාලගෙ බණ අහල."

ඇ චිකිස් ගා සිනාසුණා ය.

"හැබැයි ඒ සාසනේ මහණ වෙන්න නෙම යන්න එපා."

"ඒ අයිය ආවෙ නෑ හුඟ දවසකින්"

ගුණපාල ආවොත් හොඳ ය යි මටත් සිතිණි. ඉස්සර ඇතැම් අවස්ථාවක දී මට විසඳුම් සොයා දුන්නේ ගුණපාල ය. ප්‍රේමය පිළිබඳ ප්‍රශ්නයක් ගැන මම මීට කලින් ඔහු හා කතා කර නැතත් දැන් මට නිදහසක් තිබේ. අනෙක් අතට මට මේ නිදහස ඇති බව දැන ගත්තා ඔහු පිනා යනු යි බියක් මට ඇති විය.

"හත හමාර එනව" ඇත එන හඬට කන් දුන් නංගී කීවා ය.

"තේකලේ ළිපේ නේ ද?"

www.sinhalaelibrary.com

"ඔව්"

අපි කුප්පි ලාම්පුවත් රැගෙන ඉස්තෝප්පුවට ගියෙමු. බස් රිය නතර වූ පසු ඇතුළේ එළියෙන් මම අම්මා දුටුවෙමි. පාරට ගිය අපි වට්ටි පෙට්ටි රැගෙන ගෙට අවුත් ඉස්සරහ දොර යළිත් වසා ගතිමු.

"අරක නිදිද?"

"නිදි අම්මෙ"

"ඔන්න ඔකෙ ඇති කළු දොදොල් වගයක්. තුනි එයි. උදේට දෙන්න අරගෙන තියහන්."

"දූන්නම් අම්මෙ නිද ගන්න ගියා ම දත් කුරු කනව. පැණිරස දෙන්නත් හොඳ නෑ."

"ලොකු අක්කෙ............. නිදගන්නෙත් මූණින් අතට"

"පණු බේත් ටිකක් අරගෙන දීපන්" ය යි කියමින් අම්මා ඇඳ ළඟට ගොස් නැමී බලා සිට දූරියගේ හිස අත ගෑවා ය.

මුහුණ සෝදා ගත් අම්මා තේ ටිකක් බිව්වා ය. මම සිටින් පසු ඇයගේ හිස තෙල් ගැල්වීමි.

"නිව්ති මැගියගෙ ද?"

"සත පනහක් දුන්නා. පස්සෙ තව කීයක් හරි දෙනව."

"එදත් මගෙන් සත විසි පහක් ඉල්ල ගත්ත"

"හෙරි මට ඒක කිව්වෙ වත් නෑ"

මම වෙනදටත් වඩා ටිකක් වැඩි පුර කතා කළෙමි. පුවත් හැම තැනක දී සිනාසුණෙමි.

අම්මා පුරුදු පරිදි නින්දට ගියා ය.

පුංචි නංගී පොත් පාඩම් කරන්නට සැරසී.

"ලොකු අක්ක නිදගන්න ද?" යි ඇසුවා ය.

"කියවන්න පොතක් කාරිය නෑ නංගි ළඟ. නේ ද?"



"විරාගය තමයි තියෙන්නෙ. ඒක අක්ක මිනෑ තරම් කියවල ඇති නෙ?"

"කමක් නෑ දෙන්න, ආයෙ සැරයක් බලනව"

මම 'විරාගය' කියවන්නට ගතිමි. වරින් වර කියවන දේවල් බිලිනි යන සිතට අනෙක් මතකයන් රිංගන්න විය. ටික වේලාවක් යන විට පොත කියවන බව බොරුවට පෙන්වමින් කල්පනා නොකර නිවී හැනහිල්ලේ සිටින්නට මට වුවමනා විය. පොත වසා මේසය මත තැබූ මම ඇතුමත් හැරීයෙමි. නංගී ඊට එවුණා ය.

"අක්කෙ නිද ගනිමු. මටත් නිදි මතයි."

අපි ඇඳට වැටුණෙමු. මෙනෙහි කර අවසානයක් කර ගතිමියි වේලාසන සිතාගෙන සිටි කරුණු - පිළිතුරු දී විසඳා නිම කර ගතිමි යි සිතාගෙන සිටි ප්‍රශ්න - සියල්ල නැවත නැවතත් වඩ වඩාත් වේදනා ගෙන දෙමින් මතු වන්නට පටන් ගත්තේ ය. නිද ගන්නට තබා ඇස් පියා ගන්නට වත් නො සිතෙයි. මම අඳුරේ ඇස් ඇරගෙන කල්පනා කරන්නට වීමි.

"අක්කෙ?" මගේ සුසුමක් ඇසී පුංචි නංගී ඇසුවා ය. මම කතා නො කළෙමි. ඉරියව්ව වෙනස් නොකර සුසුම් පිට නොකර සිටීම පහසු නො විය.

වරක් මම අනෙක් අතට හැරුණේ ඉතා සීරුවෙනි.

"අක්ක නිදි නැද්ද?"

නින්ද ගිය විදියට සිටින කල මට සිනා යන්නට ආවේ ය. මොහොතක දී සිනාව අඳුරට එකතු වී මැකී ගියේ ය.

මගේ සිතට සහනයක් ඇති වූයේ තවත් ටික වේලාවකින් අඬුලා නිදි බව දිග හුස්මෙන් දැන ගත් පසුව ය. මම මුළු රැය ම එයාගේ අවදි ව ගත කළෙමි. අලුයම් යාමයේ මට යන්තම් - කඩින් කඩ - නින්ද ගියේ ය. ඒ හැම නින්දක දී ම මම නිමල් හා පද්මිනී සිහිනෙන් දුටුවෙමි. මා ඔවුන් දුටුවේ අසවල් විදියට ය යි සිතා ගත නො හැකි අන්දමිනි.

පසුව ද මගේ ගතට දැඩි අප්‍රාණික ගතියක් දනෙන්නට විය.

සඳුදා උදේ පුංචි නංගී පාසල් ගියේ නො කැමැත්තෙන් මෙනි. පොත් ටික අතට ගත් පසුත් ඈ හැරී මා වෙත පැමිණ තේරුමක් සහිත සිනාවෙන් බලාගෙන මඳක් සිටියා ය.

"ඔන්න අක්කෙ හොඳට ඉන්න ඕනෑ." යි ඇයගේ බැල්ම මට අවවාද කළේ ය.

"යන්න. යන්න. දැන් පරක්කු වුණා" යි මම ඇයගේ පිටට අත තබා කීවෙමි. එහෙත් ඇත්ත වශයෙන් මට වුවමනා කළේත් පුළුවන් නම් නංගී නොයවා නතර කර ගැනීමට ය. මා බිය වූ පරිද්දෙන් ම, ඇය ගිය පසු මට මහා පාළුවක් දනෙන්නට විය. ඒ වූ කලී තාත්තා මළ අලුත ගෙදර තනි වූ විට උදය කාලයන්හි මගේ හදවත මිරිකා ගත් පාළුවටත් වඩා දැඩි එකකි. මේ පාළුව මැද අහෝ මම කෙසේ නම් ඔවුන් ගැන නො සිතා සිටින්නෙම් ද?

අලුත් බලාපොරොත්තු හා විශ්වාසයක් උපදවාගෙන හොඳින් සිටීමට ගත් උත්සාහය විනාශ වී යෑම නිසා මම නැවත මහත් සේ කලකිරෙන්නට පටන් ගතිමි. අම්මා, නංගී හා නිල්මිණි වෙනුවෙන් සියල්ල අතහැර හොඳින් ජීවත් වීමට ඇති කර ගත් අධිෂ්ඨානයත් දියාරු වීමට යෑම නිසා මට මා ගැන ම තරහක් ද ඇති විය.

මා කිසිවක් ගැන උත්සාහයෙන් වුවමනාවෙන් සිතුවා හෝ කල්පනා කළා හෝ නො වේ. කඩා කුඹී රැළක් මෙන් අතීතය පිළිබඳ මතකයන් නොකඩවා සිතට ඇතුළු වී හදවත පත්ල විත විකා රිදවයි.

මට නින්ද යෑම අඩු විය. මා සිතා මතා නොකා නොබී සිටියා ද නොවේ. එහෙත් මට කෑම රුචියක් නො විය.

"උඹේ ඔළුව කැක්කුම ආයිත් තියනවද?" සතියකට පසුව දවසෙක අම්මා හදිසියේ ඇසුවා ය. මමත් නංගීත් වහා එකිනෙකාගේ මුහුණු බලා ගතිමු. අනුලාගේ මුහුණේ වූයේ වේදනාවකි.



"අර එද කළු දෙදෙල් කෑවද ඉඳල මගෙ බඩ රිදෙනව අම්මෙ.............."

"පොඩි එකීට නො දී හොරෙන් කෑව නිසා"

මට අනුලා සිප ගන්නට සිතිණි.

"අජීර්ණයක් වෙන්නැති. ඕකට බෙහෙත් බීපන්.............. උඹ දැන් ඇඳිල ගිහිල්ල මේ ටිකේ............ ඇත්තට හැටි! හිටියයින් බාගයයි.............."

අම්මා මා දෙස බලා ගත්තේ ම ය.

මම බිම බලා ගතිමි.

"හෙට කසායක් අඹගන්නව"

නිමල් හා පද්මිනී අතර විවාහය පිළිබඳ දින නියම වන විට මගේ හදවත වේදනාවෙන් පදම් වී තිබිණි.

මේ සඳහා ලොකු උත්සවයක් පැවැත්වීමට කමලාවතීට අවශ්‍ය විය. මා පසුව දැන ගත් පරිදි පුතාටත් මෙවැනි වුවමනා කළේ ඇද විධියකට උත්සව පැවැත්වීමට ය. හෝටලයක උත්සවය පැවැත්වීමට නිමල්ගේ අදහස වූ අතර මවට වුවමනා කරන්නේ ගෙදර මඟුල් කෑමට ය. මේ අනුව ගමේ හා අවට හිතවතුනටත් දුර නෑයනටත් ගෙදර මඟුල් කන්නට තීරණය විය. ඊළඟට මංගල්‍යය පවත්වන ලද්දේ කොළඹ මහ හෝටලයේ ය. ඒ අන් කෙනෙක් නොව ලොකු නංගීගේ රූ රැජින තේරීමේ උත්සවය පැවැත්වුණු හෝටලය ම ය.

මධු සමය ගත කර සුමානයකට පසුව ජෝඩුවත් මනාලියගේ නෑයනුත් ගෙදර එන ද තවත් උත්සවයක් විය.

කමලාවතී ඊට කලින් දවසක අපේ ගෙදර ආවා ය.

"ජේන් අක්කෙ මට මේ වැඩ ටික කර ගන්න උදව් වෙන්න ඕනෑ කවුරුත් එක්කල" යි ඈ කීවා ය.

"අනේ ඔව්. ඉතින් ඕනෑ දෙයක් අපිටත් කියන්න.............."

"වැඩ තුනක් නෙ ජේන් අක්කෙ............. තුන් විදියකට ලෑස්ති වෙන්න එපා යෑ.............. මඟුල් තුනක වියදම.............."

www.sinhalaelibrary.com

"ඔව් ඉතින් මුලින් ම කරන කටයුත්ත නෙ"

"ජේන් අක්කෙ කැවුම් ටිකක්, ආස්මි ටිකක් හද ගන්නත් එපා යැ"

"ඔව් ඉතින් මඟුලක් තුලාවක් වුණාම කැවිලි පෙවිලි ටිකත් නැතුව පුළුවනෑ."

කමලාවතී කතා කළේ මගේ ඇස් මඟ හරිමිනි. මා ද කතාවට හවුල් වුණේ නැත.

විනාඩියක් දෙකක් නතනමින් සිටි ඈ,

"අපිට කරන්න පුළුවන් වැඩක් නෙම නෙමෙයි ජේන් අක්කෙ............. ලක්ෂපතියො" යි කියා මගේ මුහුණ බැලුවා ය.

ඒ බැල්මෙන් ඇය කළේ මගෙන් සමාව ඉල්ලීමක් ද?

"ඔව් ඉතින් ඒ ළමයත් රටක් වටින දරුවෙක් නෙ. ගමටම නම්බුවක්"

මට නිමල් ගැන ඇති වුණේ අනුකම්පාවකි. දුකකි.

"වැඩියම නැයින්ටයි ගමේ මිනිස්සුන්ටයි ගෙදර බත දෙන්න කල්පනා කළේ ඔය හෝටල්වලට කියන්න බෑ ජේන් අක්කෙ හැමෝටම. ඒ පැත්තෙ විදියට ඇඳගෙන පැළඳගෙන යන්න වුණත් කවුද අපිට ඉන්නෙ? අර නොකියම බැරි නැයින්ට කිව්වා. අනිත් ඔක්කොම හෝටලේට එන්නෙ ලොකු පුතාගෙ යාළුවො............. අපේ කීප දෙනෙක් නම් තරහ වෙයි. ඒ වුණාට කරන්න දෙයක් නෑ."

"තරහ වුණයි කියල මොනව කරන්න ද? ඩියාරෝ මහත්තයාට අවනම්බුවක් නො වෙන්න වැඩ කරන්න එපා යැ?"

"ජේන් අක්කෙ දන් බද්දයි කැවිලි ටික උයා ගන්න තියෙන්නෙ. වෙළඳාමෙ යනව ද එදට.............."

"මෙහා.............. එක දවසක් වෙළඳාමෙ නොගියයි කියල මට පනාසියක් පාඩු වෙනවද?"

"ජේන් අක්ක ආවොත් නම් හොඳයි. හැමෝ ම හිතවත් නෑ ජේන් අක්කෙ. දන් ඉස්සරටත් වැඩිය ඉරිසියාව අපේ පවුල ගැන..............."



ඇය කතා කළෙ ආරූඪ කර ගත් අසරණ ගතියක් ඇති ව ය. අනෙක් අතට තමා මහන්සියෙන් ගොඩ නංවාගත් සුන්දර ලෝකයට ආරක්ෂාවට එන ලෙස අපගෙන් බැගෑපත් ඉල්ලීමක් කරන බවක් මට පෙනී ගියේ ය. මගේ හිත මොළොක් විය.

"අම්මට එන්න බැරියැ නැත්දෙ එදට. ඔක මොකක් ද දවසක් වෙළඳාමෙ නොගිය කියල."

"කුසුමෙ ඉවර තියෙනව නම් උඹත් වරෙන්." ඈ මගේ නිකට හරියට යොමා ගත් බැල්මෙන් කීවා ය.

'ඉවර තියෙනව නම්' යනුවෙන් ඇය කීවේ මා කාර්ය බහුල කෙනකු වශයෙන් සිතාගෙන නො වේ. 'කැමැති නම්' යන්න වෙනුවට ය. මා කැමැති නම් 'සිසිල' දෙරවල් දන් මට විවෘත වී ඇත. දන් ඇය වෙත මා ගැන බියක් නැත.

අඟහරුවාද රාත්‍රියේ අම්මා මට කතා කළා ය.

"උඹත් යනව ද කුසුමෙ හෙට?" ඈ ඇසුවා ය.

"මට එක අතකට යන්නත් ආසයි.............. පුංචිගෙ මොක ද කියන්නෙ............?"

"පුළුවන් නම් යනවට මමත් කැමැතියි. වෙන එකක් නිසා නෙවි. අක්කටත් ආත්ම ශක්තියක් තියෙන බව ඒ ගොල්ලට පෙන්නන්න"

"කාටවත් ආඩම්බර පෙන්නන්න එහෙම නම් යන්න ඕනෑ නෑ කුසුමෙ" යි අම්මා කීවේ අනුලා ගැන මවා ගත් තරහකින් ය.

"අම්මට තරහයි යාළුවට මොකුත් කියනවට" ඇය හිමින් මට කීවා ය.

නිල්මිණි අන්දවාගෙන මා 'සිසිලට' ගියේ සන්සුන් සිතින් ය යි කීවොත් බොරුවකි. එහි ළං වත් ම මගේ හදවත තිගැස්ම වෙතත් දැඩි විය. සියලු දෙනා ම මගේ පැමිණීම ලොකු සිද්ධියක් ලෙස සලකා බලතැ යි මට සිතිණි. එක වර ම හැඟුණේ මේ තරම ඒමෙන් මා මෝඩකමක් කළ බවකි.

මා 'සිසිලට' අන්තිමට ගොස් තිබුණේ ඊට කලින් ද සවස ය යි සිතෙන තරම් කුළුපගකමක් ද මට වහා ඇති විය. අනෙක් අතට අමුතු වර්ණයන්ගෙන් වැසුණු බිත්ති සහිත ගෙයත්, තවමත් සරසා නැති මඟුල් මඩුවත් විස්සක තිහක පිරිසත් නිසා පරිසරයේ නුපුරුදු ගතියක් ඇතැයි මගේ නෙතටත් සිතටත් වහා අවබෝධ විය. පිටුපස පැත්තෙන් ගිය අපි මඟුල් මඩුව අසල නතර වීමු. එහි කාච්චියක් වටා ගෑනු කීප දෙනෙක් ද පිටි කොටනු තවත් පිරිසක් ද වූහ.

"ආ ඔය ඉන්නෙ වැඩට ඕනෑ තරම් සෙනඟ" යි අප දුටු කමලාවතී කිසි වෙනසක් නැති බව පෙන්වීමට මෙන් කීවා ය. මම සිනාසුණෙමි.

"යමු ජේන් අක්කෙ............. තේ ටිකක් හෙම බීල ඉන්න"

"බැරියැ බැරියැ තේ බොන්න, දැන් මොනව ද කරන්න තියෙන්නෙ?"

"අර මේසෙට යමු. වරෙන් කුසුමෙ............."

ගේ ඇතුළට යෑමේ ආශාව මගේ සිතේ මැඩ ගත නො හැකි තරම් දැඩි ලෙස මතුවන්නට විය. පවුලේ අයගෙන් මට තවමත් දක්නට ලැබුණේ කමලාවතී හා ගාමිණී පමණකි. ගේ ඇතුළෙන් එන කටහඬවල් අතරින් යමක් හඳුනාගැනීමට මගේ සවන් උත්සුක විය.

නිල්මිණී මගේ ඇඟේ එල්ලුණු ගමන් ම ය. මම ඒ ගැන සතුටු වීමි. මම ඇයගේ අත තරයේ අල්ලා ගතිමි. අම්මා මගෙන් වෙන් වුණා ය. මට පාළුවක් දැනිණි. එහෙත් ස්ථානයට පුරුදු වීමට මම මහන්සි ගතිමි.

මම තිස්ස දුටුවෙමි. වේල් පෙරහර බලන්නට ගොස් අතරමං වී සිටිය දී හඳුනන කෙනකු හමු වූ කල ඇති වන සතුටින් මම ඔහු වෙත ගියෙමි.

"මල්ලිල ට හරියට වැඩ වගෙ. නේ ද?"

"අක්කලටයි අද වැඩ තියෙන්නෙ."

"අද ඉස්කෝලෙ ගියෙත් නෑ නේ ද? කෝ දෙවෙනියිය හෙම ආවෙ නැද්ද තාම?"



"දෙවෙනියියයි ලොකයියයි තාත්තයි ගියා කොළඹ............ බඩු වගයක් ගේන්න............."

බලාපොරොත්තු සුන් වූ ගතියක් මට ඇති විය.

"කුසුමෙ වරෙන්............ වරෙන් ඔය දරුවත් එක්කලම්"

නිල්මිණීට පාන් කෑල්ලක් හා කෙසෙල් ගෙඩියක් අතට දුන් මම තේ කෝප්පයක් පමණක් බොන අදහසින් සිටගෙන සිටියෙමි.

"මොකද කුසුමෙ උඹට පුරුදු නැති තැනක් ද? අරගෙන කාපන්" කමලාවතී මා මේසයට වඩාත් ළං වන සේ තල්ලු කරමින් කීවා ය.

"මම කන්නම් නැත්දෙ"

ඇයට වුවමනා කරන්නේ මට නැවතත් තැන පුරුදු කරවීම ම නොව තමා ම මට පුරුදු වීම ය යි සිතුණෙන් මගේ සිතට ධෛර්යයක් ආවේ ය.

තේ බී හමාර වන විට මට පමණක් නොව නිල්මිණීට ද පරිසරය පුරුදු වේගෙන එන්නට විය. ඈ ටිකින් ටික මගෙන් ඈත් වී ස්ථානයේ විසිතුරු බලන්නට වූවා ය.

අම්මා මඟුල් මඩුවට ගොස් කාච්චියක් වෙත වාඩි වුණා ය. ඇත්ත වශයෙන් මට කරන්නට ඒ තරම් ම වැඩක් නො විණි. වැඩක් තිබුණත් නැතත් මෙවැනි තැනක උඩ බලාගෙන සිටීම මගේ ගතිය නොවුණු නමුත් වැඩ කරන අයට හවුල් වන තරමට මගේ සිත ඒ වන විටත් සන්සුන් ව නො තිබිණි. මා සිතූ පරිදි කිසිවකු මගේ පැමිණීම අමුත්තක් කොට නොසලකන බවට හැඟීම නම් මට සහනයක් ගෙන දුන්නේ ය. පිටුපසින් ගිය මම සාලයට ඇතුළු වීමි. එහි අලුත් සැටියක් විය. ටීපෝව මත එළියෙන් එන දොරටුව දෙසට හැරෙන සේ තැබූ රාමු කළ පින්තූරයක් විය. මම ළං වී බැලීමි. පින්තූරය හඳුනා ගත් මම තිගැස්සී ගියෙමි. ඒ පද්මිනී සේනාරත්න ය. පින්තූරය සොළොස් හැවිරිදි පාසල් දැරියකගේ නො වේ. හොඳින් ඇඳ පැළඳ අමුතු කොණ්ඩා මෝස්තරයකින් සැරසුණු පරිපුන් තරුණියකගේ උඩු

තය රූපයකි. ඒ ඇස්, ඒ නැහැය, ඒ දෙ තොල්. එහෙත් මුහුණ ඇයගේ නො වේ. මා හැඳින සිටි පද්මිනීගේ නො වේ.

මඟුල් මඩුව දෙසින් නොයෙක් දෙනාගේ කතාබස් ද පිටි කොටන ගිඩි ගිඩි හඬ ද ඇසෙන්නට විය. ඒ හැම දෙනාට ම නො දනුවත්ව පාළු සාලයට මා ආවේ හොරකමකට ය යන හැඟීමෙන් මම කලබල වීමි.

නිල්මිණි අඬනු ඇසී මම පිටුපසට දුවගෙන ගියෙමි. තිස්ස ඇය නලවන්නට උත්සාහ කරමින් සිටියේ ය.

"මම ඉන්නව දුවේ. ඇයි අඬන්නෙ? අපෝ මම දාල යන්නෙ නෑ නෙ දුව.............." නිල්මිණි ඇගේ එල්ලුණු කල මම ඇය වඩා ගතිමි.

මම ඇයත් වඩාගෙන මඟුල් මඩුවට ගියෙමි.

"කොහේ ද මේ ළමය මොකුත් කරන්න දෙන එකක් යැ?" මම අම්මාට කීවෙමි.

"මොකද ඇඬුවෙ?"

"බොරු නුරුකලේ!"

මට මෙතැන ද රැඳෙන්නට නුපුළුවන. මට ඕනෑ කරන්නේ සාලයට යන්නට ය. සෙලවෙන දතක් තව තවත් සොලවා වේදනා විඳින්නට ඇති ආශාවක් මෙන් පද්මිනීගේ ඡායාරූපය නැවත නැවතත් බලා වේදනා විඳින්නට මට වුවමනා විය.

මට වැඩක් නැති ව නිකම් උඩ බලාගෙන සිටින්නට ද බැරි ය. වැඩ තිබුණත් මට කළ හැකි නො විය. කලින් මෙන් ඒ තරම් කමන්ගේ කමකින් ක්‍රියා කරන්නට අයිතියකුත් මට නැත. වුවමනාවක් ද නැත. මම අපහසු තත්ත්වයකට පත්වීමි. වැඩ සිඟෙන තැනක පෙනුමට පමණක් සිටින්නටත් මට පුරුද්දක් නැත.

"එන්න දුවේ අපි අර ගේ අතු ගාල දාන්න"

එහි දී මට සාලයේ විනාඩි ගණනක් සිටින්නට පුළුවන් වුණා පමණක් නොව චකිතයක් නැති ව ගෙයි ඇවිදින්නටත් පුළුවන් විය. මම කොස්සත් රැගෙන පද්මිනී දෙස බලාගෙන ම



ඉස්තෝප්පුවට ගියෙමි. නිල්මිණි පුටුවක වාඩි කරවා මම ඉස්තෝප්පුව වෙත ම අතු ගාන්නට වීමි. අනුන්ගේ කාමරවලට එබී බැලීම නරක වැඩකි. එහෙත් ඉස්තෝප්පුව කෙළවර අතු ගාද්දී දොර රෙද්ද මෑත් කර කාමරයට එබී නොබලා සිටින්නට මම අපොහොසත් වීමි. මා එක වර ම දුටුවේ බිත්තියේ එල්ලා තිබුණු නිමල් හතුරුසිංහගේ ලොකු ඡායාරූපය යි. මගේ පපුව හෝස් ගා ගත්තු විය. එය ඉතා මෑතක දී ගන්නා ලද්දකි. මා අන්තිමට නිමල් දුටු දට වඩා එහි මුහුණ පුෂ්ටිමත් ම තිබිණි. නිමල් කොයි තරම් වැඩ ද?

මා ගේ අතු ගෑවේ බිම ඇද වැටෙනු යි සිතෙන් මෙනි. වට පිට බලමින් මම කොස්සෙන් කුණු ටිකක් නැවත ඉස්තෝප්පුවේ කෙළවරට ගෙන ගොස් නැවත වරක් කාමරයට එබී බැලීමි.

"මට අර පිටි ටිකත් වත් කොටන එකකට උදව් වෙන්න තිබුණා. මේ ළමය පස්සෙන්මයි." යම්කිසි බියක් පහ කර ගනු පිණිස මම කමලාවතී වෙත යමින් කීමි.

"පුළුවන් නම් කුසුමෙ ඔය බත් ටික උයන්න උදව් වෙයන්" යි කී කමලාවතී පිටුපස මම කුස්සියට ගියෙමි. මා මේ කුස්සියේ කී දවසක් උයා ඇද්ද? එදා හාල් මල්ල, ලුණු, මිරිස්, [illegible]ලකඩ, අඹ බෝතලය ආදී සියල්ල වෙත ඇස් පියාගෙන [illegible] අත තැබීමේ පුරුද්දක් මට තිබිණි. කුස්සියේ වැඩට ගැහැණියක් සිටියා ය. මට තිබුණේ ඇයට උදව් කිරීම ය.

"මොනවද නැන්දෙ උයන්නෙ?" යි මා නො ඇසූ අතර,

"මොනවද කුසුමෙ උයන්නෙ....?" යි කමලාවතී ඇසුවා ය.

"............ කොස් තියෙනව. වට්ටක්ක ගෙඩියක් ඇති. කරවලයි.............."

"කිරි හොද්දකුත් උයන්නද නැන්දෙ"

"කිරි හොද්දක්.............. ඕනෑ ද?"

මම හිනාවුණෙමි.

"මා හා උඹට ඕනෑ එකක්.............." මා අදහස් කළ දෙය තේරුම් ගත් ලෙසින් ඈ කීවා ය.

www.sinhalaelibrary.com

"අද ඔත්ත දෙළ දුක ඇරෙයි." මම පසුව තිස්සට කීවෙමි.

දැඩි ආත්ම ශක්තියක් හා අධිෂ්ඨාන ශක්තියක් ඇතිව හැසිරෙන්නට මම උත්සාහ කළෙමි. මේ උත්සාහය සාර්ථක වීම නිසා අධ්‍යාත්මික ශක්තියකට සමාන හැඟීමක් මට ඇති විය. අනුලා මා කෙරෙහි තැබූ විශ්වාසය පළුදු නොකළ යුතු ය යි මම සිතා ගතිමි. ජය ගතිමි යි මම පිනා ගියෙමි. මා නොඉවසිලිමත් වූයේ මගේ චිත්ත ධෛර්යය තව දුරටත් උරගා බලන්නට නිමල් එන තුරු ය. ජීවිතයේ යම් තීරණයකට මම එළැඹියෙම් නම් මගේ ම කැමැත්තෙනි. කිසිවකුගේ බලපෑමකින් නොවේ. ඒ තීරණය වැරදි තිබෙන බවක් හෝ මා ඒ ගැන දුන් පසුතැවිලි වන බවක් හෝ සිතා ගැනීමට ඔහුට ඉඩ නොදිය යුතු ය.

ඔවුන් ආවේ හවස තුනට පමණ ය. මම එක වර ම ඔහුට මුහුණ දෙන්නට නොගියෙමි. මා මුලින් දුටුවේ ඇල්බට් ඩැඩියර් උන්නැහේ ය. මඟුල් මඩුවේ අප වැඩ කරමින් සිටි තැනට පැමිණි ඔහු මා දුක පිනා ගිය මුහුණින්,

"දුවේ කොයි වෙලාවෙද ආවෙ?" යි ඇසී ය.

"උදේ මාමෙ ආවෙ"

"හා හා හොඳා හොඳා" යි මගේ පිට අත ගා ඔහු ගෙට ගියේ ය.

නිමල් සිටින බව දුන දුනත් ඔහු නොදක ගත වන හැම විනාඩියක් ම මගේ සිත කලබල කරවයි. අනෙක් අතට ඔහු සිටින බව සහතික නිසා හැකි තරම් පමා වී මුහුණ දීමේ දී සතුට තව තවත් විශාල වනු ඇතැයි මට සිතෙයි. ඒ මොහොතේ මා වෙත බල පෑවේ ඔහු දකින ආශාව හා ආශාව මුදුන් පත් කර ගන්නා සතුටයි.

කැවුම් උයන ගැහැනියක කවටකමක් කරන කල මා බලා සිටියේ හඬ නගා සිනාසෙන්නට ය. පසුව එසේ සිනාසී අවිනීතකමක් කළායි මෝඩ වීමි.

රෝහණගේ කටහඬ මට ගේ දෙසින් ඇසිණි. ඔහු හා කතා කරන්නට මට සිත් විය. රෝහණ මා පැමිණි බව දුනගෙන



ඇත්තේ නිල්මිණි දකීමෙන් පසුව ය. මිදුලට දුවගෙන යන නිල්මිණි අතින් අල්ලා ගත් ඔහු,

"ඔබා කා එක්ක ද ආවෙ?" යි අසා තැත.

"කුසුමක්ක ආවා" යි කියා ඇත්තේ සෙනරත් ය.

රෝහණ නිල්මිණිගේ අතින් අල්ලාගෙන පිටුපස පැත්තට එන විට මම ගේ පිළියෙළ කිරීමට වතුර ළිප තබා කුස්සියේ සිට එළියට එමින් සිටියෙමි.

"කව්ද පාර කිව්වෙ?"

"එන්න එපා බොරුවට! අපි එනකොට මේ රටෙත් නෑ"

මම රෝහණට වෙනදටත් වඩා කුළුපග වීමි. ඔහු සමග වෙනදටත් වඩා කතා කරන්නට පෙළැඹුණෙමි. මම පිටු පස බරාඳයේ කුළුණකට හේත්තු වී සිටියෙමි. රෝහණ අසල පුටුවේ වාඩිවුණේ ය.

අන්තිමට මම ඔහු දුටුවෙමි.

රෝහණ හා මා එසේ කතා කරමින් සිටිය දී තනි සුදු සරමක් වලාපට ගසාගෙන නිමල් හතුරුසිංහ ළිඳ ළඟ සිට මුහුණ සෝදගෙන ලොකු තුවායකින් උර හිස් පිස දමමින් ගෙට යන්නට ආවේ ය. මා දුටු නිමල් තිගැස්සී ගිය හැටි බලා මම මොහොතකට හිත යටින් සිනාසුණෙමි. මා වෙත ද්වේෂයක් උපන්නේ නැත. සිත පුරා පැතිර ගියේ ජීවිත කාලයක් මුළුල්ලේ වවා වඩා ගත් රැක ගත් අසීමිත සෙනෙහසකි. මගේ දෙ නෙත් තෙත් වූයේ ශෝකයෙන් නොව දයාවෙනි. කරුණාවෙනි.

ඔහුගේ මුහුණ කළු විය. ඒ ඇස්වල වූයේ කුමක් ද යි තේරුම් ගැනීමට උත්සාහ කරනු වෙනුවට මම අන් කිසි ම පිරිමියකු වෙතින් ලබා නැති ඒ සුන්දරත්වයේ රස විඳින්නට වීමි. මට තවත් මොහොතකින් ඔහු දකින්නට නොලැබෙනු ඇත. මේ දකින්නට ලැබුණු දුර්ලභ අවස්ථාවෙන් පූර්ණ ඵලය ලද යුතු ය යි සිතාගෙන මෙන් මම නිමල් දෙස බලා සිටියෙමි. යමක් කියන්නට මෙන් මට හැඟ වූ ඔහු මගේ බැල්ම දරා ගත නොහැකි වූ ලෙසින් බිම බලාගෙන ගෙට ගොඩ විය. මම

ඇසිපිය හෙළන මොහොතකට ඔහුගෙන් ඇස් ඉවතට නොගතිමි. සාලයට ඇතුළු වූ ඔහු ආපසු හැරී බැලුවේ ය. අපි සිනාසෙන්නට උත්සාහ ගතිමු. ඒ උත්සාහය සාර්ථක වූයේ ද? මම නොදනිමි. මම වැටෙන්නට යතැයි බියෙන් මෙන් තුළුන තරයේ අල්ලා ගතිමි. මගේ දෙපා පණ නැති විය. මුළු ගත සීතල විය.

ගිඩි ගිඩි ගා ගැහැනුන් පිටි කොටන ශබ්දය මට ඇසුණේ නැත.

රෝහණි හා මා අතර පැවැති කතාව තවදුරටත් ගෙන යෑමට අපි අපොහොසත් වෙමු.

කාමරයට ගිය නිමල් ඇඳේ වැතිරෙන්නට ඇද්ද යි මට සිතිණි.

මා කුස්සියට යන විට වතුර හැලිය උතුරමින් තිබිණ. තේ වතුර වත්කර වැඩ කරන තැන්වලට ම ගොස් පිළිගැන්වීමට තිබිණි. අනුලාත් මට උදව් කළා ය. ඈ පාසල ඇරී කෙළින් ම 'සිසිලට' පැමිණ සිටියා ය.

ඒ අතර කීප වරක් මම ඔහු දුටුවෙමි. එහෙත් මා ඔහුගේ මුහුණ බැලුවේ නැත. මා සිටින බව ඔහු දනී. මට ඒ ඇත. දූත් මට වුවමනා කරන්නේ මගේ ආත්ම ශක්තිය ඔහුට අවබෝධ කර දීමට ය. මම ජය ගතිමියි ආඩම්බරයකින් හා සන්තෝෂයකින් මම ධෛර්යයවත් වීමි. මා ඔහුට මුහුණ දෙන අන්දම කමලාවතීට පෙන්වීමේ වුවමනාවක් මට ඇති විය. මම ඊට අවස්ථාවක් සොයමින් එහා මෙහා ගියෙමි.

මා ගෙදර අයට තේ දීම වුවමනාවෙන් ම ප්‍රමාද කළේ වැඩි පුර පිටුපස ම හැසුරුණු කමලාවතී ගෙට පැමිණෙන අවස්ථාව එන තුරු ය. වරක් ඈ ඇතුළට ගියා ය. මම තේ කෝප්පයක් රැගෙන ඉස්තෝප්පුවේ සිටි ඇල්බට් ඩැයිවර උන්නැහේ වෙත ගෙන ගියෙමි. සාලයේ මව සහ ලොකු පුතා යමක් කතා කරමින් වූන්හ.

"වැඩ කරන අයට තේ දීල ඉවරද කුසුමෙ?"

"ඔව් මේ මාමට..............." යන වචනත් සමග මගේ සිත සැහැසි විය. ඊළඟට කී වචනවලින් මම ජීවිතයේ ප්‍රථම වරට



නිමල් හතුරුසිංහගෙන හා ඔහුගේ මව වන කමලාවතීගෙන් පළි ගතිමි.

"............... තව ඉන්නෙ ඩියාරෝ මහත්තයයි දෙවෙනියියයි විතරයි."

බලාපොරොත්තු නොවූ කෙනකුගේ අපහාසාත්මක වචන ඇසුණු කලෙක මෙන් නිමල් තිගැස්සී මා දෙස බැලී ය. එහෙත් මම ඒ බවක් නුදුටු අන්දමින් ඉස්තෝප්පුවට ගියෙමි. ආපසු කුස්සිය දෙසට එන අතර ම මම දෙ වන වරටත් නිමල් හතුරුසිංහගෙන් පළිගතිමි. මා සාලය හරහා ගමන් කළේ හොඳින් ඔහුට පෙනෙන පරිදි ම කනප්පුව මත වූ පද්මිනී සේනාරත්නගේ ඡායාරූපය වෙත කෙළින් ම යොමා ගත් බැල්ම ඇතිව ය. මගේ මුවග ද්වේෂ සහගත සිනාවක් තිබිණැ යි මම සිතමි. මම එද තුන් වන වරට - එනම් අවසාන වරට ද - ඔහුගෙන් පළිගතිමි.

"කුසුම් අයියට?" ය යි මා තබා වෙත අතින් ම තේ කෝප්පයක් ගෙනැවිත් පිළිගැන් වූ කල රෝහණී ඇසුවේ ය.

"දෙවෙනියිය බොන්න............... මම ගේන්නම්" ය යි කියාගෙන ගෙට ගිය මම බන්දේසියක තබා තේ කෝප්පයක් රැ ගෙන ආවෙමි.

ඔහු ඉස්තෝප්පුවේ කෙළවර පුටුවේ වාඩිවී සිටියේ ය. මම ඇත දී ම දෙ නෙත් බිමට බර කර ගතිමි. මම ඔහු ළඟට ගොස් නතර වීමි. පාසලෙන් අස් වන අවස්ථාවේ අතින් අල්ලාගෙන අන්තිමට කතා කරමින් සිටීමෙන් පසුව මා නිමල් හතුරුසිංහ වෙත මේ තරම් සමීප වූ අවස්ථාව මෙය යි. මම ඔහුගේ මුහුණ නොබැලුවෙමි. ඔහු තේ කෝප්පය අතට ගනිද්දී ඒ ඇඟිල්ලක පද්මිනී සේනාරත්න විසින් පලඳවන ලද නිල් ගලක් ඇල්ලූ මංගල මුද්ව මගේ ඇස ගැසිණි. මගෙ මුවග දෙ තුන් වරක් මස් නටන්නට විය.

කෝප්ප පීරිසි සෝද වීනාඩි අටකට දහයකට පසුව මා නැවත ඉස්සරහ පැත්තට යන කල කිසිවෙක් නොවූහ. නිමල් බිව පීරිසි කුට්ටම මිටි තාප්පය මත විය. මම එයත් සෝද තබන්නට අදහස් කළෙමි. සාලයට ඇතුළු වෙමින් මම කෝප්පය දෙස

www.sinhalaelibrary.com

බැලීමි. එහි පත්ලේ තේ උගුරක් ඉතිරි වී තිබිණි. මම එහෙම ම නතර වී සොරකමකට මෙන් කිසිවකු ඇද්ද යි වට පිට බැලීමි. පෙනෙන තෙක් මානයේ කිසිවෙක් නොවූහ. මා කරන්නේ - මට කරන්නට වුවමනා වී තිබෙන්නේ - කුමක්ද යි තීරණය කර ගන්නටත් කලින් කෝප්පය මගේ මුවට ළං විය. මම තැති ගතිමි. පද්මිනී සේනාරත්න මා දෙස බලා සිටී. ටීපෝව මත වූ පින්තූරයේ ඇස් කෙළින් ම යොමු වී තිබුණේ මා වෙත ය. කියන් මෙන් ම පාපයකට බැඳෙන්නට යැමේ හැඟීමක් ද නිසා මගේ සියොළඟ සීතල වෙමින ගියේ ය. වහා එතැනින් ඉවත් වූ මම 'චිරිස්' යන හඬක් නැගෙන ලෙස ඉතිරි තේ ටික පිටුපස සිමෙන්ති කාණුවට දමාගැසීමි.

"අම්මෙ අපි යමුද?" යි මම අම්මා වෙත ගොස් යෝජනා කළෙමි.

"මොකද කුසුමෙ උඹට තවත් ළමයි ඉන්නව ද? ඉන්න එකා ඇවිදින් ඉන්නව නෙ" යි කමලාවතී කීවා ය.

"දන් වැඩත් ඉවරනෙ නැන්දෙ" යි මම ද සිනාසීගෙන ම කීමි.

කැවිලිපෙවිලි සෑදීමේ වැඩ අවසන් වෙත් ම උදව්වට පැමිණ ගැහැනු එකා දෙන්නා ගෙවල් කරා යන්නට පටන් ගත්හ. අන්තිමට ඉතිරි වුණේ අපත් මහලු කාන්තාවන් කීප දෙනකු පමණකි. සවස් වන විට නිල්මිණි නොසන්සුන් වන්නට වූවා ය. ඇයට ඕනෑ කළේත් ගෙදර යන්නට ය.

"පිස්සුවෙන්ද ජේන් අක්කෙ? දවස තිස්සෙ තෙල් තාච්චි ළඟ ඉඳල මේ කෙල්ලො දෙන්නෙකුත් එක්කල ගොම්මං වෙලාවෙ පාරෙ බැහැල යන්න ඕනෑ යැ? රෑට බත් ටිකක් කාලා කාල යනව."

"කෑම නම් අපිට ගෙදර ගිහිල්ල බැරියැ."

"දන් එහෙ ගියත් උයන්න එපායැ............. වරෙන් කුසුමේ උඹ මොකුත් උයපන්."

තවත් ටිකක් පෙරැත්ත කිරීමෙන් පසුව අපට රෑටත් නතර වන්නට සිදු විය. පුංචි නංගීත් මමත් කෑම පසින්නට විසු තිබෙන



හා තව පිරිමි ළමයෙක් රේඩියෝවට කන් දෙමින් සාලයේ වූහ. මම ඔවුන් පසු කර ඉස්තෝප්පුවට ගියෙමි. විජය හා රෝහණ එහි කතා කරමින් සිටියහ.

"කුසුම් දකින්නත් ආසයි." විජය එක වර ම කීවේ ය.

"මම නම් දක්ක. පුංචි අයිය බස් එකේ යනව එනව කීප දවසක්ම දක්ක." යයි කියාගෙන මම මිටි තාප්පය උඩින් වාඩි වීමි. "අයිය විබාගෙ ගන්නෙ කවදද?"

"කියන්න බෑ කුසුම්. කොහෙද මේ රස්සාවල් කර කර ඉගෙන ගන්නව කියන එක ලේසි නෑ."

"මේ රස්සාවත් නො කරන එක්කෙනාට තරකයි ආයිත් විභාගෙ ගන්නම" යි රෝහණ කීවේ මා ගැන ය.

"හොඳ වැඩ තව කොයි තරම් තියනවද?" යි නො කියැවුණා නම් හොඳ ය යි මට සිතුණේ ඒ වචන පිටවීමෙන් පසුව අප තිදෙනා අතර ඇති වූ නිශ්ශබ්දතාව මැද ය.

රේඩියෝවේ හඬ මා තුළ නොවිස්සුම් ගතියක් ඇති කළේ ය. එය මැඩගෙන ශබ්ද නගා කතා කරන්නට - කාමරයට ඇසෙන තරම් හඬ නගා කතා කරන්නට - මට පුළුවන් කමක් ද නොවී ය. අනෙක් අතට එය නුසුදුසු ය.

"අයිය නිවාඩු ද දන්?"

"නෑ කුසුම්. මම උදේ යනව. මේ තරම් කලින් නිවාඩු දගෙන නෑ."

විජය හා රෝහණ සමඟ තවත් ටික වේලාවක් කතා කරමින් සිටිය පල බලාපොරොත්තු සුන් වීමේ ගතියක් සිතට දැනෙන්නට විය.

මම සාලයට ඇතුළු වුණෙමි.

"දෙවෙනි මහමාලය, කොහොමද?" ම පුටුව පිටු පස සිටගෙන තිස්සගේ ඔළුවට අත තබා කීමි. "........... ආච්! ආච්! මේ දිග කලිසම් ඇඳලා මොන එකක් ද? මරු පහට හිටියි"

www.sinhalaelibrary.com

තිස්ස ලජ්ජාවෙන් සිනාසුණා මිස කතා කළේ නැත. ඔහු අත අඹරමින් මා දෙස බැලී ය.

"ආඩම්බර වෙන්න එපා අයියෝ! අපිටත් බලන්න ආසයි. එන්න" මම තිස්සගේ කිහිලි දෙකට යටින් අත දමා ඔහු ඔසවන්නට තැත් කරමින් කීමි. කිති කැවුණු තිස්ස හඬ නගා සිනාසෙමින් උඩ පැන සිට ගත්තේ ය. මම ඔහුත් සමග කාමරයට ගියෙමි. තිස්ස අල්මාරිය උඩ වූ කාඩ්බෝඩ් පෙට්ටිය ගෙන ඇඳ මත තබා විවෘත කළේ ය. ටෙරලින් කලිසමක් නයිලෝන් කමිසයක් හා ටයිපටියක් එහි විය.

"දිගාරින්න එපා පොඩ්ඩෙයි" යනුවෙන් මුලින් කීවත් "ඇඳල බලන්න ලස්සණද කියල" යි යළි කීවේ තිස්ස අලුත් ඇඳුමින් සැරසී සිටිනු දකිමට සෙනෙහසක් ද සහිත ආශාවක් උපන් බැවිනි.

"එදට බලන්න බැරියැ"

"ඉදා! අපි එදට එනවයැ?"

තිස්සගේ මුහුණ වෙනස් විය.

"මම බොරුවට මල්ලියෙ කිව්වෙ. දැන් අඳින්න ඕනෑ නෑ."

බොරුව කුමක්දැයි සිතා ගත නොහැකි ව ඔහු මා දෙස විමතියෙන් බැලී ය. මම සිනාසුණෙමි. ඔහු ඇඳුම් යළිත් පෙට්ටියේ තැබී ය. මම අඩියක් දෙකක් පස්සට වීමි. මා නතර වූයේ ඊළඟ කාමරයට පිවිසෙන දොර අසල ම ය. ඇඳුම් පෙට්ටිය අල්මාරිය උඩින් තැබූ තිස්ස කල්තියා දැනගෙන, සිදු වන්නට යන දෙයකට ඉඩ දෙන්නට මෙන්, මට කලින් කාමරයෙන් පිට විය. තිස්ස පමණක් නොව මම ද ඒ දෙය ගැන ඉවකින් මෙන් කල් තියා දැන සිටියෙම් ද?

තිස්ස අනුව සාලයට යා යුතු ද නැද්ද යි තීරණය කර ගන්නට බැරි ව මෙන් මම එහි තත්පර කීපයක් ගත කළෙමි. පිටු පසින් පැමිණි අතක් මගේ උර හිස මත නතර වනු මට දැනිණ. ස්පර්ශයෙන් ම ඒ අත මම හැඳින ගතිමි. විදුලි සැරයක් වැදුණු ලෙසින් මම වහා හැරී බැලීමි. දොර රෙද්ද මෑත් කරගෙන ඔහු සිටි නිමල් හතුරුසිංහ උර හිසින් ඉවත්කර ගත් අතින් මගේ



දකුණත මැණික් කටුවෙන් අල්ලා ගත්තේ ය. ඒ ඇස්වල ආරාධනයක් විය. මම කීකරු ප්‍රසියක මෙන් ඔහුගේ කාමරයට ඇතුළු වීමි. මැදත් හරියේ දී මා අත්හළ නිමල් ඇඳේ වාඩි විය. මම ජනේලය වෙත ගොස් සිට ගතිමි.

"කුසුම් කොයි වෙලාවෙද ආවෙ?"

මා දක පැය ගණනකට පසුව ඇසිය යුතු ප්‍රශ්නයක් ද? හිත යටින් සිනාසුණු මම,

"උදේ" යි දුබල හඬින් කියා ගතිමි.

ඔහු වේදනාවක් හෝ හිරි වැටීමක් හෝ පහ කර ගන්නට මෙන් එක අතක ඇඟිලි අනෙක් අතින් මිරිකමින් බිම බලාගෙන සිටියේ ය. නිමල් හතුරුසිංහ අනාථ ය. අසරණ ය. පරාද වී සිටින්නේ මා නොව ඔහු ය යන හැඟීම මගේ සිත්හි අනුකම්පාවක් ද දයාවක් ද ඇති කළේ ය. ඒ පියකරු මුහුණ මැලැවී අඳුරු වී ගොස් තිබිණි. දුක් බර හැඟීම කඳුළු බවට පත් වී දෙනෙතින් පිට වන්නට ගිය ගමන මම උත්සාහයෙන් හෙර වළක්වා ලීමි.

කියන්නට තිබෙන යමක් කියා ගත නො හැකි ව ඔහු අමාරු තත්වයක සිටී. සැනසිලිදායක වචනයකින් ඔහු මේ අමාරුවෙන් ගොඩ ගැනීමේ පුළුවන්කම හා යුතුකම මා වෙත තිබේ. ඔහු වෙනුවෙන් දනට මට කරන්නට ඇති ලොකු ම උපකාරයත් එය ම වන්නේ ය. ඔහු ජීවිතයේ ලොකු ම උදව්ව මගෙන් අපේක්ෂා කරන තැන මෙතැන යි. සමහර විට අපට කතා කරන්නට ලැබෙන අවසාන අවස්ථාව ද මෙය ම විය හැකිය. මම මේ [illegible] සහගත වචනය කුමක් විය යුතු දැයි කල්පනා කරන්නට වීමි.

"කුසුම් මට වෛර කරන්න එපා!"

"ජාති ජාතිවත් මගේ එහෙම එකක් නෑ. ඇරත් වරදක් [illegible] වුණේ............"

"කුසුමට කියන්න දේවල්............. කියල දැන් වැඩක් නෑ - [illegible] කියන්න දේවල් බොහොම තියනව."

www.sinhalaelibrary.com

"මම ආවෙ එව අහන්න නෙවි." කෝපයෙන් කොර හඬින් මම කොඳුලෙමි.

ඒ සියල්ල රස බර කතාවක් මෙන් අසා දැන ගැනීමට මමත් ආශා නො කෙළෙම් ද? වසර ගණනක් ඔහු වෙනුවෙන් හඬා වැලපුණු හදවතකට සැනසීමකැයි තවත් යමක් ඉතිරි වී ඇත්නම් ඒ ඔහුට කියන්නට තිබෙන මේ කතා පුවත පමණක් ම නො වන්නේ ද? එහෙත් බොහෝ දේවල් අහිමි කර ගත් මට මේ ආශාව පිටුදැකීම දුෂ්කර නො විය.

මා කවදත් කළේ ඔහුගෙන් වේදනා වසං කර ගැනීමයි. මේ අන්තිම මොහොතේ ද මම කඳුළු මැඩ ගැනීමට තව තවත් සිතා ගතිමි.

"මොට ද එහෙනම් ඔයා ආවෙ?" යි ඔහු ඇසුවේ අමනාපයකින් නො වේ. සිනාසෙන්නට උත්සාහ කරමිනි.

මේ සිනාව මීට පළමු දැක ඇත්තේ කොයි තරම් කලකට උඩදී ද? ඔහුගේ මෝරා ගිය මුහුණට සිනාව විසින් ලබා දෙන ලද්දේ අප පෙමින් බැඳී සිටි අවදියේ මා බෙහෙවින් ප්‍රිය කළ ගැටවර පෙනීමයි. නිමල්ගේ සිනාව හුරතලයකි. ආලය කරන ඕනෑම යුවතියකට තමාගේ පෙම්වතාගේ සිනාව තරම් සුන්දර දසුම්කලු තවත් දර්ශනයක් නො තිබෙන්නට පුළුවන. වරක් මම ද ආලයෙන් බැඳී නො සිටියෙම් ද? මටත් පෙම්වතෙක් නො සිටියේ ද? ඔහුගේ සිනාවෙන් මමත් චමත්කාරයට පත් නො වුණෙම් ද? මේ මොහොතේ ඔහුගේ සිනාවෙන් මම නොතාම් මෝහනයට පත් වුණෙම් ද යන්.

"තව එක සැරයක් හිනා වෙන්නැ" යි රහසෙන් කීමි.

දෙවියනි, මා එසේ කිවා ම නොව මට සියැවිණි. මම ඇතුළතින් හඬා වැලැපුණෙමි. ඔහුගේ මුව අග සිප සැරයක් නටනු මම දුටුවෙමි. සිනාවක් වශයෙන් මුහුණට නැඟුණේ එපමණකි. අපරාධයක් කළෙමැයි මම ශෝකයට පත් වීමි. ඒ ඒ වචනවල සැර අඩු කළ යුතු යි මට කල්පනා විය.

"මේ දවස් වල හිනාවුණු ගමන් ම ඉන්න ඕනෑ.............. මටමයි දවසක් කිව්වෙ මිනිහෙකුට ජීවිතේ වැදගත් අවස්ථා



ඇතයි තියෙන්නෙ කියල. මේ එයින් එකක්. තේරුමක් නැති දේවල් මතක් කරල මේ හොඳ අවස්ථාව මූසල කර ගන්න එපා!"

"කව්ද එහෙම කිව්වෙ?"

මම ඔහු දෙස බැලීමි. ඔහු ප්‍රශ්නය නැඟුවේ ඇයි ද යි මම එහා තේරුම් ගතිමි. පිළිතුරු හතරක් එකින් එක වශයෙන් මගේ දිවගට නැගිණි. 'මහත්තයානෙ කිව්වෙ?' 'ලොකයියා නෙ කිව්වෙ?' 'නිමල් නෙ කිව්වෙ?' 'ඔයානෙ කිව්වෙ?' යන ඒ පිළිතුරු හතරින් එකක් තෝරා ගැනීමට උත්සාහ කරන මුළු කාලය තුළ මම ඔහුගේ ඇස් දෙස බලා සිටියෙමි. මෝරන සෙනෙහසට යට වූ මම,

"ඇයි ඔයා ම නෙ කිව්වෙ දවසක්" ය යි කියා බිම බලා ගතිමි.

නිමල් කතා කළේ නැත. නිහඬතාව මැද මා මෙන් ම ඔහුත් කල්පනා කරන්නේ අතීතය ගැන ය යි මම තැති ගතිමි.

"මම අද ආවෙ ඒකටයි"

"මොකට ද?"

"ඔයාට සුභ පතල යන්න"

මගේ සුභ පැතුම් බාර ගන්නට නො කැමැත්තෙන් මෙන් ඔහු නැවත වරක් නිහඬ විය.

"මගෙ ගමන නිරපරාදෙ වුණා ය කියල හැඟීමකින් මට ආපහු යන්න ඉඩ තියන්න එපා. විශ්වාස කරන්න! මම ඔයාට සුබ පතන්නෙ බොහොම පිරිසිදු හිතින්. අවංකවම"

"ඇයි.............. කුසුම් ඇයි - එදට එන්න.............. නො එන්න ද අදහස?"

"මම දන්නෙ නෑ. මම තවම ඒ ගැන කල්පනා කළේ නෑ."

නිමල්ගේ ඇස් නැවත බිමට බර විය.

"මම එන්න ඕනෑ ද?"

"කොහොමද මම ඒක කුසුම්ට කියන්නෙ" යි ඔහු කීවේ ද කොඳුලාවට ය.

www.sinhalaelibrary.com

"මම දන්නෙ නෑ. ඔයා කියනව නම් මම එන්නම්."

"කුසුමට එන්න පුළුවන් ද?"

"ඇයි බැරි? මට පුළුවනි."

"එහෙනම් ඒක මට ලොකු සතුටක් කුසුම්"

"මට ලොකුත් ඒකයි. ඔයාගෙ සතුට, ඔයාගෙ යහපත............ මම ගෙට යන්නම්. නැන්දල දක්කොත් මොනව හරි හිතන්නත් පුළුවන්."

මා අන්තිම වචන කීවේ බියකින් නො වේ. තව දුරටත් කතා කළ නො හැකි ලෙස මගේ උගුර හිරවුණු බැවිනි. කඳුළු පටලයකින් මගේ ඇස් අන්ධකාර වෙමින් ගියේ ය.

"මොනව හිතන්න ද? ඒ ගොල්ලන්ට හිතන්න පුළුවන් නෑ කුසුම්............" ය යි නිමල් වහා කීවේ උස් වූ හඬකිනි.

මුළු ගෙදරට ම ඒ හඬ ඇසුණා ද යි මම බිය වීමි. මේ වචන මා මවිතයට පත් කළේ ය. නිමල්ට මා අහිමි වුණේ කමලාවතීගේ වරදින් විය හැකි ය. නිමල්ට පද්මිනී සොයා දුන්නේත් කමලාවතී ම ද?

මටත් ඇත්තේ යකඩ සිතක් විය යුතු ය. මම මඳ වේලාවක් බිත්තියේ වූ නිමල්ගේ ලොකු පින්තූරය දෙස බලා සිටියෙමි. අනතුරුව මා කතා කළේ සිනාවක් ඇති ව ය.

"ලස්සන පින්තූරෙ!"

ඔහු මගේ බැල්ම අනුව හැරී බිත්තිය දෙස නෙත් යොමු කළේ ය. විකට ඇඳුමකින් ලස්සණකම ආරූඪ කර ගත් ලෙසින් ඔහු ලජ්ජාවෙන් සිනාසෙන්නට උත්සාහ කළේ ය. කතාව අන් අතකට යොමු කිරීම ගැන ඔහු තුළ නොමනාපයක් හට ගත් බව මට රහසක් නොවී ය. පාපෝච්චාරණයක් කර හිත සැහැල්ලු කර ගැනීමේ ආත්මාර්ථකාමී හැඟීමකින් ඔහු පසුවන බව පෙනී ගියෙන් යළි මා තුළ කහටක් ඇති විය. එහෙත් මම ඒ කහටට ද මතු වන්නට ඉඩ නුදුන්නෙමි.

"මම හිඟිල්ල කෑම අරින්නම්. ඔය ගොල්ලට බඩගිනිත් ඇති නෙ"



"මට ඕනෑ ඇති කෑමක් නෑ"

"ඔන්න අද නොකා ඉන්නෙ හෙම නෑ" යි මා කීවේ තරවටුවක හඬිනි. අනතුරුව ඒ වචනත් සමග ගලා ආ දැඩි සෙනෙහසකින් මගේ ළය මඬල පිරී ගියේ ය. ඔහුගේ ඇගේ ගෑවෙන තරමට ගවුම් සාය පිම්බෙන පරිදි වහා හැරුණු මා කාමරයෙන් පිට වූයේ සෙනෙහසින් පිරුණු ඒ හදවත ම ඇති ව ය. ලෝකයේ සිතූ පැතූ සියල්ල හරි ගිය බවට අසීමිත තෘප්තියක් මට ඇති විය. මට ඔහු අහිමි වූ බවට තිබුණු සියලු හැඟීම් හා වේදනා පහ ව ගියේ ය.

අනුලා හා තිස්ස බරාඳයේ කතා කරමින් වුන්හ.

"නංගි දක්කෙ නැතෙ දෙවෙනි මනමාලයගෙ ඇඳුම." මම කීමි.

"ඉඳා! මම යැ දෙවෙනි මනමාලය පුංචි අයිය නෙ?"

"මහතුන් අයියෙ අපිටත් පෙන්නන්නකො සූට් එක"

"සූට් එකක් නෙවි. කලිසමයි කමිසයයි විතරයි."

"ඉතින් ඒ මදැයි"

මම තිස්සගේ උර හිසින් අල්ලා හඬ නගා සිනා සී අනතුරුව කමලාවතී සහ අම්මා ලොකු හැලිවල කෑවුම් අසුරන තැනට ගියෙමි.

"නැන්දෙ කෑම නම් හරි"

"ඔය ගෙදර කාංචෙට කන්න දීපන් කුසුමෙ"

කාන්තාවන් කීප දෙනකු හැරුණු විට කෑමට පිටින් සිටියේ තිස්සගේ යාළු අසල්වාසී පිරිමි ළමයෙක් පමණි. ඔහුත් සමග ඇල්බට් ඩ්‍රයිවර උන්නැහේත් පුත්තුත් මේසයට වාඩි වූහ. බත් එක ව්‍යංජන දීසි ආපසු ගෙන ඒමට සූදානමින් අනුලාත් මමත් බරාඳයේ සිටගෙන මීපදූප කතාවේ යෙදුණෙමු. කුළුණට හේත්තු වී මා සිටි තැනට නෙත් කොනින් බලන කල නිමල් පෙනෙයි. අඳුර නිසා ඔහුට මගේ මුහුණ පැහැදිලි ව නො පෙනෙන්නට ඇත. තවමත් මට මේ මුහුණ දෙස දිගට ම බලාගෙන සිටිය හැකි ය.

www.sinhalaelibrary.com

හිස් වන දිසි කස්සියට ගෙන ගොස් නැවත ගෙන එන්නට මට කීප වරක් ම මේසය වෙත යන්නට සිදු විය. මා අවස්ථා දෙක තුනකදී ම මේසයට අත දිගු කළේ ඔහු පිටුපස සිටගෙන ය. නිමල් ගෙල පැත්තකට හරවා ඔහුගේ උර හිසට උඩින් විහිදුණු මගේ අත් දණ්ඩ උරහිසටත් ගෙලටත් හිර කර ගනිතැයි සිතී මට සිනා ගියේ ය.

"ලොකයියෙ මේ පරිප්පු ටික බෙද ගන්න. මම තව ගේන්නම්" මම වරක් කීමි.

ලක්ෂ වාරයක් මගේ මුවින් පිට වී ඇති මේ ආමන්ත්‍රණය අවුරුදු දෙකකට වැඩි කාලයක් තිස්සේ උගුරේ යම් තැනක - නැතහොත් හදවත් පතුලේ - හිර වී තිබිණි.

'ලොකයියෙ' යි ඔහු ඉදිරියේ කතාකරන ආශාවකින් හා පිපාසයකින් ඒ අකුරු කීපය ගත වූ ඒ මුළු කාලය තිස්සේ මගේ දිවග සුදනමින් සිටින්නට ඇත.

"ඇති කුසුම් මේ තියනව."

දිසියේ ඉතිරි වී තිබුණු පරිප්පු ටික ඔහුගේ පිඟානට බෙදූ මම කුස්සියට යන්නට ගොස් දොර ළඟ දී තේරුමක් නැති ව ආපසු හැරී මේසය වෙත බැලීමි. රෝහණගේ ඇස් මා පසු පස ගමන් කරමින් තිබුණු බව මා දුටුවේ එවිට ය. අපේ ඇස් ගැටෙන ම රෝහණ ඉවත බලා ගත්තේ ය.

නිමල් හා කතා කරන්නට තවත් අවසරයක් නො ලැබ ම අපි ආහාරයෙන් පසු ව ගෙදර පැමිණියෙමු. එහෙත් මගේ සිතට කිසි ම වේදනාවක් නොවී ය. මා ඔහු සමග කතා කළ බව අනුලාට කීවේ නැත. මෙය රහසක් කර ගැනීම නිසා ඔහු හා ගත කළ විනාඩි කීපයක දී මා ලද ආස්වාදය හා සතුට නීති විරෝධී මුහුණුවරක් ගනිමින් වුව ද තව තවත් වැඩෙන්නට විය. අතරමග දී මම කැවුම් පිසින්නට පැමිණි ගැහැනුන් පිරිසක් කළ කවටකම් වගයක් මතක් කරමින් පුංචි නංගී සමග සිනාසුණෙමි. අනුලා මා තරම් සිනාසුණේ නැත්තේ ඇය නිල්මිණි කරපින්නාගෙන පැමිණි නිසා විය යුතු ය යි මම සිතට කියා ගතිමි.

ඇඳට වැටුණු මම දෙ තොල තුනී සිනාවක් ඇති ව අප අතර හුවමාරු වූ වචන ගණන් කරන්නට වීමි.



"ඔයාම නෙ එක දවසක් එහෙම කිව්වෙ."

අද මා 'ඔයා' යි ඔහුට කතා කළ ප්‍රථම අවස්ථාව එය යි. 'මම අද ආතව ඔයාට සුබ පතල යන්න' 'ඔයා කියනව නම් මම එන්නම්...........' 'ඔයාගෙ සතුට' 'ඔයා ඔයා ඔයා ඔයා ඔ......... යා ඔ......... යා ඔයා ඔ......... යා ඔ......... යා' එළිවෙන තුරු ඔහුගේ මුහුණ බලාගෙන - කට නැවෙන තුරු හෝ - උගුර වේළෙන තුරු හෝ - වෙන කිසිවක් නැති ව - 'ඔයා - ඔයා' යි ඔහු අමතමින් සිටින්නට ලැබුණා නම්.

"ලොකයියෙ මේ පරිප්පු ටික.............."

අප අතර පද්මිනීගේ නම සඳහන් වුණේවත් නැත. මා හා නිමල් ගැන සියල්ල පද්මිනී දනී. එහෙත් මේ අන්තිම කතාව ඇයට රහසක් වනු ඇත. කිසි දවසෙක නිමල් මේ කතාව සිය බිරිඳට නොකියනු ඇත. ද්වේෂ සහගත සන්තෝෂයක් මගේ සිතට ගලා එයි.

නැවිලි පෙවිලි පිළියෙළ කිරීමත් මඟුලත් අතර ගත වූ දින කීපය ඇතුළත මම කරුණු දෙකක් නිසා නැවත නො සන්සුන් වන්නට වීමි. වැඩකට පළකට උදව්වට එන්නැයි කමලාවතීගෙන් පණිවිඩයක් එන තුරු මම නො ඉවසිල්ලෙන් බලා සිටියෙමි. අනෙක් අතට මඟුල් දවස එන තුරු මම නොසන්සුන්කමින් බලා සිටියෙමි. සිතට දැඩි වේදනාවක් හා කලකිරීමක් ගෙන දෙමින් මුල් බලාපොරොත්තුව සුන් විය.

"මට නම් ඕකට නොගියත් කමක් නෑ." යි පුංචි නංගී කීවත් ඇය පාසල් ගොස් එන තුරු සිටිය යුතු නිසා මඟුල් ගෙදර යන්නට අප කතා කර ගත්තේ ඒට ය.

එදත් අම්මා සිරිත් පරිදි වෙළෙඳාමේ ගියා ය. උදේ සිට 'තිබිල' දෙසින් ඇසෙන්නට වූ වෙඩි හඬ හා සංගීත හඬ ද මඟුල් ගෙදර එන යන ගම්වාසීනු හා නෑයෝ ද මගේ සිත තවත් නො සන්සුන් කරන්නටත් නො ඉවසිලිමත් කරන්නටත් වූහ. වෙනදාට වඩා කලින් එන බව කියා ගියත් අම්මා ගෙදර ආවේ පුරුදු පරිදි හත හමාර බස් රියෙන් ම ය. මා නිල්මිණි අවදියෙන් බලා ගත්තේ වැයමිනි.

www.sinhalaelibrary.com

අප මඟුල් ගෙදර යන කල ආවතේවකාරයින් ද ළඟ ම නෑදෑ හිතවතුන් ද හැරුණු විට අමුත්තන් සිටියේ ම නැති තරම්. ඇල්බට් ඩැයිවර උන්නැහේ හා නිමල් දොරකඩ දී අප පිළිගත්හ. ආචාර කරද්දී මා බැලුවේ ඔහුගේ මුහුණ දෙස නොව මා පිළිගනු පිණිස එකට එකතු වුණු අත් දෙස ය. අර මුදුව මම නැවත ද දිටිමි. කමලාවතී අප පිළිගැනීමට ආවේ අප සාලයේ වාඩි වුණාටත් පසුව ය.

"දහක් ආවත් ජේන් අක්ක නැත්තේ මොක ද කිය කියා මම හිතුවා"

"වේලාසනින් එන්න කියලමයි ගියේ. කොහෙද බස්වල එන එක.............."

අම්මාගේ පිළිතුර අවසන් කරන තුරු බලා නොසිටි ඈ යම්කිසි වැඩකට කඩිනමින් ගෙට ගියා ය.

මඟුල් ගෙදර කලබල ස්වභාවය පහ ව තිබුණෙන් අපට වාඩි වුණු විගස ම වාගේ කෑමට වතුර අල්ලන ලදී.

"ඩැයිවර් උන්නැහෙත් කන්න. ජේන් අක්ක එක්කම" කමලාවතී කීවා ය.

"මම නෙවෙ යි, ඔහේ කන්න. ඔහේගෙ යාළුව" යි කී ඔහු හඬ නගා සිනාසුණේ ය.

"මට තව වැඩ තියෙනව"

"වැඩ ඉවර වෙන්නෙ නෑ ඔහේගෙ එළිවුණත්. දුන් යන එන අය ඉවරයි - කන්න."

"කෝ මේ ළමයි? දෙවෙනිය කෑව ද දන්නෙ නෑ." කියාගෙන කමලාවතී යළි ගේ ඇතුළට අතුරුදහන් වුණා ය.

"දෙවෙනියිය කනව අර මේසෙක"

මඟුල් මඩුවේ මේස කීපයක් හිස් ව තිබිණි. කීප තැනක ම කෑමට වාඩි වී සිටියේ වැඩටපළට උදව්වට පැමිණි අය යි.

අප අසුන් ගනිත් ම කමලාවතී කුස්සිය පැත්තේ දොරටුවකින් ඇතුළු වුණා ය.



"මමත් එහෙනම් වාඩි වෙන්නම්"

"වාඩි වෙන්න වාඩි වෙන්න - දැන් රෑ වෙලා නෙ"

"කීයකට දුවන්න ද ජේන් අක්කෙ? ගෙවෙන එකක් නම් අද මේ ටිකට ගෙයි එහාට මෙහාට ගිය ටිකට කකුල් ගෙවෙනව"

"ඇයි ඉතින් තනි මිනිහ වුණා ම.............."

මා මගේ පිඟානෙත් ම සවන්නට ගියත් නිල්මිණි තමාට වෙනම ම පංගුවක් ඕනෑය යි කියා සිටියා ය.

"බෙදා ගන්නට කන එකක් නෑ. නිදිමතේ"

"අනේ ඇත්තට මේ දරුපැටියෙකුත් එක්ක මහ දුරක වගෙ පාළොස් පැයක් යන කල් හිටියනෙ ජේන් අක්කත්"

අම්මා යළි නිදහසට කරුණු ඉදිරිපත් නො කළා ය.

"කීයක් ගැන බලන්න ද ජේන් අක්කෙ.............. එන අයො පිළිගන්න ඕනෑ, මේසවලට වාඩි වෙන්න ඕනෑ. කෝකියන්ට බඩු මුට්ටු ඕනෑ ඕනෑ දේවල් සැරෙන් සැරේ බලන්න ඕනෑ. කීයක් ද?"

"ඔහොම තමයි කටයුත්තක් වුණා ම - ඒක කරල බලන්න ඕනෑ."

"ඒ ඔක්කොම කළෑකි ජේන් අක්කෙ." යි කී කමලාවතී වට පිට බලා අම්මාගේ පැත්තට බර වී කටහඬ බාල කළා ය. "............. උදව්වක් වුණත් තියෙන්නෙ පිට මිනිස්සුන්ගෙන් - අපරාදෙ කියන්න බෑ. පිට මිනිස්සු නැත්නම් මේ යමර කර ගන්නෑකි ද? තමන්ගෙයි කියන උදවිය ඇවිදින් ඉන්නෙ අපට උදව්වට නොවෙයි. වයිරෙට.............."

"මළ ඉතින් මූණට එකක් - හිතේ එකක්"

"අර එක ගොල්ලක් ඇවිත් ඉන්නව. නැති වැරදි හොය හොයා ආව වෙලාවෙ ඉඳල.............."

"කව්ද ඒ?"

www.sinhalaelibrary.com

"පිට කෙනෙක් නෙවෙයි. මගේ අයියණ්ඩි. එක බඩවැල කඩාගෙන ආව සහෝදරයා. ඒ මිනිහ එක අතකට හොඳයි. ගෑනියි දුවයි අපේ වෛරක්කාරයො වගයක්............"

"මධුරිලත් ආව ද? "නිහඬ ව ම සිටීම වැරදි ය යි සිතා කතාවට හවුල් වීමේ අවස්ථාවක් එන තුරු බලා සිටි මම ඇසීමි.

"ආව නේන්නම්. අර කාමරේට වෙලා අම්මයි දුවයි කුමන්ත්‍රණ කරන්නෙ."

කෑම විකෙන හඬ ඇසෙන තරම් නිහඬතාවක් අප අතර ඇති විය. අනතුරුව කමලාවතී ඒ නිහඬතාව බිඳ දමුවේ වෙනත් කර ගත් කට හඬිනි.

"කීප සැරයක් ම හිතුණ ජේන් අක්කෙ කතා කරන්න. මම ඉවසුව............."

"අපොයි ඔව්. මේ හොඳ කටයුත්තක් කරන වෙලාවෙ."

"ඒක තමයි අර දරුව නිසාවෙන් මම ඉවසනව. තරහ වෙනව නම් තරහ වෙන්න ඕනෑ මොනව වුණත් ජේන් අක්කෙ. ඒ ගොල්ලන්ගෙ හිතේ තියෙන්න පුළුවනි. හිතේ තිබුණයි කියල මම මැරෙන්නද ජේන් අක්කෙ? මමත් අම්ම කෙනෙක් නේ ද? දරුවො ඉන්න අම්ම කෙනෙක් නේ ද?"

කමලාවතී අම්මා දෙස බැලුවා ය. ඇයගේ ඇස් මුල කඳුළු ගුළි දෙකක් විය. ඒ කඳුළු මවකගේ කඳුළු ය. ඊළඟට ඇ මා දෙස නො බැලුවා ය. හැට්ට අතින් ඇස පිසදා ගනිමින් කමලාවතී මගේ මුහුණ මඟ හැර මෙසේ කීවා ය.

"උඹලට කවද හරි තේරෙයි දුවේ අම්ම කෙනෙක් වුණ දව............."

"නැන්ද මොනව කියනවද මම දන්නෙ නෑ. සතුටු වෙන්න ඕනෑ දවසක නිස්කාරණේ හිත නරක් කර ගන්න ඕනෑ යැ? ඕනෑ කෙනෙකුට ඕනෑ එකක් හිතා ගන්න බැරි යැ? ලොකයියට ආදරේ ඇති කාටත් ලොකයියගෙ සතුට එයාගෙ - දියුණුව............"

ඒ වචන මා පිට නොකළා නම් මාතෘ භාවය නැමැති පරිශුද්ධ වූ පදවියට මා තුළ ඇති සුදුසුකම් අවලංගු විය හැකි ව



තිබිණ. තවත් නොයෙක් දේ කිව හැකි ව - කිව යුතු ව - තිබුණත් කමලාවතී හඬා වැලපෙතැයි බියෙන් මම කතා කළා ඇතැයි සිතා ගතිමි. මවකගෙන් තවදුරටත් කඳුළු ගැනීමේ ධූර්තකාවක් මට නොවී ය. මම අම්මාගේ මුහුණ බැලීමි. විපතේ දී මෙන් ම සැපතේ දී ද කිසි ම වෙනසක් සටහන් නොවන ඒ මුහුණ තුළ සොම්නසක සේයාවක් ඇඳී ඇතැයි සිතා ගන්නට මම තීරණය කර ගතිමි. අනුලා දිගට ම හිස් බැල්මෙන් පිගාන දෙස බලාගෙන කතා නැති ව සිටියා ය. ඇය මා සමඟ ඇස් කොනින් සිනාසුණේ අප ආපසු සාලයට ගොස් වාඩිවුණාටත් පසුව ය.

"කුසුමික්කල ආව බව මම දන්නෙත් නෑ." කාන්ති මා වෙත පැමිණ කීවා ය. මා ඇය ප්‍රථම වරට දුටුවේත් එවිට ය.

"කොහෙද හිටියෙ මේ තරම් වෙලා?"

"මම අර මධුරික්කත් එක්ක කතා කර කර හිටිය.............."

"කෝ මධුරි?"

"නිදි"

මම තවත් ටික වේලාවක් කාන්ති සමඟ කතා කරමින් සිටියෙමි. දැන් ඔවුනට මා සමඟ අමනාප වීමට හේතුවක් නැත. ඇය අතීතය මතක් වී පසුතැවිල්ලට පත් වුණා ද යි මම නො දනිමි. ඒ ගැන කල්පනා කිරීමෙන් කාලය කා දමන්නේ කුමට ද?

එක පෙළට තැබුණු පුටුවලත් සැටියේත් ළමයි කීප දෙනෙක් නින්දට වැටී සිටියහ. අම්මා හා කමලාවතී ඇතුළු ව තව කීප දෙනෙකු තැන තැන කතා කරමින් සිටියත් සාලයේ වූයේ පාළු ස්වභාවයකි.

කෑම කා තෑගි බෝග ද දී හමාර ය. දැන් අපට ඇත්තේ ආපසු යෑම පමණකි. එහෙත් යම්කිසි දෙයක් තවත් ඉතිරි ව ඇතැයි මට සිතිණ.

"ලොකු අක්කෙ දුව නිදි. අපිත් යමු ද?" අනුලා කීවා ය.

"අම්ම නැන්දත් එක්ක කතාවට වැටිල.............. ඔහේ තව ටිකක් ඉඳිමු.............." යි සිතාසී කී මම නංගීගේ උකුලේ සිටි නිල්මිණි රැගෙන කාමරයට ගියෙමි. ඇඳේ හරහට ළමයි කීප

www.sinhalaelibrary.com

දෙදෙනෙක් ම නිදා සිටියහ. මම එහි කොනක නිල්මිණි හාන්සි කළෙමි.

"උඹ දක්කෙ නෑ නේ ද කුසුමේ" යනුවෙන් කියාගෙන කමලාවතී බඩතුරේ තිබුණු යතුරු කැරැල්ල ගෙන අල්මාරිය ඇරියා ය.

එය මණිපුරි සාරියකි. එහි වටිනාකම සිතා ගැනීමට පුළුවන්කමක් මට නොවී ය.

"මේ හෙට අඳින්න මට ගෙනා සාරිය"

"ලස්සණ සාරිය......... හරි ගණන් ඇති"

"මේ බලපන් බෝඩරේ හැම" ඇ සාරිය තීප අතකට දිග හැර ඇඟට එළාගෙන කීවා ය.

"මම නම් දැකල නෑ මේ තරම් ලස්සණ සාරියක්. හැන්දෑ මනමාලි වගෙ හිටියි ඕක ඇන්දම!"

ඇයගේ මුවග රැඳුණු සිනාව ආඩම්බරකාරී එකක් ය යි මම නො කියමි.

"මේක රුපියල් එකසිය පණහක්"

"මම නම් හිතුවෙ ඊටත් වැඩියි කියල"

"මනමාලිට ගෙනත් තියෙනව පෝරුවේ දී අන්දන්න සාරියක්. ඒක ඉන්දියාවෙන් ගෙන්නල තියෙන්නෙ ලොකු පුතා, රත්නරත් තුල. උඹට පෙන්නන්න තිබුණා. මගේ හිතේ ලොකු පුතාගෙ අල්මාරියෙ ඒක ඇත්තෙ"

මරණයට කැප වූ තැනැත්තාට අලුගෝසුවා දඬුවම දීමේ දී අඳින ඇඳුම් කල් තියා ම පෙන්විය යුතු ද? සිතට ආ හැඟීම මැඩගත් මම උත්සාහයෙන් සිනාසී.

"දැන් ළඟ දී මනමාලිත් එක්ක ම බලන්න බැරි යැ නැත්දෑ" යි කියා ගතිමි.

"උඹ නම් මනමාලි දැකලත් ඇති නෙ" යි ඇය කියා දෝ යි මම බිය වීමි. වාසනාවකට මෙන් ඇය එවැනි කිසිත් කීවේ නැත.



මෝටර් රථ හඬක් ඇසිණි.

කාන්තාවක් ද පිරිමි තිදෙනෙක් ද පැමිණියහ. මම නිමල්ගේ මිත්‍රයන් වන ජයන්ත හා ප්‍රේමසිරි හැඳින ගතිමි. අනෙක් තැනැත්තා ඔවුන්ගේ තවත් මිත්‍රයකු වන මහින්ද බවත් කාන්තාව ජයන්තගේ බිරිඳ වන යමුනා බවත් මට පසුව දැන ගන්නට ලැබිණි. ඔවුන් ආවේ මඟුල් කන්නට නොවේ. පසුද ගමන් බිමන් ආදී කටයුතු කෙසේ ද යි සොයා බලනු පිණිස හිතවත්කමට ය.

අවදි ව සිටි ළමයි අමුත්තන් බැලීමට වට වූහ.

ජයන්ත හා ප්‍රේමසිරි දකින් ම පරණ මිත්‍රයන් දෙ දෙනකු දැකීමේ සතුටක් මට ඇති විය. මා ඔවුන් හා කතා බස් කර ඇත්තේ 'සිසිල' ට ගෙවදින උත්සවයේ දී මින් පෙර එක ම එක අවස්ථාවක පමණි. එහි දී අපි ඉතා කුළුපග ව හා හිතවත් ව හැසුරු කළෙමු. නිමල් තම කල්‍යාණ මිත්‍රයන් ගැන මට නොයෙක් දේ නොයෙක් විට කියා ඇති අතර ඔවුන් අතර ද නිතැකයෙන් ම මා ගැන නිතර කතා වන්නට ඇත. එසේ ම ඒ අවදියේ නිමල් හා සම්බන්ධ කර අනාගතය ගැන සිතූ ඇතැම් අවස්ථාවල දී ඔහුගේ මිත්‍රයන් අප බැලීමට එන සැටිත් අප ඔවුන් බැලීමට යන සැටිත් මම සිහිනවලින් සිතුවම් කර ගත්තෙමි. මේ කරුණු නිසා ජයන්ත හා ප්‍රේමසිරි මට පෙනුණේ මගේ ජීවිතයේ කොටසක් ව සිටි යහළුවන් මෙනි.

මඟුල් ගෙදර මා සිටිනු දකින්නට බලාපොරොත්තු නො වුණු බව ඔවුන්ගේ මුහුණුවලින් මම තේරුම් ගතිමි. වෙනසක් නොපෙන්වා කතා කරන්නට උත්සාහ ගනිමින්,

"අඳුරන අයත් ඉන්නෙ" යි ජයන්ත මා හා සිනාසී කීවේ ය.

"මහත්සි පාටයි" නිමල් දෙස බලාගෙන යමුනා කීවා ය.

"උදේ ඉඳල දෙරකඩ හිටගෙන හිටිය එන මිනිස්සු පිළිගන්න"

"හොඳ දඬුවමක්" ය යි කීවේත් යමුනා ය.

කමලාවතී පැමිණ සාලයේ වාඩි වී සිටි අමුත්තන්ට ආචාර කළා ය. නිමල් ඇයට යමුනා හඳුන්වා දුන්නේ ය.

www.sinhalaelibrary.com

"කොහොමද කුසුම සැප සනීප?" ප්‍රේමසිරි අසත් ම යමුනා වහා හැරී බැලුවා ය. ඇය මා ගැන කල් කියා අසා තිබුණු බව ඒ බැල්මෙන් මට අවබෝධ විය.

"වරදක් නෑ. ඔහේ ඉන්නව"

"කුසුම් ඉස්සරට වඩා උසයි"

"හැමදම එක වගෙ යැ?" යමුනා කීවේ මට අනුකම්පාව පළ කරනු පිණිස ය යි මම සිතමි.

"කොහොමද............ දැන් හෙට වැඩ කටයුතු ගැන මොනව ද කරන්න තියෙන්නෙ?" යි ජයන්ත ඇසී ය. යාළුවෝ කතාවෙන් ම නිමල්ගේ කාමරයට ඇතුළුණෝ ය. යමුනාගේ පාළුව මැකීමට කිසිවකු නොවූයෙන් මම ඇයට ළං වීමි. එක වර කියන්නට දෙයක් නො වූ බැවින් අපි එකිනෙකා දෙස බලා සිනාසුණෙමු.

"ඔය ගොල්ලන්ට හරි වැඩ තියෙන්න ඇති නේ ද?"

"නෑ අපි මේ ඒ වෙලා ආවෙ."

"ගෙවල් ළඟ ද?"

"ඔව්. ඔය එන පාරෙම............ ජයන්ත දැන් කොහේ ද වැඩ?"

"මහනුවර. මමත් පුෂ්පදාන උගන්වන්නෙ"

"ප්‍රේමසිරි?"

"ප්‍රේමෙ අධ්‍යාපන කාර්යාලයෙ"

ඉන් එහා අසන්නට දෙයක් ගැන මම කල්පනා කළෙමි. ඇයගේ කරාබුවල මැණික දිස්නය දෙන සැටි මගේ නෙතට අසු විය.

"ඔයාට පුළුවනි නෙ දැන් වුණේ ඉගෙන ගන්න."

මගේ සිත අත ගා බැලීමට ඇයට වුවමනා වී ඇතැයි මට ඉවකින් මෙන් තේරුම් ගියේ ය. නිමල් නො ලැබීම නිසා මා කණගාටුවෙන් සිටිනවා ද යි දැන ගැනීමට ඇයට අවශ්‍ය වී ඇත



"මම හිත හදාගෙන සේරම අමතක කළා." යි මා කී නමුත් ඒ වචන උචිත ද යි බියක් වහා පහළ වූයේ ඇයගේ මුහුණේ සිනාව තුරන් වීගෙන යනු දකීමෙනි.

කමලාවතී මට ගෙට කතා කළා ය.

"කෑම කාලපු ඇවිදින් තියෙන්නෙ. තේ වතුර ටිකක් වත් දෙන්න එපා යැ." ඈ මගෙන් ඇසුවා ය.

"ඔව් ඉතින් මොනව හරි දෙන්න එපා යැ"

"ඔය කැවුම් නම් කන එකක් නෑ............ විස්කෝතු පෙට්ටියක් කඩමු නේද?"

"ඔව් කේක් වගෙ ජාතියකුත් තියනව නම් හොඳයි"

"කේක් වගයක් ඇති. මේසෙට අරින්න ඕනෑ නැතෙ කුලුමෙ."

"ගිහිල්ල ඇල්ලුවත් ඇති"

"වරෙන්. වරෙන්. එහෙනම් උඹ ගිහිල්ල අල්ලපන්."

විස්කෝතු, කේක් සහ කෙසෙල් ගෙඩි සහිත බත්දේසිය බුලින් යමුනා වෙත ගෙන ගිය මම අනතුරුව කාමරයට ගියෙමි. ප්‍රේමසිරිගේ අවිනීත - එහෙත් අප්‍රසන්න ජනක නොවූ - උස් සිනා හඬ මා කාමරයට යත් ම නතර විය.

"බඩගිනියි කිය කියා ආවෙ මහින්ද ඔන්න" ප්‍රේමසිරි කීය.

"තවමත් පිස්සු පාට් අත් ඇරල නෑ වගෙ" මම කීමි.

"තව සැරයක් එයි. කෙසෙල් ගෙඩි දෙක දෙක ගන්න ඕනෑ නෑ."

"ඔය වෙන්න එපා තව තියනව."

"අනුන්ගෙ මඟුල් ගෙදරවල්වලදී නම් ඕනෑ තරම් සංග්‍රහ"

කටට ආ පිළිතුර පිට කිරීමට මම අසමත් වීමි. මම කාමරයට ගිය ම නිමල් හා ජයන්ත වෙතින් පලා ගිය සිනාව ආපසු කැඳවීමට ප්‍රේමසිරිගේ විහිළුව අසමත් විය. යාළුවන්ට කෑම ඇල්ලූ අනතුරු ව මම නිමල්ට බත්දේසිය පෑවෙමි. ඔවුන් මගේ

www.sinhalaelibrary.com

මුහුණ දෙස පරීක්ෂාකාරී වූ බව ඉවත බලාගෙන ම මම දුටුවෙමි. වෙනසක් නොපෙන්වීමට මා ගත් තැත සාර්ථක විය. නිමල් කෙසෙල් ගෙඩියක් පමණක් ගත්තේ ය.

"ඇති කුසුම්. බොන්න මොකුත් ගේන්න." දෙවන වර යමුනා කීවා ය.

"කෝපි හොඳ ද?"

"මට නම් මොනව වුණත් කමක් නෑ. ජයන්ත නම් කෝපිවලට කැමතියි."

කෝපි කෝප්ප හතරක් තබාගෙන මා ආපසු එන විට යමුනා කාමරයට ගොස් සිටියා ය. ඔවුන් අතර සිනාවෙන් යුත් කතාබහක් විය. ඔවුන් මනමාලයාට විහිළු කරමින් සිටින්නට ඇත.

"කෝපි ටිකක් ගේන්නද?" යි මා නිමල්ගෙන් ඇසූ කල නැවතත් සිනාව අතුරුදහන් විය.

"ටිකක් ගේන්න"

මා නිමල්ගේ කෝපි කෝප්පය ගෙන යන විටත් පිරිස අතර නැවත කතාව පටන්ගෙන තිබුණේ නැත.

පසුව ද උදේ දහයකුත් ගණනට 'සිසිල' දෙසින් වෙඩි හඬ ඇසෙත් ම මනමාලයාට ගෙදරින් පිට වන සුබ නැකත එළැඹි බව මගේ තැති ගත් හදවත තේරුම් ගත්තේ ය. විශ්වාස කළ මැනවි! ඒ මොහොතේ මගේ හදවතේ පැවතියේ තැති ගැනීමක් - දැඩි තැති ගැනීමක් - පමණකි. රිය පෙළෙහි ශබ්දය ඇසුණු කල නිල්මිණි පාරට යන්නට කෑ ගැසුවා ය. එහෙත් නිමල් හතුරුසිංහ නෑදෑයන් පිරිවරාගෙන කොළඹ මහ හෝටලයක පැවැති නම මංගල උත්සවයට සහභාගී වනු පිණිස අපේ ගේ ඉදිරිපිට පාරෙන් යනු මා බලා සිටියේ ජනේලයේ පොලු අතරිනි.

අම්මාත් නංගීත් මාත් අතර මඟුල් ගෙදර ගැන කිසිදු තොරතුරක් කතා වුණේ නැත. එද මා දවස ගෙවූයේ භූමි කම්පාවක් වැනි මහා පොදු විපතක් අසන්නට දකින්නට ලැබී කිසියම් පුද්ගලයෙකු ගැන විශේෂයක් නොවුණු දැඩි පොදු චිත්ත



වේදනාවකිනි. එය එහෙම පිටින්ම සිහිනයකි. එහෙත් එක හේතුවක් නිසා මේ ගැන කතා කරන්නට අපට සිදු විය.

ඉරිද මනාල ජෝඩුව ගෙදරට සැපත් වන ද අපටත් යන්නට ය යි කමලාවතී කීවා ය.

"කුසුමෙ උඹ ටිකක් උදෙන් වරෙන්. මෙතන පිළිවෙළක් කර ගන්න" යයි ඈ මට කීප වරක් ම කීවා ය.

මා මඟුල් ගෙදරට ඇඳගෙන ගියේ මට තිබුණු හොඳ ම සාරිය යි. මනාලියගේ පාර්ශ්වයේ නෑදෑයන් ද ඇතුළු විශේෂ අමුත්තන් සහභාගී වන උත්සවයකට ඒ සාරිය ප්‍රමාණවත් නොවී ය. මම නම් ඇඳුම් ගැන ඒ තරම් සැලකිලිමත් වුණා ම නොවෙමි. නොදන්නා අය මා නැසෙකැයි සිතනු ඇත. බාල සාරියක් ඇඳගෙන ගොස් මා නිමල්ට මදි පුංචිකමක් කිරීම වැරදි ය යි මට සිතිණි. අනෙක් අතට නිමල් පද්මිනී සමග පැමිණෙනු දකිමේ ආශාවක් හා කුතුහලයක් ද මා තුළ පවතී. ඒ ආශාව කෲර ද්වේෂ සහගත එකකැයි මට සමහර විට සිතෙයි.

"ටවුමට ගිහිල්ල සාරියක් ගෙනෙත්" ය යි අම්මා මට කීවා ය.

"මේ දවස්වල සාරිවලට වියදම් කරන්න බෑ අම්මෙ. ඇරත් යන්නව නම් ගණන් සාරියක් ගන්න ඕනෑ. ඕවට වියදම් කරන්න බෑ." මම සිනාසෙමින් ම කීවෙමි.

"නෑයි කියල මොනව කරන්න ද? මේ කාලෙ නැත්නම් කවද අඳින්න ද? ගිහිල්ල සාරියකුයි නංගිට ගවුමකට රෙද්දයි ගෙනෙන්."

"මට එපා! මම හිතුණොත් යන්නෙත් නෑ. යතත් ඔය තියන එකක් අඳිනව." අනුලා කීවා ය.

"එහෙනම් අම්ම මට දෙන්න රුපියල් විසිපහක් විතර. ඒක මම අම්මට ආපසු දෙන්නම්"

"ඒක කර ගන්න බැරියැ. විසිපහක් ඇති ද?"

නගරයට ගිය මම හැන්ඩ්ලූම් සාරියක් මිල දී ගතිමි.

www.sinhalaelibrary.com

# 6

සෙනසුරාද රෝහණ ආවේ ය. ඔහු අතේ පාර්සලයක් විය. ඔහු වාඩි වුණේ එය උකුලේ තබාගෙන ම ය.

දැන් ඉතින් සියල්ල අවසාන ය. අයියා ගැන මතක් කර මගේ හදවතට ඇඟිලි ගැසීමේ වුවමනාවක් දැන් ඔහුට නැත. ඒ නිසා මට චකිතයක් නැති ව රෝහණ සමඟ කතා කළ හැකි ය. තව ද මා කිසි ම විදියක දොම්නසකින් හෝ වේදනාවකින් හෝ පසු වන බව ද ඔහුට නොපෙන්විය යුතු ය.

"මඟුල් කාල කාලා මහත් වෙලා - තවත්" මම කීවෙමි.

රෝහණ සිනාසුණා පමණි.

"මොකක් ද ඔය පාර්සලේ?" යි මා ඇසූ කල ඔහු "නෑ නිකම්" ය යි කියා කතාව අන් අතක යොමු කළේ ය.

මා තුළ සැකයක් ද බියක් ද පහළ විය. නිමල්ට සම්බන්ධ වූ කිසිවක් නො කීම ගැන මා සතුටු වූ අතර ම ඒ තොරතුරු දැන ගැනීමේ කුහුලක් ද මගේ සිතේ ඇති නොවුණා ම නොවේ. හෝටලයේ පැවැති උත්සවය පිළිබඳ විස්තර දැන ගැනීමට මම ආශා නො කළෙමි. පද්මිනී හා නිමල් අතර සම්බන්ධය කොතෙක් ඇති වී ද යි අවබෝධ කර ගත හැකි හෝඩුවාවක් ඔහුගෙන් ලබා ගැනීමට උත්සාහ කළ යුතු ය යි මම සිතුවෙමි. එහෙත් මම සියල්ල මැඩ ගතිමි.

"කුසුම් හෙට එනව නේ ද එහෙ?" ඔහු අන්තිමට ඇසුවේ ය.



කවටකමක් කිරීමට සිතූ මම,

"තවම හිතුවෙ නෑ" යි ගණනකට නැති ව මෙන් කීමි.

"ඇයි අම්ම කිව්ව නෙ නංගිට එන්න?"

"කිව්ව නම් තමයි. නමුත් මොනවට ද ඔය රුපියල් අස්සෙ අලුක්කාල් ගහන්න අපි යන්නෙ?"

"පිස්සු නැතුව එන්න. මෙන්න!" ඔහු පාර්සලය මා අතට දිගු කරමින් කීය.

"මොනවද?" මම විස්මයෙන් ඇස් අයා ඇසීමි.

"කුසුමට ඇඳගෙන යන්න සාරියක්"

"මම විහිළුවට කිව්වෙ. මම එන්නම තමයි ඉන්නෙ. මම සාරියකුත් ගත්ත"

"කමක් නෑ මේක ගන්න."

සාරිය බාර ගැනීමට නොව එය අතට ගෙන ලස්සණ බැලීමට මට වුවමනා විය. එහෙත් ඒ ගැන ආශාව ද යටපත් කර ගත් මම සිටි තැනින් සෙලවුණේ නැත.

"මම එකක් ගත්ත දෙවෙනියියෙ."

"මොකද කුසුම් මදිකමක් ද මේක ගන්න එක?" ඔහුගේ ස්වරයෙහි කෝපයක් යන්තමින් මතු වී තිබිණි.

"අනේ එහෙම එකකට කිව්ව නෙවි. දෙවෙනියියගෙන් මම තෑගි අරගෙන නැතුව යැ..............?"

"එහෙනම්?"

"මම දන්නෙ නෑ නැන්ද හෙම වුණත් මොන විදියකට හිතයි ද කියල"

"මොනව හිතන්නද මම අම්මට කිව්ව"

"මොනවද කිව්වෙ?" යි අසන්නට ගොස් අමුතු බියකින් ගුළුවට වූ මම බොළඳ සිනාවක් ඇතිව,

"අලුත් නෑන පොඩ්ඩට තෑගි දෙන්න. ලොකු මස්සිනා නෙ" යි කීම.

මගේ විහිළුවෙන් රෝහණගේ මුහුණ සතුටකට පත් වුණේ නැත. ඔහු මා වෙත තියුණු බැල්මක් හෙළී ය.

"ගන්නවද නැද්ද මේක?"

එය තර්ජනයකි. විධානයකි. මගේ සිනාව තුනී වී ගෙන යනු කම්මුල්වලට හා ඳෙ තොලට දුනෙනන්නට විය. ඔහුගේ වචන මා බියපත් කළා ම නොවේ. අවනත වීමේ - කීකරු වීමේ - හැඟීමකට මම යටත් වුණෙමි. එය පරාජයකට පත් වීමේ හැඟීමක් නොවේ. යම්කිසි ජයග්‍රාහී ගතියක් ද ඒ හැඟීමට මිශ්‍ර වී ඇත. රෝහණ හතුරුසිංහ සම්බන්ධයෙන් එවැනි දෙයක් ඉන් පෙර කිසි දවසෙක මා වෙත ජනිත වී නැත.

මා අඩි අටක පමණ දුර ඔහු වෙත ගියේත් සැලෙන අතින් සාරිය අතට ගත්තේත් ඔහුගේ ඳෙ නෙත වෙත යොමා ගත් බැල්ම ඇතිව ය. පස්සෙන් පස්සට වී පුටුවක වාඩි වූ මම යළි ඔහු වෙත බලන විට ද ඒ මුහුණට සිනාවක් නැඟී තිබුණේ නැත. මම අලස ඇඟිලිවලින් සාරිය කඩදසි උරයෙන් එළියට ගතිමි.

"ලස්සණයි!" යටින් බලා මම කීමි. "ඔසරියට හොඳට හිටි. ඒත් මේ තරම් වටින සාරියක් මට වැඩියි."

"ඒ පැත්තෙන් එයි මෝස්තරකාරියො. කුසුම් හොඳට ඇඳගෙන යන්න ඕනෑ."

"ඉඳා! ලෝකෙ රටේ මිනිස්සු කරන දේවල් අපට කරන්න පුළුවන් ද? අපි කවද ඒ ගොල්ල වගෙ තරමට ඇඳගෙන යන්න?"

සාරිය බාර ගැනීම ගැන අතුලා මට දෙස් කීවා ය.

"ඉතින් නංගියෙ මම ගෙදරට ගෙනත් දුන්න එක ආපහු දෙන්නෙ කොහොමද? ඇරත් දෙවෙනියිය දුන්නම එපා කියන එක හරි යැ?" මම කීමි.

අම්මා කිසිත් කීවේ නැත.

මරණයට නියම වී එල්ලුම් ගසට යන තුරු ගත වන සීමිත කාලය ඇතුළත වුව ද හිරකාරයකු තුළ යම්කිසි බලාපොරොත්තුවක් බලපාමින් තිබෙනු විය හැකිය. සියල්ල



අවසාන බව ස්ථිර වුව ද අන්තිමට සිදු වන්නේ කුමක් ද යි දැන බලා ගැනීමේ කුතුහල අන් හැම හැඟීමක් ම මැඩගෙන මතු වන අවස්ථා තිබෙන්නට පුළුවන. නිමල් හතුරුසිංහ තම මනාලියත් රැගෙන ගෙදරට පැමිණෙන මොහොත එන තුරු මා ඵද ගත කරන්නට ඇත්තේ ද එවැනි බලාපොරොත්තුවකින් හා කුතුහලයකින් නොසන්සුන් වූ සිතෙනි. වේදනාවක් විණි නම් ඒ වේදනාව හදවතට දැනෙන සීමාව ඉක්මවා ගොස් හිරිවැටීමක් බවට පත්වූ තත්ත්වයක තිබෙන්නට ඇත.

මම වෙන ද මෙන් ම කතා කළ බවත් සිනාසුණු බවත් මම සිතමි. එහෙත් කුමක් කතා කළෙම් ද කෙසේ සිනාසුණෙම් ද යි හැඟීමක් අදත් මට නැත.

අප 'සිසිල' ට යන කල පැමිණ සිටි විශාල නෑදෑ හිතවතුන් අතර ජයන්ත හා ඔහුගේ බිරිඳ ද නිමල්ගේ සම්බන්ධකමින් මා දැන සිටි තවත් කීප දෙනෙක් ද වූහ. උත්සවයේ මුල් අවස්ථාවට වඩා ශබ්ගෙවින් අලංකාර ලෙස නිවස සරසා තිබිණි. එන එන අමුත්තනට සංග්‍රහයක් විය. අනතුරුව අපට තිබුණේ පිරිස පැමිණෙන තුරු බලා සිටීම පමණකි. සමානායෙන් දන්නා හඳුනන අය සමඟ ආ ගිය කතා බහෙන් පසුව තවදුරටත් කියා ගන්න දෙයක් නො මැතිව රූකඩ තැබූ ලෙස තැනින් තැනට වී වාඩි වී සිටීමට වැඩි දෙනකුට සිදු විය.

දේශපාලනය, පරණ ගම කතා, මිනී මැරුම්, ඉහළ යන බඩු මිල මේ ආදී නොයෙක් දේ ගැන පිරිමින් තැන තැන කතා කරති.

මෝටර් රථයක හඬ ඇසුණු කල කෙනෙක් දෙ දෙනෙක් කර ඔසවා බලති. ඒ අනුව හැම දෙන ම කර ඔසවා බලාපොරොත්තු ගුන් ව යළි කරබා ගනිති. මේ හැම විටක ම මගේ සිත අලුතෙන් දුවී දුවී යන්නට විය. පැයක් පමණ ගතවත් ම මා කෙතරම් නො සන්සුන් වුණා ද යි කියතොත් මා තුළ තවත් දවෙන්නට දෙයක් ඉතිරි වීම මට ම පුදුමයක් විය. මේ ගමන පැමිණීමෙන් කළේ මෝඩකමකැ යි මම වරෙක කල්පනා කළෙමි. මගේ මේ මානසික වධය කෙළවරක් කරමින් ඔවුන් දැන් දැන් ආවොත් ය යි මම නොඉවසිල්ලෙන් සිටියෙමි. එහෙත් "එනව නේ ද?" "ඔව් එනව" "එනව තමයි" අන්තිමට හැම පැත්තෙන්ම ඇසෙන කල විදුලියක්

මෙන් මගේ සිත හරහා විහිද ගිය සිහිවිලි මාත්‍රයකින් මට සිතුණේ ඔවුන් නැවීත් - සිසි දවසෙක නැවීත් - එහෙත් දන් දන් එකැයි මොහොතින් මොහොත දුව් දුව් - කල්පයක් වුව ද බලා සිටින්නට වූවා නම් මීට වඩා දහස් වරක් සැනසිලි දයක බවති.

රතු මලින් ද රතු රිබන් පටියෙන් ද සැරසුණු මංගල රථය මා යන්තම් දුටුවා පමණි. ගෙයි සිටි පිරිස ඉස්තෝප්පුවෙන් මිදුලෙන් රොක් වන්නට වූහ. සාලයේ වූ කාන්තාවෝ මා පසු කරගෙන ඉදිරිපසට ඇදෙන්නට වූහ. මම වුවමනාවෙන් ම එහි රැඳුණා නොවෙමි. කුමක් කළ යුතු දැයි සිතා ගැනීමට මම අසමත් වීමි.

පාරේ සිට මනාල යුවළ පාවාඩ පිටින් ගෙට කැඳවීමට නියමිත ව සිටි බව මා අසා තිබිණි.

වෙඩිල්ලක් පිපිරිණි. චීන පටස්! රතිඤ්ඤා! බරවෙඩි! මේ හැම වෙඩිල්ලක් ම පුපුරන්නේ මගේ පපුවේ ය. මගේ හදවත මත ය. වෙඩි ගසන්නට සුදුසු අන් තැනක් නැද්ද? මේ අසලක ගස් ගල් නැද්ද? හැම වෙඩිල්ලකින් ම මගේ හදවත නැවත නැවත සැලෙයි.

නින්දෙන් අවදි වූවකු මෙන් මම ඇද නෙත් විදහා බැලීමි. මට පෙනෙන්නේ සාලයෙන් ඉස්තෝප්පුවට තෙරපී සිටින කාන්තාවෝ ය. ඔව්හු මට පිටුපා සිටිති. මම තනි වී සිටිමි. පාළුවක් හා අනාථ වූ බවට හැඟීමක් මට දනිණි. ඔවුන් දක ගන්නට නො ලැබෙ දෝ යි බියක් මට ඇති විය. ජීවිතයේ දක්නට ලැබෙන ඉතා ම සුන්දර ඉතා ම නෙත් කලු දර්ශනය දක බලා ගැනීමට නොලැබේ දෝ යි මොහොතක බියකින් මගේ සිත ඇළලී ගියේ ය. මම කර ඔසවා බැලීමි. ජය මංගල ගාථා සිහට සුදනමින් සුදු ළමා සාරි ඇඳගෙන දෙරකඩ පෙළට සිටි දරියන් කීප දෙනාගෙන් එකියකගේ කොන්ඩය බැඳි පටිය මට යන්තම් පෙනිණි. කොයි අත යම් දැයි, අවිනිශ්චිත ව මම අඩියක් පෙරට තැබීමි. අතක් - මුදු මොළොක් අතක් - මගේ නග්න උරතලය මත රැඳී ඔයෙන් එහි උණුසුමින් මම පිනා ගියෙමි. හැරී බැලූ කල මා දුටුවේ පුංචි නංගී මා අල්ලාගෙන සිටින බවයි. මම ඇයගේ අත තරයේ ගතිමි.



"හිර වෙන්න බෑ. අපි එන්න ඔහේ මෙහාට වෙලා ඉඳිමු." අනුලා මගේ කනට කොඳුලා ය.

"නෑ අපි පෙරළගෙන යමු ඉස්සරහට" මම සිනාසෙන්නට උත්සාහ ගනිමින් කීමි.

වෙඩි හඬ නතර නොවී ය.

මගේ අත අල්ලාගෙන ඉදිරියෙන් ගිය පුංචි නංගී සෙනග පීරාගෙන යන්තම් ඉස්තෝප්පුවේ මිටි කාප්පය වෙතට ම ළං වුණා ය. මම පාවාඩ පිටින් එන පෝරුව දුටිමි. මම අනුලාගේ අත මිරිකා ගතිමි. මේ දෙක ම වූයේ එක වර ය.

දෙ පයින් පටන් ගත් සීතලක් හිස් මුදුන දක්වා ගමන් කළා ද, හිස් මුදුනෙන් පටන් ගත් රස්නයක් දෙ පතුල දක්වා ගමන් කළා දැයි කීමට කවරෙක් දනිත් ද? දන ගැනීමට කවරෙකුට ඕනෑ ද? එක වර ම මා සීතලකින් අප්‍රාණික වී ගියේත් ගින්දරකින් දවී ගියේත් කෙසේ දැයි මම නම් නොදනිමි. මට කාප්පයට හේත්තු වන්නට ඉඩදී අනුලා පස්සට වූයේ වැළඳ ගන්නට මෙන් අතක් අත මගේ උර හිස හරහා යවමිනි.

ගෙට ගොඩ නො වී ඔව්හු නතර වූහ. ජය මංගල ගාථා ආරම්භ විය.

ඒ එයා නෙවි. වෙන කෙනෙක්..............! පද්මිනී නෙවි. මට සිතිණි. මොහොතකට මා තුළ අප්‍රමාණ සතුටක් ඇති විය. ඒ ඇස්. ඒ නැහැය. ඒ මුව. එහෙත් මේ මා දන සිටි පද්මිනී නො වේ. ඇයගේ කම්මුල්වල තිබුණු මුදු මොළොක් ගතිය මේ මුහුණේ නැත. හොඳින් වැඩුණු ඇඟ පත තිබුණත් පද්මිනී මේ තරම් උස මහත ගැහැනියක් නො වූවා ය.

"මම ගැහැනියක් වුණේ කුසුම් ගැහැනු ළමයෙක් වෙන්නත් කලින්" ය යි කිවත් පද්මිනී සේනාරත්න මගේ සිතේ සටහන් වී තිබුණේ ගැහැනු ළමයකු ලෙසිනි.

මේ පද්මිනී හතුරුසිංහයි.!

මට කරුණ අවබෝධ වන්නේ දැනයි.

www.sinhalaelibrary.com

මනාලයා වෙත මිස මනාලිය වෙත කිසිදු සබඳකෝලයක් දක්නට නොවී ය. ඇය මුළු කාලය ගත කළේ එක තැන නටමිනි. ගෙට ගොඩ වන තුරු ඇයට ඉවසිල්ලක් නැති සේ ය.

දිගට ම මම ඇස් පිය නොහෙළා මෙන් ඔවුන් වෙත යොමා ගත් බැල්මෙන් සිටියෙමි. දිගට ම අනුලාගේ ආදරණීය ඇඟිලි මගේ උරහිස පිරිමදින්නට විය.

පද්මිනීගේත් මගේත් ඇස් හමු වූයේ විනාඩි දෙකකට පමණ පසුව ය. ඇය මා දුටු බව ප්‍රත්‍යක්ෂ වූ කල මගේ සිත නැති ගැන්මකට සමාන චංචල වීමකට ගොදුරු විය. ඇයගේ මුහුණ අරක්ගෙන තිබුණු සිනාව මොහොතකට අතුරුදහන් වී වෙනත් මුහුණුවරකින් ආපසු මතු විය. පද්මිනී ඒ වෙන සිනාවෙන් - මා වෙනුවෙන් නැඟුණු සිනාවෙන් - යුතුව තත්පර විස්සක් තිහක් මා දෙස බලාගෙන වුන්නා ය. මම සිනාවකින් ඇය පිළිගන්නට උත්සාහ ගතිමි. ඒ උත්සාහය අසාර්ථක වූ තැන වෙව්ලන ඇඟිලි සහිත අත හිස දෙසට අමාරුවෙන් එසවීමි. පද්මිනී ද ඊට පිළිතුරු වශයෙන් අත ඔසවා ඇඟිලි නැටෙව්වා ය. නිමල් මා දුටුවේ ඇයගේ ඒ ක්‍රියාව අනුව ය. ඔහු වහා පද්මිනී දෙස බලා අකාතරුව බිම බලා ගත්තේ ය. මගේ ඇස් මුණ ගැසීමේ වධයෙන් ඔහු නිදහස් කළ යුතු ය යි මම සිතා ගතිමි.

ජය මංගල ගාථා අවසන් වන තුරු ඉන්පසුව තීප වරක් ම පද්මිනීගේ බැල්ම එහෙ මෙහෙ ගමන් කරන අතර මා අසලට පැමිණ යළි වෙනතක යොමු විය. ඇයගේ මුහුණෙහි මුල දී තිබුණු සිනාව දක්නට නොවීය.

රතු පාට මණිපුරී සාරියකින් ද බෙරලියන්තු ගල් ඇල්වූ කණ කර අබරණින් ද සැරසී සිටි මනාලිය පමණක් නොව ඇයගේ පාර්ශ්වයෙන් පැමිණි අනෙක් කාන්තාවන් ද තරම් වටිනා ඇඳුමින් පැලඳුමින් යුත් පිරිසක් ඉන් පෙර මා දැක තිබුණේ නැත. මා පමණක් නොව එහි සිටි කාන්තාවන් වැඩි දෙනකුට ම එය කලාතුරකින් දක්නට ලැබෙන දර්ශනයක් බව කාගේත් මුහුණුවලින් තේරුම් ගත හැකි විය.

දවල් ආහාරයට පළමු ව සිසිල් පැන් සංග්‍රහයක් නියමිත ව තිබිණි. අමුත්තන් වාඩි වී චාරිත්‍රානුකූලව පිළිගැනීමෙන් පසුව කමලාවතී ඇතුළු ගෙදර අය මේ සඳහා කලබල වූ හ.



මා පද්මිනී වෙත ගොස් කතා කළ යුතු ද? යනු මගේ ක්ෂණික ප්‍රශ්නය විය. කලින් මෙන් සෙනඟ අතර ට ම වී නොපෙනී සිටින්නට මට නුපුළුවන. අනුලා මගේ අත අල්ලා ගත්තා ය.

"කුසුමේ වරෙල්ලා වරෙල්ල මෙහෙට" කමලාවතී අපට කතා කළා ය.

මම පුංචි නංගීත් සමග ගේ ඇතුළට ගියෙමි. කාන්තාවනට සිසිල් බීම ගෙන යන්නට මට ද බාර විය. සැටියේ මනාලිය පමණක් රඳවා නිමල් ඉවතට ගොස් සිටියේ ය. ඈ පැත්තකට හැරී තරුණියක හා කතාවට වැටී වුන්නා ය. මම අනෙක් පැත්තෙන් ගෙට ගියෙමි.

"කුසුමේ වරෙන් අර බීම අල්ලපන්. අර පැත්තෙන් ආව ඔබලත් කාණ්ඩෙට ඉස්සෙල්ල. පලයල්ල පලයල්ල" යි කමලාවතී මා දැක කීවා ය.

වේදනාව සිතට පුරුදු වන්නට වූයෙන් අප්‍රාණිකකමත් සීතල වීම හා දැවීමත් මගේ ගතට ද පුරුදු වන්නට විය. මට ඇය අසලට ම යන්නට සිදු වූයේ දෙ වන වටයේ දී ය. පේළියක අන්තිම කාන්තාව වීදුරුවක් ගත් කල මම බන්දේසියත් අල්ලාගෙන ම පද්මිනී ඉදිරිපිට නතර වීමි.

"ඔය කෙහෙල්මල පැත්තකින් තියල මෙතනින් වාඩි වෙන්න."

"ඔතන වාඩි වෙන්න කෙනෙක් ඉන්නව නෙ........... ගන්න"

"මම කිව්ව කුසුම්"

"මගෙන් එකක් ගන්න." මම බන්දේසිය වඩාත් ළං කළෙමි.

"හොඳයි එහෙනම් මේකත් ඔයාගෙන් ගන්නම්"

එහායින් හිස් වීදුරුවක් දැක ඒ දෙසට හැරෙන්නට වූයෙන් ඒ වචන සමග ඇයගේ මුහුණ දකීමට මම අසමත් වීමි.

"කුසුම් ඕක තියල එන්නකො" තමාගේ හිස් වීදුරුව මට දෙන අතර ඈ කීවා ය.

"කලබලයක් නැ නෙ දැන්. අපට ඕනෑ තරම් කතා කරන්න පුළුවනි නෙ" යි කියාගෙන මම මගේ කටයුත්තෙහි යෙදුණෙමි.

www.sinhalaelibrary.com

ඒ පැත්තේ නෑයන් තම තමන් සමඟ ද මේ පැත්තේ නෑයන් තම තමන් සමඟ ද මිස දෙපක්ෂය එකට ගැටී කතා බස් කරන තත්ත්වයක් නො විය. වැඩි පුර ඉංග්‍රීසියෙන් කතා බස් කළ මනමාලියගේ පිරිස සමාගමය සඳහා යන්නම් හෝ තෝරා ගත්තේ නිමල්ගේ මිත්‍රයන් ද ඔවුන් ගේ බිරියන් ද පමණකි. පද්මිනී හා යමුනා ඕපාදූපයක වැටී සිටිනු මම දුටුවෙමි. මුලින් මට කතා කළත් පසුව ඇය වෙත ඒ ගැන එකරම් උනන්දුවක් ඇති බවක් මම නොදුටුවෙමි.

මට නිමල් හා පද්මිනී දෙස බලන්නටත් බැරිය. නොබලා සිටින්නටත් බැරිය. ගෙයි කොතැනට ගියත් මට ඔව්හු පෙනෙති. නැතහොත් කොතැනට ගියත් මා රැඳුණේ ඔවුන් පෙනෙන තැනක ය. මා කුස්සිය පැත්තට ගොස් වරකට විනාඩියකට දෙකකට වඩා ගත කළේ අමාරුවෙනි.

දෙතුන් වරට සියලු දෙනා ම අහර ගෙන නිම වන විට දවල් දෙක පමණ විය.

"හරි වැඩක්නෙ ජේන් අක්කෙ" කුස්සියේ සිටි අම්මා වෙත කලබලයෙන් පැමිණි කමලාවතී පහත් හඬින් කීවා ය. "වාලිද්දරයක් නෑ කියන්නෙ............."

අම්මා එක වර කතා කළේ නැත.

"දැන් ඉතින් ඔව කිසි දෙයක් ගැන කලබල කරල වැඩක් නෑ. හොඳින් කටයුතු වුණයි කියල............."

"ඒ වුණාට ජේන් අක්කෙ රෙදි නැන්ද කෙනෙක් නැතුව එක ඉසද්දිය ගමනක් අහපු රටක් තියෙනවද?"

"කලබල වෙන්න එපා"

"මොකද නංගියෙ?" යි කියාගෙන මධුරිගේ මව එතැනට ආවා ය.

"නෑ මොකුත් නෑ" යි කමලාවතී ආපසු හැරුණු නමුත් ඇය එයින් සැහීමකට පත් නොවුණා ය.

සියල්ල දුවී ගිය බවට මුහුණේ මතු වූ පෙනීම සැඟවීමට කමලාවතී අසමත් වූවා ය.



සිදු වී ඇත්තේ කුමක් ද යි නොව සිදුවන්නේ කුමක් ද යි දැන ගැනීමේ ද්වේෂ සහගත කුතුලක් මා තුළ ඇති විය. මේ කුතුල මගේ සිතට යම්කිසි සැනසීමකි. මම සාන්තුවරියක වීමට උත්සාහ නොගෙන ද්වේෂයෙන් පිනා යෑමට සිතට ඉඩ දී කමලාවතීත් මධුරිගේ මවත් අතර කතාවන දේ අසුලා ගැනීමට උත්සාහ ගතිමි.

විනාඩි දෙකකට පමණ පසුව මධුරිගේ මව මුල්ලක දී නැවත වරක් කමලාවතී අල්ලා ගත්තා ය.

"දැන් ඉතින් වැඩ කටයුතු ඉවරයිනෙ නංගියෙ. ඊළඟට......"

"ඔව් දැන් ඒ කාණ්ඩෙ යන්න ලැස්ති වෙනව"

"එහෙම නිකම්ම ගියැකි යෑ. අම්මල තාත්තල ගැනු දරුවෙකුගේ පුද්ද පවිත්තර කම දැනගෙන යන්න එපා යෑ"

"ඒවයෙ කිළුටක් නෑ"

"එච්චරයි මිනා.........! රෙදි නැන්ද කෙනෙක් ඇවිදිල්ල නම් නෑ නේ ද?"

"මේ අලුත් කාලෙට වැඩ කරන අය ඔය පරණ සිරිත් ගණන් ගන්නෙ නෑ අක්කෙ" යි කමලාවතී කියාගෙන ගියේ සිනාවක් නගා ගැනීමට උත්සාහ කරමිනි. ඇයගේ මුහුණ දුටු මා තුළ ඇති වූයේ හැඬෙන තරමේ දැඩි අනුකම්පාවකි.

"හොඳයි ඔය සිරිතුත් අහක දැම්මොත්" ය යි කියමින් මධුරිගේ මව තමාට පිටු පා යන නෑනා දෙස බැලුවේ ද්වේෂ සහගත මෙන් ම ජයග්‍රාහී සිනාවක් ඇතිව ය. "සල්ලිවලින් වහන්න බැහැ."

පද්මිනීගේ නෑදෑයින් පිටත් ව ගිය පසු ගෙදර එන්නට කලින් '[illegible]' කියනු පිණිස මම ඇය තනි වන තුරු බලා සිටියෙමි. නිමල් ඉස්තෝප්පුවේ සිටිනු දුටු මම කෙළින් ම [illegible] ගියෙමි. සියලු හැඟීම් මැඩගෙන මගේ කල්‍යාණ මිතුරිය [illegible] සලකා එක වරක් වැළඳ ගැනීමේ බොළඳ ආශාවක් මා තුළ විය.

"පද්මී මම යන්න."

www.sinhalaelibrary.com

"කුසුම්" ඇය මගේ කරට අත දමා ගත්තා ය. මම සහෝදරියකගේ උණුසුම සොයාගෙන මෙන් ඇයට ළං වීමි. මම කඳුළු මැඩ ගැනීමට තරයේ දෙ නෙත් පියා ගතිමි.

"............ කුසුම් ඔයා මා එක්කල තරහද?"

මම හිස සැලීමි. මට කතා කර ගත නො හැකි ය.

"ඔයාට බැරි වුණු දෙයක් මම කළා."

"මගෙ තරහයක් තිබුණෙ නැහැ පද්මි කවදාවත්"

"ඒක නෙවි............. ඔයාට බැරි වුණා පලිගන්න. මම පලිගත්ත. ඔයා වෙනුවෙන්!"

විදුලි සැරයක් වැදුණු කලෙක මෙන් මම තැතිගෙන පද්මිනීගෙන් වහා ඉවත් වීමි. ඈ මා දෙස බලා සිටියා ය. ඇයගේ දෙනෙත්හි හැලියමින් තිබුණේ තෘප්තියට පත් වීමේ ආඩම්බරය ද ද්වේෂය ද යනු මට තේරුම් ගත නොහැකි ය. එවැනි බැල්මක් කිසිම ගැහැනු ඇසක මින් පෙර හෝ පසුව හෝ මා දැක නැත. මගේ සිතෙහි හදිසි ගින්නක් මෙන් වහා මතු වූයේ ක්‍රෝධයකි. මට වඩා උස මහත ශක්ති සම්පන්න එකියක වුව ද පද්මිනී සේනාරත්න - දැන් පද්මිනී හතුරුසිංහ - මිරිකා දැමීමට තරම් මගේ හැඟීම් දැඩි විය.

"තවමත් ආදරෙයි.............? ඔයා කැමැති නම් මට නම් දැන් වුණත් කමක් නෑ." යි කී ඈ සිනාසුණා ය. එය වියරු සිනාවකි.

මා පත් වූයේ සිහිනයක නැතහොත් නවකතාවක හෝ සිනමාවක හෝ පමණක් මගේ අත්දැකීම් ඇති තරුණියක පත්වන තත්ත්වයකට විය යුතු ය. ඒ තත්ත්වය යටතේ මම තවත් එක ද වචනයක් වත් නො කියා සිහිනයකින් මෙන් කාමරයෙන් පිට වී සාලයට පැමිණියෙමි. මට සාලය පෙනුණේ අමු සොහොනක් මෙනි. 'අන්න අර කාමරේ මිනියක් මරල' යි කෑ ගසන්නට පුළුවන් කමක් විණි නම් එසේ කෑ ගැසිය හැකිව තිබිණි. ඒ නැත් කිසිවකු සමග කතා කළ හැකි අන් කිසිවක් මට නො විය.

"පුංචි නංගියෝ! අම්මේ! යමු! කෝ නිල්මිණි? මෙතන ගින්නක්! අපි යමු" යි කෑ ගසන්නට මට ඊළඟට සිත් විය.



මා ගෙදර ආවේ විකල් වූ සිහියෙනි. ඇඳේ වැටුණු මම හැඬුවෙමි. එද මම නතර කරන්නට කිසිම උත්සාහයක් නොගෙන ඉකි බිඳ බිඳ බොහෝ වේලා හඬ නගා හැඬුවෙමි. අම්මා හෝ පුංචි නංගී හෝ මා නළවන්නට ආවේ නැත. මට එය සැනසීමක් විය.

අතුලා කෑම පිසූ නමුත් එද ඒ බත් කෑවේ නිල්මිණි පමණි.

# 7

සිරිත් පරිදි අම්මා වෙළෙඳාමටත් පුංචි නංගී ඉගෙනීමටත් යන්නට පටන් ගත්හ. මම වෙන ද මෙන් ම හැමට කලින් අවදි වී කේතලය ළිප තැබීමි. අම්මාට තේ වතුර පිළියෙළ කළෙමි. නිල්මිණිට කැව්වෙමි. දවල් ආහාර පිසීමි. සවස නංගී සමඟ නාන්නටත් අනතුරු ව ගමේ එළවළු එකතු කරන්නටත් ගියෙමි. සැන්දෑවේ අම්මා ගෙදර පැමිණි කල මුහුණ සෝදන්නට වතුර ටිකක් තබා පසුව ඇයගේ හිස තෙල් ගා පිරිමැද්දෙමි.

මේ අනුව බාහිර වශයෙන් මගේ ජීවිතයේ කිසිදු වෙනසක් වූ බවක් දක්නට නොවී ය. එහෙත් අභ්‍යන්තර තත්ත්වය ඊට හාත්පසින් ම අමුතු එකක් විය. ඇත්ත කියතොත් මා අභ්‍යන්තර ව වෙනසකට පත් වුණා ද නැතහොත් වෙනසකට පත් වීමේ අවශ්‍යතාවකට මුහුණ දුන්නා ද යි කීමට මම නො දනිමි.

නිල්මිණි සමඟ උදය වරුව ගෙදර තනි වන මා වෙන ද මෙන් මැහුම්ක ගෙතුම්ක වැඩක් හෝ බීඩි එතීම හෝ කළේ නැත. මා දවල් ආහාරය පිළියෙළ කළේ අලසකමිනි. කෑම කෑවේ රුචියකින් නොවේ. සවස වැඩක 'පළක යෙදුණ නම් පුංචි නංගීට පෙනෙන්නට බොරුවට මිස හිතකින් නොවේ. මගේ නින්ද අඩු විය. රාත්‍රියේ වැඩි කොටස නොනිදා පහන් කරන මා ඊළඟ ද කල් ගෙවූයේ වෙහෙස වූ ගතින් හා සිතිනි. ඉඳහිට නැවත වරක් හිසරදය ද වැළඳෙන්නට විය. මගේ මේ වෙනස අම්මාගෙන් හා නංගීගෙන් සැඟවීමට මා නිතර උත්සාහ කළෙමි.



'ඔන්න ඔහේ දන ගත්තත් මොනව කරන්න ද' යි සමහර විට මම උදාසීන වීමි. එසේ සිතුණු අනතුරුව මම නිතර ම වඩ වඩාත් කලකිරීමට ද මා ගැන ම කෝපයකට ද පත් වීමි. මේ නිසා ම ඇතැම් විට නොරිස්සුම් සහගත තත්ත්වයකට ද වැටුණෙමි.

මොනවා වුණා ද යි සිතා ගැනීම මට ම ගැටළුවක් විය.

නිමල්ගේ විවාහය නිසා මා මෙවැනි වෙනසකට පත් වූයේ ඇයි?

අවුරුදු ගණනකට උඩ දී මම මගේ ම කැමැත්තෙන් ඔහු සිතින් ඉවත් කර ගතිමි. ඔහු මට නැති වූයේ ඒ දවස්වල ම ය. ඉදින් කල් නියා හිත හද ගත් පරිදි මට අමුත්තක් නොවුණා මෙන් තරුණ ජීවිතය ගත කිරීමට ඇති බාධාව කුමක් ද?

සියලු බලාපොරොත්තු ඉවත් කරගෙන තිබුණත් මගේ ම යටි සිත අවසාන මොහොත වන තුරු නිමල් පතාගෙන සිටියා ද යි මම නොදනිමි. එවැනි අදහසක් වුණා නම් උත්සාහයකින් ඇති කර ගත්තක් නොව මිනිස් චිත්ත ස්වභාවය අනුව උපන්නක් [illegible]ක් වන්නට ඇත.

නිමල් හා මා අතර සබඳකම නතර වී කලක් ගෙවී තිබුණත් ඔහු පිළිබඳ මතක මගේ සිතුම් පැතුම් හා හැඟීම් කෙරෙහි දිගට ම බලපෑමක් ඇති කිරීමේ සමත් විය. ඔහු හා එකට ගත කරන්නට ලැබෙන අනාගතයක් ගැන කල්පනා නො වුණත් ඔහුගෙන් තොර අනාගතයක් ගැන නො සිතා සිටින්නට ඔහු අවිවාහකව සිටින තුරු මට පුළුවන්කම ලැබිණි. තීරණයකට බැහැගත් බවට කොතෙක් සිත කීවත් අතීතයේත් අනාගතයේත් දෙකේ ම සෙවණැල්ල හොල්මන් කරන්නට විය.

නිමල්ගේ විවාහයත් සමඟ මේ සියල්ල වෙනස් විය. සුන් වූ බලාපොරොත්තු හා ආශාවන් ද අධිෂ්ඨාන හා තීරණයන් ද පිළිබඳ කැබැලි එකතු කරගෙන වර්තමානය නැමැති ඒ ඒ මොහොතෙහි ඒකවර්ණ සෙවු ක්ෂේම භූමියක් වශයෙන් ගොඩ නඟා ගත් තාවකාලික මනෝ ලෝකයක් කැඩී බිඳී සුණු විසුණු වී ගියේ ය. ඒ වෙනුවට අලුත් ලෝකයක් ඉදිකර ගත යුතු ව තිබේ.

මා එදා අන්තිමට පිටත් ව ආවේ පද්මිනී කෙරෙහි උපදවා ගත් ක්‍රෝධයක් ඇතිව ය. එය මිනිස් දුවක නිසා නො ව යක්ෂණියක නිසා බියත් මිශ්‍ර වී ඇති වන ක්‍රෝධයකි. මා තුළ ඇය කෙරෙහි එවැනි අමිහිරි හැඟීමක් උපන්නේ මගෙන් නිමල් උදුරා ගැනීම ගැන නො ව සිතා මතා නිමල් විනාශ කර දැමීම ගැන ය. දින ගණන් පසුවෙත් ම එම ක්‍රෝධයේ සැර පරුෂකම හීන වුණා මිස මුහුණුවර වෙනස් වුණේ නැත.

අනෙක් අතට පද්මිනී කෙරෙහි ක්‍රෝධයක් ඇති වූ මගේ සිතෙහි ඇයගේ ගොදුරට අසු වූ නිමල් වෙනුවෙන් කිසි ම ලෙසක අනුකම්පාවක් හට නොගත්තේ ය. ඒ වෙනුවට ඔහු ගැන මට ඇති වූයේ පිළිකුලකට සමාන හැඟීම් වගයකි. ඒ නිමල් නිසා මගේ සිතේ මෙතෙක් ඉපදුණු සියලු හැඟීම්වලට වෙනස් ම ස්වභාවයකි. පද්මිනීට අසු වීම ගැන නිමල් නිදෙස් කරන්නට උත්සාහ නොගත් මම ඔහු සම්බන්ධ ව උපන් පිළිකුලට මගේ සිත්හි කැමැති පරිදි වැවෙන්නටත් වැඩෙන්නටත් ඉඩ හැරියෙමි. මේ නිසා නිමල් හා පැවති සියලු බැඳීම් මුලිනුපුටා දැමීමට උත්සාහයක් ගැනීමේ අවශ්‍යතාවක් මා ඉදිරියේ මතු වූයේ නැත. නිමල් ගැන හැඟීම් මෙසේ වුව ද ඔහු හා සම්බන්ධ ව මගේ ඉරණම විසඳී අවසාන වුව ද චිත්ත පීඩනය මා වෙතින් එහා ඉවත් වූයේ නැත. වේදනාව වූ කලී නිමල් හතුරුසිංහ නමැති පුද්ගලයා අහිමිවීමෙන් ඇති වූවක් නොව පොදු වශයෙන් අතීතය අහිමි වීම නිසා ඇති වූවක් විය යුතු ය.

ප්‍රේමය විශ්ව සාධාරණ උරුමයකි. ඒ උරුමයට හිමිකම් බැහැර කරනු ලැබීමෙන් මට අයුක්තියක් සිදු වී තිබේ. මා සිතින් නිමල් නමැති පුද්ගලයා ඉවත් කරගෙන කලක් ගත වී තිබුණත් ජීවිතයෙන් හිමි වූ මගේ උරුමය මට පැවරෙනු ඇතැයි බලාපොරොත්තුවක් - දිගට ම මගේ යටි හිතෙහි රැඳී තිබුණා ද විය හැකි ය. මට තව දුරටත් අහිමි වූයේ අතීතයකි. අතීතය නිමල්ට පමණක් නොව මටත් අයිතිය. මටත් පොදු ය. නිමල් නැති වූ නිසා ම මේ අතීතය මට අහිමි වීමත් අයුක්තියකි. ආදරය කරනු පිණිස කෙනකු නැත්නම් තවත් කෙනකු සොයා ගත හැකි ය. එහෙත් ඇත්තේ එකම අතීතයකි. බාල කාලය හා පාසල් වියත් එකල මැවූ සිහින හා ඇති කර ගත් අධිෂ්ඨානත් සියල්ල අතීතයට



අයිති ය. ඒ අතීතය මට නැත. ආපසු හැරී බැලූ කල නැවත ඇතුළු විය නො හැකි ලෙස දැවී අළු වී ගිය අතීතයෙන් පැන ගොස් සැඟවෙන්නට ඇති එක ම තැන අනාගතය යි.

අනාගතය! අනාගතය ඊටත් වඩා ගුප්ත ය. ඒ ගැන සිතන කල ඇති වන්නේ නැති ගැනීමක් හා බියකි. වෙනසක් අවශ්‍ය වන්නේ මෙතැන දී ය. අතීතයක් නැති අනාගතයක් නැති මා වර්තමානය වෙනසකට පත්කර මිරිකා දැමිය යුතු ය. බලාපොරොත්තුවක් තැබිය හැක්කේ එයින් ලැබෙන ප්‍රතිඵලයෙන් පමණකි.

මා සොයන වෙනස කුමක් ද?

වරක් මා ජීවිතයට මුහුණ දුන්නේ අම්මා නංගී හා නිල්මිණී ගැන සිතීමෙනි. අදත් මට ඉන් බාහිර තත්ත්වයක් නොතිබෙන්නට පුළුවන. අම්මාගේ ජීවිතයේ අවසාන කොටස සැපවත් කරන්නට මට ශක්තිය ඇතැයි සිතමු. නංගීට උසස් අධ්‍යාපනයක් ලබා දී යහපත් ජීවිතයකට පත් කරන්නට පුළුවනැයි සිතමු. ඉන් මගේ ප්‍රශ්නය විසඳේ ද? අම්මාත් නංගීත් සත්‍යයකින් ම මගෙන් බලාපොරොත්තු වන්නේ එවැන්නක් ම නොවේ. ඒ පරිත්‍යාගය පමණක් ඔවුනට නො සෑහෙයි. ඔව්හු මගෙන් ඊට වැඩි දෙයක් බලාපොරොත්තු වෙති. වෙනත් පරිත්‍යාගයක් ඉල්ලති. එනම් ජීවිතයට මුහුණ දීමයි. ඔවුන් වෙනුවෙන් නොව මා වෙනුවෙන් ද ජීවිතයට මුහුණ දීමයි.

මේ දිනවල අම්මාත් පුංචි නංගීත් මා ගැන ක්‍රියා කරන්නේ බරපතළ ලෙස රෝගාතුර ව සිට සුවය ලබාගෙන එන කෙනකු ලෙස සලකමිනි. කෑම බීම විවේකය හෝ නින්ද යම් විදියකින් නැවුණොත් යළි ලෙඩ වෙතැයි බියක් ඔවුන් වෙත ඇත. ඔවුන් සාදර කතා කරන්නේ පරිස්සමිනි. කෑම බීම තෝරා ගන්නේ පරෙස්සමිනි. සියල්ල මා වෙනුවෙන් මුල් තැන දීමෙනි. සියල්ලෙහි ප්‍රමුඛ ව කටයුතු කළ මම මෙතැයින් අනාථ තත්ත්වයකට වැටී සිටිමි. මේ ගැන සිතන කල මම වඩ වඩාත් සිත් තැවුලටත් සමහර විට කලකිරුණු ස්වභාවයකටත් පත් වෙමි.

'මට ලෙඩක් නෑ. මට අමුත්තක් නෑ' යි කෑ ගසා කියන්නට වෙලෙක මට සිතෙයි. එහෙත් මට ඒ තරම් ධෛර්යයක් නැත. එසේ නැගැසීමට තරම් අවංකකමක් ද නැත. . .

www.sinhalaelibrary.com

අනුලා දුන් මා ගැන ක්‍රියා කරන්නේ වයසට වඩා මේරූ එකියකගේ ලොකුකමක් ඇතිව ය. විටෙක මට ඒ ගැන සිනා යයි. මගේ සිතුම් පැතුම් සඟවාගෙන සිටීම නිසා, මිතුරියන් දෙදෙනකුගේ තත්ත්වයේ වුන් ඇයත් මාත් අතර, අලුතක සිට පරතරයක් මතු වී ගිය බවක් මට සිතෙයි. ඒ ගැනත් මම කණගාටු වෙමි. එහෙත් පරතරය මකන මඟක් ගැන මට කල්පනා නොවෙයි.

රක්ෂාවක් ලැබුණොත් මගේ ප්‍රශ්නය බොහෝ දුරට විසඳෙනු ඇත. බීඩි එතීම හෝ පාන්කි සිටුවීම හෝ නොව මට ඕනෑ කරන්නේ කාලය මිඩංගු කළ හැකි ක්‍රමානුකූල රක්ෂාවකි.

නැවත වරක් ඉගෙන ගැනීමට මට සිතෙයි. විශ්ව විද්‍යාල ප්‍රවේශ හෝ ගුරු අභ්‍යාස හෝ විභාගයට පෙනී සිටීමට මට තවමත් කල් ඇත. ටයිප් ගැසීම ඉගෙන ගන්නටත් පුළුවන.

මේ කොයිකටත් පංතියකට යා යුතු ය. නගරයේ සවස් වරුවේ පංති පැවැත්වෙන කීප තැනක් ම ඇත. අනුලා ගෙදර එන වේලාවට මට පිටත් ව යා හැක. මේ අදහස සිතට නැගුණු කල සුළු සැනසීමක් දැනෙන්නට විය. පොත් පත් අතින් ගෙන දිනපතා නගරයට යන ගමන සම්පූර්ණයෙන් ම වෙනසකි.

නිදහසක් ලබා ගැනීමේ දැඩි ආශාවක් මා තුළ උපදී.

ඇත්ත වශයෙන් පංතියකට යෑමේ ආශාව මට ඇති වන්නේ ඉගෙන ගැනීමේ වුවමනාවට ම ද යි අනෙක් අතට මට කල්පනා වෙයි. මට වුවමනා කරන්නේ මේ ඒකාකාරී දින චර්යාව වෙනස් කිරීම මිස අනාගතයක් ගැන සිතා ඉගෙනීම වැඩි දියුණු කර ගැනීම නො වේ. එය ආත්මාර්ථකාමී සිතිවිල්ලකි.

සවසට ගෙදරින් පිට වූ කල නිල්මිණිටත් පුංචි නංගීටත් පාළු ය. පංතියට නිකම් ම යා නොහැකි ය. මුදලක් ගෙවිය යුතු ය. ඉන් ලැබෙන ප්‍රතිඵලය මගේ සිතට සුළු සැනසීමක් ලබා ගැනීම පමණකි.

නිර්ණයකට බසින අදහසින් මම හැම රැයක ම ඇඳට වැටෙමි. පැය ගණනක් එක ම දේවල් ගැන නැවත නැවතත් සිතනා මා නින්දට යන්නේ වැහැරුණු සිතිනි. යම්කිසි අලුත්



සිදු වෙතැයි බලාගෙන මම අවදිවෙමි. හැම අලුත් දවසක ම මගේ ජීවිතයේ වෙනසක් ඇති කිරීමේ අලුත් කිසිවක් සිදුවෙතැයි මම බලාගෙන සිටිමි. තැපැල්කාරයා දකින මම තැති ගනිමි. කලින් යවන ලද ඉල්ලුම් පත්‍රයකට බැරිවීමකින් වත් පිළිතුරක් ලැබෙන්නට ඉඩ ඇතැයි මට සිතෙයි. මගේ ජීවිතයේ වෙනසක් කළ හැකි ලිපියක් කිසිවකුගෙන් ලැබෙන්නට ඉඩ ඇත.

මම දිනපතා බලා සිටිමි. දෙවියනි, මම බලා සිටිමි.

උදය ආහාරයෙන් පසුව නිල්මිණි නැවත බඩගිනි වන තුරු වෙරළු ගස යට සෙල්ලම් කරයි. මම ඇයගේ පරිස්සමට මෙන් ඉස්තෝප්පුවේ වාඩි වී කල්පනාවේ වැටෙමි. වැඩි වශයෙන් මහා පාළුවක් දැනෙන්නේ මේ අවස්ථාවල ය. කිසිවකු ආවොත් ය යි මම ආශාවෙන් බලා සිටිමි.

'සමරගිරි' නිවස ද තවමත් පාළු ය. මෙය නැවත ජනාවාස කරන්නට බැරි තරමට දැන් ජරාවාස ව ඇත. නිකට අත්ලේ තබාගෙන කල්පනාවේ වැටී සිටින ඇතැම් අවස්ථාවෙක මට 'සමරගිරිය' තුළින් බාල කාලය මතක් වෙයි. එකල කලඵළියෙන් යුත් මේ ලොකු ගොඩනැගිල්ල මගේ ළමා සිත විමත්කාරයට පත් කළ සැටි මතක් වෙයි. එද අප නොයෙක් අතින් දුක් වින්දෙමු. ආර්ථික තත්ත්වයේ වෙනසක් නොවුණත් අද අපි කෑමෙන් බීමෙන් හා ඇඳුමින් පැලඳුමෙන් එද තරම් පීඩා නොවිඳිමු. කුඩා දවස අපි අදට වඩා කුසගින්නේ සිටියෙමු. අඟ හිඟකමින් මිරිකී සිටියෙමු. ආර්ථික දියුණුවක් නිසා ම නොව අධ්‍යාපනය, තරුණ වයස හා සමාජ පරිසරයේ හටගත් වෙනස ආදී පරිවර්තනයනට අනුවීම නිසා ය. එකල විඳි වේදනා දැන් මගේ සිතට නො දැනෙයි. කුසුම, සෝමා හා අනුලා නමැති අසරණ දරියන් තිදෙනකු මැවී යෑමෙන් යම්කිසි අනුකම්පාවක් ඇති වෙයි. මන්ද පෝෂණය නිසා අකාලයේ මිය ගිය දරුවෙක් මතක් වෙයි.

මල්ලී ජීවත් ව සිටියා නම් අද තිස්ස වැනි ගැටවරයෙකි. පිරිමියෙක් සිටියා නම් මේ තරම් බරක් මට නො දැනෙන්නට තිබිණ. ඒ දුප්පත් ළමයින් ගැන මතක් වන විට ඔවුන් විඳි දුක් හා වේදනා ඔවුන් හෙලූ කඳුළු හා සුසුම් කිසි දවසෙක නිල්මිණිට නොදීමේ මගේ අධිෂ්ඨානය දැඩි වෙයි. මේ විදියට ගියොත් මගේ ඒ අරමුණු ඉටු කර ගත හැකි වේ දැයි බියක් මගේ සිත පෙළයි.

www.sinhalaelibrary.com

අද බාල කාලය ගැන සිතන ලෙසින් අනාගතයක තරුණ කාලය සම්බන්ධවත් මට මෙනෙහි කරන්නට ලැබෙන්නේ නටබුන් හා බොල් සිහින ගැන පමණක් ද?

මා යම්කිසි වෙනසක් ඇති කර ගත යුතු ය. මා ජීවිතයේ අභියෝගයට ස්වශක්තියෙන් හෝ මුහුණ දිය යුතු ය.

මෙහෙවා කරන්නත් මේ පාළුව! මේ තනිකම!

ගිය අවුරුද්ද දෙක ඇතුළත මගේ ඇසුරෙහි සිටි කිසිවෙක් මට අහිමි නො වූහ. එහෙත් මට දැනෙන්නේ සියල්ල අහිමි වූ තරමේ පාළුවකි.

පාළුවෙන් මුසපත් වූ එක් උදයක මම කරන්නට වැඩක් නොවූයෙන් ලාච්චුවක් අවුස්සන්නට වීමි. ගුණපාල විසින් මට එවන ලද ලියුම් සියල්ල ම පිළිවෙළින් එකතු කර පරණ ඇක්සයිස් පොතක් අස්සේ සුරක්ෂිත ව දමනු ලැබ තිබී මට හමු වූයේ මෙහි දී ය. මා තුළ එක වර කුහුලක් හට ගත්තේ ය. මම ගුණපාලගේ ලියුම් ඒ ඒ අවස්ථාවේ අතන මෙතන දැමුවෙමි. ඒවා වුවමනාවෙන් ඉරා දැමීමට මෙන් ම වුවමනාවෙන් රැක ගැනීමට ද අදහසක් මට නො වීය. මට ආ ලියුම් පුංචි නංගී ද කියෙව්වා ය. ඒ හැර ඇය ගුණපාලගේ ලියුම් වෙන ම පරිස්සමේ තබා තිබුණු බවක් මම මෙතෙක් දැන නො සිටියෙමි.

අනුලා මට වඩා වෙනස් අදහස් ඇති ගැහැනු ළමයෙකි. ඇය ගුණපාලගේ මත ප්‍රිය කරන්නේ ද?

වෙන ද ඒ තරම් උනන්දුවක් ගෙන නුදුන් නමුත් කම්මැලිකම මග හරවා ගනු පිණිස මම මෙදින ගුණපාලගේ සියලුම ලියුම් නැවතත් කියවා බැලීමි. කලින් කිසි දවසක නොදුටු හරයක් ඔහුගේ ලියවිලිවල ඇති බවක් මට පෙනී ගියේ ය.

ගුණපාල මට අන්තිමට ලියා තිබුණේ දෙ මසකට පමණ කලිනි. ඒ නිමල් හා පද්මිනී විවාහ වන බව ආරංචි වූ අලුත මා දැඩි නො සන්සුන් සිතින් ගත කළ කාලය යි. ලැබුණු අවස්ථාවේ ම මා විසින් කියවන්නට ඇතත් අන්තිම ලිපිය දෙ වන වර කියැවීමේ දී මට සිතුණේ අලුත් ම එකක් වශයෙනි. ලැබෙන තුමක් හෝ රක්ෂාවක් තෝරා ගැනීමට තමා දැන් සූදානම් බව ඔහු



එහි සඳහන් කර තිබිණි. ගුණපාල කලින් සිතාගෙන සිටියේ පුවත්පතක වැනි තැනක කෙලින් ම කලාවකට සම්බන්ධ රක්ෂාවක් ලබා ගැනීමට හෝ රක්ෂාව වශයෙන් ලේඛන කලාවේ නියුක්ත වීමට ය.

'හැඟීම් මත පමණක් ජීවත් විය නො හැකි ය. ලක්ෂ ගණන් දෙනා ජීවත්වීම සඳහා තමන් නොකැමැති දේ කරති. තමන් නො දන්නා දේ කරති. ඒ ලක්ෂ ගණනින් කෙනෙකු වීමට මම ද හිත හදා ගතිමි. අනෙක් බොහෝ දෙනාට නැති අදහස් උදහස් හා සිතුම් පැතුම් අපට තිබෙන බව සැබවි. එහෙත් අප ද ජීවත් විය යුත්තේ මිනිසුන් සමග මිනිසුන් විදියට ය. අනෙක් මිනිසුන්ට වඩා වෙනස් ය. අමුතු ය යන හැඟීමත් සමගම අපි පොදු ජන සමාජයෙන් ඉවත් වී තනි වෙමු. අපි පීඩා විඳින්නේ පොදු සමාජ ප්‍රශ්නයක විපාක නිසා බව ද ඇත්තකි. ඒ ප්‍රශ්නය විසඳීමට ප්‍රශ්නයෙන් පැන යෑමෙන් නුපුළුවන. පරිවර්තනයක් සඳහා පරිත්‍යාගය අවශ්‍ය වෙයි. දුක් කරදරවලට මුහුණ පා සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාව සමග අපගේ හැඟීම්වලට වහල් නො වී එකට ජීවත් වීම ම එක්තරා ප්‍රමාණයක පරිත්‍යාගයකැ' යි ඔහු ලියා තිබිණ.

ඊළඟට ගුණපාල මගේ සැප දුක් ගැනත් මතක් කළේ ය. 'බාධක ඉදිරියේ අපරාජිතව ජීවිතයට මුහුණ දීමේදී ඔබ තුළ ඇති ධෛර්යය ප්‍රශංසනීය' යි ගුණපාලගේ ලිපියේ අන්තිමට සඳහන් විය. මෙය අලුත් කතාවක් නො වුණු අතර මා ගැන ඔහු කරන වර්ණනාවට මා සුදුසු නැත යන හැඟීමක් මෙදින මට ඇති විය.

ලියුම් කියවා අවසානයේ මගේ පාළුව වැඩි වූ බවක් මට හැඟී ගියේ ය. පාළුවෙන් අත් මිදෙනු පිණිස ගුණපාලට ලිපියක් ලිවීමට මට සිතිණි. ලියන්නේ කුමක් ද යි අදහසක් නොවුණත් ඔහුගේ අන්තිම ලිපියට පිළිතුරු වශයෙන් යමක් ලිවීම යුතුකමකැ යි මම කල්පනා කළෙමි.

ගුණපාල සම්බන්ධ ව මා බොහෝ විට ක්‍රියා කර ඇත්තේ ආත්මාර්ථකාමී ලෙසිනි. මේ ආත්මාර්ථකාමීත්වය ඇතැම් අවස්ථාවක නපුරුකමක් තරමට දැඩි වූ බව මින් පෙර කිසි විටෙක මා සිතා නැත. තමා ලියන කියන දේවල් මා ලවා අගය

www.sinhalaelibrary.com

කරවා ගැනීමට ඔහු ආශා කළේ ය. එහෙත් ලියකියවිලි අගය කරන්නට යෑමේ දී ඔහුගේ හැඟීම් හා ගැටෙන්නට වෙතැ යි බියෙන් මම නිහඬවීමි.

රස්සාවක් කිරීමට ගුණපාල බැසගෙන ඇති තීරණය ගැන මම සතුට පළ කළෙමි. 'අනුලා ඔබේ කෙටි කතා හා රචනා කියවීමට ආශාවෙන් සිටිතැ' යි ඊළඟට බොරුවක් කී මම නැවත අපේ ගෙදර එන විට ලියා ඇති දේවල් ටිකක් ගෙන එන ලෙස ද ඉල්ලුවෙමි.

ගුණපාල මගේ ලිපියට පිළිතුරක් එව්වා නොවේ. ඊළඟ සෙනසුරාද ඔහු අපේ ගෙදර ආවේ ය. ඔහු ආවේ අනුලාට කියවීමට කෙටිකතා රැගෙන නොව හිස් අතිනි.

"ඔයා මම අර කිව්ව ඒව ගෙනාවෙ නැතෙ" යි මම උනන්දුවෙන් ඇසීමි.

මගේ බලාපොරොත්තු සුන් කරමින් - ඊටත් වඩා මා මවිත කරමින් - ගුණපාල සිනාසුණා මිස තමා ඒ තරම් අගය කරන රචනාවක් ගැන කතා කළේ වත් නැත.

ගුණපාලට තේ කෝප්පයක් පිළියෙළ කර දුන් අනුලා අපට කතා කරන්නට ඉඩ දී නිල්මිණිත් සමඟ ගේ පිටුපසට ගියා ය.

"ගුණපාල තවම පංති යනව ද?" මම ඇසීමි.

"ඔව්"

මම තවත් ප්‍රශ්න කීපයක් ඇසුවෙමි. ඔහු ඒ සියල්ලට කෙටි පිළිතුර බැගින් දුන්නේ ය. මේ වෙනද ගුණපාල නොවේ. ඔහු අද අමුතු ය. වෙන ද අවශ්‍ය වූයේ කොතැනකින් හෝ කුමන කරුණක් ගැන හෝ කතාවක් පටන් ගැනීම පමණ ය. ඉන්පසු ගුණපාල දිගට ම කතා කරගෙන ගියේ ය. මට තිබුණේ අහගෙන සිටීම පමණ ය.

"ගුණපාල අද ටිකක් අමුතුයි" මම අන්තිමට කෙළින් ම කීමි.

"ඔව්" කියා ඔහු මගේ මුහුණ බැලී ය.

ඒ ඇස් දුටු මම බිය වීමි. සියල්ල දනිතැ යි ඔහුගේ ඇස් කියයි. 'සියල්ල' යනු කුමක් ද යි මම නොදනිමි. මම බිම බලා ගතිමි.



"මම අද වැඩිපුර කතා කළේ නැ. එහෙනෙ? මම ආවෙම මා ගැන කතා නොකරන්න හිතාගෙන"

"ඒ ඇයි?"

"කුසුම්ගෙ ලියුම් නිසා."

මම අන්දුන්කුන්දුන් වී ඔහු දෙස බැලීමි. ලිපියේ අනුචිත දෙයක් - මා වරදවා තේරුම් ගැනීමට තුඩු දෙන කිසිවක් - ලියැවුණා ද?

"ලියුමෙ මොනවද තිබුණෙ විශේෂයක්?"

"ලියුමම විශේෂයක්!"

"ඇත්තමයි ගුණපාල මට මතක වත් නෑ මොනවද ඒකෙ ලිව්වෙ කියලවත්. විශේෂ දෙයක්." මම වුවමනාවටත් වඩා නොදන්නා ගතියක් පෙන්වා - එහෙත් ඔහුගේ කතාව නිසා සිතෙහි හට ගත් කැළඹීමක් ඇති ව - කීමි.

"එහෙම මුකුත් නෑ"

"අනේ මන් දන්නෙ නෑ මොනවද ගුණපාල කියන්නෙ කියල"

"වැරදි නම් කුසුම් මූණට කියන්න. අපි අතරෙ බොහොම පැහැදිලිකමක් තියෙන්න ඕනැ. මම මොන විදියකින්වත් කුසුම් වරදවා තේරුම් ගන්නෙ නෑ" ඔහු මොන විදියකින්වත් යන්න බර කර කීවේය. "............ මම කුසුම් තේරුම් අරගෙන ඉවරයි. ලියුමෙ තියෙන විශේෂකම මේකයි. කුසුම් මගෙ ලියුම්වලට උත්තර එවන්නෙ කලාතුරකින්. ලියුමක් පහුවුණොත් පහුවුණාමයි. මේ පාර මාසයකට දෙකකට උඩදී ආව ලියුමකට කුසුම් මතක් කරගෙන ඉඳල ම උත්තරයක් එව්ව"

"ඒ-කද? නෑ අනේ ලාච්චුව අවුස්සන කොට මට ඔයාගෙ ලියුම අහුවුණා. මම ඒ පාර හිතුව උත්තරයක්............"

"ඒ කුසුම් පාළුවෙ හිටිය වෙලාවක්? කරන්න වැඩක් නැතුව?"

පිළිතුරක් මග හැරිය නොහැකි ය. ඔහු මා දෙස තියුණු බැල්මක් හෙළාගෙන මගේ පිළිතුර ඉල්ලයි.

www.sinhalaelibrary.com

"ඔව්" යි තොල් මතුළ මම කෙළ ගිල්ලෙමි.

"කුසුම්ට මට වැඩිය හිතවත් අය නැති නිසා නොවෙයි. කුසුම්ගෙ හදවතට ළඟම අයට වඩා මගෙ එක්ක තියන හිතවත්කම අඩු නිසා - ඒ අය ඉදිරියෙ කියන්න බැරි සමහර දේවල් මට කියන්න කුසුම්ට පුළුවනි. මම හිතුව කුසුම්ට ඒ වගෙ මට කියා ගන්න මොකක් හරි ගැටළුවක් මතුවෙලා ඇති යි කියල. මට හිතුනා කුසුම්ට මොකක් හරි කරදරයක් වත් වෙලාද කියල අලුතින්............?"

'නෑ ගුණපාල ඔයා එක්ක හිතවත්කම අඩු නෑ' යි මවිසින් කියනු ලබනැයි ඔහු සිතන්නට ඇත. මම මෙහිදී ද ආත්මාර්ථකාමී වීමි.

"මට දැන් හිතෙනව මම ඔහොම හිතාගෙන තමයි ගුණපාලට ලියුම ලියල තියෙන්නෙ. බොරු කියන්න ඕනෑ යැ? එවෙල නම් සහතිකයි මටම හිතුනෙ නෑ ඒකද මම ලිව්වෙ කියල. දැන් බලන කොට ඇත්ත ඒකයි. ඔයා කියන එක හරි මට ප්‍රශ්නයත් කියනව."

"මට කෙළින් ම කියන්නත් අමාරුයි?"

"දැන් පුළුවනි! අද පුළුවනි. ඇත්ත කියන්නම්. ගුණපාල මම වරදවා තේරුම් ගන්නවට මම කවදත් ටිකක් බයවුණා. අද මට ගුණපාල ගැන එහෙම බයක් නෑ. මට දැන් තේරෙනව සහෝදරියක් විදියට.............."

"සහෝදරියක් විදියට මිසක් වෙන විදියක කුසුම් ගැන මගෙ හැසිරීමක් කවදවත් පෙනුණද?"

මම "නෑ" යි තොල් මතුළෙමි.

මා කී දෙය නෑසුණු ලෙසින් ඔහු මා දෙස තියුණු බැල්මක් හෙළීය. එකිනෙකා වෙත යොමා ගත් බැල්මෙන් යුතු ව ගත වූ මේ තත්පර කීපය ඇතුළත 'අවංක කවුද' යන අභියෝගය අපේ ඇස්වලින් එකිනෙකා වෙත එල්ල විය.

අභියෝගය මග හැර අපි දෙ දෙනා ම බිම බලා ගතිමු.

"කියන්න ගුණපාල. කරුණාකරලා කියන්න මම මොකක්ද කරන්නෙ කියල." මම බැගෑපත් හඬින් කීමි. මගේ දෙ නෙත්



කඳුළෙන් තෙමීගෙන ආවත් ඒ බව ඔහුගෙන් වසං කිරීමට මම උත්සාහ නො ගත්තෙමි. "ඔයාටත් තාංගිල ඉන්නව. නමුත් මම දන්නව ගුණපාලට තේරුම් ගන්න ලේසි නෑ. ගුණපාලගෙ සහෝදරියන්ට මට තියන ප්‍රශ්න නෑ. මගෙ............."

"කුසුම්ගෙ අමාරුකම් තරමක් මම දන්නව"

"ඔව් තරමක් දන්නව. ගොඩාක් දේවල් දන්නෙ නෑ............." මම කතාව තත්පර කීපයකට නතර කර සුසුමක් හෙළීමි. අනතුරුව මගේ ස්වරය වෙනස් වන්නට ඇත. "............ ගුණපාල දන්නව මම නිමල්ට ආලය කළා. රහසක් නොවි. ඒක නැති වුණා. ඔයා ඒ ටිකත් දන්නව. නමුත් මේව පටන් ගත්තෙ කොහොමද ඉවරයක් වුණේ කොහොමද කියල ගුණපාල දන්නෙ නෑ. මම අද කියන්නම් ගුණපාලට සේරම! සේරම කියන්නම් ගුණපාල............."

ඔව්! මම ගුණපාලට සියල්ල කීවෙමි. නිමල් හා ඇසුර පටන් ගත් තැන සිට අවසානය දක්වා. මුහුදු වෙරළේ දී ඔහු මා සිප ගත් සිද්ධිය හැර, සියල්ල ගුණපාලට කීවෙමි. රෝහණ, ඇල්බට් ඩ්‍රයිවර් උන්නැහේ, කමලාවතී හා තිස්ස ඇතුළු සියලු දෙනා සමග මගේ පැවැති බැඳීම් ද ඇතුළුව අපගේ ප්‍රේමයට සම්බන්ධ සියලු විස්තර ඔහුට කීවෙමි. පද්මිනී හා මා අතර පැවැති ඇසුරත් ඇය පිළිබඳ මා දැන සිටි තොරතුරුත් මේ කතාවට ඇතුළත් විය.

නිමල්ගේ විවාහයෙන් සියල්ල අවසාන ය යි මා සිතාගෙන සිටි නමුත් අතීතයෙන් උරුම වූ යම්කිසි බරක් තව දුරටත් මගේ සිතෙහි ඉතිරි වී තිබුණු බව මට පැහැදිලි ව ම අවබෝධ වූයේ පාපොච්චාරණයක මෙන් ගුණපාල ඉදිරියේ සියලු තොරතුරු හෙළි කිරීමේදී ඒ බරෙන් මා නිදහස් වන විට ය. ඒ නිසා නිමල් හා පද්මිනී පිළිබඳ කතාව ගුණපාලට කියා අවසාන වන විට මගේ සිතට දැඩි සැහැල්ලු ගතියක් දැනෙන්නට විය. විමුක්තියක් පිළිබඳ අසීමිත සහනයකින් මගේ සිත පිරිසිදු වී ගිය බවක් මට හැඟී ගියේ ය.

හරස් ප්‍රශ්න නැති ව ම මට සවන් දී සිටි ගුණපාල අවසානයේ වත් කතා කළේ නැත. ඔහු මා ගැන කුමක් සිතන්නේද, මා කළ ක්‍රියාවන් අනුමත කරන්නේ ද නැද්ද යි දැන ගැනීමේ ආශාවක් මට ඇති විය. ඔහුට විනාඩියක් දෙකක් කතා නැති ව සිටින්නට මම ඉඩ හැරියෙමි.

www.sinhalaelibrary.com

"ගුණපාල මොකද මේ ගැන කියන්නෙ?"

ඔහු සිනාසුණේ ය.

"කියන්න. හිතෙන දෙයක් කියන්න. මගෙ හිත රිදෙයි කියල හංගන්න එපා."

"කුසුම් හිතනවයි මම හැම දේකටම දේශපාලනය ඈඳ ගන්නව කියල. ඒ නිසා............"

"අනේ නෑ. දැන් මටත් හිතෙනව ගුණපාල කියන දේවල්වල ඇත්තක් තියනව කියල. මට ඕව තේරෙනවටම නෙවි"

"කුසුම්ගෙ පවුලයි හතුරුසිංහ පවුලයි එක කාලෙක ආර්ථික අතින් සමානත්වයෙන් එක තරමක තිබුණා. ටික කලකදී ඒ පවුල ආර්ථික අතින් - කලවැලියෙන් දියුණු වුණා. කුසුම්ට නිමල් අත් අරින්න සිද්ද වුණේ ඒකයි. පද්මිනිගෙයි කුසුම්ගෙයි වෙනස මොකක් ද? ධනය වත්පොහොසත්කම. ඕනෑ කරන්නෙ ප්‍රිය නම් ඔය දෙන්නට ප්‍රීතියෙන් ඉන්න නොතිබුණා ද? පංති භේදය තියන සමාජයෙ හැම දෙයක් ම බලන්නෙ සල්ලිවල වටිනාකම් උඩ."

"ඒක ඇත්ත. ඒ ටික නම් මටත් දැන් තේරෙනව."

"කුසුම්ට අද තියන ප්‍රශ්නය නිමල් නැතිවීමම නෙවි. ඇත්ත වශයෙන් කුසුම් සිය කැමැත්තෙන් එයා අත් හැරිය. කුසුම් විශ්ව විද්‍යාලයට ගියා නම් රස්සාවක් ලැබුණ නම් හිතාගෙන හිටිය විදියට ජීවත් වෙන්න ලැබුණ නම් කුසුම්ට ඒ වෙන්වීම මේ තරම් බලපාන්නෙ නෑ. කුසුම් ගෙ අම්මා, නංගී, අර බබා - ඒ ගොල්ලගෙ අනාගතය ගැන කුසුම්ට බයක් නැති නම් කුසුම්ට සැනසිල්ලෙ ඉන්න පුළුවනි."

"එහෙනම් මට වෙන මොකුත් ඕනෑ නෑ"

"කරන්න වැඩක් නැතුව හැමදම කාලෙ මර මර ඉන්න කොට ජීවිතය එපා වෙනව............."

"ඒක තමයි මට වෙලා තියෙන්නෙ. කල්පනා කරන කොට පිස්සු වැටෙනව ගුණපාල. අම්මට හැමදමත් පුළුවන් ද මේ



රස්සාව කරන්න? පුංචි නංගි ඉගෙන ගන්න කියල මට වගේම වෙයිද නැද්ද කවුද දන්නෙ............."

"අපිට තනියෙන් මේ ප්‍රශ්න විසඳන්න බෑ. පුද්ගලිකව අපි අපේ ප්‍රශ්න විසඳ ගත්තත් තව ලක්ෂ ගණනක් ඉන්නව අපේ දරුවො............."

ඊට දිය හැකි පිළිතුරක් මගේ සිතට නැගුණේ නැත.

එහෙත් කිසියම් බියකින් මගේ හදවත ක්ෂණිකව සසල වීමකට අසු විය. 'අපේ දරුවෝ' යනුවෙන් ගුණපාලගෙන් කියැවිණ. මගේ මනැසෙහි වහා ඇඳී ගියේ අනාගත නිල්මිණි ය. සෝමා එක මගකට වැටුණා ය. මම වෙනත් මගකට අවතීර්ණ වීමි. මේ දෙක ම අප සිතූ පැතූ ඒවා නොවේ. නිල්මිණිට වෙනත් මගක් නො තිබිය යුතු ද?

ගුණපාල මා දෙස බලා සිටී. තමා අත්හිමට කී කරුණු ගැන ඔහුගේ ඇස් මගේ මතය ඉල්ලයි. මා යමක් කිය යුතුව ඇත.

"රෝහණ ගැන ගුණපාල මොකද හිතන්නෙ?"

දෙවියනි! ඒ ප්‍රශ්නය ගුණපාලගෙන් ඇසුණේ ඇයි දැයි මම වහා පසුතැවිල්ලට පත්වීමි. එහෙත් ගුණපාල ඉතා සන්සුන් ව මා දෙස බලා සිනාසුණේ ය. ඔහුගේ සිනාව මට කළ සරදමක් ලෙස මට සිතිණි. සිනාව තුනී වෙමින ගියෙන් ඔහුගේ දෙ නෙත්හි අඳුරක් මතු විය. යළි මොහොතකින් ඒ අඳුර ඉවත් කර ගත් ගුණපාල.

"ඊළඟට කුසුම්ගෙ ජීවිතයට ඇතුළුවන පිරිමියා තමයි රෝහණ" යි කීය.

"මොනව හරියට කිව්වත් මම හිතන්නෙ නෑ ගුණපාල ඒකනම් හරියට කිව්ව කියල. එතනදි නම් පැරදුණා."

තමා නිවැරදි බවට තර්ක නොකර ගුණපාල කර බා ගත් කල මම තැති ගතිමි. මා ද එතැනින් නිහඬ විය යුතුව තිබිණි. එහෙත් අහල බලා "ලොකු අපලයක් තියනව" යි කී කල සැහීමකට පත් නොවී අපලය ගැන තව තවත් හාරා අසන කෙනකු මෙන් මට ද තවත් ප්‍රශ්න කිරීමේ කුතුලක් ඇති විය.

www.sinhalaelibrary.com

"රෝහණ මට කවදත් කරුණාවයි. එයාට මා ගැන ඕනෑකමක් තිබුණ නම් මුලින් මට දැන ගන්න තිබුණා. ඉස්සරත් එයා මට ගවුමකට හරි රෙදි කෑල්ලක් වත් දෙනව. ඒ නංගි කෙනකුට වගෙ. සෝමට වුණත් එයා ලියුම් ලියල තියනව. මට බැල්මකින්වත් එහෙම නෑ."

"මම ඕකට තර්ක කරන්න යන්න ඕනෑ නෑ- කුසුමට ළඟදීම දැනගන්න බැරි යෑ."



# 8

විවාහයෙන් සතියකට පමණ පසුව පිටත් ව ගිය නිමල් හා පද්මිනී ගත වූ අවුරුද්ද ඇතුළත දෙ තුන් වතාවකට වඩා 'සිසිල'ට නො පැමිණියහ. ඒ එක ද අවස්ථාවක දී වත් ඔව්හු ගෙදර රැයක් ගත නො කළහ. නිවාඩුවකට ආ නිමල් බිරිඳ කොළඹ ඇයගේ නිවසේ නතර කර දෙමාපියන් බලන්නට තනිව ම පැමිණි තවත් ගමන් කීපයක් ගැනත් මට දැන ගන්නට ලැබිණි.

ඇල්බට් ඩැයිවර උන්නැහේ හා කමලාවතී තිස්ස හා විජය ද සමඟ අනුරාධපුරයේ වන්දනාවටත් සමඟ ය යි රජරට සේවය කරන ලොකු පුතා බලන්නට එක් වරක් ගිය බවත් මම දනිමි. මේ කිසි පුවතකින් මගේ සිත කිසි විදියකින් හෝ සසල වූයේ නැත.

නිමල්ගේ විවාහය නිසා මා පත් වූ තත්ත්වයෙන් මිදෙන්නට ගුණපාල හා සමඟ ඇති වූ සාකච්ඡාවේ දී කෙළින් ම පිහිටක් ලැබුණා නොවේ. මගේ එක ද ප්‍රශ්නයකට හෝ විසඳුමක් ඔහුගෙන් ලැබුණේ නැත. එහෙත් ගුණපාල සමඟ කතා බස් කිරීමෙන් පසුව මගේ සිත පෙළමින් තිබුණු බරක් ඉවත් වී සැහැල්ලුවක් ලැබුණා පමණක් නොව ජීවිතය ගැන අලුත් අවබෝධයක් ලැබිණි. මේ අවබෝධය මා පත් වූ තත්ත්වය [illegible] ජීවිතයට මුහුණ දීමේ අලුත් ශක්තියක් ද මට ලබා දුන්නේ ය.

එයින් මම සන්සුන් වීමි.

www.sinhalaelibrary.com

මහා සමාජ පරිවර්තනයකින් පසුව පමණක් විමුක්තියක් ලැබෙනැයි ගුණපාල මෙන් මා ඒ තරම් විශ්වාස නොකළත් අපට සමාජය දෙස බලන කල මගේ ප්‍රශ්නය සුළු එකකැ යි සිතා ගැනීමට මම සමත් වීමි. නියමිත අරමුණක් හෝ ඉලක්කයක් හෝ නොවුණත් ජීවත් වීමේ පොදු ආශාවන් හා බලාපොරොත්තු සන්සුන් වූ මගේ සිතට ටිකින් ටික නැවත රිංගන්නට පටන් ගත්තේ ය.

මේ අතරතුර මගේ පුංචි ලෝකයේ වෙනස්කම් කීපයක් සිදු විය. නිල්මිණි පාසල් යන්නට පටන් ගත්තා ය. පාසල පුරුදු වීමෙන් පසුව උදේට අසල ගෙදරක ගුණවතී නම් ලොකු ළමයෙකු සමග යැවිය හැකි වුව ද දවාලට ඇය එක්කරගෙන එනු පිණිස යන්නට මට සිදු ව ඇත. අලුයම නිල්මිණි උගෙනුමට යවනු සඳහා සූදානම් කිරීමේදීත් දවාලට ඇය කැඳවාගෙන එන්නට යෑමේදීත් මම සතුටක් - අමුතු සතුටක් වින්දෙමි.

මේ අනුව මට සතියකට පස් දිනක් 'සිසිල' අසලින් යන්නට ද සිදු ව ඇත.

කලින් අම්මාගේ ප්‍රධාන වෙළෙඳ දිනය වූයේ ඉරිද ය. පෝය නිවාඩුව පටන් ගැනීමෙන් පසුව ඉරිද පොළ වෙනස් වූයෙන් අම්මා නිවාඩු දට ගෙදර නතර වූවා ය. ඒ අනුව දැන් ඇය සතියකට දින දෙක තුනකට වඩා වෙළෙඳාමේ යන්නේ නැත. මම බොහෝ පෝය දක අම්මා සිල් සමාදන්වීමට පෙළඹවීමි.

අනුලා තව තවත් වෙනස් වන්නට වූවා ය. ඇය හිතුවක්කාර වන්නට යන්නී දැයි වරෙක මා බිය වුණා තරම්. සිතුම් පැතුම් හා ගති ගුණ අතින් මේ වයසේ අපේ පරිසරයේ ගැහැනු ළමයකු තුළ දක්නට නැති තරම් ස්වාධීනකමක් ඇය වෙත ආරූඪ විය. මා මේ වර හිත හද ගෙන යථා තත්ත්වයට පත් වූයේ ගුණපාලගේ කතා බස් නිසා ය යි පුංචි නංගී සිතුවා ය. මා තුළ තවත් ධෛර්යයක් කරමින් කතා කිරීමේ දී ඇතැම් තැනක ඇය භාවිතා කළේ ගුණපාලගේ වචන ම ය. ඔහුගේ යෙදුම් ම ය.

"කොහොමද නංගී ඔය වචන ගුණපාලගෙන් අනුල ගත්තෙ?" යි මා අනුලාට සිනාසුණේ කිසිවක් අදහස් කරගෙන නොවේ.



එහෙත් ඒ වචන අසා ඇය පළ කළ සිනාව මා තුළ කුතුහලයක් ඇති කිරීමට හේතු විය.

මාස කීපයකට උඩ දී ගුණපාල මහා භාණ්ඩාගාරයේ ලිපිකාරකමක් ලබා ගත්තේ ය. ඉන් පසුව එක වරක් ද ඔහු අපේ ගෙදර ආවේ ය. මේ කිසි අවස්ථාවක මා හා ගුණපාල අතර වූ කතා බහකට අනුලා උවමනාවෙන් කන් දුන්නේ නැත. ඇත්ත වශයෙන් ම මුල් ම අවස්ථාවේ හැර ඔහු එන හැම දවසක ම ඇගේ ඇ නිල්මිණි ද සමග ඉවතට යමින් අපට නිදහසේ දොඩන්නට අවසරය ලබා දුන්නා ය. ඔහු විසින් මට එවන ලද දිග ලියුම් නම් නංගී ද කියෙව්වා ය.

"උඹලගෙ මොකක් හරි හොරයක් තියනව." මම සිනාසෙමින් කීමි.

"මොකක් ද?"

"ඒක තමයි මමත් අහන්නෙ?"

"මොකුත් නෑ අක්කෙ"

"මොකුත් නෑ අක්කෙ" යනු ඇය දිය යුතු ව තිබුණු නියම පිළිතුර නොවේ ය යි මට නිතැතට සිතිණි. කිසි ම හේතුවක් නැති ව මා තුළ සැකයක් ඉපදී ඇත. මේ ගැන සිත දුවන්නට වූයෙන් සිනාව මගේ මුහුණින් ඉවත් විය.

"ලොකු අක්ක තරහ වුණා ද?"

"මම මොටද කා එක්කවත් තරහ වෙන්නෙ? ඕනෑ කෙනෙකුට තියනව නෙ තම තමන් කැමැති විදිහකට තම තමන්ගෙ..............."

"එහෙම කියන්න එපා අක්කෙ"

මා තුළ එවර අනුලා ගැන අනුකම්පාවක් පහළ විය. ඇය ගැන සැකයක් සිතීම වැරදි ය. එහෙත් ඇයගේ ඊළඟ වචනවලින් ඒ හැඟීම සියල්ල ඉවත් වී සැකය වඩාත් බලවත් ව මතු විය.

"නෑ අක්කෙ දවසක් දෙකක් මට ගුණපාල අය්ය මුණ ගැහුණා. බස් එක පරක්කු වුණු දවසක අපිට ගොඩක් වෙලා කතා කර කර ඉන්නත ලැබුණා."

www.sinhalaelibrary.com

"මෙකි මේ ඔක්කොම හංගගෙන හිටිය. ඇහුවෙ නැතිනම් අද කියන්නෙනත් නෑ."

"මොනවද ඔක්කොම?"

"ආයෙත් අහනව. මමද දන්නෙ?"

"පව් අක්කෙ. පව්! මම ගැන මොනව හිතුවත් ඒ ළමය ගැන එහෙම මොකුත් හිතන එක හරි නෑ. මට වැඩිය හොඳට අපි ගුණපාල ගැන දන්නව."

සිතාමෙන් තොර ව පුංචි නංගී කතා කළේ දුක්බර හඬිනි. ඉක්මන්කමින් අවිනීත වුණා ද යි මම ශෝකයට පත් වීමි. අනුකම්පාව ආපසු පැමිණි නමුත් සැකය සිතින් ඉවත් ව ගියේ නැත. අනුලා හෝ ගුණපාල හෝ සැක සිතීමට හේතුවක් නැත. එහෙත් පාසලේ දී පිරිමි ළමයකු කරන සුළු කචටකමක් පවා ගෙදර අවුත් මට විස්තර ලෙස කියන පුංචි නංගී මා හොඳින් දන්නා මා නිසා ම හඳුනා ගත් ගුණපාල නගරයේ දී කීප වරක් මුණ ගැහුණු බවත් දවසක් බොහෝ වෙලා කතා කරන්නට පවා ලැබුණු බවත් මේ කතාවේදී හදිසියේ මතු වන තුරු මගෙන් රහසක් කොට තබා ගත්තේ ඇයි?

මා තුළ සහටත් ඇති වුණා පමණක් නොවේ. සහෝදරියක මෙන් ම යෙහෙළියක ද වශයෙන් සිටින අනුලා විසින් මා නොසලකා හරිනු ලැබූ බවට දුකක් සිත පිදවන්නට වන්නේ ය.

"මම එහෙම මොකුත් හිතුවෙ නෑ නංගියෙ............. ඒ වුණාට ඇයි ඔයා ඕක මට නොකිව්වෙ? හැම දෙයක් ම කියන එකා?"

"ලොකු අක්කත් එක්කල තරහට"

"මං උඹට මොනව කළාටද?"

"මට මොකුත් කළාට මම තරහ වෙන්නෙ නෑ. අපිව අරයගෙ මඟුල පහුවුණු අලුත කලකිරිල වගෙ බලාගත්තු අපේ බලාගෙන හිටිය. මම ඒකට තරහෙන් ඉන්න දවස්වලයි ගුණපාල මුණ ගැහුණේ. අද කියනව හෙට කියනව කියල ඉඳල පහුවුණු නිසා නොකියම හිටිය. ඇත්ත. මම දන්නව අක්කට නොකිව්ව එකට හිත රිදෙන්න ඇති. නමුත් ගුණපාල හරි වෙන පිරිමි



ළමයෙක් එක්කල හරි කතා කළ පළියට මා ගැන මොකුත් තරහක් හිතන්න එපා අක්කෙ"

ගුණපාල සමග හෝ වෙන පිරිමි ළමයෙක් සමග හෝ කතා කළ පළියට මම පුංචි නංගී සැක නොකරමි. මගේ ගැටළුව ඇය ඔහු හා කතාබස් කිරීම නොවේ. ඒ බව වසන් කිරීමයි. අනුලා මෙතෙක් මට සඟවන කිසිත් නොවිණැයි මම සිතාගෙන සිටියෙමි.

ගුණපාල, ජයසේකර, සිත්සිරි හා පද්මිනී ආදී එද පංතියේ එකට ඉගෙන ගත් මිතුරු මිතුරියන් ගැන සියලු තොරතුරු මා කී අන්දමින් අද අනුලා ඇයගේ පංතියේ මධුමතී, ඉන්දු, සුවිනීතා, ජගත් හා වසන්ත ආදී යහළු යෙහෙළියන් පිළිබඳ සියල්ල පමණක් නොව උපුල් හා වාණිජ අංශයේ සිරිමෙවන් නම් තවත් ළමයෙකු ද තමා ගැන පිළිබඳ සිතින් පසු වන බවත් මට නොවළහා කියා ඇත. ඉදින් ගුණපාල හමු වීම නොකීවේ මා කනස්සල්ලෙන් පසු වූ නිසා ඒ දිනවල ඇති කරගත් තරහක් උඩ ම ය යි මම කෙසේ විශ්වාස කරම් ද?

"මම ඔයා ගැන එහෙම තරහක් හිතුවෙ නෑ. නංගි ගැන මට බයක් නෑ" යි මා කීවේ ඇත්ත වශයෙන් මතුවෙමින ආ බියක් යට පත් කරනු පිණිස ය.

ජීවිතය ගැන අලුත් අවබෝධයකින් හා ධෛර්යයකින් යත්නිමත් වූ මම යම්කිසි කටයුත්තක නියුක්ත වීමට නැවතත් කල්පනා කළෙමි. මේ අන්දමේ ඒකාකාරී ලෙසින් වැඩකට නැති අන්දමින් තව දුරටත් කල් ගෙවන්නට වුණොත් කලකිරීම හා අසහනය ආපසු එන්නට ඉඩ ඇති බව අත්දැකීමෙන් මම දනිමි. එවැනි තත්ත්වයක් ගැන සිතන්නටත් මම බිය වෙමි.

කමලාවතීගේ ගෙදරට සැතපුම් බාගයකට පමණ එහා රෙදි වියන මධ්‍යස්ථානයක් තිබේ. ගමේ ගැහැනු ළමයි පිරිසක් අපේ නිවස ඉදිරිපස පාරෙන් එහි වැඩට යති. මා මිදුලේ සිටින ඇතැම් හවසක ගෙවල් බලා යන මේ දරියෝ මඟ නතර වී මා හා කතාවට වැටී මඳක් කල් ගෙවති. පසුව කම්මැළිකම් යන්නට හැම හවසක ම වාගේ මම ඔවුන් එන වේලාව බලා ඉතුරුවන් වැටිය අයිනට වී සිටින්නට වීමි. මේ අනුව රෙදි වියන්නට යන ළමයි

www.sinhalaelibrary.com

මා හා කුළුපග වූ හ. ඔව්හු සමහරෙක් තමා අත ඇති සිනමා පත්තරයක් හෝ නවකතා පොතක් හෝ මට කියවන්නට දෙති. ඔවුන් ළඟ වැඩිපුර තිබුණේ මාරක කතා පොත් ය. ඒවා කියවන පුරුද්දක් හෝ ආශාවක් හෝ නොතිබුණත් ඔවුන්ගේ සිත රිදෙතැයි මම දුන් දෙයක් ප්‍රතික්ෂේප නො කළෙමි.

මේ දරියනට තරමේ වත් රක්ෂාවක් මට නැත. එහෙත් ඔවුන් මා තුළ නිතර ඇති කළේ අනුකම්පාවකි. රෙදි වියන්නට යන ළමයින් සෙරෙප්පු සපත්තු පය ලෑවේ නැත. වැඩි දෙනා පාට සාය හා සාට හැට්ටය අඳිති. උඩ සාය දිග නිසා පහළින් හෝ ඉඟටිය හරියේ මැස්ම ලිහිණු තැනක් නිසා ඉහළින් හෝ හැම දෙනාගේ වාගේ ම යට සාය පෙනෙන තැනක් ඇත. මෙසේ කොතැනින් හෝ යට සාය පෙනෙන්නට ඇඳීම ඔවුන් අතර ප්‍රචලිත මෝස්තරයක් වුණා තරමි. සමහරෙක් සායත් හැට්ටයත් අතර අඟලක් පමණ ඉඩ තියන්නට අඳිති. ඔවුන් පියර දමන්නේ මුහුණේ අඩු වැඩි තැන් ඉතිරි වන පරිද්දෙනි.

මොව්හු දවසකට රුපියල් දෙකක් තුනක් උපයති. කෙළින් ම නැතත් ඔව්හු මටත් රෙදි වියන්නට යන්නට කතා කළහ. ජ්‍යෙෂ්ඨය සමත් කිසිවෙක් තවමත් අපේ ගමේ රෙදි වියන්නට නොයති. එහෙත් මේ අදහස ගැන මම සිතන්නට වීමි.

කෙතරම් ඇබෑර්තු තිබුණත දත හැඳුනුම්කමක් හෝ බලපෑමක් හෝ නැති ව රැකියාවක් ලබා ගත නොහැකි ය යන්නත් අත්දැකීමෙන් ම මා බැස ගත් තවත් නිගමනයකි. ඉල්ලුම් පත්වලට මුද්දර ද යමක් කමක් කළ හැකි ය යි සිතෙන තිප දෙනකු හමු වීමට එළවළු, කිරිබුට්ටි, අන්නාසි ආදී කද මලු හා තවත් එවැනි නොයෙක් තෑගිබෝග ද වෙනුවෙන් අම්මා මහන්සියෙන් උපයා ගත් මුදල් අපතේ වියදම් වුණා පමණි. මේ ගැන සිතන කල පිස්සු වැටෙයි.

ගෙදරට වී නිවි එතීම මදි පුංචිකමක් ලෙස නො සැලකුවත් විශ්ව විද්‍යාලයයට ඇතුළු වීම වරක් ජීවිතයේ මුල් අරමුණ කොටගෙන සිටි මම, මඟ මඟ බැස රෙදි වියන්නට යෑම ගැන සිත එකලස් කර ගැනමට අසමත් වීමි.



සෑහෙන රක්ෂාවක් සොයා ගැනීම පහසු නොවේ. පාසලෙන් අස් වී අවුරුදු දෙකක් පමණ කාලයක් තිස්සේ රක්ෂාවක් සොයා ගැනීමට ගත් උත්සාහයත් ව්‍යර්ථ වී ගිය අන්දම ගැන සිතන කල කවද බලාපොරොත්තු ඉටුවේ ද යි කිය නොහැකි ය. ගුණපාලගේ සමහර කියමන් හා අදහස් අනුව ද බොහෝ දුර කල්පනා කළ මම අඩු තරමින් වඩා හොඳ අන් කිසි තැනක් ලැබෙන තුරු හෝ රෙදි වියන්නට යා යුතු ය යි සිත හද ගතිමි. මුලින් ම මම මේ ගැන පුංචි නංගීට කීවෙමි. එය ඇය බලාපොරොත්තු නොවූ යෝජනාවක් විය.

"නංගි මොකද කියන්නෙ?"

"අම්ම නම් කැමැති වෙන්නෙ නෑ."

"අම්මට කියල බලනව. මොකක්ද දෙයියනේ ඕක ලැජ්ජාවක්යැ? ඔය ඕන තරම් යන්නෙ."

නංගී හිස් සිනාවක් පෑවා ය.

"නංගි කැමැති නැද්ද?"

"මම කියන්නෙ පහත් රක්ෂාවක් කියල නෙවි අක්කෙ. මම නම් යන්නෙ මට නම් යන්න තියෙන්නෙ පාර අතු ගාන්න වුණත් මට කමක් නෑ. ඒ වුණාට අක්ක ඔහොම එකකට යනව කිව්වම............ මට මොකක් ද වගෙ."

"කමක් නෑ නංගියෙ. කීයක් හරි හම්බවෙනව නෙ. ඔය හොඳ රක්ෂාවල් ලැබෙන කල් මදයි අවුරුදු දෙකකටත් වැඩිය හිටිය. ඕව හරි යන වැඩ නෙවි."

"ඒක නම් එහෙම තමයි"

"ඇරත් වැඩක් නැතුව ගෙදර ඉන්නව කියන එකත් හරි අමාරුයි නංගියෙ. මහ වදයක්."

"ඒක නම් ඇත්ත තමයි............ මම දන්නෙ නෑ අක්කට හොඳ විදිහක්."

නැමැත්තක් කෙළින් ම නොවුණත් දැඩි විරුද්ධත්වයක් නංගීගෙන් නො දක්වුණෙන් මම ඊළඟට අම්මා සමඟ කතා කළෙමි.

"නරකද තව ටිකක් බලුවොත්? නමට රස්සාවකටය කියල පාරෙ බැහැල යන්න පුළුවන් එකක්? පඩිය කොහොම වුණත්" ය යි අම්මා අසරණ ලෙසින් කීවා ය.

"මොකක් හරි හොඳ එකක් ලැබෙන කල් තමයි අම්මෙ. අර පාළුවට ගෙදර ඉන්න බැරි නිසා."

"ජේස්සෙට පාස් කරල ගෙදර ඉන්නවය කියන එක එකක්. කටයුත්තක් කෙරෙන දවසක වුණත් රෙදි ඉස්කෝලෙ යනවයි කිව්වම ඒ තරම්..............."

"කටයුතු පස්සෙ බැරියැ අම්මෙ. ඒවට තව කල් තියෙන්නෙ."

"උඹ ගෙදර නාකි වෙන්නයැ?"

"ලොකු අක්ක වැඩියත් ම අම්මෙ ගෙදර කම්මැලිකමේ ඉන්න බැරි නිසා"

"පොඩි එකිත් ඉස්කෝලෙ ගියාම මට ගෙදර ඉන්න තවත් පාළුයි අම්මෙ"

"මම දන්නෙ නෑ උඹෙ කැමැත්තක්. තව ටික කාලයක් බලන්න පුළුවන් නම්..........."

"අම්මා කැමැති නෑ අක්කෙ" පුංචි නංගී මගේ කනට කොඳුලා ය.

"මන්න ඔහෙ එහෙනම් තව ටික කලක් ඉන්නව මය හිටිය වගෙ. මොකක් ම හරි හරි හොයාකෑ" යි මා කීවේ මගේ අන්තිම වචනවලට බලාපොරොත්තුව පිළිබඳ හඬක් බලෙන් රිංගවමිනි.

මා රෙදි වියන්නට යා යුතු ය යි සිතා ගත්තේ ඒ තරම් කැමැත්තකින් හෝ ආශාවකින් හෝ නොවුණත් ඒ අදහස වෙනස් කරන්නට වුණු කල ඇති වූ බලාපොරොත්තු සුන් වීම රක්ෂාවේ තරමට වඩා බෙහෙවින් විශාල විය. එහෙත් මම කලකිරීමේ තත්ත්වයකට වහා පත් නොවීමි. ඊට හේතු වූයේ පුර කරුණකි.

සතියේ දවස් පහේ ම 'සිසිල' පසු කරන්නට වූ බව කලින් මම කීවෙමි. දනට ගෙදර නතර වී සිටින්නේ මව් පිය දෙ



දෙනාත් බාල පුතාත් පමණි. මේ හැර වැඩපළට මෙහෙකාර කාන්තාවක් වූවා ය. මේ දිනවල සිටින්නී නිමල් විසින් එවන ලද්දියකි.

තිස්ස උදෙන් ම පාසල් යයි. සමහර දවසක වෙන ළමයකු සමඟ බයිසිකලයේ හෝ පයින් හෝ යන තිස්ස මිදුල අතුගාමින් සිටින මට මුණ ගැසෙයි. මම ඔහු දකිත්ම 'මල්ලියේ' යි කියමි. 'අක්කෙ එන්නම්' කියාගෙන ඔහු යයි. පයින් යතොත් දිගට කතා කරන්නට තිබුණත් නැතත් ඔහු මට ළං වූ කල නතර වෙයි. 'කියවන්න හෙම දෙයක් නැද්ද?' මම ඔහුගේ පොත් ගොඩට අත තබමි. තිබුණොත් ඔහු පොතක් දෙයි. නැත්නම් 'හවසට පොතක් එවන්නම් නංගි අත' යයි කියයි.

'විශේෂයි අද ඔලුව පීරලත් නෑ' 'සපත්තු දෙකේ හැටි. ගන්නට පස්සෙ පොලිෂ් කරල නෑ' 'ඔය ෂර්ට් එකේ බොත්තම් දාගෙන යන්නකො' ආදී යමක් මගෙන් නිත්‍ය වශයෙන් කියැවෙයි. මඳ දුරක් ගියාට පසුත් මම තිස්ස දෙස බලා සිටිමි.

ඇල්බට් ඩැයිවර උන්නැහේත් ලොකු පුතාගේ විවාහයෙන් පසුව විශ්‍රාම ගත් නමුත් පාළුව හා කම්මැලිකම නිසා දෝ රක්ෂාවට යන කාලයේදී මෙන් දිනපතා ම වාගේ උදෙන් ඈඳපැළැඳ නගරයට හෝ අන් බැහැරක හෝ යයි. කොයි වෙලේ බැලුවත් ඉස්සරහ පැත්තේ දොරවල් ද ජනෙල් ද වසා ඇත. ඉඳ හිට දවසක ඉස්තෝප්පුවේ තිබුණු එක ම පුටුවක හාන්සි වී පුවත් පතක් කියවන ඇල්බට් ඩැයිවර උන්නැහේ දක්නට ලැබේ. තවත් සමහර දවසක කමලාවතී වත්තේ ඇත පොල් පිත්තක් කරමින් හෝ පොල් ගසක් දෙස බලාගෙන හෝ ඇවිදිමින් හෝ සිටී.

'සිසිල' අසලින් යන්නට ලැබීමේ සතුටක් මට ඇත. සිසිවකු දක්නට ලැබේ ද යි කිසියම් සිතෙහි හට ගනී. මේ ගෙය දකින විට ඇති වන හැඟීම් වේදනාවක් වශයෙන් තේරුම් ගැනීමට මම අපොහොසත් වෙමි. කලක් 'සිසිල' මට මගේ ම ගෙදරක් විය. තවත් කලෙක මම එය මගේ ම සෙවණක් කර ගැනීමට හැකි වෙතැයි විසිතුරු සිහින දකිමින් සිටියෙමි. දන් පාළුවට ගොස් තිබෙන මේ ගෙයට එළියක් ලබා දී අසිරිමත් මන්දිරයක් කිරීමට පිනක්

www.sinhalaelibrary.com

වාසනාවක් මා වෙත විණැයි එද මම ඔහඳ වීමි. අද මට ඒ එකක් වත් නැත. කමලාවතී විසින් සිය දරුවන් වෙනුවෙන් ගොඩ නංවන ලද 'සිසිල' මට දෙවන ගෙදරක් වත් මගේ ම සෙවණක් වත් නොවේ. එහෙත් අධ්‍යක්ෂකාරයකුගෙන් බේරීමට පැන යන සිවුපාවකු නොදනුවත්ව ම අභය භූමියකට රිංගා රැකවරණය ලබන්නාක් මෙන් වේදනාව විසින් පුහුබඳිනු ලබන මගේ සිත තවමත් සමහර දවසෙක 'සිසිල' පිළිබඳ මතකයෙහි රිංගාගෙන රැකවරණ ලබයි. ඒ මතකයට නිමල් අයිති නැත. නිමල් හැර අන් සියල්ල!

තවත් සමහර අවස්ථාවෙක 'සිසිල' දකිමේ දී මා තුළ ඇති වන්නේ කෞතුක භාණ්ඩයක් දකිමේ හැඟීමට සමාන වූවකි. අපේ ගේ අබියස වරක් ශ්‍රී විභූතියෙන් වැජඹුණු 'සමරගිරි' ය අද මා තුළ දනවන්නේත් ඒ හැඟීම ම ද යි මම නොදනිමි.

එක් දවාලක මම නිල්මිණි කැඳවාගෙන එන්නට යන කල කමලාවතී පාරට ආවා ය. "මම මේ කුසුමෙ වෙල හරියෙදි ම දැකල ආවෙ."

"නැන්ද පේන්න වත් නෑ. මම කීප දවසක් ම බලබලා හිටියේ."

"කොහෙද උඹල නිකමටවත් ඇවිත් යනවයැ මේ පැත්තෙ" යි ඇයි කීවේ දුක්ගැනවිල්ලක හඬිනි.

කමලාවතී ගැන මගේ බැඳීම් දක් බොහෝ දුරට බුරුල් වී ඇතත් ඇය වෙනුවෙන් මා තුළ අනුකම්පාවක් ඇති විය.

"එන්න කිය කියා හිටියෙ නැන්දෙ, වෙලාවක් තිබුණෙත් නෑ."

"ආපහු යන කොට මේ පැත්තෙන් ඇවිත් පලයන් කො"

මට දන් ඇය වෙතින් බලාපොරොත්තු වන්නට දෙයක් නැත. එද දෙවොලක් ලෙසින් සලකන ලද 'සිසිල' වෙත ගොස් කරන්නට කන්නලව්වක් හෝ යාඥාවක් හෝ අද මා ළඟ ඉතිරි වී නො මැත. එහෙත් කමලාවතීගේ වචන මගේ සිත සසල කළේ ය. එතැන් සිට ඉදිරියට මා ගමන් කළේ කැළැඹුණු සිතිනි.



දිගු කලක් වෙළෙඳාමේ නියුක්ත ව සිටි කමලාවතී ගමේ බොහෝ දෙනකු හා ඈසුරට පත් ව සිටි කාන්තාවකි. එහෙත් දන් ඇයගේ ගෙදරට යන්නේ කලාතුරකින් ටික දෙනකු පමණි. ඇයගේ පවුල හා සම තත්ත්වයේ සිට ඉහළ යෑමේ තරගයෙන් පරාද වූ අය දන් ඇයට ඊර්ෂ්‍යා කරති. අනෙක් අතට ඊට වඩා ඉහළින් සිටි ටික දෙනා දන් මේ පවුල තමන්ට අත පොවන සීමාවක් පන්නා දියුණු වී සිටීම ගැන ඊර්ෂ්‍යාව කරති. රන් රිදී අබරණ හෝ පොල් ගස් කීපයක් හෝ උගස් කර ණයට මුදලක් ගැනීමට තවමත් ඉඳහිට කමලාවතී වෙත යන ගැමි ගැහැනුන් කියන්නේ දන් ඇය ආඩම්බර බවකි.

මේ හැර ඉඳ හිට හෝ 'සිසිල' ට යන්නේ පුතුන්ගේ මිතුරු පිරිමි ළමයි ය. ඔවුන් හා කතා බහට වැටෙන හේතුවක් කමලාවතීට නැත.

තවද කමලාවතී වැඩට මිස නිකම් සිටින්නට උපන් කාන්තාවක් ද නොවූවා ය. ගේ දෙර අතුපතු ගැමත් වතුපිටි බලා ගැනීමත් හැර ඇයට දන් කරන්නට වැඩක් ද නැත. මේ නිසා ඇය දැඩි පාළුවකින් පසු වුණා විය හැකි ය. එසේ නැතහොත් ඇයට මා ලවා කරවා ගත යුතු යම්කිසි කටයුත්තක් තිබුණා විය හැකි ය. කොහොම වුණත් නිල්මිණිත් සමඟ ආපසු යන අතර මා 'සිසිල' ට ගොඩ වුණේ නොමැඩුණු කුහුලක් ද ඇතිව ය.

"ගේ පාළුවට ගිහිල්ල" පිටු පසින් ඉස්තෝප්පුවට ගොඩ වෙමින් මම කීමි. මා තුළ ශෝකයක් ඇති විය. මින් ඉහත මා මෙහි ගිය අන්තිම වතාව නිමල්ගේ මඟුල් ද ය. එදත් අදත් අතර ඇත්තේ ගෙවල් දෙකක වෙනසකි.

කැවිලි පෙවිලි දවසේත් අනතුරුව උත්සව දවසේත් යම්කිසි විශේෂයක් විය. ඒ හැරුණු විට අද මගේ ගමන බොහෝ දුරට සම්බන්ධ කළ හැක්කේ ඈසුර අත් හරින්නට කලින් නිතර ආ ගිය ගමන් බිමන් සමඟ ය.

"දවල් දවසෙ මනුස්සයෙක් නෑ කුසුමෙ. පාළු නැද්ද?"

"මාමත් නෑ නේද?"

www.sinhalaelibrary.com

"කොහෙද ඩැයිවර උන්නැහෙත් යනව හරියට රස්සාවට යන ගණනයි. කරුවලේ එන්නෙ. වාඩි වෙයන් කුසුමෙ"

"මම වෙන වෙලාවක එන්නම් නැන්දෙ. පොඩි එකීට බඩගිනි ඇති.............."

"ඉතින් බං ඒකීට බත් ටිකක් දෙන්න බැරියැ."

නිල්මිණී මගේ මුහුණ බැලුවා ය.

"පොඩි එකීට කන්න මොකුත් තියනවද මම දන්නෙ නෑ.............." යි කියාගෙන ඈ කුස්සියට ඇතුළු වුණා ය. ".............. අපි දුන් ඔය මොනව හරි රත්කර ගන්නව කුසුමෙ. දවාලට ජේනුයි මමයි විතරයි නෙ." ඇය කියනු මට ඇසිණි.

මම බරාදයේ සිට වට පිට බැලීමි. පාළුව තුළින් සංවේගයක් හා අස්වැල් බැඳගෙන අතීතය මගේ සිතට හිමින් හිමින් පිය නගන්නට විය. ඒ අතීතය විශේෂ සිද්ධියක් පිළිබඳ මුහුණුවරක් නොව යථාභියාව පිළිබඳ පොදු හැඟීමකි. මේ හැඟීම ජීවිතයේ එක්තරා ඈත දවසක විඳ පුරුදු ව තිබී දුන් හදිසියේ දුනෙන සුවඳකට සමාන ය.

මම කුස්සිය දෙසට ඇදී උළුවස්සට හේත්තු වීමි. නිල්මිණී ඒ අනුව ඇවිත් මගේ දෙපා බඳ ගත්තා ය.

මල් සහිත බෙලෙක් පිඟානකට බත් බෙදූ අතින් ගෙන සිටි කමලාවතී,

"අල තියෙනව, මෑ කරල් හොඳ නැතුව ඇති පොඩි එකීට" යි කීවා ය.

"කමක් නෑ නැන්දෙ. මම ඔය ගුණාගුණ බලන්නෙ නෑ. ඕනෑ එකක් දෙනව."

"එහෙම තමයි බං හදන්න ඕනෑ. කවන්නත් ඕනැද?"

"නෑ මෙයා පැහිල." මම දූරියගේ හිස අතගාමින් කීමි. දිව දික්කරගෙන මා දෙස බැලූ ඈ ඇඹරුණා ය.

"අපොයි ලැජ්ජාව." මම ඇයගේ නිකට මිරිකීමි.

"වරෙන් දුවේ. වරෙන් මෙන්න පුංචි පුටුවකුත් තියනව."



"අපි අත සෝදගෙන ඉඳිමු දුවේ."

බංකු පුටුව බරාදයේ තැබූ මම එහි නිල්මිණී වාඩි කරවා පිඟාන උකුළ මත තැබීමි. මා දෙසත් කමලාවතී දෙසත් මාරුවෙන් මාරුවට බලා ලජ්ජාවෙන් සිනාසුණු ඇයට,

"කන්න ඉතින් මුකුළු නැතුව" යි මම කීමි.

කමලාවතී මවකගේ ඇසින් මඳ වේලාවක් දූරිය දෙස බලා සිටියා ය. ඒ ඇසෙහි සෙනෙහසක් විය.

"සැකසුරුවමට කනව. අහක දන්නෙ නෙමෙ නෑ. වරෙන් කුසුමෙ වාඩිවෙයන්."

කමලාවතී ලොයි බංකුවේ අසුන් ගත්තා ය.

"කෝ අර ගෙදර වැඩට ඉන්නව නේද අම්මෙක්" ය යි මම වට පිට බලා වාඩිවෙමින් කීමි.

"අම්මෙක් නෙවෙයි කුසුමෙ දුවෙක්! වයස හතළිස් පහක් විතර ඇති. තවම ළමිස්සියෙක් කියල හිතේ. මන්න ඔගේ නාන්න යියා. දුන් සුවඳ ගගහ එයි. දෙළහට කලින් නාන්න ඕනෑ. හවසට නින්දක් නිදගන්න ඕනෑ. රුපියල් හතළිස් පහක් දෙනව. කරන්නෙ උයන එක විතරයි."

"එහෙම තමයි සමහරෙක්."

"ගෑනියෙක් වුණාම එහෙම පුළුවන් ද කුසුමෙ? ලොකු පුතා එවල තියෙනව. පඩි දෙන්නෙත් එයා. කාගෙත් ගියත් පිං පඩි. එයාගෙ වදේට මම ඔය ගෑනි නවත්තගෙන ඉන්නෙ. මට පුළුවනි ඔය සේරම වැඩ ටික කරගන්න. ගෑනියෙක් නැතුවට."

"නැන්ද දුන් මහන්සි වෙන්න ඕනෑ නෑ."

"මොකක්ද කුසුමෙ මාන්සියක්. මට මේ නිකම් ඉන්න එක නින්දුවක් වගෙ. හිරේ දල වගෙ."

මම සිනාසුණෙමි.

"මන්න බලපන් කුසුමෙ ඔය ගෑනිගෙ හැටි. දවාලට ඉන්නෙ මායි ඒ ගෑනියි විතරයි. දවාලට පිරිමියෙක් නැති ගෙදර මිදෑ

www.sinhalaelibrary.com

දෙකක් උයා ගත්තම? ඒ ගැනිට ඒක මදි. කෑම හොඳ නෑ කියල ඔය යන්න කිය කියා නාහෙන් අඬනව. යතොත් ගියදෙන්. මම අල්ලල තවත්ත ගන්නෙ නෑ..............."

"ඇයි මහතුන් මල්ලි?"

"ඉඳල හිටල එනව. සෙල්ලම් කරල හරි පාඩම් කරල හරි ඊවෙන කල් ඉස්කෝලෙ ඉඳල ඒ ළමය එන්නෙත් කරුවලේ. උන්ටත් පාළුයි. කොල්ලො නෙ කුසුමෙ?"

"ඒ වුණාට නැත්ද මෙහෙ තනියෙම දූල එහෙම හොඳයැ?"

"ඊටත් වඩා හැන්දෑ වෙන කොට ඉතින් ඇතැට පේන කල් බයයි කුසුමෙ. කොහේ ගියාද කියල. කාණ්ඩවලට වැටිල එහෙම හරක් වෙනවට නෙවි. මහතුන් හොඳයි. ඒ වුණාට ඉතින් ඊ වෙනකොට මට බය යි."

"මල්ලිට මම කියන්නම්"

"උඹ කියපන්. උඹ කිව්වොත් අහයි. මහතුන් උඹට ආදරෙයි."

කලින් වූ වේදනාව පහව ගොස් ඇයගේ දෙනෙත් කරුණාවෙන් මෙන් ම බලාපොරොත්තුවකින් ද දිප්තිමත් විය.

නිල්මිණී බත් කා අවසන් වූ කල කමලාවතී ඇගේ ඇතුළට ගියා ය. පිටු පසින් සාලය වෙත ඇතුළු වන දෙර වෙත ගිය මම එබී බැලීමි. දෙර ජනෙල් වසා තිබුණෙන් අඳුරකින් ද යුත් සාලය වඩාත් පාළු ය. අඳුරත් පාළුවත් මදිවට සැටිය සාරි රෙදිවලින් ද වඩා තිබිණි. සාරි රෙදිවලින් පොරවන ලද සැටිය මට පෙනුණේ අසුබ ලකුණක් මෙනි.

පද්මිනීගේ ඡායාරූපය මා දුටුවේ නැත. ඔවුන්ගේ මඟුල් පින්තූරයක් හෝ කොහේ හෝ තැනක හෝ තිබෙන්නට පුළුවන. මම අඩියක් දෙකක් පස්සට වීමි.

"ඉඳා දූවේ කාපන්" ආපසු පැමිණි කමලාවතී නිල්මිණී අත ටොපියක් තැබුවා ය.

"ඉඳා උඹට තුණු බිස්කට්." ය යි කුඩා දවස මට ඇය කී වචන් ලොසින්ජර දී ඇද්ද?



"මේ දෙරවල් වත් ටිකක් ඇරල දන්නකො නැත්දෙ හුළං ටිකක් වත් එන්න."

"මට ඒතරම් වත් හිතක් නෑ කුසුමෙ." දුක් බර උදසීන හඬකින් කියැවුණු ඒ වචන කීපය දිග කතාවක සංදෙශනයක් හෝ සාරාංශයක් හෝ විය යුතු බව මට වහා වැටහිණි. ආත්මාර්ථකාමී ජයග්‍රාහී හැඟීමකින් තුහුල මැඩගත් මම නිහඬ වීමි. ඇය අනුව මම ද ආපසු ලොවී බංකුව වෙත ආවෙමි. ටොපිය කටේ ද ගත් නිල්මිණී පාට කඩදසි කැබෙල්ල කුලුණකට තබා රැළි යන ලෙස ඇඟිලිවලින් පිරිමදින්නට වූවා ය.

"අර ඩැයිවර උන්නැහේ කියන්න වගෙ ගෑනු ළමයෙක් නැති ගෙදර එළියක් නෑ. අපිට ඉතින් ඔච්චර තමයි. කොල්ලො නිතරම ඊට. ගෙවල් නැදුව. දෙරවල් වහගෙන පිළිකන්නට වෙලා පාළුවෙ ඉන්නව............... දූවේ වාඩි වෙයන්"

අපේ අම්මාගේ මුහුණේ මෙන් ම කමලාවතීගේ මුහුණේ ද හැඟීමක සටහනක් නැගෙන්නේ කලාතුරකිනි. ඔවුන් දෙ දෙනා කතා කරන කල සිතෙහි තුමක් පවතී ද යි තේරුම් ගත හැකි වන්නේ මුහුණ බැලීමෙන් නොව කතා කරන ඒ වචන අපගේ හදවතෙහි වැදී අපට දනෙන දෙංකාරය අවබෝධ කර ගැනීමෙනි.

අම්මා හා කමලාවතී අතර දිගු කලක් තිස්සේ පවතින දුඩි බැඳීමේ හා ලෙන්ගතුකමේ පදනමත් රහසක් වූයේ ඔවුන් වෙත ඇති මේ සමානකම ද යි මම නො දනිමි.

මෙදින කමලාවතී 'දූවේ' ය යි මා ඇමතූ මුල් වතාව ද මෙය යි. අවස්ථා දෙකක දී ඇය මට එලෙසින් කතා කරයි. එකක් මගෙන් යම්කිසි වැඩක් ගැනීමට වුවමනා වූ විට ය. අද ඒ වුවමනාව ඇය වෙත නොවේ. අනෙක සතුටක දී හෝ දුකක දී හෝ ශෝකයක දී හෝ විපතක දී තමාගේ හදවත මගේ හදවත කරා සමීප කර ගැනීමට වුවමනා වූ විට ය. කමලාවතීට සතුටක් ලැබෙන ගැන රසවත් තොරතුරක් මගේ කණට කොඳුරා කියන්නට තිබෙතැයි මේ මොහොතේ මම විශ්වාස නොකරමි.

"වාඩිවෙයන් කුසුමෙ" [illegible]

www.sinhalaelibrary.com

"මෙයා බත් කාල ටිකක් නිදා ගන්නව." නිල්මිණි දෙස බලා මම කීමි.

"ඉතින් නිදා ගන්න බැරියෑ. මේ ඉඩ තියෙන්නෙ"

"නංගිත් තව ටිකකින් එයි. මම ගිහිල්ල එන්නම් නැන්දෙ?"

කමලාවතී මා දෙස බැලුවා ය.

"කුසුමෙ මේ උඹද?" යි මා හඳුනා ගැනීමෙ උත්සාහයක් ඇයගේ බැල්මේ විණැයි මට සිතිණි. එහෙත් මගේ සිත මොලොක් වූයේ නැත.

"බත් ටිකක් කාල පලයන්"

"ගෙදර උයල නැන්දෙ මම ආවෙ."

"මම නෑ කිව්වයෑ? බත් කන්න ඒ තරම් දවල් වුණේ නැති හින්දයි මම කතා නො කළෙ. වරෙන් කුසුමෙ. වරෙන් බත් ටිකක් කාපන්." ය යි නැගිටිමින් ඈ කීවා ය.

"කරදර වෙන්න එපා නැන්දෙ. මම වෙන වෙලාවක එන්නම්"

නිල්මිණි ටොපි කොළය පුටුවක් උඩ තිබුණු හෝඩි පොත ඇතුළට දමාගෙන පොතක් ගල්ලැල්ලත් අතට ගත්තා ය.

"දුවේ උඹ ඉඳල පලයන්" කමලාවතී දියණියගේ උරහිසට අත තබා කීවා ය. ඈ මටත් ඉස්සර වී මිදුලට පැනගෙන, කමලාවතී තමා පසු පස එද්දයි දැන ගන්නට මෙන් හැරී බැලුවා ය.

"යන්නම් නැන්දෙ." යි කියමින් මම මිදුලට බැස්සෙමි.

"අපිට කෙල්ලෙක් බල බලා ඉන්න ඒ තරම්වත් වාසනාවක් නෑ."

'නැන්දෙ මම යන්න හැදුවෙ - වැරදිලා. මම නවතින්නම් නැන්දෙ' යි කෑ ගැසෙන්නට ගියා තරම්. මගේ ළය මහලු වේදනාවට පත් කරමින් උතුරන අනුකම්පාවක් හා දයාවක් හදිසියේ මතු විය. මා ප්‍රමාද වුණා වැඩියි. මට දැන් ආපසු නවතින්නට නුපුළුවන. මම හැරී බැලීමි. ඒ බව කමලාවතී දුටුවේ නැත. ඇයගේ ඇස් යොමුව තිබුණේ මට ඉස්සර වී පිය නගමින්



සිටි නිල්මිණි වෙත ය. තුනී සිනාවකින් නො වැසුණු දෙමිනසක් ඇයගේ මුහුණේ යම්තම් ඇඳී තිබිණි.

"මම හෙටත් එන්නම් නැන්දෙ"

"හෙට පෙර පෝය නෙ කුසුමෙ. හෙට ඉස්කෝලෙ නියනවයෑ?"

මගේ වේදනාව අලුත් විය. ගැහැනු දරුවකු නොමැති පවුලක එළියක් නැතැයි ඇල්බට් ඩැයිවර් උන්නැහේ නොයෙක් වර කියනු කුඩා දවස සිට ම මා අසා ඇතත් කමලාවතීගෙන් එවැන්නක් පිට වුණු පළමු වතාව මෙය යි. අහිමි වූ දුහිතෘ ලාභයක් ගැන කම්පාවට නොපත් ඈ පුතුන් දෙස බලා සැනසෙන්නට වැඩ කළා ය. කමලාවතී දුවක නොමැති වීම ගැන පමණක් නොව අහිමි වූ තවත් නොයෙක් සැප සම්පත් හා වරප්‍රසාද ගැන කම්පාවට පත් වූ - පසුබට වූ - කාන්තාවක් නොවුණා ය. අසවල් අසවල් දේ නැතැයි ඈ උදාසීන වුණා හෝ ඒ දෙයින් කැප්කිමත් වුණා හෝ නොවේ. මේ මේ දේ නැත. මේ මේ දේ ලබාගත යුතු ය යි ඇය එළිපිට කතා කළේ ද නැත. ආ උත්පත්තියෙන් හා පරිසරයෙන් නොලද එහෙත් ජීවිතයකට අවශ්‍ය ය යි සිතන ලද භෞතික හා ආධ්‍යාත්මික ජයග්‍රහණයන් ගණනාවක් දිනා ගත්තා ය. පවුලේ නියමුවා ලෙස ඈ තමාට ම විශේෂ වූ දර්ශනයක් ද තමා විසින් ම සනිටුහන් කොට ගත්තා ලද මගක් ද ඔස්සේ අරමුණු හා ඉලක්කයන් කරා දරුවන් ද සැමියා ද මෙහෙයවීමට කටයුතු කළා ය.

මේ ගමන කිසිසේත් පහසු එකක් නොවී ය. මත්පැනට ඇබ්බැහි වුණු බස් රියැදුරකු හා විවාහ වී පුංචි කඩකාරියක වශයෙන් පටන්ගෙන ප්‍රථම උපාධිධාරියා හා උසස් ම රජයේ නිලධාරියා ගමට හඳුන්වා දීම දක්වා ගිය මේ ගමනේ දී ඈ නොයෙකුත් කරදර, දුෂ්කරතා, හිරිහැර හා පරිභවයනට මුහුණ දුන්නා ය. ඈ ඒ කිසිවකින් පසුබට නොවුණා ය. ඇය කිසි ම අවස්ථාවක ජීවිතය ගැන කලකිරුණේ නැත. තමාගේ දරුවන් මේ තත්ත්වයට පත් කළ යුතු ය යි හැඟීමක් පැහැදිලි ව ඇය වෙත තිබුණා නොවේ. තමා ගොඩ නංවන්නට යන්නේ මෙවැනි ලෝකයකැයි ඇය වෙත කල්පියා සැලැස්මක් හෝ ආකෘතියක් හෝ අරගෙන

www.sinhalaelibrary.com

හෝ තිබුණා නොවේ. අන්තිමේ දී අධිෂ්ඨානයෙන් ද උත්සාහයෙන් හා නොපසුබට වීර්යයෙන් ද ගිය ඒ දුෂ්කර ගමන කෙළවර සිතන්නට වත් බැරි ලෝකයක් - විසිතුරු ලෝකයක් - ඇය අබියස බිහි විය. එහෙත් ඈ දැන් කලකිරී දෙම්හසින් පසු වන්නී ය. දුවක නොමැති වීම නිසා ගෙදර වසා ගත් අඳුර ඇයට පෙනෙයි. ලේලියක වෙතින් ඒ ආලෝකය ලබා ගන්නට ඇය බලා සිටින්නට ඇත. ගැහැනු ළමයකු නොමැති වීමෙන් පාඩුවක් නොවේ ය යි තබාගෙන තිබුණු බලාපොරොත්තු හා විශ්වාසය ලේලිය අතින් ඉටු නොවුණු නිසා ඇය දැන් තැවෙනු ඇත.

පවුලේ තවත් පුත්තු සිටිති. නව පුතුන් සිටියත් පවුලේ සිළුමිණ වැනි ලොකු පුතා අත ගන්නා මනාලිය ගැන ඇය නොයෙක් ලෙසින් සිතාගෙන සිටින්නට ඇත. ඒ බලාපොරොත්තු කෙතරම් විශාල වන්නට ඇද්ද යත් ඇය වෙත දැන් අනෙකකු ගැන අදහසක් නැති තරම් විය හැකි ය.

'දුවේ මට මගෙ දරුව බේරල දීපන්' ය යි වරක් කමලාවතී මගෙන් ඉල්ලීමක් කළා ය. මම ඒ ඉල්ලීම ඇයගේ පැතුම් පිරි ම ඉටු කළෙමි. එපමණක් නොවේ. වුවමනා නම් මට ඇයගෙන් ඒ ලොකු පුතා උදුරා ගැනීමේ ඉඩකඩ සම්පූර්ණයෙන් ම තිබිණි. ඒ සියල්ල ඈ දන්නී ය. යොවුන් සිතක පවතින ආදරයේ වේදනාව තේරුම් ගැනීමට ඇය අසමත් වුණා හෝ උත්සාහ නොකළා හෝ වෙන ම කරුණකි.

කමලාවතී නිමල්ට ආදරය කළා ය. මම ද නිමල්ට ආදරය කළෙමි. මම ද ඔහු වෙනුවෙන් පරිත්‍යාගයක් කළෙමි. අප දෙදෙනා වෙන වෙන ම කළ ආදරයේත් පරිත්‍යාගයේත් ප්‍රමාණය වෙනස් වන්නට ඇත. ඇය මවකට කළ හැකි ඉහළ ම මිම්මෙන් තම පුතාට ආදරය කළේ යම් සේ ද මම පෙම්වතියකට කළ හැකි ඉහළ ම මිම්මෙන් ඔහුට ආදරය කළෙමි. ඇය මවකට පමණක් කළ හැකි පරිත්‍යාගයක් පුතා වෙනුවෙන් කළේ යම් සේ ද මම පෙම්වතියකට පමණක් කළ හැකි ඉහළ ම පරිත්‍යාගය ඔහු වෙනුවෙන් කළෙමි. වන්දියක් වශයෙන් නොවුණත් තමා කළ ආදරයත් පරිත්‍යාගයත් වෙනුවෙන් ඔහුගෙන් ආපසු එළියක් ලබා ගැනීමේ ඉඩකඩ ඇයට තිබිණි. මා මගේ පරිත්‍යාගය කළේ ඒ තුළින් මගේ ජීවිතයට එළියක් ලබන ඉඩකඩ ඉතිරි කරගෙන හෝ



බලාපොරොත්තු තබාගෙන හෝ නොවේ. මා මගේ හදවත ආලෝකවත් කළ ප්‍රේමයේ පහන් සිළුව කටින් පිඹ දමා අන්ධකාරයේ නිමග්න වූයේ ඔහුට යහපතක් සලසන පරම පිවිසිදු චේතනාවකිනි.

කමලාවතී මේ සියල්ල දනී. එද නොදන සිටියත් ඈ අද දන්නවා විය යුතු ය. එද දන ගැනීමට වුවමනාවක් නොවුණා විය හැකි වුව ද අද ඇය මේ ගැන සිතනු විය යුතු ය. පරිත්‍යාගයෙන් වැඩක් නො වීමෙන් තමා ලබන පසුතැවිල්ල මටත් ඇතැයි ඇය සිතන්නට ඇත.

එපමණක් ද නොවේ.

'මට මගෙ දරුව බේරල දීපන්' ය යි එද ඇය මට කීවේ මා කෙරෙහි තබාගත් විශ්වාසයක් ඇතිව ය. මම ඒ විශ්වාසය පලුදු නොකර ආරක්ෂා කළෙමි. අදත් ඇය මා කෙරෙහි විශ්වාසය තබන්නට ඇත. තමාගේ හිතට වධ දෙන යම් කිසි වේදනාවක් හෙළි කර බරෙන් නිදහස් විය හැකි ය යි ඇය සිතන්නට ඇත.

'ඔහොම වාඩි වෙයන් දුවේ' ය යි ඇය කීවේ එහෙයිනි.

අද මම ඒ විශ්වාසය ආරක්ෂා නොකළෙමි. මම කුසුම් දැයි ඇයට පුදුම හිතෙන්නට ඇත. මා කුසුම් පමණක් නොව මා ගැහැනියක ද බව කමලාවතී අමතක කළා ය. නිල්මිණි අතින් අල්ලාගෙන ගෙදර එන මඟ දිගට මා කල්පනා කළේ කුසුම් අභිබවා ගැහැනිය මතු වූයේ ඇයි යනුවෙනි. මා කමලාවතීගෙන් පළිගත්තේ ඇයි?

අවස්ථාවක් ලද වහා කමලාවතී හමුවීමට යා යුතු ය යි මම අවසානයේ තීරණය කර ගතිමි. ඒ තීරණයට බැස ගත්තේ මා නමැති ගැහැනිය නොව මා නමැති කුසුම් ය. කමලාවතී නිසා නිමල් පරිත්‍යාග කළ දුප්පත් කුසුම් ය. කමලාවතී ගැන මෙන් ම ඒ කුසුම් ගැන ද උපන් අනුකම්පාවකින් මගේ ළය මඩල පිරිකී ගියේ ය.

'සිසිල' ට ගිය ගමන ගැන මම ගෙදර දී ද කතා කළෙමි.

"ඇයි මහ ලොකුවට ලේලි කෙනෙක් ඉන්නෙ? පාළුවෙ ඉන්න ඕනැ යැ?" යි අනුලා කීවා ය.

www.sinhalaelibrary.com

"මොනව කව්වත් අම්ම නෙ. ඔය සේරම කළේ නැන්දගෙ මහන්සියෙන්. ඒ ගොල්ලටත් වටිනව නිතර ඇවිදින් බලලවත් යන්න" යි මම කීමි.

අම්මා කිසිත් නොකීවා ය.

"මම ගියාම නැන්දට හරි සතුටුයි."

"යන්න එපා අක්කෙ. ඔය ආයිත් වැඩ ගන්න පුරුදු කර ගන්නයි එන්නෙ. එයාට කව්රු කළත් මදි අක්ක නැතුව. යන්න එපා."

"උඹට ඉවර කියන වෙලාවට පලයන් කුසුමෙ. මොකද වෙන්නෙ පුළුවන් නම් ගිහිල්ල වැඩක් පළක් කරල දුන්නහම? අම්ම කෙනෙක් වගෙ හිටිය ගෑනියෙක් නේද.............. උඹට කොහෙන්ද පුංචි එකියෙ ඔය තරම් දඩි හිතක් ආවෙ?"

"ගුණපාලගෙනි" මම නංගීගේ කණට කොඳුළෙමි.

"නිකං ඉන්න අක්කෙ කෝලම් නැතුව." යි අනුලා ගතා දැම්මා ය.

මම තවත් කීප දවසක් එහි ගියෙමි. කමලාවතී මුලින් දවසේ කියන්නට ගොස් මගෙන් අනුබලයක් නොලද නැත යටපත් වූ කතාව නැවත ඔහු කරනැයි මම හැම දිනක ම බලාගෙන සිටියෙමි. එහෙත් එවැන්නක් නොවී ය. මම බලාපොරොත්තු සුන් වූ ගතියකට හා පසුතැවිල්ලකට පත්වීමි. යටපත් වූ කතාව ඔහු නොකිරීමෙන් මට ඇයගෙන් වෙනස්කමක් වූ බවට ගතියක් මගේ සිතට දනෙන්නට විය. කෙසේ වුව ද ඇයගේ ආදර කරුණාවේ අඩුවක් නම් දක්නට නොවී ය. දවසක් ඇර දවසක් ගිය විටෙක දී වුව ද,

"ඇයි කුසුමෙ, උඹ මෙච්චර - දවසක් නාවෙ?" යි කියන තරමට ඈ මා එන තුරු බලාගෙන සිටියා ය.

ගුණවතී පාසල් නොගියෙන් එක උදයක මට තනිවම ඒ නිල්මිණ ගෙවට යන්නට සිදු විය. ආපසු එන අතර මම 'සිසිල' ට ගොඩ වීමි. එදා ඇල්බට් ඩැයිවර උන්නැහේත් ගෙදර සිටියේ ය. මා ඊට කලින් ඔහු ළඟකට දැක තිබුණේ අපේ ගෙට ගෙවදීම



අවස්ථාවේ ය. එදාට වඩා අද ඔහු අවුරුදු කීපයකින් වයසට ගොස් සිටියේ ය.

"අනේ අනේ දුවේ උඹල දකින්න කියන අමාරුවක්. වාඩි වෙයන් වාඩි වෙයන් හතර පස් පොළකින්" ය යි ඇල්බට් ඩැයිවර උන්නැහේ කීය.

"මම කීප දවසක්ම ආව. මාම නැහෙන කොයි වෙලාවකවත් ගෙදර"

"කම්මැලියි දුවේ. පාළුයි. මම ඕක දැනගෙනම නෙ ඒ කාලෙ උඹට කතා කළේ." යි කී ඇල්බට් ඩැයිවර උන්නැහේ හඬ නගා සිනාසුණේ ය. ඒ සිනාව ලෝකයේ කිසිම බරක් පතළක් නොදත් - නොහැකන - දරුවකුගේ මෙන් අහිංසක ය.

මගේ සිතට පෙත් ගතියක් දැනිණි.

"කම්මැලිකමත් පිරිමින්ට විතරයි කුසුමෙ. අපට නෑ. අපට පුළුවන් ඔහේ උඩ බලාගෙන පාළුවෙ ඉන්න." ය යි කමලාවතී ඇනුම් පදයක් කීවා ය.

"කවුද අල්ල ගන්නෙ? ඔහේට තහනම් කරල තියනවයැ කොහේවත් යන්න?"

"කිව්වත් වගෙ නැන්දටත් තියෙන්නෙ ඇඳගෙන පැළඳගෙන ලුමස් ගිහිල්ල එන්න."

"පුරුද්දක් නැති කොට! මමත් එහෙම ගියා නම් මෙච්ච කොයිවත් හරියන්න තිබුණා."

කමලාවතී කතා කළේ නොරිස්සුම් ගතියකින් හෝ කණගාටුවකින් හෝ නොව සියල්ල ගොඩ නැංවුණේ තමා ගෙදර ම නතර වී එසේ ක්‍රියා කිරීම නිසා ය යන ආඩම්බරකම ඇතිව ය.

"මේ දෙරවල් ඇරලවත් දන්න එපා යැ නැන්දෙ?" යි කියාගෙන ම පිටුපසින් සාලයට ඇතුළු වූ මම වසා තිබුණු ඉස්සරහ ලොකු දොර විවෘත කළෙමි. අවසරය ලැබෙන තුරු දොරකඩ ළඟ බලා සිටියකු මෙන් ඇතුළු වුණු ඉරු රැස් පටියක් සාලය එළිය කළේ ය

www.sinhalaelibrary.com

ඉස්තෝප්පුවට නියමිත පුටු කීපය එක ගොඩක - එහෙත් අක්‍රමවත් ව - සාලය කෙළවරක විය. කනප්පුව මත පද්මිනී හතුරුසිංහගේ පින්තූරය තිබුණේ නැත.

මට හදිසියේ මඟුල් දවස සිහිපත් විය. මනමාලිය ඇතුළු නෑදෑ පිරිස වාඩි වී සිටි තැන් පමණක් නොව මල් පෝච්චි තැබුණු තැන් පවා මගේ මතකයට නැඟිණි. මඟුල් සම්භා බඳුන්වලට දැමීම සඳහා නුවරඑළියෙන් ගෙන්වන ලද සිහින් කොළ සහිත අතු රිකිළි පොඩි කළ විට නැඟෙන අඹිහිරි පැහිච් සුවඳ නැහැයට දනෙන්නාක් මෙන් මොහොතකට මට හැඟී ගියේ ය. එදත් අදත් අතර මේ ගෙදර ඇත්තේ කෙතරම් විශාල වෙනසක් ද? මේ වෙනස එහි පදිංචි කරුවන්ගේ සිත් සතන්හි පවතින වෙනසක සෙවණැල්ලක් විය හැකි ද?

"උඹ උදේට කෑවද කුසුමේ?"

"මම කෑව නැත්දෙ, නැන්දල කන්න."

"එහෙන්. තව මාම කෑවෙත් නෑ උදේට"

මම කුස්සිය දෙසට ගියෙමි. උදය ආහාරය සඳහා බත් උයා තිබිණි. ඇල්බට් ඩැයිවර උන්නැහේ පැමිණ කෑමට වාඩි විය.

මම කුස්සියට එබී බැලීමි. කලින් සිටි මැදි වියේ කාන්තාව අස් ව ගොස් සිටියෙන් මේ දිනවල ගෙදර වැඩට වූයේ මහලු ස්ත්‍රියකි. ඈ බත් හැලියක දංකුඩ සූරමින් සිටියා ය.

"ආච්චියෙ වැඩ ද?"

"නෑ මම මේ දංකුඩ ටික සීරුවෙ බල්ලට දෙන්න. සනොහ් සල්පයෙන් කියල උාටත් බඩගිනි නෑනෑ. මේ ගෙදර ඉන්න අයට නම් බඩගින්නක් නෑ. ඒ ගොල්ල කන්නෙ ඉර මුදුනට ගියාම. මගෙ නම් බඩ දවිල්ලෙ පණ ගිහිල්ල." යි කී ඈ කර මසවා "ඒ ගොල්ලට ඕනෑ වැඩ විතරයි." යනුවෙන් පහත් හඬින් තෙපලා ය.

තුටුවමිනා කතාවකට මැදිහත් වෙතැයි මම බිය වීමි.

"මාම නම් අන්න කන්න ආව."



"එ-හෙමද? එහෙනම් තේ වතුර ටිකක් හදන්නත් එපායැ" යි ඇයි කීවේ කරන්නට තිබෙන තවත් බරපතළ කටයුත්තක් මතක් වූ කලෙක මෙනි. පොළොවට අත තබා සිටගත් කාන්තාව මේසය උඩ වූ පෝච්චියේ පියන ඇර ඇතුළ බලා "උදේ දාපු කහට තාම ඇති" යි තමාට ම කියා ගත්තා ය.

"දෙන්න ආච්චියෙ මම තේ එක හදල දෙන්නම්." ය යි කී මම ඇයගේ අවසරයක් ලැබෙන තුරු නොසිට තේ කොළ මණ්ඩිත් සහිත ඇල් කහට වතුර ටික ඉවතට විසිකර පෝච්චිය උණු දියෙන් සෝදා අලුතින් තේ කොළ දමා උණු වතුර වත් කොට නැම්බෙන්නට තැබීමි.

"තේ කොළ ඉවරයි කිව්වොත් ළමයා හිතන්නෙ මම මැල්පුමට කාල ඉවර කරලයි කියල. මම දන් කියල තියෙන්නෙ සේරම බඩු මුට්ටු යතුරු දමගන තියා ගන්නය කියල. ඒ ඒ වෙලාවට ඕන කරන දේවල් දෙන්නය කියලයි.............. මම මේ ඩියාරෝතුමා එනකල් ඉන්නෙ. මගෙ මේ කෙස් පැහුණෙ ගෙවල්වල වැඩ කරල. ලොකු බංගලාවල තට්ටු දෙකේ තුනේ රජ් මන්දිර වගෙ තැන්වල හිටිය. මෙහෙම තැනක නම් ඉඳල නෑ.............."

ඇයට අනුබල දීමේ අදහසක් මා තුළ නොවී ය. මගේ නිශ්ශබ්දතාව ම අනුබලයකැයි සිතුණත් ඊට පටහැණි ලෙසින් තිව යුත්තක් ගැන මට කල්පනා වූයේ නැත.

"කාලෙකින් උණුවට තේ වතුර ටිකක් බිව්ව." යි ඇල්බට් ඩැයිවර උන්නැහේ කීය.

"ඔය යන තැන්වල හෝටල්වලවත් නැද්ද උණු තේ හැබෑටම?"

"නෑ මම කිව්වෙ ගෙදරදී"

කමලාවතී පෙරැත්ත කළ නමුත් මා තේ ටිකක් බීවා මිස බත් කෑවේ නැත. කෝප්පය සේදීමට කුස්සියට ගිය අතර මෙහෙකාරිය මා නැවතත් කතාවට - තොහොත් සවන් දීමට - අල්ලා ගැනීමේ උත්සාහයක යෙදුණා ය. මම හැකි ඉක්මනින් එතැනින් පිටතට ආවෙමි.

www.sinhalaelibrary.com

"හවසත් උඹට එන්න වෙයි මිව ගෙයින් කියන්න. හොරු නො ගෙනිච්චොත් සුමානයක් හරි ඔහොමම තියෙයි." මා ඉස්තෝප්පුවේ පුටු තබනු දුටු ඇල්බට් ඩැයිවර උන්නැහේ කීය.

"ඉතින් එන්න බැරියැ." යි මම සිනාසුණෙමි.

'සිසිල' ගැන මගේ ම ගෙදරක් වශයෙන් හැඟීම ටිකින් ටික ලියලන්නට වූණේ සිතට ආස්වාදයක් හා තෘප්තියක් ද ඇති කරවමිනි. එකී සුහද හැඟීම් කලක් වෙන් ව සිට ආපසු පැමිණි හිතවතකු ලෙස මගේ හදවත විසින් බාර ගනු ලැබී ය.

"හැන්දෑ අර මකුළු දැල් කඩන දිග කොස්ස කෝ?"

"ඒව කොහෙ දලද දන්නෙ නෑ දුවේ. ඒවයින් වැඩ ගන්නෙ කවදද?" යි කීවේ ඇල්බට් ඩැයිවර් උන්නැහේ ය.

"දවල් දවසෙ ගෙදර නැති මිනිස්සු දන්නවයැ බඩු මුට්ටු තියන තැන්? අන්න අර පැත්තෙ කාමරේ ඇති කුසුමෙ"

කමලාවතී කතා කරන්නී අමනාපයකින් ම නොවුණත් නොරිස්සුම් ගතියක් ඒ ස්වරයේ තිබිණැයි නැවතත් මට සිතිණි. ඇයගේ වේදනාව තමා තනි ව පාළුවේ දමා සැමියා මුළු දවස බැහැර ව සිටින නිසා ඔහු ගැන පෞද්ගලිකව ම ය යි මම නො සිතමි. ඔවුන් අතර අසමගියක් කිසි දිනෙක නොවීය. පවුල ගැන ඒ තරම් සැලකිල්ලක් නො දක් වූ සැමියා උපයන මුදලින් වැඩි කොටස මත් පැනට වියදම් කරන කාලයේ වත් කමලාවතී ඔහු සමඟ සණ්ඩුසරුවල් කරන්නට ගියේ නැත. දැන් පවත්නා මේ නොරිස්සුම් ගතිය කෙනෙකුට විරුද්ධ ව නොවේ. පොදු වශයෙන් තමා පත් තත්ත්වයට විරුද්ධ ව ඇති වූ එකක් වුණා විය හැකි ය.

මකුළු දැල් කඩන කොස්ස ගැනීමට කාමරයට ඇතුළු වුණු කල අලුතක දී කිසි දවසෙක නොවූ තරමින් මගේ සිත වහා සසල වන්නට විය. ඉරණම් සහගත සිදුවීමකට පසුතල වූයේ මේ කාමරය යි. 'සිසිල' ට ගෙවැදුණු අලුත පිරිත් පිංකම් ආසන්නයේ දෙර රෙදි මසමින් සිටින කල පිටු පසින් පැමිණි නිමල් මගේ ඇස් වැසුවේ මේ කාමරයේ දී ය. දැන් එය තිස්සගේ පදිංචිය බවට පත් ව ඇත. ඕම, පොත් මේසය, ඇඳ, ඇඳුම් රාක්කය ආදී



කාමරයේ හැම දෙයක් ම අක්‍රමවත් ව තිබිණි. තිස්සගේ සරමක්, ඇඳුම් මාරු කරද්දී කලිසම් දමා ඔළුවෙන් පන්නා විසි කළ විට වැටුණු පරිද්දෙන් ම පුටුවක එල්ලෙමින් තිබිණි. ඇඳ රෙද්ද ඇඹරී ගුලි ගැසී තිබිණි. බිම විසිරී තිබුණේ බස් ටිකට් හා තවත් කඩදාසි කොළ ය. මේසය අසල ඉහළින් බිත්තියේ මුණ බලන කණ්ණාඩියක් ද සිනමා නිළියකගේ වර්ණ ඡායාරූපයක් ද විය. කාමරය මැද සිටගෙන වට පිට බැලූ විට දක්නට ලද හිස් බව හා පාළුව දෙකෙහින් සිතට ඇතුළු වී වේදනාවක් ඇති කළේ ය.

මම වසා තිබුණු ජනේලය විවෘත කර පිටත බැලීමි. මම වරක් බොත්තම් කාස මසමින් සිටි තිස්සගේ කමිසයක් ඇතැකිව මේ ජනේලය වෙත ගොස් අප්‍රාණික වූ හිස ජනෙල් කණුවට හේත්තු කර ගතිමි. එද මගේ නෙත අහස දෙස යොමු වී තිබිණි. පරක් තෙරක් නැති ගුවන් කලය හරහා සුදු වලා පෙළක් අරමුණක් නැති ගමනක යෙදී සිටිනු පොල් අතු අතරින් දුටු බවක් යන්තම් මතක නමුත් නිශ්චය වශයෙන් අදත් කිව නොහැකි ය. මා ජනේලයෙන් අහස දෙස බලා සිටිය දී එද සිටියේ අන්ත අසරණ ය යි මට දැන් මතක් වෙයි. තවත් එහි රැඳී සිටින්නට බියකින් මෙන් මම දිග මිටක් සහිත කොස්සත් රැගෙන වහා කාමරයෙන් පිට වීමි.

යතුරු දමා වසා තිබුණු කාමරයක් හැර මම අන් හැම තැන ම මකුළු දැල් කඩා ගේ අතු ගා දැමීමි. 'ඇයි කුසුමෙ අර කාමරේ?' යි ඇසීමට කමලාවතී ආවේ නැත. මේ කාමරය පිරිසිදු කරන්නට ඇය මට දෙර හැර දුන්නේ ද නැත. මම ප්‍රශ්න ද නො කළෙමි.

"අද මොකද මේ? යන්නෙ නැද්ද රාජකාරිවලට? ඉස්තෝප්පුවේ හාන්සිපුටුවේ පුවත්පත කියවමින් සිටි තැනට ආ කමලාවතී ඇල්බට් ඩැයිවර් උන්නැහේගෙන් ඇසුවා ය.

"ඇයි ඔහේ ඉතින් කොච්චරවත් නෝක්කඩු කියන්නෙ?"

"අපොයි ඔව්! මේ මම කියන නිසා.........?" ය යි කියාගෙන එවකට පිටු පස සාලය අතුගාමින් සිටි මට ළං වූ කමලාවතී "............... ඕය අද ගෙදර නැවතුණේ උඹ ඉන්න හින්දයි කුසුමෙ" යි යනුවෙන් කීවේ ඊර්ෂ්‍යාවෙන් නොව සෙනෙහසකින් මා දෙස බලාගෙන ය.

www.sinhalaelibrary.com

පටන් ගත් වැඩ කොටස අවසන් කළ වහා ම නිල්මිණි එන වෙලාවට බතක් උයන්නට තිබෙන නිසා ගෙදර යන්නට මා කෙතරම් උත්සාහ කළත් කමලාවතීත් ඇල්බට් ඩැයිවර් උන්නැහේත් දෙ දෙනා ම පෙරැත්ත කළ නිසා මට නවතින්නට සිදු විය. එද දවාලට එහි කෑම පිසුවේ ද මා විසිනි. නිල්මිණි කැඳවා ගෙනැවිත් කවා මාත් කා සවස ආවේ අනුලාටත් බත් මුලක් ද රැගෙන ය.



# 9

සමූපකාරයේ බිල් ලියන්නට කෙනකු වුවමනා කර තිබුණු බව මට කමලාවතීගෙන් දැනගන්නට ලැබුණේ 'සිසිල' ට ගිය දෙවැනි ගමනක දී ය.

මුල දී සහල් හා අවශ්‍ය අනෙකුත් බඩු බාහිරාදිය ගෙනෙන්නට කඩයට ගියේ අම්මා ය. නිල්මිණි සමඟ පාසලට යන එන වේලාවක සමූපකාරය විවෘත ව තිබුණු ඇතැම් විට සබන් කැල්ලක්, තුල් බෝලයක් හෝ එවැනි අන් යමක් ගැනීමට මම එහි ගොඩවීමි. වයස තිස් අටක් පමණ වූ පෙරේරා නම් කළමනාකරු මේ නිසා වචනයක් දෙකක් කතා කරන තරමට මා හා හුරුපග ව ද සිටියේ ය.

ආරම්භක පඩිය රුපියල් හතළිස් පහක් විය. වේතනය කොතෙක් වුව ද ගෙදරට වී නිකම් ම සිටීමට වඩා මේ රක්ෂාවට යා යුතු ය යි මට සිතිණි. අම්මා වෙළෙඳාමේ යන දවස්වල නිල්මිණි නැති වූ කල උදේ වරුවට දූන් මා ගෙදර දවස ගෙවන්නේ තවත් අමාරුවෙනි.

රෙදි වියන්නට ගියා නම් මට මීට වැඩි ආදායමක් ලද හැකි වුවත් හොඳට ඇඳපැළඳගෙන රක්ෂාවකට යනවා ය යි සමූපකාරයේ බිල් ලියන්නට යන හැකි විය. ලැබෙන මුදල සුළු නිසා කැමැත්තකින් නොවුණත් අම්මාත් පුංචි නංගීත් මගේ අදහසට එකඟ වූහ.

උදේ අටත් සවස පහත් අතර සමූපකාර කඩය විවෘත ව තිබුණු අතර දෙළහත් එකත් අතර විවේකයක් විය. උදේ ම

දවාලට බතක් පිළියෙළ කර යන මට ආහාර විවේකයේ දී නිල්මිණී කැඳවාගෙන අවුත් බත් කා අම්මා නැති දවසක නම් ඇය ඇග්නස්ලාගේ ගෙදර නතර කර සවස් වරුවේ වැඩට යා හැකි විය. මා මුලින් අදහස් කළ වැඩ පිළිවෙළ එය යි.

සමහර දවසක නිල්මිණී ඇග්නසලාගේ ගෙදර නතර වීමට බැරි ය යි කියා මා සමඟ දවාලට කඩයට ආවා ය. හිස් කාඩ්බෝඩ් පෙට්ටි, පාට කඩදසි හා ලේබල් එකතු කර ගත හැකි නිසා ඈ සමුපකාරයට යෑම ප්‍රිය කළා ය. මා සමඟ එහි යන නිල්මිණී කැඳවා ගැනීමට කමලාවතී උත්සාහ කළා ය. ලොසින්ජර හා ටොෆි යනාදිය දී දූරිය යාළු කර ගැනීමට ඈ සමත් වුණා ය. මේ අනුව ඈ දවාලට මා සමඟ ද කම්මැළි සිතුණු විට කමලාවතී ළඟ ද කල් ගෙව්වා ය. පාසල ඇරී එන අනුලා අම්මා ගෙදර නැති දවසක කෑම කා නිල්මිණී කැඳවාගෙන යන්නට කඩයට ආවා ය. මේ අනුව මා රක්ෂාවට යෑම නිසා අපගේ ජීවිතය දවල් කාලයේ අනුක්‍රමවත් එකක් බවට පත් විය.

සතියේ මුලින් ම සහල් දෙන දවසේත් අන්තිම දවසේත් වෙළෙඳාම වැඩි වූයෙන් වැඩ අධික විය. මේ හැරුණු විට අනෙක් දවස්වල මට වැඩි වැඩක් නොවී ය.

කළමනාකාර පෙරේරා හා මා වාඩි වී සිටියේ එක ම මේසයක දෙපැත්තේ ය. මේ හැර කඩයේ වැඩට පියතිස්ස හා මයිකල් නමින් තරුණයෝ දෙ දෙනෙක් ද වූහ. මේ දෙ දෙනා මා ගැන දැක්වූ අමුතු සැලකිල්ල හෝ මේ තරුණයන්ගේ ගතිගුණ ගැන බියසැක වීමට හේතුවක් හෝ තිබුණු නිසා නොව කොයි එකටත් ඔවුන් සම්බන්ධයෙන් පරිස්සමින් සිටිය යුතු ය යි මම මුල පටන් ම සිතා ගතිමි.

දවල් දහයට පමණත් සවස තුනට පමණත් තේ ගෙන්වාගෙන බීමේ පුරුද්දක් විය. මා යන්නට කලින් කළමනාකරු හා සේවකයන් දෙ දෙනා එක එක දවස බැගින් මාරුවෙන් මාරුවට මුදල් ගෙවීමේ වැඩ පිළිවෙළක් ඔවුන් අතර පැවැති බව මට පෙනී ගියේ ය.

මම මුල දී ඔවුන්ගෙන් තේ බීමි. දවස් කීපයකට පසුව 'අද මම තේ ගෙන්වීමට මුදල් දිය යුතුයි' කල්තියා ම සිතාගෙන



ගියෙමි. තේ ගෙන්වා ගත්තේ ඒ ඒ වෙලාවට බඩු ගැනීමට හෝ රස්තියාදු වීමට හෝ පැමිණ සිටින ළමයකු ලවා ය.

"බංඩාරේ තේ බොමුද?" යි පෙරේරා කඩ පිළේ වාඩි වී බීඩියක් උරමින් සිටි ළමයකු අමතා කී ය.

"හොඳ අදහස මැනේජර් මහත්තයෝ" යි කියාගෙන ළමයා මේසයට ළං විය.

"මෙන්න ගේන්න." යි මම වහා ම ළමයාට සත විසිපහක් දිගු කළෙමි.

"ඉඳා බංඩාරේ මේකෙන් ගෙනෙන්."

"මම දෙන්නම් මැනේජර් මහත්තයා. ඊයෙත් මැනේජර් මහත්තයගෙ සල්ලි ගෙව්වෙ."

"කාගෙන් මොකද තේ හතරට නෙ. ඔයා තියා ගන්න." ය යි කී පෙරේරා මගේ අත ගසා දමා ළමයාට මුදල් දුන්නේ ය. මුදලින් හවුල් නොවී තේ බීම මගේ සිතට කරදරයක් විය.

"කුසුමෙ වරෙන් තේ වතුර ටිකක් බීල පලයන්." ය යි මට වැඩක් නැති බව දුටුවොත් ජනේලය ළඟට එන කමලාවතී කීවා ය. මේ අනුව මා 'සිසිල' ට ගොස් තේ බොන්නට පෙලැඹුණේ කැමැත්තෙනි. තව ද කමලාවතී බොහෝ අවස්ථාවල දී කඩය පිටුපසට පැමිණ ජනේලයෙන් මා සමඟ කතා කරමින් කල් ගෙවන්නටත් පුරුදු වුණා ය.

මට පරිස්සම් වීමට ඇත්තේ තරුණ සේවකයන් දෙ දෙනාගෙන් නොව පෙරේරාගෙන් බව වැඩි දවසක් යන්නට කලින් මට තේරුම් ගත හැකි විය. මා එක් වර ම ඔහු සමඟ කතාවට ගියේ නැත. එහෙත් ඔහු මා ඒ සඳහා පොළඹවා ගත් බව දැන් මට සිතෙයි. සතියකට දින කීපයක ම වැඩක් නැති ව ගත කරන්නට තිබුණු නොයෙක් අවස්ථාවන්හි පොතක් පතක් කියවීමෙන් කාලය ගෙවන්නට මම මුල දී උත්සාහ කළෙමි. පෙරේරා ඊට ඉඩ දුන්නේ නැත. ඔහු හිමින් හිමින් මා කතාවට ඇදලා ගත්තේ ය. එක මේසයේ වාඩි වී සිටීමෙන් මට ඔහු හා කතාවට නොවැටී සිටීම පහසුවක් නොවී ය.

www.sinhalaelibrary.com

කෙටියෙන් යමක් කියා මා නැවත පොත වෙත නෙත යොමු කරගෙන සිටින අතර ඔහු මා දෙස විදහා ගත් දෑසින් බලා සිටින බව මට හැඟී ගියේ ය. මම ඊට බිය වීමි. මම ඔහුගේ බැල්මට බිය වීමි.

අන්තිමට මම විවේක අවස්ථාවන්හි පොත් කියවීමේ උත්සාහය සම්පූර්ණයෙන් ම අත්හැර දැමීමි. පුවත්පතක් ලැබුණොත් පමණක් ඔහුගෙන් මුහුණ මුවා කරගෙන කියැවිය හැකි විය. කෙසේ හෝ මා නො පැකිළ කතාවට වැටීම නිසා ඔහු ධෛර්යයවත් වුණා විය හැකි ය.

සමහර දවසක ආපසු ගෙදර යන මම ඒ වේලාවට ම වැඩ ඇරී යන රෙදි වියන යුවතියන්ගේ කණ්ඩායමට වැටෙමි.

"ඔයා හරි තැනකනෙ වැඩට ගියේ?" පියසෝමා දවසක් කීවා ය.

"ඇයි?"

"ඇයි කියන්නෙ? ඔය සමුපකාරේ මැනේජර් හරි චලා."

මා තුළ එක වර ම ඇති වුයේ බියක් නොව තරහකි. මොවුහු මට වරක් රෙදි වියන්නට යන්නට කතා කළහ. මම ඊට අකැමැති වීමි. සමුපකාරයේ රක්ෂාවෙන් ලැබෙන පඩිය අඩු බව ඔවුන් ද දනිතත් මම ඔවුනට වඩා හොඳට කළඑළියට හා පිරිසිදුවට ඇඳපැළඳගෙන යමි. ඔවුන් මා මෙන් සෙරෙප්පු දමන්නේ නැත. සමහර දැරියක මට ඊර්ෂ්‍යා කරන බවක් මට තේරුම් ගොස් ඇත. සමුපකාරය තරුණියකට රක්ෂාව කරන්නට සුදුසු තැනක් නොවන බවට හැඟීමකින් පියසෝමා කතා කරන්නේ එබැවිනැයි සිතූ මම කෝපයට පත් වීමි.

"මට මොකද එයා කොහොම වුණත්. මම මගෙ රක්ෂාව කරගෙන ඉන්නවා."

"තමන් හොඳ නම් කවුරු කොහොම වුණත් මොකද?" ජයවතී මගේ පැත්තට කතා කළා ය.

"ඒ වුණාට! පිරිමි විතරක් ඉන්න තැනක් නේ"



"නෑ ඉතින ඩ්‍රයිවර මාමලගෙ ගෙයක් ළඟනෙ. නැන්ද හෙම නිතරම ඉන්නවා. ඒකයි මම බයක් නැතුව ඕකට යන්නෙ."

"කවුරු හිටියත් තරක මිනිහෙක් යටතෙ වැඩ කරන කොට කතන්දර හැදෙනවා."

මගේ සිතට බියක් ඇතුළු විය. එහෙත් මා කතා කළේ ඇයගේ වචනවලින් වෙනසකට පත් වූ බවක් නොපෙන්වමිනි.

"කතන්දර හැදෙන එක නම් ඉතින් ගෙදර හිටියත් නවත්වන්නයැ?"

පියසෝමා මා කී දෙයින් පසුබට වුණේ නැත.

"දවසක් මම නූල් කැරැල්ලක් ගන්න ගිහිල්ල ඉතුරු සල්ලි දෙන ගමන් මගෙ ඇඟිල්ල මිරිකුවා."

කීප අවස්ථාවක ම මේසය යටින් පෙරේරාගේ දණ හිස මගේ කකුලේ වැදුණු බව මට එක වර මතක් විය. මට ඒ අවස්ථාවල දී හැඟුණේ බැරිවීමකින් වුවක් ලෙසිනි.

පසුව ද මා ඔහුට මුහුණ දුන්නේ අලුත් බියකින් හා චකිතයකිනි. මින් පසුව මට වැඩ කරන්නට වුණේ නොසන්සුන් සිතිනි. පෙරේරා සමඟ කතා බස් කිරීම අඩු කරන්නට කල්පනා කළත් ඔහුගෙන් ඊට ඉඩක් නොලැබේ. ඔහු සමඟ තනි වීම මඟ හරවනු පිණිස මම වෙන ද නොවූ උනන්දුවකින් තරුණයන් දෙදෙනා ද කතාවට හවුල් කර ගැනීමට උත්සාහ කළෙමි.

සවස් වරුවට වෙළෙඳ සැල විවෘත කළ වහා ම බඩු ගැනීමට සෙනඟ එන්නේ නැත. පැයක් හමාරක් යන තුරු කඩය පාළු ය. පියතිස්ස මේ වේලාවට දිනපතා ම වාගේ බඩු ගෝනි ගොඩක හාන්සි වී නින්දට ගියේ ය. මයිකල් පොතක් කියවයි. මා බැලුවත් නැතත් පෙරේරා මා දෙස ගිලින්නට මෙන් බලා සිටී. ඔහුගේ ඇස්වල ඇත්තේ තරුණ ඇසක ඇති පෙනීමට වඩා දැඩි කාමුකකමක් හා කෑදරකමකි. මා තුළ බියක් මෙන් ම පිළිකුලක් ද ඇති වෙයි.

මම පුටුවෙන් නැඟිට හිරී ඇර ඉස්තෝප්පුවට ගොස් පාර දෙස බලමි.

www.sinhalaelibrary.com

"මෙන්න මේ ගණන් ටික මම එකතු කරල තියනව හරිද බලන්නකෝ" යි පෙරේරා කියයි.

මා ආපසු මේසය වෙත පැමිණ වාඩි වී ලැජරය අතට ගන්නා කල "ගෑනු ගණන්වලට දක්ෂ නෙ" යි ඔහු කියයි.

මුල දී මෙවැන්නකට පිළිතුරක් දුන් නමුත් ඔහුගේ ස්වභාව දැන ගත් පසු මම අවිනීත කවටකමක දී කෝපය සිනාවකින් වසාගෙන නිහඬවීමි. පුටුවේ වාඩි වූ මම සෙරෙප්පුවෙන් මුදා ගත් පය අනෙක් පය මත තබාගෙන වැඩ කරන්නට වීමි. මඳ වේලාවකින් මගේ පාදයට ස්පර්ශයක් දැනිණි. මම ධෛර්යයවත් වීමි. බැරිවීමකින් වුණා ද නැතහොත් වුවමනාවෙන් ම කරන ක්‍රියාවක් දැයි ප්‍රත්‍යක්ෂ කරගනු පිණිස මම කිසිත් නො දන්නා බවක් පෙන්වීමි. ඔහු ඊළඟ පියවර ගන්නා තුරු මා ඒ පයෙහි පහස ඉවසා සිටියේ දැඩි පිළිකුලකිනි. වැඩි වේලාවක් යන්නට කලින් පෙරේරා මගේ කකුල රිදෙන තරමට පෑගුවේ ය. මම වහා දෙ පය ම මෑත් කර ගතිමි. මගේ හදවත තදින් ස්පන්දනය වන්නට විය. ඇත්ත නැත්ත දැන ගැනීමට වුව ද ඔහු ධෛර්යයවත් කිරීම ගැන මම දැඩි පසුතැවිල්ලට පත්වීමි.

"මූණ රතු වුණා ම තවත් ලස්සණ නෙ"

මම අලුත් බියකින් ගැහෙන්නට වීමි.

'නැත්දෝ!' යි කමලාවතීට කෑ ගසන්නට මට සිතිණි. සියලු හැඟීම් යට පත් කර ගත් මම අමාරුවෙන් වුව ද කෙළින් ම හිස ඔසවා ඔහු දෙස රවා ලැජරය බලා ගතිමි. මට ඉලක්කම් පෙනෙන්නට වූයේ නොපැහැදිලි තිත් පෙළක් මෙනි.

"මුලදී කවුරුත් ටිකක් ඔහොම සැර පෙන්නනව. බොරුවට"

මගේ මුළු ගත නැවත සීතල විය. ඔහුට විරුද්ධ ව යමක් කිව යුතු ය. තමා අදහස් කරන පැත්තකට කතාව යොමු කරවීමට මගෙන් කිසිවක් පිටවීම ඔහුට වාසියක් වනු ඇතැයි ඉවකින් මෙන් අනෙක් අතට මට සිතිණි. ශබ්දයක් නැගෙන්නට ගණන් පොත වසා දමා සිට ගත් මම පිළ මත වාඩි වී සිටි මයිකල්ට, "මම අරෙහෙට යනව. කවුරුත් බඩු ගන්න ආවොත් කතා කරන්නැ" යි කියාගෙන 'කිසිල' ට ගියෙමි. සිද්ධිය කමලාවතීට



කීමේ අදහසක් මා තුළ නොවී ය. ඇත්ත වශයෙන් කුමක් කළ යුතු දැ යි පැහැදිලි හැඟීමක් මට තිබුණේ නැත. වුවමනා කළේ අනතුරකින් බේරීමට රැකවරණක් කරා යෑම පමණකි.

"මොකද කුසුමෙ?" යි මගේ කලබල ස්වභාව තේරුම් ගත් ලෙසින් කමලාවතී ඇසුවා ය.

"නිකම් නැත්දෙ? වැඩක් නෑ. කම්මැලිකමට ආව."

මයිකල් මට කතා කළේ පැයකට පමණ පසුව ය. ඒ අතර තුණ්ඩු කීපයක් පෙරේරා විසින් ම ලියන ලදුව තිබිණි.

බිය, ලැජ්ජාව හා පිළිකුල නිසා මට ඔහුගේ මුහුණ බලන්නට බැරිය. එහෙත් යම්කිසි බයාදු ගතියක් එහි රැඳී තිබෙනු මට දැක ගත හැකි විය. මට සතුටක් ඇති විය. මා සියල්ල කමලාවතීට කියන්නට ඇතැයි ඔහු බිය පත් වුණා විය යුතු ය.

ගෙදර ගිය මම කණ්ණාඩිය ඉදිරියේ සිට ගතිමි. මගේ මුහුණ මේ ටිකට වැහැරී තිබිණි.

පාසල් වියේදීත් ඉන් පසුවත් තරුණයන් මට කවටකම් කළ අවස්ථා ඕනෑ තරම් ඇත. ඒ හැර බස් රියේ දී පින්කම් පොළක දී හෝ එවැනි අන් තැනක දී පිරිමින් වුවමනාවෙන් ම ඇඟේ හැපුණු කකුල පෑගූ අත මිරිකා ගන්නට තැත් කළ අවස්ථා කීපයක් ගැන මට මතක ය. ඒ කිසිවක් කලින් සිතා මතා කරන ලද ඒවා නොවේ. ඒ කිසිවක් පෙරේරා සිද්ධියට සමාන අත්දැකීම් නොවේ.

තරුණයකු බලන කල හෝ සිනාසෙන කල හෝ අසතුටු නම් ඉවත බලා ගත හැකි ය. ලියුමක් දුන් කල ප්‍රතික්ෂේප කළ හැකි ය. ඔහු ඉල්ලාගෙන එන්නේ ආදරය යි. බැරි ය යි කී කල ආදරය බලෙන් ලබා ගන්නට ඔහු ඉදිරිපත් නොවනු ඇත. සාමාන්‍ය තත්ත්වය එය යි. විවාහකයකු පතන්නේ ආදරයක් නොවේ. මා රවා බැලූ කල පෙරේරා අධෛර්යයට පත් වූයේ නැත. ගැහැනුන්ගෙන් බැනුම් ඇසීමත් සැපතක් ලෙස සලකන පිරිමි සිටිති.

පිරිමින් ගැන කිසි කලෙක නොවූණු පිළිකුලක් හා කලකිරීමක් මා තුළ වැඩිණි.

www.sinhalaelibrary.com

මා තව දුරටත් රක්ෂාවට යන්නේ කෙසේ ද? මට කිසිවකුට මුහුණ දිය නොහැකි ය. මගේ ආරක්ෂාව අවදානමකට පත් ව තිබේ.

සිදු වූ කිසිවක් මම පුංචි නංගීටවත් නො කීවෙමි. සමූපකාරයේ රක්ෂාව තෝරා ගත්තේ මගේ ම කැමැත්තෙනි.

පෙරේරා නැවත තම අවලක්ෂණ අදහස් හෙළි කරන්නට තවත් සතියක් පමණ කල් ගත්තේ ය.

මුල් සිද්ධියට පසුව මම ඔහු හා කතාබහ රාජකාරි කටයුතුවලට පමණක් සීමා කරන්නට සිතා ගතිමි. මා වැඩිපුර කතාවට අල්ලා ගැනීමට ඔහු ද එක් වර ම උත්සාහ කළේ නැත. කෙසේ වුව ද එක තැන වැඩ කරන නිසා කතා නොකර ම සිටීම ද පහසු නොවී ය. මගේ වෙනස අනෙක් සේවකයන් දෙදෙනාටත් පෙනෙනැයි බිය වූ මම අනෙක් අතට එහෙම වුණොත් හොඳ ය යි ද සිතිමි.

කමලාවතී සිරිත් පරිදි කඩය පිටුපසට අවුත් විවේක අවස්ථාවන්හිදී මා හා කතාවට වැටුණු කල පෙරේරා සමඟ ද වෙන ද මෙන් කතා කළා ය. මා සිදු වූ දේවල් ඇයට නො කී බව මෙහි දී පෙරේරා තේරුම් ගන්නට ඇත. ඔහු නැවතත් ධෛර්යයවත් වූයේ ඒ නිසා විය හැකි ය.

පෙරේරා එක් සවසක පසුව ද කොළඹ ගොස් ගෙනෙන්නට අවශ්‍ය ව තිබුණු බඩු බාහිරාදියේ ලැයිස්තුවක් සකස් කරමින් සිටියේ ය. ඔහු විකුණා අවසාන දේවල් ගැන වරින් වර සේවකයන්ගෙන් ප්‍රශ්න කළේ ය.

"ඔයාට හෙම මතක් වෙන්නෙ නැද්ද තව ඕනෑ කරන දේවල්?" ය යි මට පමණක් ඇසෙන්නට ඔහු කී ය.

මම නො ඇසුණාක් මෙන් කරබා ගතිමි.

"මේ.........." ඔහු මා ඕම බලාගෙන සිටින කල පැන්සලෙන් මගේ බාහුවට තට්ටු කර කතා කළේ ය. "............. ඔයාට මොනවද ගේන්න හෙම ඕනෑ."

"ගෙදර ගිහිල්ල නෝනාගෙන් අහන්න. එන්න එපා කෝල් කරන්න."



මට නැවතත් රක්ෂාව එපා විය. එහෙත් මම අම්මාට කුමක් කියන්නෙම් ද? අම්මාට හෝ අනුලාට හෝ කිව නොහැකි තරම් රහසිගත කරුණු සාමාන්‍යයෙන් මා වෙත නොවුණත් පෙරේරා ගැන ඔවුන් ඉදිරියේ කියන්නට බැරිකමකට මම මුහුණ දුනිමි.

වේතනය රුපියල් හතළිස් පහක් තරම් සුළු මුදලක් නමුත් මා රක්ෂාවට ගියේ ලොකු බලාපොරොත්තු හා ආශාවෙන් ඇසිව ය. මට වියදමක් ගියේ ඇඳුමට පමණකි. ඒ නිසා කියක් හෝ ඉතිරි කර ගැනීමට මම සමත් වීමි. මුල මාසයේ පඩිය ලබා ගන්නට කලින් සත දහයේ මුද්දරය මත රිසිට් පතේ මා අත්සන් තැබුවේ කෙතරම් සතුටකින් ද? කළමනාකරු අතින් ගත් රුපියල් හතළිස් පහ - රුපියල් දහයේ කොළ හතර හා රුපියල් පහේ කොළය - මා හරිදයි ගණන කර බැලුවේ සැලෙන ඇඟිලිවලිනි. නිල් පාට රුපියල් දහයේ නෝට්ටු හතරක්! එතරම් ලොකු මුදලක් එක වර මා අතට පත් වන්නේ කෙතරම් කලාතුරකින් ද? පඩි ගත් ද ගෙදර යන අතර මඟ කීප වරක් ම මට තනිව ම සිනා ගියේ ය. පඩිය පැත්තකින් තබා කල්පනා කළත් රක්ෂාවකට යෑම මා තුළ අලුත් ප්‍රබෝධයක් හා ජීවිතය ගැන අලුත් උනන්දුවක් ඇති කළේ ය. කලක් තිස්සේ සිතට අවශ්‍ය ව තිබුණු වෙනස සුළු වශයෙන් හෝ ඇති විය. පෙරේරා දැන් මේ සියල්ල විනාශ කරන්නට යයි. මයිකල්ට හෝ පියතිස්සට හෝ තම සමාවක් දිය හැකිව තිබිණි. අනුකම්පාවක් දැක්විය හැකිව තිබිණි. මොහු ගැන සිතන කල වෛරයක ද්වේෂයක් හා පිළිකුලක් හැර අන් හැඟීමක් ඇති කර ගන්නේ කෙසේ ද? මිනිසකු කෙරෙහි ඇති නොවුණු තරම් දැඩි කෝපයක් ඔහු ගැන මා තුළ පැසවන්නට විය.

ගුණපාල ආවොත් ය යි මම ආශාවෙන් බලා සිටියෙමි. ගුණපාලට ප්‍රශ්නයක් තේරුම් ගත හැකි ය. මා කළ යුත්තේ කුමක් දැයි උපදෙසක් ගන්නට සිටින්නේ ඔහු පමණකි.

ගුණපාල ආවේ නැත. ඒ වෙනුවට රෝහණ වත්තේ සිට නිවාඩුවකට ගෙදර ආවේ ය. රාත්‍රියක පැමිණි රෝහණ පසු ද උදෙන් ම බැහැරක ගිය බව කමලාවතී මට කීවා ය. ඔහු දකින, දක කතා කරන ආශාවක් මට උපන්නේ ය. එපමණක් නොව රෝහණ ගෙදර පැමිණ සිටින බවට මතක නිසා පෙරේරා ගැන මේ දිනවල පැවැති නිරන්තර බිය ද පහ ව ගියේ ය.

www.sinhalaelibrary.com

දෙළහට සමූපකාර කඩය වසන තුරුත් රෝහණ ගෙදර ආවේ නැත. සවස් වරුවේ ගිය මම 'සිසිල' ට ගොඩ වීමි. ඔහු දවල් බත් කා නින්දට ගොස් සිටිනු මට දක්නට ලැබිණි. මා හා අමනාප ගතියක් නො පෙනුණත් කමලාවතී වෙත ද කිසියම් වෙනසක් පළ විය. කඩය වසන්නට ටික වේලාවකට පසු රෝහණ පාරට බැස අපගේ ගෙදර පැත්තට යනු මම දිටිමි. ඔහු මා දෙස බැලුවේ වත් නැත. මා තුළ කුකුසක් ඇති විය. රෝහණ හා කමලාවතී අතර කතා බහක් ඇති වුණා විය හැකි ය.

වැඩ නිම වුණු පසු මම නිවෙස බලා යමින් සිටි රෙදි වියන යුවතියන් අතරට වැටුණෙමි. අපි සිරිත් පරිදි සිනාසෙමින් කතා කරමින් ගියෙමු. වෙල මැද බෝක්කුව මත සිටි රෝහණ මම ඈත දී ම හඳුනා ගතිමි. මගේ සිත සෙනෙහසින් පිරී ගියේ ය. ගෙදර පැමිණ දවසක් ම ගත ව තිබුණත් මෙතෙක් හමු වී නොසිටියෙන් ඔහු හා කතා කරන ආශාව වඩාත් බලවත් විය. මට අඩිය ඉක්මන් කර යන්නට සිතුණා තරම්. මා ඔහුට ළං වූයේ උතුරන සිනාවක් ඇතිව ය. එහෙත් ඔහු සිනාසුණේ නැත. ඔහු කෙලින් ම මගේ මුහුණ බලාගෙන සිටියේ ය. මට හේතුවක් නැති ව බියක් ඇති විය.

"මම දවල් යන කොට දෙවෙනියිය නිදි.............."

"මට කුසුම් මුණ ගැහෙන්න ඕනෑ." යි ඔහු ගොරෝසු හඬින් කීය.

අනෙක් දැරියෝ අප පසු කර මදක් තැන් ගොස් නතර වූහ.

"ඇයි ඔය දැන් හම්බ වුණේ?" විහිළුවක් කියා ඔහුගේ මුහුණට සිනාවක් ගෙන්වීමට සිතුණත් මම ඒ ඇස්වලට බිය වීමි.

"දෙවෙනියිය අපේ ගෙදර එනවද?"

"මම උදේට එන්නම්"

"මම අටට විතර වැඩට එනව."

"වැඩ? තාල්ල වැඩක් නෙ හොයාගෙන තියෙන්නෙ.............. ලැජ්ජ නැතුව?"



සිනාසෙන්නට උත්සාහ කළ නමුත් ඔහුගේ බැල්ම පමණක් නොව කටහඬත් මා තවත් බිය පත් කළේ ය. මහපටැඟිල්ලෙන් සෙරෙප්පු අඩිය හාරමින් මම හිස ඔසවා ඔහු දෙස බැලීමි. ඔහුගෙන් බුරුලක් නැත.

"අර ළමයි බලා ඉන්නව. මම යනව."

මගේ දෙ නෙත් කඳුළෙන් තෙත් විය. බිම බලාගෙන ගිය මම අනෙක් පිරිසට එකතු වූ නමුත් ඔවුන් නැවත පටන් ගත් සිනාවටත් කතාවටත් එකතු වීමට අසමත් වීමි.

මා සමූපකාරයේ රක්ෂාවට යෑම ගැන ඔහු නොමනාපයට පත් ව සිටී. ඇත්ත වශයෙන් ම දැන් රක්ෂාව ගැන මගේත් ආශාවක් හෝ උනන්දුවක් හෝ නැත. එය වෙන ම කරුණකි. මම රෝහණගෙන් මෙවැන්නක් බලාපොරොත්තු නොවුණෙමි.

'මොනාවටද නංගියෙ ඔය රක්ෂාවට යන්නෙ?' යි කරුණාවන්ත ලෙස කතා කළා නම් 'ඒක නෙන්නම් දෙවෙනියියෙ බලන්නකො අර පෙරේරත් මහ නරක මිනිහ නෙ' යි සහෝදරයකු සමඟ ලෙසින් සියල්ල කතා කළ හැකි ව තිබිණි. ඒ වෙනුවට රෝහණ හැසුරුණේ අභිෂ්ට ලෙසිනැයි මට සිතිණි. ඔහු කතා කළේ මගේ නිදහසට ඇඟිලි ගසන කෙනකු විදියට ය. මා කැමැති රක්ෂාවක් කරන්නට මට අයිතියක් තිබේ. මා වරදක් කළත් කතා කළ යුතු විදිය එය නොවේ. ඔහු මා දෙස මරවා ගෙන බලා සිටියේත් සැරෙන් කතා කළේත් තවත් යුවතියන් පිරිසකට ද පෙනෙන පරිදි හා ඇසෙන පරිදි ය. අනුන්ටත් පෙනෙන්නට මට සැර පෙන්වා ඔහු තෘප්තියක් ලබන්නට ඇත.

ඒ තරුණියන් යම් කිසිවක් ගැන සැක නොසිතන්නට ඇද්ද? මාසයකට සෑහෙන කතාවක් ගොතා ගන්නට මේ ටික සෑහෙයි. පදනමක් අවශ්‍ය නැත. සුළඟක් වැටුණොත් ඉතිරි හරිය අතින් දමා ඔපා දූප ගොතා ගැනීම ඔවුනට පහසු ය.

රෝහණ මේ තරම් කෝපයට පත් ව සිටින්නේ ඇයි? ඔහු පෙරේරා ගැන මා නොදන්නා දේවලුත් දැනගෙන ඇද්ද? පියතිස්ස හෝ මයිකල් හෝ කිසියම් කේලමක් රෝහණට කියන්නට ඇද්ද? සැරෙන් කතා කිරීම නිසා හටගත් නොමනාපය ගට පත් කරගෙන රෝහණ ගැන මගේ සිතේ බියක් එපී.

www.sinhalaelibrary.com

වැඩිහිටියකුගේ අවසරය ලබා ගත යුතු ව තිබිය දී ඊට පටහැණි ව යමක් කර අසු වීමේ දී ඇති වන මේ බිය, දෙවියනි, රෝහණ වෙත මා තුළ අලුත් බැඳීමක් ජනිත කරවීමේ සමත් වෙයි. ඔහු නැගි කළ සාරිය බාර ගන්නට මා මැළි වූ කල සැර කළ අවස්ථාවේදීත් මට වන්නට ගියේ මෙය ම නොවේ ද?

එද පැවැතියේ වෙන ම - විශේෂ තත්ත්වයකි. නිමල්ගේ විවාහය සම්බන්ධ ව මගේ සිත අතිශයින් නොසන්සුන් ව පැවැති ඒ අවස්ථාවේ රෝහණ වෙත බිය නිසා හට ගත් බැඳීම කුණාටුවක් මැද වැදුණු පුළු විදුලි පහරක් පමණි. අද එසේ නොවේ. ගෙණ හඩක් පිපිරුණේ ශාන්ත නිශ්චල අහසක ය. මෙදින අම්මාත් ගෙදර සිටි දවසකි. ඒ නිසා අමුත්තක් වූ බව නො පෙන්වීමට මම වඩාත් උත්සාහ ගතිමි.

"දෙවෙනියියත් ඇවිත් හිටිය" ය කීවා මිස මම අනුලාට ද වෙන විස්තරයක් නො කළෙමි.

පසුව ද උදේ මම වෙන ද මෙන් ම වැඩට යන අදහසින් ආහාර පිළියෙල කළෙමි. පුංචි නංගී හතට කලින් ගෙදරින් පිටත් ව ගියා ය. මම නිල්මිණි ද පාසල් යවා ඇඳපැලඳ ගතිමි. රෝහණ එනු ඇත්තේ මා වැඩට යන වේලාව මග හැරෙන්නට බිය පසු ය යි මට තිකමට සිතිණි. තමා ප්‍රමාද වුණොත් නොබලා යද්ද නැතහොත් එන තුරු මා බලා සිටී ද යි දැන ගැනීමට ඔහුට වුවමනාව ඇත. කීයට හෝ එන තුරු නොසිටියොත් ඔහු ඒකත් ලොකු කර සලකන්නට ඉඩ තිබේ.

මම අමාරු තත්ත්වයකට පත් වුණෙමි. වැඩට යන වේලාව පසු වන්නටත් ආසන්න ය. රෝහණ ගැන නො බලා යන්නටත් නුපුළුවන.

"ඇයි අද යන්නෙ නැද්ද?" රෙදි වියන්නට යන යුවතියක් පාරේ නතර වී ඇසුවා ය.

"යන්න, මම එන්නම්"

නොසන්සුන් වූ සිතෙහි රෝහණ ගැන තරහක් උපදී. ඔහුට වුවමනා කරන්නේ මා තමා එන තෙක් වැඩට නොගොස් බලා සිටිද නැද්ද යි දැන ගැනීම පමණකි. වෙන මුකුත් නැත!



කලින් දින ඔහු හැසිරුණු ආකාරය මතක් වී මගේ හැඟීම දැඩි වන්නට විය.

කරන්නට කිසි ම දෙයක් නොමැති වූ කල මම සුළු පඩියකට එහෙත් බලාපොරොත්තු සහගත ව රක්ෂාවට ගියෙමි. එතැනත් දේවදත්තයෙකු පෙරේරා මහත් වී කෝපය ඔහු වෙත යොමු විය.

මා පත්වූ තත්ත්වය කියන්නට කෙනෙක් නොවී ය. මට පිහිට වෙන්නට කෙනෙක් නොවී ය. රෝහණ පැමිණ සැර කරයි. මම රක්ෂාවක් නැති ව අවුරුදු ගණනක් ගෙදර නිකරුණේ සුසුම් හෙළමින් ගත කළෙමි. මට රැකියාවක් සොයා දීමට ඔහු වචනයක් වත් මිඩංගු කළේ නැත.

මොනවා හිතුණත් ඔහු එන තුරු නොබලා යන්නට ධෛර්යයක් මට නැත. රෝහණ ගැන ඇති වූ මේ අන්දමේ බියක් නිමල් නිසා කිසි දවසෙක මා තුළ ඉපදී නැත.

නවයට පමණ රෝහණ ආවේ ය. මම කතා නොකළෙමි. තරහක් ආරූඪ කර ගත් මම උළුවස්සට හේත්තු වී පාර දිහා බලා ගතිමි. මේ සියල්ල ඔහු තව තවත් පොළඹවන බව දැන දැනත් මම දුර දිග කල්පනා නොකර අවස්ථානුකූල බොළඳ ආශාවකට යට වීමි. ඔහු මා දෙස බලා සිටිනු ඇස් කොනින් මම දුටුවෙමි. ඔහුගේ මුහුණේ ජයගත්තකුගේ සතුටක් ඇත. මා යටත් විණැ යි ඔහු ආඩම්බර වුණා විය හැකි ය.

"ඇයි අද වැඩට ගියේ නැද්ද?"

මම කතා නොකළෙමි.

"අපරාදෙ තමට කිංදුව"

"මට නෙ ඒකෙ පාඩුව. කාටත් මොකද?"

මගේ මේ හැසිරීම කුමක් ද? මා රෝහණ ඉදිරියේ මින් පෙර කිසි දිනෙක මෙසේ හැසිරී නැත. 'දෙවෙනිදිය ඇයි මුණ ගැහෙන්න ඕනැයි කිව්වෙ? හදිසියක් ද? මොකක්ද වුවමනාව?' ආදී වශයෙන් කෙළින් ඇසීමට මට බැරි ඇයි? ඔහු හා මම ජීවිතයේ කිසි දවසෙක නොවුණු තරම් එකිනෙකාගෙන් ඈත් වුණෙම් ද? නැතහොත් එකිනෙකාට අපි වඩ වඩා ළං වුණෙම් ද?

www.sinhalaelibrary.com

මේ නිශ්ශබ්දතාව හොඳ එකක් නොවේ. අප යමක් කිව යුතු ය. මට කිසිවක් කිව නොහැකි ය. ඔහු ද කිසිවක් කියන්නේ නැත. ඒ වෙනුවට ඔහු මා දෙස බලා සිටී. ජයග්‍රහණයේ දීප්තියෙන් පෙරෙන ඒ ඇස් මට ඇස් කොණෙන් පෙනෙයි. කාන්දමකින් මෙන් මගේ බැල්ම ඒ වෙත ඇදෙන්නට යයි. තවත් ඇත්තේ බැල්මට බැල්ම මුණ ගැසෙන්නට පමණි. එහි දී සියල්ල විසඳෙනු ඇත. සියල්ල තීරණය වනු ඇත. 'එපා' 'එපා' යි සිත කෑ ගසා කීය. ගුණපාලට වුණේ වැරදීමකැයි ඔප්පු කරන ලෙස සිත හඬ නගා කීය. මගේ හදවත වඩාත් සැලෙන්නට විය. ජීවිත කාලයක් ඇතුළත අත් දකින්නට ලැබෙන්නේ එක ම එක වරක් පමණැ යි මා විසින් අසන ලද වේදනාවකට තුඩු දුන් රසවත්කමකින් මගේ ළය පිරී ගියේ ය. මම සිතට අවනත නොවී ගියෙමි. මගේ ඇස් රෝහණ හතුරුසිංහගේ ජයග්‍රහණයේ දීප්තියෙන් පෙරෙන ඇස් වැළඳ ගත්තේ ය. සිහින් කැළැඹුණු මම ගතින් අප්‍රාණික වීමි.

ඔහුගෙන් මුවා වන තුරු කිත්සිය අයින දිගේ ගෙතුළට වූ මම සාලය මැද නැවතී දෙ අතින් මුහුණ වසා ගතිමි. ඉකි බිඳෙන හඬ ඇසී ඔහු මා වෙත ආවේ ය. පිටු පසින් පැමිණි ඔහුගේ දෑත් මගේ දෙවුර මත නතර විය. මම සීතලෙන් තැති ගතිමි.

"කුසුම් මොකද?" ඒ හඬ නැගුණේ මගේ කණ අසල ම ය. ජීවිතයේ නොවුණු බියකින් මම හිරිවැටී ගියෙමි. මා බිය වූයේ පිරිමියකුට ද මා තුළ සැඟවුණු ගැහැනියට ද යි මම නොදනිමි. මුහුණ වසාගෙන ම ඔහුගේ අත් ගිලිහෙන ලෙස අඩියක් දෙකක් ඉස්සරහට ගිය මම වහා හැරී ඔහු දෙස බැලීමි. එකල මට හමු වුණු මුහුණේ වූයේ ද බිය රැඳි ගතියකි.

"ඇයි අඬන්නේ?"

"කියන්න දෙයක් කියනව නම් වෙන වෙලාවක එන්න! යන්න! මම වේගයෙන් ඔහුට කීමි. "............... මම දැන් ඉන්නෙ තනියම!"

පුරතලයට ඇති දුව් කරනු ලැබූ පූසිය විසින් සපාකනු ලැබූවකුගේ බැල්මෙන් ඔහු පස්සට වීසි වුණා මෙන් පියවර කීපයක් ආපසු තැබී ය.



"කුසුම් බයද?"

"මොටද මම බය වෙන්නෙ?"

"එහෙනම් අඬල ඉවර වුණාම කියන්න. මම ඉස්සරහට වෙලා ඉන්නම් කො."

ඔහු ඉස්තෝප්පුවට ආපසු ගොස් පුටුවක වාඩි වනු ඇසුණා තරම්. මා තුළ මෙතෙක් පැවැති සියලු හැඟීම් ලෝ දියක් මෙන් ගලා ආ කෝපයකින් දුවී ගෙන ම ජෙදී ගියේ ය. මම මට ම එපා වීමි. කිලුටට හසු වූ බවට හැඟීමකින් මම දුව් කලකිරීමකට පත් වීමි. මෙතෙක් කල් පණ මෙන් ආරක්ෂා කරගෙන ආ මහාර්ඝ වස්තුවක් දුවම්නාවෙන් ම විනාශ වෙන්නට ඉඩ දුන් බවට අසීමිත පසුතැවිල්ලකින් මම කම්පාවට පත්වීමි.

මට නිමල් අහිමි විය. මට තාත්තා නැති විය. සෝමා නැති විය. පද්මිනී - පද්මිනී සේනාරත්න - නැති විය. මගේ බලාපොරොත්තු බොල් සිහින බවට පත් විය. මා අහසේ තැනූ මාලිගා සුනු විසුණු වී ගිලිහී ගිය සමනළ පිහාටු මෙන් බිම විසිර ගියේ ය. මේ හැම දෙන - හැම දෙය නැති වුණත් සියල්ල නැති වුණත් තවත් යමක් ඉතිරි වී සුරක්ෂිත ව ඇතැයි හැඟීමක් මෙතෙක් මා තුළ පැවතිණි. ජීවිතය ගැන අලුත් බලාපොරොත්තු ද ආශාවන් හා අධිෂ්ඨානයන ද වවා වඩා ගන්නට මට ආධාර උපකාර වුණේ ඒ හැඟීම ය. දැන් ඒ සියල්ල ඉවර ය. සියල්ල අවසාන ය. අන්තිමට ඉතිරි වී තිබුණු අධ්‍යාත්මයක් මට අහිමි විය.

මගේ කෝපයට නිමල් අසු විය. රෝහණ අසු විය. කමලාවතී අසු වූවා ය. මේ මින් පෙර කිසි දවසෙක ඔවුන් කිසිවකු ගැන උපන් කෝපයක් නොවේ.

"එකෙක් මා නැති කළා! දැන් අනික එනවද ඉතිරි ටිකත් නැති කරල දාන්න" යි කෑ ගසා කියන්නට මට සිතිණි.

දෙ නෙතින් පිට වුණු කෝපයේ ගින්නට අසු වීමෙන් කඳුළු වියැළී ගියේ ය. එසේ දෙ නෙත් වියැළී යත් ම හදවත ද දුව් විය. මා තුළ රෝහණ ගැන තවදුරටත් බියක් නැත. කැදර දෙ නෙතින් පුන් පෙරේරාගේ අමිලක්ෂණ මුහුණ මට මතක් විය. ඔව් ...ත් මා

www.sinhalaelibrary.com

ඔහුටත් බිය නැත. ලෝකයේ කිසිවකුට බිය නැත. මම මින් මතු කිසිවකු ඉදිරියේ බැගෑපත් නොවෙමි. කවරකුට කුමක් වුණත් මම මින් මතු කිසි දවසෙක මගේ හැඟීම්වලට යටත් නොවෙමි.

පුදුම් ආත්ම ශක්තියක් හා එඩිතරකමක් ඇතිව ඉස්තෝප්පුවට පැමිණි මම රෝහණ ඉදිරිපස අනෙක් පුටුවේ වාඩි වීමි.

"අඬල ඉවරද?"

"මොකද මූණ ගැහෙන්න ඕනැයි කිව්වෙ? කියන්න බලන්න. මොකක්ද කාරණය කියල දැන ගන්න?"

සිත් ඇදගන්නා මුහුණක් තිබුණත් හැඩිදඩි අතපය හා ඇඟපත ඇති රෝහණ හතුරුසිංහ පුදුමැලි වී ගොස් සිටියේ ය. මම ආත්ම ශක්තියෙන් තවත් උදම් වීමි. වෙන අවස්ථාවක වෙන තත්ත්වයක් යටතේ නම් මා තුළ ඇති විය යුතුව තිබුණේ අනුකම්පාවකි.

"මොකද කුසුම් තරහ ගිහිල්ල වගෙ?"

තමා කිසි ම වරදක් නොකළ එකකු බව පෙන්වීමේ උත්සාහයෙන් රෝහණ ඇසී ය. ඔහු චපලයෙකැයි මට සිතිණි.

"මොකද අපිට තරහ යන්න තහනම් ද? අනිත් අයට වගෙ අපිටත් තරහ යනව."

"කුසුම් අද අමුතු කෙනෙක් වෙලා. ඔහොම තමයි. ඔය ඕනෑ නැති මිනිස්සු එක්කල ආස්සරේට වැටුණම.............."

මම නිහඬ වීමි. රෝහණ අතේ තිබුණු සිගරට් කොටයෙන් තව එකක් පත්තු කර ගත්තේ ය. මේ ක්‍රියාව ඔහුගේ පෙනීමෙන් හෝ කතාවෙන් හෝ නොවූ අනුකම්පාවක් මා තුළ ඇති කරවීමට සමත් වූයේ ඇයිදැයි මම නොදනිමි.

"ඊයෙ මට කේන්ති ගියා කුසුම්. කුසුම් සමූපකාරෙ වැඩට යනව කියල ආරංචි වුණා ම මට ලොකු හිතේ අමාරුවක් ඇති වුණා. තරහක් විතරම නෙවි."

"මිනිසුන්ට කේන්ති යනව දෙවෙනියියෙ. නමුත් කේන්ති ගිය පළියට පිස්සො වගෙ වැඩ කරන්නෙ නෑ.............. මා දිහා තාන්න



වගෙ ඔරවගෙන හිටිය. අර කෙල්ලන්ට වුණත් තේරෙන්න ඇති. අද නොගියම තවත් මොනව හරි හිතයි."

"ඒකට කමක් නෑ"

"කමක් නෑ ඔය කෙල්ලන්ට. දුප්පත් වුණත් මටත් ආත්ම ගෞරවයක් තියනව. මට නම් මොනව වුණත් කමක් නෑ. තව කෙල්ලෙක් ගෙදර ඉන්නව.............." කඳුළු! මා කඳුළු නොහෙළිය යුතුය. "අපි දෙන්නෙක් නැති වුණා. ඒකිට වත් කලක් යන්න එපායැ? මම දුප්පත්කමට රක්ෂාවකට ගියා. මොකද මම මේ........... වල්කමකට ගියා ය?"

"ඒක තමයි මම කියන්නෙ. ඔය පෙරේරා වගෙ කෙනෙක් ළඟ රස්සාව කරන කොට ඕනෑ හොඳ කෙනකුට කතන්දර හැදෙන්න පුළුවනි. කුසුම් යන්න ඕනෑ නෑ ඔය රස්සාවට. ඒකයි මම කියන්න ආවෙ."

මම ඊට කිසිත් නොකීමි. මගේ නිහඬතාව 'ඒක තමුසෙට අයිති වැඩක් නොවෙයි' යන පිළිතුරට සමාන වන්නට ඇත. එයින් ඔහු අමාරු තත්ත්වයකට පත් වුණා නියත ය. ඊළඟට කියන්නට දෙයක් මගෙන් අල්ලා ගත නොහැකි ව ඔහු ද ටිකකට ගොළු විය. මම හිතුවක්කාර වීමේ - මුරණ්ඩු වීමේ - බොළඳ ආස්වාදයක් ලැබීමි.

"කුසුම් අද ඉඳල නවතින්න. මීට පස්සෙ යන්න එපා. ලැජ්ජ නැද්ද ඔතෙන්ට යන්න?"

මා කල් ගෙවූයේත් ඒ ගැන සිතමිනි. එහෙත් මම රක්ෂාව ගැන කලකිරී සිටින බවක් ඔහුට නොපෙන්විය යුතු ය යි තීරණය කර ගතිමි.

"දෙවෙනියිය ඔය කතා කරන්නෙ මගේ පැත්ත - මම වැටිල ඉන්න තත්ත්වය ගැන මේ.............. ඇබිත්තකටවත් කල්පනා කරලයෑ දෙවියනේ?" ශෝකයත් කෝපයත් මුසු හඬින් මම කීමි.

"කල්පනා කරල කුසුම්! අන්තිමට ම කල්පනා කරල තමයි මම ඕක කියන්න ආවෙ."

www.sinhalaelibrary.com

"කල්පනා කළා නම් කවදාවත් ඔහොම කතා කරන්නෙ නෑ. මාසයකට රුපියල් හතළිස් පහක් කියන්නෙ මට ලොකු දෙයක්..........."

"කුසුම් ඒව ගැන බය වෙන්න ඕනෑ නෑ. මම කුසුම් ගැන ඔක්කොම බලා ගන්නම්."

"මම කාටවත් බරක් වෙන්න ඕනෑ නෑ." ඉවත බලාගෙන ඒ මම මොහොතක් සිට "අනික දෙවෙනියියට හිතෙන්නෙ නැද්ද මට මෙහෙම ගෙදර රස්තියාදු වෙන එක ලේසි දෙයක් නෙවි වගෙ? මම පිස්සු වැටෙයි මෙහෙම හිටියොත්" ය යි කියාගෙන නළලට පහරක් ගසා ගතිමි.

"ආයෙත් කියනවා! මම කුසුම්ට ඔහොම වැඩිකලක් රස්තියාදු වෙන්න ඉඩ තියන්නෙ නෑ. ඒක මම තීරණය කරල ඉවරයි."

"තීරණය? මොනවටද?"

"කුසුම් ඔබෙක්ද කුසුම්? මම කියන එක කුසුම්ට තේරෙන්නෙ නැද්ද?"

"තේරෙනව"

"ඉතින්"

මම නළලට අත තබා ගතිමි.

"ඔයා කැමැති නැද්ද?"

මම එද කතා නො කළෙමි.

"ඒ ටික විතරක් කියන්න එහෙනම් දනට"

"මම දන්නෙ නෑ"

රෝහණ මඳ වේලාවක් කතා නැති ව සිටියේ ගත හැකි ය යි සිතෙන තරම් ළඟ - එහෙත් අත නොපොවිවන සෙව්වක ඇති - සෙල්ලම් බඩුවක් ගන්නට ගොස් බැරි වූ පුංචි ළමයකු තුළ ඇතිවන කෝපයෙන් හා නො ඉවසිල්ලෙන් විය යුතු ය. ඔහු ඊළඟට කතා කළේ මට නොව තමාට ය.



"මුරණ්ඩුය මුරණ්ඩුය කිව්වට මම නම් හැබෑ ගත්තෙ නෑ. දැනුයි තේරෙන්නෙ"

මා මුරණ්ඩු ය යි මට කලින් කියන්නට ඇත්නම් එසේ කියා ඇති එක ම පුද්ගලයා ඔහුගේ සහෝදරයා පමණක් විය යුතු ය.

"මුරණ්ඩුකමක් මගෙ ඇති එකක් නෑ. කල්පනා කරල පස්සෙ වචනයක් දෙන්නම්." ය යි කියමින් සිට ගත් මම අත් බැඳගෙන පාර දෙසට හැරී කුළුණකට හේත්තු වීමි. නිසැකව ම ඔහු කෝපයට පත් විය. රෝහණ කෝපයට පත් කරවීම මට අද එක විදියක සෙල්ලමකි.

"මොනවද කුසුම් ඔය තරම් කල්පනා කරන්න තියෙන්නෙ..........?"

"මමත් එහෙම හිතුව එක සැරයක්..........." මම ඔහු දෙසට හැරී තැඹුරු වී කීමි. "මම සැරයක් එහෙම හිතල ඇස් දෙක පියාගෙන කණෙක් වගෙ බීරෙක් වගෙ හැඟීම්වලට යට වෙලා එක්කෙනකුට වචනයක් දුන්න. වචනෙ දීලයි අනික්ව බැලුවෙ. ඒ මෝඩකමට පෑහෙන්න එන්දි මම ගෙව්ව. ඒ නාට්‍යය ආයිත් සැරයක් රඟ පාන්න ඕනෑ නෑ දෙවෙනියියෙ. ඒකෙ රඟේ මම දන්නව. කවුරුවත් දන්නෙ නෑ මම බිව්ව කඳුළුවල රස.............."

මම ආපසු හැරී පුටුවේ වාඩි වීමි.

"........... මම ඒ මෝඩ කෙල්ල නෙවි දන්. ඒ වැටුණු වළේ දවල් වැටෙන්න ඕනෑ නෑ."

"හොඳයි ඒ තත්ත්වයක් එන්නෙ නැත්නම් කුසුම...........?"

"කොටින් කියනොත් මගෙන් අහන්න එපා! මගෙ අතේ නෙවි උත්තරේ තියෙන්නෙ.........." මී ළඟට කියන්නට ගිය දෙයට අනතුරුව 'අර ගුණපාල කියන්න වගෙ' යි නිතැතින් ම මගේ කටට ආ නමුත් මම ඔහුගේ නම ගිල ගතිමි. එහෙත් ගුණපාල පිළිබඳ මතක මට මෙහි දී උපදේශකයෙක් විය. "........... මේ සමාජයෙ මේ වගෙ තැනකදී දෙන්නගෙ කැමැත්ත නෙවි බලන්නෙ. ප්‍රේමය, ආදරය ඕවගෙ වචන දල කතා කළැකි. දෙන්න දෙන්නට ආදරේ නම් දෙන්න දෙන්න ගැන

අවබෝධයක් ඇත්නම් සැපවත් විවාහයක් ගත කරන්න පුළුවන්. කියල කිව්වට ඒව ගණන් ගන්නෙ නෑ. ඒව යට කරන ජාතියක් තියනව. අපි නිකම් වෙළඳ බඩු! එච්චරයි! බඩුවක් විකුණන කොට ඒ බඩුවට පුළුවන්කමක් නෑ තමන් කැමති කෙනකුට විකිණෙන්න. විකුණන මිනිහයි ගන්න මිනිහයි කැමති වෙන්න ඕන. විකුණන මිනිහට නම් ඕනෑ කරනව සමහර වෙලාවකට ඉක්මනට විකුණ ගන්න. පරණ වෙලා යන්න කලින්. ඒ නිසා දෙපැත්ත කතා කරල බලන්න. මගෙ වගක් ඕනෑ නෑ............."

"කුසුම්ට ඔහොම කතා කරන්න අයිතියක් තියනව. මම නෑ කියන්නෙ නෑ. නමුත් මෙතන දි එහෙම ප්‍රශ්නයක් මතු වෙන්නෙ නෑ! කුසුම් මම ඒ ගැන වග බලාගන්නම්"

"ඕවගෙ කතාවල් තවත් හතුරුසිංහ කෙනකුගෙන් අහල මම මෙල්ල වුණේ නෑ දෙවෙනියියෙ. අයිය තරහ වෙන්න එපා. මම මෙහෙම කතා කරන්නෙ මමයි මේව විඳවන්නෙ. ඒකයි! එක් කෙනෙක් නිසා මට ගෙදරක් වගෙ යන්න තිබුණෙ එක තැනයි. ඒක නැති කර ගත්ත. ඒ වරද නැත්නම් අද මට ලොකයිය ළඟට ගිහිල්ල රස්සාවක් හරි හොයල දෙන්න තියන්න තිබුණා. දැන් දෙවෙනියිය ඉන්නව. ගමට ආව දකවත් නිකමට හරි ගොඩවෙලා යනව. ළඟ පාතක හෝ හිටියත් මේ පිරිමි පුළුටක් නැති ගෙදර ඒක අපිට ධෛර්යයක්. ඒකත් නැති වෙන පොටක් මෙතන එච්චරයි ඕවයින් වෙන්නෙ"

මම වෙහෙස වූ ගතියකින් මඳක් කතා නැති ව සිටි අතර රෝහණ ද ඒ නිහඬතාවට එකතු විය. කඳුළු ඉනීමෙන් මෙන් ඔහුගේ දෙනෙත් තෙත් වී ඉදිමී තිබිණි. මට තිස්ස මතක් විය. තිස්ස තරම් බොළඳකමක් රෝහණ වෙත ද දුටුවෙන් නැවතත් මගේ සිත අනුකම්පාවකින් උණු වී ගියේ ය.

"දෙවෙනියියට මම එකක් කියන්නම්: හිතේ කහටක් හෙම තියනව නම් ඒක නැති කරගන්න. මගෙ වෙන දෙයක් ගැන හෙම හිතේ තියන නිසා මෙහෙම කතා කරනව නෙවි. ඉස්සර වෙලා ගිහිල්ල නැන්දට කතා කරන්න. නැන්ද කැමැති නම් අම්මලට කියන්න. මගේ හිතේ හෙම මොකුත් නෑ. එච්චරයි. අම්මල කැමැති නම් මට කමක් නෑ. මම හිත හදගෙන ඉවරයි.



මට ඕනෑ කෙනෙක්. මට කවුරු හරි!" මගේ හඬ උස්වෙයි. "..........
කුසුම් අන්න අර පාරෙ යන හිඟන්න එක්කල උඹ යන්න ඕන කියල පාරෙ හිඟන්නෙකුට කතා කරල මට අම්ම කිව්වොත්, මට තියෙන්නෙ යන එකයි. මම සිය කැමැත්තෙන්ම යනව. මගෙ තියෙන්නෙ එකම එක ඉල්ලීමයි. කා එක්ක ගියත් මම යන තැනක අන්න අර අම්මප්ප නැති දුප්පත් කොල්ලන් එක්කල යන්න ඕනෑ. එකක් දෙවෙනියියෙ ඕනෑ මිනිහෙක් එක්ක මට බයක් නැතුව යන්න පුළුවනි. මට හිතේ බයක් නැතුව වෙව්ලන්නෙ නැතුව ඕනෑ කෙනකුට අත දෙන්න පුළුවනි. මට ඒ බය නෑ! කියන්න ගිහිල්ල ඔය කොල්ලන්ගෙ අම්මට අන්න ඒක. ඒවට ඒ කොල්ලගෙ ගෞරවයක් තියනව නම්..............! මට..........."

"කුසුම්!"

"මට කැමැති කෙනකුට ආදරය කරන්න අයිතියක් නෑ. කැමැති කෙනෙක් එක්කල සන්තෝසෙන් ජීවත් වෙන්න මට අයිතියක් නෑ. නමුත් මට අයිතියක් තියනව මගෙ සීලාචාරකම රැකගන්න. මම ඒ ටික රැක ගත්ත. ඩීයාරෝ මහත්තයගෙ අම්මට කියන්න ඒක. ලොකු පුතාංඩිය එකම එක දවසක් මගෙ මූණ ඉඹල ඇති! එච්චරයි කියල. ඒක.........."

"කුසුම් මොකද මේ පිස්සියෙක් වගෙ නෑ ගහන්නෙ පාරවල් ඇහෙන්න............? කවුරුත් කුසුම්ගෙ වරදක් කියල තියනව ද?"

"මුළු ගමට ඇහෙද්දෙන්! මට මොකද්ද" යි කී මුත් මගේ හඬ එක වර බාල විය.

"............... මම හිතනව ඒ වැරැද්දට පිරිමියෙක් මට කවද හරි සමාව දෙයි" යනුවෙන් අනතුරු ව මා කියා ගත්තේ කඳුළු සහිත ඇද තෙත් ඇතිව මට ම ය.

ඊළඟ නිහඬතාවයේ දී මගේ වේගය යළි වැඩි විය. ඒ අනුව නැවත මා කතා කරන්නට වූයේ උස් හඬිනි.

"පුංචි නංගී මොනව කර ගනීද මම දන්නෙ නෑ. නමුත් මම හෙම ඉඩ තියන්නෙ නෑ අක්කගෙ වරදින් අපිටත් පාරෙ බැහැල යන්න බෑ කියල කියන්න. අම්මට නැරඹිටි වාරුවෙන් හරි

www.sinhalaelibrary.com

වෙළඳාමෙ යන දවසක පාරෙ බැහැල යන්න පුළුවනි. මම නිසා මූණ හංග ගෙනගෙන. අම්මට පින්සිද්ද වෙන්න මම ඒ නම්බුව රැක ගත්ත. අපේ අම්ම සිලාචාර ගෑනියෙක් අපේ අම්ම නම්බුවට කැමැති ගෑනියෙක් දුප්පත් වුණාට. ඔන්න ඔය සෝමෙ විපත්තියක වැටුණ නෙවි. විපත්තියක දම්ම කවුරු කවුරු හරි එකතු වෙලා. සෝමෙගෙ ජීවිතයට හවුල් වුණු කවුරුත් එක කියන්න ඕනෑ ඒකට! හැ-මෝම!"

"පත්තරකාරයෙක්............."

දඟ කළායි චෝදනා ලද ළමයකු වරදින් බේරෙන්නට "මම විතරක් නෙවි අර ගොල්ලොත්" ය යි කියන කතාවක් මට මතක් විය.

"ඔව්! වල් පත්තරත් ඇතුළුව හැමෝ ම"

අඳුරු වීමෙන් අවලක්ෂණ වූ මුහුණක් මම දුටුවෙමි. එය විත්තිකරුවකුගේ මුහුණකි.

නිශ්ශබ්දතාවක් මැද කාලය ගෙවී යන්නට ගන්නා උත්සාහය ගුම් ගුම් හඬින් කන් සිදුරු අසල රැව් පිළිරැව් දෙන්නට විය.

"කුසුම් මම ගිහිල්ල එන්නම් නංගියෙ එහෙනම්"

"දෙවෙනියියට තේ එකක්වත්.........."

"කමක් නෑ. මම තේ බොන්න පස්සෙ වෙලාවක එන්නම්"

"අයිය කවද්ද වත්තට යන්නෙ?"

"කියන්න බෑ."

"අපි අතරෙ මෙහෙම දෙයක් නොවුණ කියල හිතාගෙන අයිය ඉස්සර වගෙ යන්න එන්න."

රෝහණ හතුරුසිංහ පිට ව ගියේ ය. ඔහු ගමන් ගත්තේ කලක් තිස්සේ ගොඩ නංවාගෙන තිබුණු විසිතුරු මන්දිරයක සුන්බුන් අතර ඇවිදගෙන ය යි මට සහතික ය.

අසනීප බවක් කියා මඟ යන කෙනකු අත කඩයට ලියුම් කැබැල්ලක් යවන්නට පුළුවන. එහෙත් නිල්මිණි කැඳවාගෙන එන්නට යා යුතු බැවින් බොරුව අසු වෙයි. නොයෙක් පැත්තට



කල්පනා කළ මම පුංචි ළමයකු ගෙන එන්න දවාලට පාසලට යන අහල පහළ කාන්තාවකට නිල්මිණිත් එක්කරගෙන එන්නැ යි කියා ඇය අත ම සමුපකාරයට ලියුම් කැබැල්ලක් ද යැවීමි.

ජීවිතයෙහි අද්භූත ජනක ස්වභාවයක් පවතී ද? තමන්ට තමන් ගැන ම ඇතැම් කරුණු උඩ අවබෝධයක් ලැබෙන්නේ කලාතුරකින් හදිසියේ ය. රෝහණ සම්බන්ධ ව මෙදින මගේ ක්‍රියා කලාපය එක අතකින් බලන කල මට ම පුදුමයකි. මා මෙසේ හැසුරුණු අන් අවස්ථාවක් ගැන මට සිතා ගත නො හැකි ය. මගේ හැසිරීමත් කතාවත් මගේ ම ද යි මට ම සැක පහළ වෙයි. මා පළ කළේ මා වෙත තිබිණැ යි මා දන සිටි අදහස් නොවේ. ගුණපාලගේ බලපෑමට යට වූ අනුලා මා වෙනුවෙන් කතා කළා ද යි වරෙක මට සිතෙයි.

අනෙක් අතට කල්පනා කර බලන කල ජීවිතයේ මෙවැනි අවස්ථා නිතර එළැඹෙන්නේ නැත. කලාතුරකින් පත් වන එබඳු අසාමාන්‍ය අවස්ථාවක දී - විශේෂ තත්ත්වයක දී - අසාමාන්‍ය විශේෂ ආකාරයකින් හැසිරීමේ හෝ කතා කිරීමේ හෝ කිසිදු අද්භූතයක් නොතිබෙන්නට පුළුවන.

තමන් තුළ පිහිනීමෙහි හැකියාවක් තිබේ ද නැද්ද යි සෙවීමේ වුවමනාවක් හෝ අවස්ථාවක් හෝ නොවුණත් එවැනි හැකියාවක් තිබෙන බව නොදන සිටි කෙනකු හදිසියේ දියඹට අසු වී, සාර්ථක ලෙස මරු මුවින් බේරී වෙරළට ළඟා වූ පසු ඇති වන්නේ ජීවිතය බේරා ගැනීමේ තෘප්තිය හා සන්තුෂ්ටිය පමණක් නොවේ. මෙතෙක් නො හඳුනාගෙන සිටි දක්ෂකමක් තමා වෙත විණැයි අවබෝධ වීම නිසා ආස්වාදයකින් ඔහු පිනා යයි. සිද්ධිය දෙස ආපසු බලන කල මමත් එවැනි තෘප්තියකින් හා සන්තුෂ්ටියකින් ද ආස්වාදයකින් ද පිනා ගියෙමි.

කෝපයට පත් රෝහණ නිසා ඇති වූ බිය ඔස්සේ උපන් ළෙන්ගතුකමකින් ඔහු වෙත වඩ වඩා බැඳෙන්නට ගිය මම ඒ බැඳීම නිසා සිතින් දුබල වී ගියෙමි. හැඟීම්වලට යට ව සිටි මා විත්ත ධෛර්යය හා එඩිතරකම ලබා ගත්තේ කුමකින් කොතැනක දී දැයි දත් මට විනිශ්චය කර ගත නොහැකි ය. කෙසේ හෝ මම ජය ගතිමි.

www.sinhalaelibrary.com

දැන් කල්පනා කර බලන කල මා කතා කළේ පිස්සියක මෙනි. මා තුළ එවන් වේගයක් සැඟැ වී තිබුණු බවත් මම නොදැන සිටියෙමි. මා එසේ ක්‍රියා කළේ කුමන හේතුවක් උඩ ද?

රෝහණ මට විවාහ යෝජනාවක් කළේ ය. තරුණයකු හා තරුණියක අතර ළමා වියේ සිට පැවැති සමීප ඇසුරක නියත ප්‍රතිඵලය වශයෙන් මතුවුණු මේ යෝජනාව කාරුණික ලෙස ප්‍රතික්ෂේප කළ හැකි ව තිබිණි. කෝපාවිෂ්ට වීමට තරම් අවශ්‍යතාවක් මෙතැන නැත. එහෙත් මම කිපුණෙමි.

තමන් අතින් හදිසියේ ප්‍රබන්ධය වුණු කාව්‍යයක් නැවත නැවතත් කියවා නිර්මාණ ශක්තිය ගැන ආඩම්බරයක් හා තෘප්තියක් විඳින කලාකාරියක මෙන් මම මගෙන් රෝහණට කියැවුණු වචන නැවත නැවතත් මතක් කරමින් ආස්වාදයක් ලැබීමි.

අනුලා එන තුරු නො ඉවසිල්ලෙන් සිටි මම ඇයට මා හැඬූ බව හැර අන් සියල්ල කීමි.

"ඇති යාන්තම්! ඔය ටිකවත් කියා ගත්ත" මගේ විස්තර අවසානයේ ඉමහත් සැනසිලි ගතියකින් පුංචි නංගී කීවා ය.

"මොකද උඹ හිතන්නෙ මම බයගුල්ලෙක් කියලද?"

"බයක් නෙවි. අක්කට බැහැ කෙනෙකුගෙ හිත රිදවන්න. ඒකයි. ඒකනෙ ලොකු අක්කට වුණෙත්"

"මටම පුදුමයි නංගියෙ. මට ඔය ටික කියා ගන්න ලැබුණට..........."

"මිනිහ හිතන්න නැතුව ඇති ඔහොම එකක්."

"ඔව්! කළුවෙලා ගියා මූණ. මට පවුත් කියල හිතෙනව වෙලාවකට"

"අන්තන්න! අන් න ඒ අනුකම්පාව නම් භයානකයි"

"නෑ මම එහෙම හිතනව නෙවි. මොනව කිව්වත් අපිට හිතවත්නෙ? සහෝදරයෙක් වගෙ"

"ඒක ඇත්ත අක්කෙ. පිහිය රත්තරන් කියල නැගෙනෙ තුවාලවෙනව............."



මම බිම බලාගෙන සිනාසීමි.

"ගුණපාල ඕක කිව්ව නෙ. රෝහණ මට යෝජනා කරයි කියල."

"ඇත්-තෙත්!"

"ඒ ළමයට දිවැස් තියනව වගෙ. අපි ඒ කාලෙ හිනාවුණා පිස්සු ළමය කියල. නමුත් මොනව කිව්වත් කියන හැම දෙයක් ම ඇත්ත........... බලාපල්ලකො මේකිගෙ මූණෙ තියන සතුට. මම ගුණපාලගෙ හොඳ කතා කරන කොට..........."

"මට වැඩිය සතුටු නැහැ අක්කට"

"මොකක්ද ඒ මනමාල කතාවෙ තේරුම?"

"ලොකු අක්ක ඕනෑ විදියක් හිතන්න. මම කිව්වෙ ගුණපාල මම දන්නෙ අද ඊයෙ. අක්කගෙ පරණ යාළුවෙක් එකට ඉගෙන ගත්ත. අක්ක ප්‍රශ්න විසඳ ගන්න ගියේ එයා ළඟට. ඒකයි..........."

"ඒක මිසක්.............! මට ඉවසිල්ලක් නෑ ගුණපාලට මේ කතාව කියා ගන්න තල්."

"අක්ක ඕක ගුණපාලට කියනවද?" අනුලා ඇසුවේ නො ඉවසිල්ලෙනි.

"සේරම ජානි කියන්නෙ නෑ. සමහර කෑලි කියන්න මට ලැජ්ජයි‍න්. යෝජනාවක් කළා කියල කියනව. ගුණපාලටත් සතුටු හිතෙයි. එයාගෙ අනාවැකිය හරි ගියා කියල."

"අම්මට?"

"කියන්න ඕනෑද නංගියෙ?"

"එක්කො මොටද නැති ප්‍රශ්න අම්මගෙ ඔළුවට දන්නෙ?"

"කල්පනා කරල බලල කියමු."

"මට නම් තේන්නිම මෙන්න මේකට අක්කෙ. එයාට තේරෙන්න ඕනෑ නේ දැන් එකක් වැරදුණෙත් අක්කගෙ අකමැත්තෙන් නෙවිනෙ. මේකටත් ඒකමනෙ. ඒ ගොල්ලන්ගෙ අම්මට මුලින් ම කතා කරල අවසරයක් අරන් එන්නැ ඕනී නෑයි?"

"ඒක තමයි මම කිව්වෙත්"

"ඔවුන් ඔක්කොම අම්මණ්ඩිට බයයි. ඒ ගැනි.............."

"නෑ ඉතින් අම්මට කීකරු වුණාට අපේ මොකද? ඒක හොඳයි"

"වැරැද්දක් මම කිව්ව නෙවි. අම්මගෙ හිත හද ගන්න මහන්සි ගන්නෙ නැතුව එනව මෙහෙන් පටන් ගන්න. අක්කගෙ හිත අවුස්සල ඊට පස්සෙයි විසඳුම හොයන්න යන්නෙ.........."

"ඒක පිරිමින්ගෙ ගතියක් වෙන්න ඇති. නේද? ගැනියෙක් කසාද බැඳ ගන්න බැරිවුණාට කමක් නැතුව ඇති. ඒ ගැනිගෙ හිත දිනා ගන්න පුළුවන් නම්. හිත අරගෙන ඒ ගැනි තමන් වෙනුවෙන් මැරෙන්න වුණත් සූදානම් බව දැන ගත්තොත් තමන් නිසා වද විඳින බව දැන ගත්තොත් එයින් තෘප්තියක් විඳිනව ඇති ඒ ගොල්ල. මට හිතෙනව එහෙමයි කියල."

"පිරිමි ගැන නොහිත හිටියම තේරටම වැඩිය ලේසියි."

"පුළුවන් නම් කොයි තරම් හොඳ ද?"

අනුලා කතා කළේ නැත.



# 10

**නො** සන්සුන් වූ සිතින් යුතු ව - නමුත් ධාවිර වශයෙන් වෙනසක් නොපෙන්වා - මම ඊළඟ ද වැඩට ගියෙමි. බොරුවක් කියා දවසක් නතර වීම නිසා පෙරේරා දුටු කල පාසල් යන කාලයේ නියමිත පරිදි ඉරිද සවස නැති ව සඳුද උදේ නේවාසයට ගිය අවස්ථාවල මෙට්‍රන්වරියට මුහුණ දීමේ දි උපන් අන්දමේ චකිතයක් ද බියක් ද මට ඇති විය.

ඔහු සිනාසුණේ ජය ගත්තකු ලෙසිනි.

"අපි මේ අසනීපකාරයන් බලන්න යන්න නෙ හිටියෙ." පෙරේරා සාවඥ සිනාවක් ඇතිව කීය. ඒ සිනාව හඳුනා ගන්නට අසමත් වූ බවක් පෙන් වූ මම,

"නෑ මේ නිකම් බඩ රිදෙන්න හැදුණා." යි කීමි.

"සමහරෙකුට ඔහොම අමාරු හැදෙනව ඔය වයසට"

බොරුවක් කියා වැඩට නො පැමිණීමේ අර බිය එතෙකුදු පැවති බැවින් මම කෝපය පිට කිරීමට පසුබට වීමි. මම ඉවසාගෙන සිටියෙමි.

"අපි නොගියට බලන්න යන්න ඕනෑ අය යන්න ඇතිනෙ?" ඔහු තවත් උදම් වී කීවේ ය.

මම නැතී ගතිමි. ඔහු මෙතැනින් නතර නොවනු ඇත. මට පීඩා කළ හැකි යමක් ඔහු අතට අහු වී තිබේ. ඔහු මෙය මට විරුද්ධ ව නිරතුරු ව පාවිච්චි කරනු ඇත.

"හොඳයි..........! හොඳයි!"

කතා නැති ව සිටි මම වරින් වර ජනේලයෙන් 'සිසිල' දෙස නො බලා සිටින්නට අසමත් වීමි.

"වට පිට බල බලා වැඩ කරන කොට ගණනුත් වරදියි. එයා ගෙදර නෑ. උදේ ගියා."

"ඕනෑ නැති කතා හදන්න එපා මැනේජර් මහත්තයා"

"නෑ මම කිව්වෙ අර ගේ පැත්ත කොච්චරවත් බලන නිසා"

"මම පුරුදු වෙන්න බැලුවයැ?"

"පු-රු-දු පාටයි!"

දවල් කමලාවතී තේ බොන්නට කතා කළ විට මම සතුටට පත්වීමි.

"උඹ ඊයෙ ආවෙ නැද්ද කුසුමෙ?" ඈ ඇසුවා ය.

කමලාවතීට බිය වීමේ හේතුවක් දත් මට නැතත් මම බියට පත් වීමි.

"ඊයෙ බඩේ අමාරුවක් හැදිල හිටිය නැත්දෙ?"

"දෙවෙනිය එහෙ ගියාද?"

මගේ බිය අලුත් විය.

"ගියා"

"උඹට මොකුත් කිව්ව ද?"

කමලාවතී කෙතෙක් දුර දනිත්ද යි සැකයක් මතු වීම නිසා මට පරිස්සමින් කතා කිරීමේ නුවණක් පහළ විය.

"සමූපකාරෙ වැඩට එනවට දෙවෙනියිය කැමැති නෑ"

"ඒක තමයි! මටත් බැන්න උඹට ඔතන ඔන්නුව කිව්වෙ අපිටි කියල."

"දෙවෙනියිය ගියා ද?"

"ඕකට තරහ වෙලා ගියා ඔන්න උදෙන්ම"



මා සිනාසුණා මිස කතා කළේ නැත.

"ඔය මැනේජර තරක මිනිහෙක්ය කියන්නෙ."

"ටිකක් එක විදියක් තමයි. ඒත් අපිට මොකද?"

"මොනව වෙනවද කුසුමෙ තමන් හොඳ නම්? උඹ ගැන අපි නොදන්නව යැ? අනික ඒ ඇරත් මම මේ නිතරම සෝදිසියෙන්."

පුංචි නංගීත් මාත් කල්පනා කළ ලෙසට ම රෝහණ මට විවාහ යෝජනාවක් ඉදිරිපත් කරන්නට පැමිණ ඇත්තේ මටට කලින් දනුම් දී නොවේ. ඔහුට ඒ තරම් එඩිතරකමක් නැත. යෝජනාව ප්‍රතික්ෂේප කිරීමෙන් මා කළ ක්‍රියාව සාධාරණ ය යුක්ති සහගත ය යි මම තවත් ධෛර්යයට පත්වීමි.

පෙරේරා මට තව කීප වරක් ම ඇනුම් පද කිවේ ය. ගෙදර යන අවස්ථාව එන තුරු මා දවස ගෙවූයේ නො ඉවසිල්ලෙනි.

ඊළඟ ද කඩයට යන වේලාව එළඹෙත් ම මගේ සිත අලුතින් සැලෙන්නට වන්නේ ය. පෙරේරාගේ මුහුණේ කලින් දවසේ වූ ජයග්‍රාහී ආඩම්බර සිනාව වඩාත් ඔප වී තිබෙනු දුටු කල මගේ සිත බියකින් ඇළැලී ගියේ ය.

"මයිකල් අපි මේ තරම් දෙයක් දන්නෙ නෑ නෙ. දනුයි නෙ මේව එළිවෙන්නෙ." යි ඔහු කීය.

මයිකල් අසරණ ලෙස සිනාසුණා පමණකි. ඔහුගේ ඒ ක්‍රියාව මා වෙත දක් වූ අනුකම්පාවක් හා පක්ෂපාතකමක් මෙනි.

පෙරේරා අදහස් කරන්නේ කුමක් ද? කුමක් වුවත් ඒ වචන එල්ල වූයේ මා වෙත ය. පොළොව පළාගෙන යන්නට තරම් ලැජ්ජාවක් හට ගත් අතර ම හැදෙන්නට යන - නැතහොත් දනටමත් හැදී ඇති - අපවාදයේ සම්පූර්ණ අර්ථය දැන ගැනීමේ කුතුලක් ද මට ඇති විය.

පෙරේරා කඩයට බඩුගෙන යෑමට පැමිණ සිටි දරියකගේ කණෙහිත් ඇද්දේ ය.

"අනේ නිකා ඉන්නකො" යි ඈ ඇඹරෙමින් කීවා ය.

"උපාසකම්ම! අපි නිකම් අත තිබ්බොත් බොහොම විසයි. හතරට ගනින්න බැරුව වගෙ උඹල ඉන්නෙ නම්."

www.sinhalaelibrary.com

තුඩා දුටියට හැර එහි සිටි කාටත් ඒ වචන ඇය වෙනුවෙන් කියැවුණු ඒවා නොවන බව වැටහෙන්නට ඇත. කාන්තාවන් වහා මා දෙස බැලුවා ය.

පෙරේරා කතා කළේ කෝපයක් හා වේදනාවක් මිශ්‍ර හඬකිනි. වැඩ කටයුතුවලදී - අනවශ්‍ය තැනක දී - මිස ඔහු එදා මා හා කතා කළේ නැත. මා තුළ කලකිරීමක් ද ශෝකයක් ද උපන්නේ ය. එක්තරා පුද්ගලයෙකුගේ විශේෂ ක්‍රියාවක් නිසා නොවේ. මිනිසුන්ට මේ තරම් දරුණු විය හැකිද? ඔහු හා මා අතර හිතවත්කමක් නොවී ය. එහෙත් අපි ටික කලක් එක තැන සේවය කළෙමු. ඇසුරු කළෙමු. ඔහු මට දන් ඇනුම්පද කියන්නේ ඒ සියල්ල අමතක කර අපකීර්තියට පත් වල් කෙල්ලක ලෙස සලකාගෙන ය. මගේ කලකිරීම මිනිස් සංහතිය ම ගැන ය.

ගෙදි වියත යුවතියන් සමහරකු වෙත වෙන ද පැවැති හිතවත්කම නොමැති බව මට සවස ආපසු ගෙදර එද්දී පැහැදිලි ව පෙනී ගියේ ය. මා එකතු වීම නිසා ඔවුන්ගේ රහස් කතාවකට බාධාවක් වූ බවට හැඟීමක් ද මට ඇති විය. වැඩි දෙනකු මා දෙස බැලුවේ සැකයෙන් හා කුතුහලිනි. මට තරහක් ද ඇති විය.

"අක්කෙ අන්න ගැන කතාවක් තියනවලු මොකද්ද ගමේ" අනුලා සවස බිය රැඳි ස්වරයෙන් මට කීවා ය. බැරෑරුම්කමක් තවත් එකතු කරනු නොරිසි වූ මම මට ඇසුණු ඇනුම් පද ගැන නොකියා,

"මොන කතාවක්ද" යි උදාසීන ව ඇසීමි.

"මම හරියටම දන්නෙ නෑ. මට නිකම් ඉස්කෝලෙදී ආරංචි වුණා.........."

"මොකක් ගැන ද?"

"දෙවෙනියගෙ නම ගාවල. සෙනෙහෙලතා කිව්වෙ"

"ඕක මොකක් ද? ඉස්සරත් ගමේ මිනිස්සු නොයෙක් දේ කිව්වය කියන්නෙ. නොයෙක් දේවල් දෙවෙනිඩියගෙ නම, පුංචි අයියගෙ නම ගාවල. ඕව ගණන් ගන්නෙ කව්ද?"

"නමුත් මට නිකම් සෙනෙහෙලතාගෙන් තේරුණේ මේක ටිකක් සැරට යන එකක් වගෙ."



නැති ගත් හමක් මම නංගීට වෙනසක් නොපෙන්වීමි.

ලෝකයාට මුහුණ දීමට බැරි තරම් අවමානයක් ගෙන දුන් කට කතා රෝහණ හා මා සම්බන්ධ ව ගමේ පැතිර ගියේ ය. පෙරේරා හා තවත් කීප දෙනකුගේ ඇනුම්පද ද අමුතු විදියට බැලීම් ද හැර ඇතත වශයෙන් කිසිවකු කිසිවක් මූණට කීවා හෝ ඇසුවා හෝ නොවේ. එහෙත් අනුලාටත් මටත් එහෙන් මෙහෙන් ඇසුණු පද එකතු කර ගත් කල, පැතිර ගිය කට කතාවට එහි කර්තෘවරුන් පදනම් කර ගත්තේ කුමක් කරුණු දැයි සිතා ගත හැකි විය.

එද රෝහණ මා හමු වීමට පැමිණි අවස්ථාවේ අන් කිසිවකු නොසිටි බව දැන ගැනීමට ගේ ඇතුළට එබිකම් නොකර ම මඟ ගිය කෙනකුට ඕනෑ තරම් ඉඩ තිබිණි. ඔහු අපගේ නිවසේ ගත කළ පැයකටත් වැඩි කාල සීමාව ඇතුළත පාරේ ගිය අය අතර අනුන්ගේ අඩුමුඩු සොයා කට කතා ගෙතීමේ හා පැතිරවීමේ පුරුද්දක් ආශාවක් ඇති අය ද සිටින්නට ඇත.

රෝහණ ගේ ඇතුළට අවුත් හඬමින් සිටි මා දෙළවරෙන් අල්ලා කතා කර ආපසු ගියේ ය. ඔහු විනාඩි දෙකක් වත් ගේ ඇතුළේ සිටියේ නැත. රෝහණ ගෙට ඇතුළු වනු පාරේ ගිය කෙනකු දැක ඇත. අපගේ ගෙය පිටු පස රබර් වත්තේ කිරි කපන ගැහැනියක ජනේලයකින් දැක ඇත්තේ 'රෝහණ මා වැළඳගෙන' සිටි බවකි. තවත් කෙනකු 'ඔය කියන වෙලාවට පැයකට පමණ පසුව රෝහණ අපේ ගේ ඇතුළෙ සිට එනු' දැක තිබේ.

මේ සියල්ලට අනතුරු ව තවත් කවදෝ විසින් දක්නා ලද්දේ මා 'කම්මුලට අත තබාගෙන විස්සෝපයෙන් පුටුව මත සිටි' අන්දමයි.

පුරුක් කීපය එකතු කර සම්පූර්ණ කතාව ගෙතීමටත් පැතිර වීමටත් මුල් වූයේ පෙරේරා ය.

වැඩි විස්තර මා දැන ගත්තේ පෙහෙකම් හලේ ලතාගෙනි. අනෙක් කාංඩය මඟ හැර මා හා වැටුණු ලතා එහෙන් මෙහෙන් කතාව මට කීවා ය.

www.sinhalaelibrary.com

මට ඉවසාගෙන සිටිය හැකි වූයේ මිදුලට එන තෙක් පමණි. ගෙට පැන ගත් මම මගේ ඇඟේ එල්ලෙන්නට ආ නිල්මිණි ද නොතකා ඇඳේ පෙරළී ඉකිබිඳිමින් හඬන්නට පටන් ගතිමි.

මා මාගේ චරිත ශුද්ධිය ගැන රෝහණ ඉදිරියේ ආඩම්බරයෙන් පුරසාරම් දෙඩුවේ දින කීපයකට උඩ දී ය. අවමානයක් විඳ රැක ගන්නා ගෞරවයේ ඇති වටිනාකම කුමක් ද? 'සිසිල' ට නිතර ආ ගිය ගමන් බිමත් හදිසියේ නතර වූ කාලයේ ගමේ නොයෙක දෙනා මගේ නම තම තමන්ගේ හිතුමතය අනුව නිමල්, රෝහණ හා විජය යන තිදෙනාගේ ම නම් හා ගාවා කට කතා කී බව දැන සිටියත් ඒ අවස්ථාවල මම කම්පා නොවුණෙමි. මෙවර කතාව බරපතළ වූවා පමණක් නොව එයින් ගමේ ඇති වූ ආන්දෝලනය ද විශාල ය. අවට ගම් කීපයකින් ද තරුණියෝ පෙහෙකම් හලට පැමිණිය හ. ඒ නිසා මේ කතාවට පියාපත් ලබා ගැනීම පහසු විය.

තවත් සමහරකුට ඇත්ත වශයෙන් මඩ ගැසීමට වුවමනා කළේ මට නොව රෝහණට ය. වරක් සම තත්ත්වයේ සිට දිනුණු වීමට කළ තරගයේ දී පරාද වූ පවුල් කීපයක් ද කලින් බලවත් ය යි සිතාගෙන සිටි පවුල් කපයක් ද හතුරුසිංහ පවුල සමඟ ඊර්ෂ්‍යාවෙන් පසු වූහ.

කෙසේ වුව ද මට ඉතිරි වී යමක් තිබුණා නම් - ආඩම්බර වීමට සතුටු වීමට යමක් තිබුණා නම් - මගේ නම්බුවයි. එයත් නැති වූ කල ජීවත් වීමෙන් වැඩක් ඇද්ද? මා වඩ වඩාත් තැවුණේ මා ගැන ම නොව අම්මා හා නංගී ගැන ය.

"මොකද අක්කෙ?" මට ටිකක් අඬන්නට දී පැමිණි අනුලා මා පසෙක වාඩි වී උරහිසින් අල්ලා ඇසුවා ය.

"නංගිට ආරංචිද රටේ යන කතාව?"

"මට අද අලුතින් ටිකක් දැන ගන්න ලැබුණා. ඉතින්?"

"බලන්න නංගියෙ මට ඉඳල වැඩක් තියනවද?"

"අක්කට පිස්සුද?"

"වහ ටිකක් බොනව මිසක් මට නම් බෑ පැයක් ජීවත් වෙන්න. ජීවත් වෙලා වැඩක් නෑ. ඔහොම කතා............."



"අනෙ ඇත්තට අක්කත් මේ තරම් මෝඩද?"

"නංගිට පුළුවන්ද පාරෙ බැහැල ඉස්කෝලෙ යන්න............"

"මොකද මට බැරි?"

"මම අම්ම එන්න ඉස්සෙල්ල යනව කොහේ හරි. මට බෑ අම්මගෙ මූණ බලන්න."

"අක්කෙ ඕනෑ දෙයක් කියපු දෙන්. ඔයිට වැඩිය සිරිමාවොටත් කතන්දර හදන්නෙ............. ඕනෑ එකෙකුට බැරිද කතන්දර හදන්න............. මේ ගත් ටික බොන්න පිස්සු නැතුව" යි කියාගෙන නංගී ඉස්තෝප්පුව දෙසට ගියා ය.

"එකෙක් නෑ හෝ මූණට කියන්නෙ! අතන මෙතන කතන්දර කියනව මිසක්. කණට ඇහුණොත් දත් ඇන්ද අතට අරන් දෙනව" අනුලා පාරටත් ඇසෙන්නට තරම් හඬ නගා කීවේ ඈතෙන කෙනකුට එල්ල කළ අභියෝගයකට මෙනි.

රෑ කෑමෙන් පසු මා දත් මැද ඉස්තෝප්පුවට එන කල අම්මා පුටුවේ වාඩි වී බුලත් විටක් කමින් වුන්නා ය. මම ඇය වෙත පැමිණ නතර වීමි.

"අම්මෙ මම හෙට ඉඳල වැඩට යන්නෙ නෑ."

"උඹටමනෙ යන්න ඕනෑ උනෙත්"

කඳුළු නතර කර ගැනීමේ උත්සාහයෙන් මදක් කතා නැති ව සිට එය ව්‍යර්ථ වූයෙන් මම අම්මා ළඟ බිම ඇද වැටී ඇයගේ දෙපා බදගෙන 'අනේ අම්මේ' යි කියා ගතිමි.

"මොකද?"

කතා කළේ නංගී ය.

"අක්කට කතන්දරයක් හදලයි කියන්නෙ අම්මෙ ගමේ. පෙරෙයි ද අර දෙවෙනිියිය ඇවිත් ගියානෙ මෙහෙ? ඊට පස්සෙ."

"ඒ ළමයි මෙහෙ වෙනාදටත් එන්නෙ."

"නෑ එද අක්කට කලින් ද ගේ ලඟදි මූණ ගැහිල පනුවද් මොකක්ද එකකට එනව කියල තියනව. අක්ක ඉතින් වැඩට

නොගිහිල්ල හිටියලු. එයා ඇවිත් අර දෙර පුටුවෙ ඉඳගෙන කතා කරල ගිහිල්ල තියෙනව."

"නෑ අම්මෙ මමයි නංගියි කතා කර ගත්ත අම්මට දෙවෙනියිය ආව එක නොකියන්න දන්ම. එයා කිව්ව මට සමූපකාරෙ කඩේට යන්න එපා කියල. මම කිව්ව මට එහෙම බෑ කියත් හරි හම්බෙවනාව අරව මේව කියල. ඒ පාර එයා කිව්ව මම කුසුම් ගැන බලා ගන්නම් කියල. මට තේරුණු විදියට එයාගෙ අදහස - ඉතින් මම කිව්ව මම දන්නෙ නෑ. මට මොකුත් කියන්න බෑ. නැන්දට කියල කැමැති නම් අම්මලගෙන් අහන්න කියල. හැබැයි මුලදිත් මම කිව්ව කතා කරන්න දෙයක් තියනව නම් අම්ම ඉන්න වෙලාවක එන්න කියලත්............."

මා එසේ කීවේ ගේ ඇතුළත දී බව මෙහි දී සඳහන් නො කළෙමි. සිද්ධිය පිළිබඳ අම්මාට කළ කෙටි වාර්තාවෙන් පමණෙක් නොව පුංචි නංගීට කළ විස්තර වාර්තාවෙන් ද මම රෝහණ ගෙට ගිය කොටස ඉවත් කළෙමි. ඔහු සාලයට පිය නැඟුවේ මගේ වරදින් ය යන හැඟීම මුල සිට මා සිත රිදු වූ අතර මේ කට කතාවලින් පසුව අම්මා පවා මා ගැන සැකයක් සිතන් දැයි බිය මෙතැන දී මා කෙරෙහි වඩාත් බල පෑවේ ය.

"ඉතින් ඕකට කොයික ද කතා හැදුවෙ?"

"නෑ අම්මෙ අර ලොම්බි - අනේ ඔකිගෙ අනින් දත් දෙකක් හැළෙන්න රබර් මුලක උලන්න ඇත්නම්. ඒකි කිව්වලු............."

"මොන ලොම්බි ද බං?"

"අර එහා වත්තෙ රබර් කපන දත් නැති මැංචි? ඒකි කියල තියනව සියදෝරිස් මුදලාලිගෙ ගෙදර කිරි පෙරන්න ගිහිල්ල - ගස් කප කපා ඉන්ද දී දෙවෙනියියයි අක්කයි ගේ ඇතුළෙ ඉන්නව දක්ක කියල. සියදෝරිස් මුදලාලිගෙ ගැනින් ඩැයිවර මාමල එක්කල හිත හොඳ නැතෙ. ඒ ගෙදර අර වපර දුව ඩියාරෝට දී ගන්න ඉඳල බැරි වුණාට. ඒ මිනිහගෙ ගම පුරා පතුරවලා ඔය කතාව........... අර මැනිජරත් පෝර්දල තියනව."

"මම හෙට උදේ ඩැයිවර උන්නැහෙලගෙ ගෙදර ගිහිල්ල කියන්නම්කො. ඒ ළමයි වුණත් දැන ගන්න ඕනෑ - ගෑනු



ළමිස්සියො ඉන්න තැන්වලට වෙලාවක් අවේලාවක් බලල එන්න යන්න."

ලෝකය පෙරළුණත් නොසෙල්වෙන අම්මා ඒ වචන කීවේ වෙව්ලමිනි. ඇය හැඟීමක් පිට දුටු එවන් අන් අවස්ථාවක් මා දුක නැත. මගේ ශෝකය ඳෙ ගුණ තෙ ගුණ විය.

"ඕක ඔහොමම ගියදෙන් අම්මෙ. ඒ ගොල්ලට වදින්න යන්න ඕනෑ නෑ."

"කතා නොකරම හිටියමත් හොඳ නෑ. ඒ ළමයි වුණත් දැනගන්න ඕනෑ. තමන්ට කරන්න පුළුවන් සුදුසු දෙයක් නම් කමක් නෑ. අපේ පාඩුවෙ අපි ඉන්නව. ආයෙත් මෙහෙම නොකරන්න."

"අම්ම යන්න ඕනෑ නෑ. ආයිත් ආවොත් මම බලාගන්නම්කො! මම ගන්නව ඉලපත! මම ඕකුන්ට තේ එකක්වත් දෙන්නෙ මෙතන මේ අක්ක නිසා..............."

"ඉතින් ආවම පන්නන්නයැ අම්මෙ"

"අර එක්කෙනෙක් ඉගෙනීමත් නැති කරල දැම්ම. දැන් ඔය ලොක්ක වෙලා ඉන්නව. වෙන දෙයක් එපා. රක්ෂාවක් හොයල දීපල්ල."

"කුසුමෙ ගිහිල්ල නිද ගනින්. රස්සාවට යන්න බැරි නම් ගෙදර හිටපන්. මට උඹල දෙන්නට කන්න දෙන්න හාම පුළුවනි."

"ඒක නෙවී අම්මෙ. මන්න අක්කට පිස්සු නැතුව ඉන්න කියන්න. අම්මගෙ මූණ බලන්න බෑ කියල වස බොනව කිය කියා හිටියෙ."

"මගෙ මූණ බලන්න බැරි වැරැද්දක් උඹට වෙලා නෑ නෙ? උඹ පිරිසිදු නම් කට කැඩුණු එව්වො ඕනෑ දෙයක් කිව්වම අපිට මොකද? උන්ගෙ කට කුණුවෙයි. පිස්සු නැතුව නිද ගනින්."

ඇඳට යන්නට කලින් මා එද අම්මාට වැන්දේ ඇයගේ පිට පතුලෙහි දෙතොල ගෑවෙන ලෙසිනි.

www.sinhalaelibrary.com

මම පසුව ද ම රක්ෂාවට යෑම නතර කළෙමි. සේවයෙන් අස්වීමට කල් දීමක් නොකළ නිසා ඇප මුදල් ආපසු ලබා ගැනීම තරමක් දුෂ්කර විය. මේ ගැන කතා කරන්නට අම්මා සමුපකාර කඩයට ගිය අවස්ථාවේ දී මැනේජර් නුවුවමනා කතා කියන්නට ඇවිත් ඇත. අම්මා බැන වැදුණු කල ඔහු නිහඬ විය.

බැරි ය අමාරුය ය යි මුල දී සිතෙන නොයෙක් දේවල් කරන්නට මේ ජීවිතයේ දී අපට සිදු වෙයි. රෝහණ හතුරුසිංහගේ නම ගාවා මා සම්බන්ධ ව පැතිර ගිය කට කතාවලින් පසුව ලෝකයාට මුහුණ දිය නොහැකි ව මුළු ගැන්වී සිටි මට දිගට ම එසේ කල් ගෙවීමට නුපුළුවන් විය.

මුල් දවස් කීපයේ නිල්මිණි පාසල් ගියේ නැත. ඊළඟට ඇය දවාලට කැඳවාගෙන එනු පිණිස වෙළෙඳාමේ නොයෙක් දවස් කීපයක් ගෙදර නවතින්නටත් අම්මාට සිදු විය. මේ තත්ත්වය දිගට ම පවත්වාගෙන යන නොහැකි විය. මට සමාජයෙන් ඈත් වී එදිනෙදා වැඩ කටයුතුවලට හවුල් නොවී ජීවත් විය නොහැකි විය. වරදක් නොකර අනුන්ගේ කතාවලට බියෙන් මෙසේ සැඟවී සිටීම දුබලකමක් ලෙස අනෙක් අතට මම කල්පනා කළෙමි. මෙහි දී අනුලා අවවාද කරමින් මා ධෛර්යයවත් කළා ය. දින කීපයක් ඇවෑමෙන් සිත දැඩි කර ගත් මම අම්මාට වෙළෙඳාමේ යන්නට කීවෙමි. ඇය මගේ කීම පිළිගත්තේ තවත් දවසක් දෙකකට පසුව ය.

හිත හද ගත් නමුත් මා මුලින් ම නැවතත් දවල් නිල්මිණි එක්කරගෙන එනු පිණිස පාරට බැස්සේ නිරුවතින් ප්‍රදර්ශනයකට නැඹුණු වහලියක මෙන් ලැජ්ජාවෙන් බර වූ හද හොත් බීමට යොමු කරගෙන ය. සමුපකාරය ළඟින් යන කල මම වඩාත් තැති ගතිමි. කඩය පසුකර මඳ දුරක් යන විට පෙරේරාගේ සිනා හඬක් ඇසිණැයි මම සිතමි.

මම වෙනාද කෙලින් ම පාසල් ගොඩනැගිල්ල වෙත නොගොස් කාප්පයෙන් පිටු පැත්තේ සිට නිල්මිණිට කතා කළෙමි. විනාඩි කීපයක් කලින් ගිය දවසක නම් ඇයගේ ගුරුතුමිය හා වචනයක් දෙකක් දොඩන තරමටත් මම කුළුපග වී සිටියෙමි. එහෙත් මෙදින මම අනෙක් වැඩිහිටියනට මැදි වී දුරිය එන තුරු ගේට්ටුව ළඟ බලා සිටියෙමි.



සමුපකාරය නිසා ම මට 'සිසිල' පසු වන තුරු ම බිම බලාගෙන ගමන් කිරීමට සිදුවිය. අනාථ අසරණ වීමේ දැඩි ආත්මානුකම්පාවක් තුළින් කමලාවතීගේ ගෙදර අය ගැන මා තුළ කෝපයක් ද හට ගත්තේ ය.

එහෙත් එක් දවසක මා නිල්මිණි සමග එන අතර පාරට පමිණ සිටි කමලාවතී මට කතා කළා ය. එතැන ම නතර වී වචන කීපයක් කතා කළ මම, "වරෙන් කුසුමෙ වරෙන් ගෙට යන්නැ" යි ඇ දෙවන වරටත් කී කල.

"ළමයට බඩගිනි ඇති නැත්දෙ මම වෙන වෙලාවක එන්නම්" යයි මග හැර යන්නට උත්සාහ කළෙමි.

"ඉකින් පොඩි එකිට බත් ටිකක් දෙන්න බැරුවයැ. අපිට මදි වෙන්නෙ නෑ වරෙන්." එවර මම ඇයට අවනත වීමි. ගෙට යන අතර ඈ දොඩන්නට වූවා ය.

"උඹ විස්වාස කරපන් කුසුමෙ, මට උඹ ගැන නරක කතාවක් ගමේ පැතුරුණය කියල ආරංචි වුණු දවසෙ නින්ද ගියේ නෑ. මට කන්න බැරි වුණා. මගෙ එකෙකුත් ඒ කතාවට යාවුණු නිසා හෙම නෙවෙයි. විස්වාස කරපන්! ඌ පිරිමියෙක්. උඹ ගැන කොයි එකෙකුට වුණත් ඔහොම කතා හදන්න වටින්නෙ නෑ. හෙන ගහන අපරාදයක්"

මම, "ඕව මොනාවද නැත්නද කටවල් වහන්නයැ" යි නොකීවෙමි. මගේ අවමානය වැසීමට කමලාවතීගේ කණගාටුව සමත් නොවීණි.

"............... ගෙදර ආවොත් දෙවෙනිය එහෙ යනවනෙ. එදත් හදිසියෙ ආවෙ කොළඹ ආව ගමන්ය කියල. උඹලගෙ ගෙදර ඉඳල ඇවිත් බත් කෑව නොකෑව ගියා. වාසනාවකට එදම ගියා. ඌට ආරංචි වුණාහම් උඹ ගැන ඔහොම කතාවක් හදලය කියල ඌ මිනීමරා ගන්නව. කියන එවුන් හොයාගෙන ගිහිල්ල කටට පිහියෙන් අනී. දෙවෙනිය උඹට ඒ තරම් කරුණාවයි. මම දන්නව ඒක. දෙවෙනිය මට විස්වාස නෑ. මම කවදත් කියන්නෙ කුසුමෙ ගෑනු සම්බන්ධයෙන් දෙවෙනිය සුද්ද කරන්න යන්නෙ නෑ මම. නමුත් උඹ ගැන කවදවත් එහෙම අහිතක් උගෙ නෑ. උඹ නංගිවට

මට ඒක නවත්තල යන්න පුළුවන් එකට. උඹ ගැන මට ඌ ඒ තරම් විශ්වාසයි. මම ඔය ඌ උඹලගෙ දිහාවෙ යනවට මොකුත් නොකිව්වෙත් ඒකයි. ඌ උඹට නංගි කෙනකුට වගෙ ආදරෙයි. මම ඒ ගැන දන්නව............. ගෑනු දරුවෙක් මට නැතත් මට බොහොම වේගයි ඔය කතාවට............. මම උඹ ගැන දන්න නිසාවෙත් උඹේ හොඳකම නිසාවෙත්............. උඹේ හොඳකම නිසාවෙන් බේරුණු කෙනෙක් දුවේ මම.............."

රෝහණ එදා අපේ ගෙදරට ගියේ කුමන් අරමුණු කොටගෙන දැ යි සිය මවට කියා නැති බව කමලාවතීගේ කතාවෙන් මට තවත් ස්ථිර ලෙස අවබෝධ විය. ඇත්ත වශයෙන් මගේ සිත දුවන්නට වූයේ ඒ කරුණ ගැන මිස ඇය මගේ පැත්ත ගෙන කළ විස්තරය ගැන නොවේ. නිමල් සම්බන්ධ ප්‍රශ්නයේ දී නම් ඇය මා කෙරෙහි විශ්වාසයක් තබා කතා කරන කල මට එක්තරා සැනසීමක් ලැබිණි. රෝහණ සම්බන්ධ ව ඇය මා විශ්වාස කළත් නැතත් කමක් නැතැයි මා තුළ උදාසීන ගතියක් පහළ විය. මේ උදාසීන ගතිය තරහක් ලෙස ඇයට සිතෙතැයි සැක කළ මම යමක් කීමට සිතුවෙමි. අන්තිමට මගෙන් කියැවුණේ කල්තියා අදහස් කළ දෙයක් නොවුණත් ඇයට අනුචිත නො වේතැයි පසුව මට සිතුණු දෙයකි.

"මොනාවද නැන්දෙ ඕව. මම දැන් පුරුදු වෙලා ඉවර. මම කිසි දෙයක් ගණන් ගන්නෙ නෑ. අපහාස වුණාය කියල වැඩිම වුණොත් ගෙදර නාකි වෙන්න වෙයි. ඊට වැඩිය දෙයක් වෙන්නෙ නැහැ. ඉතින් මොකද...........?" දිගට කතා කිරීමේ අදහස මුලින් නොවුණත් සිතේ යම් තැනක් හිල් වී වචන ගලාගෙන එයි.

"............. මට ඒකට කමක් නෑ. මිනිස්සු හිතනව ඇති මහ හපන්කමක් කළාය කියල. මට මොකද නැන්දේ? මට හිතලවත් නෑ. මට දැන් වයස විසි එකක් විසි දෙකක්. මම කිසිදේකින් කලබල වෙන්නෙ නෑ. අන්න අර පුංචි නංගී ගැන තමයි මම කල්පනා කරන්නෙ. මට දැන් මොනාව වුණත් කමක් නෑ.........."

"උඹට කවද හරි හරියයි කුසුමෙ.........."



"හරි නොගියත් මැරෙනකල් ඉන්න එපා යැ නැන්දෙ? මට පුළුවනි මොනාව වුණත් ජීවත් වෙන්න. ඒක මට සහතිකයි."

"ඔන්න ඔය මැනේජරය තමයි ඔය කතාව පතුරුවල තියෙන්නෙ වැඩියත්ම. මම උන්දට කිව්ව ටිකක්. අපි ඕක ආරංචි වුණු හැටියෙම සමූපකාර සභාපතිට කල් දුන්න කණේ අස්කර ගන්න. ඩැයිවර උන්නැහෙ නයා වගෙ එද ඕක දැන ගත්ත දවසෙ. මහතුන් ඊට එහා. අපිත් දුර දිග බැලුවෙ නෑ කුසුමෙ උඹට ඔතන රස්සාවට එන්න කියන වෙලාවෙ. පස්සෙ නම් මටත් ආරංචි වුණා. ඔය මිනිහගෙ............"

"මොනාව කරන්නද නැන්දෙ. නැන්දල හිතුවෙත් මගෙ හොඳට නෙ."

"මම ජේන් අක්කටත් කිව්ව. උඹ අපිට විශ්වාසනෙ කුසුමෙ."

"එහෙනම් ඇති!" තරහට ම නොව විහිළුවට මෙන් කියන්නට සිතුණත් මා කතා කළේ නැත.

www.sinhalaelibrary.com

# II

කුඩා දරු දරියන් සඳහා පංතියක් පැවැත්විය හැකි නේද යි මුලින් ම අදහස ඉදිරිපත් කරනු ලැබුවේ අනුලා විසිනි. පාසලට ඇතුළු කරන වයස පිරී නැති එහෙත් අකුරු කියවා ඇති ළමයි ගමේ සිටිති. ගෙදර සිටින කල 'දඟට පුරුදුවන' නිසා බාර ගත්තොත් නියි වයසට කලිනුත් ඔවුන් පාසල් යවන්නට දෙමාපියෝ කැමැති ය. රබර් කිරි කැපීම ආදී රැකී රක්ෂාවලට යන මව්වරුනට මේ ළමයින් උදය කාලයේ බලා කියා ගන්නටත් අමාරු ය.

පුංචි නංගීගේ අදහස පරිදි අම්මාගේ කැමැත්ත ද ලැබුණෙන් මම පෙර පාසල් වයසේ දරු දරියන් හත් අට දෙනකුගෙන් උදේට පංතියක් පටන් ගතිමි.

"මමත් අක්කගෙන් ඉගෙන ගන්න ඕනෑ" යි මුල දී නිල්මිණී ද ගෙදර නවතින්නට උත්සාහ කළා ය.

මා සම්බන්ධ අපවාදය කෙමෙන් අසල් වාසීනට අමතක වෙමින් යත් ම එය ප්‍රචාරය කරන්නට හවුල් වූවන් අතර පවා මා වල් එතියක යන හැඟීම ඉතිරි විණැ යි මම නො සිතමි. දෙමාපියන් මගේ පංතියට ළමයින් එවන්නට පසුබට නොවුණේ ඒ නිසා විය හැකි ය.

මම එක ළමයකුගෙන් රුපියල් දෙකක් අය කළෙමි. වැඩි දවසක් යන්නට කලින් ගෝලයෝ ගණනක් මා වෙත ආහ. මම බාල ලීයෙන් බංකු කීපයක් ද පුංචි කළු ලෑල්ලක් ද සාදවා ගතිමි.



ඉගැන්වීමෙන් සුළු ආදායමක් ලැබුණු අතර එයින් මා ලද ආස්වාදය හා තෘප්තිය මිල කළ නොහැකි විය. කාලයක් තිස්සේ මා සොයමින් සිටි සන්සුන්කම මම කුඩා දරියන් වෙතින් ලැබුවෙමි. අවුරුදු කීපයක් තිස්සේ අභ්‍යන්තරයෙන් පමණක් නොව බාහිර වශයෙන් ද විශේෂයෙන් උදය කාලයට දැනෙමින් තිබුණු පාළු ගතිය මා අත හැර ගියේ ය.

උන්ට ඉගැනවීමෙන්, කතාන්දර කියා දීමෙන්, සුරතල් බැලීමෙන් හා එකිනෙකා අතර අඩ දබර සංසිඳුවීමෙන්, නැළැවීමෙන් පමණක් නොව සමහර විට තරවටු කිරීමෙන් ද මා වින්දේ මින් පෙර නොදැන සිටි සතුටකි.

සවස අනුලා ගෙදර පැමිණි කල උදය කාලයේ ළමයින් කළ කී දේවල් මතක් කර විනෝද වීමු. අනෙක් දරු දරියන් ගැන උනන්දුවක් දක්වන බව දකිම නිල්මිණීගේ සතුටට හේතුවක් නොවීය. සමහර දවසක මම පංතියේ ප්‍රයෝජනය සඳහා චිත්‍රයක් ඇන්දෙමි. ඒ හැම විටක ම නිල්මිණීටත් වෙන ම පින්තූරයක් ඇඳ දිය යුතු විය.

මගෙන් ඉගෙන ගන්නා සමහර ළමයින්ගේ දෙමාපියෝ මට ඉස්සරට වඩා සැලකිල්ලක් ද කරුණාවක් ද දක්වන්නට වූහ. ජීවිතය නිෂ්ඵල නැත යන හැඟීමකින් මම උදම් වීමි.

ගුණපාලගේ ලිපියකට පිළිතුරු යවද්දී මගේ අලුත් තත්ත්වය ගැන ලීවෙමි. ඒ ගැන සතුට පළ කර ගුණපාල මට නැවතත් ලීවේ ය. කාලෙකින් නාවේ ඇයි දැයි මා නො ඇසූ නමුත් ඊට හේතුව ඔහු තම ලිපියේ විස්තර කළේ ය.

ඔහු උත්සාහ කරන්නේ කෙසේ හෝ පොතක් මුද්‍රණය කිරීමට ය. ප්‍රකාශකයන් කීප දෙනකු සොයා ගිය මුත් වැඩක් නොවූයෙන් අතින් හෝ මුදල් වියදම් කර පොත මුද්‍රණය කිරීම ගුණපාලගේ අධිෂ්ඨානයයි. ලේඛකයකු වශයෙන් ඇති කර ගත් නමක් හෝ දැනහැඳුනුම්කමක් හෝ නැති ව නවකයකුගේ පොතක් අලෙවි කර ගැනීම පහසු නො වේ. පොතක් ලියන්නට කලින් පුවත්පතකට ලිපි සපයා නමක් ඇති කර ගැනීමට අදහස් කළ ගුණපාල ඒ ගැන ද සොයා බලා ඇත. එතැන දී ද දැන හැඳුනුම්කම අවශ්‍ය වෙයි. පත්තරයක ලිපි පළ කරවා ගැනීමට

www.sinhalaelibrary.com

ඇති අනෙක් පහස ක්‍රමය නම් බටහිර සිනමා නිළියක හෝ ගණිකාවක හෝ ගෙන ජීවිතයේ කාමුක පැත්ත ගැන ලිවීමයි. එවැනි චරිතයන් ගැනත් පයෝධර, චුම්බන, ආලිංගන ආදී මාතෘකා ගැනත් ඇමරිකන් සඟරාවල පළ වන ලිපි පරිවර්තනය කර තමන්ගේ නමින් යැව්වොත් උඩින් බාර ගන්නා පත්තර ඇතත් ජාතියට වසුරිය බෝකර නමක් හදා ගැනීම අපරාධයකැයි ගුණපාල කියයි.

පොත මුද්‍රණය කර ගැනීමේ දී සුළුවෙන් හෝ උදව්වක් වීමට කැමැත්ත පළ කරමින් මම ලිපියක් යැවීමි. ඔහු ඊට ද පිළිතුරක් එව්වේ ය. මම නැවත හොලීවෙමි.

මේ අතරතුර මගේ සිත නොසන්සුන් කළ තත්ත්වයක් අනුලා නිසා මතු විය. ඈ හදිසියේම වාගේ ලාච්චුවකට යතුරක් පාවිච්චි කරන්නට වූවා ය. එහි යතුරු තිබුණු නමුත් කලින් පාවිච්චි වුණේ නැත. ඇය මේ ලාච්චුව අරින්නේ වසන්නේ ඉතා පරිස්සමින් හොර රහසේ මෙනි. ඇයගේ මේ ක්‍රියාව මා තුළ කුතුහලයක් පමණක් නොව නොසන්සුන් කමක් ද ඇති කළේ ය. සැකයක් මගේ සිතට ඇතුළු වුණා ම නොව සැකයක සෙවණැල්ලක් සිතෙහි සීමාවේ හොල්මන් කරන්නට වන්නේ ය. මට ඇය සැක කිරීමට හේතුවක් පමණක් නොව යුතුකමක් ද නැත. වඩාත් මගේ සිතට වධයක් වූයේ මේ ගැන ඇයගෙන් ප්‍රශ්න කිරීමට පුළුවන්කමක් නොතිබීමයි. අපගේ හදවත් ඒ තරමට විවෘත ය. ඇය මට නොකියන රහසක් නැත. විශේෂයෙන් පිරිමි ළමයකු කරන කට්ටකමක් වුණත් නොවරදවා ම මට කීම ඇයගේ සිරිත ය. දවසක් පංතියේ පිරිමි ළමයකු විසින් ඇයට ලියුමක් දී ඇත. අනුලා මේ ලිපිය පවා මට ගෙනැවිත් දුන්නා ය. එසේ තිබිය දී මම කෙසේ නම් ඇය සැක කරන්නෙම් ද?

මේ කුමක් සිතුවත් මගේ සිත සන්සුන් නොවෙයි. පද්මසිරි නම් ඒ ළමයා දුන් ලියුම ඇය ප්‍රතික්ෂේප කළේ ඔහුට නොසතුටු නිසා විය හැකි ය. එසේ නැතහොත් ඇයගේ සිතෙහි දනටමත් අන් කෙනකුට ඉඩ නැති නිසා විය යුතුය. පෙම් හසුන් හැර, නංගිගේ වයසේ දැරියකට ලාච්චුවක යතුරු දමා සුරක්ෂිත ලෙස සඟවා තබා ගැනීමට තරම් වටිනා අන් වස්තුවක් ගැන මට සිතා



ගත නොහැකි ය. අනෙක් අතට කල්පනා කර බලන කල අනුලාගේ ක්‍රියා කලාපය හා හැසිරීම ප්‍රේමය සිතට ඇතුළු කර ගත් යුවතියකට කිසිසේත් උචිත ද නොවේ ය.

මෑතක දී එක් නිවාඩු දවසක පුංචි නංගී ඇයගේ සියලු ම ගවුම්වල සායේ වාට්ටිය ලිහා අලුතෙන් මැහුවා ය. මා මේ ගැන ප්‍රශ්න කළ විට ඈ මෙසේ කීවා ය.

"එක ළමයෙකුට මිස් ඇනුම්පද කිව්වා ගවුම කොටයි කියල. හැබැයි ඒ ළමය නම් වාඩිවෙන්න බැරි තරම් කොටට අඳින්නෙ. මටත් නිකම් හිතුන මගෙත් සායවල් කොටද කියල."

"නංගි කොහෙද ඒ තරම් කොටට අඳින්නෙ" යි කී නමුත් මම ඒ ගැන ඉන් එහා කතා නොකළෙමි.

මේ හැර අනුලා පන්සල් යන විට ළමාසාරිය අඳින්නටත් පටන් ගත්තා ය. ඇයගේ මේ වෙනස් වීම මෙතැනින් නතර නොවී ය. ඇයගේ කණේ වූ කරාබු දෙක දවසක් දක්නට නොවී ය. මම නංගීගෙන් ඒ ගැන ඇසුවෙමි.

"මට ඕව ගැන ආසාවක් නෑ අක්කෙ." යි කී නංගී සිනාසුණා ය.

"කන් දෙක පාළුයි."

"ඒකට කමක් නෑ. අපි නාම ඉස්කෝලෙ යන ළමයිනෙ"

තවද ඇය පියරු දැමීම නතර කළා ය.

නංගී එවන් ජීවිතයකට පුරුදු වීම ගැන කලබල වීමට කාරණාවක් මට නැත. එහෙත් ඇය මේ වෙනස්කම් සිය කැමැත්තෙන් ම නොව අන් කෙනකුගේ කීමකට හෝ පෙළඹවීමකට හෝ කරන්නට ඇතැයි සැකයක් සියුම් වේදනාවක් ද ගෙන දෙමින් මට ඇති විය. එසේ නම් ඇයගේ හැසිරීම කෙරෙහි බලපෑමක් ඇති කරන්නට ඇත්තේ කවරකු විසින් ද? මම තිගැස්සී ගියෙමි. නංගීගේ මේ පැවැත්ම ගුණපාලගේ අදහස් අනුව ගැළපෙයි.

පාසලේ දිනපතා සිදුවීම් සියල්ල වාර්තා කරන අනුලා වරක් ගුණපාල මුණ ගැසමේ සිද්ධිය මට කීවේ සති ගණනකට පසු

www.sinhalaelibrary.com

ය. මට කියන්නට අමතක වූ තවත් හමුවීම් ඔවුන් අතර වුණා ද? අනුලා හා ගුණපාල ගැන මෙසේ සිතීම පාපයක් වන තරම් බරපතළ වරදකැයි මට ඒ විගස ම කල්පනා වෙයි. ඇය ඔහු ප්‍රිය කරන බව වෙනම ප්‍රශ්නයකි. මම ද ගුණපාල ප්‍රිය කරමි. එපමණක් නොව පුංචි නංගී ඔහුට ආලය කළත් එහි ඇති වරදක් තිබේ ද?

යොවුන් වියට පත් ව සිටින අනුලා යම් දිනෙක යමකුට ආලය කරනු ඇත. ඇයගේ හදවත කිසිවකු විසින් කිසියම් දිනෙක විවෘත කරනු ඇත. එය මට වැළැක්විය නොහැකි ය. මේ ස්වභාවික පරිවර්තනය වැළැක්වීමට මා උත්සාහ නොගත යුතු ය. ඒ තැනැත්තා ගුණපාල නම් මා ඇත්ත වශයෙන් සතුටු විය යුතු ය. ගුණපාල හොඳ ළමයෙකි.

කෙසේ තර්ක කළත් මට මගේ සිත සන්සුන් කර ගත නොහැකි ය. අනුලා වෙත තිබෙන රහස කුමක් ද? මගෙන් සැඟවීමට දෙයක් ඇයට තිබිය යුතු නැත. ඕනෑ ම දෙයක් මට දන්වීමේ ඉඩකඩ ඇය වෙත තිබේ. ගුණපාලට තමා ආලය කරන බව ඇය කීවත් මා හරස් නොවන බව ඇය දැන ගත යුතු ය.

අනුලා සතියකට දවසක් දෙකක් සවස් වරුවේ පංතිවලට හෝ සමිති සමාගම්වල වැඩට හෝ නතර වෙයි. මේ දවස්වලට ඇය ගෙදර එන්නේ පහට හෝ හයට පමණ ය. නිවාඩු දවස්වලට ශ්‍රමදාන වැඩට ය යි කීප වරක් ම පාසල් ගියා ය. මේ කිසිවක් සැක කටයුතු නොවේ. නංගී ඇත්තට ම පාසල් වැඩට හෝ ශ්‍රමදාන වැඩට හෝ යන්නේ ද යි ඇයගෙන් සැකය දුරු කරනු පිණිස ප්‍රශ්න කරන්නටත් නුපුළුවන.

මෙසේ සිතින් කැළැඹී ගිය මම පුංචි නංගීගේ කතා බහ, හැසිරීම් හා වැඩකටයුතු ගැන මුල දී නොවූ සැලකිල්ලක් දක්වීමට නිතැතින් ම පෙලැඹුණෙමි.

අනුලා පසුවන්නී උතුරා යන තරම් ජීවයකින් පිරුණු වයසක ය. කඩිසරකම හා ක්‍රියාශීලීත්වය හැර ආදරය ඔළුවට ගත් යුවතියකගේ දඟකාරකමක් ඇය වෙත දක්නට නැත. කෙතරම් පරිස්සමින් හා ඕනෑකමින් බැලුවත් නළියන අනුරාගයක් ඇයගේ



දීප්තිමත් ඇස්වල දක්නට නැත. අලුතෙක දී ඇති වූ වර්ගයේ මානසික ලකුණු ඇයගේ බාහිර හැසිරීමෙන් කිසි විදියකින් පළ නොවේ.

හැමෙතක් ම එසේ නමුත් මගෙන් යමක් වසංකර තබා ගැනීමේ උත්සාහයක් ඇය ඉහවහා ගොස් ඇති බව නොසලකා සිටින්නට මම අපොහොසත් වෙමි. දිගින් දිගට කල්පනා කර ගෙන යැමේදී මගේ සිතෙහි දැඩි වේදනාවක් ඉතිරී විය. මේ වේදනාවට මුහුණුවර කීපයක් විය. පුංචි නංගී කෙරෙහි සැකයක් ඇති කර ගන්නට වීම එකකි. ඇය යමක් - කුමක් දැයි මා නොදන්නා යමක් - මගෙන් රහසක් කොට තබා ගැනීම අනෙකකි.

තමා වෙත ඇති ඕනෑම රහසක් නොවළහා මට හෙළි කිරීමේ පුළුවන්කම ඇය වෙත තිබෙන්නාක් මෙන් ම කෙළින් ම ඇයට කතා කර මගේ මේ සැකය දුරුකර ගැනීමට වුව ද හැම අතින් ම පුළුවන්කම මටත් තිබේ. එහෙත් එවැනි පියවරක් ගැනීමට මගේ සිත ඉඩ නොදෙයි. ඇයගේ මුහුණ බලාගෙන අවිශ්වාසයක් උඩ කතා කරන්නේ කෙසේ ද?

සැක දුරු කර ගැනීමේ ලා ඉවහල් වන කතාවකට තුඩු දෙන යමක් ඇයගෙන් අනුලා ගැනීමට අන්තිමට මම සිතාගතිමි.

පෝය දවසක සවස්වරුවේ ගුණපාල අපේ ගෙදර ආවේ ය. අනුලා ගැන සැක දුරුකර ගැනීමට මේ අවස්ථාවේ පුළුවන් වෙතැයි මම කල්පනා කළෙමි. රක්ෂාව ලැබීමෙන් පසුව ගුණපාල පළමු වන වරට අපේ ගෙදර ආවේ මෙදින ය. මම ඔහුගේ අලුත් තත්ත්වය ගැන විමසීමි.

නියමිත වේතනයක් ලැබුණත් ආර්ථික දුෂ්කරතාවන් තරමක් දුරට මග හැරීමත් කාලය ගෙවන්නට මගක් හමුවීමත් හැර රක්ෂාවෙන් ඔහු ලද මානසික සහනයක් නොවී ය.

රජයේ කාර්යාලය මිනිසාගේ ආත්මය මරන තැනකි. වැරදි අධ්‍යාපන ක්‍රමය විසින් පාසලේ දී විනාශ කර දමා ඉතිරි වූ ආත්මය මරා දමා අවසානයක් කර දැමීමට සුදුසු පරිදි කාර්යාලය සකස් වී තිබේ. සුද්දන් රජයේ පරිපාලන සේවය සකස් කරන ලද්දේ මෙරට වාසීන්ගේ යහපත සැලසීමට නොව තමන්ගේ

www.sinhalaelibrary.com

අයිතිවාසිකම් හා වුවමනාවන් රැක ගැනීමට පහසු වන පරිද්දෙනි. එවැනි පරිපාලන සේවයක මූලික පරමාර්ථවලින් එකක් නම් ජනතාව පීඩනයට පත් කිරීමයි. සුද්දන් රාජ්‍ය යන්ත්‍රය සකස් කළේ මහජන ප්‍රශ්න විසඳීමට නොව ඒවා යටපත් කිරීමට ය.

ජනතාවගේ ජාතික නිදහස් අරගලය මැඩ පවත්වනු පිණිස නිදහසක් ලබා ගත් බවට මායාවකින් බොරුවකින් රැවටිල්ලකින් රටවැසියාගේ ඇස්වලට වැලි ගසා ඇතත් තවමත් ලංකාවේ පවතින්නේ සුද්දන්ගේ පරිපාලනයයි. එම පරිපාලන යන්ත්‍රයේ කේන්ද්‍රස්ථානය වන භාණ්ඩාගාරයේ රට ගැන අවංක ඇල්මක් ඇති - කරුණු දන්නා කෙනකුට කෙසේ නම් තෘප්තිමත් ව වැඩකළ හැකි ද?

රක්ෂාවෙන් මානසික සහනයක් නොලද නමුත් රක්ෂාව ලැබීම නිසා ගුණපාලගේ ජීවිතය නිසැකයෙන් ම වෙනසකට යොමු විය.

ගුණපාල කාසි වැනි රෙද්දවලින් ඇඳුම් අඳින්නට පටන් ගත්තේ ය. ඔහු සපත්තු වෙනුවට සෙරෙප්පු දැමුවේ ය. සිගරට් බීම හා මත්පැන් පානය කළේ නැත. සැතපුම් විසි ගණනක දුර දිනපතා බස් රියෙන් යෑමට හැකි වූ නමුත් ඔහු කාලය ඉතිරි කරනු පිණිස කොළඹ බෝඩිමක නතර විය. හැකි තරම් අඩුවෙන් වියදම් කළ ගුණපාල ඉතිරි කර ගත් මුදලින් කොටසක් තමාගේ පොත මුද්‍රණය කිරීමේ අරමුදල සඳහා යෙදවී ය. කොටසක් ඇවිදීමට වියදම් විය. සති අන්තයට ඔහු කොහේ හෝ ගියේ ය. ඔහු ඇවිද්දේ රට තොට බලා ගැනීමට ම නොව මිනිසුන් දැක බලා ගැනීමට ය. මිනිසුන් අතරට ගොස් කතාබස් කර ඔවුන්ගෙන් අත්දැකීම් හා අවබෝධයක් ලබා ගැනීමට පුළුවනැයි ඔහු මට කීවේ ය. හැකි හැම අවස්ථාවක දී ඔහු මිනිසුන් අතරට ගියේ ය.

ගුණපාල කාලයෙන් හැකි පමණ ප්‍රයෝජන ගත්තේ ය. කලෙකින් අපේ ගෙදර එන්නට නො ලැබුණේ ද ඔහුගේ මේ වැඩකටයුතු නිසා ය.

"රට තොට බලන එක හරි හොඳයි. මටත් ආසයි කොහේ හරි ඇවිදින්න යන්න සුමානයක් විතර." මම කීවෙමි.



"රට තොට විතරක් නෙවි කුසුම්. මිනිස්සුත් දැක බලා ගන්නැකි."

"මිනිස්සුද ගැනු ද?" මම සිනාසීමි.

"ඔව්, මිනිස්සු ගැනු ළමයි කවුරුත්"

"කොළඹ හැද්ද ගැනු මිනිස්සු."

"ඉන්නව. ඒ අය අතරටත් යනව මම. මුළු රටම කොළඹ නෙවි. එක එක පළාත්වල මිනිස්සු වෙනස්. ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්න කරදර වේදනාව ගැටළු වෙනස්. අත්දැකීම් වෙනස්............."

"මොන එකකටද ඉතින් ඕව හොයන්නෙ?"

"එහෙම කියන්න අමාරුයි."

"රහසක් ද?"

"අනේ නෑ."

"මම හිතන්නෙ නෑ රහසක් වුණත් ගුණපාල මට නොකිය ඉඳියි කියල"

මම මේ වචන අවසාන කළේ බැල්ම අනුලා වෙත යොමු කර ගනිමිනි. ඇය ඇතුළතින් සිනාසුණා ය යි හැඟුණත් මා බලාපොරොත්තු වූ වෙනසක් පිටතින් දැකගත නොහැකි විය.

නො කිය යුත වචන කීපයක් කීමියි මම පසුතැවිල්ලට පත්වීමි.

"කිසිම රහසක් නෑ කුසුම්. කියන්න අමාරුයි කිව්වෙ ඒ අදහසින් නෙවි."

ගුණපාලගේ පිළිතුරු පැහැදිලි එකක් නොවී ය. මම එයින් තෘප්තිමත් නොවුණෙමි. මා අදහස් කළ කරුණ සම්බන්ධයෙන් නම් මා පත් වූයේ වඩ වඩාත් මුළා වූ තත්ත්වයකට ය. මගේ සිතෙහි යම් කිසි ප්‍රශ්නයක් පවතින බව ඔහුට පමණක් නොව අනුලාටත් තේරුම් යන්නට ඇත.

"ඔයාට ඕනෑ කරන්නෙ මිනිසුන්ට සේවයක් කරන්න. ඊට කලින් මිනිසුන් ගැන අවබෝධයක් ලබාගන්න ඕනෑකම ඇති.

මිනිස්සු අතරට නොගිහින් ඒ අවබෝධය ලබාගන්න බෑ. එහෙම ද ගුණපාල?" අනුලා ඇසුවා ය.

ඇය කතාවට හවුල් වූ ප්‍රථම අවස්ථාව එය යි.

"මට වැඩිය හොඳට ගුණපාල කියන දේවල් තාංගිට තේරෙනව." යි මා කීවේ සිනාසෙමින් වුව ද ඒ සිනාව කෙතෙක් දුරට අවනාජදැයි මම නොදනිමි.

"අක්ක වගෙ මම කතාවට හවුල් නොවී අහගෙන ඉන්න නිසා."

"මිනිසුන්ට සේවයක් කිරීමට නොවී කුසුම්" අප දෙදෙනාගේ ම කතාව ගණන් නොගෙන ලෙසින් ගුණපාල කීය. "මට බොරු විරවරයෙක් වෙන්න බෑ. මිනිස්සුන්ගෙ උදව් ලබා ගන්න."

"මොකකට ද?"

"අද තියෙන ක්‍රමය වෙනස් කරන්න."

අම්මාට ගිලන්පස රැගෙන පන්සල් යන්නට තිබුණු නිසා එදා අපට ඊට වැඩිය ගුණපාල සමග කතා කරන්නට ලැබුණේ නැත.

රෝහණ මට විවාහ යෝජනාවක් කළ බව ගුණපාලට කියන්නට සිතාගෙන සිටි නමුත් මට එය අමතක විය. පන්සල් යන අතරමග මම මේ බව අනුලාට කීමි.

"කමක් නෑ අක්කෙ. ගුණපාලට ඕක නොකියන එක හොඳයි" ඈ කීවා ය.

"ඇයි?"

"මම කාරණයක් ඇතුව කිව්ව නෙවි."

මගේ සැකය දුරු කිරීමේ හෝ තහවුරු කිරීමේ හෝ සමත් වන අන්දමේ යමක් ගුණපාල සමග සාකච්ඡාවේ දී, විශේෂයෙන් තාංගීත් හවුල් වූ අවසාන කොටසේ දී, මතු වන්නට ගොස් යළි යටපත් වීණැයි හැඟීමක් ඇති කර ගත් මම පන්සල් යන අතර මගදීත් ගුණපාල ගැනත් ඔහුගේ අදහස් ගැනත් ඇය කතාවට අල්ලා ගතිමි. ප්‍රතිඵලය වූයේ මා තව තවත් මුළා වී අසරණ බවට



වැටීම පමණකි. අන්තිමට මම කෝපයට පත් වීමි. කෝපය, සැකයක් මවා ගත් මා ගැන ම උපන් එකකි.

එක් දවසක මා තිල්මිණි කැඳවාගෙන එන්නට යන කල කමලාවතීගේ නිවසේ ඉදිරිපස දොර ජනෙල් සියල්ල විවෘත ව තිබෙනු දක්නට ලැබිණ. මෙය යම් කිසි වෙනසකි. ගෙයි දක්නට ලැබුණු වෙනසින් මගේ සිතෙහි ද වෙනසක් ඇති විය.

'නිමල්වත් ඇවිදින් ද?' යනුවෙන් නිකමට සිතිණි. යම්කිසි විදියකින් නිමල් ගෙදර පැමිණ සිටිනු දක්නට ලැබේද යන චකිතය 'සිසිල' ළඟින් යන බොහෝ අවස්ථාවල මා තුළ තවමත් ඇති වෙයි. නිමල් ගෙදර සිටියොත් මට ඇති විය යුත්තේ ඔහු දකින ආශාව ද නැතහොත් මග හරින වුවමනාව දැයි හැඟීමක් මට නොවී ය. ඔහු පැමිණියේ නම් මෝටර් රථයක් ද තිබිය යුතු ය. සමහර විට මෙදින ඔවුන් ගෙදර එන්නට නියමිත ව තිබුණා විය හැකි ය.

මා ආපසු එන විට රෝහණ පාර අයිනේ සිටියේ ය. ඔහු දකින් ම මම අප අතර කිසිදු වෙනසක් නොවූ ලෙසින් සිනා සීමි. වරදක් කර පසුතැවිලි වන ගතියක් ඔහුගේ සිනාවට මිශ්‍ර වී තිබිණි.

"දෙවෙනියිය කවදද ආවෙ?"

"ඊයෙ රෑ - මම දන්න කුසුම් ඔය පැත්තට යනවත්"

"මම දන්නෙ නෑ. මම හොඳට බල බලා ගියෙත් මොකද මේ දොරවල් හෙම ඇරල දල තියෙන්නෙ කියල."

"ටිකක් හුළංවත් වැදෙන්න දොරවල් ඇරල දැම්ම මම. පාළු ගෙදේ ඉන්න බෑ."

"දෙවෙනියිය ඒ පැත්තෙ ආවෙ නැත්තෙ?"

ඔහු එක වර ම පිළිතුරක් නොදී සිනාසුණේ ය.

"කුසුම්ට තවත් කරදරයක් කරල යන්න?"

"ඕවට බය වෙලා පුළුවනෑ. යන්න ඉස්සර වෙලා ඇවිත් යන්න එන්න"

www.sinhalaelibrary.com

"අනුලා එන්නෙ කොයි වෙලාවට ද?"

"දෙකට විතර එයි - දෙකට තුනට"

"මම එන්නම් කො"

ඔබ කීපයක් ගෙවූ මම ආපසු හැරී නොබලා එන්නට අපොසත් වීමි. රෝහණ අත් දෙක බැඳගෙන බිමට යොමු කර ගත් බැල්මෙන් කල්පනාවක යෙදී සිටියේ ය.

රෝහණ මට මුණ ගැසුණු බවත් සමහර විට සවස එන්නට ඉඩ තිබෙන බවත් මම පුංචි නංගිට කීවෙමි.

"ආයිත් හදල යන්නද කතාවක්? ඇයි අක්ක කිව්වෙ නැද්ද?"

"මොනව කියන්නද?"

"අක්කට පාරෙ බැහැල යන්න බැරිවුණ හැටි"

"ලැජ්ජ නැතුව මට ඕව කතා කළැකිය එයත් එක්කල? ගමට ආවොත් මෙහාට එන මිනිහ මෙ පාරම නාවම මිනිස්සු වුණත් හිතයි මෙ කතාවල ඇත්තක් තියනව කියල. ඒකයි මම එන්නා කිව්වෙ. නැත්නම් මටත් ඕනෑකමක් නෑ ගෙන්න ගන්න."

මා තමාගේ කතාව තුරුස්සන්නට ඇතැයි පුංචි නංගී සිතුවා ය.

"ආවට කමක් නෑ. නමුත් මට නම් ඔය ගෙදර කාංචෙ පෙන්නන්න බෑ."

"නහී වෙරෙන වේරානි" මා කලින් කී වචනවල සැර අඩු කරන්නටත් සිතාගෙන සිනාසීමි.

"එක අතකට වාසනාවක් කුසුම් ඔය කතාව පැතිරෙන්න කලින් මම ගමෙන් ගිය එක." සවස අපේ ගෙදර පැමිණි රෝහණ කතාව පටන් ගනිමින් කීය. "......... මට ආරංචි වුණ ගමන්මයි ඒයෙ පිටත් වුණේ. වාසනාවකට මට ගමේ දී නෙවි ආරංචි වුණේ. ඒ කියන්නෙ මගදි. මම හිතුව හුගක්. මම නිසා නෙවි. නංගී නිසා ඉවසිල්ලෙත්........."

"දැන් ඒක යට ගිය කෙහෙල්මලක්. ආයෙත් එව්ව අවුස්සන්න............"



"ඒක තමයි කුසුම්. මම ගමේ ඉන්නෙත් නෑ. මම පිරිමියෙක්. මම හොඳ මිනිහෙක් නෙවෙයි. හොඳ මිනිහෙක් වෙන්න මට ඕනෑ කමකුත් නෑ දැන්. හොඳ මිනිහෙක් වෙන්න අදහසක් වෙලාවක තිබුණ. ඒක වෙනම ප්‍රශ්නයක්.......... ආයෙත් ඔය කතාව මතුකරල ගත්තොත් කුසුම්ට හොඳ නෑ. අම්ම කිව්වෙත් ඒකයි. නමුත් මම දන්නව ඔය කතාවට මුල්වුණු කීප දෙනෙක්. නිතර නොහිටියත් මේ ගම දල යන්නෙ නැතෙ"

"ඕව හිතේ තියාගන්නෙ මොනවට ද දෙවෙනියියෙ. මෝඩ මිනිස්සු. අපිත් ඒ තත්ත්වයට වැටෙන්න ඕනෑ යැ."

එක විෂයයක් අවසාන විය. ඊළඟ මාතෘකාව කුමක් විය යුතු ද? කුමක් විය හැකි ද? කතා කරන්නට දෙයක් ගැන මම කල්පනා කළෙමි. අප අතර නිශ්ශබ්දතාවක් ඇති වූයේ ඔහු ද එවැනි ම කල්පනාවක වැටුණු නිසා විය යුතු ය.

"දෙවෙනියිය කවදද වත්තට යන්නෙ ආපහු?"

"කියන්න බෑ කුසුම්.............. ගෙදරට ආවම යන්න හිතත් නෑ. ඉන්න හිතත් නෑ. ගෙදර පාළුවට ම ගියා."

"දවසක් දෙකක් මමත් ළඟදි ගියා. පාළුවෙ ඉන්න බෑ තමයි."

රෝහණ කතා නැති ව සිගරැට්ටුව උරන්නට විය. ඇත්ත වශයෙන් මා හොඳින් ඇසුරු කළ දූනහැඳුනුම්කම් පැවැත්වූ පවුලකට ගිය කල ය යි සංවේගයක් හා අනුකම්පාවක් මා තුළ උපන්නේ ය. රෝහණ අද මගේ හද ගැබට ඇඟිලි නොගසයි. ඒ නිසා මගේ අනුකම්පාව හා සංවේගය වැඩෙයි.

"නො කෙරෙන දේවල් ගැන කල්පනා කරන්නෙ නැතුව දෙවෙනියිය කෙරෙන දෙයක් ගැන හිතල බලන්න. මම මේ කියන්නෙ අයියලගෙ පවුල දන්න පවුලෙ කාටත් ආදරේ ඇති කෙනෙක් විදියට. පවුලෙම කෙනෙක් විදියට - ඔය ගෙදරට දැන් ගෑනියෙක් ඕනෑ."

"ඇත්ත කුසුම්. ඇත්ත. මම කල්පනා කළෙත් ඒකයි. ඒව සේරම කල්පනා කරල තමයි මම කුසුම්ට අර යෝජනාව කළේ. ඒක.............."

"වෙන්නෙ නැත දෙයක්නෙ!"

"ඒකත් ඇත්ත. මම පිළිගන්නව. මම කළේ මෝඩ වැරදි යෝජනාවක් බවත් මම පිළිගන්නව. කාරණා කීපයක් උඩ. කුසුම් මම කියන එක අහන්න............."

"දෙවෙනියියෙ ඔය තරම් සිගරට් බොන්න එපා."

"මට තේරුණා කුසුම් ගෙදරට ගෑනියෙක් ඕනෑ බව. කොහොම ගෑනියෙකුට ද අපේ ගෙදර ඇවිත් ඉන්න පුළුවන්? කොහොම ගෑනියෙක්ද අපේ ගෙදරට ඕනෑ? මම මුලදීම කිව්ව කුසුම් අයිය අපිට නැති වෙයි. අයිය එයාටමත් නැතිවෙයි කියල. මේවා නංගිට කියන්න ඕනෑ නෑ. ප්‍රශ්නෙට සම්බන්ධ නිසා නිකම් කියන්නම්. අයිය බැන්ද ලොකු තැනකින්. මම හිතන්නෙ නෑ අයිය සතුටින් ඉන්නව කියල. හනිමූන් දවසෙවත් අඩුගානෙ එයා සතුටින් හිටිය කියල. ඊට වැඩිය ඒ ගැන කියන්න ඕනෑ නෑ. දූත් ඊළඟට මම බඳිනව කියමුකො. මම ඒ ගෑනි අරගෙන එක්කො වත්තට යන්න ඕනෑ. ඒකෙන් ප්‍රශ්නෙ විසඳෙන්නෙ නෑ. ගෙදර බලාගෙන අම්මලට තාත්තලට සලකගෙන කවුරු හරි ඉන්න ඕනෑ. එහෙම නම් ගෙදර පදිංචි වෙන්න ඕනෑ වෙන රස්සාවක් හොයාගෙන. නැත්නම් ඉඳල හිටල එන්න ගෑනි ගෙදර නවත්තල යන්න ඕනෑ. පිට ගෑනියෙක් ඇවිදින් අපේ ගෙදර වැඩ කරනවය කියන එක ලේසි නෑ කුසුම්"

"නැන්දට ඕනෑ ඉතින් වැඩම තමයි"

"වැඩ කළාට කමක් නෑ කුසුම් වැඩ කරන්න ඕනෑ. ගෑනු වුණත් පිරිමි වුණත් වැඩ කරන්න ඕනෑ. බෝනික්කො වගෙ තියාගන්න ගෑනු ඕනෑ නෑ. නමුත් ඒවයෙ පිළිවෙළක් තියෙන්න ඕනෑ. පොල් අත්ත වියන්නත් ඕනෑ. කොස් ඇටයක් අහක දන්නත් බෑ. ගෙහේ බිලිං ටික අහක යනවට ලෝබකමට ඕක කඩල වේලල තව කුනපහත් දල අච්චාරු දල බල්ලෙක්වත් කන්නෙ නෑ කුණු වුණාම අහක දානව. ඒක අපතෙ යෑමක් කියල හිතන්නෙත් නෑ. ඒ වගෙ තමයි හැම වැඩක් ම. ඒවගෙ වටිනාකමක් තිබුණු කාලයක් තියෙන්න ඇති කුසුම්. නමුත් දැන් ඒව වෙනස්. අම්මල දන්නෙ නෑ. ඕව සේරමත් බදගෙන සේරමත් කරන්න ඕනෑ. මොන එකකට ද? දන අයිය ගෙදරට ගණනාත්



එවනව. මමයි මල්ලල දෙන්නෙකුයි රස්සාව කරනව. තව ටිකක් හරි ආදායමක් තියනව. මදිද? හොඳට කාල බීල සැපසේ ඉන්න පුළුවන්."

"ඒක තමයි මමයි අම්මයි කතා වුණෙත් කීප දවසක්............."

"අර නාකි ගෑනියෙක් ඉන්නව. බලු බල්ලන්ට කන්න බෑ උයන දෙයක්. ළමිස්සියෙක් තියාගන්න බෑ කියමුකො කොල්ලො ගැවසෙන තැන නිසා. නමුත් වැඩ පළ කරන්න පුළුවන් උයන්න දන්න තලත්තෑනි ගෑනු නැතෑ ඕනෑ තරම්. කොහෙද වැඩකාරයෙක් ආවොත් උන්ට වැඩක් කරන්න දෙන්නෙ නෑ. ධූණු ඕකක් අපතෙ යයිද අඹ ඇටයක් වැඩිය දයිද ගෙයි වතුර ඉහිරෙව්ව ද සේරටම ඇඟිලි ගහන්න ඕනෑ."

"ඒක නම් ඇත්ත. නැන්දට ඉතින් තමන් ම අත නො ගැහැව්වොත් හිතට මදි. ඕන්න ඉස්සර හරි මම ඉන්නව නම් විතරයි වැඩට ඇඟිලි ගහන්න නොයන්නෙ"

"ඉන්න කුසුම් මම ඒ කාරණේට එන්නම්............. තාත්තට රසට කන්න ඕනෑ. කුසුම් දනනව ඒක. මම හිතන්නෙ දූත් තාත්ත ඉන්නෙම බඩ ගින්නෙ."

"මාම ගෙදර නෑ වැඩිය............."

"හිටියැකිද කුසුම් ඒ ගෙදර..........? ඒ ගොල්ල කාලයක් දුක් වින්ද. හිතට අමාරු ඒකයි. අපි පොඩි කාලෙ නැති බැරි කාලෙ අපි වෙනුවෙන් බොහෝම දුක් වින්ද. එහෙම දුක් විඳල අපි අද එක තැනකට ආව. ලක්ෂපතියො නෙවෙයි. දෙයියනේ කියල කාල ඇඳල රගේ ජීවත් වෙන්න පුළුවන් තැනකට. ඇයි අපිට ඒ විදියට ජීවත් වෙන්න බැරි? ඇයි අද ඒ ගොල්ලට සැපසේ ජීවත් වෙන්න බැරි? ඇයි අපි වෙනුවෙන් දුක් වින්ද ඒවයෙ වන්දිය ගෙවන්න අපිට ඉඩ නො දෙන්නෙ? ඒකයි කුසුම් හිතට අමාරු"

"ඇත්ත තමයි. දූන් ඉතින් සැප විඳින්න ඕනෑ කාලෙ. අමාරුවකුත් නැනෙ."

"එච්චරක් නෙවි. අපි සලකන්නෙ නෑ කියල හැඟීමකුත් තියනව. සලකනව කියල මොනව කරන්නද නංගියෙ? වැඩකාරයෙක් තියල පඩි දීල කෑමට බීමට වියදම් කරල සේරම

www.sinhalaelibrary.com

කළැකි. ඉදල හිටල ඇවිදින් සැපදූක් බලන්න පුළුවනි. චන්ද්‍රනා ගමනක් විනෝද ගමනක් එක්ක යන්න පුළුවනි. ලෙඩට දුකට බලන්න පුළුවනි. ඒවට ඉඩ දෙන්නෙ නෑ. දුන් අර අහක වාහයක් කියල රට කෙඳිරිගානව. මම එන දවසක් ඇත්නම් කතා කරනව යමු දෙස්තර කෙනෙක් ළඟට හරි කොහේ හරි කියල. එන්නෙ නෑ! උස්සගෙන යන්නද කුසුම්? අම්ම කියන්නෙ මය නිකම් වැඩක් නැතුව ඉන්න නිසාලු වාගෙ හැදුනෙ. නිකම් හිටියට ලෙඩ හැදෙනවද මිනිස්සුන්ට? නිකම් ඉදල නෙවි. ඒ කාලෙ නැහි නැහී වැඩ කරපුවයෙ විපාක. දුන් බෙහෙක් අරගෙන හොඳට කාල නාල ඉන්න එකයි තියෙන්නෙ."

"ඔව් ඉතින් නැන්දල ඒ කාලෙ මහන්සි වුණානෙ"

රෝහණ නැවත කතා කරන්නට පටන් ගත්තේ තත්පර කීපයක් මහන්සි ඇරීමෙන් පසුව ය.

"කුසුම් හිතනව ද අයියගෙ විවාහයෙන් අම්ම පාඩමක් ඉගෙන ගත්ත ය කියල? නෑ. අම්ම ඒකෙන් ඉගෙන ගත්තෙ නෑ............... කුසුම් දන්නව නේද අර විජේගුණවර්ධනල හන්දියෙ............"

"අර ලොකු ගේ නෙ?" යි නිමල්ගේ අසාර්ථක වූ විවාහයත් විජේගුණවර්ධනලාත් අතර ඇති සබඳකම කුමක් දැයි තේරුම් ගැනීමට උත්සාහ ගනිමින් ම මම ඇසීමි.

"ඔව් ඔය විජේගුණවර්ධනලගෙ ඉස්සර නම් පෙරේරා. ඔය කොල්ලගෙ මහප්ප කෙනෙක් හිටිය. ඒ මහප්පට ලැබුණා මුහන්දිරම්කමක්. ඒ කාලෙ ඔය සුද්දගෙ කාලෙ මුහන්දිරම්කමක් මුදලිකමක් දෙන්නෙ නිකම් නෙවි. අලුත් නමකුත් එක්කල. මුහන්දිරම්කම ලැබුණට පස්සෙ පෙරේරල විජේගුණවර්ධනල වුණා. ඒක ඒ මුහන්දිරම්කම ලැබුණු පුද්ගලයට විතරක් නෙවි. පවුලෙ අනෙක් සහෝදරයන්ටත් ඒ නම පාවිච්චි කළැකි. අපෙ අම්ම හිතන්නෙ මේ අයියගෙ ඩියාරෝකමත් අන්න ඒ වගෙ කියල කුසුම්. නංගි මොකද හිතා වෙන්නෙ? විහිළුවක් නෙවි. මම මේ කියන්නෙ ඇත්ත. අම්ම හිතනව අයිය ඩියාරෝ වුණාම අපි ඔක්කොම ඩියාරෝ කියල. මම ඩියාරෝ. විජය ඩියාරෝ. අර ඉස්කෝලෙ යන මහතුනුත් ඩියාරෝ කියල යි අම්මගෙ හිතේ. අපි



හැමෝටම සේනාරත්න පවුල නැත්නම් ඊට ඉහළ පවුලකින් තමයි ගෑනු ගේන්න දැන් අම්මගෙ හිතේ තියෙන්නෙ. ඉන් මෙහා නැතකින් බෑ. ඩියාරෝකම නැතත් සේනාරත්නලට වැඩිය ලොකු නැන්වලින් කටයුතු කරගන්න අපිටත් පුළුවන් වෙයි. හැබැයි ඒ හැම පවුලකම අපේ නෑන වගෙ කරක්ගෙඩි හිටියොත්! නැත්නම් බෑ............... මම නම් හිත හදගෙන ඉවරයි. මම එක හැටියක් බාර ගන්නව. තවත් ඉන්නවනෙ. මට දුක උන් ගැන..............."

"අනේ මම දන්නෙ නෑ දෙවෙනිසියෙ"

"එක අතකට කුසුම් අයියගෙ කටයුත්ත එයාම කරගත්ත එක. අම්ම එතනට මඟ පෑදුව විතරයි. අම්මත් වග කියන්න ඕනෑ. සම්පූර්ණයෙන් ම නෙවි. එක්කො එයාගෙ ඉරණම. නැත්නම් දැනගෙන හරි නො දැන හරි කුසුම්ට දුන්න ගින්දර. ඒ..............."

"මම නම් ජාති ජාතිවත් නෑ අයියෙ එහෙම හිතන්නෙ." කඳුළු ඇහිව මම කීමි. "............... මම අදත් දෙවියන්ට කියන්නෙ එයාට දුකක් වේදනාවක් දෙන්න එපයි කියන එක. මට තිබුණෙ එයාගෙ සැපතට බාධා නො කර අයින් වෙන එක. මම ඒක කළා. ඉතුරු හරිය ඉරණම."

"කුසුම් කිව්ව නෙ නංගි වැඩට ගියාම විතරක් අම්ම ඇඟිලි ගහන්න යන්නෙ නෑ කියල. මට කියන්න ඕනෑත් අන්න ඒ ටික. අපේ ගෙදර වැටිල තියන තත්වය ගැන මම හුඟක් කල්පනා කළා කුසුම්............... මම ඊට ඉස්සෙල්ල කියන්නම් මම ගැන. මම නරක මිනිහෙක්! මම..............."

"අනේ අපිට නම් කිසි වැරැද්දක් නෑ."

"මම හොඳ මිනිහෙක් නෙවි. නංගිල දන්නව. මම නංගිල දන්නවටත් වැඩිය නරකයි. මමයි මා ගැන දන්නෙ. නමුත් කුසුම් ගැන කවදාවත් අහිතක් හිතුවෙ නෑ."

"ඒක අපිත් දන්නව. අපි කියන්නෙ මම දන්නව. අම්ම දන්නව. නැන්දත් දන්නව. නැන්ද නිතරම කියනව ඒක."

"අයිය කුසුම්ට ආදරය කරන්නෙ පුංචි කාලෙ ඉඳල. ඒ නිසාම නෙවි මම කුසුම් ගැන අහිතක් නොහිතුවෙ. නංගි අපේ ගෙදරම වගෙ හැදුණෙ. අපේ පවුලෙන් පිට කෙනෙක් කියල

මගෙ අදත් හැඟීමක් නෑ. කුසුම් සමුපකාරෙට යනව කියල ආරංචි වුණාම මට තරහ ගියෙත් ඒ තරම් ඒකයි. මගෙ හිතේ තිබුණා හැඟීමක් අපෙන් - අපේ පවුලෙන් කුසුමට අයුක්තියක් වුණා කියල. ඒකට අපි වන්දි ගෙවන්න ඕනෑ කියල. නංගිට අර යෝජනාව කරන්න මම පෙළඹුණු එක හේතුවක් ඒක. අනික තමයි මම අර මුලින් කිව්ව කාරණාව. අපේ පවුලට - අපේ ගෙදරට - ගෑනියෙක් ඉන්නව නම් - අපේ ගෙදරට එළියක් දෙන්න පුළුවන් ගෑනියෙක්, මම දන්න තැනක ඉන්නව නම් - ඒ කුසුම් විතරයි. තව ලෝකෙ ඇති කුසුම් වගෙ ගෑනු ළමයි. මම නෑ කියන්නෙ නෑ. නමුත් හොයන්න බෑ. අමාරුයි. එහෙම හිටියත් ඔය කුසුම් තරම් අපේ පවුල ගැන දන්නෙ නෑ. කුසුම් සේරම දන්නව. හොඳ නරක සේරම දන්නව. අපේ අම්මත් එක්කල වැඩ කරගෙන ඉන්න පුළුවන්කමක් ඇති ගෑනියෙක් මේ ලෝකෙ ඇතෙයි කියල මම හිතන්නෙ නෑ. අපේ පවුලෙ අද තත්ත්වයෙ හැටියට ගේ දොර බලාගෙන අම්මට සලකගෙන ඉන්න කුසුමට වැඩිය සුදුසු තවත් ගෑනියෙක් හොයා ගන්න පුළුවන් කියල මම හිතන්නෙ නෑ! ඒව සේරම කල්පනා කරල තමයි කුසුම් මම එද අර යෝජනාව කළේ. හිතන්න එපා කුසුම් අපේ ගෙදර දාසකමට ගෙනියන්න............"

"මට තේරෙනව අයිය කියන දේ"

"මම ඒ යෝජනාව ලේසියෙන් කළා නෙවි. කුසුමට අර සමුපකාරෙට යන්න එපයි කියන්න ආව නිසා ඒක උඩින් ඔය තරමටවත් කියා ගත්තෙ. නැත්නම් මට කුසුම්ගෙ මූණ බලාගෙන ඕක කියා ගන්න බෑ. මම ඕක කුසුමට යෝජනා කරන්න හිත හදගත්තෙ බොහොම අමාරුවෙන්. කුසුම් ගැන එහෙම එකක් හිතන්න වෙයි කියල මම කවදාවත් බලාපොරොත්තු වුණේ නෑ. ලෝකෙ හැම ගෑනියෙක් දිහාම මම බැලුවෙ එකම ඇහැකින්, එකම බැල්මකින්. එකම වහවර ආත්මාර්ථකාමී චේතනාවකින්. මම නෑ කියන්නෙ නෑ. මම ළමිස්සියක් දිහා ඊට පිටස්තර ඇහැකින් බැලුව නම් ඒ නංගි දිහා විතරයි. අනෙක් හැම ගෑනු දිහාම බලන ඇහෙන් මම නංගි දිහා කවදාවත් බැලුවෙ නෑ. බලන්නෙත් නෑ. බලන්නත් බෑ. කුසුම් එද කිව්ව දේවල් සේරම ඇත්ත."



"ඒ ගැන මතක කරන්න එපා. එද මම පිස්සියක් වගෙ හැසුරුණේ."

"එහෙම හැසිරෙන්න කුසුමට අයිතියක් තියනව. නංගි කිව්ව සේරම ඇත්ත. අම්මගෙ හිත කඩන්න සූදානම් වුණා නම් කුසුමට තිබුණ අයිය බැඳ ගන්න. කුසුමට අයිය නැති වුණේ අපේ අම්ම ගැන බැලුව නිසා. මගෙ ප්‍රශ්නෙදිත් ඒකමයි. ඒකයි මගෙ යෝජනාව මෝඩ එකක් කියල කිව්වෙ. අම්මගෙ හිත කඩන්න පුළුවන් නම් මම නැතුවට මට වැඩිය හැම අතින්ම උසස් - කුසුම් ප්‍රාර්ථනා කළ අපේ අයියව බැඳ ගන්න තිබුණ. තීරණය අදත් අම්ම අතේ. කුසුම් ගැන කියල නෙවි. මම වටින් පිටින් වචන දලා බැලුව. අම්මගෙ හිත වෙනස් වෙලා නෑ. අම්ම පාඩම් ඉගෙනගෙන නෑ. සේනාරත්න පවුල! නැත්නම් ඊට ඉහළ නැත්!"

"උසස් බලාපොරොත්තු තියාගෙන ඉන්න එක හොඳ දෙයක් නමුත්............"

"සීමාවක් තියෙන්න ඕනෑ. අපේ අම්ම අම්ම කෙනෙක් විදියට දහකගෙන් හොයන්න බෑ කුසුම්. අපි යම් දියුණුවක් ලැබුව නම් ඒ අම්ම නිසා. තාත්තා නෙවි මහන්සි වුණේ. තාත්ත නෙවි ඔය වැඩ කළේ. තාත්ත නෙවි ගෙවල් හැදුවෙ. සේරම අම්ම. ඒව සේරම ඇත්ත. නමුත් අම්ම අපෙන් ඕනෑවට වැඩිය දේවල් බලාපොරොත්තු වෙනව. මේ පළාතෙ - ගමේ විතරක් නෙවි මුළු පළාතෙම - සේරටම වැඩිය ඉහළින් වැඩ කරන්න අම්මට ඕනෑ. ඒ තෘප්තිය විඳින්න ඕනෑ දෙයක් පරිත්‍යාග කරන්න අම්ම ලෑස්තියි. අපිට තියෙන්නෙ අපේ අම්ම ඒ තෘප්තිය විත්ද කියල හිතාගෙන ඒකට සැපවෙන එක විතරයි කුසුම්. කුසුම් වගෙ ගෑනු ළමයෙක් අතින් බත් වේලක් කන්න, අමාරු මොහොතකදී බෙහෙත් වේලක් බොන්න වාසනාවක් අපේ අම්මට නෑ. ඒ නැති වාසනාව බලෙන් අම්ම පිට පටවන්න පුළුවන්කමක් අපිටත් නෑ."

"මට මොනාවද අයියෙ ඉතින් කියන්නෙ?" යි මා ඇසුවේ උගුරෙනි.

"මොනාව කියන්නද කුසුම්?" ය යි රෝහණ තමාට ම කියා ගත්තේ ය.

පුළුවන් කමක් - ඉඩක් - එහාම නිදහසක් - තිබිණි නම් මෙහි දී රෝහණ හතුරුසිංහ හඬා වැලැපිය හැකිව තිබිණි. රෝහණ කුඩා දවස හෝ හඬනු මා දක නැත. ඔහු හඬන්නට ඇත්තේ මට මතක ඇති කාලයකටත් එපිට දී විය යුතු ය.

කතා නැති ව බිම බලාගෙන මඳක් කල්පනාවේ යෙදී සිටි රෝහණගේ ඇස්වල ජීවිතයේ අන් කිසි දවසෙක පිරිමියකු වෙත මවිසින් නොදක්නා ලද වේදනාවක් සටහන් වී තිබිණි.

"කුසුම්ගෙන් මම කාරණා දෙකක් ඉල්ලනව. එකක් ඒ තරම් වැදගත් එකක් නෙවි. මට වැදගත්! නමුත් අමාරු නම් මම කුසුම්ට බල කරල කියන්නෙ නෑ."

"මට පුළුවන් ඕනෑ දෙයක් මම කරන්නම් දෙවෙනියියෙ, මට..............."

"කුසුම් ඉඳල හිටල අපේ ගෙදර යන්න"

"මට දවස ගානෙ වුණත් යන්න බැරි යැ"

"කුසුම් ලේලි කර ගන්න අම්ම සූදනම් නෑ. ඒක වෙනම එකක්. නමුත් කුසුම්ට ඒ ගෙදරයි මේ ගෙදරයි කියල දුනුත් කාගෙන්වත් වෙනසක් නෑ.............. යනව එනව නම් අම්ම සතුටුයි."

"දුනුත් මම යනවට ගොඩාක් සන්තෝසයි නැන්දට"

"අනික් කාරණය නම් කුසුම් මම බල කරල කියනව. මම ඉල්ලන ලොකුම උදව්ව. මම ආයෙත් මේ ගෙදරට එන්නත් පුළුවනි කුසුම්. නේන්නත් පුළුවනි. මම නාවොත් හෙම..............."

"දෙවෙනියිය මේ මොනව කියනවද මම දන්නෙ නෑ. මුසල කතා! ඇයි අයියට එහෙම එන්න බැරිකම?"

"කිසිම බැරිකමක් නෑ කුසුම්. නමුත් 'මම දන්නෙ නෑ මම සමහර විට නැවිදින් හිටිවි. එහෙම වුණොත් - එහෙම වෙන එකක් නෑ මම හිතන්නෙ - එහෙම වුණත් තරහටය කියල හිතන්න එපා.............. මම ඉල්ලන උදව්ව මේකයි. මම ආවත් නැතත් ගම හිටියත් නැතත් නංගිට සහෝදරයෙක් ඉන්නව කියල හිතේ තියා ගන්න! නංගිට ඕනෑ කමක් වුණොත් කරදරයක් ලෙඩක් දුකක් මොනව වුණත් මොන උදව්වක් ඕනෑ වුණත් මට කියල එවන්න. ඕනෑම උදව්වක් ඕනෑ වුණොත් මට කියන්න. කුසුම් එද කිව්ව වගේම අපි අතරෙ එද වුණු විදියෙ කතාවක් වුණේ නෑ කියල හිතා ගනිමු. මම සහෝදරයෙක් කියල සලකන්න."



"එක කුසේ උපන්නෙ නෑ කියල වෙනසක් මගෙ නෑ අයියෙ."

ඒ වචන කීපයෙන් මම කිව යුතු - කිව හැකි සියල්ල කියා ගතිමි යි සිතිමි. තවදුරටත් කිව හැකි කිසිවක් නොවුණත් කිව යුතු බොහෝ දේ මගේ හදවතෙහි ඉතිරි වුණා විය හැකි ය. ඉතිරි වුණු දේවල් මගේ උගුරෙහි හිර විය. දෙ අතින් මුහුණ වසාගෙන ගෙට ගිය මම ඉකිබිඳිමින් හඬන්නට පටන් ගතිමි. විනාඩි ගණනකට පසුව මා ආපසු එන කල රෝහණ හතුරුසිංහ දක්නට නොවී ය.

වේදනාව මගේ සිතට අලුත් දෙයක් වත් හුහුරු දෙයක් වත් නොවේ. මතක ඇති කාලයේ සිට මා නොයෙක් හේතූන් උඩ වේදනා විඳ ඇත. දුප්පත්කමින් හා නැතිබැරිකමින් මිරිකුණු පවුලක උපන් මට කෑම බීම, ඇඳුම්පැලඳුම්, පොත්පත් හා අවශ්‍ය තව නොයෙක් දේවල් අහිමි වීම නිසා දුවි චිත්ත පීඩාවනට මුහුණ දීමට සිදු වී ඇත. බාල කාලයේ මල්ලීත් පසුව තාත්තාත් මිය ගියහ. සෝමා අනාථ වුණා ය. ජීවිතයේ මා සතු ලොකුම වස්තුව ය යි වරක් සිතූ පැතූ නිමල් මට අහිමි විය. මගේ ඉගෙනීම අතරමඟ නතර විය. මගේ බලාපොරොත්තු වැඩි හරියක් සුළගේ පාවී අහෝසි වුණු බොල් සිහින බවට පත් විය. වයස අනුව බලන කල අවුරුදු විස්සක විසි දෙකක මගේ මේ කෙටි ජීවිත කාලය නොයෙක් විදියේ බාධක, කම්කටොලු, පරාජය, බලාපොරොත්තු සුන්වීම ආදී නොයෙක් ගැටුම්වලින් පිරුණු එකකි. මෙවැනි අමිහිරි කර්කශ අත්දැකීම් වැලකට මුහුණ දුන් මට ජීවිතයේ වැඩි කොටස වේදනාවෙන් ගත කරන්නට වීම පුදුමයක් නොවේ. කඳුළු අතරින් සිනාසීමට තරම් ආත්ම ශක්තියක් හා චිත්ත ධෛර්යයක් තිබුණු මා එඩිතර ව ජීවිතයට මුහුණ දීමට සමත් වූ නමුත් මම හැම පරාජයක දී ම තිහඬ වේදනා විඳ ඇත්තෙමි. වේදනාව මට අලුත් දෙයක් වත් හුහුරු

www.sinhalaelibrary.com

දෙයක් වත් නොවණ ද රෝහණගේ කතාව නිසා ඇති වූ අන්දමේ වේදනාවක් මා ඉන් පෙර අත්දැක තිබුණේ නැත.

කලින් දවසේ මට විවාහ යෝජනාව කළ අවස්ථාවේ ඔහු ගැන මෙන් ම මුළු හතුරුසිංහ පවුල ගැන ම යම් කිසි අමිහිරි හැඟීමක් ඇති වුණා නම් ඊට වඩා හාත්පසින් ම වෙනස් හැඟීමක් ඔවුන් ගැන මෙදින මගේ සිතට නැඟිණි. එය අලුත් හැඟීමක් ම නොව කාලයක් තිස්සේ සිසිලත් මාත් අතර තිබී නිමල් හා මා වෙන්වීමත් විසින් වසා දමන ලදු ව සැඟවුණු සබඳකම හා ලෙන්ගතුකම ය. හතුරුසිංහ පවුලත් මාත් අතර පැවැති සබඳකම නැති වුණේ අන් කිසිවකුගේ වරදකින් නොව මගේ ම වරදිනැයි හැඟීමක් මට ඇති විය. ඔවුන් නොතකා හැරීමෙන් මා යුතුකමක් පැහැර හැර තිබෙන බවට මගේ සිත වේදනා විඳින්නට විය.

මා කවදත් රෝහණ සැලකුවේ සහෝදරයකු වශයෙනි. ඔහු ද කවදත් මා නැගණියක ලෙස සැලකූ බව මට රහසක් නොවී ය. රෝහණ දැකීමෙන් ද ඔහු හා කතා බස් කිරීමෙන් ද ඉතා හිතවත් ළඟ නෑයකුගේ දර්ශනයෙන් හා ආශ්‍රයෙන් ලබන සෙනෙහසක් හා තෘප්තියක් මම කවදත් ලැබුවෙමි. එහෙත් රෝහණ හතුරුසිංහ මේ තරම් මා සිය හදවතට ළං කරගෙන සිටි බවක් මා ඔහුගේ හදවතට මේ තරම් සමීප ව ජීවත් වූ බවක් මම නම් දැන නොසිටියෙමි. ඔහු මට දක්වා තිබෙන ආදරය කරුණාව හා දයාව සමඟ සසඳන කල ඔහු වෙනුවෙන් මගේ තිබුණු හැඟීම මඳි ය, අල්ප ය යන කණගාටුවක් දැන් මට ඇති වෙයි. රෝහණ වෙත අවශ්‍ය තරමේ දයාවක් නොපෙන්වීමෙන් මගෙන් ඔහුට වෙනස්කමක් සිදු වී තිබෙන බවට පසුතැවිල්ලක් මගේ සිතට කරදර කරන්නට වන්නේ ය.

මගේ වේදනාව දැඩි වූයේ මෙපමණකින් නොවේ. දුකක් කරදරයක් අමාරුවක් වූ ඕනෑම අවස්ථාවක ඕනෑම උදව්වක් බලාපොරොත්තු වන ඉල්ලීම ඔහු මගෙන් කළේ ය. හිතවත් සහෝදරයකු සිටින බව මතක තබා ගන්නා ලෙස ඔහු ඉල්ලා සිටියේ ය. එහෙත් ඔහු තව දුරටත් මට අයිති නැත. ඔහු අපේ ගෙදරින් පිට ව ගියේ හිතවතකු, නෑයකු, සහෝදරයකු වශයෙන් මට තිබුණු සියලු හිමිකම් අහිමිව ය. රෝහණ හතුරුසිංහ මගේ ජීවිතයෙන් සදහට ම නැති විය. මගේ සැබෑ ලෝකයට සැබෑ



ජීවිතයට ඔහු තවදුරටත් අයිති නැත. මෙතැන් පටන් ඔහු ජීවත් වන්නේ මගේ හදවතෙහි අනුස්මරණීය කටයුතු ආදරණීය මතකයක් වශයෙන් සිහිවටනයක් වශයෙන් පමණකි. ඒ මතක නිමල්, සෝමා හා පද්මිනී මෙන් අතීතයට පමණක් අයිති වූවකි.

නිමල්, පද්මිනී හා සෝමා මෙන් ම රෝහණ ද මට නැති විය යන හැඟීම මගේ සිතේ තහවුරු විය.

"අදත් ආව ද අඩවල යන්න. මම මේ අක්ක නිසා ඉවසා ගෙන හිටියෙ. කීප සැරයක් මට බැණින්න හිතුණ." පුංචි නංගී කාමරයේ දොරකඩට පැමිණ කීවා ය.

"මොකුත් නොදැන එහෙම කතා කරන්න එපා අනූ." යි මම අලුත් කර ගත් කඳුළු ද ඇතිව කීමි.

මගේ වචන බැගෑපත් ඉල්ලීමක් විය. මොහොතක් අන්දුන් කුන්දුන් ව මා දෙස බලා සිටි ඈ ඇඳේ මා පසෙක වාඩි වුණා ය.

"මොකද අක්කෙ?"

"දෙවෙනියිය දේවල් ගොඩාක් කිව්ව. එයා අපි හිතුවට වඩා හුඟක් වෙනස් නංගියෙ."

"හිත අරගෙන ගිහිල්ල වගෙ"

"එහෙම කියන්න එපා. පව්! නංගි කතා කරන්නෙ කිසි දෙයක් නොදැන."

"ඉතින් කියන්නකෝ! මම කොහොමද දන්නෙ."

අප අතර ඇති වූ කතාව මම නැගණියට කීවෙමි.

"මම හිතුවෙ දෙවෙනියියට අලිපැටියෙක් වගෙ ඇඟපත මිසක් මොළයක් නෑ කියල. මට නම් පුදුමයි."

"මොළයක් විතරක් නෙවී පපුවකුත් තියනව. රත්තරන් පපුවක්............. අපි නොයෙක් දෙනා ගැන වැරදි විදියට කල්පනා කරනව."

"ඒකනම් ඇත්ත. එක පැත්තක් විතරක් බලල එක අඩුපාඩුවක් විතරක් දකල කෙනකුගෙ හොඳ නරක මනින්න

www.sinhalaelibrary.com

හොඳ නෑ කියල මටත් හිතෙනව. මිනිස්සු ගැන නිගමනයකට බහින කොට හුඟක් කල්පනා කරන්න ඕනෑ."

"නංගිට දෙවෙනිපිය ගැන දුක නැද්ද?"

"ඇයි නැත්තෙ? මට තවත් දුකයි එයා ගැන මගෙ කලින් පැහැදීමක් නොතිබුණු එක ගැන"

අපි දෙදෙනා ම කල්පනාවක වැටුණෙමු.

"හැබැයි අක්කෙ අර අම්මන්ඩි ගැන නම් මගෙ පරණ අදහස් මම වෙනස් කර ගන්නෙ නෑ. ඇත්ත කියනොත් දුක් ඉස්සරටත් වැඩිය හිතෙනව මේ සේරටම මුල එයයි."

"නැන්ද හිතනව ඇති දරුවන්ට කරන්න පුළුවන් ලොකු දේ නමයි............."

"අක්ක බණ ගැන හිතල මිනිස්සුන්ට සමාව දෙන්න. මට නම් බෑ"

මම කියන්නට ගිය දේ අවසන් නොකර කරබා ගතිමි.

රෝහණ හතුරුසිංහ දින ගණනක් යන තුරු ම මගේ සිහිවිලි අතර නිරන්තරව ම වාගේ රැඳී සිටින්නට විය. අප අතර වූ කතා බහෙන් අමතක ව ගිය බොහෝ දෙයක සටහන් මැද ඔහුගේ දුක් බර දෙනෙත් ද වේදනාවෙන් පිරී මුහුණ ද ඇඳී තිබිණි. ඔහු මහත්මයෙක් ය වීරයෙක් ය යන නිගමනයට නොබැස සිටීමට මම අපොහොසත් වීමි.

මට දුක් වූ තරමට මගෙන් ඔහුට ලෙන්ගතුකමක් නොදක්විණැයි ඇති වූ පසුතැවිල්ල නිසා වන්දි ගෙවීමක් වශයෙන් ඇති කර ගත් මේ නිගමනය ඔහු වෙනුවෙන් මගේ හදවතෙහි ගොඩ නැංවුණු සිහිවටනයක් ලෙස මම සලකමි. අකලංක සහෝදරත්වයකට පිරිනැමිය හැකි ලොකුම උපහාරය ද මේ සිහිවටනය ම වන්නේ ය.

දෙමව්පියන් වෙනුවෙන් ආදරය කැප කරමුයි මා කොතෙක් කීවත් නිමල් පිළිගත්තේ නැත. හිතුවක්කාරකමට හෝ විවාහ වීමට කැමැති වන ලෙස මා පෙළඹවීමට නිමල් හැකිතාක් උත්සාහ කළේ ය. රෝහණ ද මේ අදහසට අනුබල දුන්නේ ය.



දෙමව්පියන්ගේ කැමැත්ත ඇතත් නැතත් සිය සොහොයුරා සමඟ විවාහ වන ලෙස මා පෙළඹවීමට රෝහණ උත්සාහ කළේ ය. නිමල් මගේ සිත වෙනස් කරගැනීමට තැත් කළේ තමා වෙනුවෙනි. එය ආත්මාර්ථකාමී ව කළ ක්‍රියාවකි. රෝහණ එසේ නොවේ. ඔහු මා පැතුවේ තමා වෙනුවෙන් නොවේ. දෙමව්පියන් ද සහෝදරයන් ද මා ද වෙනුවෙනි.

අයියා සමඟ හිතුවක්කාරකමට හෝ විවාහ වන ලෙස මට කී ඔහු තමා සම්බන්ධයෙන් එවැනි අදහසක් අසලකට වත් ගත්තේ නැත. ඔහු මගේ හදවතට ඇඟිලි ගසන්නට එන කෙනකු වශයෙන් මම සිතාගෙන සිටියෙමි. ඔහු මගේ හදවතට ඇඟිලි ගැසූ බව ඇත්තකි. එසේ කළේ නිමල් හා මා පිළිබඳ ප්‍රශ්නයේ දී පමණකි. ප්‍රශ්නයට තමා සම්බන්ධ වූ කල ඔහු එසේ කළේ නැත. එද - කලින් දවසේ - අන්තිමට මගේ හදවතට ඇඟිලි ගසන්නට ආවා නම් රෝහණ යන්නට තිබුණේ මගේ හදවත ද රැගෙන විය යුතු ය.

"මම දෙවියන්ගෙනුත් ඉල්ලන්නෙ එයාට දුකක් වේදනාවක් දෙන්න එපා යි කියල.............." යනුවෙන් රෝහණගේ කතාවකට නිමල් සම්බන්ධ ව තිබේ ඇත්ත වශයෙන් මා ඔහු වෙනුවෙන් යාඥා කළ නිසා නොවේ. එතැන් පටන් වත් නිමල්ගේ චිත්ත සන්තුෂ්ටිය ප්‍රාර්ථනා කළ යුතු ය යි සිතාගෙන පමණි. එහෙත් මා රෑ නින්දට ගොස් පිරිත් පරිදි පන්සිල් ගෙන කුණුරුවන් වැඳ දෙවියනට පින් දී ඉල්ලා සිටියේ නිමල් වෙත සතුට සැනසීම ලබා දෙන ලෙසට නොවේ. ඊට වඩා ඕනෑකමින් හා භක්තියකින් මා දෙවියනට කන්නලව් කළේ රෝහණ ගැන ය.

www.sinhalaelibrary.com

## 12

මාස හත අටක් ගත වූ නමුත් රෝහණ හතුරුසිංහ නැවත ගමට ආවේ නැත. මේ කාලය ඇතුළත නිමල් දෙ වරක් ගෙදර පැමිණි බවත් එක් අවස්ථාවක රැය ගත කර ගිය බවත් මම දනිමි. මේ ගමන් දෙක ම මට ආරංචි වූයේ දින කීපයකට පසුව ය. එක දවසක් නම් මම ඔහුගේ මෝටර් රථය දුටුවෙමි. ඇඳිරි වැටෙන්නට ආසන්නයේ බැවින් එහි ගියේ නිමල් දැයි මම ඒ අවස්ථාවේ දන නො සිටියෙමි.

අන්තිම වරට හමු වූ අවස්ථාවේ රෝහණ මගෙන් කළ මුල් ඉල්ලීම ඉටු කිරීමට මම අසමත් වීමි. ඔහු බලාපොරොත්තු වූ පරිදි නිතර නිතර 'සිසිල' ට ගොස් මව්පියන්ගේ දුක සැප බැලිය යුතු ය යි මා ද සිතාගත් නමුත් ඇත්ත වශයෙන් මගේ ගමන් බිමන් කව තවත් අඩු විය. බාහිර වශයෙන් මෙන් ම අභ්‍යන්තර වශයෙන් ද වූ වෙනස්කම් කීපයක් මීට හේතු විය.

පාසලට හා මගටත් අනෙක් ළමයින්ටත් කෙමෙන් පුරුදු වූයෙන් දවාලට නිල්මිණි කැඳවාගෙන ඒමට යෑමේ අවශ්‍යතාවක් මට නොවී ය.

නිල්මිණි ඇති දැඩි කරන ආකාරය ගැන මගේ පැහැදිලි අදහසක් විය.

මාත් සෝමා හා අනුලාත් බාල කාලයේ විඳි අනන්ත දුක් කරදරවලට මුහුණ දීමේ අවාසනාවෙන් ඇය මුදා ගැනීමේ ලොකු අධිෂ්ඨානයක් එක අතකින් මා තුළ විය. අනෙක් අතට අපගේ



ශක්ති ප්‍රමාණයට වඩා ඉහළින් සැප පහසුකම් දී සුවපහසු පැවැත්මකට ඇය පුරුදු නො කළ යුතු ය යි ද ජීවිතයේ දුක් බර හා කරදර කාරී පැත්ත ගැන අත්දැකීමෙන් ම ලද අවබෝධය ඇති ව මම සිතා ගතිමි. මේ අනුව සම වයසේ අනෙක් දරු දැරියන් ද සමඟ වැඩිහිටියකු නැති ව පාසල් යන්නට එන්නට මම ඇය පුරුදු කළෙමි. ඒ නිසා දන් මා 'සිසිල' ට යා යුත්තේ වෙනම ම ගමනක් වශයෙනි.

කමලවතී සමඟ හෝ පවුලේ අන් කිසිවකු සමඟ හෝ මගේ සිත අලුතින් බිඳුණා නොවේ. එහෙත් මේ ගෙදරට යන ආශාව හා උනන්දුව මා තුළ කෙමෙන් තුනී වන්නට විය. ඇත්ත කියනොත් අන්තිම ගමන් කීපය මා එහි ගියේ රෝහණගේ ඉල්ලීම දවස් ගණනක් තිස්සේ මතක් කර යුතුකමක් ලෙස සලකා උත්සාහයෙන් හිත හදාගෙන ය. එකල ද අතීතය මතක් වීමෙන් සිත සසල වීමක් හෝ සංවේගයක් හෝ මට නොදැනිණි. යමක් දනුණා නම් ගෙයත් වත්තත් මිදුලත් පමණක් නොව පදිංචිකාරයන්ගේ මුහුණු ද වසා ගත් පාළුව පමණකි.

ගෙය ද එහි පදිංචිකාරයන් ද මේ තත්ත්වයට පත් වෙමින ආ මුල් අවස්ථාවේ 'ගෙයකට ගිය කල! පවුලකට ගිය කල!' ය යි උපන් සංවේගය පවා දන් මට නො දැනෙයි.

රෝහණ මගේ සිත සෙනෙහසකින් පිර වූ නමුත් මා කිසි දවසක ඔහු බලාගෙන 'සිසිල' ට ගියේ නැත. එහෙත් ඔහු මට සිතින් අහිමි වූ පසු 'සිසිල' හා මා පිළිබඳ සබඳකමේ තවත් පුරුකක් - බලගතු පුරුකක් - ගිලිහී ගිය බවට හැඟීමක් ද මා උදාසීන බවට පත්කරවන්නට විය. වසර ගණනක් තිස්සේ මා එහි යන බොහෝ දවසක ඔහු ගෙදර නො සිටිතත් 'දෙවෙනියියන් නැ නේද?' යනුවෙන් ඒ කාලයේ නො දනුණු අඩුවක් පාඩුවක් හා පාළුවක් දන් මට දැනෙයි.

නිමල් ගැන මතක් වීමෙන් හෝ ඔහු ගමට පැමිණි බව සැලවීමෙන් හෝ මා තුළ දන් වෙනසක් නොවෙතත් රෝහණ සම්බන්ධයෙන් තවමත් එසේ නොවේ. ලෙඩක් දුකක් නොවී ටිය අනතුරක් වැනි බලාපොරොත්තු රහිත හදිසි විපතකින් මරු මුවට පත් ව මළා ද නැද්ද යි ඇදහිය නොහැකි තත්ත්වයකින් ඔහු දිගට ම මගේ සිතෙහි ජීවත් වෙයි.

සහෝදරයකු වශයෙන් ඇසුරෙන් මට රෝහණ නැති වුණේ නැත. නැවත ලැබෙන්නේත් නැත. මගේ සිතෙහි සෝමා ගැන පවතින්නේත් විවාහ වන තුරු ම නිමල් ගැන පැවතියේත් මෙවැනි ම ගුප්ත හැඟීම්වලියකි.

'සිසිල' ට ආ ගිය මගේ ගමන් බිමන් අඩු කළ තවත් හේතුවක් විය.

මා එහි යෑමෙන් කමලාවතී වෙත ළඟා කරන්නට පුළුවන් වෙතැයි රෝහණ හා මා අදහස් කළ සහනය ඇයට නුවුවමනා බවක් ටිකින් ටික මට පෙනී යන්නට විය. "සිසිල" හා සම්බන්ධ ව මා දක්වූ උදාසීන පිළිවෙත ම ඇය ද මා ගැනත් දක්වන බවක් මට පෙනිණි. මට තව දුරටත් පෙනී ගිය පරිදි ඇය තුළ පසු කාලයේ විද්‍යමාන වූ මේ වෙනස මා කෙරෙහි ඇති වූ විශේෂයක් ම නොව මුළු ජීවිතය හා අවට ලෝකය පිළිබඳ ව ඇය තුළ වූ වෙනසකැ යි මට සිතේ.

මුලින් ම මා ඇය තුළ දුටුවේ බාහිර වෙනසකි. කමලාවතී හදිසියේ ම වාගේ තවත් පුෂ්ටිමත් වන්නට වූවා ය. එහෙත් එය කිසිසේත් නිරෝගී ලක්ෂණයක් නම් නොවී ය. ගැමියන් පාණ්ඩු පාට ය යි හඳුන්වන පෙනීම ඇයගේ මුහුණේ විය. වැඩක් පළක් නොකර නිකම් සිටීම හිරේ දම්මකැ යි වරක් සැලකූ කමලාවතී ගෙයත් මිදුලත් ඇමදීම හා දර අත්තක් පොල් අත්තක් කැපීම ආදී වශයෙන් එතෙක් කරගෙන ගිය සුළු සුළු වැඩ කටයුතු ද නතර කළා ය. ඈ මෙහෙකාරිය හරි හැටි කුස්සියේ වැඩ කරද්දැයි ඇඟිලි ගසා සොයන්නට ද නොගියා ය.

එක තැනක වාඩි වුණු ඈ බොහෝ වේලාවක් ඕහේ බලාගත් අත බලාගෙන වුන්නා ය. තමාගේ පාළුව හා තනිකම ගැන ඇය තවදුරටත් කිසිත් නො කීවා ය. තනිකම හා පාළුව රැඳී තිබුණේ ඇයගේ සුදුමැලි වී ගිය ඇස්වල පමණකි.

මා අන්තිමට එහි ගිය අවස්ථාවල කමලාවතී මා දකින් ම 'කුසුමෙ වාඩිවෙයන්' ය යි කීවා මිස 'ඇයි කුසුමෙ උඹ මෙතරම් දවසක් නාවෙ?' ආදී වශයෙන් මුල දී මෙන් ඇසුවේ නැත.

"කුසුමෙ තේ වතුර ටිකක් බොනවා ද" යි ඇසුවත් "මම තේ බිව්ව ගමන් ආවෙ නැත්දෙ" යි කී කල ඇය සෑහීමට පත් වුණා විනා ඉස්සර මෙන් පෙරැත්ත කළේ නැත.



"කොහොමද කුසුමෙ ජේන් අක්කට?" යි ඈ ඉඳ හිට ඇසුවා ය.

"උඹේ පංතියට හෙම කොහොමද කුසුමෙ පාරද?" යි ඇසූ ඇය කවටකමින් කළ ලෙසින් සිනාසෙන්නට ගියා ය. එහෙත් මගේ පංතියේ දියුණුව ගැන ඇසීමේ උනන්දුවක් ඇය ඉන් එහා දැක්වූයේ නැත.

නිල්මිණි ගැන වුව ද කමලාවතී මුලින් දක් වූ සැලකිල්ල අඩු විය. ඇතැම් විටෙක ඈ දරිය දෙස මවකගේ ඒ සෙනෙහසින් ම බලා සිටියා ය. හිස අත ගෑවා ය. එහෙත් ඇය බැරිය කියා දඟලද්දී බලෙන් උකුළට ගන්නට හෝ නතර කරවා ගන්නට හෝ ගියේ නැත.

"මම ගිහිල්ල එන්නම් නැත්දෙ" යි මා කී කල සිනාවක් ඇතිව "හොඳයි කුසුමෙ" යි කීවා මිසක් "ඉවර තියෙන වෙලාවක ආයෙත් වරෙන්" ය යි කීමට ඇයට අමතක විය. මෙසේ මා පිටත් වන විට දුන් තමාගේ මුහුණට නො පුරුදු සිනාව එහි නතර කර ගැනීමට කමලාවතී උත්සාහ කළේත් නැත.

මට මවක මෙන් සිටි "ඩ්‍රයිවර මාමලගෙ කඩේ නැන්ද" වශයෙන් හෝ "නිමල්ගේ අම්මා" වශයෙන් හෝ සලකාගෙන නොව, මැදිවිය ඉක්මවා මහලු විය කරා පිය නගන කාන්තාවක වශයෙන් සලකා ඇය ගැන දැඩි අනුකම්පාවක් හා සංවේගයක් මගේ සිතේ උපදී. එහෙත් ඇය වෙනුවෙන් කළ යුතු කළ හැකි දෙයක් මා වෙත නැත. ජීවිත කාලයක් තිස්සේ දීප්තිය ගෙන දුන් - බලාපොරොත්තුව විසින් අත්හරිනු ලැබ - අද හිස් ව පාළු ව තිබෙන ඒ ඇස්වලට දීප්තියක් නැවත ලබා දීමට මම අපොහොසත් වෙමි.

කිසියම් හෝඩුවාවක් හෝ ඔත්තුවක් හෝ නොලැබුණත් කමලාවතී මේ අන්දමින් හදිසි වෙනසකට පත් වන්නට පටන් ගත්තේ කලකට පසුව නිමල් ගෙදර පැමිණ ගිය ද සිට දැයි මට සිතෙයි. එසේ සිතෙන් ම නිමල් ගැන මට ඇති වන්නේ තරහකි.

ගමේ මිනිසුන් අතර ඔහු ගැන නොයෙක් අන්දමේ කතා පවතී. ගැමියන් අතර ඔහු කෙරෙහි කලින් තිබුණු ගෞරවය, සැලකිල්ල හා විශ්වාසය දැන් ඉස්සර තරම් නැත.

www.sinhalaelibrary.com

ඉහළ පෙළේ පවුල් ගණනක් ඊර්ෂ්‍යාකම් කළත් පොදු වශයෙන් ගමේ සාමාන්‍ය මිනිස්සු නිමල් හතුරුසිංහ ඩියාරෝ පදවියට පත් වූ කල සතුටු වූහ. ආඩම්බර වූහ. ඉහළ තැනකට ගිය මේ නිහතමානී කරුණ නිලධාරියාගෙන් අසවල් අසවල් දේ ගමට පොදුවේත් තම තමනට පෞද්ගලිකවත් ඉටු කරවා ගත හැකි වෙතැ යි මිනිසුන් නියත වශයෙන් බලාපොරොත්තු ඇති කර ගත්තාම නොවේ. එහෙත් ගමෙන් මේ තත්ත්වයේ කෙනකු බිහි වීම ආඩම්බරයක් මෙන් ම වාසියක් ය යන හැඟීම හා අතරත් විය. නිමල් ඩියාරෝ වූ අවස්ථාවේත් විවාහ වූ අවස්ථාවේත් තොරණ් බැඳ පෙරහැර පවත්වා ගමේ මිනිසුන් විසින් පිළිගනු ලැබුවේ එබැවිනි.

පිට පළාතකට ගොස් 'ඒ ඩියාරෝ මහත්තය අපේ ගමේ නෙ. අපේ නෑයෙක් නෙ' ආදී වශයෙන් උජාරු කතාවෙන් එවේලේ ආස්වාදයක් විඳිනු විනා නිමල්ගෙන් නෑයන්ට වත් ගමට වත් වැඩක් නොවී ය. ඔහු ගමෙන් ඈත් විය. දරුවකුට රක්ෂාවක්, සහතිකයක් ලියුමක් ලබා ගැනීමට හෝ සල්පිල් විවෘත කිරීම, ගමේ පාසලේ සංවත්සරයේ මුලසුන ගැනීම, දහම් පාසලේ තෑගි බෙද දීම ආදී කටයුත්තක් සඳහා ආරාධනා කිරීමට හෝ ඔහු සොයා රජරට යා යුතු විය. කොළඹ හෝ ගෙදර හෝ එන දවසක් ගැන දන්නා කෙනෙක් නොවූ හ.

ගමේ පෞද්ගලික හා පොදු කටයුතු වගයකට නිමල් හමු වනු පිණිස කොළඹ ඔහුගේ නැදිමයිලන්ගේ නිවසට ගිය කීප දෙනකුට ම ගෙදර ඇත්තන්ගෙන් ඒ තරම් කරුණාවන්ත සංග්‍රහයක් නොලද බවට කතා ද ගමේ පැතිර ගියේ ය. ඔහු 'බිරිඳ කියන විදියට වැඩ කරන සැමියකු' හා 'ඉහළ තනතුරකට ගොස් පොහොසත් පවුලකින් විවාහයක් කරගෙන මුල අමතක කළ කෙනකු' වශයෙන් ගමේ මිනිසුන් විසින් හඳුන්වනු ලැබූ අවස්ථා ද ඇත.

මේ කවර තත්ත්වයක් යටතේ වුව ද නිමල් ගැන මට කල්පනා වුණේ උදසීන සිතිනි.

ඇතැම් ඉඳහිට අවස්ථාවක මට මහා පුදුම දෙයක් සිදු වෙයි. විවාහය ආසන්න කාලයේ දී මෙන් ඉතා ම කලාතුරකින්



අවස්ථාවක නිමල්ලා දෙ දෙනකු ගැන මට සිතෙයි. ගෙදරත් ගමත් අත හැර ගෙදරින් ද ගමෙන් ද ඈත් වී සිටින නිමල් හතුරුසිංහ ඩියාරෝ අමුතු ම පුද්ගලයකු ලෙස එකල මට පෙනෙයි. ඔහු හා ගමෙන් ඈත් ව පිට පළාතක රක්ෂාවක් කරන අන් ඕනෑ ම පුද්ගලයකු අතර වෙනසක් මට නොපෙනෙයි. ඔහු ගැන ගැමියන් මොනවා කතා වුණත් මට කමක් නැත. මා තුළ අනුකම්පාවක් සංවේගයක් හෝ පසුතැවිල්ලක් කිසිසේත් ඇති කරවීමට ඒ කිසි ම කතාවක් සමත් නොවෙයි.

සිතෙහි ඈත - ඈත - නොපෙනෙන තරම් බොහෝ ඈත - තැනක ඡායා මාත්‍රයක් වශයෙන් ජීවත් වන තවත් නිමල් කෙනෙක් වෙයි. ඔහු කමලාවතීගේ ලොකු පුතා බව මම දනිමි. වරක් මා ඔහුගේ ළඟ ඇසුරට පත් ව සිටි බවත් මම දනිමි. එහෙත් මේ දෙවන නිමල් පවා වරක් මට පෙම් කළ මගේ සිත චමත්කාරයට පත් කළ යොවුන් වියේ මගේ සිහින රසවත් කළ මගේ නිමල් ම ද යි මම නො දනිමි. මේ ගැන තව දුරටත් කල්පනා කළොත් මට සිතෙන්නේ නිමල්ලා දෙ දෙනකු ගැන නොව ති දෙනකු ගැන ය.

ඩියාරෝ නිමල්, මගේ සිතේ ඇති - ඈත - බොහෝ ඈත - තැනක ජීවත් වන නිමල් හා මගේ නිමල් ය. මම වැඩි දුර කල්පනා නො කරමි. තුන් වන නිමල් කෙනකු චින්තන පථයේ ක්ෂිතිජයෙන් මතු වෙත් ම මම සෝමා ගැන සිතමි. තුන් වන නිමල් - මගේ නිමල් - මට අහිමි වූ යේ ද සෝමා මට අහිමි වූ පරිද්දෙන් ම ය. කොහේ ගියා ද කුමක් වුණා ද යි කිසිවෙක් නොදනිති. හොරු ගෙන ගියා වැන්න.

සෝමා මතක් වූ සමහර අවස්ථාවක මම නිල්මිණිගේ මුහුණ බලාගෙන සිටිමි. ටික වේලාවකින් මට සෝමා මතක නැති වෙයි. ඒ වෙනුවට මගේ සිත පිරෙන්නේ ආත්මාර්ථ කාමී සන්තෝෂයකිනි. උතුරා යන සෙනෙහසකිනි. දරියට ලොකු නංගීගේ මෙන් ම මගේ ද මුහුණුවර ඇති බැවිනි. සෝමා මට වඩා රූමත් නමුත් අප දෙ දෙනාට ම තිබුණේ එක ම ඇස්, එක ම ඇහිබැම, එක ම නැහැය, එක ම හිස කෙස් ය. ඒ අනුව නිල්මිණිට ඇත්තේ මගේ ඇස්, මගේ ඇහිබැම, මගේ නැහැය හා

www.sinhalaelibrary.com

මගේ ම කෙස් ය. මම ඇය අල්ලා බදා ගෙන, වැළඳගෙන, හදවතට මිරිකාගෙන ලේ වන තුරු කම්මුල් සිපගෙන යන්නෙමි. නැහැය අගත් කම්මුලත් ලේ පැහැගැන්වුණු කල ඇයගේ මුහුණ මොන තරම් සුන්දර ද? ඇය දවසෙක ඇයගේ අම්මා වැනි ම රූමතියක වෙතැයි මට සිතෙයි.

ප්‍රසව වේදනාව නො දන මම දරුක ප්‍රේමය හඳුනා ගතිමි. නිල්මිණි මගේ ම දියණිය යි.

විවාහයක් පිළිබඳ අදහස සිතින් පලවා හැරීමට මට නිල්මිණි ද උදවු වුණා ය. මම ඒ ගැන සතුටු වෙමි.

අම්මා කපුවකු අල්ලාගෙන මටත් හොරෙන් කීප වතාවක් පොරොන්දම් බැලූ බව මම දනිමි. ඇය හඳහන් බලවන්නට යන්නේ එහා ගමේ ජ්‍යොතිෂකාරයකු ළඟට ය. ඇය බැහැරක යන්නට සූදානම් වන කල,

"බැරක් ද අම්මේ යන්නෙ?" යි මම අසමි.

"නෑ මම මේ නිකම් මෙහාට ගිහිල්ල එන්න" යි ඇ කියතොත් ජ්‍යොතිෂකාරයා ළඟට යන ගමනක් බව මම නිසැකයෙන් ම දනිමි.

"දෙයියනේ ඕක හරියන්න එපා." මම සිනාසී කියමි.

අම්මා කතා නොකර මිදුලට බසී.

"චුක්, චුක්, චුක්, චුක්.............. ඔන්න අම්මෙ හූනෙක් ඇඩුව. ගමන බාධයි" මම හඬ නගා සිනාසෙමි. අම්මා තරහක් මවාගෙන මා දෙස බලා යළි ගමනට හැරෙයි. මම මිදුලට පැන පිටුපසින් ගොස් ඇය බදාගෙන,

"සුභ ගමන් අම්මෙ! අද වත් බැණ කෙනෙක් හරි ගන්න ගෙන ම එන්නකො" යි කියා හිස අතගාමි.

"කෝලං නොකර ඉඳිං" ය යි කියමින් අම්මා මා ගසා දමා යන්නට යයි. මම පාරට යන තෙක් ඇය පසු පස පිය නගමි. මගේ සිනාව මුහුණින් ඉවත් වෙයි. මම නොපෙනී යන තුරු ම අම්මා දෙස බලා සිටිමි. මා ගෙට එන්නේ වේදනාවකිනි. මට අම්මා ගැන දුක සිතෙයි. ගෙට ගොඩ වන මම කමලාවනී විසින්



නැගි කරන ලද පුටුවක ඇද වැටෙමි. මම අම්මාට බරක්මි. විවාහ වීමට තව කල් ඇතැයි මා කොතෙක් කිවත් ඒ බර සැහැල්ලු වන්නේ නැත. මා කවද හෝ කවරකු සමඟ හෝ විවාහ විය යුත්තෙමි. මා මානසික වශයෙන් විවාහයකට සූදානමක් නැතැයි අම්මා මුලින් ම කපුවකු ගෙට ගෙන් වූ ද මම සිතුවෙමි. දැන් මගේ සිතෙහි අවුලක් නැත. එහෙත් පිරිමියකු පදිංචිකරවීමට තරම් සුදුසු පරිසරයක් තවමත් එහි ඇද්දැයි මම නො දනිමි.

අම්මා සුදුසු යයි කියන ඕනෑ ම යෝජනාවකට එකඟ වීමට වරෙක මට සිතෙයි. මගේ හැඟීම මතු වීමට ඉඩ නොදී අම්මාට සහනයක් ලබා දෙනු පිණිස එසේ සිතුණත් ප්‍රශ්නය ගැන දිගින් දිගට කල්පනා කරන කල මගේ සිතට බියක් පිංගයි. මා තවමත් ගෙවා ඇත්තේ අවුරුදු විසිදෙකකි. අකල් මරණයකට ගොදුරු නොවුණොත් ජීවිතයේ වැඩි හරිය ඉදිරියට ය. එසේ මුළු ජීවිත කාලයක් ගෙවන්නට වන්නේ විවාහයකිනි. මම රූපය, ධනය, කුලය, ඇඳුම හෝ බාහිර ඔපයක් ගැන නොසොයමි. අපගේ තත්ත්වයට ගැළපෙන තරුණයකු ගැන අම්මා කැමැති වුණොත් මට ඇත්තේ එකඟවීම පමණකි.

කේන්දර ගැළපුණොත්, කපුවකු සමඟ ගෙට එන නන් නාඳුනන තරුණයකු ඉදිරියට බුලත් හෙප්පුව හෝ තේ බන්දේසිය හෝ රැගෙන ගොස් සිනාසී, වැඳීම වුණොත් තවත් දවසක් දෙකක් මුණගැසී වචන කීපයක් කතා කර ඇති කර ගන්නා ඇසුරක් තුළින් බැඳෙන කරකාර බන්ධනයකින් ජීවිත කාලයක් ගෙන යන්නට දෙවියනි බියක් ඇති නො වන්නේ ද? ගති ගුණ, හැඟීම්, සිතුම් පැතුම්, අදහස් කිසිත් නො දන තරුණයකුට අත දෙන්නේ කෙසේ ද?

සියල්ලටමත් වඩා නිල්මිණි!

'මනමාල මහත්තයා මේකයි ප්‍රශ්නය. ඒ ගැනු ළමිස්සිගෙ නංගි මැරිල. නංගිගෙ දරුවා හදගන්නෙත් මේ ළමිස්සිමයි. එයා යන තැනක දරුවත් ගෙනියන්න ඕනෑ'

'නංගි මැරිල? ඒකට කමක් නෑ. ඔය දරුවෙකුට හාල් හුණ්ඩු දෙකක් යයි සුමානෙකට වැඩිම වුණොත්. ඒක අපිට කමක් නෑ'

මුලින් කවුරුත් කියන්නේ එහෙමයි. නිල්මිණි දිගට ම කුඩා දරියක ලෙසින් නොසිටිනු ඇත. ඇයට පොත් ඕනෑ වෙයි. ඇඳුම් ඕනෑ වෙයි. තමාට දව මගේ කුසින් උපදින දරුවකු දකින දව ඔහුට නිල්මිණි එපා වන්නට පටන් ගනී.

'ඔය ළමය නංගිගෙයි කියන්නෙ බොරු! පේන්නෙ නැද්ද? පළාපු පළුව' අසල්වාසී කාන්තාවන කියනු ඇත.

'නෑ නංගිගෙ තමයි. නංගි ගෙදර වද ගත්ත ළමයෙක්!'

'එහෙ-මද? එහෙනම් අක්කත් ඇති නංගි වගෙම'

"මට බෑ අම්මෙ. මට කසාදයක් බඳින්න බෑ. මම අම්මත් බලාගෙන නංගිත් බලාගෙන පොඩි එකීත් බලාගෙන මෙහෙම ඉන්නම්." අන්තිමට මම අම්මාට කීවෙමි.

"උඹට යන කල දවස?"

"මටත් කලක් යයි අම්මෙ. මට මෙහෙම ඉන්න ඉඩ දෙන්න. මම මෙහෙම ම ඉන්නම්. අම්මෙ මම සන්තෝසෙන් ඉන්නම්. මම හවසටත් පංතියක් පටන් ගන්නවා. ගෑනු ළමයින්ට විතරක්. මට දැන් කීප දෙනෙක් කතා කරලත් තියෙන්නෙ."

අම්මා මගේ මේ අනාගත වැඩ පිළිවෙළ අනුමත නොකළා ය. මම ගෑනු ළමයින් කීප දෙනෙක සඳහා ගණිතය ඉගැන්වීමේ පංතියක් සවස් වරුවට පටන් ගතිමි. මේ නිසා මට දැන් කාලය මිඩංගු කිරීමට සෑහෙන වැඩපළ තිබේ.

"පුංචි නංගි පාසලෙන් අස්වන තුරුවත් විවාහ වීමේ අදහස කල් තබමු" යි මම අම්මාට කීවෙමි. අම්මා එයත් බාර ගත්තා ද යි මා දන්නේ නැත. මේ ප්‍රශ්නය ගැන කතාවෙන අවස්ථාවන්හි අනුලා කළේ හිස් බැල්මෙන් බලා සිටීම පමණි. මගෙන් ඈත් වීම ඇයටත් දුකකැයි මම දනිමි. අපට මරණයෙන් වෙන් වෙන තුරු මේ අන්දමින් ම එකට කල් ගෙවන්නට 'බැරි ඇයි?

පාසල් යන කාලයේ මොන ප්‍රශ්නයක් ගැන කතා කළත් නිමල්ට කළ ප්‍රේමය උඩ මතු වූ කරුණු ගැන ගුණපාල ඉදිරියේ සඳහන් නොකළේ යම් සේ ද දැන් ඔහු හා මා අතර කෙතෙරම් පැහැදිලිකමක් තිබුණත් විවාහය නිසා මගේ ඇති සිත් තැවුල් කිසිවක් නොකීවෙමි.



වැඩිම කලක් ඇසුරු කළ පිරිමියකු වශයෙන් දැන් මට ඉතිර වී සිටින්නේ ගුණපාල පමණකි. ඔහු හා ආශ්‍රය මගේ සිතට ධෛර්යයක් ද අධ්‍යාත්මික ශක්තියක් ද වෙයි. ඔහු කෙරෙහි මා තුළ පවතින්නේ හිතවතකු මෙන් ම වැඩිහිටියකු ද ලෙස සලකා උපදින භක්තියත් ගෞරවයත් මිශ්‍ර ළෙන්ගතුකමකි. මේ හැඟීම පුද්ගලයකු නොව යම්කිසි ආයතනයක් සම්බන්ධ ව පවතින බැඳීමකට සමාන ය. තමන් ඉගෙන ගත් පාසල හෝ සේවය කරන ආයතනය හෝ මතක් වන කල උපදින හැඟීමට සමාන ය.

හදවත විවෘත කර පෙන්වීමට ගියොත් නිමල් හා රෝහණ නැතිවූ පරිද්දෙන් ම ගුණපාලත් මට නැති වෙතැයි බියක් මා තුළ ඇත. ඔහු කිසි ම දවසෙක මගේ සිතට බලෙන් ඇතුළු වීමට උත්සාහ කළේ නැත. අප දෙදෙනා අතර අද ඉතා පැහැදිලි තත්ත්වයක් තිබේ. මා වරදවා තේරුම් ගැනීමේ කිසිම ඉඩක් මා කිසි විටක ඔහුට ඉතිරි කර නැත. ගුණපාල ද මේ තත්ත්වය ඉඳුරා ම පිළිගෙන ඇත. එහෙත් හැඟීම් ගැන කතා කරන්නට ගියොත් බලෙන් පියවරක් නොගන්නා නමුදු හදවතට ඇතුළු වන සිදුරක් ගුණපාලට අහුවේ ද යි මම පරිස්සම් වීමි.

ගුණපාල ගෙදර එන්නේ මසකට දෙකකට වරකි. එකල නොවරදවා ම වාගේ මා බැලීමටත් ආවේ ය. පොත් කීපයක් ලියා ගෙන යන බව ඔහු කීවේ ය. මම ඔහු ලියන කියන දේ ගැන වඩ වඩාත් උනන්දුවක් දැක්වීමි. ඔහු ධෛර්යවත් කරනු පිණිස ය. අදහස් උදහස් මා පිළිගත්තත් නැතත් ගුණපාල දිරි ගැන්විය යුතු කෙනෙකු යි මම අවංකව ම සැලකුවෙමි. තමාගේ වැඩ කටයුතු ගැන උනන්දුවක් දක්වූ තරමින් මා වරදවා තේරුම් නො ගැනීමට තරම් ඔහු බුද්ධිමත් බවත් වැඩිහිටි වී සිටින බවත් දැන් මම දනිමි.

වරක් ගුණපාල අපේ ගෙදර පැමිණියේ මගෙන් උදව්වක් ද බලා ගෙන ය. තමා විසින් ලියන ලද පොතක, මුද්‍රණයට කලින් හොඳ අකුරින් අත් පිටපත සකස් කර දෙන ලෙස ඔහු මගෙන් ඉල්ලා සිටියේ ය.

www.sinhalaelibrary.com

ප්‍රකාශක සමාගමක් අල්ලා ගැනීමට ගත් උත්සාහය හරි නො ගියෙන් තමන්ගේ ම මුදලින් පොත මුද්‍රණය කරවීමට ඔහු තීරණය කර ගත්තේ ය. මෙය පහසු කටයුත්තක් නොවී ය. මුද්‍රණ ගාස්තු වශයෙන් පමණක් රුපියල් එක් දහස් පන්සියයක් පමණ වැය කළ යුතුව තිබිණි. දැන්වීම් සඳහා ද මුදලක් අවශ්‍ය විය. ඔහු ළඟ තිබුණේත් අමාරුවෙන් ඉතිරි කර ගත් රුපියල් දහක් පමණකි.

මේ කාලය වන විට ගෙය සෑදීමේ දී අප වුණු ණය ගෙවා අවසන් කර තිබිණි. උදය හා සවස පංතිවලින් ලද ආදයමින් සුළු මුදලක් මා ළඟ ද විය. ගුණපාලට රුපියල් පනහක හැටක හෝ ආධාරයක් වත් දිය යුතු ය යි මම සිතා ගතිමි.

"ඕනෑ වුණොත් මම කියන්නම්කො කුසුම්. දැනට මට මේක ලියල දෙන්න." ඔහු කීය.

පිට කවරය සඳහා චිත්‍රයක් ඇඳ දෙන්නටත් ඔහු මට කීය.

"අනේ, මම ඉස්කෝලෙන් අස්වුණාට පස්සෙ පින්සලයක් ඇල්ලුවෙ මේ ළඟදි. අර පුංචි ළමයින්ට පින්තූරයක් ඇඳල දෙන්න." මම බොළඳ ලෙස කීමි. එහෙත් මේ යෝජනාව මගේ සිතට ගෙන දුන්නේ සතුටකි.

'ඔබේ වගකීම' යන මැයෙන් යුත් ගුණපාලගේ පොත තරුණ පරපුර වෙත ඉදිරිපත් කැරෙන ආයාචනයක් හා පණිවිඩයක් වැන්න.

පොදුවේ ජාතිය ද විශේෂයෙන් තරුණ තරුණියන් ද මුහුණ පා සිටින රැකීරක්ෂා, නිවාස, ආහාර හා අධ්‍යාපන ආදී ගැටලුවල නිධානය තවමත් රටට නිදහස නොමැතිකම බව ගුණපාල කීවේ ය. මව්බිම තවමත් විදේශීය රැජිනකට යටත් ව පවතී. අදත් රට පාලනය වන්නේ ලංකාව දේශපාලන, ආර්ථික හා සාමාජික ලෙස වහල් කරනු පිණිස සුද්දන්ගේ වාසියට සකස් වුණු නීති රීති හා පරිපාලන යන්ත්‍රයක් මගිනි. ආණ්ඩු ක්‍රමය විජාතික, විදේශීය එකකි. වෙළෙඳාම විදේශීන් අතේ ය. ජාතික ධනය දිගටම විදේශයන් කරා ඇදී යයි. මේ තත්ත්වය යටතේ බාල හා තරුණ පරපුර විශේෂයෙන් දුෂ්කරතාවලට මුහුණ පා සිටිති. ඔවුන් ඉදිරියේ ඇති විශේෂ ප්‍රශ්නයන් ගැන ගුණපාල විස්තර කළේ ය.



බලාපොරොත්තු සුන් වූ උගත් තරුණ පිරිසක් අද සිටිති. ඔවුන් වෙත කලින් පරම්පරාවට වඩා අවබෝධයක් දැනීමක් හා උගත්කමක් ද ඇත. අනෙක් අතට කලින් පරම්පරාව ඉදිරියේ නොවුණු දුෂ්කරතා හා බාධක රාශියක් නූතන තරුණ පරපුර ඉදිරියෙහි ඇත. මේ දුෂ්කරතා හා බාධකවලට වගකිව යුත්තෝ තරුණ තරුණියෝ නොවෙති. එහෙත් ඒවාට ගොදුරු වී සිටින්නේ ඔවුන් ය.

තව ද පුවත්පත්, සිනමාව, පත පොත, ඇඳුම් මෝස්තර, ගුවන් විදුලිය හා වෙළෙඳ ප්‍රචාර ආදී සියල්ල සකස් වී ඇත්තේ යොවුන් පරපුර විනාශ කරන ආයතන වශයෙනි. නිදල්ලේ යන තරුණ පෙළක් බිහි වී සිටිති. දෙමව්පියෝත් වැඩිහිටියෝත් ඉදහිට දෙස් තවරනු විනා මොවුන් බේරා ගැනීමට කිසිත් නොකරති.

පාර්ලිමේන්තු ආසන ගැන ම බලාගෙන සිටිනු විනා එක ද දේශපාලන පක්ෂයක් වත් ජාතියේ මේ විනාශය ගැන අවංක ව කල්පනා නො කරති. වෘත්තීය සමිති, ආගමික සමිති, ගම්වඩන සමිති හා මහිලා සමිති ආදී සංවිධාන ගමක් පාසා ඇතත් ඒ කිසිවකට කිසිවකුට බාල හා තරුණ පරපුර විනාශය කරා යන මේ ගමන නො පෙනෙයි.

තරුණ තරුණියන් තමන් වැටී සිටින මේ අවාසනාවන්ත තත්ත්වය තේරුම් ගන්නා මෙන් ගුණපාල තම පොතෙන් ඉල්ලීමක් කළේ ය. තමන්ගේත් ජාතියේත් වගකීම ගැන තරුණ පරපුර අවධානය යොමු කළ යුතු කාලය එළැඹ තිබේ. ජාතික නිදහස දිනාගෙන, රැකීරක්ෂා, ආහාර, නිවාස, අධ්‍යාපන සහ අනෙකුත් පොදු ප්‍රශ්න විසඳා ප්‍රීතිමත් හා සෞභාග්‍යමත් සමාජයක් කරා ජනතාව මෙහෙයවිය හැකි නව සංවිධානයක් අවශ්‍යය යි ගුණපාල පෙන්වා දුන්නේ ය.

ජනතාව පීඩනයෙන් මිරිකී සිටිති. ඔවුනට විමුක්තිය ඕනෑ කෙරේ. තැත්තේ පීඩනයෙන් මිදෙන මගක් පමණකි. ඒ මග සොයා ගත යුතු ය. රටට නව නායකත්වයක් අවශ්‍යව ඇත. තරුණ පරපුර මේ වගකීමට කරදිය යුතුය. ගුණපාල තරුණ පරපුරට දෙන පණිවිඩය මෙයයි.

හැම තරුණයෙක් ම නායකයෙකි. හැම තරුණියක් ම නායිකාවකි. අන් සියල්ලට ඉහළින් උපන් බිම උතුම් කොට තකා ලංකාව මාතෘ භූමිය ලෙස සලකන හැම තරුණයකු ම තරුණියක ම එහි නිදහස, ප්‍රගතිය, සංවර්ධනය හා ආරක්ෂාව සඳහා ඉදිරිපත් විය යුතු ය. ජාතියේ යහපත සඳහා කැපවුණු සේවක පිරිසක් වශයෙන් හැඩ ගැසිය යුතු ය.

පක්ෂ දේශපාලනය ගැන උනන්දුවක් දක්වීමෙන් පමණක් මෙය කළ නොහැකි ය. ශාරීරික හා මානසික යන දෙයාකාරයෙන් ම ශක්තිමත් ධෛර්යය, අවංක භාවය, එඩිතරකම, පරිත්‍යාගශීලය, නිහතමානී ගුණය, වැඩ කිරීමේ ආශාව හා කඩිසරකම ආදී ගුණාංගයන්ගෙන් යුත් තරුණ පිරිසක් බිහි කළ යුතු ය. දනට දේශපාලන පක්ෂ යටතේ ඇති කිසි ම තරුණ සංවිධානයකින් මේ අරමුණු ඉටු නොවේ. නායකයන් කතා කරන කල අත්පුඩි ගැසීම, කොඩි ඇදීම හා පෝස්ටර් ඇලවීම ආදී කටයුතු හැරුණු විට ඒවායේ සාමාජිකත්වයෙන් අන් දෙයක් නායකයෝ බලාපොරොත්තු නොවෙති.

තරුණ තරුණියන්ගේ දේශපාලන වෛරය වැරදි මග උසිගන්වනු විනා ඔවුන් අතර සංවරය, චරිත ශුද්ධිය, විනය, බුද්ධිය, උගත්කම, දනීම, දේශප්‍රේමය, සමානාත්මතාව ඇතුළු ගුණාංගයන් ඇති කරවීමට දේශපාලන පක්ෂ යටතේ දනට පවත්නා කිසිම තරුණ සමිතියකින් කිසිදු පියවරක් නොගනී. ඒ නිසා දිවයින පුරා පැතුරුණු ජාතික තරුණ සංවිධානයක් ගොඩ නංවා ගැනීම සඳහා එක ගමකින් දෙ තුන් දෙනා බැගින් වත් ඉදිරිපත් වන ලෙස ගුණපාල ඉල්ලා සිටියේ ය.

මුද්‍රණය වූ කල පොත පිටු සියයක් පමණ වෙතැයි ඔහු මට කීය. රෑ කීපයක් පිට පිට නිදි මැරීමෙන් පසුව මට පොත පිටපත් කර අවසාන කළ හැකි විය. පුංචි නංගීට ගුණපාල ලියා තිබූ සියල්ල කට පාඩම් තරම්. මා ලියන ලියන පිටු කියවා බලා ඈ අකුරු අඩු වැඩි තැන් හරි ගැස්සුවා ය.

"මම මේක කරන්නම්. පුංචි නංගි ගිහිල්ල පාඩම් කරන්නැ" යි කීප වරක් ම තරවටුවක් ලෙසින් කියන්නට මට සිදු විය.



ඇත්ත වශයෙන් ම මගේ සිත ද ඔහුගේ ලියවිලි වෙත තදින් ඇදී ගියේ ය. පාසලේ ඉගෙන ගන්නා කාලයේදීට වඩා ගුණපාලගේ අදහස් උදහස් මෙන් ම ප්‍රකාශන ශක්තියත් ලියන ලතාවත් බෙහෙවින් දියුණු වී තිබිණි.

ගුණපාල කියන පරිදි ම මෙවැනි දක්ෂකම් ඇති තවත් කී දෙනෙක් සැඟවී සිටිත් ද? වනයේ පිපී මැරී යන මල් මෙන් ඒ දක්ෂකම් කෙතෙක් නම් අපතේ යන්නේ ද? නන්නාඳුනන ලේඛක ලේඛිකාවන් පිරිසක් වෙනුවෙන් මගේ සිත අනුකම්පාවකින් තෙත් විය.

ලියා නිම කළ අත් පිටපත ගුණපාලගේ කොළඹ ලිපිනයට තැපැල් කළ යුතුව තිබිණි.

'ඔබේ වගකීම' මුද්‍රණයෙන් පිට වන තුරු මා ද බලා සිටියේ ආශාවෙනි.

එය කියවා රස වැටුණු මම වහා පළ කරන අවස්ථාවක් නැතත් ලියා තිබෙන තවත් නොයෙක් දේ පිටපත් කරනු පිණිස ගෙන්වා ගතිමි. ඇත්ත වශයෙන් මා ඒවා ගෙන්වා ගත්තේ පිටපත් කර තැබීමට වඩා විවේක අවස්ථාවන්හි කියවා බැලීමට ය.

ගුණපාල තමාගේ මතය අනුව ඉතිහාසය වෙනස් කර ලියා තිබුණේ ය. එය ඇක්සයිස් පොත් හත අටක පරණ කෘතියකි. ඔහුගේ අලුත් ඉතිහාසය නවකතාවක් මෙන් කියවා රස විඳිය හැකිව තිබිණි. මෙහිදී ඔහු කුමාරණතුංගගේ හා ඊ.පියෙල් කොන්නකෝන්ගේ මත රාශියක් පිටුවහල් කොට ගත් බව සඳහන් ව තිබිණි. පළමු වන රාජසිංහ රජු පීතෘ ඝාතක නපුරකු නොව ශ්‍රේෂ්ඨතම ජාතික වීරවරයකු වශයෙන් ගුණපාල හැඳින්විය.

මා මෙන් ම අනුලාත් මට පෞද්ගලිකව එවන ලියුම් ද ඇතුළුව ගුණපාලගේ සියලු ම ලියකියවිලි කියැවූයේ ආශාවෙන් හා උනන්දුවෙනි. අලුත් කරුණු සහ නව නිර්මාණයන් සෙවීමේ පිපාසයෙන් පෙළෙන වයසකට සහ පරපුරකට අයත් නැගණිය මෙහිදී දක්වන ආශාවත් උනන්දුවත් ගැන පුදුම වීමට කරුණක් නැත. එහෙත් බාහිර විෂයයන් ගැන වුවමනාවට වඩා අවධානය

www.sinhalaelibrary.com

යෙදවීමෙන ඇයගේ අධ්‍යාපන කටයුතුවලට බාධා පැමිණෙතැයි මම බියවීමි.

"බිය වෙන්න එපා ලොකු අක්කෙ. මම පාඩම් අතපසු කරගන්නෙ නෑ" යි මා මේ ගැන මතක් කරන හැම විට ම ඈ කීවා ය. එහෙත් ඇයගේ මේ සහතිකය මගේ සිත සන්සුන් කිරීමට සමත්වුණේ නැත.

ඇත්ත වශයෙන් මම ඇතුළතින් වඩවඩාත් සසල වන්නට වීමි. ගුණපාල විසින් මට එවන ලද සියලු ම ලියුම් එකට ගොනුකර අනුලා විසින් පරිස්සම් කරනු ලැබ තිබී හසුවීමේ සිද්ධිය සිතෙහි විමතියක් ද ඇති කරවමින් මට නිතර සිහිපත් වෙයි. ඊටත් වඩා, නගරයේ දී කීප වරක් ම ඔවුන් හමු වුණු බව සැහෙන කලකට පසුව ඇයගෙන් මට දැන ගන්නට ලැබුණේත් අහම්බෙන් මෙනි. එහිදී තමාගෙන් සිදු වූ ප්‍රමාද දෝෂයක් ගැන නිදහසට කරුණු වශයෙන් ඇය ඉදිරිපත් කළ හේතුව බරක් නැති කියමනක් බව එදටත් වඩා බරපතළ ලෙස අද මට පෙනී යයි.

මහත් ඕනෑකමින් ගුණපාලගේ ලියවිලි කියැවීමෙන් නතර නොවුණු පුංචි නංගී අවසරය සහ අවස්ථාව ලද හැම විටෙක ම ඔහු ගැනත් ඔහුගේ අදහස් උදහස් සහ මතිමතාන්තර ගැනත් කොතෙකුත් දෙඩන්නට වූවා ය. ගුණපාල සහ ඔහු සම්බන්ධ ඕනෑ ම දෙයක් ගැන සඳහන් කරන හැම විට ම ඇයගේ ඇස් අසාමාන්‍ය දීප්තියකින් සහ සොම්නසකින් නළියන බව දැක මම ඇතුළතින් තවතවත් කලබල වීමි.

මුල සිට ම ගුණපාලගෙන් ලද පෞද්ගලික ලියුම් පවා කියැවීමට ඉඩ දීමෙන් මගෙන් ම ඇයට අනුබලයක් ලැබුණු බව පසුතැවිල්ලකින් ද යුක්ත ව පිළිගත් මම, මගෙන් වුණු එම වරද හරිගස්සා ගැනීමට කල්පනා කළෙමි. එහිදී උපක්‍රමයක් වශයෙන් අඩු තරමින් ඇය ඉදිරිපිට මතුපිටින් හෝ ඔහු සම්බන්ධ මගේ පිළිවෙත සහ ආකල්පය බොරුවට වත් වෙනස් කළ යුතු ය යි මම සිතා ගතිමි. ඒ අනුව මම ක්‍රමක්‍රමයෙන් ගුණපාල ගැන කතා කිරීම අඩු කළෙමි. ඔහු ඈඳෙන පරිදි ඇයම පටන් ගන්නා කතාවකට රුකුලක් නොදෙන අතර හැකි හැම විට ම මාතෘකාව වෙනස් කිරීමට පරිස්සම් වීමි. බොහෝ විට මා කළේ හුමිටි



තැබීම පමණකි. අනුලා අතින් ඔහුගේ අදහසක් - කියමනක් ඇගැයෙන අවස්ථාවක,

"අනේ මම දන්නෙ නෑ පිස්සු ළමයෙක්!"

වැනි යමක් සරදමට මෙන් කීවේ උපහාසයක හඬින් සිනාසෙමිනි.

මගේ එබඳු වචනයක් අසා ඇයගේ මුහුණ හරහා කිසියම් අඳුරක් පාවී ගිය අතර ගුණපාල ගැන මෙසේ දෙඩන්නට සිදුවීම ගැන මා තුළ ද දුකක් ඇති නොවුණා නොවේ.

මේ සියල්ලටත් වඩා, ගුණපාල පිළිබඳව, හැසිරීම සහ ගතිපැවතුම් වැනි ජීවිතයේ පෞද්ගලික අංශයට අයත් ලක්ෂණයක් ගැන කතාකරන බොහෝ අවස්ථාවල, නැගණිය මා දෙස අඩැසින් බලා නගන සිනාවේ මොකක් දෝ අමුත්තක් ඇතැයි මට අවබෝධ විය. මේ අමුත්ත මගේ පුංචි නංගිගේ දැසට හුරුපුරුදු ගතියක් නොවන බව මගේ සිත මට කියයි. සුළු කරුණක් ලෙස වරෙක පෙනුණත් ඇයගේ මේ වෙනස මා කැළැඹීමකට පත් කළේ ය.

අනුලා ඔහු ගැන සඳහන් කරන කල "ගුණපාල අය්යා" යනුවෙන් හැඳින්වීමේ වරදක් හෝ විශේෂයක් හෝ තිබේ ද? ගැහැනු ළමයින් තිදෙනෙකුගෙන් පමණක් යුත් පවුලකට අයත් අනුලාට සහෝදරයකු නැතිකම නිසා එක්තරා පාළුවක් හා පාඩුවක් දැනෙමින් තිබෙන්නට ඇත. මගේ ද හිතවතකු වන ඔහු කෙරෙහි ඇය තුළ සහෝදරකමක් බඳු සෙනෙහසක් ජනිත වීම සොබාවික ය. සාධාරණ ය. සොහොයුරකු නොමැතිවීමේ හිස් බව ළමා වියේ පටන් ම මට නොදැනුණේ නිමල්, රෝහණ හා තිස්ස ආදීන්ගේ ඇසුර නිසා නොවන්නේ ද?

මේ අතර එක් පසළොස්වක පොහොය දිනෙක උදය වරුවේ නිවසෙහි රැඳුණේ මාත් පුංචි නංගීත් විතර ය. සිල් සමාදන් වුණු අම්මා පන්සලේ ය. ඇග්නස්ලාගේ ගෙදර ළමයින් දහම් පාසල් යන විට ඒ සමඟ පන්සල් යන්නට නිල්මිණිට ඕනෑ විය.

www.sinhalaelibrary.com

විවේක පුටුවෙන් මෙන් ගත කළ මම ඉස්තෝප්පුවට වී පොතක් කියවන්නට වීමි. පුංචි නංගී එහි පැමිණ අසල පුටුවේ වාඩි වුණේ,

"සමහර විට ගුණපාල අය්යා අද හවස්වෙලා............" යනුවෙන් කියා ගෙන ය.

"ඉදා! දන් අයිය කැල්ල නැතුවම බැහෙ ඒ මනුස්සය ගැන කතා කරන්න." මම කට ඇද කැර කීවෙමි. "............ මොන නැකමකට ද?"

නැගණිය, ළඟක දී සිට මගේ සිත සසල කරවන අර සිනාවත් රැගත් අඩැසින් මා දෙස බැලුවා ය. ඒ බැල්ම දකින් ම මට ඇති වුණේ බියක් සහ තරහක් මිශ්‍ර අවිනිශ්චිත හැඟීමකි. ඇයගේ යොවුන් දෙනෙත්හි දගලන්නේ මනමාලකම ය යි තීරණය කර ගත් මම, බිය අභිබවා කෝපය ඉස්මතු කැර ගැනීමට සමත් වුණෙමි. ඒ අනුව මගේ වතට නපුරු පෙනීමක් පහළ වන්නට ඇත. ඇය කියන්නට ගිය දෙයක් අතරමග නතර කර බයාදු ගතියෙන් මා දෙස බලන්නට වූයේ ඒ නිසා වන්නට ඇත.

"දනට නම් නැකමක්............" යනු ඇයගේ ඒ අසම්පූර්ණ කියමන ය. ඒ වචන දෙකතුනෙන් පවා නැතිගැන්මකට හසුවුණු මම,

"මොකක්ද කියන්න ගියේ?" යි සැරෙන් ඇසීමි.

"මුකුත් නෑ" යි බිම බලා ගෙන කී පුංචි නංගී සිනාසෙන වෑයමෙන් නැවත මගේ මුහුණ බැලුවා ය. ඇය වෙත පැන බෙල්ල මුලින් අල්ලා ගත් මම,

"කියපන්! කියපන් බලන්න උඹ මොකක්ද කියන්න ගියේ?" යි අසමින් කීප වරක් සෙලවීමි.

අනුලා නගා වෙතින් සාමාන්‍යයෙන් දක්නට නොලැබෙන තරමේ බොළඳ ගතියකින්,

"අනාරින්න. මම නරක දෙයක් කියන්න ගියේ නෑ." යි කෑගාගෙන පුටුවේ පහතට නැඹුරු වී මගේ ග්‍රහණයෙන් මිදී යළි හඬ නගා සිනාසෙමින් ඉවතට පැන ගත්තා ය.



මම ද මුළු ජවනිකාව ම විහිළුවක් සේ සලකා සිනාසෙන්නට වීමි. එහෙත් ඒ කෙළිලොල් සොම්නස් ගතිය මා වෙතින් පලා යන්නට වැඩි වේලාවක් ගත වුණේ නැත.

ගෙතුළට වැදුණු නැගණිය වහා ආපසු නොපැමිණියෙන් ඉස්තෝප්පුවේ හුදකලා වී කල්පනාවක වැටුණු මට පසුතැවිල්ලක් ද මා ගැන ම තරහක් ද ඇති විය. මා කලබල වුණා වැඩි ය. මවිසින් කළ යුතුව තිබුණේ අනුලා පවසන්නට ගිය දෙය එහෙම ම යට යන්නට ඉඩ හැරීම ය. ඉක්මන් වුණා පමණක් නොව මා ලාමක වුණා ද වැඩිය. ඇයගෙන් කියැවෙන්නට යන්නට ඇත්තේ මගේ යටිසිත ඉඟි කරන මේ කිසිවක් නොවේ. මම මට සිදු වූ වැරදීම ඔස්සේ දිගට ම කල්පනා කළෙමි. එහෙත් එමගින් හිත හද ගැනීමට තැත් කළත් හදවතට වධයක් වන අන්දමේ යම්කිසි බරපතළ දෙයක් සිදු වී ඇති බවට - සිදු වීමට යන බවට - හැඟීම පිටු දකීමට මම අසමත් වීමි. ඒ අනුව පසුතැවිල්ලට සහ කෝපයට අමතර ව දැඩි වේදනාවක් ද මා පෙළන්නට වන්නේ ය. අතීතය හා සම්බන්ධ සියලු බැඳීම්වලින් මිදී මානසික විමුක්තියක් කරා ළඟා වී ඇතැයි මා විසින් විශ්වාස කරනු ලැබූ අවස්ථාවක තවත් අවුලක් හිසට ඇතුළු වුණු බැවිනි. තවත් එබඳු ආකූල ව්‍යාකූල තත්ත්වයකට මුහුණ දීමට දැන් මා කිසිසේත් සූදානම් නැත.

මා වාඩි වී සිටියේ සාලයෙන් එන දොර අසල ම පුටුවේ ය. විනාඩි කීපයකට පසුව කොංඩය අලුතින් ගොතමින් පැමිණි අනුලා මට සමීප ව එළිපත්ත උඩ නතර වී උළුවස්සට හේත්තු වුණා ය.

"සහෝදරයො වගෙ හිටිය දෙන්නෙක් ම මට නැති වුණා. තව ඉතුරු වෙලා ඉන්නෙ එක්කෙනායි. පුළුවන් නම් මට ඒ ළමයත් නැති කරන්නැ" යි කී මම පුංචි නංගීගෙන් ඉවතට මුහුණ හරවා නිකට උරහිසට ඔබා ගතිමි.

එය ඒ මොහොත වන තුරුත් කරන්නට සිතාගෙන සිටි ප්‍රකාශයක් නොවේ. මට එසේ කියැවුණේ එහෙම පිටින් ම නිරුත්සාහයෙන් සහ හදිසියේ ය. සමහර විට ගෙවුණු විනාඩි ගණනක කාලය මුළුල්ලේ මගේ යටි සිත විසින් මේ වචන ටික

www.sinhalaelibrary.com

ගොනු කරනු ලැබ තිබෙන්නට ඇත. නිරුත්සාහයෙන් සහ හදිසියේ වුව ද මගෙන් අනාවරණය වුණේ පරම සත්‍යය නොවේ ද යි මට වහා අවබෝධ විය. දැඩි ආත්මානුකම්පාවකින් මගේ ළය මඬල මිරිකී මට මහත් ශෝකයක් දැනෙන්නට විය. පළමු ව තිමල් ද දෙවනු ව රෝහණ ද අහිමි වූ අයුරින් ම දැනටමත් ගුණපාල ද අහිමි වී ඉවර ය යි හටගත් මහත් වේදනාවක් මගේ හදවත වෙලා ගත්තේ ය. මගේ මුහුණ ඉවතට හැරී තිබුණෙන් එහි සටහන් වුණු කිසිවක් හඳුනා ගැනීමට සහෝදරිය අසමත් වුණා නම් පුදුමයක් නොවේ.

"ඔන්න ඕකත තමා ලොකු අක්කට වැරදිලා තියන තැන!" ඈ සිනාව මිශ්‍ර හඬකින් තෙපලා ය.

මා වහා හැරී පුංචි නංගී දෙස බැලුවෙමි. ඇයගේ වත ද දුක්බර පෙනීමකින් වැසී තිබිණි.

"............... අක්ක තාමත් ගුණපාල දිහා බලන්නෙ ඒකාලෙ පංතියෙදි පිස්සු ළමයෙක් කියල බැලුව විදිහටමයි. ඒකයි මට දුක"

"මටත් දුකයි! ලොකු අක්ක කොහොම ගෑනියෙක් ද කියල තාමත් නගාට තේරුම් ගන්න බැරි වුණාට. ............... පුංචි නංගි ඕනෑ බූතයක් සිතා ගන්න. මම ඒ කාලෙ වුණත් ගුණපාලගෙ අදහස් පිළිගත්තෙ නැතුවට ඒ ළමයට ගරු කළා. එතන හුනත් ඒ අදහස් අගය කළා. අනිත් කොල්ලො - කෙල්ලො වගෙ මම කවදාවත් එයාට හිනා වෙලා නෑ. මම අවුරුදු හතක් හිටිය සෙන්ට්‍රල් එකේ. ඒ අවුරුදු හතට මම ගුණපාල තරම් වෙන කිසි ම පිරිමි ළමයෙක් ළඟින් ආශ්‍රය කළේ නෑ..................."

"මම ඒ සේරම දන්නව අක්කෙ. ඒ සේරම මම............."

"දන්නව නම් මම ඔයාට එකක් කියන්නම්............." මම දෙපා පුටුව උඩට ගනිමින් වමතින් සාය සකස් කර ගත්තා අතර ම නැගණියට දකුණත දබරැඟිල්ල උලුක් කළෙමි. "............... කරුණාකරල මගේ ඒ හිතවත්කම වැරදි විදියට තේරුම් ගන්න විතරක් එපා!" මම දෙපා නැවත පහළට දමා අනුලාගෙන් මුහුණ ඉවතට හරවා ගතිමි. "............... මම දන්නෙ නෑ - මම හිතන්නෙ



නෑ - ගුණපාල මාව වරදවා තේරුම් අරගෙන ඇති කියල. බැරි වෙලා හරි එහෙම වැරදීමක් වෙලා තියනව නම් ඒ ළමයට මගෙ තියෙන ගෞරවයත් නැති වෙයි."

ඕනෑවට වඩා දිගට කතා කරගෙන ගියෙම් දැයි මෙහි දී විමතියක් ඇති විය. එහෙත් ඒ ගැන මා තුළ පසුතැවිල්ලක් නැත. අනුලා නිසා දුකක් ගැන සඳහන් වුණු නමුදු මෙසේ දිගට කතාකර ගෙන යෑමේ දී ටිකකට කලින් සිතට පීඩනය ගෙන දුන් ආත්මානුකම්පාවත් ශෝකයත් ඉවත් වී හදවත සැහැල්ලු විය.

"ඒ කියන්නෙ වෙන කිසිම පිරිමි ළමයකු ගැන නොතිබුණු විශේෂත්වයක් අක්කගෙ හිතේ එදත් ගුණපාල ගැන තිබුණා?"

"ගෞරවයක්! අගය කිරීමක්! ඒ කියන්නෙ අදහස්. ප්‍රතිපත්ති. ඒව පහළ වෙන්නෙ ඔළුවෙ. හිත තියෙන්නෙ වෙන තැනක. මෙයි ඒකවත් දන්නෙ නෑ පංඩිතකම් කිව්වට."

අනුලාගේ මුවගට සාවඥ සිනාවක් නැගිණි. එය විවාදයකදී ප්‍රතිවාදියාගෙන් ඉදිරිපත් වුණු පුහු තර්කයක් නිසා පහළ වන උඩඟු සිනාවක් වැන්න.

"මගේ ඒ නොදන්න කමෙන් ඒ තරම් පාඩුවක් වෙන එකක් නෑ දනාට..............." ය යි කියාගෙන එළිපත්ත මත එහෙම ම වාඩි වුණු පුංචි නංගී දිග සංවාදයකට සූදානම් වීමට මෙන් ගවුම් සාය ද සකසාගෙන හරි බරි ගැසුණා ය.

"කොහොම වුණත් ඔළුවයි - අක්ක ඔය කියන හිතයි තියන ස්ථානයයි - අතරෙ මහ පරතරයක් නැතෙ අක්කෙ............... ඉතින් මම අහන්නෙ ඇයි අක්කට බැරි ඒ ඔළුවෙ තියන ගෞරවය තව චූටිවත් පහළට අරගෙන ආදරයකට හරවන්න?"

මගේ සමස්ත චිත්තාභ්‍යන්තරය ම මොහොතකට සැහැල්ලු විය. මම උස් හඬින් සිනාසෙන්නට වීමි. මුළු කතාව ම විහිළුවකට හරවා ගැනීමට මම සමත් වූයෙමි. ඒ අතර ම සහෝදරියගේ මුඛරිකම ගැන මම සොම්නසින් පිනා ගියෙමි.

"මොකක්ද ඇති ඕනෑ කම? ඇරත් මේ හදිසියෙ?"

www.sinhalaelibrary.com

පුපු වන දිගේ ඇදුණු මගේ අත මත අතක් තබා, හිස මදක් පසෙකට බර කර, දයාබර බැල්මෙන් මා දෙස බැලූ සොහොයුරිය,

"ලොකු අක්කගෙ අදහස කවදාවත් නොබඳින්න ද?" යි මෘදු හඬින් ඇසුවා ය.

ඇයගේ ඒ ඉරියව්ව, ක්‍රියාව, බැල්ම සහ හඬ යන සියල්ල මගේ හදවත වහා මොළොක් කළේ ය. එහෙත් මම ඇයට පිළිතුරු දුන්නේ ආරූඪ කැර ගත් නොමනාපයෙනි.

"මම දසසිල් වෙනව කියල කාටවත් පොරොන්දු වෙලා නෑ. බඳින්න වෙයි - කවද හරි"

"කවද හරි? ඇයි දන් වයස හරි නැද්ද?"

"ඔහ කමක් තියනව නම් උඹට වුණත් වයස හරි..............." මම ඒ ව්‍යාජ නොමනාපයෙන් ම කීවෙමි. "............... වයස හරි ගියාය කියල ආවට ගියාට බඳින ඒව නමා ඔය ඉක්මනින්ම ලිහා ගන්න බැරුව දඟලන්නෙ"

"හොඳයි! අද නැතත් කවදහරි - තව අවුරුදු කීපයකින් කියමුකෝ - ගුණපාල නරක ද?"

මා තුළ කිසිම හැඟිගැනීමක් හටගත්තේ නැත. දන් සැහෙන වේලාවක සිට මගේ යටි සිත අනුලාගෙන් නැගෙන මෙබඳු ප්‍රශ්නයකට හෝ යෝජනාවකට හෝ මුහුණ දීමට සූදනමින් සිටින්නට ඇත.

"මිනිහෙක් හැටියට දහසයෙන් හොයන්න බෑ" මම තොල් මතුළෙමි.

"ඉතින් ඇයි ගුණපාලට ආදරය කරන්න බැරි?"

"ආදරය කරනවය කියන එක මේ හිනාවෙන්න වගෙ හැමෝම එක්කල කරන්න පුළුවන් දෙයක් නෙවි අනු. ඒක හිතෙන් - පපුවෙන් එන්න ඕනැ දෙයක්."

"ඒක මම පිළිගන්නව අක්කෙ..............."



"ඊටත් වඩා - මම කලිනුත් කිව්වෙ - හැඟීම්වලට ඉක්මනු වෙන්න ඉඩදීල අහින් දෙන්න අහිමි වුණා වගෙ මේ මනුස්සයත් නැති වෙලා යයි ද කියල මට බයයි. නංගිට තේරෙන්නෙ නැද්ද ගුණපාල හැමදම හිටියෙ මගෙ ඔළුවෙ"

"ඒ කියන්නෙ නළලෙ.............."

"මෙක විහිළුවක් නෙවි පුංචි.............. මට බයයි හදවතට ඇතුළු කරගන්න හිතන්න.................."

"අහිමිවීමක් ගැන ප්‍රශ්නයක් මෙතන නෑ අක්කෙ. අයිතිය ස්ථිර වෙනව මිසක්. නීත්‍යානුකූල වෙනව මිසක්"

මා එවර අනුලා දෙස වහා හැරී බැලුවේ තැතිගත් සිතිනි. මේවා ඇයගේ ම ස්වාධීන අදහස් විය නොහැකි ය.

"මෙකී පංඩිතයෙක් වගෙ කතා කරන හැටි! මමයි ඔය වැරැද්ද කළේ. අර ගුණපාල ලියන හැම කෙහෙල්මලක් ම කියවන්න දීල. ඒවයින් තමයි ඔය පංඩිත වාක්‍ය ඉගෙන ගෙන තියෙන්නෙ."

"හොඳ දේවල් කාගෙන් ඉගෙන ගත්තත් වැරැද්දක් නෑ.............. ලොකු අක්ක ඔය තේන්තියෙන් කතා කරන්නෙ බොරුවට! ප්‍රශ්නය මගාරින්න. මතුවෙලා තියන තත්ත්වයට මුහුණ දෙන්න අක්ක සූදනම් නෑ"

"හරියට හරි!" යයි මගෙන් කියැවුණා තරම්. ප්‍රශ්නයට සෘජු ව මුහුණ දීමට මා පසුබට වන්නේ, පාසල් වියේදී මෙන් ම අදත් මගේ හදවතට එබී බැලීමේ ඉඩකඩ ගුණපාලට නොලැබෙන පරිදි ඔහු ගැන මවිසින් සකස් කර ගන්නා ලද ප්‍රතිපත්තියේ කොන්දේසියක් වශයෙනි.

"ඇයි ඔය තරම් බය?" මා නිහඬ වූ තැන පුංචි නංගී ඇසුවා ය.

"බයක් ම නෙවි. කලින් කිව්ව දේවල් ම ආයිත් ආයිත් කියන්න මම කැමති නෑ. අන්තිම වතාවට මම මේ කියන්නෙ - මීට පස්සෙ ඔය ගැන අදින්න ඕනැත් නෑ - ඒ ළමයා ගැන මගෙ පැහැදිලි අදහසක් - හැඟීමක් තියනවා. ඒ නිසාවත්තම මොකක්ද

www.sinhalaelibrary.com

මොන ජාතියට අයිති එකක් ද කියල මට කිසිම අවුලක් සැකයක් නෑ. දෙවෙනියිය ඇරුණ ම වෙන කිසිම කෙනෙක් ගැන මගේ හිතේ ඒ තරම් ලැදිකමක් තිබිල නෑ. එක අතකට ඒකත් ආදරයක් තමා. ඒ කියන්නෙ සහෝදර ප්‍රේමය තරමට ම ලොකු බැඳීමක්. ළෙන්ගතුකමක්. ඊට එහා හිතන්න - ප්‍රශ්නවලට මුහුණ දෙන්න බව වෙන්නෙ මොටද කියල නැති ප්‍රශ්න ඇති කර ගන්න - ඕනෑ කමක් නෑ මට............." යනුවෙන් පවසා මොහොතක් සිටි මා " අනික් කාරණය නංගියෙ............." යි අනුලා ඇමතුවේ පහත් හඬිනි. "............. ඔය ගොල්ලවත් දන්නෙ නෑ මම වින්ද දේවල්. ඒවම ඒවම ආයිත් විඳින්න යනව නම් ඒ තරම් තවත් මෝඩකමක් නෑ. වැරදීම්වලින් පාඩම් ඉගෙන ගන්න ඕනෑ. අත්දැකීම් කියන්නෙ අන්න ඒකට. ඒ වැටුණු වළේ............."

"හොඳයි අක්කෙ ගුණපාල අක්කට ආදරේ නම්?"

මවිසින් විඳින ලද සිත් වේදනා කොතෙක්දැයි සහෝදරිය පවා නොදන්නා බව මොහොතකට කලින් මගෙන් කියැවිණි. මට අත්විඳින්නට ලැබුණු ඒ දුක්වේදනා, තාඩන පීඩන, කම්කටොලු, පසුබැසීම් සහ බලාපොරොත්තු සුන්වීම් ආදියෙන් පිරි දුක්බර - කටුක ජීවිතය දිගටම හැම තීරණාත්මක අවස්ථාවක දී සියල්ලට මුහුණ දී කඳුළු අතරින් සිනාසිය හැකි තරම් බලයක් මට ලැබී ඇත. ඒ බලය නම් ආත්ම ශක්තිය සහ ධෛර්යය යි. නිමල් හා සම්බන්ධයේ බොහෝ අවස්ථාවල මොළය මෙහෙයවා හදවත පාලනය කර ගැනීමටත් රෝහණ තමාගේ ප්‍රේමය මට යෝජනා කළ දවසේ මගේ ආත්මය විනාශ වී යා නොදී ආරක්ෂා කර ගැනීමටත් මට පිහිට වූයේ එම බලය යි. අද - දැන් - ගුණපාල පිළිබඳ මේ තීරණාත්මක මොහොතේ ද තත්පර කීපයකට මා නැතිගත් නමුදු අන් සියලු හැඟීම් පාලනය කර ගැනීමට හැකි වන තරම් බලවත් ලෙස ආත්ම ශක්තියත් ධෛර්යයත් මා තුළ වහා වර්ධනය විය.

"ගුණපාල මට ආදරේ නම්?" මම ඉතා සන්සුන් ලෙස කියන්නට වීමි. "............. එහෙනම් - මම මේ ටිකකට කලිනුත් කිව්වෙ. එයා ගැන මගේ තියන ගෞරවය නැති වෙයි. ඒ ළමයත් මට නැති වෙයි. එච්චරයි!"



"මට නම් බෑ අක්කෙ, කොහොමවත් ඒ තර්කය පිළිගන්න."

"එපා! පිළිගන්නත් එපා!" මම කෑගැවෙමි. "මගෙ අදහස් තවත් කෙනෙකුගෙ පිට පටවන්න මට ඕනෑකමක් නෑ"

"අද විතරක් නෙවි. දැන් ටික දවසක ඉඳල ලොකු අක්ක අමුතුයි"

"ඒ ජේන හැටි වෙන්නැති" මම බිඳුණු හඬින් කියා ගතිමි.

"ජේන හැටි තමයි මම කිව්වෙ. කවදාවත් නැති නපුරුකමක්............." ය යි කියා නතර කළ නැගණිය හඬන්නට පටන් ගත්තේ නැත. එහෙත් ඇයගේ උගුර හිරවෙන බවක් මම දිටිමි. ඈ ඉතා දුක්බර බැල්මෙන් මා දෙස බැලුවා ය. මගේ පපුව හොස් ගා ඇවිළිණි.

"නංගිට මේව තේරෙන්නෙ නෑ නංගියෙ............. අපි පස්සෙ කතා කරමු." යි කියා ගෙන මම අසුනෙන් නැගිට ගතිමි. එළිපත්ත උඩ වාඩි වී සිටි අනුලා දැතින් ම මගේ අතක් ගෙන දැඩි සෙනෙහසක් පුරවා ගත් දෙනෙතින් මොහොතක් මා දෙස බලා සිටියා ය.

"ඔව් අක්කෙ. අපි පස්සෙ කතා කරමු. ඒ අතර අක්ක හොඳට කල්පනා කරන්න මම කිව්ව කාරණේ ගැන.......... කොහොම වුණත් අපි අක්කට බල කරන්නෙ නෑ"

"අපි?" මම මවිත වූ ගතියෙන් බිම දෙදණ ඔබා අනුලා ඉදිරිපස වාඩි වුණෙමි. "........... කවුද අපි?"

පුංචි නංගී උත්සාහයෙන් මුහුණට සිනාවක් නගා ගත්තා ය. එය බියත් සැකයත් වසං කර ගැනීමට ගත් තැතක් වැන්න. මම දෙවුරෙන් අල්ලා ඇය සෙලවීමි.

"කියපන් බලන්න! කවුද අපි? උඹ දැනටමත් අම්මගෙ ඔළුවට මේ ගිනි ගෙඩිය දැම්ද?"

"අපි කිව්වෙ ගුණපාලයි මමයි"

"මොනව-ආ? එහෙනම් කුමන්ත්‍රණයක්?"

"ඔව් දිග කුමන්ත්‍රණයක්!"

දැඩි සංවේගයක් අනුලාගේ මුහුණ අරක් ගත්තෙන් සිනාව වහා තුරන් විය. ඒ අසරණ දෑස් දකින කල ඇය කළ අභාවරණය නිසා මසිත ජනිත සියලු හැඟීම් යට යන්නට විය. බලා සිටිය දී ඇයගේ දෙනෙත් කඳුළෙන් පිරෙන්නට විය.

"ඇයි නංගියෙ........? පුංචියෙ ඇයි?" මම නැවත කෑගෑවෙමි.

මම ඇය වැළඳ ගතිමි. මොහොතකින් ඇය ඉකි බිඳින්නට පටන් ගත්තා ය. බියකින් - බියකින් ම නොව හින්දරකින් - මගේ පපුව ඇවිළීගෙන ගියේ ය. ඒ හින්දර මීත් පෙර තවත් එක ම අවස්ථාවක මා දුටා ඇත. සෝමා ගැබ් ගත් කල, පුවත දැනගන්නට ඔන්න මෙන්න කියා තිබිය දී ය. සහෝදරියකට එවැනි වේදනාවක් එක ජීවිත කාලයක් ඇතුළත දෙ වරක් ම අත්දකින්නට තරම් දෙවියනි, මම කාලකණ්ණියක් වෙම් ද? "අනු!" මම ඇය තවත් තරයේ බඳ ගෙන කම්මුල සිප ගතිමි. ඈ මගේ කටහඬ තේරුම් ගන්නට ඇත.

"නෑ අක්කෙ නෑ. බය වෙන්න දෙයක් නෑ" යි නැගණිය මගේ ගෙලමුල මූණ ඔබමින් කීවා ය.

මට ඇති වූ සැනසීමක්!

"කියන්න කෝ! මොකද?"

"ඉන්න. මම තව ටිකක් අඬන්න ඕනෑ"

"මෙතැන? මහ පාරටත් පේන්න?"

ඇයගේ මුහුණ බලන්නට උත්සාහ කරමින්, මඳ සිනාවක් ඇතිව කී මම නංගීගේ කිහිලිවලට යටින් ඔසවන්නට ගියෙමි. "............ අඬන්න ඇති තරමක්. යන් ගෙට............ හොඳ කෙල්ල වගෙ යන් ඇතුළට."

බඳ වටා අත යවා මම අනුලා කාමරයට රැගෙන ගියෙමි. දෙපා පණ නැතිව මෙන් ඇය මගේ ගතට බර වූයේ ශාරීරික දුර්වලතාවකින් ම නොව හුරතලයට - නොදොල් කමට යි සිතී මගේ ළය අමුතු සෙනෙහසකින් පිරිණි. මම ඇය ඇඳේ හොවා,

"අඬන්න ඕනෑ තරම්" යයි කියා දෙතුන වරක් හිස අත ගා නැවත එළියට ආයෙමි.



අනුලා වෙනුවෙන් උපන් අනුකම්පාවකින් හා දුකකින් ඇති වුණු බරක් මගේ සිතට දැනෙන්නට විය. මා ඇයට හපුරු වුණා වැඩිය. කීප වරක් ම මා ඇයට පෙන්වූයේ ආරූඪ කරගත් රොරු හරහක් බව සැබැවි. එහෙත් ඇය ඒ බව නොදන මගේ කෝපය ඇත්තට ම බාර ගන්නට ඇත. මෑතක දී කිසි දවසක මා පුංචි නංගීට සැරවැර කර නැත. වරදක දී වත් ඇයගේ සිත රිදෙන දෙයක් කියා නැත. කොටින් කියතොත් සෝමා නිවසින් පිට වීමෙන් පසුව මම දිගට ම අනුලාට විශේෂයෙන් කරුණාවන්ත වීමට වලබලා ගතිමි. අද මගේ කතාබහ ඒ පුරුදු ක්‍රියා කලාපයට වෙනස් ය.

ගත වුණු පැයක හමාරක් පමණ වූ කාල සීමාව ඇතුළත අප දෙදෙනා අතර මතු වුණු කතාබහේ අගක් මුලක් අල්ලා ගැනීමට මම උත්සාහ කළෙමි. එහෙත් වැඩි වේලාවක් සිතිවිලි අතර මට තනිවීමට ඉඩ නොදෙමින් අනුලා ඉස්තෝප්පුවට ආවාය. මම දයාවෙන් ඇය දෙස බලා "අඬල ඉවරද?" යන ප්‍රශ්නය ඇසුවේ මුවින් නොව දෙනෙතිනි. ඇයගේ දෙනෙත් ද කම්මුල් ද රත්පැහැ ගැන්වී තිබිණි. මගේත් සෝමාගේත් දෙදෙනාගේ ම හැඩතිල කැටිකර ගත් අනුලාගේ මුහුණ, දෙවියනි මොන තරම් සුන්දර ද?

"මම අක්කට ගොඩාක් වැරදි කරල තියනව"

දෑත් බැඳගෙන, මා ඉදිරිපිට මිටි තාප්පයේ වාඩි වෙමින් පුංචි නංගී කීවා ය.

"මොනවද නංගි මට කරල තියෙන වැරදි?"

මම දිගට ම සිනාව රැක ගනිමින්, එහෙත් සැකය ගැබ්වුණු ස්වරයෙන් ඇසීමි.

"ඒක තමයි. අක්ක දන්නෙ නෑ............ මම අද සේරම කියන්නම්."

"කියන්න බලන්න. මාත් දැන ගන්න" මම කකුලක් පිට කකුලක් දමා ගනිමින් කීවෙමි.

"කොහෙන් පටන් ගන්නවද මම දන්නෙ නෑ" යි ඇය අසරණ සිනාවක් පා නැවත මුහුණට ගැඹුරු පෙනීමක් නගා ගත්තා ය.

www.sinhalaelibrary.com

දේශපාලන මත නො අදහයි. අනෙක් අතට මේ ගැන සිත යොදවීමෙන් පාඩම්වල වැඩට බාධාවෙතැයි බිය වනු ඇත. ගුණපාල මුණ ගැසුණු බව කීවොත් කතාබස් වුණු දේවල් කිය යුතු ය. ඔවුන් අතර පොදු ප්‍රශ්න විනා පෞද්ගලික දෙයක් කිසි විටෙක කතා වුණේ නැත. ඇය මුල් පටන් ම ගුණපාලගේ හමුවීම අක්කාට නොකීවේ මේ හේතූන් නිසා ය. අලුත් වැඩ පිළිවෙළ ගැන නම් කොහෙත් ම ඇයට කියන්නට නුපුළුවන.

කරුණු දෙකක් උඩ ගුණපාල කියන සාකච්ඡාවලට හවුල් වීමට අනුලා මුලදී පසුබට වුණා ය. අක්කාගෙන් සැඟවිය හැකි කිසිවක් ඇය වෙත නොවේ. එය එක හේතුවකි. කෙතරම් විශ්වාස වුණත් ගුණපාල තරුණයෙකි. ඔහු ගැන ඇය දන්නේ අක්කාගෙන් අසා ඇති විස්තරත් දින කීපයක් කතාබස් කිරීමෙන් ලද තොරතුරුත් පමණකි. ඔහුගේ අදහස් උදහස් හා මත ගැන මිස හැඟීම් හා ගතිගුණ ගැන කිසිත් ඇය දන්නේ නැත.

ගුණපාල ගැන මේ තරමේ වත් අවබෝධයක් ඇතත් ඔහු හා සම්බන්ධ අනෙක් අය කළු ද සුදු ද යන්න පවා ඈ නො දන්නී ය. පරමාර්ථ කෙතරම් උසස් විය හැකි වුව ද නාඳුනන තරුණයන් පිරිසක් සමඟ නාඳුනන තැනක අවේලාවේ මුණ ගැසීම ඇයගේ වයසේ දැරියකට කිසිසේත් නොහොබී.

අනුලාට පුංචි අක්කා අත්කර ගත් ඉරණම මතක් විය. ඇයගේ සියොලඟ දැවී ගියේ ය. මේ අතර ඇයට ගුණපාලගේ වචන දිගට ම ඇසෙන්නට විය. ඒවා විප්ලවයක රණ හඬක් මෙන් ඇය කුල්මත් කරන්නට විය. ඔහුගේ යෝජනාව මුලින් ඉදිරිපත් වූ අවස්ථාවේ දැනුණු අසීමිත සන්තුෂ්ටිය හා තෘප්තිය ඇයට සිහිපත් විය. මේ හැඟීම්වලට ඈ තමාගේ ආත්ම ශක්තිය ගැන ඇති දැඩි විශ්වාසය ද පරමාර්ථය මුදුන් පත් කරගැනීමේ අධිෂ්ඨානය ද එකතු කර ගත්තා ය. ඇයගේ සිත එඩිතර විය. ධෛර්ය සම්පන්න විය. ශක්තිමත් විය.

අනුලා දෙ වන බාධකය කලින් ඉවත් කර ගත්තා ය. ඊළඟට ඉතිරි වූයේ අක්කා පිළිබඳ ප්‍රශ්නය යි.

තමා කරන්නට යන දෙය යුතුකමක් හා වගකීමක් ලෙස ඈ කල්පනා කළා ය. හොඳක් මිස නරකක් එයින් ඇයටත් අන්



කෙනකුටත් සිදු නොවෙයි. ඇයගේ චේතනාව හොඳ ය. පිරිසිදු ය. යථා කාලයේදී අක්කාට සියල්ල හෙළි කළ හැකි ය. ඇය තමාට දවසක සමාව දෙන බව අනුලාට සහතික ය. දැනට ඇයට හොරෙන් මේ කටයුතුවලට සහභාගී වීමේ වරදක් නැත.

එදා රෑ අනුලා නිහඬ ව හැඬුවා ය. හඬා අක්කාට කිසිවක් නොකියා ගුණපාල යෝජනා කළ වැඩ පිළිවෙළට හවුල් වීමට තීරණය කර ගත්තා ය. අක්කාට නොකියන තීරණයට ගුණපාල එකඟ වූයේ නො කැමැත්තෙනි.

අනුලාගේ ම පාසලේ ඉගෙන ගත් පිරිමි ළමයකුගේ ගෙදරක ඔව්හු රැස් වූහ. ඒ ළමයාගේ නැගණියක් ද එහි ම උගන්නා ය. අනුලාට ඇයත් සමඟ ඔවුන්ගේ ගෙදර යෑම පහසුවක් විය. දැරිය මේ කිසිවක් ගැන උනන්දුවක් දැක්වූයේ නැත. ගුණපාල ඇතුළු දහ දෙනෙක් පමණ පැමිණ සිටිය හ. අනුලා හැර සිටියේ තවත් එක ම ශිෂ්‍යාවකි.

ගුණපාල ඔහුගේ පොතෙන් ඉදිරිපත් කළ තරුණ සමිති පිළිබඳ අදහස ක්‍රියාත්මක කිරීමේ ආරම්භය මෙයයි. ඔහු මුලින් ම අදහස් පැහැදිලි කිරීමක් කළේ ය. කරන්නට යන නියමිත වැඩ පිළිවෙළක් ගැන ඔහු යෝජනා ඉදිරිපත් කළා ම නොවේ.

"මුලින් ම අපි හැදෙමු" යි ඔහු කීය.

ක්ෂණික අරමුණ වූයේ සාමාජිකයන්ගේ දැනීම වැඩිකර ගැනීමයි. පර්යේෂණ, පරීක්ෂණ, අත්හද බැලීම්, සාකච්ඡා හා වාද විවාද මගින් දැනීම වර්ධනය කර ගැනීමට සම්මත විය.

චරිත ශුද්ධියට හා ආත්ම දමනයට මුල්තැන දුන් දැඩි විනය මාලාවක් ඔවුන් අතර විය. චාන්කම, නිහතමානීකම, අවංකකම, ධෛර්ය ය, අධිෂ්ඨානය, ආත්ම ශක්තිය, පරිත්‍යාගය ආදී ගුණාංග වවා වඩා ගත යුතු ය. හැම සාමාජිකයෙක් ම තම තමන්ගේ දුබලකම් ගැන පාපෝච්චාරණයක් කර ඒවා එකින් එක මඟ හරවා ගැනීමට අවංකව උත්සාහ කළ යුතු ය.

මෙසේ පරමාර්ථ මුල් කරගෙන ඔව්හු සතියකට වරක් දෙවරක් රැස් වූහ. ඔවුන් අතර සාකච්ඡා වූයේ දේශපාලන විද්‍යාව පමණක් නොවේ. ඉතිහාසය, ආගම් ධර්ම, සමාජ සිරිත් විරිත්,

www.sinhalaelibrary.com

ලෝක තත්ත්වය, ජාතික ප්‍රශ්න ආදී මාතෘකා ගැන මෙන් ම සිනමාව, නාටක, නවකතා ආදී නොයෙක් කරුණු ගැන ද කතා බස් කළ ඔව්හු ඒ හැම දෙයක් ම සම්බන්ධ ව අන්තිම ඒකමතික නිගමන හා තීරණවලට පිවිසිය හ.

ඔවුන් විසින් තමන් හඳුන්වනු ලැබුවේ 'මල් සමාජය' නමිනි. දහයක් දොළහක් ඇතිව පටන් ගත් මල් සමාජයයේ දැන් සිය ගණනක් සාමාජික සාමාජිකාවෝ සිටිති. ගුණපාල සභාපති ය. ලේකම් අනුලා ය. මෙහි ශාඛා කීපයක් පිහිටුවීමට ඇය සැතපුම් හත අට දුර බැහැර ස්ථානවලට පවා ගොස් ඇත. මේ වැඩ කටයුතුවලට සහභාගීවීම සඳහා පාසලේ සවස් වරුවේ පංති හා අනෙකුත් වැඩ ඇතැයි ගෙදරට කියන බොරුව ගොතා ගන්නා ලද්දේ ද අනුලා විසින් ම ය.

ඇත්ත වශයෙන් එක පෙර පෝදන මැදි මහ විදුහලේ සමාජ සේවා සංගමය මගින් සංවිධානය කරන ලද ශ්‍රමදානයකට සහභාගී වීමට ඇයට සිදු විය. මෙයින් අදහසක් ලබා ගත් ඈ ඈත ගම්වල ශාඛා පිහිටුවීමට තිබුණු දව පාසලේ ශ්‍රම දානයකට ය යි අක්කාට බොරුවක් කීමට පුරුදු වූවා ය.

අක්කාට බොරුවක් කී හැම අවස්ථාවක ම අනුලා ගෙදරින් පිටවී ගියේ මහත් හිත් අමාරුවෙනි. ඇය ආපසු ගෙදර ආවේ චකිතයෙනි. ඇයට කෙළින් අක්කාගේ මුහුණ බලන්නට අමාරු විය. මේ අතර ඈ ගුණපාල ගැන තව තවත් පැහැදුණා ය. ඔහු වෙත ඇය තුළ වැඩෙන්නට වූයේ භක්තියත් ගෞරවය හා ආදරයත් මිශ්‍ර හැඟීමකි. ඇයගේ හදවතට ඒ තරම් ළං වූ කිසිම පිරිමියෙක් නොවී ය. අක්කාට පවතින අන්දමේ ම බැඳීමක් ඔහුට ද ඇයගේ සිතේ හට ගත්තේ ය. අම්මාත් ලොකු අක්කාත් නිල්මිණීත් හැරුණු විට ඇයට සිටි නෑයාත් හිතවතාත් ගුණපාල ය. ඇත්ත වශයෙන් සමහර විටෙක මේ ඇල්ම පවුලේ කෙනකුට හා තරමට ම දැඩි විය. ගුණපාල පවුලේ ම කෙනකු කර ගන්නට ඇත්නම් යන බොළඳ ආශාව පවා ඇයගේ සිතට රිංගන්නට වන්නේ ය. එක්තරා අවධියක දී ගුණපාල තමා ගැන අදහසකින් පසු වූ බව වරක් අක්කා කී කතාව ඇයට මතක් විය. සෑහෙන තරමට කුළුපග වූ පසු ගුණපාලගේ හද ගැබට එබිකම් කර



බැලීමට අනුලා සතා ගත්තා ය. ඈ මුලින් ම අක්කා ගැන වටින් පිටින් කතා කළා ය. පාසල් සමයේ නොයෙක් කරුණු ඔහුගෙන් ද කියැවෙන්නට වූයේ මෙහි දී ය.

මේ අතර නිමල්ගේ විවාහය එළැඹියේ ය. ශෝකයෙන් පසු වූ අක්කා නිසා අනුලා ද අතිශයින් ශෝකයට පත් වුණා ය. අක්කාගේ සිතට සැනසීමක් ලබා දෙන මගක් ගැන ඈ කොතෙකුත් කල්පනා කළා ය. මෙය ඇයට විසඳා ගත නොහැකි ගැටළුවක් විය. ඇයට එක සැනසීමක් තිබේ. ගැටළුවක දී උපදෙස් සොයා යෑමට දැන් වැඩිහිටියෙක් සිටී. වරක් අක්කා යමකිසි ප්‍රශ්නයක් ගැන කතා කර ගැනීමට ගුණපාල වෙත ගිය විදියට ම අනුලාත් අක්කා ගැන ඔහු සමඟ කතා කළා ය. අක්කා ගැන ඇය මෙන් ම ඔහු ද එක තරම් උනන්දුවක් දැක්වූයේ ය. අක්කා දෙ දෙනාට ම පොදු ප්‍රශ්නයක් බවට පත් වුණා ය. ඔහු ඇය ගැන දන්නා නොයෙක් දේ හෙළි කළේ ය. මෙහි දී ඔහුගේ හදවත ද හෙළි විය.

සාහිත්‍ය සංගමයේ සඟරාව සකස් කිරීමට එකතු වීමෙන් ගුණපාල අක්කා සමඟ ඇසුරට වැටුණේ ය. ඔහු කියන අන්දමට මුලින් ම ඇය ප්‍රිය කරන්නට ඔහු පෙලැඹුණේ ඇය වෙත 'බොරු කෝලං' නොතිබුණු නිසා ය. ඈ පිරිමි ළමයින් සමඟ මුතුළු නැතිව නො පැකිළ කතා බස් කළා ය. ඇසුරු කළා ය. ඇයගේ චාත්කමත් අවංකකමත් ඔහුගේ සිත් ගත්තේ ය. තමාගේ නැති බැරිකම් හා අගහිඟකම් වසා ගැනීමේ බොරු ආඩම්බරයක් නොතිබීමත් ඇය ගැන ඔහු තුළ පැහැදීමක් ඇති කළේ ය. මේ සියල්ලටත් වඩා ගුණපාල අක්කා ගැන පැහැදුණු හේතුවක් විය. ඔහුගේ අදහස් උදහස් අනුමත නොකළත් ඇය ඒවාට කිසිවිටෙක සිනාසුණේ නැත. අපහාස උපහාස කළේ නැත. ඔහු කියන සියල්ලට ඈ සවන් දුන්නා ය.

තමා ප්‍රිය කරන විෂයයන් ගැන සාකච්ඡා කිරීමට කෙනකු නොමැතිවීම ගුණපාලට එදා තිබුණු ලොකු වේදනාවකි. මේ නිසා ම තනිකමක් හා පාළුවක් පිළිබඳ හැඟීමක් ද නිරන්තර ව ඔහුගේ සිතට වධ දුන්නේ ය. අක්කා මේ පාළුව නැති කිරීමට සමත් විය හැකි කෙනෙකැයි ගුණපාල සිතී ය. සාකච්ඡාවට අල්ලා ගත

www.sinhalaelibrary.com

හැකි කෙනකු ලෙස පරිවර්තනය කරනු පිණිස තමාගේ මත හා අදහස් ඇයගේ ඔළුවට දැමීමට ඔහු කල්පනා කළේ ය. තමා විසින් ලියන ලද කෙටිකතා, කවි හා රචනා ඇය ලවා කියවීමට ඔහු සැලැස්සුවේ මේ අරමුණ ඇතිව ය.

අක්කා ගුණපාල සිතූ තරම් බොළඳ නොවුණා ය. ඇය ඔහු සිතුවාට වඩා බුද්ධිමත් ය. ඈ ඔහුගේ අදහස් ගරු කළත් අනුමත කළේ වත් ඒවාට එකඟ වුණේ වත් නැති බව අවබෝධ විය. මෙයින් ඔහු පසුබට නොවී ය. කොටින් කියතොත් මේ ස්වාධීනකම නිසා ඇය ගැන ඔහුගේ පැහැදීම තව තවත් වැඩි විය.

ඇයගේ අදහස් පමණක් නොව හැඟීම් ද දැනගැනීමට ඔහු කීප වරක් උත්සාහ කළේ ය. එතැන දී ඈ වඩාත් බුද්ධිමත් ලෙස ක්‍රියා කළා ය. ඔහුට තම හදවත දැන ගැනීමට ඈ කිසි ඉඩක් නො දුන්නා ය. ඇයට ඇත්තේ ද ගොළු හදවතකැ යි ඔහු සිතී ය. ඇයගේ මේ ගතිය ඔහු තුළ වේදනාවක් ඇති කළේ ය. අක්කාගේ හදවතෙහි කිසිවකු ජීවත් වන බවට සැකයක් පැවැති නමුත් ඒ සැකය සනාථ කරන සාක්ෂි කිසිවක් සොයා ගත නොහැකි විය. නිමල් හතුරුසිංහ ගුරු පත්වීම ලැබ එන තුරු ඔහු මේ සැකයෙහි ජීවත් විය.

අක්කා හා නිමල් අතර පැවැති සම්බන්ධය ගුණපාලට මුල දී ප්‍රහේලිකාවක් විය. ඔහු පමණක් නොව එකල ඉහළ පංතිවල බොහෝ දෙනකු තුළ මේ ප්‍රහේලිකාව පැවැතිණි. ඔවුන් අතර ඇසුරක් තිබී කඩාකප්පල් වී ගිය බවක් කවුරුත් පසුව දැන ගත්හ. එහෙත් ඒ ඇසුර නැවත අලුත් වනු ඇත යන විශ්වාසය ගුණපාල තුළ විය. අක්කා අන්තිම මොහොත වන තුරු ම නිමල්ට ආලය කළ බව ගුණපාලගේ හැඟීමයි.

පාසලෙන් අස් වූ පසුවත් යමකිසි මිහිරිතම දෙයක මතකයක් වශයෙන් අක්කාගේ රූ සටහන දිගට ම ගුණපාලගේ සිතෙහි රැඳී තිබිණි. ඔහු ඇයට අම්තන කරන්නට බැරි තරමින් බොළඳ ලෙස ආලය කළා නොවේ. ඔහු ඇසුරට පත් එක ම දූරිය ඇයයි. ඔහු ප්‍රිය කරන ගති ගුණ ඇත එක ම දූරිය ඇයයි. ඈ 'යම් දිනෙක විවාහ වෙතොත් මෙන්න මේ විදිය කෙනෙකු සමගය' යි සිතින් මවා ගත් චරිතයට ගැළපෙන යුවතියකි.



අක්කාත් ගුණපාලත් අතර පැවැති ඇසුරෙහි මුහුණුවර කුමක් වුව ද ඇය නිසා ඔහුගේ සිතෙහි පැවැති පාළුවක් නැති වී ගියේ ය. පාසල් විය කෙළවර මේ ඇසුර නිමාවට පත්වීමෙන් ප්‍රියතම දෙයක් අහිමි වීමේ අලුත් පාළුවක් ඔහුගේ සිතට ඇතුළු විය. ඉන් පසුවත් ඔහු දිගට ම ඇයට ලියුම් ලීවේත් ඉඳහිට ඇය බලන්නට ආවේත් මේ දෙ වන පාළුව නැති කර ගනු පිණිස ය.

නිමල්ගේ විවාහයෙන් පසුව අක්කාගේ හදවත හිස් වූ බව ගුණපාල දනී. එහෙත් එහි තමාට ඉඩක් ඇති බවක් ඔහු නොසිතයි. නිමල් අත් හරිනු ලැබුවේ සිය කැමැත්තෙන් ම වුව ද අදත් - මේ මොහොතේත් - ඔහු වෙනුවෙන් අක්කාගේ හදවත හඬා වැලපෙන බවත් එහි අන් කෙනකුට ඉඩක් නැති බවත් ගුණපාලගේ විශ්වාසයයි. ඇයගේ හදවතට ඇතුළු වීමේ ඉඩකඩ තිබේදැයි උත්සාහයක් කිරීමට පවා ඔහු නො කැමැති ය. ඇතුළුවීම තහනම් නම් ඇයගේ හදවත රිදවීමට ඔහුට සිදු වන බැවිනි. අක්කාගේ සිත තැළීම මලක් තැළීම වැනි පාපයකැයි ගුණපාල සිතයි. ඈ ගැහැනු ළමයකු නොකරන පරිත්‍යාගයක් කළ එකියකි. ඇයට තව තවත් රිදවීම අපරාධයකි.

අක්කාගේ මෙන් ම ගුණපාලගේ ද හදවත හිස් ය. තවදුත් හිස් ය. තමාගේ හදවතෙහි හිස් බව පිරවිය හැකි ශක්තියක් ඇති තරුණියක සෙවීම පහසු ය යි ඔහු නොසිතයි. එවැන්නියක් මුණ ගැසෙනු විනා සෙවිය හැකි නොවේ.

"ගුණපාලගෙන් මම මේ විස්තර අහගත්තෙ බොහොම අමාරුවෙන්. කොන්දේසියක් උඩ. අක්කට නො කියන පොරොන්දුව උඩ. ඒ නිසා අපි දෙන්න අතරේ කුමන්ත්‍රණයක් වුණා ම ය කියල කියන්නත් බැහැ..............."

"ඉතින් ඇයි ඒ පොරොන්දුව කැඩුවෙ?"

"මම දන්නෙ නෑ. අක්කට කියන ආදරේට. ඒක මගෙ පුද්ගලික ප්‍රශ්නයක්. අපේ සංවිධානයට සම්බන්ධ කාරණයක් නෙවි."

www.sinhalaelibrary.com

"මට තේරෙන්නෙ නෑ." යි මම සුසුමක් හෙළා තවදුරටත් නිහඬ වීමි.

"දැන් ඉතින් කියන්න අක්ක මට සමාව දෙනවද කියල?"

"මුල කොටසට මම සමාව දෙනව. ඒ කියන්නෙ නංගි කළ දේවල් මම අනුමත කරනව නෙවි. මුලින් දැන ගත්ත නම් මම කවදාවත් ඕවගේ දේවල්වලට යන්න දෙන්නෙ නෑ. නංගිට හරිය කියල හිතෙන දෙයක් නංගි කළා............... ඩැයිවර් මාමලගෙ ගෙදර නැත්ද අපිට අපේ අයිතිය දුන්නෙ නෑ. වෙනත් ප්‍රශ්නයක් වුණත් මෙතැනදි නංගිගෙ අයිතිය උදුර ගන්න ඕන කමක් නෑ මට."

මා මෙහි දී කතා කළේ ආත්ම වංචාවෙන් මගේ සිතේ එක පැත්තක් වසං කර ගෙන ය. මම සාන්තුවරියක් නොවෙමි. සහෝදරියක පමණක් නොව සම වයසේ මිතුරියක ද වූ අනුලා මෙතරම් දෙයක් මෙතරම් කලක් මට රහසක් ලෙස තබා ගැනීම මගේ සිත දැඩි ලෙස වේදනාවට පත් කළේ ය. මා තනි වී අනාථ වුණු බවට මහා අසරණකමක් ඇයගේ කතාවට සවන් දී සිටින අතර මගේ සිතට දැනෙන්නට විය. මගේ හදවතට සමීප වූවන් වෙනුවෙන් මා තුළ ඇති ආදරය, කරුණාව හා දයාවත් ඔවුන් උදෙසා මා කර ඇති පරිත්‍යාගයන් කිසිවකු අගින් පිළිගැනීමක් නොලැබ නිෂ්ඵල වුණු බවට දැඩි දුකක් මට ඇති විය.

මෙය කුමන්ත්‍රණයක් නොවේ ය යි මොන විදියකින් වත් සිතන්නට බැරි ය. මගෙන් සත්‍ය වසං කර ඇත්තේ නංගී පමණක් නොවේ. ගුණපාල ද මේ හැම දෙයකට ම හවුල් ය. මෙතරම් දීර්ඝ කාලයක් මගේ සමීප හිතවතකු ව හිටි ඔහු මගේ මාර්ගයෙන් හඳුනා ගත් මගේ ම නැගණිය සමඟ බරපතල කරුණු රැසක් මගෙන් රහසක් කොට තබා ගෙන ඇත. එක් අතකින් ඔවුන් දෙ දෙනාගේ ක්‍රියාකලාපය මට විශ්වාස කරන්නට පවා නුපුළුවන. එය ඇදහිය නොහැකි අද්භූත ජනක සිහිනයක් මෙනි. අනෙක් අතට මින්පසු කවුරුන් විශ්වාස කරන්න ද කවුරුන් ගරු කරන්න ද කවරකුට ආදරය කරන්න ද යනාදී ප්‍රශ්න වැලක් ඉදිරිපිට මම අසරණ අනාථ තත්තවයකට පත් වීමි.



අනුලාගේ විස්තරයට සවන් දීගෙන සිටින අතර මට තවත් විදියක දැඩි වේදනාවක් දැනෙන්නට විය. ස්වාධීන මඟකට වැටුණු සෝමා මට අහිමි වූවා ය. ඊට වඩා හාත්පසින් වෙනස් ප්‍රතිවිරුද්ධ දිශාවකට යොමු වුණු ස්වාධීන මඟකට අද අනුලා ද පිවිස සිටින්නී ය. මට සෝමා අහිමි වූ අයුරින් ම යම් දවසක අනුලා ද මට අහිමි වනු ඇත. ලොකු නංගී මා අත පොවන සීමාවෙන් ඈත්වුණු අතර අද පුංචි නංගී ද මගෙන් බොහෝ දුරස් වී සිටී. දැන් ඇය සිටින්නේ මගේ පාලනයෙන් බාහිරවය. මේ කරුණු සිතට එන කල මගේ හදවත දැඩි කම්පනයට හසු විය.

අන්තිමට පුංචි නංගි සියල්ල මගෙන් සඟවා තබා ගැනීමෙන් සිදු වුණු මදි පුංචිකම ලුහුඬු කර ගැනීමට මට අවශ්‍ය විය.

"පුංචි නංගි මට නොකිව්වට මම නම් හුඟ දවසක ඉඳල දැනගෙන හිටිය මගෙන් හංගන මොකක් ම හරි කියනව කියල." මම දුබල සිනාවක් මුවගට නගාගෙන කීවෙමි.

"අක්ක එහෙම හිතුවෙ මොන හේතුවක් උඩද?"

"නංගි අර ලාච්චුවට යතුරක් පාවිච්චි කරන බව දැක්කට පස්සෙ මුලින්ම සැකයක් ඇති වුණේ..............."

"ඒකෙ තියෙන්නෙ අපේ රැස්වීම්වල සාකච්ඡාවල වාර්තා.............."

"තව ලේඛන කීපයක් ම තිබුණා.............."

"ඒ මොනවද?"

"දැන් ඕව කතා කරල වැඩක් නෑ. අක්කටත් ඇස්කන් තියනව.............. ඒක නෙවි.............. නංගි ඔහොම ඈත ගම්වලත් නාඳුනන තැන්වලට යන එක නම් මම අනුමත කරන්නෙ නෑ. මට බයයි."

"නෑ අක්කෙ මම ඒ තරම් දුර්වල නෑ. මම පිළිගන්නව පුංචි අක්ක ගැනත් මතක් වෙන කොට අක්ක මේ තරම්වත් සත්පුරුෂ විදියට කතා කරන එක පුදුමයි. අපි අපේ ආත්මාරක්ෂාව ආත්ම ගෞරවය ගැන එහෙමත් කතා කරනව. අනික් දේවල් ගැන වාගේම චරිත ශුද්ධිය ගැනත් මුල්තැනක් දීලයි කටයුතු කරන්නෙ.........

"ඔව් ගුණපාලගෙ පොතෙත් ඒ ගැන තිබුණ නම් තමයි..............."

"අපේ වැඩ පොතට විතරක් සීමා කරල නෑ. මම අද අක්කට කිව්වෙ දවස් ගණනාවක් කියල ඉවර කරන්න බැරි කතාවක්. කෙටියෙන්. මම විවේකයෙන් අක්කට සේරම කියන්නම්............... හොඳ අක්ක වගේ දැන් ඉතින් මම අහන එකට උත්තර දෙන්න. අක්ක මුල කොටසට සමාව දෙනව කිව්වනෙ. දෙවන කොටසට?"

"මම දන්නෙ නෑ. අද කණට වැටුණු දේවල් ගැන හිතල බේරුමක් කරන්න එක ඔළුවක් මදි." යි කී මම සුසුමක් හෙළා ළය සැහැල්ලු කර ගත්තේ හිසේ බර අඩු කර ගැනීමට මෙනි.

"එහෙනම් තවත් ටිකක් එකතු කරන්න ද?"

"මාව අංගොඩ යවන්න ඕනෑ වෙලා ද?" මම අනුලා දෙස බලා සිනාසීමි.

"මට ඒක කියන්නත් බයයි. අක්ක කලබල වෙයි කියල"

"කලබල වෙනව නම් දැන් අහගන්න ටික හොඳටම ඇති"

"ඒක මට සම්බන්ධ කාරණාවක්" මම එපමණින් ම ඇඟිල්ලකින් කැලැඹීමි. "............... එක් කෙනෙක් මා ගැන හැඟීමක් ඇති කරගෙන"

"නංගිලගෙ සාමාජිකයෙක්?"

"නැහැ. අපි අතරෙ එහෙම ඒව නෑ............... මහතුන් අයියා"

"තිස්ස?"

"අක්ක ඔන්න කලබල වුණා"

"නෑ"

"නැත්තෙ මොකද? කලබල වෙන්න එපා අක්කෙ. මම ඒ ගැන තීරණයක් කරල නෑ"

"ඒ කියන්නෙ තවම තීරණය කරල නෑ?"



"අක්ක අදහස් කරන එක නෙවි අක්කෙ. කෙනෙකුට ආලය කරනවද කියල මගෙ තීරණයක් නෑ. ඒක එකක්. තිස්සට ආලය කරනවද කියන එක තවත් එකක්. මම දන්නෙ නෑ."

"තීරණයකට බහින්නත් එපා! උඹ නම් කවදාවත් මම වගෙ නැන්දල අකමැතියි කියල නිකම් ඉන්නෙ නෑ. හිත ගියොත් හිතුවක්කාරකමට කර ගනියි."

"මම ඕක කලින් නොකිව්වෙත් මට වුණු දේම නේද නංගිටත් වෙන්නෙ කියල අක්ක බයවෙන නිසා. මේ එකක්වත් අක්කෙ අක්කගෙන් රහසක් විදියට මම තියාගෙන හිටියෙ ලේසියෙන් නෙවි. මම හරියට හිතින් දුක් වින්ද අක්කෙ"

"ආයෙත් අඬන්න එපා. නංගි මට කිව්ව නෙ අද හරි"

"මම අක්ක වගේම ඉස්කෝලෙදි කොයි පිරිමි ළමයා එක්කලත් කතා බස් කළා. ටික දෙනෙක් ආශ්‍රය කළා. මහතුන් අයිය ඉතින් මෙහෙදිත් අඳුරන නිසා වැඩිය කතා බස් කළා. දවසක් එයා කිව්ව මට යමක් කියන්න තියනව ලියල දෙන්නද කියල. මම කිව්ව ඕනෑ එකක් කටින් කියන්න කියල. බොහොම අමාරුවෙන් එයා කිව්ව මට ආදරෙයි කියල. හැබැයි අක්කට නම් කියන්න එපා ම කිව්ව. මම කෙළින් ම බෑ කියනව වෙන කෙනෙකුට නම්. නමුත් මට ඒ මූණට එහෙම කියන්න දුක හිතුණ. ඒ තරම් අසරණයි. මම කිව්ව කල්පනා කරල කියන්නම් කියල. ආයෙත් ආයෙත් ඇහුව, අන්තිමට මම කිව්ව මම දන්නම ඕව ගැන හිතන්නෙ නෑ කියල. අන්තිමට එයා ඇහුව කවද හරි මා ගැන බලාපොරොත්තුවෙන් ඉන්නද කියල. මම කිව්ව මගෙන් තහනමක් නෑ නමුත් මම කවද හරි බෑ කිව්වොත් ගෑනු චපලයි කියල මුළු ගෑනු සංහතියට ම සාප කරන්න එපා කියල මම හිනාවුණා. මගේ හිත වෙන කෙනෙක් ගැන ගියොත් එදට ඒ බව එයාට කියනවද කියල ඇහුව. මම කිව්ව මම ඒක නම් කියන්නම් කියල. එච්චරයි."

"මට වුණේ ඔය ටික කියා ගන්න බැරිවුණු එක. නංගි මට වඩා ඉහළයි ඒ අතින්."

"නෑ අක්කෙ. මම අක්කගෙනුයි පුංචි අක්කගෙනුයි දෙන්නගෙන් ම පාඩම් ඉගෙන ගත්ත. මම දන්නෙ නෑ මම වයසට වැඩිය පැහිලද..............."

www.sinhalaelibrary.com

"උඹ ඉඳිල"

"හිනා නෙවී අක්කෙ. මම හුඟාක් දේවල් කල්පනා කළා. අක්කට මෙහෙම වෙන්න කිසිම යුක්තියක් නෑ. නමුත් අක්කට මෙහෙම වුණා. ඒ කියන්නෙ යුක්තියට ඉඩක් නෑ. අපි එක වයසකදි හිතනව ප්‍රේමය ඉදිරියේ බාධාවක් නෑ ප්‍රේමය අවංක නම් ස්ථිර නම් ජයගන්නව කියල. මම නම් ඕව විශ්වාස කරන්නෙ නෑ. නිකම් බොළඳ කතා. මගෙ යාළු ගෑනු ළමයින්ට මම හිනාවෙනව. ඒ ගොල්ල කීප දෙනෙකුට ම යාළු පිරිමි ළමයි ඉන්නව. ඒ ගොල්ලගෙ ලියුම් හොමත් මට පෙන්නනවා. හරි බොළඳයි. සමහරෙක් කියනව බාධක තිබුණමලු ප්‍රේමය රසවත්. මේ සමාජයේ මට හිතෙන විදියට ප්‍රේමයට තියන බාධාව ඇති නැති භේදය, කුල භේදය, ඔවගෙ දේවල්. ඒක තේරුම් ගන්න බැරි වුණු කවිකාරයො පෙම්වතුන් ගැන අනුකම්පාවෙන් බාධක තිබුණම ප්‍රේමය රසවත් කියල ලියන්න ඇති. නැත්නම් ප්‍රේමයට වෙන බාධක දකල මේවට මුල පංති භේදය නැත්නම් කුල භේදය බව තේරුම් අරගෙන තරුණ තරුණියන් මේ සමාජ ක්‍රමය වෙනස් කරන්න පෙළඹෙයි කියල වුවමනාවෙන් ම ඒ අය නොමඟ යවන්න ඔය බොරු මත දමන්න ඇති. මට නම්..............."

"අපරාදෙ කියන්න බෑ ගුණපාල හරියට ගෝලය හදල තියනව"

"ගුණපාලගෙ අදහස් ම නෙවී අක්කෙ. මම කියන්නෙ නෑ පිරිමි ළමයි ගෑනු ළමයි ආලය කරන්න නරකයි කියල. මම ම හෙට කාට හරි හිත දෙන්න ඉඩ තියෙනව. ඒක වෙනම එකක්. නමුත් ඇහැට පෙනි පෙනි මම නම් ආලය කරනවය කියල කඳුළු බොන්න ලෑස්ති නෑ. ආලය කියන දේකට ඉඩ නැත්නම් - අක්කගෙන් ම ඒක මට ඔප්පු වුණා - ආලය කියන එකට ඉඩ නැත්නම් මොටද කියන්න ආලය කරල කඳුළු බිබී..............?"

"ඒක සොබාවික වුවමනාවක්"

"ඇත්ත! මහන්සි ගන්න ඕනෑ හිත දමනය කර ගන්න. අඩු ගණනෙ කලකටවත්. ආත්ම ශක්තිය තියනව නම් පුළුවනි. මම නම් හිතන්නෙ ඉස්කෝලෙන් අස්වෙන කල්වත් කොහොම හරි



හිත හද ගන්නව. අක්ක කොයි තරම් කිව්වත් ඔය කෙහෙල්මල හුණ නම් අක්කට වාසිටි යන්න පුළුවන් වෙනව."

"දැන් කිව්වම මොකද ඒක නම් වුණේ එයා හරියට අපිටම උගන්නන්න ආවනෙ. එයාගෙ මූණ මග අරින්න ඕන නිසා මම පාඩමටවත් හරියට කන් දුන්නෙ නෑ නෙ"

"ඒක තමයි. එයාගෙ හතුරුකම තමයි මම කියන්නෙ"

"මගෙ ඒක උදාහරණයකට ගන්න බෑ. මට තව කරදර තිබුණ නෙ නංගියෙ. මතක නැද්ද ඒ කාලෙ මම හැම සුමානෙකම වගෙ ගෙදර ආව. තාත්ත ලෙඩින්. සෝමෙගෙ කරදර."

"ඕක තමයි මට අක්කලත් එක්කල තරහ යන්නෙ. තාමත් එයාගෙ වැරැද්දක් කිව්වොත් මොනව හරි කියල ඒක යට ගහගන්නමයි බලන්නෙ."

"මම කිව්වෙ ඇත්ත. නංගිට වගෙ මට බෑ රටේ ඉන්න මිනිස්සුන්ට වෛර කරල මගෙ හිත හදාගන්න."

"වෛර කරන්න එපා. මම කිව්වෙ එයා............"

"ඇති! ඒක යට ගිය කතාවක්!"

අනුලාගේ මුහුණ නරක් විය. මගේ සිත රිදවීමට සිදු වීම ගැන ඇය පසුතැවිලි වුණා විය හැකි ය.

"ඉතින් කියන්නකො නංගිගෙ කතාවෙ ඉතුරු හරිය"

"මගෙ කතාව ඉවරයි. මම කියන්නෙ ප්‍රේමය සම්බන්ධව මම හිත දමනය කරගෙන ඉන්නව. එතැනදි මට කරුණු දෙකක් උදව් වෙයි. එකක් ලොකු අක්කගෙයි පුංචි අක්කගෙයි ජීවිත දිහා බලල මම ඉගෙන ගත්ත දේවල්. දෙන්නටම දෙවිදියක වැරදුණු තැන් මට පාඩමක්. ඒ වාගේම ලොකු අක්කගෙ උදර ගතිගුණ මට............"

"අනේ කෙල්ලෙ!"

"............... ලොකු ආදර්ශයක්. දෙවෙනි කාරණය ගුණපාල. අපි මේ කරන වැඩකටයුතු. පිරිමි ළමයින් නැතුවට මට දැන් කරන්න දේවල් හිතන්න දේවල් ඕනෑ තරම් තියනව. මම කල්පනා කරන

www.sinhalaelibrary.com

දෙයක් යන්නම් වයස දහතුන දහතර වෙන කොට ගෑනු පිරිමි දෙගොල්ලම ප්‍රේමය ඔළුවට ගන්නෙ හිත යොමු කරන්න වෙන වැදගත් වැඩක් නැති නිසා."

"ඇයි උන්ට පාඩම් කළාම මොනව වෙනවද මනමාලකම වැහෙන්නෙ නැතුව?"

"ඒකම මදි අක්කෙ. ඔය කාලෙට ඉගෙන ගන්න එකත් සාමාන්‍ය දෙයක්."

"මේවම කතා කර කර ඉන්නව මිසක් අද අපි දවාලට උයන්නෙ නැද්ද?"

"ලොකු අක්කට නම් බඩගිනිත් නැතුව ඇති. හිත පිරිල නෙ"

"උඹ මගෙන් මොකුත් අහගන්න එපා" මම උන් තැනින් නැගිට කුස්සිය දෙසට යමින් කීවෙමි.

කෑම පිසින අතර අප දෙදෙනා අතර කතාබහක් නොවුණා තරම්. මට මෙන් ම අනුලාටත් සිතන්නට බොහෝ දේවල් තිබෙන්නට ඇත.

"ඉතින් ලොකු අක්කෙ දන්වත් දෙන්න කො උත්තරයක්." යනුවෙන් ඇය නැවත කීවේ සෑහෙන වෙලාවකට පසුව ය.

"මොන උත්තරයක් ද?"

"මම ගුණපාලට කියන්නම්............"

"කියන්න දෙයක් නැහෙ මෙතැන. නංගි ඔය සේරම එයාගෙන් අහගත්තෙ මට මොකුත්ම කියන්නෙ නැත කියල පොරොන්දුවක් උඩ. කිසි දෙයක් නූන විදියට ඉන්න"

* * * * * *

මැදියම පසු වී ඇතත් නිදිමත අහලකවත් නැත. ඒයේටත් වඩා කදිමට හඳ එළිය බැබැළෙයි. රාත්‍රිය මෙසේ අමුතු චමත්කාරයක් ගනු ඇතැයි වේලාසන සිට ම මට හැඟෙන්නට විය. සැන්දෑවේ කිසියම් කටයුත්තකට මිදුලට බට අවස්ථාවේ මම වෙරි ගස යට නතර වී නිකමට මෙන් වට පිට බැලුවෙමි. හිරු අවරෙහි ගැලෙන් ම පැතුරුණු තුනී අඳුරක් දුව වත්නට නිශ්චල



ප්‍රයත්නයක යෙදෙමින් තිබිණි. අඳුරට ඉඩක් නැති බව මට පැහැදිලි විය. අපගේ නිවස ඉදිරිපිට පාළුවට ගිය "සමරගිරි" ය පිටුපස ගස් පෙළට මුවා වී ලොකු හඳක් පායන්නට සැරසෙන සැටි මම දිටිමි. අද නැගෙන්නේ ඊයේ - පසළොස්වක පෝය ද - හඳටත් වඩා ලොකු, පිරුණු හඳකැයි මට හැඟිණි.

සොම්නස හා දොම්නස විසින් අවුල් කරන ලද සිහින් රැ තිස්සේ අවදියෙන් ගත කළ අවස්ථා මගේ ජීවිතයේ බහුල ය. එහෙත් අද අමුතු ය. මට ගැටළුවක් වූයේ ගුණපාල සම්බන්ධ ව අනුලාට දිය යුතු පිළිතුර කුමක්දැයි තීරණය කර ගැනීම නොවේ. ඊටත් වඩා බරපතළ එකකි.

ඊට කලින් එකක් කිව යුතු ය. ඊයේත් ඒ කතාවෙන් පසුව අනුලාත් මාත් අතර ගුණපාල ගැන කිසි සඳහනක් නොවිණි. සාමාන්‍ය එදිනෙද දේවල් ගැන පවා අප දෙඩුවේ ඉතාම අඩුවෙනි. එහෙත් එම නිශ්චලතාව තුළ මුසලකමක් හෝ පාළු ගතියක් හෝ නොවිණි. වචන වශයෙන් වැඩි දෙයක් පිට නොවුණත් එකිනෙකා වෙත පවතින දයාව, විශ්වාසය හා අවබෝධය වරින්වර එකිනෙකා වෙත එල්ල වුණු අඩබැල්මෙන් පළ විය. දෙ දෙනාට ම සිතන්නට බොහෝ දේ ඇතැයි දෙ දෙනා ම දනිමු.

මගේ සිතේ ප්‍රමුඛ ව උපන්නෙ ගුණපාලත් මට අහිමි වේදැයි බියක් හා ශෝකයකි. ආලය නිසා මට නිමල් නැති විය. රෝහණ නැති විය. ඊළඟට ගුණපාල?

රෝහණ මට අහිමි වී අවසාන බැවින් අම්මාත් පුංචි නංගී සහ නිල්මිණිත් හැරුණු විට ගුණපාල තරම් දත් මගේ හදවතට වඩාත් සමීප වුණු තවත් කෙනෙක් නොවෙති. ඔහු මගේ පැවැත්මෙහි කොටසක් බවට පත්ව සිටින බව අලුතින් අවබෝධ වෙත් ම මගේ බියත් ශෝකයත් වැඩෙන්නට විය. ඔහු මා කෙරෙහි ඇති කළ බලපෑම යථා ස්වරූපයෙන් මා දකින්නේ අද ය.

අප අතර හැඟීම් හුවමාරුවක් නොවුණත් ඔහු දිග කලක් තිස්සේ මගේ හදවතට ළංව නොසිටියේ ද? කලින් නොයෙක් වර කියැවී ඇති අන්දමට පාසලේ අන් කිසිම පිරිමි ළමයකුට

වඩා මම ඔහු කිට්ටුවෙන් ඇසුරු කළෙමි. ප්‍රේමය හැරුණු විට මා මුහුණ දුන් සියලු ම ප්‍රශ්න මම ඔහු වෙත ගෙන ගියෙමි. මගේ ගැටළු සම්බන්ධ ව මෙන් ම පොදුවේ කෙරුණු කතාබහේ දීත් ඔහුගෙන් ඉදිරිපත් වුණු අදහස් උදහස් සහ මතිමතාන්තර සමඟ එකඟ නොවුණත් මම ඒවා අගය කළෙමි. ඒ අතර මම ඔහුගෙන් ආපසු දෙයක් නොලැබුවෙම් ද?

ළමා වියේ සිට ම දුක්කරදරවලට සිනාමුසු ව මුහුණ දීමේ ශක්තියක් මට තිබුණු බව ඇත්තකි. එසේ වුව ද නිමල් අහිමි වීම, සෝමාගේ ඉරණම, කාන්තාගේ මරණය සහ ඉගෙනුම කඩාකප්පල් වීම ආදී වශයෙන් මා පසු කළ කටුක ම අත්දැකීම්වලට මුහුණ දීමේ දී ගුණපාලගේ ඇසුරෙන් හා ඔහුගේ දර්ශනයෙන් මා ලද ධෛර්යයත් ආලෝකයත් මට අතිරේක ශක්තියක් නොවිණි ද?

ඇත්ත වශයෙන් මගේ හදවතට ආසන්න වූයේ ගුණපාල නමැති පුද්ගලයා නොවන බව දුන් මගේ හැඟීම ය. එය ඔහුගේ අදහස්, මත හා දර්ශන ඇසුරෙන් නිර්මිත සිසියම් සංකේතයකි. සංකේතය තරුණියෙක් නොවේ. පිරිමියෙක් නොවේ. සංස්ථාවක් පමණි.

මා ගුණපාල දෙස බැලූ ආකාරයට වඩා වෙනත් ආකාරයකට ඔහු මා දෙස බැලූ බව ඊයේ අනුලා කියන්නටත් බොහෝ කලකට උඩ දී මම දැන සිටියෙමි. මට පොතක් කියවන්නට දුන් ඔහු අනතුරුව එහි අන්තර්ගතය ගැන දිගට හරහට ප්‍රශ්න අසන්නට වූයේ රුචිඅරුචිකම් හි සිතුම් පැතුම් අතින් මා තමාට කෙතරම් සමීපදැයි සොයා බැලීමට බව එදත් මට රහසක් නොවිණි. ඔහු හැඟීම්වලට යට නොවී මොළයෙන් හදවත පාලනය කර ගත් තැනැත්තකු බව සැබෑව. එහෙත් අන් ඕනෑම කෙනකුගේ සිතක් මෙන් ඔහුගේ සිත ද වින්දනයට යටත් ය. කතාබහේ දී නොයෙක් වර මගෙන් කියැවුණු සමහර වචනයකින් ඔහුගේ දෙනෙත් හරහා අඳුරක් ඇඳී ගියේ එබැවිනි.

නිමල් මා පැතුවේ හුදෙක් තමා වෙනුවෙනි. රෝහණ මා සිය ජීවිතයට යාකර ගැනීමට සිතුවේ එමගින් මට මෙන් ම තම මව්පියනට, සහෝදරයනට සහ පවුලට සෙතක් සලසා ගැනීමේ



චේතනාවෙනි. කිත්සිරි මා පිළිබඳ හැඟීම් සඟවා තබා ගත්තේ කෙළින් ම මට කතා කිරීමට තරම් ආත්ම ශක්තියක් නොවූ බැවිනි. ගුණපාල අද සිය හදවත මා ඉදිරියේ විවෘත කිරීමට පසුබට වන්නේ මලක් තළන්නට මැළි වන රසිකයකු මෙන් මගේ සිත තළන්නට ඇති නොකැමැත්ත නිසා ය.

අනුකම්පාව මගේ සිතට ඉතා පහසුවෙන් හා ඉතා ඉක්මනින් ගලා එන හැඟීම් විශේෂයකි. එහෙත් ගුණපාලට අනුකම්පා කිරීමට මා කිසිසේත් සූදානම් නැත. මන්ද? අනුකම්පාව මත තීරණ ගැනීමට ගියොත් ඔහු මට අහිමි වන බැවිනි. ඔහු සමඟ මා වෙත පවතින්නේ අධ්‍යාත්මික හිතවත් කමකි. එයින් මා ලබන්නේ අධ්‍යාත්මික ශක්තියකි. මේ ශක්තිය නැති වුණු කල මා තව තවත් අසරණ වනු ඇත. දුබල වනු ඇත.

ගුණපාලගේ මව්පිය දෙ දෙනා ගුරු යුවලකි. ඔවුනට ලොකු ගෙයක් ද ඉඩකඩම් ද සමාජ තත්ත්වය ද තිබෙන්නට පුළුවන. ඔහු නැතත් මව් පියන් දෑවැද්ද, දේපළ, රන්රිදී ආභරණ සහ ඇඳුම් පැළඳුම් ඉල්ලනු ඇත. වැඩිහිටියන්ගේ ඒ බැමි කඩාගෙන යෑමට, ආත්මාර්ථයෙන් ක්‍රියා කළ නිමල් හකුරුසිංහ පවා වරක් මට යෝජනා කළේ ය. ස්වාධීන පුද්ගලයෙක් වන ගුණපාල මව්පියන්ගේ බලපෑම් ඒ තරම් වත් ගණන් නොගන්නවා ඇත. එහෙත් මට එහෙම බැරි ය. මට නිමල්ගේ ය ගුණපාලගේ ය යි අම්මලා අතර වෙනසක් නැත.

කෙසේ වුව ද මට ගුණපාල අහිමි කරගත බැරි ය. අනුකම්පා කළ නොහැකි වුව ද ඔහුට ගෞරව කිරීමට මට පුළුවන. ඔහු මට සදහට ම අයත් වන්නේ එමගින් පමණක් බව බොහෝ දුර කල්පනා කිරීමේ දී මම අවබෝධ කර ගතිමි. එපමණක් නොව මම එහි දී ඔහු දකින සත්‍යය වෙත සමීප වීමට ද සමත් වීමි.

මා හා සමාන - සමහර විට මටත් වඩා අන්ත - තරුණියෝ ගමේ විවාහ වෙති. ඇතැමෙක් කිරි කපන, කුලී වැඩ කරන හෝ ගොවිතැන් කරන තරුණයන් සමඟ යති. එවැන්නකු බැණා කර ගැනීමට අම්මා කිසිසේත් කැමති නොවනු ඇත.

www.sinhalaelibrary.com

ශිෂ්‍යත්වය නො ලැබුණා නම් - මැදි මහ විදුහලට නො ගියා නම් - ගමේ පාසලේ දී මගේ අධ්‍යාපනය නිම විය හැකිව තිබිණි. මැදි මහ විදුහල් ටයි පටිය හා සුදු ගවුම වෙනුවට ඊට වඩා දිග පාට ගවුමක් ඇඳ සපත්තු සෙරෙප්පු නැතිව ගමේ පාසලේ හතරට පහට හෝ හතට අටට හෝ ඉගෙන, මට කාගේ හෝ ඉඩමක කිරි කපන්නට හෝ රෙදි වියන්නට හෝ යන්නට හැකි ව තිබිණි. එසේ නම් ගොවිතැන් කරන හෝ කිරි කපන හෝ තරුණයකු වෙත මා පාවා දීමට අම්මා නො කැමති නොවනු ඇත.

එවැනි ගැමි යුවතියක හා මා අතර ඇති වෙනස අධ්‍යාපනය යි.

අධ්‍යාපනය විසින් මට දෙන ලද්දේ කුමක් ද? අම්මලාට හා තාත්තලාට වඩා උසස් - කලඑළියෙන් යුත් - හොඳ ජීවිතයක් ගත කිරීමේ වුවමනාව, බලාපොරොත්තු හා ප්‍රාර්ථනා හැර අන් කවර දායාදයක් අධ්‍යාපනය විසින් අප වෙත සලසන ලද්දේ ද?

හැම දෙයක් ම බොල් සිහින සහ පුහු බලාපොරොත්තුවලට පමණක් සීමා වූයේ ඇයි? "වැරදි අධ්‍යාපනය කියන්නෙ කුනුම වැරදි සමාජ ක්‍රමයක එක පැත්තක් විතරයි" එද ගුණපාල කීවේ ය.

ඔහු කීවේ ඇත්තකි. අධ්‍යාපනය පමණක් නොව රැකී රක්ෂා, ආහාර, බෙහෙත් හේත්, නිවාස ආදි අප මුහුණ පා සිටින කිසිවක් හුදකලා ප්‍රශ්න නොවේ. හැම එකක් ම වැරදි සමාජ ක්‍රමයක් පිළිබඳ එක ම සංකීර්ණ ප්‍රශ්නයක කොටසක් පමණකි. අප කොතෙක් උත්සාහ කළත් අපට තනි තනි ව මේ කිසිවක් විසඳා ගත නොහැකි ය. අපගේ කැමැත්තෙන් හෝ නොකැමැත්තෙන්, දැනුවත් ව හෝ නොදැනුවත් ව, උත්සාහයෙන් හෝ නිරුත්සාහයෙන් මූලික පරිවර්තනයක් වන තුරු මේ ප්‍රශ්න සහ පීඩනත් ගැටළු සහ දුෂ්කරතාත් නොවිසඳී දිගට ම පවතිනු ඇත. ඒ පරිවර්තනයට හවුල් වීමට අප සූදානම් ද නැද්ද යනු වෙන ම කරුණකි.

මට නැත්නම් අනුලාට ඒත් නැත්නම් නිල්මිණිට අද හෝ හෙට හෝ ඒ වගකීම පැවරෙනු ඇත. අප වගකීමේ අභියෝගය



බාර නොගතහොත් මට මෙන් ම අනුලාටත් නිල්මිණිටත් පමණක් නොව ඔවුනගේ දරුවනටත් දැවැද්ද ඇතුළු සියලු අසාධාරණයනට යටත් වන්නටත් එයින් පරාද වන්නටත් සිදු වනු ඇත. සත්‍යය එය යි. මම ද මෙම සත්‍යයේ හවුල්කාරියක් - කොටස් කාරියක් - වන්නෙමි. මට ගුණපාල පමණක් නොව මුළු මිනිස් වර්ගයා ම අහිමි නොවන්නේ එමගින් පමණකි.

මම හිමින් සීරුවේ ජනෙල් පළුවක් ඇර පිටත බැලීමි. අර පිරුණු හඳ දිගට ම විරාජමාන ව බැබළෙයි. එතැන සිට ගෙල හරවා ආපසු බැලූ මම, සුව නින්දේ පසු වන අනුලා සහ නිල්මිණි දිටිමි. මම ඇඳ කරා පැමිණ පසෙක වාඩි වී අනුලාගේ මුහුණට එබී බැලීමි. ඇයගේ වත යාන්තම් සිනා පොඩිත්තකින් විකසිත වී තිබිණි. මම මුදු මොළොක් ලෙස ඇයගේ උර හිසට අත තැබීමි. ඇය අවදි කරවන සිතක් මට නොවිණි.

මම ඔවුන් දෙදෙනා අතර ඉඩක් පාද ගෙන ඇඳේ වැතිර ගතිමි. මගේ සිත අප්‍රමාණ ලෙස සැහැල්ලු ය. පිරිසිදු ය. නිදහස් ය. තවමත් නිදි මතක් නැත. එහෙත් මම මුවග මඳහසක් ද ඇති ව නෙත් පියා ගත්තේ හෙට අවදි වුණු විගස අනුලාට කිව යුතු මේ වචන සිතින් ගොනු කර ගෙන ය.

"පුංචි නංගියේ මමත් එනව. ඔය ගොල්ල එක්ක යන්න මමත් එනව.............. කොහේද මොකක්ද කියල මට ඒ තරම්ම තේරුමක් නෑ. ඒත් මම එන්නම්. මමත් හවුල් වෙන්නම්."

නිමි.

www.sinhalaelibrary.com

# පිරුණු හදක්

## කරුණාසේන ජයලත්

හැටේ දශකයෙන් ඇරඹී පුවතකින් පාඨකයන්
අමන්දානන්දයට පත් කරමින් ඔවුන් නැවුම්
ලොවකට කැඳවා ගෙන ගිය කරුණාසේන ජයලත්
මැවූ චරිත සදා ජීවමාන ය. එසෙයින් 'පිරුණු
හදක්' නව මුද්‍රණය එළිදකින අද, ඔවුන් ජීවමාන ව
නැතත් දශක ගණනාවක් යන තුරු ම පාඨක සිත්
සතන් තුළ ඔවුන් අමරණීය වනු ඇත.



www.sinhalaebook.com